# ලෝවැඩසඟරාව.

වීදගම ශ්‍රී ඝනානන්ද පරිවෙණාධිපතිව වැඩ විසූ

මහානෙත්‍ර ප්‍රාසාදමූල

**මෛත්‍රෙය මහා ස්ථවිර ස්වාමිපාදයන් වහන්සේ**

විසින්

විරචිතයි.

---

මොරටුවේ එගොඩ උයනේ

**ටී. ඒ. ධර්මබන්ධු මහතා විසින්**

ලියනලද විස්තරාර්ථ සන්නයෙන්

උපලක්ෂිතයි.

---

ප්‍රාචීන භාෂොපකාර සමිතියේ සමාජික ධුරන්ධරවූද

පාණදුරේ සෞගත විද්‍යාලයෙහි උප ප්‍රධානාචාර්ය පදප්‍රාප්තවූද

වලානේ සරණපාලාරාම මහා විහාරාධිපති

ගෞරවාර්හ චිත්‍රභාණක සිරිසද්ධම්මාචරිය

**වලානේ ධම්මානන්දාභිධාන මහාස්ථවිර**

ස්වාමිපාදයන් වහන්සේ

විසින්

අවසාන ශුද්ධපත්‍රාවලෝකනයෙන්

පිළිගන්වනලදී.

---

කොළඹ දෙවෙනි මරදානේ

" සේව්‍යශ්‍රී යන්ත්‍රාලයෙහි "

මුද්‍රිතයි.

---

**2469.**

1925

To

MY BELOVED FATHER

(LATE MR. T. JOSEPH FERNANDO)

THIS COMMENTARY ON

# LOVEDA SANGARA

IS RESPECTFULLY DEDICATED



මොරටුවේ එගොඩ උයනේ විසූ

ටී. ජෝශප් ප්‍රණාන්දු ගුරුතුමා.

දි ග ත වතල ගුණ සුව දිත් විසිතු රුව
සු ග ත දහම් සඟ තෙරුවන් මතදූ රුව
සු’ ග ත මපිය පිය පුරවත් පුරදූ රුව
මෙ ග ත සිහි කරමි කුළුණෙන් ලය පි රුව

පී. ඒ. ධම්බන්ධු.

# Introduction

This excellent poem "Loveda Sangara" was composed by Mahanetra Prasàda Mula Maithriya Mahà Sthavira, Principal, Sri Ghanànanda Pirivena of Weedagama about four hundred and fifty four years ago. Though it is impossible to obtain any definite information about his life save a few details that could be gathered from his own composition, there is enough evidence to prove that this Sthavira was the adviser on various religious matters to the warrior prince "Sapumal" who was the adopted son of Parakramabahu VI and who became king of Ceylon as Buwaneka Bahu VI in the year 2012 B.E.

**Author of Loveda Sangara.**

Of the compositions of this pious, learned and venerable Sthavira, the following are available :— (i) Buduguna Alankara (ii) Tisara (Hansa) Sandesa (iii) Kavyalakshana Mani Malawa (Lakunu Mina) and (iv) Loveda Sangara.

**His Literary Works**

I. **Buduguna Alankara** (a Treatise on Lord Buddha's attributes) This contains 611 stanzas of the best type based on the story which deals with Lord Buddha's great achievement in saving the people of Vesali from the three throes of Death— plague, famine and evil-spirits—by the repeated chanting of the well known "Ratana Sutta."

II. **Tisara Sandesa** (a message sent through a swan.) This is an imaginary message of 201 stanzas sent through a swan from Jayawardanapura to Sri Rajaguru Wanaratana Sangaraja Sthavira, head priest of Keragala Vihare.

III. **Kavya Lakshana Mani Malawa** (a garland of gems of Metrical rules) obviously composed at the request of a pandit named Kivi Gaja Kesara of Gangasiri Pura (Gampola) deals with the rules that must be observed by those composing poetry.

IV. **Loveda Sangara** (a book written for the welfare of humanity.) This well-known work of Sinhalese poetry giving the gist of the most valuable teachings of Buddhism is written in very simple language for the benefit of those who cannot understand them in their original form. The purpose of writing this book is explained in :—

* "ඉවසෙසින් පෙළ ද මි නොමදන් දනහ ට
පවසමි කළ කම් පළ දූන් හෙළ කො ට"

and

* "නොදැනෙනුවන් හට පවසින් නිසම කො ට
බද ලෝවැඩ සගරා පිණෙනි හැම වි ට"

Though the exact year of the composition of this book cannot be determined by internal evidence, we find in Buduguna Alankara the following lines which suggest that Loveda Sangara was written previous to Buduguna Alankara.

**Date of composition (In or about 2015 B. E.)**

† "සමතැස් මුනිඳු පිරිනිවි වස පවත් ල ද
දෙදහස් පසළොසක් අවුරුදු පිරුණු ස ද"
† "සෙත් කළ මුනි සඳ ගුණ කවි පෙදෙන් බැ ඳ
සගත් වැඩ වස් මෙද කොළෙ මෙන් සිතින් න ද"

The last line "සගත් වැඩ වස් මෙද කොළෙ මෙන් සිතින් නද" shows that one or more books of this nature had been written previous to this.

Considering the facts that Buduguna Alankára was written in 2015 B. E. and that the only other religious book known to have been written by the same author is Loveda Sangara, we may conclude from this external evidence that it was written in or before the year 2015 B. E.

* Stanzas 4 and 138. † See Stanzas 609 & 611, "Buduguna Alankara."

Many editions of this book, which has been used for more than four and a half centuries by the Buddhist Public with great reverence and love and by the educators to inculcate morals into the minds of the young, exist to-day with paraphrases by numerous writers, both laymen and priests. But I have felt for some time that these editions do not give sufficient details to enable the students to appreciate the book or even to understand it.

**Popularity of the book and other editions**

About fifteen years ago (in 1910) it was decided by the then Director of Public Instruction to test the students who wished to compete for the Diamond Jubilee Prize for Classical Sinhalese, in a few selected stories from the Jataka Kathas and this book, Loveda Sangara, under the head Literature. As a student of the Prince of Wales' College, Moratuwa, I had the good fortune to take part in the competition, but experienced innumerable difficulties in understanding some of the stanzas and in tracing the allusions. Though I was able to succeed in my attempt in spite of these difficulties the need of a suitable commentary on Loveda Sangara for the use of students was felt too keenly to be erased from my mind and this created in me a great desire to supply this need. I felt, however, at the time that I was not competent enough to undertake such a heavy task as this. Yet a sense of duty urged me to make an attempt and I am glad, that, in spite of the length of time taken over it owing to my inability to devote my time exclusively to this, it has been possible for me to present the work in this form.

**Causes that led to this edition**

I trust that the readers will take the book for what it is worth and encourage me in my attempt by bringing to my notice any short-comings that may be met with while they peruse the book, so that the future editions may be free from such errors or short-comings as far as possible.

Since in most cases this book runs parallel to "Saddhammo Payana" many stanzas have been quoted specially from that book and generally from other Buddhist Literature to show the various sources and to explain the allusions. I am greatly indebted to

**Sources, allusions and parallel verses**

all the authors from whom I quote. I beg to be excused for being unable to give in a few cases the names of the authors from whom I have freely quoted.

**My indebtedness**

I am greatly indebted to Chitrabhanaka Siri Saddhammachariya Dhammananda Maha Sthavira of Saranapalarama, Walana, for the kind assistance rendered in correcting the proofs and testing the accuracy of the passages quoted or referred to. My sincere thanks are due to Siri Wisuddhachariya P. Nanananda Sthavira of Thalarukkharama, Egodauyana, for valuable help given in certain matters connected with the compilation of the book and to C. Medhananda Sthavira of the same temple for supplying me with not a few of the books I had to consult. A share of the merits acquired by the publication of this book is due to the late Mr. M. A. Perera of Panadura who generously donated a sum of Fifty Rupees towards the cost of printing.

Mention must also be made of Messrs. R. W. D. Salmon Appuhamy, M. W. Surasena, W. G. M. Peiris Silva and T. Arlis Peiris for sharing the cost of publication and Mr. T. Darley Richard Fernando for copying the manuscript and Messrs. Agilion Perera and T. S. Dharmabandu, my pupils, for helping me in various ways in bringing out this book.

May this book containing numerous gems from the teachings of the Master live long for the benefit of Mankind!

T. A. DHARMABANDU,
"Guru Medura,"
Egodauyana, Moratuwa.

*Full moon day of Poson 2469 B.E.*
*6th June, 1925.*

# සංඥාපනය.

ලෝවැඩ සඟරා නම්වූ මෙම ප්‍රශස්ත මධුර මනෝහර කාව්‍ය පුස්තකය වනාහි විදගම ශ්‍රී ඝනානන්ද කාව්‍ය කර්තෘ. පරිවෙණාධිපතිව වැඩිසූ මහා තෙන්‍ර ප්‍රාසාදමූල පෙමතෙන්ස මහා ස්ථවිරපාදයන්වහන්සේ විසින් මීට වර්ෂ සාරසිය සූපණසකට පමණ පූර්වයෙහිදී රචනාකරණලද්දකි.

මෙම කාව්‍ය කර්තෘවූ මහා ස්වාමිපාදයන්වහන්සේගේ ජීවන චරිතය පිළිබඳ උන්වහන්සේගේම රචනාවලින් උපුටාගතහැකි ස්වල්ප මාත්‍රවූ යම්කිසි ප්‍රවෘත්තියක්මිස විස්තරලෙස යමක් දැනගැනීමට නොහැකි නමුත් බුද්ධ වර්ෂ 2012 දී පරාක්‍රමබාහු මහ රජතුමාගේ (ඇතිකරගත්) පුත්‍රයක්වූ සපුමල් කුමාරයායයි ප්‍රසිද්ධ සේනාධිපති කුමරතෙම vi භුවනෙකබාහු යන නාමයෙන් රාජ ශ්‍රීයට පැමිණිබවත් මිහිස විදගම මහා ස්ථවිරයන්වහන්සේ එම මහරජාණන්ගේ රාජ්‍යයෙහි ශාසන කෘත්‍යවල ප්‍රධාන ධුරය දරමින් ලෝකාර්ථසිද්ධිය සඳහා කටයුතුකළබවත් පොතපතින් පෙනේ.

සම්බුද්ධ පරිනිර්වාණයෙන් වර්ෂ 2002 වන්නෙහි රාමඤ්ඤ දේශයෙහි (පහළ බුරුමරට) අධිපතිබවට පැමිණි ත්‍රිපිටකයෙහි හා නානා ශාස්ත්‍රාන්තර සමයාන්තරයන්හි දක්ෂවූ ධම්ම චෙතිය මහ රජතුමන් විසින් ලක්දිවින් උපසම්පදාව ගෙණයනුවස් ශ්‍රී බුද්ධ වර්ෂ 2017 වැන්නෙහි නවම් මස "චිත්‍රදූත" "රාමදූත" යන ඇමතියන්, දෙදෙනෙකු සමග මොග්ගල්ලාන, මහා සීවලී යන මහ තෙරුන් වහන්සේ ප්‍රමුඛ තෙරණුවන් දෙවිසිනමක් පිටත්කොට එවනලද බවද සිංහල නරපති තෙමේ ඒ පිරිස සතුටින් පිළිගෙණ කැළණි ගඟෙහි පාරු එක්කොට බඳවා ඒ මත්තෙහි විචිත්‍රාලංකාර මණ්ඩප යක් කරවා උපසම්පදාව දීමට යොග්‍ය ස්ථවිරවරයන් තෝරා දෙන ලෙස විදගම මහ තෙරුන් වහන්සේට ආරාධනා කරණලදින්

උත්වහන්සේ විසින් 1. ධම්මකිත්ති මහා ස්ථවිර, 2. වනරතන මහා ස්ථවිර, 3. පඤ්චපරිවේණවාසී මඞ්ගල මහාස්ථවිර, 4. සිංහල රාජ යුවරාජයන්ගේ ආචාර්ය මහා ස්ථවිර යන මහ තෙරුන්වහන්සේලා ප්‍රමුඛ සුවිසි නමක් ගණයා තෝරා දුන්බවද ශ්‍රී බුද්ධ වර්ෂ 2018 ඇසල මස පූර්ණිමාන්ත උපසම්පදාකර්මය සිදුකලබවද කල්‍යාණිශිලාලිපියෙන් ප්‍රත්‍යක්ෂ වේ. *

**කර්තෘ විසින් කරණලද ග්‍රන්ථ.**

ශාස්ත්‍රාගමාභිදක්ෂව රාජපූජ්‍යව වැඩ විසූ මෙම මහා ස්ථවිරපාද යන්වහන්සේ විසින් රචනා කරණු ලැබූ ලෝක ශාසනෝපකාරී ග්‍රන්ථයන් අතුරෙන් i බුදුගුණ අලංකාරයද, ii තිසර (හංස) සන්දේශයද, iii කාව්‍යලක්ෂණ මණිමාලාව (ලකුණුමිණ) ද iv ලෝවැඩ සඟරාවද මෙකල්හි දක්නා ලැබේ.

i **බුදුගුණ අලංකාරය**—විශාලා මහනුවර උපන් (රෝග, අමනුෂ්‍ය, දුර්භික්ෂ යන) ත්‍රිවිධභය ව්‍යුපසමනය පිණිස බුදුරජාණන් වහන්සේ වැඩමවා රතනසූත්‍ර දේශනාවෙන් පිරිත් කිරීමේ ප්‍රවෘත්තිය කථා ශරීරකොට ගෙණ කරුණරශාන්ත අද්භූත කාව්‍ය හසිය එකොළොසකින් යුක්තව කාව්‍යාභිලාෂීන්ගේ චිත්තාකර්ෂණයවන පරිදි රචනාකරණලද උසස් ග්‍රන්ථයකි.

ii **තිසර ( හංස ) සන්දේශය**—ජයවර්ධන පුරයෙහි සිට කැරගල විහාරාධිපතිව වැඩ විසූ ශ්‍රී රාජගුරු වනරතන සංඝරාජ

---

* "තතො පරං සිහල රාජා "සෙත ගජපතිස්ස යථා සන්දෙසං කරිස්සාමීති" සීහලිය්‍යාමච්චෙව ආණාපෙත්වා, තෙහා න පරිභොගෙන භගවතා පරිභුත්තාය කල්‍යාණි ගඞ්ගාය නාවා සඞ්ඝාටං කාරාපෙත්වා තස්සුපරි පාසාදං කාරාපෙත්වා චෙල විතානං බන්ධාපෙත්වා නානාවිධ විතානොලම්බකං කාරාපෙසි. **විදගම මහාථෙරස්ස** මහා විහාර වාසී පවෙණිභූත භික්ඛු සංඝෙනා පි ගරුභාපරූපවාද මත්ත චිර ඨිතං ගණ මුච්චිතාපෙසි තද **විදගම මහාථෙරො**; ධම්මකිත්ති මහා ථෙර, වනරතන මහාථෙර, පඤ්චපරිවෙණවාසි මඞ්ගලථෙර සීහල රාජ යුවරාජාචරිය ථෙරාදිකං චතුවීසති පරිමාණං ගණ මුච්චිනි. එවං රාජා නාවාසඞ්ඝාටං පටියාදාපෙත්වා ගණ මුච්චිතාපෙත්වා දුතියා සාළ්හි මාසස්ස කාලපක්ඛ එකාදසමියං බුධවාරෙ ධම්මකිත්ති මහා ථෙරාදයො කම්මකාරකෙ ච චතුවීසති භික්ඛු නිමන්තාපෙත්වා නාවාසඞ්ඝාට මභිරූහාපෙත්වා තෙසං චතුවග්ගානාලිඞ්ගානං රමඤ්ඤ දෙසියානං භික්ඛූන මුපසම්පද දනං කාරාපෙසි."

ස්වාමිපාදයන්වහන්සේ වෙත හංසයෙක් දූත මෙහෙවරෙහි යොදා යවනලද්දක් පරිද්දෙන් කවි දෙසිය එකකින් යුක්තව කරණලද ප්‍රශස්ත කාව්‍ය ප්‍රබන්ධයකි.

iii **කාව්‍ය ලක්ෂණ මණිමාලාව** — මෙය ගඩගා සිරිපුරයෙහි ජනිත කිවිගජ කේසර නම්වූ පඬිතුමාගේ ආරාධනාවෙන් කළබැව් පෙනේ * ඉෂ්ටානිෂ්ට වර්ණ ගණ නක්ෂත්‍රයොගාදිවූ කාව්‍ය බන්ධනයෙහි දතමනා මනා උපදෙශයන්ගෙන් යුත් කවි අසූ හතකින් සමන්විත විශිෂ්ට රචනාවකි.

iv **ලෝවැඩ සඟරාව** — පාලි ධර්මය නොදන්නා ජනයාට පව්පින් පල මේ මේයයි නිශ්චිතලෙස අවබෝධ කරවීම පිණිස මහාර්ඝ ධර්මාවවාදයන් පිඬුකොට ගොතනලද කවි එකසිය තිස් නවයකින් යුත් චිර ප්‍රසිද්ධ ප්‍රබන්ධයකි. ඒබව මෙම ලෝවැඩසඟරාවෙහිම,

“මෙවෙසෙසින් පෙළදම් නොමදත් දනහ ට
පවසම් කළ සම් පල දැන් හෙළකො ට”

යනුවෙන් හා

“නොදැනෙනනුවන්හට පව්පින් නියමකොර ට
බඳ ලෝවැඩසඟරා පිණෙනි හැමවී ට”

යනුවෙන්ද සඳුව වේ. මෙම ග්‍රන්ථ නිර්මාණයකළ වර්ෂය මෙයයි ස්ථිර වශයෙන් දැනගත නොහැකි නමුත් මෙම ස්වාමිපාදයන්වහන්සේ විසින්ම කරණලද බුදුගුණ අලංකාරයෙහි,

**ග්‍රන්ථ නිර්මාණ කාලය.** (බුද්ධ වර්ෂ 2015 දී පමණ)

“ස ම තැ ස් මුනිඳු පිරිණිවි වස පවත් ල ද
දෙ ද හ ස් පසළොසක් අවුරුදු පිරුණුස ද
දිය ගො ස් පැහිරි බුවනෙකබුජ නිරිඳු ස ද
පි රි ව ස් තුනෙහි සිරිලක රජබිංසව් ල ද

දී න දි න නොඅඩු දින පුද පැවති මනහ ර
ද න මු න රදන සැදි ගෙළයන් සිරින් ස ර
වැජඹෙන පසිඳු මහ රයිගම් පුර අතු ර
බ බ ල න සොඳුරු වීදගම් මහ වෙහෙ ර

* “ගඟ සිරි පුරැ උපන්—කිවිකැල මුදුන් මල් කඩ
කිවිගජ කෙසර පඬිවර—අදරින් දූකැ අයැදිමෙන්”

සි ත් ජස කොත් දසදික් දිගු යටගු සි ද
මම ත් මහ නෙත් පාමුල මහ තෙරිඳු ස ද
මස ත් කල මුනිසඳ ගුණ කව් පෙදෙත් බැ ද
ස ත් වැඩ වස් මෙද කෙලෙ මෙන් සිහින් න ද”

යනුවෙන් ශ්‍රී බුධ වර්ෂ 2015 දී බුදුගුණ අලංකාරය කළබැව් දක්වා තිබේ **“සත්වැඩ වස් මෙද කොලෙ මෙන් සිහින් නද”** යනුවෙන් බුදුගුණඅලංකාරය කරන්ටප්‍රථම **සඞ්ඝාගිවෘද්ධිය පිණිස අන්‍ය රචනාවක් හෝ රචනාවන්කර තිබෙනබැව්** ප්‍රකාශවේ.

මුන්වහන්සේගේ රචනාඅතුරෙන් බුදුගුණ අලංකාරය මෙන්ම ලෝකයාගේ දෙලෝ අභිවෘද්ධියට හේතුවූ අනින් කෘත්‍යය වූ ම ලෝවැඩසඟරාවබැවින් එය බුධවර්ෂ 2015 දී හෝ ඊටප්‍රථම වර්ෂයක රචනාකළබැව් සිතීම යුක්ති සහිතයයි හඟිමු.

**ග්‍රන්ථරූපය සහ සංස්කරණ.**

මෙසේ ශතවර්ෂ හතරහමාරකටත් පූර්වකාලයෙහි පටන් බෞද්ධ ආචාර්යවරයන් විසින් ශිෂ්‍ය පරම්පරාවට පුරුදු පුහුණුකරගෙණ එනු ලබන්නාවූද, මහ ජනයා විසින් අත්‍යාදරයෙන් භාවිතා කරණු ලබන්නාවූද, මේ මාහැඟි කාව්‍ය පුස්තකය ගිනි පැවිදි උතුමන් විසින් පදගත භාවසත්තයෙන් යුක්තව සකස්කොට වරින්වර මුද්‍රණය කරවනලදින් **සන්නසගිය ලෝවැඩ සඟරා කිපයක්ම මෙකල විද්‍යමාන නමුත් ඒ විස්තර වර්ණනාවෙන් තොර හෙයින් ආධුනිකයන්ගේ සුඛාවබෝධය පිණිස ප්‍රමාණ නොවන බැව් කලකට පෙර අපට ප්‍රත්‍යක්ෂලෙස වැටහුණේය.**

**මෙය සකස්කිරීමට හේතු.**

මීට පසළොස් වර්ෂයකට පමණ පෙර (1910 වර්ෂයේ) දියමන්ති ජුබිලි ත්‍යාගවිභාගයේ භාෂාව පිළිබඳව පන්සියපණස් ජාතකයෙන් කථාවස්තු ස්වල්පයක් හා ලෝවැඩ සඟරාවද අධ්‍යාපන අධ්‍යක්ෂකතුමා විසින් නියමකරණ ලදී. එවකට මොරටුවේ වේල්ස්කුමාර ශාස්ත්‍රශාලාවේ ශාස්ත්‍රාද්ග්‍රහණයකිරීමෙහි නියුක්තව සිටි අපටද මේ විභාගය පිළිබඳ සැරසීමට සිදුවිය. **විස්තරාර්ථ වර්ණනා සහිත ලෝවැඩ සඟරාවක් නැති පාඩුව අපට එහිදී මොනවට අවබෝධවිය.** කව්වල අන්තර්ගත කථාවස්තු දැනගැණීමටත් සුඛාවබෝධ නොවන ගැටමුසු ස්ථාන ලිහිල්කරවා ගැණීමටත් මහත් පරිශ්‍රම දරන්ට සිදුවිය. **එයකින්** **කාව්‍යතුකොට** ඒ වර්ෂයෙහි ත්‍යාගය දිනාගැණීමෙන් අප අදහස්

මුද්‍රණ පමුණුවා ගත් නමුත් එතැන් සිට ලෝවැඩසඟරා විස්තරාර්ථ **සන්නයක් කිරීමට අප සිත්තුල මහත් අභිලාෂයක් ඇතිවිය.** නමුත් මෙවැනි බැරෑරුම් කටයුත්තක්පිළිබඳ ඉදිරිපත්වීමට එවකට අපි අපොහොසත්වීමු. එතකුදුවුවත් අපි එදින ඇතිකරගත් සංකල්පනාව කිසිවිටෙකත් අප සිතින් බැහැර නොකෙළෙමු. නොයෙක් කටයුතු නිසා අපට වැඩි විවේකයක් නොලැබුන නමුත් අපට අවකාශ ලැබෙන සියළු ප්‍රස්ථාවලදීම ලොකාර්ථදායී මෙම කාර්‍ය්‍යය පිළිබඳ ව්‍යාවෘතවීමු. අපේ මේ ව්‍යාපාරයෙහි යම් දෙෂයක් විද්‍යමාන වීනම් මෙය කියවන සුධීහු අප කෙරෙහි අනුකම්පාකොට මෙහි ගුණ පක්ෂයම භජනයකරමින් එවැනි දෙෂ ස්ථාන අපවෙත දනුම් දුන මැනවි. එවිට විතීය සංස්කරණයේදී ඒ සියල්ල ශුද්ධකොට වඩා නිර්මල ග්‍රන්ථයක් ශාස්ත්‍රකාමාභිවෘද්ධිකාමී භවතුන් වෙත පත්කරලීමට අපට අවකාශ ලැබේ.

**උපුටා ගැණීම්.** **ලෝවැඩ සඟරාව** බොහෝ සෙයින් **සද්ධර්මොපායන** නම් මාහැඟි ධර්ම ප්‍රකරණයට අනුව ලියා තිබෙන බැව් පෙණී ගිය හෙයින් විශෙෂ වශයෙන් එම ධර්ම පුස්තකයෙන් හා සාමාන්‍යයෙන් බෞද්ධ ධර්මය අන්තර්ගත වෙනත් නොයෙක් පොතපතින්ද කරුණු උපුටා අප පොතෙහි යෙදීමු. ඒ සියළු ග්‍රන්ථ කර්තෘවරයින් වෙත අපගේ අවංකාදරනමස්කාරය පුදකරම්හ. තවද කරුණු උපුටාගත් ඇතැම් පොත්වල නම් මෙහි බහාලීමට නොහැකිවිය. ඒ ගැණ අප හා සමාධිය භජනය කරණමෙන් කාරුණාවෙන් ඉල්ලමු.

**අපේ ස්තුතිය.** මෙම සංස්කරණයෙහිදී ශොධ්‍ය පත්‍ර බලා සකස්කොට දීමාදියෙන් **වලානේ සරණපාලාරාමමහාවිහාරාධිපති විනයභාණක සිරිසද්ධම්මාචරිය වලානෙ ධම්මානන්ද මහස්ථවිරපාදයන් වහන්සේ** විසින් කරණ ලද විශෙෂාධාරය ගෞරව පුරස්සරව සිහිපත්කරමු. එසේම **එගොඩඋයනේ තාලරුක්ඛාරාමාධිපති සිරිවිශුද්ධාචරිය පොහද්දරමුල්ලේ ඤාණානන්ද ස්ථවිරපාදයන්වහන්සේගෙන්** ඇතැම් වැදගත් කරුණු පිළිබඳ අකල්ප උපකාර ලැබුන බැව් හා **එම විහාරාධිවාසි කොළඹ ධම්මානන්ද ස්ථවිරපාදයන්වහන්සේ** උවමනා පොතපත සපයා දීමෙන් ආධාරකළබවද ගෞරවයෙන් ප්‍රකාශකරමු.

පාණදුරේ විසූ සත් ගුණවත් **ඇම්. ඒ. පෙරේරා මහතා** මෙම පොත මුද්‍රණය සඳහා රුපියල් පණහ ( Rs. 50/- ) ක විශෙෂ පරිත්‍යාගයක් කරණලද බැව්ද සිහිදීමෙන් මතක්කරමු.

පාණදුරේ ආර්. ඩබ්ලිව්. ඩී. සල්මන් අප්පුහාමි, තික්කඩුවේ ඇම්. ඩබ්ලිව්. සුරසේන, මිරිස්සේ ඩබ්ලිව්. ජී. ඇම්. පීරිස් සිල්වා සහ එගොඩඋයනේ පී. ආර්ලිස් පීරිස් යන මහතුන් මෙම පොත මුද්‍රණ කරවීම පිළිබඳ වියදම් දැරීමෙන්ද, පී. ඩාර්ලි විවඩි ප්‍රණාන්දු මහත්මයා පොත ලිපිකිරීමෙහි සහායවීමෙන්ද, ඇඹිලිගොන්ජ්‍රේ සිරිගණදස ධර්මබන්ධු යන අසමදීය ශිෂ්‍යදෙපල මේ සත්‍යකෘත්‍යය පිළිබඳ උවමනා කෘත්‍යය සම්පාදනයෙහි නියුක්ත වීමෙන්ද ආධාරකළ බැවි ස්තුතියෙන් සඳහන් කරමු.

**සහපත් ධර්ම කොට්ඨාසයන්ගෙන් යුක්තවූ මෙම ග්‍රන්ථය ලෝක සත්ත්වයාගේ හිතාභිවෘද්ධිය පිණිස චිරකාල් පවතීවා!**

මීට-වැඩකැමති,

**පී. ආයර්දස ධර්මබන්ධු.**

ශ්‍රී බුද්ධ වර්ෂ 2469 ක්වූ
පොසොන්මසපුරපසළොස්වක්ලත්
(1925 ක්වූ ජූනි මස 6 වෙනි) ශනිදින
මොරටුවේ එගොඩඋයනේ
"ගුරු මැදුරේ" දීය.

# පටුන.


| කව. | ප්‍රකාශිත කරුණු. | |
|---|---|---|
| 1 සිට 3 දක්වා | රත්නත්‍ර නමස්කාරය. | |
| 4 | කම්පල විභාග එළිවන් දක්වීම පිණිස පොත කළ්බව දක්වයි. | |
| 5 | සිංහල ගීතිකා ශ්‍රවණයෙන්වූ රගත්වීම, | |
| 6 | එළිවෙන් කීයෙයයි අනාදර නොකොට ධර්මය ශ්‍රවණය කටයුතුබව | |
| 7 | ධර්මශ්‍රවණය කටයුතු පිළිවෙල, | |
| 8 සිට 17 දක්වා | අෂ්ටදුෂ්ටක්ෂණ හා එහි විභාග, | |
| 18 සහ 19 | මනුෂ්‍යාත්මග දුර්ලභ පරිදි, | |
| 20 සිට 75 දක්වා | පුණ්‍යකර්මයන්හි නිරතවීම අවශ්‍යබව, | |
| 76 සිට 104 දක්වා | දශ අකුසල් හා එහි විස්තර විභාග, | |
| | ප්‍රාණඝාත, | 77, 78, 95 |
| | අදත්තාදාන, | 79, 80, 96 |
| | කාමමිථ්‍යාචාර, | 81, 97 |
| | මුසාවාද, | 82, 98 |
| | පිසුණාවාච, | 83, 99 |
| | පරුෂාවාච, | 84, 100 |
| | සම්ඵප්‍රලාප, | 85, 101 |
| | අභිධ්‍යා, | 86, 102 |
| | ව්‍යාපාද, | 87, 103 |
| | මිථ්‍යාදෘෂ්ටි, | 88, 89, 90, 104 |
| 105 සිට 137 දක්වා | කුසල් හා එහි විස්තර විභාග, | |
| | දානය, | 106, 107, 108, 124 |
| | ශීලය, | 109, 110, 125 |
| | භාවනාව, | 111, 112, 126 |
| | පින්දීම, | 113, 127 |
| | පින් අනුමෝදන්වීම, | 128 |
| | බණකීම, | 114, 132 |
| | බණ ඇසීම, | 115, 129 |
| | පිදියයුත්තන් පිදීම, | 116, 117, 130, 131 |
| | වතාවත්කිරීම, | 118, 133 |
| | පින්කරු ගුණ වැනීම, | 119, |
| | තුණුරුවන් සරණ යෑම හා තිසරණ ගුණානුස්මෘතිය, | 120, 121, 122, 135, 136, 137 |
| 138 | පුණ්‍යානුමෝදනාව, | |
| 139 | කර්තෘසන්දර්ශිතය හා කර්තෘගේ ප්‍රාර්ථනාව. | |

"සහස්සමපි චෙ වාචා
අනත්ථපද සංහිතා
එකං අත්ථ පදං සෙය්‍යො
යං සුත්වා උපසම්මති.

සහස්සමපි චෙ ගාථා
අනත්ථපද සංහිතා
එකං ගාථා පදං සෙය්‍යො
යං සුත්වා උපසම්මති.

යො චෙ ගාථා සතං භාසෙ
අනත්ථපද සංහිතා
එකං ධම්මපදං සෙය්‍යො
යං සුත්වා උපසම්මති.

යො චෙ වස්සසතං ජීවෙ
අපස්සං ධම්ම මුත්තමං
එකාහං ජීවිතං සෙය්‍යො
පස්සතො ධම්ම මුත්තමං"

(ධම්මපද)

# ලෝවැඩ සඟරාව.

1. සෙ ත් සිරිදෙන මහ ගුණ මුහු දු ණ න්
ස ත් හටවන බව දුකට වෙ දු ණ න්
ති ත් ගනඳුරු දුරලන දිනි ඳු ණ න්
සි ත් සතොසින් නමදිම් මුනි ඳු ණ න්

සෙත්සිරි, නිර්වාණශ්‍රිය; දෙන, දානයකරන්නාවූ; මහගුණ, මහත්වූ ගුණයන්ට; මුහුදුණන්, මහා සමුද්‍රය වැනිවූ; සත්හට, සත්වයාහට; වන, වන්නාවූ; බවදුකට, භවදුඃඛයට හෙවත් සසරදුකට; වෙදුණන්, වෛද්‍යාචාර්‍ය්‍යවරයෙකු බඳුවූ; තිත්ගනඳුරු, තීර්ථක නමැති ඝනාන්ධකාරය; දුරලන, දූරීභූත කිරීමෙහි; දිනිඳුණන්, සූර්‍ය්‍ය දිව්‍ය රාජයා වැනිවූ; මුනිඳුණන්, මුනීන්ද්‍රයාණන්වහන්සේ; සිත් සතොසින්, චිත්ත සන්තොෂයෙන්; නමදිම්, නමස්කාර කෙරෙමි.

**සෙත්සිරි**-අනිත්‍ය, දුඃඛ, අනාත්ම යන ත්‍රි ලක්ෂණයෙන් යුක්ත හෙයින් කාම, රූප, අරූප, යන ත්‍රි භවයම සැප සහිත ස්ථාන වශයෙන් ගිණිය නොහේ. පුනරුත්පත්තියක් නොමැති ශුද්ධවූ සුඛ ස්වරූප නිර්වාණයම එකම ශාන්තිදායක ස්ථානයවේ.

**සිරි**-කළ පින් ඇත්තවුන් විසින් සේවන කරණු ලබන හෙයින් නිර්වාණසුඛය සිරිනම්වී.

**මහගුණ මුහුදුණන්**-මහා සමුද්‍රය (දිග, පළල ගැඹර මෙතෙකැයි ප්‍රමාණයක් නොකටහැකි ලෙස) ප්‍රමාණය ඉක්මවා පවත්නේ යම්සේද එසේම තථාගතයන් වහන්සේ කෙරෙහි විද්‍යමානවූ ගුණ රාශියද ප්‍රමාණාතික්‍රාන්තව පවත්නේයි. මෙසේ ව්‍යාප්තව පවත්නාබුදු ගුණය මහත්සේ පැතිර පවත්නා මහා සමුද්‍රයට උපමා කළබැව් දතයුතු.

**සත්හට වන බව දුකට වෙදුණන්**-(කාම, රූප, අරූප, යන) භවත්‍රයෙහි අන්තගීතවූ සකල සත්වයෝම භවදුක් නමැති රොගයෙන් පෙළෙමින් සිටිති. සසර දුක් නමැති රොගයෙන් නොපෙළෙන්නාවූ හෙවත් දුඃඛ සත්‍යයෙහි බෙදීම් වන ජාති ජරා මරණාදියට වසඟ නොවන්නාවූ එකද සත්වයෙකුදු නොමැත්තේය. සර්වඥ රාජොත්තමයාණන් වහන්සේගේ ශ්‍රී සද්ධර්ම නමැති අමෘතෞෂධ පානයෙන්විනා අන්‍ය කිසිම

ක්‍රමයකින් සසර සැරි සැරිම නමැති මෙම භයඞ්කර රොග
යෙන් මිදී පුනරුත්පත්තියෙන් තොරවූ නිර්‍වාණ නමැති
ආරොග්‍යභාවය ලැබ ගැන්මට නොහැක. එබැවින් සද්ධර්‍ම
නමැති ඖෂධ දානයෙන් ලොක සත්‍ත්‍වයා නමැති රෝගීන්
සසර උත්පත්තිය නමැති රොගයෙන් මුදවා නිර්‍වාණ නමැති
සුවය ලබා දෙන්නාවූ බුදු රජාණන්වහන්සේ වෛද්‍යාචාර්‍යවර
යෙකුට බඳු උපමා ඇතියහ.

"යෙකෙචි ඔසධාලොකෙ-විජ්ජන්ති විවිධාබහු
ධම්මොසධ සමං නත්ථි-එතං පිවථ භික්ඛවො."

**තිත්**-[තීර්‍ථකයෝ නාම කවරහයත්? තීර්‍ථකරයන්ගේ ලබ්ධිගෙනැ
පැවිජිවූවාහුයි. කිසේයැයත්? i තීර්‍ථයැ ii තීර්‍ථකරයහ iii
තීර්‍ථකායහ, iv තීර්‍ථක ශ්‍රාවකයහයි සතරෙක්වෙති. i එහි
"තීර්‍ථ" නම් දෙසැට දිට්ඨිහ හා එහි සඞ්ග්‍රහයට යන මිථ්‍යාග්‍රාහයැ.
එහි සත්‍වයෝ තරණ ප්‍ලවන උන්මජ්ජන නිමජ්ජන කෙරෙති.
එහින් හේ "තීර්‍ථ" නම්වේ. ii ඒ දෘෂ්ටිනට උත්පාදකයෝ
"තීර්‍ථකර" නම්වෙත්. iii ඔවුන්ගේ ලබ්ධිගෙනැ පැවිජිවූවාහු
"තීර්‍ථක" නම්වෙත්. iv ඔවුනට ප්‍රත්‍යයදායකයෝ "තීර්‍ථක
ශ්‍රාවක" නම්වෙත්. යම්සේ නුවණනැති ගොපල්ලෝ අනෙක
සහස්‍රගොගණයන් ගඞ්ගානදියට නොතොටින් බහා මුහුදු
බත් කළෝද එසෙයින්මැ තීර්‍ථකයෝ සත්‍වයන් නොතොටින්
බහා අපායගාමි කෙරෙත්]—ධර්‍ම ප්‍රදීපිකාව

**දිනිඳුණන්**-දබාලට අධිපතිකර්‍මකාරණ අර්‍ථයෙන් දිනෙන්ද්‍ර (දිනිඳු)
යනු සූර්‍ය්‍යාට නම්.

**තිත් ගනඳුරැ දුරලන දිනිඳුණන්**-මිථ්‍යාන්ධකාරයෙන් සත්‍ය
ලොකය වැසී තිබෙනකල බුදුරජානන් වහන්සේ නමැති
සූර්‍ය්‍ය දිව්‍ය රාජයාගේ උදාවීමෙන් සද්ධර්‍ම නමැති සූර්‍ය්‍යාලොකය
ලෙව්හි පැතිරගොස් මිථ්‍යාදෘෂ්ටි නමැති ඝනාන්ධකාරය විධ්වං
ශනයවිය. එබැවින් ධර්‍මරාජන්වූ තථාගතයන් වහන්සේ
තීර්‍ථකයන්ගේ මිථ්‍යා ලබ්ධි නමැති ඝනාන්ධකාරය දුරිභූත
කිරීමෙහි සූර්‍ය්‍ය දිව්‍ය රාජයා වැනියහ.

**මුනිඳුණන්**-["මෞන"යයි නුවණ කියති. එනුවණින් යුක්තවන
බැවින් බුදුහුදු "මුනි" නම්වෙත්. එහින් කීහ. "මුනීති, මොනං
වුච්චති ඤාණං යා පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිච
යො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා, පණ්ඩිච්චං කො
සල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උපපරික්ඛා භූරි මෙධා පරි
ණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං
පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො

පඤ්ඤාඔභාසො පඤ්ඤා පජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි තෙන ඤාණෙන සමන්නාගතො භගවා මුනිමොනප්පත්තො"ති. නොහොත් කායමෞනෙය්‍යය, වාක් මෞනෙය්‍යය, මනොමෞනෙය්‍යය යන ත්‍රිවිධ මෞනෙය ධර්මයෙන් යුක්තවූ මුනිහු සදෙනෙක්වෙත්, ඔහු කවරහුත්? කීයේ මැනො "ඉමෙහි මොනෙය්‍යෙහි ධම්මෙහි සමන්නාගතා ඡමුනිනො (i) අගාර මුනිනො (ii) අනගාර මුනිනො (iii) සෙඛ මුනිනො (iv) අසෙඛමුනිනො (v) පච්චෙක මුනිනො (vi) මුනි මුනිනො. (i) කතමෙ අගාර මුනිනො? යෙතෙ අගාරිකා දිට්ඨපදා විඤ්ඤාතසාසනා ඉමෙ අගාරමුනිනො (ii) කතමෙ අනගාර මුනිනො? යෙතෙ පබ්බජිතා දිට්ඨපදා විඤ්ඤාතසාසනා ඉමෙ අනගාර මුනිනො (iii) සත්ත සෙඛා සෙඛමුනිනො (iv) අරහන්තො අසෙඛමුනිනො (v) පච්චෙකබුද්ධා පච්චෙකමුනිනො (vi) මුනි මුනිනො වුච්චන්ති තථාගතා අරහන්තො සම්මා සම්බුද්ධා"ති. මෙසෙසින් ෂඩ්විධ මුනීන් කෙරෙහි "මුනි මුනී" නම් ලද බුදුහු තුමූහු මුනීනට ප්‍රධානවන බැවින් "මුනිඳු" නම් වෙත්]—ධර්මප්‍රදීපිකාව.

2. ඇ ම  ප ම ණින් පැවසූ මුනි දැන ත  තූ
   මෙ ම  හැම දෙන බලවසි දැක්වියසු  තූ
   ත  ම  ත ම නැණ පමණින් දැනගතසු  තූ
   ම  ම  න ම දිමි සදහම් පැහැදි සි  තූ

මුනි, සර්වඥයන්වහන්සේ (විසින්); තතුදැන,(ලොකසත්වයාගේ) තත්වය ජානනයකොට; ඇම්පමණින්,සකල ප්‍රමාණයෙන් හෙවත් සියල්ලන්ගේ ප්‍රමාණවශයෙන්; පැවසූ, ප්‍රකාශකරණලද්දවූ; හැම දෙන, සකලජනයෙහි; මෙම බලවසි, මෙයම (මේ ධර්මයම) අවලොකණයකරවයි; දැක්වියයුතු, දර්ශනයකරවියයුතුවූ; තම තම නැණපමණින්, (එකිනෙක තැනැත්තා) ස්වකීය ඥානශක්ති ප්‍රමාණයෙන්; දැනගතයුතු, අවබොධකළයුතුවූ; සදහම්, සද්ධර්මය; පැහැදී සිතු, ප්‍රසාදවූ චිත්තයෙන්; මමනමදිමි, මම නමස්කාර කරමි.

**ඇම්පමණින් පැවසූ මුනි දැනතතු**—සර්වඥයන් වහන්සේ විසින් ලොකසත්වයාගේ තත්වය මනාසේ දැන ඒ සත්වයාට සුබාවබොධයවනසේ ධර්මය දෙශනාකොට තිබෙනබ. ඒ ධර්ම ගුණ පාඨයෙහි "ස්වාක්ඛාතො භගවතා ධම්මො" (භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාකොට වදාරණලද්දේය) යනු වෙත් ප්‍රත්‍යක්ෂවේ.

**මෙම හැමදෙන බලවයි දක්වියයුතු**—මේ සප්‍තත්‍රිංශද් බෝධිපාක්ෂික නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය ඉතා ආශ්චර්‍ය්‍ය හෙයින් මෙහි අවුත් බලවයි කියා ආමන්ත්‍රණයට සුදුසුවූබව ධර්මානුස්මෘති භාවනාවෙහි "එහි පස්සිකො" (මෙහි එව, මෙය බලවයි කියා ප්‍රකාශ කිරීමට සුදුසුවන්නේය) යනුවෙන් ස්ඵුටවේ.

**තම තම නැණපමණින් දනගතයුතු**—එක එක තැනැත්තාගේ ප්‍රඥාවේ ප්‍රමාණයට ධර්මාවබොධය කටයුතුබැව් දක්වයි. අන්‍ය ඉගැන්වීම්වලමෙන් නොව බුද්ධධර්මය එකිනෙකා තැනැත්තාට තමාගේම නුවණ මෙහෙයා දැන ඉගෙණ එහි අගය අවබොධවූ ඉක්බිති ග්‍රහණය කිරීමට අවකාශ ඇත්තේය.

**සදහම්**—සත්පුරුෂවූ බුද්ධාදී උතුමන්ගේ දහම් සදහම් නම්. "චතුසු අපායෙසු පතමානෙ සත්තෙ අපතමානෙ කත්වා ධාරෙතීති ධම්මො" යනුවෙන් සතර අපායෙහි පතිතවන්නාවූ සත්‍වයන් ඉන් නගා ධරණාර්ථයෙන් ධර්ම නම්වේ. සත්‍වයෝ සද්ධර්මය ඇසීමෙන් බැලීමෙන් දස අකුසල ධර්මයන්ගෙන්වන අනිෂ්ට විපාකාදිය සලකා එයින් මිදී දස කුසල ධර්මයන්හි හැසිරෙමින් දෙව්මිනිස් සැප හා කෙළවර නිර්වාණ සැපතටද පැමිණෙත්.

**3. සිරිමත් බඹ සිරසෙහි පා පිසි නා**
**සැරියුත් මහ මුගලන් පිළිවෙළි නා**
**පිළිවෙත් සරු මහ සඟගණ සොබ නා**
**මුදුනත් බැඳ නම දිමි බැති පෙමි නා**

සිරිමත්, ශ්‍රීමත්වූ; බඹසිරසෙහි, බ්‍රහ්මයන්ගේ ශීර්ෂයෙහි; පා පිසිනා, පාද පූජ්‍ය්‍ය කරන්නාවූ; සැරියුත් මහමුගලන්, ශාරිපුත්‍ර මහාමෞද්ගල්‍යායන (මහා සංඝයාගේ); පිළිවෙළිනා, පටිපාටියෙන් ආවාවූ; පිළිවෙත්සරු, ප්‍රතිපත්තිසාරවූ හෙවත් මහාප්‍රතිපත්තියෙන් යුක්තවූ; සොබනා, ශොභනවූ; මහසඟගණ (අෂ්ටාර්‍ය්‍ය පුද්ගල) මහා සංඝ සමූහයා; මුදුනත්බැඳ, මස්තකාඤ්ජලී බඳකොට; බැති පෙමිනා, භක්ති ප්‍රේමයෙන්; නමදිමි, නමස්කාරකෙරෙමි.

**බඹ සිරසෙහි පාපිසිනා**—බ්‍රහ්මයන් විසින් නමස්කාරය පිණිස නමනලද තිස් මහාසඞ්ඝයාවහන්සේගේ පාද ස්පර්ශීවීමයි.

**සැරියුත් මහමුගලන්**—සාරිපුත්‍ර මහාමෞද්ගල්‍යායන යන දෙදෙනාවහන්සේ වනාහි අප (ගෞතම) සර්වඥරාජොත්තමයාණන්වහන්සේගේ අග්‍රශ්‍රාවක දෙදෙනාවහන්සේවෙති. උන්වහන්සේලාගේ සංක්ෂෙප ජීවිත කථාව මෙසේයි. මේ මහා භද්‍රකල්පයට එකාසඞ්ඛ්‍ය කල්පලක්ෂයකින් යට අනොමදස්සි නම් සම්මා

සම්බුදුන් සමයෙහි සැරියුත් මහතෙරුන්වහන්සේ සරද නම් තාපසව සුසැත්තෑ දහසක් පමණ තපස්වීන් පිරිවරණලදුව හිමාලවනයෙහි එක්තරා පන්සැලක වසන සමයෙහි ලක්ෂයක් මහරහතන් හා සමග නමන්වහන්සේගේ පන්සැලට වැඩියාවූ බුදුන් දැක පැහැද වනමුල් ඵලාහාරයෙන් සන්තර්පණයකරවා ලක්ෂයක් මල්ආසනපණවා සතරගව්වක්උස මලස්නෙක බුදුන් වඩාහිඳුවා තුන්ගව් උස මලසුන්වල අගසව් දෙදෙනාවහන්සේ වඩාහිඳුවා ගව්දෙගව්උස මලසුන්වල සෙසු රහතන් වඩාහිඳුවා බුදුන් මුදුනට මහත් මල්කුඩයක් මවා ඒ කුඩය අතින් අල්වා ගෙණ සත්දවසක් නිරාහාරයෙන් බුද්ධාලම්බන ප්‍රීතින්සිටධ්‍යාන සුවයෙන් වැඩඋන් බුදුපියාණන්ට මෙසේ පූජාකොට සත්වෙනිදා අගසව්දෙදෙනා බුදුන් අභිමුඛයේ හිඳ වදාරණලද බණ අසා "මමද බුදුකෙනෙකුන්ට අගසව්ව මුන්වහන්සේ සේම නුවනැතිව බණනිමවා දූන කියන්නවුන්කෙරෙන් අග්‍රවෙම්ව"යි කියා ප්‍රාර්ථනා කලසේක. බුදුහුද විවරණ පතුල්දුන්සේක. මුගලන් මහතෙරුන් වහන්සේ එසමයෙහි එම සරද තාපසයින්ගේ ගිහි යහළුවූ සිරිවඩ්ඪ නම් සිටුව මෙපවත් අසා "මමද මාගේ යහළුවානන් වහන්සේ කල ප්‍රාර්ථනාව කෙරෙමි"යි සිතා නිලුපුල්මලින් මණ්ඩපයක් නිමවා එහි බුදුන් ප්‍රධානවූ එක් ලක්ෂ සුසැත්තෑ දහසක් රහතන් පවරා වඩා හිඳුවා සත්දවසක් මහදන්දී "මමද මතු බුදුවන කෙනෙකුට විතීය ශ්‍රාවක වෙම්ව"යි ප්‍රාර්ථනා කලසේක. මෙසේ මේ දෙදෙනා වහන්සේ එකල පටන් එකාසංඛ්‍ය කප්ලක්ෂයක් මුළුල්ලෙහි ඔවුනොවුන් හා සමග මිත්‍ර ධර්මය රක්ෂාකොට දෙව්මිනිස් සැපත් එක්ව විඳ සසර සැරිසරා අවුත් අප බුදුරජානන්වහන්සේගේ කාලයෙහි සරද තාපසතෙම රජගහනුවරට නුදුරුවූ උපතිස්ස නම් බමුණුගම සාරි නම් බැමිණියගේ කුසයෙහිද ඔහුගේ යහළුවූ සිරිවඩ්ඪකෙලෙඹිතෙමේ රජගහනුවරටම නුදුරුවූ කෝලිතනම් බමුණුගම මොග්ගලී නම් බැමිණියගේ කුසයෙහිද පිළිසිඳ ගත්තෝය. ඒ දෙකුලයෝම වනාහී සත්වන කුලපරම්පරාව දක්වා පෙරපසු බැඳුණු මිත්‍ර සම්බන්ධ ඇත්තෝය. සාරි බැමිණියගේ පුතනුවන්ට උපතිස්සගම දෙටුකුලයාගේ දරුහෙයින් උපතිස්සයයිද මොග්ගලී බැමිණියගේ පුතනුවන්ට කෝලිත ගම දෙටුකුලයාගේ දරුහෙයින් කෝලිතයයිද නම් තුබූහ. ඔහුදෙදෙනම වර්ධනයට පැමිණ සියළු ශිල්පයන්ගේ පරතෙරට ගියාහුය. කෝලිත කුමාරයන් උයන්කෙළියට දියකෙළියට නික්මෙන වේලේ අසූන් යෙදූ රථ පන්සියයක් කැටුවයෙයි. උපතිස්ස කුමාරයන් සමග පන්සීයක් රන්සිවි ගෙවල් යෙයි.

දෙදෙනම පන්සීයක් පන්සීයක් පිරිවර ඇත්තාහුය. කෙළි නළු බලනකල දෙදෙන සමගිව හිඳ බලන්නාහ. එකල්හි රජගහනුවර අවුරුදුපතා පවත්වනුලබන "ගිරග්ග සමජ්ජ" නම් නැටුම්බක්විය. ඔවුන් දෙදෙනාද එක්ව හිඳ කෙළිනළු බලන්නාහු තමන්ගේ ශ්‍රාවක පාරමී ඥානය මුහුකුරා ගිය හෙයින් සංසාරයෙහි කාලකිරී නොසතුටුව "මේ කෙළි නම් සසරින් ගැලවී යන උපායෙක් නොවෙයි. මෙතැන්පටන් කෙළිනළු නොසොයා නිවන් සොයම්හ"යි මන්ත්‍රණයකොට කව්රුන් ගුරුකොට තපස් කරමෝදෝහෝයි පරීක්ෂා කරන්නාහු එසමයෙහි රජගහනුවර ලාභයෙන් යසයෙන් අග්‍රව වසන සංජය නම් පරිබ්‍රාජකයාගේ සවරූප අසා තමන්ගේ රථ හා සිවිගෙවල්ද පන්සීයක්දෙනා අත ගමටයවා ඉතිරි පන්සීයක් අත වැස්සන් හැරගෙනගොස් තවුස් වෙස්ගෙණ ඒ පරිබ්‍රාජකයන්කෙරේ වැස තමන් මහානුවනැතිහෙයින් උන්ගේ තීර්ථක සමයෙහි නිවන් මගක් නැතැයි දැන මුළුදඹදිව තෙසැට දහසක් රාජධානිවල ඇවිද නිවන්මග පානෘතරම් ගුරුකෙනෙකුත් නොලදින් නැවත රජගහනුවරට අවුත් "අප දෙදෙනා අතරෙන් යම්කෙනෙක් පළමුව නිවන්මග දුටුමෝනම් ඔවුනොවුන්ට කියම්හ"යි මන්ත්‍රණයකොට වාසය කෙරෙති. එසමයෙහි අපගේ ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ ලොවුතුරා බුධත්වයට පැමිණ පවත්වනලද උතුම් දම්සක් ඇතිසේක් අනුක්‍රමයෙන් රජගහනුවරට වැද වේළුවනාරාම යෙහි වසනසේක. පස්වග වහන්දෑට අයත් අස්සජි මහතෙරුන් වහන්සේ මුළු දඹදිව ඇවිද බුදුන් උපන් පරිදි බොහෝ සතුන්ට කියා ලෝවැඩකොට නැවත රජගහනුවරට වැද වේළුවනාරාමයෙහිදී බුදුන් දැක එදුරු එහි ලැග දෙවන දවස් උදෑසනම් පාසිවුරුගෙන නුවරට වැද ගෙපිළිවෙලින් පිඩු සිඟනසේක. එසමයෙහි උපතිස්ස පරිබ්‍රාජකයෝ උන්වහන්සේ සිඟන්නා දැක මේ උපසමය ඉතා සන්සුන්වෙසකැයි පැහැද පසුපස්සේ ගොස් ඔබවළඳනා වේලෙහි තමන්ගේ පරිබ්‍රාජක පුටුවපිට වඩා හිඳුවා වළඳා අනතුයෙහි කෙණ්ඩිකාවෙන් පැන් අතටගෙන ලා මමසේ පළමුකොට ඇදුරුවනින් ආදර දක්වා ඉක්බිති මියුරු පිළිසඳර කථා පවත්වා "ස්වාමීනි, නුඹවහන්සේගේ ඉන්ද්‍රියයෝ ඉතා ප්‍රසන්නයහ. ඡවි වර්ණය පිරිසිදුය, ප්‍රභාස්වරය, නුඹගේ කායවාක් සමාචාරයෝද ඉතා ප්‍රියය, එසේහෙයින් නුඹ නිවන්මග දුටුහයි සිතමි. ඇවැත්නි, නුඹවහන්සේ කවරකෙනෙකුන් උදෙසා පැවිදිවූවහුද? ඔබගේ

ශාස්තෲන්වහන්සේ කවරහුද? නුඹවහන්සේ කවරකෙනෙකුන්ගේ ධර්මය රුස්වහුද්ද"යි විචාළෝ. එබසට තෙරුන්වහන්සේ "භවත, මාගේ ගුරුන්නාන්සේ සර්වඥභගවාදත් බුද්ධරජය. මම ඒ භාග්‍යවතුන්වහන්සේ උදෙසා පැවිදිවූවෙක්මි. උන්වහන්සේම මාගේ ශාස්තෲවනසේක. මම උන්වහන්සේගේම ධර්මය රුස්නෙමි"යි වදාලහ. පරිබ්‍රාජකයෝ කියන්නාහු "ස්වාමිනි එසේවීනම් ගුරුන් වදාලෙන් අවවාද පදයක් අපටද දී වදාළ මැනව"යි කීහ. අස්සජි මහතෙරුන්වහන්සේ "මේ පරිබ්‍රාජකවරු නම් බුද්ධ සස්නට ප්‍රතිපක්ෂයහ. එසේහෙයින් මෝනට බුදුන්ගේ ධර්මය ගරුබව හඟවා හයගන්වමි"යි සිතාලා "ඇවැත්නි, මම වනාහි අළුත් ශ්‍රමණ කෙනෙක්මි, පැවිදිව නොබෝකල් ඇත්තෙමි. දහම් ඉතා ගරුය, විශේෂයෙන් තව හඟවාලීම මට නුපුළුවනැ"යි වදාලසේක. පරිබ්‍රාජකතෙම කියනුයේ "උපතිස්ස පරිබ්‍රාජකනම් මමය. නුඹවහන්සේ මට බොහෝකොට වදරා දුක් නොගතමැනව. එකනයකින් සංක්ෂෙපකොට කිවමැනව. එවිට ඒ ධර්මය නය සියයකින් නය දහසකින් ප්‍රතිවෙධ කරන්ට නුවණැතියෙමි"යි කීහ. එකල්හි මහතෙරුන්වහන්සේ—

"යෙ ධම්මා හෙතුප්පභවා, තෙසං හෙතුං තථාගතො,
ආහ තෙසංච යො නිරොධො, එවං වාදී මහා සමණො".

යනුවෙන් "අවිද්‍යාදිවූ යම්හෙතු ධර්ම කෙනෙකුන් නිසා හටගන්නාවූ සංස්කාරාදිවූ යම්ඵල ධර්ම කෙනෙක් ඇද්ද, ඒ ඵල ධර්මයන් සම්බන්ධවූ හෙතු ධර්මය අප තථාගතයන්වහන්සේ වදාලසේක. (ඒ හෙතු ධර්මයන්ගේ නිරොධයෙන් ඵල ධර්මයන්ගේ නිරොධයවෙයි යන) ඔවුන්ගේ යම් නිරොධයෙක් ඇද්ද, හෙද තථාගතයන්වහන්සේ වදාලසේක. මහා ශ්‍රමණවූ අපගේ ශාස්තෲන්වහන්සේ මෙබඳු වාද ඇතිසේකැ"යි මේ ගාථාව වදාලසේක. ගාථාවේ පළමුදෙපදය ඇසූ පමණකින් පරිබ්‍රාජකතෙමේ දහසක් නයින් යුත් සෝවාන් පෙලෙහි පිහිටියේය. අනනා දෙපදයී සෝවාන්ව සිට අසා සාධුකාරදී පසඟ පිහිටුවා තෙරුන්වහන්සේ වැඳ සමුගෙණ තම මිත්‍ර කෝලිත පරිබ්‍රාජකයන් කරාගොස් තමන් නිවන් අවබොධ කළබවත් බුදුන් උපන්බවත් කියා ඉක්බිති තමන් ඉගෙණගත් ගාථාවද පැවසීය. ගාථා කෙළවරෙහිදී කොලිත පරිබ්‍රාජකතෙමේ සෝවාන් පෙලෙහි පිහිටියේය. ඉක්බිති දෙදෙනාම "සංජය පරිබ්‍රාජකයන්ටත් අප ලද නිවන් රස දෙම්හ"යි ඔවුන්ගේ

ආරාමයට ගොස් "ආචාරිනි, නුඹවහන්සේ කුමක්කරන්නාහුද? බුදුරජාණන්වහන්සේ ලොව පහළවූසේක. යම්හ, ඒ බුදුන් දක්නෙමු"යයි කීහ. සංජය පරිබ්‍රාජකතෙමේ ඔවුන්ගේ බස් නොගිවිස්සේය. ඔහු දෙදෙන නොයෙක් සියගණන් කරුණු දක්වාත් තම ආචාරීන් කැමතිකරගත නුහුනුවාහු තමන් අවවාදයෙහි පවත්නා පිරිසගෙන වේළුවනාරාමයට ගියහ. ඔවුන්ගේ පන්සියක් අතවැස්සන් අතුරෙන් දෙසිය පණස් දෙනෙකු ගුරුන්කෙරෙහි කරුණාවෙන් රඳපිහ. අනිත් දෙසිය පණස්දෙන ඔවුන් හා කැටිවම නික්මුනාහ. එකල්හි ශාස්තෲන්වහන්සේ සිව්වණක් පිරිස්මැද දහම්දෙසනසේක්, ඔවුන් දුරදීම දුක වදාරා භික්ෂූන්ට ආමන්ත්‍රණයකොට, "මහණෙනි, මාකරාඑන තෙල පරිබ්‍රාජකවරු දෙදෙන මගේ සර්වඥ නමැති දිව්‍ය රථය අලංකාර කරන්නාවූ දිව්‍ය චක්‍ර යුග්මයක්සේ ඇතිවන මගේ අගසව් දෙදෙන වන්නෝය"යි වදාළසේක. පරිබ්‍රාජක දෙදෙනා සහ පිරිවරත් බුදුන්කරා අවුදින් පසඟ පිහිටුවා වැඳ එකත්පස්ව හිඳ "ස්වාමීනි, නුඹ වහන්සේගේ ශාසනයෙහි පැවිදි ලබමෝද්ද"යි විචාළහ. එකෙණෙහි බුදුහු දක්ෂිණ ශ්‍රීහස්තය දිගුකොට "එථ භික්ඛවෙ ස්වාක්ඛාතො ධම්මො චරථ බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්ත කිරියාය"යි වදාළසේක. එකෙණෙහි හැමදෙනම ඍද්ධිමයවූ පාත්‍රා සිවුරු ලදින් වර්ෂ ශතයක් ගුණදම් පිරූ මහතෙර පෙළක්සේ වැඩඋන්සේක. ඉක්බිත්තෙන් බුදුහු ධර්මදෙශනා කළහ. අගසව් දෙදෙනා වහන්සේ හැර අවශෙෂවූ දෙසිය පණස්දෙනාවහන්සේම රහත්වූසේක. මුගලන් මහතෙරුන් වහන්සේ පැවිදිවූ සත්දවසින් මගධරට "කලලවාල"නම් ගමදී බුදුන් විසින් දුන්නාවූ ධාතු කර්මස්ථානය අසා මතු මාර්ගත්‍රය ඥානය නිමවා ශ්‍රාවක පාරමිතාඥානය මස්තක ප්‍රාප්තකළසේක. සැරියුත් මහතෙරුන්වහන්සේද පැවිදිවූ පසළොස් දවසකින් ශාස්තෲන්වහන්සේ හා සමග එම රජගහනුවර නිසා "සූකර ඛතලෙණ" නම් ගල්ගුහායෙහි වැඩවසනුවෝ තමන්වහන්සේගේ බෑනණියන්පුත් "දීඝනඛ" නම් පරිබ්‍රාජකයාහට බුදුරජාණන්වහන්සේ විසින් දෙශනාකළ වෙදනා පරිග්‍රහ සූත්‍ර දෙශනාව අසා ඒ අනුසාරයෙන් ඥානය මෙහෙයා අනිකක්හට වැඩූ බතක් උදුරාගෙණ කන්නාසේ සෙසු තුන් මාර්ග ඵලයන් පැමිණීමෙන් අග්‍රශ්‍රාවක ඥානයෙහි මුදුන් පැමිණිසේක. මෙසේ මේ දෙදෙනා වහන්සේගේ ශ්‍රාවක පාරමී ඥානය භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර වැඩවසනා කල්හිම මස්තක ප්‍රාප්තවී-

ඉන් මැතභාගයෙහි බුදුරජාණන්වහන්සේ "මහාපඤ්ඤානං යදිදං සාරිපුත්තො, ඉද්ධිමන්තානං යදිදං මොග්ගල්ලානො" යි වදාරා දම්සෙනෙවි සැරියුත් මහතෙරුන්වහන්සේ මහාප්‍රාඥවූ ශ්‍රාවකයන් අතුරෙන් අග්‍රසේකැයිද, මුගලන් මහතෙරුන් වහන්සේ ඉද්ධිමත් ශ්‍රාවකයන් අතුරෙන් අග්‍රසේකැයිද මේ මහා ශ්‍රාවකයන් දෙදෙනා වහන්සේ අග්‍රස්ථානාන්තරයෙහි තබා වදාළසේක.

**සැරියුත් මහමුගලන් පිළිවෙළිනා**—සැරියුත් මහමුගලන් යන දෑග සව්වන් වහන්සේලාගෙන් පිළිවෙළ කඩනොවී පැවත ආවාවූ :

**පිළිවෙත් සරු**—ප්‍රතිපත්ති මනාසේ ආරක්ෂා කරණහෙයින් (ප්‍රතිපත්ති සාරවූ) "පිළිවෙත් සරු" යන්න යෙදේ. මහාසංඝයා වහන්සේ කෙරෙහි විද්‍යමාන ගුණ හා ප්‍රතිපත්ති සංඝානුස්මෘති භාවනාවෙහි පැණේ. ඒ මෙසේයි–"සුපටිපන්නො භගවතො සාවක සංඝො උජුපටිපන්නො භගවතො සාවක සංඝො ඤාය පටිපන්නො භගවතො සාවක සංඝො සාමීචි පටිපන්නො භගවතො සාවක සංඝො යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨ පුරිසපුග්ගලා එස භගවතො සාවක සංඝො ආහුණෙය්‍යො පාහුණෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති."

මෙහි සංඝයා කෙරෙහි විද්‍යමානවූ ගුණ නවයක් ප්‍රකාශවේ. එනම් :-

1. සුපටිපණ්ණො—මනාව පිළිපන්සේක.
2. උජුපටිපණ්ණො—ඍජුව පිළිපන්සේක.
3. ඤායපටිපණ්ණො—ඤායනම්ලද නිවන් සඳහා පිළිපන්සේක.
4. සාමීචිපටිපණ්ණො—නිවණට අනුකූල පිළිවෙත පිළිපන්සේක.
5. ආහුණෙය්‍යො—පූජාවට සුදුසුසේක.
6. පාහුණෙය්‍යො—අමුතු පඬුරු පිළිගැන්මට සුදුසුසේක.
7. දක්ඛිණෙය්‍යො—දක්ෂිණාවට සුදුසුසේක.
8. අඤ්ජලිකරණීයො—දෙහොත් මුදුනේදී කරණ නමස්කාරයට සුදුසුසේක.
9. අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස—ලෝවැස්සාගේ උත්තම පුණ්‍යධාන්‍යයන් වැපිරීමට පින්කෙතය.

**මහසඟගණ**—පූර්වෝක්ත සඞ්ඝානුස්මෘති භාවනාවෙහි "චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිස පුග්ගලා" යනුවෙන් දක්වනලද පුරුෂ යුග සතර නම් සිව්මගපල පිහිටි අෂ්ටාර්‍ය්‍ය පුද්ගලයෝ වෙති.

එනම් :-

| | | |
|---|---|---|
| 1. | සෝවාන් මාර්ගස්ථ පුද්ගලයෝය | යුගවශයෙන් 1 |
| 2. | සෝවාන් ඵලස්ථ පුද්ගලයෝය | |
| 3. | සකෘදාගාමි මාර්ගස්ථ පුද්ගලයෝය | යුගවශයෙන් 2 |
| 4. | සකෘදාගාමි ඵලස්ථ පුද්ගලයෝය | |
| 5. | අනාගාමි මාර්ගස්ථ පුද්ගලයෝය | යුගවශයෙන් 3 |
| 6. | අනාගාමි ඵලස්ථ පුද්ගලයෝය | |
| 7. | අර්හත් මාර්ගස්ථ පුද්ගලයෝය | යුගවශයෙන් 4 |
| 8. | අර්හත් ඵලස්ථ පුද්ගලයෝය | |

**සඟන** —"සමූහට්ඨෙන සඞ්ඝො, සමාන සංවාසකා අනෙක භික්ඛු සතසහස්සානි එකසීමායං සමග්ගා සම්මොදමානා උපොසථ පවාරණාදීනි කම්මානි කරොන්තීති සඞ්ඝො, එක භික්ඛුපි පාතිමොක්ඛ සංවරාදයො සීලසමූහං ධාරෙති රක්ඛති ගොපයතීති සඞ්ඝො, දිට්ඨි කිලෙස සඞ්ඝාතනතො සොතාපත්ති මග්ගඵලාදයො ලොකුත්තර ධම්ම සමූහං අධිගච්ඡතීති සඞ්ඝො"—"සමූහට්ඨෙන සංඝො" යී යනුවෙන් දක්වනලද සමාන සංවාසික නොයෙක් සියදහස් ගණන් භික්ෂූහු එක සීමාවෙක්හි රැස්ව සමගි සතුටුව පොහෝ පවාරණාදියට එළඹ ඒ ඒ විනය ධර්මයන් කරණ බැවින් සංඝ නම්වෙති. තවද එක උපසම්පද භික්ෂු නමක්වූයේවී නමුත් ප්‍රාතිමොක්ෂ සංවර ශීලය ආජීව පාරිශුද්ධි ශීලය ආදිවූ අනෙක ප්‍රකාර ශිල සමූහයන් ධරණාවියෙන්ද සංඝ නම්වේ. තවද දෙසැට මිථ්‍යාදෘෂ්ටියද ඒ දෘෂ්ටීන් නිසා උපදනා කෙලශ සමූහයන්ද ඝාතනයකොට සෝවාන් මාර්ග ඵලාදි ඒ ඒ මාර්ග පිළිවෙළින් නිර්වාණාධිගමයට පැමිණෙන හෙයින්ද සංඝ නම්වේ.

4. ම න ර ම් නරද ම් සැරිද ම් සඟන ට
මෙලෙසින් බැතියෙන් අදරි න් නම්කො ට
පෙළෙසින් පෙළද ම් නොමදන් දනහ ට
ප ව ස ම් කළක ම් පළද න් හෙළකො ට

මනරම්, මනොරම්‍යවූ හෙවත් සිත්ප්‍රියකරන්නාවූ; නරදම්සැරි, නරදම්‍ය සාරථිවූ බුදුරජාණන් වහන්සේටද; දම්, ශ්‍රීසද්ධර්මයටද; සඟනට, (අෂ්ටාර්‍ය පුද්ගල) මහා සඞ්ඝ රත්නයටද; මෙලෙසින්, මෙයාකාරයෙන්; බැතියෙන් අදරින්, භක්ත්‍යාදරයෙන්; නම්කොට, නමස්කාරකොට; පෙළෙසින්, විශෙෂයෙන්; පෙළදම්, පාලි (ත්‍රිපිටක) ධර්මය; නොමදන්, ඤානය නොකළාවූ; දනහට, ජනයාහට; කළ කම්පල, කරණලද්දාවූ කුසලාකුසල කර්මයන්ගේ ඵලය; හෙළකොට, එළුවට නගා හෙවත් සිංහල භාෂාවට පරිවර්තනයකොට; දැන්, මේ අවස්ථාවෙහි; පවසම්, ප්‍රකාශකරමි,

**නරදම්සැරි**—නරයන් (මනුෂ්‍යයන්) දමනයකිරීමෙහි සාරථිවූයේ "නරදම්සැරි" නම්වේ. මෙය "පුරුෂ දම්‍ය සාරථි" යන්න හා සමානාර්ථ ඇත්තේ වේ.

**තෙපලදම්**—බුද්ධධර්මය, i **පෙළ** ii **අටුවා** iii **ටීකා** කියා **පොත් පඞ්ක්ති** තුණකට බෙදේ.

i **පෙළ**-(දීක්සඟිය, මැදුම්සඟිය, සංයුත්සඟිය, අඞ්ගුත්තර සඟිය, ඛුද්දගොත්සඟිය යන බෙදීම් පහකින්යුත්) සූත්‍ර පිටක යද; (පාරාජිකා, පචිති, සුලුවග, මහවග, පරිවාර පාඨ යන බෙදීම් පහකින්යුත්) විනය පිටකයද; (ධම්ම සඟිනී, විභඞ්ග, කථාවත්ථු, පුග්ගලපඤ්ඤත්ති, ධාතුකථා, යමක, පට්ඨාන යන බෙදීම් හතකින්යුත්) අභිධර්ම පිටකයද; යන පිටකත්‍රයට අයත් පෙළ පොත් 17 කි. ශ්‍රී මුඛදෙශනාව එහි ඇතුළත්ව තිබෙන බැවින් ඒට දෙශනා පෙළ පොත්යයි කියනු ලැබේ.

ii **අටුවා**-ශ්‍රීමුඛ දෙශනාව විස්තරකර වදාළාවූ බුදුරජාණන් වහන්සේගේම ප්‍රකීර්ණක දෙශනාවට අටුවායයි කියනු ලැබේ.

iii **ටීකා**-අටුවා පාළිය විස්තරකොට ත්‍රිපිටකධාරී මහාස්ථවිර යන්විසින් රචනා කරණලද පොත් ටීකා පාලියයි කියනු ලැබේ.

**කම්ඵල**—i ජනක, ii උපස්තම්භක, iii උපපීඩක, iv උපඝාතකයයි **කෘත්‍යවශයෙන් සතරෙක්ද**; v යද්ගරුක, vi යදාසන්න vii යත් බහුල (ආචීර්ණ,) viii කෘතත්වාත්යයි **විපාකදානානු ක්‍රමයෙන් සතරෙක්ද**; ix දෘෂ්ටධර්මවෙද්‍ය, x උපපද්‍යවෙද්‍ය, xi අපරාපර්‍යාය වෙද්‍ය xii අහොසියයි **විපාකදානකාලවශයෙන් සතරෙක්ද**; xiii අකුසලකර්ම, xiv කාමාවචර කුසලකර්ම xv රූපාවචරකුසල කර්ම, xvi අරූපාවචර කුසල කර්මයයි **විපාක භූමි වශයෙන් සතරෙක් දැයි මෙසේ කර්ම ප්‍රභෙදය ෂොඩශ (16) විධවේ.**

i **ජනකකර්ම.** "ජනෙතීති ජනකං"-යම්කර්මයක් ප්‍රතිසන්ධියගෙණ දෙයිද එහි ජනක කර්මනම්වෙයි.

ii **උපස්තම්භක කර්ම.** "උපත්ථම්භෙතීති උපත්ථම්භකං"-උපදවා විපාකදෙන කර්මයටවන අනතුරය වැළැක්වීමෙන් උපස්ථම්භ වන්නාවූ හෙවත් සුගති දුර්ගති දෙක්හි සත්වයන් ජනක කර්ම යෙන් ඉපදවූකල සුගතිය උපන්නවුන් සුවයෙන් පිරිහියනොදී දුර්ගතිය උපන්නවුන් දුකින් පිරිහියනොදී (පරණ ගෙයක් නොවැටෙනලෙස දෙවනු සවිකරණලද කනුමෙන්) සුවදුක් දෙකට පිහිටවන්නේ උපස්ථම්භක කර්මනම්වේ.

iii **උපපීඩක කර්ම.** "උපගන්ත්වා පීළෙතීති උපපීළකං"-අන්කර්මය කින් දෙනලද පිළිසඳෙහි විපාකය උපන්කල්හි හටගත් සුවදුක් දෙකට පීඩාකරණ බාධාකරණ කාලක් පැවැත්මට අවකාශ නොදෙන කර්මය උපපීඩකනම්. කුසල කර්මය විපාකදෙන කල්හි අකුසල කර්මය උපපීඩකව හෙවත් ඇමිපයට පැමිණ පීඩාකරන්නෙක්ව ඒ කුසල කර්මයාගේ විපාකය විඳීමට ඉඩ නොදෙයි. අකුසලකර්මය විපාකදෙනකල්හි කුසලකර්මය උප පීඩකව ඒ අකුසල කර්මයාගේ විපාකය විඳීමට ඉඩනොදෙයි. යම්සේ වැඩෙන්නාවූ රුකක් හෝ වැලක් හෝ කිසිවෙක් දණ්ඩකින් හෝ ආයුධයකින් හෝ බිඳින්නේ හෝ වෙයිද? සිඳින්නේ හෝ වෙයිද? ඒ රුක් ආදිය වැඩෙන්ට නොහැකි වන්නේය. එපරිද්දෙන්ම විපාක දෙනුලබන්නාවූ කුසල කර්මය අකුසල කර්මයෙන් පෙළනලද්දේද් අකුසල් කර්මය හෝ කුසල කර්මයෙන් පෙළනලද්දේ විපාකදීමට නොහැකිවෙයි.

iv **උපඝාතක කර්ම.** "උපගන්ත්වා ඝාතෙතීති උපඝාතකං"-යම් කර්මයක් කුසල් හෝ අකුසල් හෝ වේද ඒ කුසලාකුසල කර්මයන්කරා අන් කර්මයක් පැමිණ ඒ කුසලාකුසල කර්මයාගේ විපාකය වළක්වාද හේ උපඝාතක නම්වේ.

v **යද්ගරුක කර්ම.** "කුසලංවා හොතු අකුසලං ගරුකා ගරුකෙසු යං ගරුකං, අකුසල පක්ඛෙ මාතුඝාතකාදි කම්මං කුසල පක්ඛෙ මහග්ගත කම්මංවා තදෙව පඨමං විපච්චති"-කුසල යක් හෝ වේවා අකුශලයක් හෝ වේවා බැරෑරුම්වූද බැරෑරුම් නොවූද කර්මයන් අතුරෙන් යම් බැරෑරුම් කර්මයක් වෙයිද, අකුසල පක්ෂයට ඒකාන්තයෙන් අපායෙහි උපදවන මාතෘ ඝාතක, පිතෘඝාතක, අරහන්ත ඝාතක, ලොහිතුප්පාද සඞ්ඝ භෙද යන පඤ්චානන්තරිය කර්මයද, කුසල පක්ෂයට ඒකාන්ත යෙන් බ්‍රහ්මලොව උපදවන අෂ්ටසමාපත්ත්‍යාදියද යද්ගරුක කර්මනම්වේ.

vi **යදාසන්න කර්ම.** "යං පන කුසලාකුසලෙසු ආසන්න මරණෙ අනුස්සරිතුං සක්කොති, තං යදාසන්නං නාම"-කරණලද කුසල් අකුසල් අතුරෙන් මරණාසන්න කාලයෙහි යමක් සිහි කරන්ට හැකිවෙයිද? එසේ සිහිකරණලද කර්මය යදාසන්න නම්.

vii **යබ්බහුල කර්ම.** "කුසලාකුසලෙසු පන යං බහුලංහොති තං යබ්බහුලං නාම"-කුසලාකුසලයන් අතුරෙන් නිතර කරණ ලද්දාවූ කර්මයෝ යත්බහුල (ආචිණ්ණ) නම්.

viii **කෘතත්වාත්කර්ම.** "කටත්තා කම්මන්ති ගරුකාදිභාවං අසම්පත්තං කතමත්තත්තායෙව කම්මන්ති වත්තබ්බං කම්මං" - පූර්වොක්ත යද්ගරුක, යදාසන්න, යත්බහුල යන මේ තුන් ආකාරයට නොපැමිණියාවූ අන්‍ය වශයෙන් කරණලද කර්මය කෘතත්වාත් නම්වේ.

ix **දෘෂ්ට ධර්ම වේද්‍ය කර්ම.** "දිට්ඨ ධම්මො පච්චක්ඛ භූතො පච්චුප්පන්නො අත්තභාවො තත්ථ විපාකානුභවනවසෙනාති වෙදිතබ්බං" - ඉහාත්ම භාවයෙහි (එම අත්බැව්හිදීම) විපාකගෙණ දෙන කුසලාකුසලකර්මය දෘෂ්ට ධර්ම වේද්‍ය නම්වේ. මෙය පරිපක්ක වෙදනීය, අපරිපක්ක වෙදනීයයි ද්විප්‍රකාරවේ. පරිපක්ක යනු පැසුණු යන අර්ථයි. අපරිපක්ක යනු නොපැසුණු යන අර්ථයි. අධික ගුණවතුන්කෙරෙහි කරණලද්ද පරිපක්ක කර්මයි. ගුණහීනයන් කෙරෙහි කරණලද්ද අපරිපක්ක කර්මයි. පරිපක්ක කර්මය සත්දවසක් ඇතුලත විපාකදෙයි. ප්‍රථම වයස්හි කරණලද යම් කර්මයක්තෙම ප්‍රථමවයස්හි හෝ මැද වයස්හි හෝ අගවයස්හි හෝ විපාකදෙයිද, මධ්‍යම වයස්හි කරණලද යම් කර්මයක් මධ්‍යම වයස්හි හෝ අන්තිම වයස්හි හෝ විපාක දෙයිද අගවයස්හි කරණලද යම් කර්මයක් අග වයස්හිම විපාකදෙයිද ඒ සියල්ල අපරිපක්ක වෙදනීය නම්වේ.

x **උපපද්‍ය වේද්‍ය කර්ම.** "දිට්ඨධම්මතො අනන්තරං උප්පජ්ජිත්වා වෙදිතබ්බං උපපජ්ජවෙදනීයං" - අනන්තර භවයෙහි ඉපිද නොහොත් මරණින්මත්තෙහි පළමුවෙනි ආත්ම භාවයෙහිදී අනුභව කටයුතු විපාක ඇත්තේ උප පද්‍ය වේද්‍ය කර්මනම්වේ.

xi **අපරාපර්‍ය වේද්‍ය කර්ම.** "අපරෙ අපරෙ දිට්ඨ ධම්මතො අඤ්ඤස්මිං යත්ථ කත්ථචි අත්තභාවෙ වෙදිතබ්බං කම්මං අපරාපරිය වෙදනීයං" - ප්‍රත්‍යක්ෂ ආත්ම භාවය කෙරෙන් අන්‍යවූ යම්කිසි අවකාශලත් අත් බැවෙක්හි විපාකදෙන සුළුවූයේ අපරාපර්‍ය වේද්‍ය කර්මනම්වේ.

xii **අහෝසිකර්ම.** "අහොසි එව කම්මං න තස්ස විපාකො අහොසි අත්ථි භවිස්සතිවාති එවං වත්තබ්බං කම්මං අහොසි කම්මං" - විපාකදීමේ කාල නියමය ඉක්මගියාවූ කර්මය අහෝසිකර්ම නම්වේ.

xiii **අකුසලකර්ම.** සතර අපායෙහි ඝොරවූ දුක් හා මනුෂ්‍යලොකයෙහි ශොකපරිදෙවාදී නොයෙක් දුක්ගෙණදෙන දුසචඩ අකුසලය අකුසල කර්ම නම්වේ.

xiv **කාමාවචර කුසලකම්.** මනුෂ්‍ය ලොකයෙහි සහ සදිව්‍ය ලොකයෙහිද උපදවා සැපගෙණදෙන කුසල කම් කාමාවචර කුසල කම් නම්වේ.

xv **රූපාවචර කුසලකම්.** ෂොඩශවිධ බ්‍රහ්මලොකයන්හි උත්පත්ති කරවන භාවනාමයවූ රූපධ්‍යාන කුසල කර්මය රූපාවචර කුසලකර්ම නම්වේ.

xvi **අරූපාවචර කුසලකම්.** සතරවිධ අරූපි බ්‍රහ්මලොකයෙහි උත්පත්තිය කරවන භාවනාමයවූ අරූපධ්‍යාන කුසල කර්මය අරූපාවචර කුසල කර්මනම්වේ.

**5. ද හ ම ට සරිකොට එළුවෙන් පෙර කී**
**කා ව ය ට සිත පහද සිට නිසැ කී**
**සිහිකො ට කඳ පිළිවෙල දෙස් නොයෙ කී**
**නි ව ණ ට සපැමිණි සඟ සැට නම කී**

පෙර, පූර්වයෙහි; දහමට සරිකොට, ධර්මයට අනුරූපකොට හෙවත් ධර්මානුකූලව; එළුවෙන්, සිංහල භාෂාවෙන්; කී, කිවාවූ; කාව්‍යට, කාව්‍යයට; නිසැකී, නිශ්ශඞ්කීව හෙවත් සැකරහිතව; සිතපහදසිට, චිත්ත ප්‍රසන්නකොටගෙණ; නොයෙකී, අනෙකාකාරයෙන්; කඳපිළිවෙලදෙස්, ස්කන්ධ පටිපාටියෙහි දෙශයන්; සිහිකොට, ස්මරණයකොට; නිවණට, නිර්වාණයට; සපැමිණි, සම්ප්‍රාප්තවූ; සඟ සැටනමකී, සඞ්ඝයා සැටනමක්ය; (හෙවත් සැටනමකී සඟ, සැටනමක් සඞ්ඝයා; නිවණට සපැමිණි, නිර්වාණයට සම්ප්‍රාප්ත වූවෝයි.)

කඳ පිළිවෙල—ස්කන්ධයන්ගේ පිළිවෙළ සංක්ෂෙපයෙන් මෙහි දක්වනුලැබේ.

ස්කන්ධ රාශි හෙවත් කොටස් පසකට බෙදතිබේ. එනම් :-

i රූප, ii වේදනා, iii සඤ්ඤා, iv සඞ්ඛාර, v විඤ්ඤාණ යන මේ ස්කන්ධයෝ සස්වේදනා වෙති. මේ පඤ්චස්කන්ධයෝම එක එක සත්වයෙකු විසින් "මමය මාගේය"යි තෘෂ්ණා වශයෙන් අල්ලාගණු ලබන බැවින් ඒ ඒ සත්වයා අයත් ස්කන්ධ පඤ්චකයම ඕහට "උපාදාන ස්කන්ධ ලෝකය" නම්වේ. ඒ මේ පඤ්චස්කන්ධය "නාමය රූපය"යි ද්විප්‍රකාරවේ. එයින් රූපස්කන්ධය රූප නම්වේ. වේදනා, සඤ්ඤා, සඞ්ඛාර, විඤ්ඤාණ යන, සතර ස්කන්ධය නාම (හෙවත් අරූපස්කන්ධ) නම්වේ.

කවරහෙයකින් **නාම** නම්වීදයත්? රූපය නමාවෙන නමා ගන්නා අර්ථයෙන් **නාම** නම්වේ. [හේ මෙසේ දතයුතු:-යමි කියා සිත උපන්කල්හි මේ ශරීරය ඉදිරියට යන්නේය. එසේම **සිටිමි, හිඳිමි,** හෝ **නිදමි** කියා සිත උපන්කල්හි මේ ශරීරයද ඒ ඒ ක්‍රියාවෙහි නැමෙන්නේය. සිත උප උපන් ලෙසම රූපය ඒ ඒ ක්‍රියාවට නැමි නැමී පවත්නේය.]

**රූපස්කන්ධය**—"සීත උෂ්ණාදි විරුඬ හේතුන් කරණකොටගෙණ නැසෙන බිඳෙන ස්වභාව ධර්මරාශිය" යන අර්ථයෙන් **රූප ස්කන්ධ** නම්වූ මෙම ශරීරයෙහි **භූත රූප සතරක්** හා ඒ භූත රූපයන් සතර නිසා පවත්නා **උපාදාය රූප විසිහතරක්** දූයි **රූප ධර්ම විසිඅටක්** වෙත්. මේ හැර අහේතුක සප්පච්චයාදී වශයෙන්ද, අජ්ඣත්තික බාහිරාදි වශයෙන්ද, රූපකලාපාදී වශයෙන්ද රූපස්කන්ධයෙහි ප්‍රභේදයෝ අනෙක ප්‍රකාරවෙත්.

**භූත රූපයෝ නම්**—(i) පඨවි (ii) ආපො (iii) තෙජො (iv) වායො යන මේ සතරයි.

i **පඨවි ධාතුරූපය**:—ශරීරය පිළිබඳ තදවූ රළුගුණය ඇතිදූසිදේ සියල්ල **පඨවි ධාතුරූපයෙහි** අන්තර්ගතවේ. එබැවින් හිසකේ; ලොම්; නිය; දත්; සම්; මස්; නහර; ඇට; ඇටමිදුළු; වකුගඩුව; හෘදය; අක්මාව; දලබුව; බඩදිව; පපුව; බඩවැල; අතුනුබහන; උදරපටල; මල; හිස්මොල; යන මේ **කුණප** කොටස් **විස්ස** පඨවිධාතු රූපයයි දතයුතු.

ii **ආපොධාතු රූපය** :—ශරීරයෙහි පවත්නා වැගිරීම් ලක්ෂණවූ ද්‍රව්‍ය සමූහය ආපොධාතු රූපයෙහි ඇතුලත්වේ. එබැවින් පිත්; සෙම්; සැරව; ලේ; ඩහදිය; මෙදතෙල්; කඳුළු; වුරුණුතෙල්; කෙල; සොටු; සඳමිදුළු; මුත්‍ර යන මේ කුණප කොටස් **දොළස** ආපොධාතු රූපයයි දතයුතු.

iii **තෙජෝධාතු රූපය** :—ශරීරය පිළිබඳ උණුසුම් ගුණය හා පැසවන ලක්ෂණ ඇති යම් ද්‍රව්‍ය සමූහයක් ඇද්ද එය තෙජෝ ධාතු රූප නම්වේ. යම් තෙජෝ ගුණයකින් මේ ශරීර සන්තානය ශොක පරිදෙවාදිය ඇතිකල්හි තැවේද; යම් තෙජෝ ගුණයකින් මේ ශරීරය දවාද; යම් තෙජෝ ගුණයකින් ශරීරය ජරාභාවයට පමුණුවාද; යම් තෙජෝ ගුණයකින් අනුභවකල ආහාර පැසවීමට යෙයිද; ඒ මේ **සතර** ආකාර උසුණුම් ගුණය තෙජෝ ධාතු රූපයයි දතයුතු.

iv **වායෝධාතු රූපය** :—යාම් ඊම් ආදී සතර ඉරියව්වෙහි යොදවන්නාවූද; කෑම් පිම් ආදි ඒ ඒ ක්‍රියාවන් කරවන්නාවූද; ශරීරය පිළිබඳව පවත්නා යම් වායු කොට්ඨාසයක් ඇද්ද එය වායෝධාතු රූපය නම්වේ. i උද්ධංගම වාතය, ii අධෝගම වාතය, iii කුච්ඡිසය වාතය, iv කොට්ඨසය වාතය, v අඞ්ගමඞ්ගානුසාරී වාතය, vi ආශ්වාස ප්‍රාශ්වාස වාතයයි මෙය කොටස් හයකට බෙදේ.

i දෙපතුල පටන් සිරස දක්වා පවත්නා උඩුකුරුව ගමන් කරන්නාවූ වාතය **උද්ධංගම වාතය** නම්වේ. ii සිරස පටන් දෙපතුල දක්වා පවත්නා යටිකුරුව ගමන්කරණ වාතය **අධෝගම වාතය** නම්වේ. iii බඩවැල පිට හැසිරෙන වාතය **කුච්ඡිසය වාතයයි**. iv බඩවැල ඇතුලත හැසිරෙන වාතය **කොට්ඨසය වාතයයි**. v හස්තපාදාදී ශරීරයේ සියළු අඞ්ග ප්‍රත්‍යඞ්ගයන් ආශ්‍රිතව පවත්නා වාතය **අඞ්ගමඞ්ගානුසාරී වාතයයි**. මේවායු කොට්ඨාසයේ බලයෙන් ශරීර අවයවයන් අකුලන්ටත් දිගහරින්ටත් යාම්, ඊම්, ආදී සතර ඊර්යාපථයෙහිම සත්ත්වයා යොදවන්ටත් පුළුවන. vi හුස්මගැණීම හෙලීමේදී ශරීරයට ඇතුල්කරණ ශරීරයෙන් පිටකරණ වායු කොට්ඨාස **ආශ්වාස ප්‍රාශ්වාස වාත** නම්වේ.

“මහන්තා පාතු භූතාති මහාභූත සමානිවා,
වඤ්චකත්තා අභූතෙන මහාභූතාති සම්මතා.”

ඇත්ත ඇතිහැටි නොදක්වා වෙනස්කොට දක්වමින් අස්ථිර අජීව ශූන්‍ය මහාභූත ක්‍රියාකරණබැවින් භූතරූපයන්ට **සතර මහා භූතයෝ** යයි නම් කරතිබේ. මෙම ධාතුන්ගේ ශක්තියෙන් සිද්ධවන්නාවූ සියළු ක්‍රියා නිෂ්ඵලය. මනුෂ්‍යයන්මෙන්ද; තිරිසනුන්මෙන්ද; දිව්‍යරාජයන්මෙන්ද; දිව්‍යාඞ්ගනාවන්මෙන්ද; මේ ආදී සියළු ස්වභාව රූපවලින් ඒ ඒ දේ ඇතිහැටි වසා අනික් අනික් විධියකින් පෙන්නුම්කරණුලබන්නේ මේ චතුර්විධ ධාතුන්ගේ සංයෝගවීමෙනි. එහෙයින්ම මෙම ධාතු සතරේ අනුසාරයෙන් **රූපස්කන්ධ** සියල්ලක්ම සත්වාකාරයෙන් දක්වයි. කර්මාදීන්ගේ බලයෙන් එසේ සත්වාකාරයෙන් දක්වන රූපස්කන්ධ ස්ත්‍රී පුරුෂාදී වශයෙන් වෙන්කොට පෙන්නුම්කරයි. කැමති සත්වයෙක් කෙරෙහි අන්තර්ගත මෙම ධාතු සතර වෙනස්කොට කැබලිකොට ලිහා බැළුවොත් එම රූපස්කන්ධය කෙරෙහි පූර්වෝක්ත පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන ධාතු සතරම මුත් සත්වයාය කියා ගිණියහැකි යමක් අවිද්‍යමාන බැව් පෙණේ.

අපි අපගේ මුළු කාලයම මේ ධාතූන් පිණවීමෙහි කෘත්‍යය ගැන ගතකරමින් මේ ධාතූන්ට වාල්ව ආහරපාන, වස්ත්‍රාදීම් ආදී නානා උපස්ථානයෙන් නිරතුරු ඒවා සන්තර්පනය කිරීම පිණිස වෙහෙසෙන නමුත් යටදක්වනලද පරිදි මෙම ශරීරය ඇති සැටියට වඩා වෙනස් ආකාරයකින් යම් යම් දේ පෙන්නුම් කරන්නාවූ මහා වඤ්චාකාර මහාභූත ධාතූසතරකින් සමන්විත බැවින් ආහාර ගැනීමාදිය මෙම ධාතු සතර අලංකාර කිරීමට කරුණුලබන ප්‍රයත්නයක් පමණකි. මෙම ධාතු සතර පෙරළෙන ලක්ෂණ ඇති නිසා ආහාර මේ සතරට බෙදියයි.

සතර මහා භූතයන්ගෙන් එකක්වත් සදාකාලික නොවේ ඒවා සියල්ලක්ම නැගිවීම ස්වභාවකොට ඇතිබැවින් අනිත්‍යයි. එබැවින් දිරණසුළු ධාතූන්ගෙන් යුක්ත පිළිකුල් කටයුතු කාය නිත්‍යනොවේ. පෙරළෙන සුළුවේ. මේ නයින් ශරීරයෙහි අනිත්‍ය දුක්ඛ අනාත්ම යන ත්‍රිලක්ෂණය නුවණින් මෙනෙහිකොට සසර ආලය දුරුකිරීමෙහි වීර්‍ය්‍ය වැඩියයුතුයි.

මෙතැන්සිට සතර භූත රූපයන් නිසා පවත්නා සූවිසි උපාද රූපයන් ලුහුඬින් විස්තර කරණු ලැබේ,

i. යම් ද්‍රව්‍යයක පවත්නා නීල පීතාදිවූ වර්ණය, වටකුරු පැතලි ආදිවූ හැඩහුරුකම ආදී ඒ ඒ දේ තත්ත්වාකාරයෙන් දර්ශනය කරවන්නාවූ ඇස පිළිබඳව පවත්නා චක්ෂු ප්‍රසාද රූපයද;

ii. භෙරිවීනා මේඝ ගර්ජනාදී ශබ්දයන් ශ්‍රවණය කරවන්නාවූ කණ ආශ්‍රිතව පවත්නා ශ්‍රොත ප්‍රසාද රූපයද;

iii. මේ සුගඳ, දුගඳයයි ආඝ්‍රාණයකල ක්ෂණයකින්ම දැනගැනීමට හැකිවන්නාවූ නාසය ආශ්‍රයකොට පවත්නා ඝ්‍රාණ ප්‍රසාද රූපයද;

iv. කටුක තික්තාදී රසයන් දැනගැනීමෙහි අතිශය උපකාරීවූ දිව හා බැඳී පවත්නා ජිව්හා ප්‍රසාද රූපයද;

v. ශරීරයේ ඒ ඒ ස්ථානයන් පිළිබඳව පවත්නා හැඟීම්, රිදීම්, ස්පර්ශාදීන් මේ මේ යයි වෙන්වශයෙන් දැනගැනීම කරවන්නාවූ ශරීරය සම්බන්ධව පවත්නා කාය ප්‍රසාද රූපයදැයි;

මෙසේ චක්ෂු, ශ්‍රොත, ඝ්‍රාණ, ජිව්හා, කාය යන පඤ්චෙන්ද්‍රියයන් ඇසුරුකොට ඒ ඒ ස්ථාන හා බැඳී පවත්නා ප්‍රසාද රූපයෝ පස්දෙනෙක් වෙත්,

vi. ඇසට ගොචරවූ (පෙණෙන්නාවූ) **රූපාලම්බනයද;**

vii. කණට ගොදුරුවූ (ඇසෙන්නාවූ) ශබ්දාලම්බනයද;

viii. නාසයට විෂයවූ (දැනෙන්නාවූ) ගන්ධාලම්බනයද;

ix. දිවට විෂයවූ **රසාලම්බනය** දැයි **විෂයරූප (ගොචරරූප) සතරක්වේ.**

[**ගොචරරූපයක්** සම්පූර්ණවන්නේ පඨවී, ආපෝ, තේජෝ, වායෝ යන ධාතු සතරම ලැබීමෙනි. ආපෝ ධාතුව හැර අනිකුත් පඨවී, තේජෝ, වායෝ යන ධාතු තුන පමණක් ස්පර්ශවනහෙයින් ශරීරයට විෂයවූ **ස්පර්ශාලම්බනය** වෙන් වශයෙන් ගිණියයුතු නොවේ.]

x. ස්ත්‍රීභාවය, xi. පුරුෂ භාවයයි **භාවරූපය ද්විධවේ.**

බලවත් කුශලකර්මයෙහි විපාක වශයෙන් පුරුෂ භාවයත් දුර්වල කුසල කර්මයෙහි විපාක වශයෙන් ස්ත්‍රී භාවයත් සිදුවන බැවින් සත්වයාගේ පිළිසිඳ ගැන්මේදීම කර්ම විපාක බලයෙන් පුරුෂ භාවය හෝ ස්ත්‍රීභාවය ලැබ එය ක්‍රමයෙන් මුහුකුරාගොස් කල් යත් යත් පුරුෂයෙක් හෝ ස්ත්‍රියක් හෝ උත්පත්ති කරවයි. හස්ත පාදාදී අඞ්ග ප්‍රත්‍යඞ්ගයන්ගේ වෙනස් සවභාව (උස් පහත්) කටහඬ, ගමනාගමනය කරණ පිළිවෙල ආදී නා නා ක්‍රමයෙන් මේ පුරුෂයෙක, මේ ස්ත්‍රියකැයි වෙන් වශයෙන් හැඳින ගත හැකිවේ. එහෙයින්ම **භාවරූපයන්ගේ** වෙනස් සවභාව නිසා ස්ත්‍රී පුරුෂයන්ගේ අන්‍යොන්‍ය විපර්යාස ගති ක්‍රියා ලක්ෂණ ආදියේ ප්‍රභෙද මොනවට ප්‍රත්‍යක්ෂවේ.

xii. රත්පියුම් පෙත්තක පිට බඳු පැහැඇති පිටපෙති හැර යට බලා හැබූ පියුම් කැකුලක් බඳු සටහණින්යුත්, පිටහින් සිලුටුවූ ඇතුළු වැටකොළු ඵලයක් සමානවූ, තුවකැත්තෙන්ට මදක් විදහා සිටි, පෙකුණයත්ට හැකිලී සිටි, පෙඬ ඇටයක් ඇතුල් කිරීමට ප්‍රමාණවූ කුහරයකින් සමන්විත (රාග චරිතයාහට රක්තවර්ණවද, ද්වේෂ චරිතයාහට කාලවර්ණවද, මෝහ චරිතයාහට මස්සේදූ දියන්නක් බඳුවද, ශ්‍රද්ධා චරිතයාහට කිණිහිරි මලකට බඳු පැහැයෙන් යුක්තවද, ප්‍රඥා චරිතයාහට ප්‍රසන්නව, පැහැදී, නොකැලඹී, ශෝභන වර්ණව, පිරිසිදුව ඔප්නැගූ දියමන්තියක් ලෙස ප්‍රභාමත්වද,) අඩපතක් පමණ ලේවලින් පිරී පවත්නා පපුවේ වාම පාර්ශවයේ පිහිටි (මූල සන්ධිකය පිළිබඳ **මනොධාතු මනො විඤ්ඤාණධාතු** යන මොවුන්ට වස්තුවූ) **හෘදය වස්තුව හදය රූපය** නම්වේ.

xiii ශරීරයේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන චතුර්විධ ධාතු හා චක්ඛුප්පසාද, ශ්‍රොත්‍රප්‍රසාද, ඝ්‍රාණප්‍රසාද, ජිව්හාප්‍රසාද, කාය ප්‍රසාද යන පංචවිධ ප්‍රසාද රූපාදී ද්‍රව්‍ය සියල්ලක්ම ප්‍රාණවත් කරමින් මුළුදෙහය සම්බන්ධ රූපයන් දරාසිටින්නේ **ජීවිතෙන්ද්‍රිය** යයි දතයුතුයි.

xiv. සත්‍වයා දවසකට දෙතුන්වරක් ආහාර අනුභවකරන්නේ වීනමුත් එයින් වැඩිකොටසක් මලමුත්‍ර ආදියට පෙරලී ශරීරයෙන් පිටවේයයි. එක කොටසක් ශරීරයෙහි පණු කැලන්ට ආහාරවේ. ඕජාදි චතුර්විධ ආහාරයාගේ හෙවත් කබලීකාරාහාරයාගේ රසය ශරීරයට වැදගැන්මෙන්වූ **ඕජා ශක්තිය** පමණක් ලේ ආදිය දියුණුකරමින් ශරීරයෙහිම පවතී. **ආහාර රූපයයි** මෙයට නාමී.

**සතර මහා භූතයන්** සහිත පූර්වෝක්ත **තුදුස් උපාද රූපයෝ** පෙර ජාතියෙහි කරණලද කර්මාදි හේතුවෙන් උපදනා බැවින් ඒ මේ අටළොස් රූපයන්ට **කම්ජ රූප** හෙවත් **නිෂ්පන්න රූපයයි** කියනුලැබේ.

මෙතැන්සිට (කර්මාදී හෙතුවෙන් නොනිපන් බැවින්) **අනිෂ්පන්න** නම්වූ සෙසු **රූපයන් දශයද** සැකෙවින් විස්තර කරනු ලැබේ.

xv. ශරීරය පිළිබඳවූ දෙඇස, දෙකණ, නාසා සිදුරු දෙක, මුඛය, මල මූත්‍ර මාර්ග යන මේ නවද්වාරයන් රූප කලාපයන් හා එකිනෙකට ස්පර්ශයනොදී වෙන්ව පවත්නා අතරතුර (**අවකාශ රූපය** හෙවත්) **පරිච්ඡේද රූපය** නම්වේ.

xvi. කයින් (කරනු ලබන යාම්, ඊම් ආදී ක්‍රියා විශෙෂයන්) අභිප්‍රාය හඟවන්නාවූ **කායවිඥප්ති රූපයද**;

xvii. වචනයෙන් (කරනු ලබන කථා, හැඬීම් ආදී ක්‍රියා විශෙෂයෙන්) අභිප්‍රාය හඟවන්නාවූ **වාග්විඥප්ති රූපය** දැයි **විඥප්ති රූපය ද්විවිධ වේ.**

xviii. (දවසක් මුළුල්ලෙහි ගිණියම් කරණලද රත්වූ යකඩ කඳක් මෙන්) ශරීරයාගේ ලඝු (සැහැල්ලු) බවයයි කියනලද **කාය ලහුතා රූපයද**;

xix. සුමර්දිත චර්මයක් මෙන් (මහාකොට මදිනලද සමක් මෙන්) ශරීරය පිළිබඳ ක්‍රියාවන්හි දරදඬුගතියට ප්‍රතිපක්ෂවූ මෘදු (නොදැඩි) බවයයි කියනලද **කායමුදුතා රූපයද**;

xx සකස්කොට තවනලද සවර්ණයක්මෙන් ශරීරයේ (අට ළොස් නිෂ්පන්න රූපයන්) ඒ ඒ දෙයට අනුකූලබව හෙවත් යොග්‍ය බවයයි කියනලද **කම්මඤ්ඤතා රූපයද; විකාර රූප** නම් වේ. (ප්‍රාමාණ්‍යාත්‍ර **විඤ්ඤත්ති රූපඩයද විකාර රූප**යෙහිම අන්තර්ගත වේ.)

xxi. ශංඛෙර කැපූ කූපයාගේ උදකොත් ගමනයක් මෙන් (ලිඳෙනි නිතර දිය උනන්නාක්මෙන්) අටළොස් නිෂ්පන්න රූපයන්ගේ (ප්‍රථමෝත්පත්ති වශයෙන් අභිවෘද්ධි සඞ්ඛ්‍යාත) මතුමත් නැගී වැඩීමයයි කියනලද **උපචය රූපයද;**

xxii. පරිපූර්ණ කූපයෙන් (පිරීගිය ලිඳෙන්) පිටත දියගලා යාමක්මෙන් එසේ වැඩුනු රූපයන්ගේ නැවත නැවත නොසිඳ නොබිඳී (ප්‍රබන්ධෝත්පත්ති වශයෙන්) පැවැත්ම සඞ්ඛ්‍යාත **සන්තති රූපයද;**

xxiii. අටළොස් නිෂ්පන්න රූපයන්ගේ බිඳීයාමට ආසන්නව පවත්නා (නිරොධාභිමුඛ වශයෙන්වූ) **ජරතා රූපයද;**

xxiv. (නැගී නැගී බිඳීයන්නාවූ දිය බුබුළුමෙන්) එම රූපයන් ගේම පරිභෙද ස්වභාවවූ (බිඳීයාමයයි කියනලද) **අනිච්චතා රූපයදයි, ලක්ෂණ රූපය චතුර්විධ වේ.**

භූතරූප සතරය, ප්‍රසාද රූප පසය, විෂය රූප සතරය, භාව රූප දෙකය, හෘදය රූපය, ජීවිත රූපය, ආහාර රූපය යන **අටළොස් නිෂ්පන්න රූපයෙක්** හා පරිච්ඡේද රූපය, විඥප්ති රූප දෙකය, විකාරරූප තුණය, ලක්ෂණ රූප සතරය යන **දශ අනිෂ්පන්න රූපයන්** දැයි මෙසේ **අටවිසි රූපයකින්** සමන්විත මම ශරීරයෙහි (භූතෝපාදාය භෙද භින්න) සියළු රූපයන් එක් රැස්කොට (මහා ජලසමූහයකට ජලස්කන්ධයයි කියන්නාක්මෙන්) **රූපස්කන්ධයයි** කියනුලැබේ.

"භූතප්පසාද විසයා – භාවො හදය මිච්චපි
ජීවිතාහාර රූපෙහි – අට්ඨාරසවිධං තථා
පරිච්ඡෙදො ච විඤ්ඤත්ති – විකාරො ලක්ඛණන්ති ච
අනිප්ඵන්නා දස චෙති – අට්ඨවීසවිධං භවෙ."

**වෙදනාස්කන්ධය** :- අරමුණු රසය විඳින්නාවූ වේදනා හෙවත් සිතෑග ධර්ම වශයෙන් එකක්වූනාමුදු ආරම්මණ ප්‍රභෙදයෙන් අනෙක විධවෙයි, සිතට ප්‍රිය උපදවන රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම

සහ අරමුණු සය; ඇස, කණ, නාසය, දිව, කය, සිත යන සදෙරට පැමිණිකල්හි ඉෂ්ටානුභවන ලක්ෂණවූ සුඛ වේදනාවද; සිතට ප්‍රියනුවූ රූපාදි ආරම්මණයෙහි අනිෂ්ටානුභවන ලක්ෂණවූ දුඃඛ වේදනාවද, සිතට සතුටක් හෝ අසතුටක් නොවීමට හේතුවූ රූපාදි ආරම්මණයෙහි මධ්‍යස්ථානුභවන ලක්ෂණවූ උපෙක්ෂා වේදනාවදැයි වේදනාස්කන්ධය (සිතට වන විඳීම) ත්‍රිවිධවේ. චක්ෂු ප්‍රසාදාදි වස්තුවය. රූපාදී ආලම්බනය, ලොභාදී කෙලශ මලය, චක්ෂු ස්පර්ශාදි ස්පර්ශ ඝට්ටනය යන සතර කාරණයෙන් වේදනාව පහළවේ සිතෙහි උපදනා සතුට සෞම්නස් වේදනාවයයිද, අසතුට දෞර්මනස් වේදනාවයයිද කියනුලැබේ.

ඇස, කණ, නාසය, දිව, කය, සිත යන සදෙර නිසා ප්‍රාරම්භ වෙයහි සය ආකාරයෙක්වූ වේදනාව සැප, දුක්, උපෙක්ෂා යන තුනෙන් ගුණකිරීමෙන් අටලොස් ප්‍රභෙදයෙක්ව 'සාමිස වෙදනා නිරාමිස වෙදනා'' යන සන්තාන ක්‍රමයෙන් නැවත විගුණකිරීමෙන් සතිසක්ව, එම සතිස් වේදනාවද "අතීතානාගත පච්චුප්පන්න අජ්ඣත්ත බහිද්ධා ඕළාරික සුඛුමදූර, සන්තික, හීනපණීත" යනාදි වශයෙන් විභඞ්ගයෙහි වදාළ එකොළොස් ආකාරයෙන් වැඩිකළ කල 396 ක් වේ. සැප වේදනාවක් විඳිනකල ඇතිවූ සිත් සමූහය ඒ සැපය පහවනතුරු නිරුද්ධවීයයි. එසේම දුක් වේදනාවක් ඇතිවන කලද ඒ සමගම අන්‍යවූ සිත් සමූහයක් ඉපිද ඒ වේදනාව නැතිවන විටම නිරුද්ධවීයයි. උපෙක්ෂා වේදනාව පිළිබඳවද මේ ක්‍රමයම බැව් දතයුතුයි. තමහට ප්‍රියවූ මිත්‍රයෙකුගේ දර්ශනයෙන් සෞම්නස උපදී. තමහට අප්‍රියවූ සතුරෙකුගේ දැක්මෙන් දෞර්මනස උපදී. මෙසේ සලකා බලනකල ශරීරය ආධාරකොට වේදනාව පැවති නිරුද්ධවීයනු මිස වෙදනාව විඳින්නාවූ අන්‍යයෙක් නැතිබැව් මොනවට ප්‍රත්‍යක්ෂවේ.

ලොකවාසී සියළු සත්වයෝම සැපවිඳීමට කැමති වෙති. යවත් පිරිසෙයින් දුක්විඳීමට කැමති සත්වයෙක් හිරිසතුන් අතරේ පවා සොයාගැනීම උගහටය. මෙසේ සත්වයාතුළ සැපවිඳීමෙහි කෙතරම් අභිලාෂය ඇතිවූවත් එකම සත්වයෙකුටවත් සියකැමැත්තලෙස සැපවිඳීම නොපිළිවන. සැපයක් ඉපදීමට හේතුවක් ඇතිවූකල සැප වේදනාවද, දුකක් ඉපදීමට හේතුවක් ඇතිවූකල දුක් වේදනාවද, හටගැනීම කිසිකලෙක කිසිවෙකුට වැලැක්විය නොහැකි ස්වභාව ධර්මතාවෙක. කාරණා මෙසේව තිබියදී දෙතිස් කුණපයෙන් යුත් මද්කුත් සාරනුවූ මේ ස්කන්ධ පඤ්චකය කෙරෙහි නිත්‍ය, සුභ, සුඛ, ආත්ම වශයෙන් විපරීත ග්‍රහණයකොට "මමය මාගේය"යි දෘෂ්ටියෙන් හා තෘෂ්ණාවෙන් අල්ලා ගැනීම මහත් මූඪකමකි. තමන්තුළ

සාරවත්වූ, බලවත්වූ, සදාකාලිකවූ ආත්මයක් ඇත්නම් තමන් ඊදිත්ව කැමතිවූ සැප වේදනාව උපදවාගෙන් කල එය ජීවිතාන්තය දක්වා නොනසා පවත්වාගතයුතු නොවේද? එසේම තමන් විඳිනු නොකැමැතිවූ දුක් වේදනාව කිසිකලෙක නොඉපදවියයුතු නොවේද? එසේ සිදුවීමක් නොව හේතු කාරණයන්ගේ වශයෙන් සැප දුක් වේදනා ඉපදීම හා නිරුද්ධවීම සිදුවන බැවින් වේදනාව අනිත්‍යයයිද දුක්ඛයයිද අනාත්මයයිද දතයුතුයි.

**සංඥාස්කන්ධය** :-අරමුණු හැඳිනීම කරන්නාවූ සංඥා චෛතසිකයද ධර්ම වශයෙන් එකක්ම නමුදු ආරම්මණ ප්‍රභේදයෙන් අනේකවිධ වෙති. එය වනාහි, රූප සංඥා, ශබ්ද සංඥා, ගන්ධ සංඥා, රස සංඥා, ස්පර්ශ සංඥා, ධර්ම සංඥා යයි සංක්ෂෙප වශයෙන් සවැදෑරුම් වේ.

i. ඇසින් දුටු නීලපීතාදි රූපයන් වෙන්කොට හැඳිනීම **රූප සංඥාව** යයිද, ii කණින් ඇසූ භේරිවීණාදි ශබ්දයන් වෙන්කොට හැඳිනීම **ශබ්ද සංඥාව** යයිද, iii. නාසයෙන් ආඝ්‍රාණය කල සුගඳ, දුගඳ දෙක වෙන්කොට හැඳිනීම **ගන්ධ සංඥාව** යයිද,. iv. දිවට දැනෙන කටුක තික්තාදී රසයන් වෙන්කොට හැඳිනීම **රස සංඥාව** යයිද, v. කයින් විඳිනා සුඛ දුක්ඛාදී ස්පර්ශයන් වෙන්කොට හැඳිනීම **ස්පර්ශ සංඥාව** යයිද, vi. සිතෙහි උපදනා ඒ ඒ සිතිවිලි මේ මේයයි වෙන්කොට හැඳිනීම **ධර්ම සංඥාව** යයිද දතයුතු.

ස්ත්‍රියක හෝ පුරුෂයෙකු දුටුකල "මේ ස්ත්‍රියක, මේ පුරුෂයෙකැයි" අපට හැඳිනීමට පිළිවන. අපි හඳුනන යම් පමණක් ස්ත්‍රී පුරුෂයෝ ඇද්ද, යම් පමණක් තිරිසන්නු ඇද්ද, යම් පමණක් වෘක්ෂලතාදීහු ඇද්ද ඒ මේ සියල්ල දැක "මේ අසවල් තැනැත්තිය, මේ අසවල් තැනැත්තාය, මේ අසවල් තිරිසනාය, මේ අසවල් ගසය, මේ අසවල් වැලය" යනාදී වශයෙන්ද, එමෙන්ම මේදේ උස්ය, මේදේ පහත්ය, මේදේ මහත්ය, මේදේ කුඩාය, මේය සතරැස්ය, මේය වටකුරුය යනාදී වශයෙන් හා මේ නීලවර්ණය, මේ කාලවර්ණය, මේ ශ්වේතවර්ණය යනාදී වශයෙනුත් එක් එක් ද්‍රව්‍යයක සටහනක් හෝ වර්ණයක් දැනගැන්මට හැකිවන්නේ සංඥා චෛතසිකයේ ආධාරයෙනි. මේ එක් එක් සත්වයෙක්, ද්‍රව්‍යයක්, සටහනක් හෝ වර්ණයක් දැනගන්නා අවස්ථාවේදී අන්‍ය අන්‍යවූම සිත් උපදිති. උස්දේ ඇඳිනගැණීමේදී ඇතිවූ සිත මිටිදේ හැඳිනීමේදිද, සුදුපැහැය හැඳිනීමේදී ඇතිවූ සිත කළුපැහැය හැඳිනීමේදීද නිරුද්ධවේ. මේ නයින් එකම රූප සංඥාවෙහි කොතරම් විපර්යාස ඇතිවිද්දැයි කල්පනා කිරීමට පිළිවන.

රූපයන් හැඳිනීමේදී හටගන්නා සිත් එකක්වත් ශබ්ද ශ්‍රවණය පිණිස ඉවහල් නොවේ. මිනිසුන්ගේ හඬ, භේරිවීණාදියෙහි නාදය ආදි ශබ්ද සංඥාවෙහි අඩ ගුවු එකිනෙක ශබ්දයක් පාසාව එක් එක් සිතක් බැගින් ඉපිද අන්‍ය අන්‍ය ශබ්දයක් ඇසෙන කල එය නිරුද්ධවීයයි. එහෙයින්ම අප විසින් ශ්‍රවණය කරනුලබන වචනයක එක් එක් අක්ෂරයක් පාසාම එක් එකී සිතක් බැගින් ඇතිවේ. ශ්‍රවණයෙහි ආධාරවූ සිත්වලින් අසනලද වචනයෙහි අර්ථය අවබෝධ කරගැනීම පිණිස කිසි ප්‍රයෝජනයක් නොලැබේ. අර්ථාවබෝධය පිණිස අන්‍යවූ සිත් රැසක් උපදනා බැව් දතයුතුයි. සිත් ඉපදීමේ ශීඝ්‍රතාවය නිසා මේ විපර්යාසය එකවරටම තේරුම් ගැනීම අපහසු වුවත් මෙය පරීක්ෂාවෙන් කල්පනාකළ කල එහි සත්‍යතාවය මොනවට ප්‍රත්‍යක්ෂවේ. මේ අනුමින් ශබ්ද සංඥාවෙහිද ප්‍රමාණකළ නොහැකි තරම් ප්‍රභේද විද්‍යමානයි.

ගඳ සුවඳ දැනගැනීම පිණිස පූර්වොක්ත රූප දර්ශනය හා ශබ්ද ශ්‍රවණය පිණිස ඇතිවූ සිත්වලින් එකක්වත් ප්‍රයෝජන නොවේ. සුගඳ දුගඳ දෙක හා එහි ඇත්තාවූ අනේකවිධ ප්‍රභේදයන්ද අවබෝධ කරගැන්මේදී අන්‍යවූ සිත් රැසක්ම උපදනා බැව් දතයුතුයි. රස සංඥාදී අවශේෂ කරුණු පිළිබඳවද මේ ක්‍රමය පවත්තේවීනමුත් ඒ එක එක වෙන් වශයෙන් මෙහි විස්තර නොකළාට ඉහත දැක්වූ කරුණු ආශ්‍රයෙන් ඒ සියල්ල හොඳින් තේරුම් ගැනීමට පුළුවන. මෙසේ සලකා බලනකල සංඥාස්කන්ධ සඞ්ඛ්‍යාත චෛතසිකයද "උත්පාද, ස්ථිති, භඞ්ග" යන ක්ෂණත්‍රයට පැමිණ මැරි මැරී උපදිමින් හේතු ප්‍රත්‍ය ඇතිතාක් පැවති නිරුද්ධවන ස්වභාව ධර්මයක් බවත් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය විනා කිසි හරයක් එහි නොමැති බවත් යසරහට ඔප්පුවේ.

**සංස්කාරස්කන්ධය :-**

"සඞ්ඛාරා චෙතනා ඵස්සො—මනසිකාරො'ථ සණ්ඨිති
තක්කො විචාරො වායාමො—පීති ඡන්දා'ධිමොක්ඛකො—

සද්ධාසති හිරො'ත්තප්පං—චාගො මෙත්තා මිතී පුන
මජ්ඣත්තතා ච පස්සද්ධි—කාය චිත්ත වසාදුවෙ—

ලහුතා මුදුකම්මඤ්ඤ—පාගුඤ්ඤ උජුතා තථා
දයා මුදු සම්මාවාචා—කම්මාජීව සංවරො—

ලොභො දොසො ච මොහො ච—දිට්ඨි උද්ධච්ච මෙව ච
අහිරික මනොත්තප්පං—විචිකිච්ඡිත මෙව ච—

මානො ඉස්සාච මච්ඡරං – කුක්කුච්චං ථින මිද්ධකං
ඉති එතානි පඤ්ඤාස—සඞ්ඛාරක්ඛන්ධ සඤ්ඤිතා."

යනුවෙන් දක්වන **සමපණසක් චෛතසිකයෝ සංස්කාරස්කන්ධයයි** කියනු ලැබෙත්. එබැවින් **සංස්කාරස්කන්ධ** යනුවෙන් අප සිත්තුල ඇසිල්ලක් පාසා උපදිමින් මැරෙමින් පවත්නා ස්වභාව ධර්ම **පණසක්** පමණක් අභිප්‍රාය කරණු ලැබේ.

සිත සමග (ඉදිරි පසු නොව) එකවිටම උපදනාවූද, එකවිටම නස්නාවූද, සිත උපන් අරමුණෙහිම එල්බගෙන උපදනාවූද (චක්ෂු වස්තු ආදි) එක් වස්තුවක් නිසාම පවත්නාවූදැයි මෙසේ **මේ සතර ලක්ෂණයෙන් යුක්තව, සිත කෙරෙන් කිසිසේත් වෙන් නොවනසේ යෙදී බැඳී පවත්නාවූ චෛතසිකයෝ දෙපණසක් වෙත්.**

**ඒ දෙපණස් චෛතසිකයෝ ප්‍රධාන වශයෙන් සතර කොටසකට බෙදේ. ඒ මෙසේයි:-**

(1) සියළු සිත්වලට පොදු බැවින් **සබ්බ චිත්ත සාධාරණ** නම්වූ **චෛතසික ධර්ම සතකි.**

(2) කුසල් අකුසල් අව්‍යාකෘත ධර්මයන්ට මිශ්‍රහෙයින් හෙවත් කුසලාකුසලාදී සියළු සිත්හි විවිධ කාරයෙන් විසිර පවත්නා බැවින් **ප්‍රකීර්ණක** නම්වූ **චෛතසික ධර්ම සයකි.**

(3) සෝභන (කුසල්) සිත්වලම මිස අන් කිසිවක නොයෙදෙන බැවින් **සෝභන** නම්වූ **චෛතසිකයෝ පස්විසි** ආකාර වෙත්.

(4) අකුශල සිතක මිස අන් කිසිවක නූපදනා **අකුශල චෛතසිකයෝ තුදුසක්** වෙත්.

(1) **සබ්බචිත්ත සාධාරණ චෛතසික සත** නම්:—i **ඵස්ස**-(ස්පර්ශය) අරමුණෙහි හැපීම ලක්ෂණයෙන් සිත්හි උපදනා ගතිය. ii **වේදනා**- අරමුණු රසය විඳගැනීම—iii **සඤ්ඤා**-අරමුණු හැඳිනීම—iv **චේතනා**-සියළු සහජාත ධර්මයන් අරමුණෙහි හැසිර වීම—v **ඒකග්ගතා**-(ඒකාග්‍රතාවය) ගත් අරමුණ මිස අනිකක් අපේක්ෂා නොකිරීම—vi **අරූප ජීවිතින්ද්‍රිය**-තමා හා සමග යෙදුනාවූ චිත්ත චෛතසික ධර්මයන්ගේ ආයුෂය රැකීම—vii **මනසිකාර** (මනස්කාරය) තමා හා සමග යෙදුනාවූ චිත්ත චෛතසිකයන් අරමුණුකරා යොමුකරවීම,

(2) **ප්‍රකීර්ණක චෛතසික** සය නම්:-i **විතක්ක**-(විතර්කය) සිත අරමුණට නැඟවීම් ස්වභාව—ii **විචාර**-අරමුණට නැඟුසිත නැවත නැවත එම අරමුණෙහි හැසිරවීම—iii **අධිමොක්ඛ**-(අධිමොක්ෂය) අරමුණෙහි සිත මොනවට පිහිටුවීම—iv **විරිය**-සියළු කටයුත්තෙහි නොපසුබට ස්වභාව—v **පීතිය**-ඉෂ්ටාරම්මන ප්‍රතිලාභයෙහි උපදනා සතුට—vi **ඡන්දය**-අරමුණු ගැණීමෙහි කැමැත්ත.

(පූර්වෝක්ත සර්ව චිත්ත සාධාරණ චෛතසික හතද, ප්‍රකීර්ණක චෛතසික සයද සෝභනයන් කෙරෙහි යෙදෙතැයි ඊට විරුද්ධවූ අසෝභනයන් කෙරෙහි නොයෙදීමක්වත්, අසෝභනයන් කෙරෙහි යෙදෙතැයි ඊට ප්‍රතිපක්ෂ සෝභනයන් කෙරෙහි නොයෙදීමක්වත්, එකිනෙකට වෙනස් ස්වභාවඇති කුශලා කුශල අව්‍යාකෘත යනාදීන් අතුරෙහි එක් පක්ෂයක යෙදෙතැයි අනික් පක්ෂයක නොයෙදීමක් වත් නැතිව පක්ෂ ව්‍යවස්ථාව ඉක්ම පවත්නා බැවින් **අඤ්ඤසමානයෝ** නම් වෙති.)

(3) **පස්විසි**, **වැදෑරුම්වූ සෝභන චෛතසිකයෝ**:-i **සද්ධා**-(ශ්‍රද්ධාව) චිත්ත චෛතසික ධර්මයන් පහදවන්නාවූ ගතිය—ii **සති**-(සම්‍යක්ස්මෘතිය) අකුසල ධර්මයන් දුරලීම පිණිස හා කුසල ධර්මයන් කරණලෙස සිහිකරවන ලක්ෂණය—iii **හිරි**-අකුසල් කිරීමෙහි ලජ්ජා ස්වභාව—iv **ඔත්තප්ප**-අකුසල ක්‍රියාවෙහි භයවන ස්වභාව—v **අලෝභ**-අරමුණෙහි නොඇලෙන ගතිය—vi **අදෝස**-කිසි අරමුණෙක්හි ක්‍රෝධවශයෙන් නොගැටීම—vii **තත්‍රමජ්ඣත්තතා**-(තත්‍රමධ්‍යස්ථතාවය) ඒ ඒ අරමුණෙහි චිත්ත චෛතසිකයන් මැදහත් ආකාරයෙන් පවත්වන ස්වභාව—viii **කායපස්සද්ධි**-(කාය ප්‍රශ්‍රබ්ධිය) වේදනා සඤ්ඤා සංස්කාර යන ස්කන්ධත්‍රයෙහි උද්ධච්චාදී කෙලශයන් සන්සිඳුවන ස්වභාව—ix **චිත්තපස්සද්ධි**-(චිත්තප්‍රශ්‍රබ්ධිය) විඥානස්කන්ධයෙහි උද්ධච්චාදී ක්ලේශයන් සන්සිඳුවන ගතිය—x **කායලහුතා**-(කායලඝුත්වය) වේදනාදි ස්කන්ධ ත්‍රයෙහි බරබවවූ ථිනමිද්ධාදී කෙලශයන් සංසිඳුවමින් සැහැල්ලු කරන්නාවූ ගතිය—xi **චිත්තලහුතා**-(චිත්තලඝුත්වය) විඥානස්කන්ධයෙහි බරබවවූ (එම) කෙලශයන් සන්සිඳුවමින් සැහැල්ලු කරන්නාවූ ගතිය—xii **කායමුදුතා**-(කායමෘදුත්වය) වේදනාදී ස්කන්ධත්‍රයෙහි තදබවවූ දෘෂ්ටිමානාදීන් සන්සිඳුවමින් මෘදුකරන්නාවූ ගතිය—xiii **චිත්තමුදුතා**-(චිත්තමෘදුත්වය) විඥානස්කන්ධයෙහි තදබව සන්සිඳුවමින් මෘදුකරන්නාවූ ගතිය—xiv **කායකම්මඤ්ඤතා**-(කායකර්මණ්‍යතාවය) වේදනාදී ස්කන්ධත්‍රයෙහි සුචරිත ධර්මයන්ට නුසුදුසුවූ කාමච්ඡන්දාදීන් සන්සිඳුවමින් සුදුසුබවට පමුණුවන්නාවූ

ගතිය—xv **චිත්තකම්මඤ්ඤතා**-(චිත්තකර්මණ්‍යතාවය) විඥාන ස්කන්ධයෙහි (එලෙසම) අයෝග්‍යතාව සන්සිඳුවමින් යෝග්‍යකරන්නාවූ ගතිය—xvi **කායපාගුඤ්ඤතා**-(කාය ප්‍රාගුණ්‍යතාවය) වේදනාදී ස්කන්ධත්‍රයෙහි ගිලන්බව නම්වූ අශ්‍රද්ධාදී පාපයන් සන්සිඳවමින් ප්‍රගුණ බව ඇතිකරණ ගතිය—xvii **චිත්ත පාගුඤ්ඤතා**-(චිත්ත ප්‍රාගුණ්‍යතාවය) විඥානස්කන්ධයෙහි (එම) ගිලන්බව සන්සිඳවා ප්‍රගුණබව ඇතිකරණ ගතිය—xviii **කායුජ්ජුකතා**-(කාය සෘජුභාවය) වේදනාදී ස්කන්ධත්‍රයෙහි වඞ්කභාවයවූ මායා සාඨෙය්‍යාදිය සන්සිඳවමින් සෘජුබව ඇතිකරණ ගතිය—xix **චිත්තුජ්ජුකතා**-(චිත්ත සෘජුභාවය) විඥානස්කන්ධයෙහි (එම) වඞ්ක බව සන්සිඳුවා සෘජුබව ඇතිකරණ ගතිය.

(මෙම එකුන්විසි චෛතසිකයෝ ශෝභන චිත්තයන් එකක්දු නොහැර සියල්ලෙහි යෙදෙන බැවින් **ශෝභන සාධාරණ** නම්වෙත්.)

xx **සම්මාවාචා** (සම්‍යක් වචනය) මුසාවාද, පිසුණාවාච, ඵරුෂාවාච, සම්ඵප්‍රලාප යන චතුර්විධ වාග්දුශ්චරිතයෙන් වෙන්වීම් ලක්ෂණවූ ගතිය—xxi **සම්මාකම්මන්තා**-(සම්‍යක්කර්මාන්තය) ප්‍රාණඝාත, අදත්තාදාන, කාමමිථ්‍යාචාර යන ත්‍රිවිධ කාය දුශ්චරිතයෙන් වෙන්වීම් ලක්ෂණවූ ගතිය—xxii **සම්මාආජීව**-(සම්‍යක් ආජීවය) මිථ්‍යා ජීවිකාවෙන් වැලකීම් ලක්ෂණවූ ගතිය.

(පූර්වෝක්ත, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය යන තුන මිථ්‍යාවචන, මිථ්‍යාකර්මාන්ත, මිථ්‍යා ආජීව යන තුනෙන් වැලකීම් ලක්ෂණවූ හෙයින් **විරති චෛතසිකයෝ** නම්වෙති.)

xxiii **කරුණා**-දුක්ඛිත සත්වයන්ගේ දුක්දුරලනු කැමතිබව. xxiv **මුදිතා**-සුඛිත සත්වයන්ගේ සැපයට පිරුඩිනොව එකගවීම.

(මෙම, කරුණා, මුදිතා යන දෙක සත්වයෙක් කෙරෙහිම මිස වෙන යමක් කෙරෙහි නොපැවැත්විය හැකි හෙයින් අනන්ත අප්‍රමාණ සත්වයන් කෙරෙහි පතුරුවනු ලබනකල අප්‍රමාණව පවතිනුයි **අප්‍රමාණ්‍ය චෛතසිකයෝ** නම්වෙත්.)

xxv **පඤ්ඤා**-(ප්‍රඥාවය) අවිද්‍යාන්ධකාරය විධ්වංසනයකොට සියළු සංස්කාර ධර්මයන්ගේ **අනිත්‍ය දුඃඛ අනාත්ම** යන ත්‍රිලක්ෂණය ප්‍රකාශකිරීම් ලක්ෂණය.

(4) **තුදුස් අකුසල චෛතසිකයෝ** :-i **මෝහය**-අරමුණෙහි ස්වභාව නොපෙණෙනසේ මුවහ කරණ ගතිය—ii **අහිරිකය**-අකුසල චෛතසිකයන් හා එක්ව යෙදීමෙහි පිළිකුල් නොවන ගතිය—iii **අනොත්තප්පය**-අකුසල චෛතසිකයන් හා එක්ව යෙදීමෙහි භය නොවන ගතිය—iv **උද්ධච්චය**-සිත නොසන්සිඳී විසිරීයාම පවත්නා ගතිය—v **ලෝභය**-අරමුණෙහි දැඩිවසයෙන් ඇලෙන්නාවූ ගතිය—vi **දිට්ඨිය**-අරමුණෙහි තත්වය හැර අන්පරිද්දෙකින් දක්නා ගතිය—vii **මානය**-තමා අනුන් හා සංසන්දනය කිරීමෙන් "මම ශ්‍රේෂ්ඨ වෙමි. සියල්ලටම වැඩිතරමි" යනාදි වශයෙන් උපදනා උඩඟු ස්වභාව—viii **ද්වේෂය**-කිපීම් ලක්ෂණවූ (වෛර) ස්වභාව—ix **ඉස්සා**-(ඊර්ෂ්‍යාව) අනුන්ගේ සම්පත නොඉවසීම් ලක්ෂණවූ ගතිය—x **මච්ඡරිය**-(මාත්සර්ය්‍ය) තමාගේ සම්පත අනුන් විසින් ලබනු දකිනු තබා දැනීම් මාත්‍රයක්වත් නොවිවාසි සඟවන ගතිය—xi **කුක්කුච්චය**-(කුකුසය) තමා කල කීමෙදය වරදයයි ශෝකකිරීම (පසුතැවිලිවීම)—xii **ථීනය**-අරමුණු ගැන්මෙහි හැකිලී පසුබස්නා සිතෙහි මැලි ස්වභාව—xiii **මිද්ධය**-චෛතසිකයන්ගේ (එබඳුමවූ) මැලි ස්වභාව—xiv **විචිකිච්ඡා**-චිත්ත චෛතසිකයන්ට අරමුණු නිශ්චයකොට නොදතහැකි ස්වභාව හෙවත් සැකකිරීම් ලක්ෂණවූ ගතිය.

මේ දෙපණස **සංස්කාර ධර්ම** බවත් ඉන් **වේදනා, සඤ්ඤා,** දෙක හැර සෙසු පණස සංස්කාරස්කන්ධයට ඇතුළත් බවත් දතයුතුයි.

පූර්වෝක්ත චෛතසික ධර්මයන් අතරෙහි උත්පාද, ස්ථිති, භඞ්ග යන ක්ෂණ තුනෙන් නොනැසී සැමකල්හිම එකාකාරව පවත්නා එකම ධර්මයකුත් නැත්තේය. මේ සියළු සංස්කාරයෝම හේතු ප්‍රත්‍ය ඇතිතාක් මැරී මැරී ඉපදී ඉපදී පවත්නා සුලුය. එසේම හේතු ප්‍රත්‍ය නැතිවීමෙන් නිරුද්ධවන සුලුය එබැවින් අනිත්‍ය දුක්ඛ අනාත්ම යන ත්‍රිලක්ෂණය විනා කිසි හරයක් **සංස්කාරස්කන්ධයෙහිද** නොවැති බැව් දතයුතුයි.

**විඤ්ඤාණස්කන්ධය** :-විඤ්ඤාණය යනු චිත්තයට පර්යාය නාමයකි. මනසය, චිත්තය, මනය, විඤ්ඤාණය, හදය යනු චිත්ත පර්යාය (සිතට සාධාරණ) නාමයෝයි. සත්වයන් තුළ පවත්නා විඤ්ඤාණ නම්වූ ඒ මේ චිත්ත ධර්ම වශයෙන් එකක්ම නමුදු භූමි, ජාති ආදී වශයෙන් ප්‍රභේදව අසූනමවිධ වේ.

භූමි වශයෙන්වූ අසූනම විභාගය (1) කාමාවචර සිව්පණසක (2) රූපාවචර පසළොසක (3) අරූපාවචර දොළසක (4) ලෝකෝත්තර අටෙකැයි චතුර්විධවේ.

ජාති වශයෙන්වූ අසූනව චිත්තය (කාමාවචර කුසල්-8 රූපාවචර කුසල්-5 අරූපාවචර කුසල්-4 ලෝකෝත්තර කුසල්-4 යන) **කුසල් සිත් 21 ක,** (කාමාවචර) **අකුසල් සිත් 12 ක,** (අහේතුක අකුසල විපාක-7 අහේතුක කුසල විපාක-8 සහේතුක කාමාවචර විපාක-8 රූපාවචර විපාක-5 අරූපාවචර විපාක-4 ලෝකෝත්තර විපාක 4 යන) **විපාක සිත් 36 ක,** (අහේතුක ක්‍රියා-3 සහේතුක කාමාවචර ක්‍රියා-8 රූපාවචර ක්‍රියා-5 අරූපාවචර ක්‍රියා 4 යන) **ක්‍රියා සිත් 20 කැයි** චතුර්විධ වේ.

**1 කාමාවචරය**

චක්ෂු, ශ්‍රොත, ඝ්‍රාණ, ජිව්හා, කාය යන පඤ්චෙන්ද්‍රියයන් කරණ කොටගෙණ පඤ්ච කාමයෙහි ආසා කරවන්නාවූ හෙවත් කාම තෘෂ්ණාව නිදානකොට ඇති සිව් අපාය, මනුෂ්‍ය ලෝකය හා සදිව්‍ය ලෝකයද **කාමභව** නම්වේ. "කාමෙ අවචරන්තීති කාමාවචරං" යන නිරුක්තිනයින් එම එකොළොස් කාම භවයන් ආශ්‍රිත චිත්තයෝ **කාමාවචර** නම්වෙති. මේ වගීයෙහි (a) අකුසල දොළස (12) ක (b) අහේතුක අටළොස (18) ක (c) සෝභන හෙවත් සහේතුක කාමාවචර සුවිස්ස (24) කැයි තුන් ප්‍රකාරවූ සිව්පණස (54) ක් චිත්තයෝ විද්‍යමාන වෙත්.

**(a) දොළොස් අකුසල චිත්තයෝ**

"අට්ඨ ලොභ මූලානි-දොස මූලානිච ද්විධා
මොහ මූලානිච ද්වෙති-ද්වාදසා කුසලා සියුං"

යනුවෙන් දක්වන (i) ලෝභ මූලික අටක (ii) ද්වේෂ මූලික දෙකක (iii) මෝහ මූලික දෙකකැයි ත්‍රිවිධවේ,

**(b) අටළොස් අහේතුක චිත්තයෝ**

"සත්තා කුසල පාකානි-පුඤ්ඤ පාකානි අට්ඨධා
ක්‍රියා චිත්තානි තීණීති-අට්ඨාරස අහේතුකා"

යනුවෙන් දක්වන (i) අකුසල විපාක සතක (ii) (අහේතුක) කුසල විපාක අටක (iii) (අහේතුක) ක්‍රියා සිත් තුණකැයි ත්‍රිවිධවේ.

(පූර්වෝක්ත අකුසල සිත් දොළොසද අහේතුක අටළොසද යන තිස (30) අසෝභන යති නියාද ව්‍යවහාර කරනු ලැබේ.)

**(c) කාමාවචර සෝභන හෙවත් සහේතුක කාමාවචර සුවිස්ස**

"වේදනා ඤාණ සඞ්ඛාර-භෙදෙන චතුවීසති
සහෙතු කාමාවචර-පුඤ්ඤ පාක ක්‍රියා මතා"

යනුවෙන් දක්වන (i) කුසල් සිත් අටක (ii) විපාක සිත් අටක (iii) ක්‍රියා සිත් අටකැයි ත්‍රිවිධවේ.

**රූපාවචරය**

(කසිණ ප්‍රතිභාග නිමිති සංඛ්‍යාත රූපය අරමුණුකොට උපදවනලද ධ්‍යාන බලයෙන් ඇතිව පවත්නා) රූප තෘෂ්ණාව නිදනකොට ඇති සොළොස් බඹතලය **රූපභව** නම්වේ. “රූපෙ අවචරතීති රූපාවචරං” යන නිරුක්තිනයින් එම රූපභවයන් ආශ්‍රිත චිත්තයෝ **රූපාවචර** නම්වෙති.

“පඤ්චධා ඣාන භෙදෙන-රූපාවචර මානසං
පුඤ්ඤපාක ක්‍රියා භෙදා-තම්පඤ්ච දසධා භවෙ”

යනුවෙන්, මේ වර්ගයෙහිවූ (ප්‍රථම ධ්‍යාන; ද්විතීය ධ්‍යාන; තෘතීය ධ්‍යාන; චතුර්ථ ධ්‍යාන; පඤ්චම ධ්‍යාන යන) පස් ප්‍රකාර ධ්‍යාන චිත්තයෝ (i) කුසල (ii) විපාක (iii) ක්‍රියා යන ත්‍රිභේදයෙන් ගුණවීමෙන් පසළොස් වැදෑරුම්වේ.

**3 අරූපාවචරය**

(රූපයෙහි දොස් දැක රූපය නැතිකරණු පිණිස අරූප ධ්‍යාන උපදවා ඒ ධ්‍යාන බලයෙන් ආකාශයෙහි සතර නාමස්කන්ධයන් පහළව පවත්නා) අරූප තෘෂ්ණාව නිදනකොට ඇති සතර ස්ථානය **අරූපභව** නම්වේ. “අරූපෙ අවචරතීති අරූපාවචරං” යනු විග්‍රහ මගයින් එම සතර අරූපභවයන් ආශ්‍රිත චිත්තයෝ **අරූපාවචර** නම්වෙති.

“ආලම්බනප්පභෙදෙන-චතුධාරුප්ප මානසං
පුඤ්ඤපාක ක්‍රියා භෙදා-පුනද්වාදස ධායිතං”

යනුවෙන් මේ වර්ගයෙහිවූ එකම පඤ්චම ධ්‍යාන චිත්තය ගත් අරමුණේ භේදයෙන් සතර වැදෑරුම්ව ඉක්බිති (i) කුසල (ii) විපාක (iii) ක්‍රියා යන ත්‍රිභේදයෙන් ගුණවීමෙන් දොළොස් වැදෑරුම්වේ.

**4 ලොකෝත්තරය**

“ලොකතො උත්තිණ්ණන්ති ලොකුත්තරං” යනුවෙන් (යට දක්වූ කාම, රූප, අරූප සංඛ්‍යාත ත්‍රිවිධ) ලෝකයෙන් එතරවූ බැවින් **ලොකෝත්තර** නම්වූ මේ වර්ගයෙහි,

“චතුමග්ගප්පභෙදෙන-චතුධා කුසලං තථා
පාකං තස්ස ඵලත්තා ති-අට්ඨධානුත්තරං මතං”

යනුවෙන් දක්වන (i) (සක්කායදිට්ඨි; විචිකිච්ඡා; සීලබ්බත පරාමාස යන සංයෝජන ධර්මයන් තුන්දෙන මූලොච්ඡේද වශයෙන් නසන්නාවූ) සෝතාපත්ති මාර්ග චිත්තය. (ii) (කාමරාග; ව්‍යාපාද යන සංයෝජනයන් දෙදෙනා නැවත දියුණු නොවන පරිදි තුනී

කරන්නාවූ) සකෘදාගාමි මාර්ග චිත්තය. (iii) (එම කාමරාග ව්‍යාපාද යන් මූලෝච්ඡේද වශයෙන් නසන්නාවූ) අනාගාමි මාර්ග චිත්තය. (iv) (රූපරාග; අරූපරාග; මාන; උද්ධච්ච; අවිද්‍යා යන සංයෝජන යන් පස්දෙන මූලෝච්ඡේද වශයෙන් නසන්නාවූ) අර්හත් මාර්ග චිත්තය යන **කුසල සිත් සතරක්** හා, (ඒ ඒ මාර්ග සිතට අනතුරුව ම ඒ ඒ කුසලයෙහි විපාක වශයෙන් ලැබෙන්නාවූ) (v) සෝතාපත්ති ඵලසිතය, (vi) සකෘදාගාමි ඵලසිතය, (vii) අනාගාමි ඵල සිතය (viii) අර්හත් ඵල සිතය යන **විපාකසිත් සතරයැයි** මෙසේ අෂ්ටප්‍රකාරවූ සිත් අටෙක්වේ.

මෙහි නාම මාත්‍රා පමණක් ඉතා සැකෙවින් දක්වනලද කාමාවචර සිත් සූපනසද; රූපාවචර පසළොසද; අරූපාවචර දොළසද; ලෝකෝත්තර සිත් අටදැයි; අසූනව වැදෑරුම්වූ විඤ්ඤාණයෝ ඇසිල්ලක් පාසා උත්පාද; ස්ථිති; භංග යන ක්ෂණ ත්‍රයට පැමිණීමෙන් වෙනස් වන්නාහුය. ඊට **ක්ෂණික මරණයයි** කියනු ලැබේ.

මේ සියලු විඤ්ඤාණයෝම හේතු ප්‍රත්‍ය ඇතිකොත් මැරි මැරී ඉපිද ඉපිදී පවත්නා සුළුය. හේතු ප්‍රත්‍ය නැතිවීමෙන් නිරුද්ධවන සුළුය. එබැවින් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය විනා කිසි හරයක් **විඤ්ඤාණස්කන්ධයෙහිද** නොමැතිබැව් දතයුතුයි.

"ඵෙණ පිණ්ඩූපමං රූපං-වේදනා බුබ්බුළූපමා,
මරීචි කූපමා සඤ්ඤා-සංඛාරා කදලූපමා,
මායූපමං ච විඤ්ඤාණං-දෙසිතාදිච්ච බන්ධුනා,"

රූපස්කන්ධය පෙණපිඩකටද; වේදනාස්කන්ධය දියබුබුලකටද; සඤ්ඤාස්කන්ධය මිරිඟුදියකටද; සංස්කාරස්කන්ධය කෙසෙල්කඳකටද; විඤ්ඤාණස්කන්ධය ඉන්ද්‍රජාලයකටද; බඳු උපමාඇත්තේයයි ආදිත්‍ය බන්ධුවූ සම්බුද්ධයන්වහන්සේ විසින් දේශනාකරණලද්දේය.

"සංඛාරා පරමා දුඛා," සංස්කාරයෝ අතිශයින්ම දුක්වූවාහු වෙති – මෙහි සංඛාර ශබ්දයෙන් ස්කන්ධ පඤ්චකයම ගැණේ.

**කඳ සිලිවෙල දෙදුස්**-පඤ්චස්කන්ධයාගේ පහළවීම නිසා ජරාමරණාදී සියළු දුක් සමූහය ඇතිවන බැවින් දුක්ඛසත්‍යය දේශනාකොට වදාරන්නාවූ බුදුරජාණන් වහන්සේ විසින් ["සංඛිත්තේන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා,"] "සැකෙවින් පඤ්ච උපාදානස්කන්ධයෝම දුක්වන්නාහ"යි වදාරණලදී.

**සිහිකොට කළ පිළිවෙල දෙස්**-සිහිකොට නොහොත් මෙනෙහි කොට යනුවෙන් **සම්‍යක් සිහිය** දක්වයි-රූප වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ යන සකන්ධ යන්ට අනුව සිහිය පිහිටුවීම i කායානුපස්සනා ii වේදනානුපස්සනා iii චිත්තානුපස්සනා iv ධම්මානුපස්සනා යන සතර සතිපට්ඨාන නම්, කුසලා කුසල ධර්මයන් සිහිකරවීම ලක්ෂණ කොට ඇති සමාධියගේ පිහිටුවීම “සතිපට්ඨාන” නම්වේ.

**නිවණ**-“වාණ සංඛාතාය තණ්හාය නික්ඛන්තත්තා නිබ්බාණං” කුඩා මහත් භවයන් එකටගලපන අර්ථයෙන් වාණ නොහොත් බාණය යි ගැණෙයි කියනලද තෘෂ්ණාවෙන් නික්මුණු බැවින් නිර්වාණ යනු මෙහි වචනාර්ථයි. වාණයයි කියනලද තෘෂ්ණාවගේ නිවීම ‘**නිවණ**’ නම්වේ. හේතුවෙක් ප්‍රත්‍යයෙන් හට ගැණීමක් ඉපදීමක් නැතිනිසා නිර්වාණය අසංඛතධාතු නම්වේ. ලෞකිකවූ දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍යසැප වේදනාවෙන් සුඛහෙයින් පෙරළෙන සුව හෙයින් උතුම් නොවේ. නිවන්සැපය වේදනාවෙන් තොරත්වූ හෙයින් නොපෙරළෙන සුව හෙයින් සදාකාලික ශාන්තසැපය වේ. නිර්වාණය දැනගැණීමට සමත්වූ මාර්ගඥාණය පෘථග්ජනවූ අපට නැතිනිසා නිර්වාණය ප්‍රත්‍යක්ෂඥාණයෙන් අපට දැනගත නොහැක. එබැවින් පෘථග්ජනතෙම නිර්වාණය ගැණ සියලු කල්හි මුලාවෙයි.*

**නිවණට සපැමිණි**-නිවණට සපැමිණීමේ එකම මාර්ගය “එකායනො අයං භික්ඛවෙ මග්ගො සත්තානං විසුද්ධියා සොකපරිදෙවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථගමාය ඤායස්ස අධිගමාය නිබ්බාණස්ස සච්ඡිකිරියාය යදිදං චත්තාරො සතිපට්ඨානා” යනුවෙන් “මහණෙනි, (රාගාදිකෙලෙශයන්ගෙන් කිලුටුවූ සිත් ඇති) සත්වයාගේ (විසුද්ධි සංඛ්‍යාත) පිරිසුදු බව පිණිසද, ශොක පරිදෙව දුක්ඛයන්ගේ ඉක්මවීම පිණිසද, (කායික දුක්ඛය චෛතසික දෞර්මනස්‍යය යන) දුක් දොම්නස් දෙදෙනාගේ නැසීම පිණිසද ආර්ය අෂ්ටාඞ්ගිකමාර්ගයාගේ ප්‍රතිලාභය පිණිසද නිර්වාණ නම්වූ උතුම් අමෘතයාගේ (අවබොධවීමෙන්) ප්‍රත්‍යක්ෂ කිරීම පිණිසද පවත්නාවූ යම් මේ සතර සතිපට්ඨාන කෙනෙක් ඇද්ද මේතම අයනසංඛ්‍යාතවූ එකම මාර්ගය වන්නේය” යි මහාසතිපට්ඨාන සුත්‍රයෙහිදී දෙශනා කළසේක.

**නිවණට සපැමිණි සඟ සැම නමැති**-“මග්ගපස්ස සස්සං රක්ඛ තායියා සීහල වෙරිකාය සීහල කෙනෙව ජාති ජරා මරණ

---

* “ලොකෙ ලොකප්පහවෙ-ලොකත්තගමෙසිවෙච තදුපායෙ
සම්මුය්හති තාවනරො-තාවජ්ජානාති යාව සච්චානි.”

යුත්තා ගීතිකං ගායන්තියා සද්දං සුත්වා මග්ගං ගච්ඡන්තා සට්ඨි මත්තා විපස්සකා භික්ඛූ අරහත්තං පාපුණිංසු" මැයි පාලියෙහි ශස්‍ය රකිමින් ජාති ජරා මරණ ප්‍රතිසංයුක්තවූ සිංහල භාෂා වෙන්ම කරණලද ගීතිකාවක් ගායනා කරන්නාවූ සිංහල දූසියකගේ ගීතිකා ශබ්දය අසා මාර්ගයෙහි යන්නාවූ සැටනමක් පමණ විදර්ශක භික්ෂූහු රහත් බවට පැමිණියාහුය.

(වඞ්ගීස සංයුක්ත අටුවාව.)

6. එ බැ වි න් එඑවෙන් කිවයි අනද ර
නොවමි න් බැතියෙන් අදරින් නමක ර
ස තොසි න් ඇසුවොත් මෙදහම් මනහ ර
සැ බැ වි න් සිදුවෙයි සග මොක් සිරි ස ර

එබැවින්, එසේහෙයින්; එඑවෙන් කීවයි, සිංහල භාෂාවෙන් කියනලද්දේයයි; අනදරනොවමින්, අනාදරනොකොට; බැතියෙන් අදරින්, භක්ත්‍යාදරයෙන්; නමකර, නමස්කාරකොට; මනහර, මනොහරවූ හෙවත් සිත් සතුටු කරන්නාවූ; මෙදහම්, මේ (පහත විස්තරකරණුලබන) ධර්මය; සතොසින් ඇසුවොත්, සන්තොෂයෙන් ශ්‍රවණය කළෙව්නම්; සැබවින්, ඒකාන්තයෙන් නොහොත් සත්‍ය වශයෙන්; සගමොක් සිරිසර, ස්වර්ගමොක්ෂ ශ්‍රී සාරය; සිදුවෙයි, සිද්ධවන්නේය.

**සග**-රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන ලෞකිකවූ පංචකාම සැප යෙන්අග්‍රවූ හෙයින්, මිනිස් ලොවද සදිව්‍ය ලොකයද "සප්ත කාම ස්වර්ගය"යි කියනු ලැබේ.

**මොක්**-"මුච්චන්ති එත්ථ එතෙනවා රාගාදීහිති මොක්ඛො"-මෙහි හෝ මෙයින් රාගාදිවූ ක්ලේශයන් කෙරෙන් මිදෙත් නුයි මොක්ඛ නම්වී. එබැවින් රාග ද්වේෂ මොහාදී ක්ලේශ ධර්මයන්ගෙන් මිදී සාන්ත සුඛ ස්වරූපවූ නිර්වාණ ධාතුව අවබොධ කිරීම මොක්ඛ (මොක්) නම් වන්නේය.

7. බි ම ඉඳ සිට කී බණ නා ස න් නේ
වි ම තිව උඩ ඉඳ සිට නා ස න් නේ
කැමැ තිව ගිමොන් විමසා ස න් නේ
එ ම වද සගමොක් සැප සාද න් නේ

සිටකීබණ, සිටගෙණ කියනලද ධර්මය; බිම්ඉඳ, භූමියෙහි නිසී දනස කොට; නාසන්නේ, නොම අසන්නේය හෙවත් ශ්‍රවණය නොකරන්නේය; විමතිව, විශ්මිතවූ හෙවත් දුර්මනව; උඩඉඳසිට, උඩඉඳගෙණ හෝ සිටගෙණ හෝ; නාසන්නේ, නොම අසන්නේය;

කිංවාත්, යමෙක්විසින් (ධර්ම) දෙශනා කරනුලබන්නේ වීනම්; කැමතිව, ශ්‍රද්ධා සිතින් යුක්තව හෙවත් කැමැත්තෙන්; විමසා'සන්නේ, විමංසනය කොට (පරීක්‍ෂාකාරීව) ශ්‍රවණය කරන්නේය; සගමොක් සැප, ස්වර්ගී මොක්‍ෂ සම්පත්තිය; සාදන්නේ, සිද්ධ කරන්නේ; එමවද, ඒ හේතුවින්වද නැතහොත් ඒ හේතුවින්මැයි.

**බිම ඉඳසිට කී බණ නාසන්නේ-විමතිව උඩඉඳ සිට නාසන්නේ**

"නඡමාය නිසීදිත්වා ආසනෙ නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා"

"නනීචෙ ආසනෙ නිසීදිත්වා උච්චෙ ආසනෙ නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා"

"නඨිතො නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා"

ඡමාය නිසීදිත්වා, බිම හිඳගෙන; ආසනෙ නිසින්නස්ස, ආසනෙහි හිඳිනාවූ; අගිලානස්ස, නොගිලනෙක්හට; ධම්මං, ධර්මය; නදෙසිස්සාමීති, දෙශනා නොකරන්නෙමියි; සික්ඛා, ශික්‍ෂාතොමෝ; කරණීයා, කටයුත්තීය.

නීචෙ ආසනෙ, මිටි අස්නෙක්හි; නිසීදිත්වා, හිඳගෙන; උච්චෙ ආසනෙ, උස් ආසනයෙක්හි; නිසින්නස්ස, හිඳිනාවූ; අගිලානස්ස, නොගිලනෙක්හට; ධම්මං, ධර්මය; නදෙසිස්සාමීති, දෙශනා නොකරන්නෙමියි; සික්ඛා, ශික්‍ෂා තොමෝ; කරණීයා, කටයුත්තීය.

ඨිතො, සිටියාවූ මම; නිසින්නස්ස, හුන්නාවූ; අගිනාලස්ස, නොගිලනෙක්හට; ධම්මං, ධර්මය; නදෙසිස්සාමීති, දෙශනානොකරන්නෙමියි; සික්ඛා, ශික්‍ෂාතොමෝ; කරණීයා, කටයුත්තීය.

(සෙඛියා-පාතිමොක්ඛපාළි)

**විමසා'සන්නේ-**

"විහාය වික්ඛෙපමලං-අට්ඨිකත්වාන සාධුකං
සද්ධම්ම සවණං එත්ථ-සවණන්ති පකාසිතං"

වික්‍ෂෙපමල සඞ්ඛ්‍යාත නොයෙක් අරමුණු මෙනෙහි කිරීමවූ කිළුටු සිතින් තුරන්ව අසන්නාවූ ධර්මය යහපත්ව ගලපා ගැණීමෙන් සද්ධර්ම ශ්‍රවණය කෙරේද එයම ශ්‍රවණයයි ප්‍රකාශ කරණලදී.

**8. සියල් සසර දුක් දුරුකර දොසෙ කී**
**අසල් කරණ මොක් සිරි සැප නිසැ කී**
**සියල් සතුනි පින් කරවයි මුනි කී**
**නොකල් අමෙකි පින් කම්කළ නොහැ කී**

නොමයෙකි, අමොනකම්වූ; සිසල් සසරදුක්, සකල සංසාර දුක්ඛයන්; දුරුකර, දුරිභූතකොට; නිසැකී, නිශ්ශංකීව හෙවත් සැකරහිතව; මොක් සිරිසැප, මෝක්ෂ ශ්‍රී සම්පත්තිය; අසල්කරණ, සම්පකරන්නාවූ; පින්, පුණ්‍යකර්මයන්; සියල් සතුනි, සකල සත්ත්වයෙනි; කරවයි, කරව්යයි කියා; මුනි, සර්වඥයන් වහන්සේ විසින්; කී, දෙශනා කරණලදී. පින්කම් කළ නොහැකි, පුණ්‍ය කර්ම කිරීමට නොහැකිවූ; නොකල් අටෙකි, අකාල අටක්වේ.

**සසර**-"සංපුනප්පුනං සරතීති සංසාරො"-නැවත නැවත (භවයෙහි) හැසිරේනුයි **සංසාර** නම්වේ.

"ඛන්ධානං පටි පාටි-ධාතු ආයතනානිච
අබ්බොච්ඡින්නං වත්ත මානං-සංසාරොති පවුච්චති"

ස්කන්ධ ධාතු ආයතනයන්ගේ පිළිවෙළ නොසිඳ පැවැත්ම **සංසාර** යයි කියනුලැබේ. ඒ මේ සංසාරයතෙම නොදත හැකි අග ඇත්තේය. අවිද්‍යාවෙන් වැසුනාවූ තෘෂ්ණාවෙන් බැඳී සිටින්නාවූ චුති ප්‍රතිසන්ධි වශයෙන් දුවන්නාවූ සංසාරගත සත්ත්වයන්ගේ පූර්වකෙළවර නොපෙණෙයයි. "අනමතග්ගොයං භික්ඛවෙ සංසාරො පුබ්බා කොටි න පඤ්ඤායති අවිජ්ජා නීවරණානං සත්තානං තණ්හා සංයොජනානං සන්ධාවතං සංසරතං" යනුවෙන් සර්වඥයන්වහන්සේ විසින් වදාරා තිබෙන බැවින් අපේ මුල්පටන් ගැණීම අනන්ත ධර්මයට ඇතුළත්වේ.

**නොකල් අටෙකි පින් කම්කල නොහැකි.**

"තයො අපායා ආරුප්පා-සඤ්ඤං පච්චන්ති මම්පිච
පඤ්චින්ද්‍රියානං වෙකල්ලං-මිච්ඡාදිට්ඨිච දාරුණං
අපාතු භාවො බුද්ධස්ස-සද්ධම්මා මතාදසිතො
අට්ඨක්ඛණා අසමයා-ඉතිඑතෙපකාසිතා"

තයො අපායා, (1 නරක, 2 තිරිසන්, 3 ප්‍රේත ලොකය යනමේ) තුන් අපායයෝද; ආරුප්පා සඤ්ඤං, 4 අරූප අසඤ්ඤ තලයෝද; පච්චන්තිමම්පිච, 5 ප්‍රත්‍යන්ත දෙශයද; පඤ්චින්ද්‍රියානං වෙකල්ලං, (චක්ඛු, සොත, ඝ්‍රාණ, ජිව්හා, කාය යන) 6 පසිඳුරන්ගේ විකලබවද; මිච්ඡාදිට්ඨිච දාරුණං, කර්කශවූ 7 මිථ්‍යාදෘෂ්ටියද; සද්ධම්මො මතාදසිතො, සද්ධර්මනමැති අමෘත දෙනා සුළුවූ (සද්ධර්ම අමාදෙන); බුද්ධස්ස අපාතුභාවො, 8 බුදුකෙනෙකුන්ගේ පහළනොවීමද යන; එතෙ අට්ඨක්ඛණා, මේ අෂ්ට අක්ෂණයෝ හෙවත් අෂ්ට දුෂ්ඨ ක්ෂණයෝ; අසමයාඉති, පින්කිරීමට සමයවූවාහු නොවෙතියි; පකාසිතා, ප්‍රකාශ කරණ ලද්දාහුය.

(සද්ධම්මොපායනය)

9. සිතුවත් බිය කරවන අරත රයේ
වැටුණොත් එක්සිය සතිසක් නි රයේ
බලවත් දුක් විඳි නොස කරද රයේ
මදකුත් පිණකට නැත අවස රයේ

සිතුවත්, සිතූ ප්‍රමාණයෙන්ම; අරතරයේ, දුස්තරව; බිය කරවන, භියට පමුණුවන්නාවූ හෙවත් භය එළවන්නාවූ; එක්සිය සතිසක් නිරයේ, එකසිය තිස්හයක් නරකයෙහි; වැටුණොත්, පතිතවූයේවීනම්; කරදරයේ, කරදරසහිතවූ; බලවත්දුක්, දුඛිතරවූ දුකකින්; විඳිනොස, විඳිනය කිරීමට සිදුවන්නේයි; පිණකට, පුණ්‍යකර්මයක් කිරීම පිණිස; මදකුත් අවසරයේ නැත (එහි) ස්වල්පයකුදු අවකාශයක් නැත්තේය.

නිරයේ–"සුඛං අයොනි සංබාතං–යහිංසොනොප ලබ්භති
නිග්ගතා යොනිනිරයො–ඉතිවුත්තොතදඤ්ඤුහි"

සුඛං, සුවතෙමේ; අයෝනි, අයසිකියා; සංබාතං, කියනලද; සො, ඒ අයතෙමේ, (සුවතෙමේ); යහිං, යම් තැනෙක්හි; නො පලබ්භති, නොලැබේද; (එබැවින්) නිග්ගත, නික්මුනාවූ; අයො ඉති, අය ඇත්තේනුයි; (සුව ඇත්තේනුයි) තදඤ්ඤුහි, එහි අර්ථදන්නවුන් විසින්; නිරයොඉති, නරකයයි; වුත්තො, කියනලදී.

**එක්සිය සතිසක් නිරයේ**-93 වෙනි කිවි-බලනු

**නිරයේ ......පිණකට නැත අවසරයේ-**

"කාරෙන්තා කම්ම කරණං-නිරයෙ අතිදාරුණං
භයානකං භුසංඝොරං–කථං පුඤ්ඤං කරිස්සති"

නිරයෙ, නරකයෙහි; අතිදාරුණං, අතිශයින්ම දරුණුවූ; භයානකං, භයඋපදවන්නාවූ; ඝොරං, කර්කශවූ; කම්ම කරණං, කම්කටුල්; භුසං, අනවරතයෙන්; කාරෙන්තා, කරවන්නෙන්; කථං පුඤ්ඤං කරිස්සති, කෙසේ පින් කරන්නේද?

(සද්ධම්මොපායනය)

10. තිරිසන් ජාතිය උපතත් පව්කො ට
අවසන් නොව බිය සවනී සිට යි ට
මදසන් සුන් කමකුත් නැත හැමවි ට
සලසන් නේ කෙලෙසද සිතු පිණ කට

පව්කොට, පාප කර්මයන් කොට; තිරිසන් ජාතිය උපනත්, තිරශ්චාන යෝනියෙහි උපන්නේවීනම්; අවසන්නොව, අවසාන රහිතව; පිට පිට, නිතර නිතර; බිය පවතී, භය පවත්නේයි; හැමවිට, සියලු කාලයෙහිම; මඳ සත් සුත් කමකුත් නැත, ස්වල්පවූ (සිත) සන්සිඳීම් මාත්‍රයකුත් නැත්තේය; සිතු, චින්තය; පිණකට, පුණ්‍යකර්මයක් පිණිස; සලසන්නේ, යොමුකරන්නේ; කෙලෙසද, කවරාකාරයකින්ද?

**තිරිසන්**–"තිරියතො යෙව විනතානනති, ගච්ඡනතීව සයනතිව
තිරොගතිචඡා ධමෙමසු, තිරච්ඡානාත තොමතා"

යම් හෙයකින් හරසම සිතත්ද සරසම් යෙද්ද සරසම සයනය කෙරෙද්ද, ධර්මයෙහි මුවහවූ ඉච්ඡා ඇත්තෝද, එහෙයින් '**තිරශ්චාන**'යහයි දත්නාලදහු.

**තිරිසන් ජාතිය.........සලසන්නේ කෙලෙසද සිතු පිණකට–**

"සඩමමසඤඤරහිතෙ, සදා උබබිගගජීවිතෙ,
තිරච්ඡාන භවෙ සනෙතා, කථං පුඤඤං කරිසසති"

සඩමම සඤඤරහිතෙ, සඩර්ම සංඥරහිතවූ (සඩර්මයක සංඥවක් නැත්තාවූ; සදා, සැමකල්හිම; උබබිගගජීවිතෙ, උච්ගනාවූ (මරණ භයින් භයපත්වූ) ජීවිත ඇති; තිරච්ඡාන භවෙසනො, තිරිසන් භවයෙහි වූයේ; කථං පුඤඤං කරිසසති, කෙසේ පින් කරන්නේද?

(සඩමෙමාපායනය)

11. උ ප න ත් ජේතව පව්කොට නොප ණ ත්
කලෙ කත් නොලැබෙයි සෙම් සොවු පම ණ ත්
උ ගු ර ත් නොතෙමෙයි සුරඟඟ වැවු ණ ත්
ම ද කු ත් පින් නොකළැකි මැයි සිතු ණ ත්

නොපනත්, ප්‍රඥප්තියට විරුඩවූ; පව්කොට; අකුසල්කොට; ජේතව උපනත්, ප්‍රේතාත්මයෙහි උපන්නේවීනම්; සෙම්සොවු පමණත්, සෙම් හා සොවු පමණවත්; කලෙකත් නොලැබෙයි, කාලයකදිවත් නොලැබෙන්නේය; සුරඟග වැවුණත්, ආකාශ ගංගාවෙහි පතිතවූයේවී නමුත්; උගුරත් නොතෙමෙයි, උගුරවත් නොතෙමෙන්නේය; සිතුණත් (පින්කිරීමට) චිත්තාභිලාෂයක් ඇතිවූයේවී නමුත්; මඳකුත්, ස්වල්පයක්වත්; පින් නොකළැකිමැයි, පුණ්‍යකර්මයක් කළනොහැක්කේමැයි.

**ප්‍රේතව**-“සකම්මවාරිතත්තාප, ආහාරන්’මතන්දිතා
ඉතොවිනතාව පයතා, ඉතිපෙතා’ති සද්දිතා”

තම තමන්ගේ කර්මයෙන් වලකනලද බත් පැන් ඇත්තාහු අනලස්ව සැනපුම් නැතිව ආහර පිණිස ඔබමොබද යෙත්නුයි ‘ප්‍රේත’යන ශබ්දිතයෝයි. (කියනලදහුයි.)

**1. නිජ්ඣාම තණ්හික, 2. ඛුප්පිපාසික, 3. පාංශුපිසාච 4. පරදත්තූපජීව** යයි ප්‍රේතයෝ සතර කොටසක් වෙති.

1. රුක් සිදුරෙක්හි දිලි දිලී ඇවිලෙන ගිනිකඳන්මෙන් ඇතුළත සා පිපාසදෙකින් ඇවිලෙන ගිනි කරණකොට ගෙන විශෙෂයෙන් පීඩා විඳින ප්‍රේත කොටස **‘නිජ්ඣාමතණ්හික’** නම්.

2. නොයෙක් බුද්ධාන්තර ගණනක් සා පිපාස දෙකින් පෙලි පෙලී සිටින ප්‍රේත කොටස **‘ඛුප්පිපාසික’** නම්

3. අසූචි පහරණාදී හැන්වල ඉපිද එහිම වාසය කරණ ප්‍රේත කොටස **‘පාංශු පිසාච’** නාම්. ගල් ආකාරව උපදනාහු මේ කොට සෙහිම ගැණෙත්.

4. අනුන් නිසාම ජීවත් වන්නාවූ හෙවත් අනුන් දෙනපින් ලැබීම් ආදියට බලාසිටින ප්‍රේත කොටස **‘පරදත්තූපජීව’** නම්

**උපනත් ප්‍රේතව... .....පින් නොකළැකිමයි-**

“ගන්ත්වාන පෙත්ති විසයං, සන්තාප පරි සොසිතො
ඛුප්පිපාසා පරිස්සන්තො, කථං පුඤ්ඤං කරිස්සති”

පෙත්ති විසයං, ප්‍රේත විෂයට; ගන්ත්වාන, ගොස් (එහිලා) සන්තාප පරිසොසිතො, (අග්නිසන්තාප, ශොක සන්තාප යන මේ) දෙතැවීමෙන් වියලෙන ලද්දේ; ඛුප්පිපාසා පරිස්සන්තො, සා පිපාස දෙකින් පරිශ්‍රාන්තවූයේ (පිරිකුණේ); කථං පුඤ්ඤං කරිස්ස ති, කෙසේ පින් කරන්නේද?

(සද්ධම්මොපායන)

**සුරගඟ**-සුරගඟ හෙවත් ආකාශ ගඞ්ගාව මෙසේ දතයුතු:— අයම් එතරින් තුන් තුන් දහස් යොදුන් පමණවූ උසින් පන් සියයක් යොදුන් පමණ ඇති සුවාසුදහසක් රන් රිදී මැණික් පර්වතයෙන් ප්‍රතිමණ්ඩිතවූ හැමකල් හිමයට වාස ස්ථාන හෙයින් හිමාලයනම්වූ වන ප්‍රදෙශයෙහි අනොතත්ත නම් විලෙක් ඇත්තේය. ඒ විල වටකොට සුදර්ශනකූටය, චිත්‍රකූටය,

කාලකූටය, ගන්ධමාදනකූටය, කෛලාසකූටයයි පර්වත පසෙක් පිහිටියේය. ඒ පර්වතයන්ට දෙවියන්ගේ අනුභාවයෙන් මස කට සතර වැස්සෙක් වස්නේය. එයින් පර්වත මුදුනෙහි ගත් දිය ගඞ්ගාමෙන් ගලා බස්නේය. ඒ හැමනදීහු අනොතත්ත විලටම වදනාහුයි. අනොතත්ත විලට දෙවියන් විසින් කරණ ලද රිදී පවුරෙක් ඇත්තේය. ඒ පවුර තැනින්තැන සෝපාන මාලා වලින් යුක්තවූ නාහන තොටවලින් හොබනේය. ප්‍රාණීන් රහිතවූ නිර්මල ජලය බුදුපසේබුදු මහරහතන් වහන්සේලාටද සිද්ධවිද්‍යාධරාදිවූ දෙවියන්ටද ප්‍රයොජනවත්විය. ඒ විල සතර දිසින් ගඞ්ගා සතරෙක් හුණුයේය. පශ්චිමොත්තර පූර්ව දිශාවෙන් නික්මුණු තුන්ගඞ්ගාවෝ තුන්තුන්වට විලවට ප්‍රදක්ෂිණ කොට මහවන මැදින්ම ගොස් සමුද්‍රයට වදනාහ. දකුණට නික්මුණු ගඞ්ගාව තුන්වටක් විල්වටා පැදකුණු කොට ‹කුණු පස මහගලතලක් මුදුනෙන් සැටයොදුනක්තැන් ගොස් සරස සිටි පර්වතයක පැහැර තුන්ගව්වක් පමණවට ඇති දියකඳ අහසට පැනනැගී සැටයොදුනක්තැන් අහසින් ගමනයකෙරේ. මෙසේ අහසින් ගමන්ගත් ජලධාරා තොමෝ **ආකාශ ගඞ්ගා** නම්විය. අනොතත්ත නම් විල පිහිටිවන ප්‍රදෙශය දශවිධ සුගන්ධයකින් යුක්ත බැවින් එම විලෙහි නිර්මල ශීතල ජලය තෙම එම සුගන්ධයෙන් සම්පෘක්තවිය. එහෙයින් අකාශ නදියෙහි ජලය තෙම දශවිධ සුගන්ධයකින් සුරභිවූ ප්‍රණීත ජලයෙකි. මේ ජලය වනාහී අති නිර්මලවූ ශුභ්‍රවර්ණයකින් ශොභාමත් වෙයි. ජලය මාරුත සම්ප්‍රාප්තව සතත කම්පිත හෙයින් නදීතොමෝ ශුභ්‍රවර්ණ තරඞ්ගමාලායෙන් හැම්කල් මනොනයනාභිරාමව බබළා. මේ නදියෙහි නා නා වර්ණයෙන් හා නා නා ස්වරයෙන් යුක්තවූ ආකාශචාරී පක්ෂිමාලාවෝ නිතර සඤ්චාරණය කෙරෙති. සිද්ධවිද්‍යාධර දිව්‍ය දිව්‍යාඞ්ගනාවෝද එහි බැස ජලක්‍රීඩනයෙන් අප්‍රමෙය ප්‍රීතියට පැමිණෙත්.

(ගුත්තිලකාව්‍ය වර්ණනා)

සුරගඟ හෙවත් ආකාශ ගඞ්ගාව බොහෝ කාව්‍යයන්හී සඳහන් වේ. එය දක්වනු සඳහා කවි පඞ්ක්තියක් මෙහි යොදන්නෙමු.

**කාව්‍ය ශෙඛරයෙහි :—**

අහස් ගඟ යමු නා
එක්වූ තැනෙහි සොබ නා
පයා ගඟ දිය නා
ගිමන් සැරසී කුමරු දිය නා

කුසජාතක කාව්‍යයෙහි :—

පිළි මිණි පවුර ල ග
බබලන දිය අගල ර ග
ගනහර බහුරි ර ග
කෙළෙස වට හුණු වැනන සුරග ග

ගුත්තිල කාව්‍යයෙහි :—

සොඳ පුන්සඳ සොමිකිරණින් පිහිකු ළු
වැද සුරගඟ රළ වටකළ සුල කු ළු
තිද සිරි සර පාමින් රන්ගිරි කු ළු
ඇද පිරිසිදු සුදු සිතිඳු කසී ස ළු

සැළලිහිණි සන්දේශයෙහි :—

ව ල දින අදහසින් මෙන් සුරගඟ අහ ණ
නා ල බල සසල දළ රළපෙළ නුබ නැඟෙ ණ
වෙ ල ලසැ ගැවසි මුතු සක් පබළු බබල ණ
බ ල මහ මුහුද එමසඳ උතුරෙන් පෙනෙ ණ

ගිරා සන්දේශයෙහි :—

සි ය ල් සි රි න් පිරි මෙහි පත නැරලි අ ග
තු මු ල් සු නි ල් මිණි පැහැ පැතිර සුරම ග
අ ස ල් මෙ මි න් රිදී සඳු හට පලඟ ර ග
මසවල් ලෙසි න් දිසිවිය ගොස් අහස් ග ග

බුදුගුණ අලංකාරයෙහි :—

ක ර වැ ල් අවුලෙන් තිරිසන් වන ද ග
ය ම ප ල් බිළිඳුයන් අදනා ලඟ ල ග
ඇ ම ක ල් දලවුල් වේ තරණි ග ග
සි හි ලැ ල් දියවිය එලසින් සුරග ග

12. පව් මිස පිණකැයි නොකරණ හැම ක ල
මුනි බණ නොපවතිනා පිළිසක්ව ල
නිකිලෙස උපනය් ලැබෙදන මන ක ල
කිසිකලෙකත් කුසලක් නොකළැකි බ ල

හැමකල, සදා කල්හි; පව්මිස, පාපයක්ම විනා; පිණකැයි, කුසලයෙකැයි; නොකරණ, නොකරන්නාවූ; මුනිබණ, බුඩධර්මය; නොපවතිනා, නොපවත්නාවූ; පිළිසක්වල, ප්‍රත්‍යන්ත චක්‍රවාට යන්හි; මනකාල, මනඃ කල්‍යවූ; දනලැබ, ධනලාභිව; නිකිලෙස

උපනත්, (භවභොග සම්පත්තියෙන් ආඪ්‍යව) නිසි ආකාරයකින් උපන්නේවිනමුත්; බල, බලවත්වූ; කුසලක්, කුසල කර්මයක්; කිසි කලෙකත් නොකළැකි, කවර කාලයකවත් නොකොට හැක්කේය; (හෙවත් කුසලක්, කුසලකර්මයක්; කිසිකලෙකත්; කවර කාලයකවත්; නොකළැකි, නොකළ හැක්කේමය; බල, අවලොකණ්‍යකරව.)

**පිටසක්වල ..........කුසලක් නොකළැකිබල-**

"අච්ඡන්තා ධම්ම බහුලෙ-මුනින්ද සුත වජ්ජිතෙ
පච්චන්තා විසයෙ ජාතා-කථං පුඤ්ඤං කරිස්සති."

මුනින්ද සුත වජ්ජිතෙ, මුනීන්ද්‍ර සුතවූ (තථාගතයන් වහන්සේගේ දරුවූ) ශ්‍රාවක සංඝයා විසින් වර්ජිතවූ; අච්ඡන්තා, අතිශයින්ම; අධම්ම බහුලෙ, අධර්ම බහුලවූ; පච්චන්ත විසයෙ ජාතා, ප්‍රත්‍යන්ත දෙශයෙහි උපන්නෝ; කථං පුඤ්ඤං කරිස්සති, කෙසේ පින් කරන්නේද?

(සද්ධම්මොපායනය)

**සක්වල** – සමස්ත ලොකවාසි සත්ත්වයන්ගේ කර්මානුකූලලෙස ජනිතවූ මහදිව්, කොදිව්, හිමවු, කුලපව්, මෙර, සයුරු ආදිය එකහෙළා එලිකළ දීගිඳ නිසසුරු කරපතුරුවා පවත්නාතැන් **සක්වලෙක්** නම්වේ. මෙසේ පවත්නාවූ අගණිත චක්‍රවාලාන්තර වලින් **බුඩ, ප්‍රත්‍යෙකබුඩ, ආර්යශ්‍රාවක, චක්‍රවර්ති නරෙන්ද්‍රාදී සත්ව ජනමවූ සර්වගුණානුභාවයෙන් උත්කෘෂ්ටවූ චක්‍රවාලය, මධ්‍යල චක්‍රවාල (මගුල්සක්වල) නම්වේ.** ඉතිරිවූ **ප්‍රත්‍යන්ත චක්‍රවාල** (පිටසක්වල්) නම්වේ. මගුල් සක්වල වනාහි **පූර්ව විදෙහය, අපරගොයානය, උතුරුකුරුදිවයින, ජම්බුද්වීපය** යන සතර මහාද්වීපයකින් හා මේ එකීනෙක මහාද්වීපයට පරිවාරවූ පන්සියයක් පන්සියයක් කොදෙව්වලින්ද යුක්තවේ. මෙකී සක්වල පළල දෙලොස් ලක්ෂ තුන්දස් සාරසියයක් යොදුනෙක, දිග සතිස්ලක්ෂ දසදහස තුන්සිය පණස් යොදුනෙක. පස්පොළොව සතර දෙලක්ෂ සතලිස් දහසක් යොදුනෙක. ඒයට දිය පොළොව සාරලක්ෂ අසූදහසක් යොදුනෙක. ඒයට වාපොළොව නවලක්ෂ සැටදහසක් යොදුනෙක. ඒයට කිසිවස්තුවක් නැතිහෙයින් අජටාකාශයයි කියනලද. එහි ඉමක් නැති. මේ මගුල්සක්වලිනුත් දෙදහසක් කොදෙව් හා පූර්වාපර උතුරුකුරු දිවයිනැයි යන මහාදිවයින් වලද බුඩ, ප්‍රත්‍යෙකබුඩ, ආර්ය ශ්‍රාවකයන් හා චක්‍රවර්ති මහ රජහු නූපදනාහ, ජම්බුද්වීපයෙහිම උපදනාහ. එසේහෙයින්

මඩගල චක්‍රවාලාන්තරයෙහුන් ජම්බුද්වීපයම විශිෂ්ට වන්නේය. එක් විටක චක්‍රවර්ති රජහු දෙදෙනෙක් නූපදනාහුය. එසේම සුන්‍ය කල්පයෙහිද නූපදනාහුය. බුදු පසේබුදු මහරහතුන් උපදනා අසුන්‍ය කල්පයෙහිම උපදනාහුය. සර්වඥ වරයන් හා චක්‍රවර්ති රජහු එක්කලෙක නොපැලඹෙන්නාහුය. එක්කල්හිම උපනත් බුදුන් ලොව්තුරා බුදුවන කාලයට චක්‍රවර්ති රජහු කළුරිය හෝ කෙරෙති. නැතහොත් බුදුසසුන් වැද මහණවෙති. චක්‍රවර්ති රජුගේ සප්තවිධ රත්නයන් ප්‍රධාන සකලෛශ්වර්යයම පූර්වයෙහි කළාවූ දානශීලාදිවූ අප්‍රමාණ කුශලානු භාවයෙන් ප්‍රාදුර්භූතවේ. ඒ සප්තවිධරත්නයෝ නම් කවරහුදයත්? 1. (සර්වාකාරයෙන් පරිපූර්ණ නාභි, නිම්වළලු සහිතවූ දහස්දහසකින් බොරලන්නාවූ) චක්‍රරත්නය. 2. (අවයව සම්පත්තීන් ශොභමානවූ රිදී පර්වතයක්මෙන් බබලන්නාවූ සර්වලක්ෂණ සම්පන්නවූ) හස්ති රත්නය 3. (නොයෙක් දහස් ගණන් අස් සෙනඟ පිරිවරණලද ආකාශයෙහි වලාකුළු මැඩීමින් යන්නට සමර්ථවූ ජවබලඇති) අශ්වරත්නය 4. (සුවාසූ දහසක් මාණික්‍යරත්නයන් පිරිවරා රාත්‍රි භාගයෙහි හාත් පසින් සතර ගව්වෙක අන්ධකාර විධ්වංශනය කොට දිලිසෙන්නාවූ) මාණික්‍යරත්නය 5 බහා පළඳනා මාණික්‍යමය කුණ්ඩලාභරණාදිවූ දෙව්නිර්මිත නොයෙක් කිසෝ පළඳනාවෙන් සොභාමත් සිව්සැටක් පමණ ස්ත්‍රීලක්ෂණයෙන් යුක්තවූ දිව්‍යප්සරාවක මෙන් විරාජමානවූ නොයෙක් දහස් ගණන් කිසෝවරුන් පිරිවරණලද) ස්ත්‍රී රත්නය 6. (මිහපොළොව ඇතුලෙහි යොදුනක් පමණ තැන්හි පිහිටනලද නිධාන දක්නාතරම් මහානුභාව සම්පන්න දිවැස් ඇති සියළු සම්පත්තියෙන් ආඪ්‍යවූ නොයෙක් දහස්ගණන් සිටුවරුන් පිරිවරණලද්දවූ) ගෘහපති රත්නය. 7. (දහස්ගණන් සේවකයන් පිරිවරණලද්දවූ සතිස් යොදුනෙහි පැතිර සිටින මහසෙනග හා සමග රජහුගේ අභිප්‍රාව දැන ඒවූපරිද්දෙන් පිළිපදිනව සමර්ථව පරසිත්දන්නා දිව්‍යඥාන ඇති කාර්‍යාකාර්‍යයෙහි දක්ෂ ව්‍යක්ත මුඛනවාදීවූ ප්‍රඥාසම්පන්නවූ ජ්‍යෙෂ්ට පුත්‍රයයි කියනලද) පරිනායකරත්නය යන මොව්හුයි.

(චක්‍රවර්ති සීහනාද සූත්‍රය හා සද්ධර්මරත්නාකරය)

13. ද ද මිනිසුන් බස් ගෙන කිසි කලෙ ස ය
ස ද අකුසල් කොට කාලින් වැළ ස ය
අ ද ගොලු බිහිරිව ලදුවන් මේ ස ය
ම ද මිණිසුන් නොසිරෙයි බල නිසා ස ය

කිසිකලෙකත, කිසියම් කාලයෙක්හි; දද මිනිසුන් බස්ගෙණ, අඥනයන්ගේ වචන විශ්වාසකොට; කුසලින් වැලකය, පුණ්‍යක්‍රියාවෙන් මෙන්ව; තද අකුසල් කොට, දුඃඛ පාප කර්මයන් කොට; (ඒ අකුසල විපාකයෙන්) අද ගොලු බිහිරිව, අන්ධව, ගොලුව, බිහිරිව; මේකය ලදුවත්, මේ ශරීරය ලද්දේවී නමුත්; මද පිණකුත්, සවල්පවූ කුසලයකුත්; නොපිරෙයි, නොපිරෙන්නේය; බල, බලව; නිසැකය, ශඞ්කාවක්නැත; (නොහොත් බල නිසැකය, නිශ්ශඞ්කිව (සඞ්කා රහිතව) මෙය බලව)

**අඳ ගොලු බිහිරිව……… මද පිණකුත් නොපිරෙයි-**

"ජළො මූගාදි කොවාපි-විපාකා වරණෙසිතො'
ගහණො පාය රහිතො-කථං පුඤ්ඤං කරිස්සති"

ජළො, (දන්නාවුන් කීවාක් අසන දරණ පමණ නුවණ නැතිව) ජඩවූද; මූගාදි කොවාපි, ගොලුව ජාත්‍යන්ධව ජාතිබධිරවූද; විපාකා වරණෙසිතො, විපාකාවරණ අහෙතුක පිළිසඳ සිටියේද; ගහණො පායරහිතො, සදහම් ගන්නට උපාය නැත්තේ; කථං පුඤ්ඤං කරිස්සති, කෙසේ පින් කරන්නේද?

(සද්ධම්මො පායනය)

**14. සිත මිස කය නැති බඹලොව සතරෙ කි**
**සිත නැති වම කය ඇති බඹ තලයෙ කි**
**මෙද සත පින් කොට උපදින පෙදෙසෙ කි**
**එහි උපනත් කුසලක් නොම කළ හැ කි**

සිත මිස, විඥානයවිනා; කයනැති, ශරීරයක් නැත්තාවූ; බඹලොව් සතරෙකි; බ්‍රහ්මලෝක සතරක් වෙති; සිත නැතිවම, විඥානය රහිතවම; කය ඇති, ශරීරය (පමණක්) ඇත්තාවූ; බඹතලයෙකි; එක්බඹතලයෙක් වෙයි; මෙද, මේකී සත්ත්වයෝද; සත, සත්වයෝ; පින් කොට, පුණ්‍යකර්මකොට; උපදින පෙදෙසෙකි, උපදින්නාවූ ප්‍රදේශයෝවෙත්; එහි උපනත්, එකී ස්ථානවල උපන්නේවී නමුත්; කුසලක් නොම්කළහැකි, කුසල කර්මයක් කළ නොහැක්කේයි.

**සිත මිස කය නැති බඹලොව සතරකි**—රූපය විඳුමාන කල්හි දඬුමුගුරු ශස්ත්‍රාදිය ගෙණ සත්ව ඝාතනාදිය කරන්නේයයි රූපයේදෝෂ දැක රූපය නැති කරණුවස් අරූපධ්‍යාන උපදවා ඒ ධ්‍යාන බලයෙන් ආකාශයෙහි සතර නාමස්කන්ධයන් පමණක් පහළව පවත්නා ස්ථාන සතරයි. **අරූප භවයයිද** මෙයටනාම. ඒ ස්ථාන සතර නම් :-

**1. ආකාශානඤ්චායතනය**-රූපස්කන්ධයහැර සතර නාමස්කන්ධ මාත්‍රයන් පවත්නා ආකාශ ප්‍රදේශයයි. එහි ආයු මහාකල්ප (20000) විසිදහසකි.

2. **විඤ්ඤාණඤ්චායතනය**-ඒ කසිණුග්ඝාටිමාකාශයෙහි උපදවාගත් විඥානය අරමුණු කොට උපදවාගත් ධ්‍යාන තලයයි. එහි ආයුෂ මහාකල්ප (40000) සතලිස් දහසකි.

3. **ආකිඤ්චඤ්ඤායතනය**-ඒ ආකාශානඤ්චායතන විඥානයාගේ නාස්තිභාව ප්‍රඥප්තිය අරමුණු කොට උපදවාගත් ධ්‍යාන තලයයි. එහි ආයුෂ මහාකල්ප (60000) සැටදහසකි.

• **නෙවසඤ්ඤා නා සඤ්ඤායතනය**-තෘතීයා රූප්‍ය විඥානය අරමුණු කොට උපදවාගත් ඉතා සියුම් සතර නාමස්කන්ධය පවත්නා තලයයි. එහි ආයුෂ මහාකල්ප (84000) සුවාසූදහසකි.

මේ සතර අරූපාවචර බ්‍රහ්මලෝකයෝ ෂොළොස් රූපාවචර බ්‍රහ්මලෝකයන්ට මත්තෙහි පිළිවෙලින් මතුමත්තෙහි පිහිටා තිබේ.

**සිතනැතිවම කය ඇතිබඹ තලයෙකි**-නාම ධර්මයෙහි අපුණු දක ඒ නාම ධර්මය නැතිකරණු පිණිස භාවනාවඩා ඒ ධ්‍යාන බලයෙන් තිර්යක්කායන් උපදනා එකම රූපස්කන්ධය පමණක් සිත් පිත් නැත්තාවූ පිළිරූමෙන් මහාකල්ප පන්සියක් පවත්නා තලයයි, අසඤ්ඤතලයයිද මෙයටනම්.

**සිත සිය කයනැති.........කුසලක් නොමකළහැකි-**

"ආරුප්පා සඤ්ඤ ලොකෙපි-සවණොපාය වජ්ජිතො
සද්ධම්ම සවණාභිඤ්ඤා-කථං පුඤ්ඤං කරිස්සති."

ආරුප්පාසඤ්ඤලොකෙපි, අරූතල අසංඥතල යනමේදෙලොවෙහිදු (කන් නැති හෙයින්) සවණොපාය වජ්ජිතො, අසන්නට උපායෙන් විජිතවූයේ; සද්ධම්ම සවණාභිඤ්ඤා, සද්ධර්ම ශ්‍රවණයෙන් පිරිහුණුයේ; කථං පුඤ්ඤං කරිස්සති, කෙසේ පින්කරන්නේද ?
(සද්ධම්මොපායනය)

15. බලකොටු වි න් නර මෙසසර නුව රේ
මු ලැ ස වු ව න් දලු ලන පව් පඳු රේ
වි ස කා වු ව න් සග මොක් මග අතු රේ
මි ස දි ටු ව න් ඇසවත් පින නොක රේ

මෙසසර නුවරේ, මේ සංසාර නමැති නගරයෙහි; බලකොටු වන්, සවිර බලකොටු වැනිවූද; පව් පඳුරේ, පාපය නමැති පඳුරෙහි; දලුලන, දලු දමන්නාවූ; මුලැසවුවන්, ඇසවු මුලක්වැනිවූද; සග මොක් මග අතුරේ, ස්වර්ග මෝක්ෂ මාර්ගාන්තරයෙහි; විස කටුවන්, විසකටු වැනිවූද; මිසදිටුවන් අසවත්, මිථ්‍යාදෘෂ්ටි ගත්තාවූවන්ටත්; පින් නොපිරේ, පින් නොපිරෙන්නේයි.

**බලකොටු වන් තර මෙසසර නුවරේ**-සසර සතුරන් ගෙන් වන උපද්‍රවාදියෙන් වළක්වා ගැණීමට නගරයකට බලකොටුවක් ආධාර වන්නේ යම්සේද, එසේම සංසාරය නුවරකට උපමා කරණකල්හි එය දීර්ඝකාලයක් ආරක්ෂාකරගැණීමට (සසර බොහෝ කාලයක් හැරී සැරීමට) මිථ්‍යාදෘෂ්ටිය බලකොටුවක් වැන්න.

**මුලැසටු වන් දලු ලන පව් පඳුරේ**-මිථ්‍යාදෘෂ්ටි ගතවූවෝ පවට බිය නොව පව්කම්හි ඇලී ගැලී වාසය කරණ බැවින් පාප පඳුර කට උපමා කරණකල්හි මිථ්‍යාදෘෂ්ටිය එහි ලපටිපත්‍ර (දලු) දමන්නාවූ ඇසටු මූලක් මෙනි.

**විසකටුවන් සගමොක් මග අතුරේ**-මිථ්‍යාදෘෂ්ටිය ස්වර්ග මොක්ෂ සම්පත් ප්‍රතිලාභයට බාධාකරණ බැවින් එය නිර්වාණ මාර්ගයෙහි ආස්තරණය කරණලද විසකටු වැන්න.

**සිසැදිමු වන් අසටන් පින් නොපිරේ**-

“උක්ඛෙත්තා පාපිකං දිට්ඨිං-සබ්බථා අනිච්ඡන්තිසං
සංසාර ඛාණු භූතෝහි-කථං පුඤ්ඤං කරිස්සති”

සබ්බථා අනිච්ඡන්තිසං, හැමතැනින්ම නොනැවතිය හැකිවූ; පාපිකං දිට්ඨිං, පවටුවූ මිථ්‍යාදෘෂ්ටියට; උක්ඛෙත්තා, බටුයේ; සංසාර ඛාණු භූතෝහි, සසර කනුවක් බඳුවූයේම; කථං පුඤ්ඤං කරිස්සති; කෙසේ පින් කරන්නේද ?

(සද්ධම්මෝපායනය)

16. බු දු කෙනකුන් මේ ලොව නුපන් ව ර
අ දු රෙක් මෙන් සදහම් නැති මෙසස ර
ඉ ඳු රා නොදකෙනසී පව් පින් තොරතු ර
සි දු නොකළැකි ඉන් සගමොක් සිරිස ර

බුදුකෙනෙකුන්, සර්වඥවරයෙක්; මේ ලොව, මේ ලෝකයෙහි; නුපන්වර, උත්පාද නොවූ කල්හි; (නොහොත් අබුද්ධොත්පාද කාලයෙහි) සදහම් නැති, ශ්‍රීසද්ධර්මය නැත්තාවූ; මෙසසර, මේසංසාරය; අඳුරෙක්මෙන්, අන්ධකාරයක්මෙන්; පව් පින් තොරතුර, පාපපුණ්‍ය ක්‍රියාවන්හි විශෙෂ විභාග; ඉඳුරා නොදකෙනසී, (එම අබුද්ධොත්පාද කාලයෙහි) සැබෑව අවබොධ නොවන්නේමය; නොහොත් ප්‍රත්‍යක්ෂව නොදකෙත්; ඉන්, ඒ හේතුවෙන්; සගමොක් සිරිසර, ස්වර්ගමොක්ෂ ශ්‍රී සාරය; සිදුනොකළැකි, සිද්ධකොට ගත නොහැක්කේසී.

**බුදුගොතෙනතුන්**–"බුජ්ඣිතා සච්චානී"ති බුද්ධො, බොධෙතා පජායාති බුද්ධො, සබ්බඤ්ඤුතාය බුද්ධො, සබ්බදස්සාවිතාය බුද්ධො, අනඤ්ඤනෙය්‍යතාය බුද්ධො, එකසිතාය බුද්ධො, එකන්ත වීතරාගොති බුද්ධො, එකන්ත වීතදොසොති බුද්ධො, එකන්ත වීතමොහොති බුද්ධො, එකන්ත නික්කිලෙසොති බුද්ධො, එකායන මග්ගං ගතොති බුද්ධො, එකො අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුද්ධොති බුද්ධො," යනුහෙයින් චතුස්සත්‍යාවබොධය කළ හෙයින්ද බුධ නම්වේ, ද්‍රජාවසඞ්ඛ්‍යාත සත්වයන් අතුරෙන් බොධනෙය්‍ය පුද්ගලයන් ප්‍රබොධ කරවන බැවින්ද බුධනම්වේ, සියළුදේ දනගත් හෙයින්ද බුධනම්වේ, සියළුදේ දුටු බැවින්ද බුධ නම්වේ, ගුරූපදෙශයන් රහිතව තමන්ගේම නුවණින් දනගත් හෙයින්ද බුධ නම්වේ, නොයෙක් ගුණයෙන් විකාශනය කරණ හෙයින්ද බුධ නම්වේ, එකාන්තයෙන් රාගය දුරුකළ හෙයින්ද ද්වෙෂය දුරුකළ හෙයින්ද මොහය දුරුකළ හෙයින්ද බුධ නම්වේ, සියළු ක්ලෙශයන් දුරුකළ හෙයින්ද බුධ නම්වේ, එකාවබු නිර්වාණගාමී ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයට පැමිණි හෙයින්ද බුධ නම්වේ, හුදකලාව නිරුත්තර සම්‍යක්සම්බොධිය අවබොධකළ හෙයින්ද බුධ නම්වේ. බුධ යනමේ නාමය මෑනියන් විසින් හෝ පියාණන් විසින් හෝ සහෝදර සහෝදරියන් විසින් හෝ මිත්‍රාමාත්‍යාදීන් විසින් හෝ ඥාතීන් විසින් හෝ තබන ලද නාමයක් නොව බොධිද්‍රැමමූලයෙහිදී සර්වඥතාඥාණ ප්‍රතිලාභයෙන් දනගත යුතුවූ සකල ලෞකික ලොකොත්තර උත්තරි මනුෂ්‍ය ධර්මයන් පරප්‍රත්‍යයක් නැතුව ස්වයම්භූඥාණයෙන් මනාව අවබොධකළ හෙයින් බුදුවරයින් වහන්සේලාට ප්‍රත්‍යක්‍ෂයෙන් සිඩවූ ප්‍රඥප්ති නාමයක්වන්නේය.

"පුබ්බෙනිවාසං යො වෙදී—සග්ගාපායඤ්ච පස්සති
අථො ජාතික්ඛයං පත්තො—අභිඤ්ඤාවොසිතො මුනි
චිත්තං විසුද්ධං ජානාති—මුත්තං රාගෙහි සබ්බසො
පහීනජාති මරණො—බ්‍රහ්මචරියස්ස කෙවලී
පාරගූ සබ්බ ධම්මානං—බුද්ධො තාදි පවුච්චතී"

(බ්‍රහ්මායු සූත්‍රය)

"සිව සස් සිය නැ ණින්
දනා දුන් ව්‍යා සැළු ණින්
සුලසි අනුව ණින්
බුදු නම් විය ගුණ පම ණින්"

(බුදුගුණ අලංකාරය)

**බුදුකෙනෙකුන් මේ ලොව නූපන්වර...... ..පින් නොකළැකි දුන් සගමොක් සිරිසර-**

"බුද්ධාදිච්චෙ අනුදිතෙ-සිද්ධිමග්ගාව භාසකෙ
මොහන්ධකාරෙ වත්තන්තෙ-කථං පුඤ්ඤං කරිස්සති"

සිද්ධිමග්ගාව භාසකෙ, නිවන් මග බබුළුවන (පහයන); බුද්ධාදිච්චෙ අනුදිතෙ, සර්වඥ නමැති සූර්ය්‍යයා නොනැගි කල්හි; මොහන්ධකාරෙ වත්තන්තෙ, මොහය නමැති අඳුරෙහි පවත්නේ; කථං පුඤ්ඤං කරිස්සති, කෙසේ පින් කරන්නේද?

(සද්ධම්මොපායනය)

**17. සැබවින් බණ ඇසුවන් මුනිඳුන් කී**
**ගොළුවන් බිහිරන් සේ නොවූ සැලකී**
**ඉඳිනෙන් මිස නොප කුසලින් වැළකී**
**මෙලෙසින් පින් නොකළැකිකල් අටෙකී**

මුනිඳුන්කී, සර්වඥයන්වහන්සේ විසින් දෙශනා කරණ ලද්දාවූ; බණ, ධර්මය; සැබවින් ඇසුවත්, සත්‍යයයි ශ්‍රවණය කොටින්; ගොළුවන් බිහිරන්සේ, ගොළුවන් බිහිරන් පරිද්දෙන්; නොව සැලකී, සැලකිලි රහිතව හෙවත් නොසලකා; නොප (අෂ්ට දුෂ්ටක්‍ෂණ යෙන් විනිර්මුක්තාවූ) යුෂ්මත්හු; ඉඳිනෙන් මිස, ඉඳිනු විනා හෝ ඉපනෙන්වීනමුත්; මෙලෙසින්; මේ (පූර්වොක්ත) ක්‍රමයෙන්; පින් නොකළැකි කල් අටෙකී, පුණ්‍යකර්ම කළ නොහැක්කාවූ කාල අට පමණකා.

**මෙලෙසින් පින් නොකළැකිකල් අටෙකී-**

"යං භාවනාමයං පුඤ්ඤං-සච්චාභි සමයාවහං
නාස්සනොකාස භාවෙන-එතෙ අක්ඛණ සම්මතා

අට්ඨක්ඛණ විනිමුත්තො-ඛණොපරම දුල්ලභො
තං ලද්ධා කොපමජ්ජෙය්‍ය-සබ්බ සම්පත්ති සාධකං"

සච්ච (දුක්ඛ, සමුදය, නිරොධ; මාර්ගය න) චතුස්සත්‍යයන්ගේ; අභිසමය, දැක්මය යන මාර්ගඥාන කෘත්‍යය; ආවහං, එළවන; භාවනාමයං, විදර්ශනාදි භාවනාමයවූ; යං පුඤ්ඤං, යම් පිණක් ඇද්ද; තස්ස, ඒ පිණට; අනොකාසභාවෙන, අවකාශ නොවන බැවින්; එතෙ, මොව්හු; අක්ඛණ සම්මතා, අක්‍ෂණයෝයයි සම්මතයහ.

අට්ඨක්ඛණ විනිමුත්තො, අෂ්ට අක්‍ෂණයෙන් හෙවත් අෂ්ට දුෂ්ටක්‍ෂණයෙන් විනිර්මුක්තවූ; ඛණො, නවවනවූ ක්‍ෂණය නොහොත් අවකාශය; පරම දුල්ලභො, අතිදුර්ලභය; (එබැවින්) සබ්බ සම්පත්ති සාධකං, සියලු සම්පත් සාදන්නා; තං ලද්ධා, ඒ ක්‍ෂණ සම්පත්තිය ලදින්: කො, කවරෙක්; පමජ්ජෙය්‍ය (පින් කිරීමෙහි) පමාවන්නේද? නොපමාවන්නේමැයි.

(සද්ධම්මොපායනය)

18. දිගු පුළු ලින් සක් වළ වන් සිඳු කු ස
සිය වස කින් උඩ එන කැස්බා හි ස
විය සිඳු රෙන් නැගෙනන් දුගතිස බැ ස
නව උප දින් නම බැරි මෙමිනිස් කු ස

දිගු පුළුලින්, අයම් විතරින් (දිගින් හා පළලින්); සක්වළවන්; චක්‍රවාටය සමානවූ (හෙවත් මුලු සක්වළ සිසාරා සිටින); සිඳුකුස, සමුද්‍රකුක්ෂියෙහි; සියවසකින්, ශතවර්ෂයකින්; උඩඑන, උඩට පැමිණෙන්නාවූ; කැස්බාහිස, කැස්බෑගේ හිසක්; වියසිඳුරෙන්, විය දඬු ඡිද්‍රයෙන් හෙවත් වියගස සිදුරකින්: නැගෙනන්, උද්ගත වන් නෙත්වී නමුත්; දුගතිය බැස, දුර්ගතියෙහි අවතීර්ණව හෙවත් අපායෙහි වැටී; මෙමිනිස් කුස, මේ මනුෂ්‍ය කුක්ෂියෙහි; නව උපදින්නට බැරි, නැවත වරක් උත්පත්තිය ලැබීම උගහට්වේ.

**දුගතිස**-දුක්ඛයට පිහිට හෙයින් දුර්ගති-දුගති නම්වේ.

**නව උපදින්නට බැරි මෙමිනිස් කුස**-

"එකපුග්ගල සුත්තන්ත-කාණකච්ඡපොපමේනච
උභින්නං දුල්ලභත්තංහි-වේදිතබ්බං විජානතා"

එකපුග්ගල සුත්තන්ත, එක පුද්ගලයෙකුගේ ලොකයෙහි ඉපදීම දුර්ලභයයි වදාළ සූත්‍රයෙන්ද; කාණකච්ඡපොපමේනච, කාණකච්ඡපොපම සූත්‍රයෙන්ද; උභින්නං, (බුද්ධොත්පාද මනුෂ්‍යත්ව) දෙදෙනාගේ; දුල්ලභත්තං, දුර්ලභබව (දුකසේ ලබාගතයුතු බව); විජානතා, දන්නහු විසින්; වේදිතබ්බංහි, දතයුතුමැයි.

(සද්ධම්මොපායන)

**මනුෂ්‍යත්වය දුර්ලභපිළිබඳ නිදර්ශනයක්**-"සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො එකච්ඡිග්ගලං යුගං සමුද්දෙ පක්ඛිපෙය්‍ය තමෙනං පුරත්ථිමො වාතො පච්ඡිමෙන සංහරෙය්‍ය පච්ඡිමො වාතො පුරත්ථිමෙන සංහරෙය්‍ය උත්තරො වාතො දක්ඛිණෙන සංහරෙය්‍ය දක්ඛිණො වාතො උත්තරෙන සංහරෙය්‍ය තත්‍රස්ස කාණො කච්ඡපො සො වස්ස සතස්ස වස්ස සතස්ස අච්චයෙන සකිං උම්මුජ්ජෙය්‍ය තං කිං මඤ්ඤථ භික්ඛවෙ අපි නු සො කාණො කච්ඡපො අමුස්මිං එකච්ඡිග්ගලෙ යුගෙ ගීවං පවෙසෙය්‍යාති, යදිනූන භන්තෙ කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙනාති ඛිප්පතරං ඛො සො භික්ඛවෙ කාණො කච්ඡපො අමුස්මිං එකච්ඡිග්ගලෙ යුගෙ ගීවං පවෙසෙය්‍ය තතො දුල්ලභතරාහං භික්ඛවෙ මනුස්සත්තං වදාමි සකිං විනිපාත ගතෙන බාලෙන"යි.

බුදුහු "මහණෙනි! යම්සේ පුරුෂයෙක් එකවිට්ද වියදඬුවක් මහා සමුද්‍රයෙහි ප්‍රක්ෂෙප කෙරේද ඒ වියදඬුව පූර්වදිශා භාගයෙන් හමනා සුළඟ පශ්චිමදිශා භාගයට ගෙණයයි, පශ්චිම දිශා භාගයෙන් හමනා සුළඟ පූර්වදිශාභාගයට ගෙණයයි, උත්තරදිශා භාගයෙන් හමනා සුළඟ දක්ෂිණ දිශාභාගයට ගෙණයයි, දක්ෂිණ දිශාභාගයෙන් හමනා සුළඟ උත්තර දිශාභාගයට ගෙණයයි. එහි ඉදින් කාණකච්ඡපයෙක් වර්ෂ ශතයක් ගියකල්හි එක්යලක් හිස් නගාද, කිම හෝ මහණෙනි! ඒ කාණකච්ඡපයා හිස වියදඬු සිදුට ප්‍රවිෂ්ට හා වන්නේ හෝ?" යි වදාළෝ.

සහනු "වහන්ස! දීර්ඝකාලාපගමයෙන් යම් දවසක් ප්‍රවිෂ්ට වේනම් කියෙද්දනේද?" යි යුහු–"මහණෙනි! ඒකාණකච්ඡපයා ශංඛතසර ශතයෙන් නානා හිස ප්‍රබල වාතයෙන් උඩුත වීචි මාලා ඇති මුහුදුපිට ඇවිදුනා වියදඬු සිදට ප්‍රවිෂ්ටවනු සුලභය. මිනිස් පියෙන් ගැල එක්යළක් අපායට ගිය බාලයන්හු මිනිස් පියට එනු දුර්ලභය"යි වදාළෝ.

(ධර්මප්‍රදීපිකාව)

19. කාලැකිනි බුදුකෙනෙකුන් උපදින්නේ
දුකකිනි මිනිසත් බව ලැබ ගන්නේ
මෙලෙදකිනි මෙසසර දුක් දුර ලන්නේ
සුදනෙනි කිම විරිය නොකරන්නේ

බුදුකෙනෙකුන්, සර්වඥවරයෙක්; උපදින්නේ, උත්පාදවන්නේ; කලකිනි (අනිදිෂ්ට කාලයකින්ය; මිනිසත් බව, මනුෂ්‍යාත්මභාවය ලැබගන්නේ, (සමෙක්) ලබාගන්නේ; දුකකිනි, (ඉතාමත්) දුෂ්කරයෙනි; මෙසසර, මේ සංසාරයෙහි; දුක්, දුඃඛය; දුරලන්නේ, දුරීභූතකර ගැණීමට හැකිවන්නේ; මෙලෙදකිනි, මේ කියනලද (බුද්ධොත්පාද කාලය සහ මනුෂ්‍යාත්මය ලැබීමයන) දෙයාකාරයෙනි; සුදනෙනි, සත්පුරුෂයිනි; විරියනොකරන්නේ. (සංසාරසාගරයෙන් එතරවීමපිණිස උත්සාහ නොවඩන්නේ; කිම, කවරහෙතුවකින්ද?

**කලකිනි බුදු කෙනෙකුන් උපදින්නේ, දුකකිනි මිනිසත් බව ලැබ ගන්නේ—**

"දුල්ලභංච මනුස්සත්තං - බුද්ධුප්පාදොච දුල්ලභො
දුල්ලභා ඛණසම්පත්ති - සද්ධම්මො පරම දුල්ලභො."

මනුෂ්‍යාත්මභාවය දුර්ලභය, බුද්ධොත්පාදකාලය දුර්ලභය, ක්ෂණ සම්පත්තිය දුර්ලභය, සද්ධර්මය අතිශයින්ම දුර්ලභය.

"කිච්ඡො මනුස්සපටිලාභො-කිච්ඡං මච්චාන ජීවිතං
කිච්ඡං සද්ධම්ම සවණං-කිච්ඡො බුද්ධානං උප්පාදො"

මිනිසත්බව පිළිලැබීම දුලීභය, සත්ත්වයන්ගේ ජීවිතයද දුකය, සද්ධර්ම ශ්‍රවණයද දුලීභය, සම්බුද්ධවරයන්ගේ ඉපදීමද දුලීභය.
(ධම්මපදය)

"අවෙකල්ල මනුස්සත්තං-බුද්ධාදිච්චාභි මණ්ඩිතං
සුදුල්ලභ තරං තංහි-ඛණො නිබ්බාණ සිද්ධියා"
"හෙතු දුක්කරතොචෙව-සාරතොච මහග්ඝතො
මහාසාරංව රතනං-මනුස්සත්තං සුදුල්ලභං"
"උභයෙසං සමායොගො-ඛණො අච්චන්ත දුල්ලභො
අත්තදත්ථ පරො විඤ්ඤූ-නාවිරොධෙය්‍ය තංඛණං"

බුද්ධාදිච්චාභිමණ්ඩිතං, සම්බුද්ධ නමැති සූර්යයාගෙන් ප්‍රතිමණ්ඩිතවූ; (බුද්ධොත්පාදයෙන් හෙබි); අවෙකල්ල, (නොළ බිහිරි බැව් ආදි) වෛකල්‍ය රහිතවූ; මනුස්සත්තං, මිනිසත් බව; සුදුල්ලභ තරං, අතිශයින් දුලීභය; තංහි, ඒ මනුෂ්‍යාත්ම භාවය වනාහි; නිබ්බානසිද්ධියා, නිර්වාණසිද්ධියට; ඛණො, ක්ෂණයහි, අවකාශයහි;

හෙතුදුක්කරතොචෙව, මනුෂ්‍යාත්මය ලබන්නට හෙතුවූපින් දුෂ්කරහෙයින්ද; සාරතොච, මනුෂ්‍යාත්මයතමා සාරහෙයින්ද; මහග්ඝතොච, මාහැඟි හෙයින්ද; මහා සාරං, මහා සාරවූ; රතනං ඉව, රුවනක්මෙන්; මනුස්සත්තං, මනුෂ්‍යාත්මභාවය; සුදුල්ලභං, අතිශයින් දුලීභවෙයි.

උභයෙසං (බුද්ධොත්පාදය මනුෂ්‍යාත්මය යන) දෙදෙනාගේ; සමායොගො, එක්වීමය යන; ඛණො, අවකාශය; අච්චන්ත දුල්ලභො, අත්‍යන්ත දුලීභය; (එබැවින්) අත්තදත්ථපරො, ආත්මාර්ථයෙහි නිරතවූ (සියවැඩ කැමති); විඤ්ඤූ, නුවනැත්තේ; තංඛණං, ඒ අවකාශය; නාවිරොධෙය්‍ය, නොවරදවන්නේය.

(සද්ධම්මොපායනය)

20. ප ස් පව් කොට මෙතනත් ලැබ සෝ කා ය
ගො ස් නිරයේ දුක් විඳිනි අනේ කා ය
රැ ස් කොට ඉන් පින් මෙමිනිස් ලෝ කා ය
සි ස් නොකරව් කල්කිස් ලත් මේ කා ය

පස් පව් කොට, පඤ්චපාපයන් කොට; මෙතනත්, මේ (මිනිස්) ලෝකයෙහිත්; සෝකායලැබ, සෝකාය ලබා; ගොස්, මෙයින් (මිය පරලොව) ගමනය කොට; නිරයේ, නරකයෙහි (ඉපිද); අනේකාය,

අනේකවිධවූ හෙවත් නානාප්‍රකාරවූ; දුක්විඳිති, (නිරා) දුක්විඳින්නාහ; ඉන්, එබැවින්; මෙමිනිස් ලෝකය, මේ මිනුෂ්‍ය ලෝකයෙහිදී; පින් රැස් කොට, පුණ්‍යරාශි කොට ගෙණ; කලකින්ලත්, (දුකසේ) කාලයකින් ලබාගත්තාවූ; මේනය මේ ආත්මභාවය; සිස් නොකරව්, හිස් හෝ නිරාඵල නොවනසේ කටයුතු කරව්

**පස්පව්**—1. පාණාතිපාතය, 2. අදත්තාදානය, 3. කාමමිථ්‍යාචාරය, 4. මුසාවාදය, 5. සුරාපානය යන මේ පස **පඤ්ච දුශ්චරිත** හෙවත් **පස්පව්** නම්වේ.

**පස්පව් කොට මෙනතන් ලැබ සෝකය–**

"යොපාණමතිපාතෙති, මුසාවාදංච භාසති
ලොකෙ අදින්නං ආදියති, පරදාරංච ගච්ඡති
සුරාමෙරය පානඤ්ච, යොනරො අනුයුඤ්ජති
ඉධෙව මෙසොලොකස්මිං, මූලංඛණති අත්තනො"

යො, යම් පුද්ගලයෙක්; පාණං අතිපාතෙති, යම්කිසිසත්වයෙකු ජීවිතේන්ද්‍රියයෙන් පහකෙරේද; මුසාවාදංච භාසති, අසත්‍ය භජක බොරු කියාද; ලොකෙ, මේ ලොකයෙහි; අදින්නං, පරසන්තක වස්තුව; ආදියති, සොරාගණීද; පරදාරංච ගච්ඡති, අනුන් විසින් රක්ෂිත ගොපිතවූ ස්ත්‍රීන් කරායේද; යොනරො, යම් පුරුෂයෙක්; සුරාමෙරය පානංච, රහමෙරපීමෙහි; අනුයුඤ්ජති, නැවත නැවත යේද; එසො, මෙබඳු පුද්ගල තෙම; ඉධ එව ලොකස්මිං, පරලොවිතබා මෙලොවදීම; අත්තනො මූලංඛණති, තමාගේ ප්‍රතිෂ්ඨාමූලය කණින්නේති.

(ධම්මපදය)

**පස් පව් කොට මෙනතන් ලැබ සෝකය, ඝෝර නිරයේ දුක් විඳිති අනේකය —**

"අධිමත්තානි පාපානි–අභිසංඛාචරන්තියෙ
නිරයෙ තෙ මහාඝොරෙ–උපපජ්ජන්ති අසංසයං."

යෙ, යම් කෙණෙක්; අභිසංඛා, නිසැකව (සැකනැතිව) අධිමත්තානි පාපානි, බලවත්වූ පව්; චරන්ති, කෙරෙද්ද; තෙ, ඔහු; මහාඝොරෙ, මහාඝොරවූ (භයානකවූ); නිරයෙ, නිරයෙහි; උපපජ්ජන්ති, උපදිති; අසංසයං, සැකනැත්තේයි.

(සද්ධම්මොපායනය)

"ඉධසොචති පෙච්චසොචති-පාපකාරී උභයත්ථ සොචති
සොසොචති සොවිහඤ්ඤති-දිස්වා කම්ම කිලිට්ඨමත්තනො
ඉධතප්පති පෙච්චතප්පති-පාපකාරී උභයත්ථ තප්පති
පාපංමෙකතන්තිතප්පති-භිය්‍යොතප්පති දුග්ගතිංගතො"

පාපකාරී, (ප්‍රාණවධාදි නොයෙක්) පව්කම් කරණ සුළුවූ පුද්ගල තෙම; ඉධසොචති, (සෙසුදවස් ශොක නොකළ නමුත් මරණ කාලයෙහි ගතිනිමිත්ත වශයෙන් එළඹ සිටි නරක වගණ්‍යාදිය දුක මා විසින් කුසල් නොකොට ගත්තාලද පව්ම කරණ ලදැයි මෙසේ කර්මානුස්මරණ වශයෙන්) මෙලොවම ඒකාන්තයෙන් ශොකකරන්නේය; පෙච්චසොචති; පරලොව (අපායදුක් විඳිමින් විපාකානුභව වශයෙන්) ශොක කරන්නේයි; උභයත්ථ සොචති, (මෙසේ ඒ පාපකාරී පුද්ගලතෙම) දෙලොවම ශොකකරන්නේය; සො, ඒ පාපකාරීවූ පුද්ගලතෙම; අත්තනො, තමාගේ (හෙවත්) තමා විසින් කරණ ලද්දාවූ; කිලිට්ඨං කම්මං දිස්වා, කිලිටුවූ කායවාක් කර්මය දැක; සොචති, (මෙලොවම) ශොක කරන්නේය; සො, හෙතෙම; විහඤ්ඤති, (පරලොව අපායදුක් විඳිමින්) වෙසෙසින් පෙළෙන්නේයි;

පාපකාරී, (ප්‍රාණවධාදි නොයෙක්) පව්කම් කරණ සුළුවූ පුද්ගලතෙම; ඉධ, මේ ලෙව්හිම; තප්පති, (කර්මසන්තාපයෙන්) තැවෙන්නේය; පෙච්ච, පරලෙව්හිද; තප්පති, (විපාක සන්තාපයෙන්) තැවෙන්නේය; උභයත්ථ, මෙලෝ පරලෝ දෙක්හිම; තප්පති, (උක්තප්‍රකාරවූ කර්ම සන්තාප විපාක සන්තාපයෙන්) තැවෙන්නේය, මෙ, මා විසින්; පාපංකතං ඉති, පව්කම් කරණ ලදැයි; තප්පති, (මෙලොව) තැවෙන්නේය; දුග්ගතිංගතො, (පරලොව) දුගතියටගියේ; භිය්‍යොතප්පති, (නරකාදි සතර අපායෙහි අතිකර්කශවූ අනිෂ්ටවිපාක සන්තාපයෙන්) බොහෝ කොට තැවෙන්නේයි.

(ධම්මපදය)

21. කා ත් නා ත් මෙන් විස අඹපල පි ස් සේ
ම ත් ස ත් තොස් කර කිම පල සෙ ස් සේ
දැ ක් දැ න් එයි මරුවා පසුප ස් සේ
ඉ ක් පි න් මය කාටසුතු නම් ද ස් සේ

විස අඹපල, (කිම්පක්ක නම්) විෂ අඹඵලයන්; පිස්සේ, කැමතී සරිද්දෙදන්; කන්නන් මෙන්, භක්ෂණය කරන්නවුන් මෙන්; මත් සත් තොස්කර (රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන පඤ්චකාම සම්පත්තියෙහි) චිත්ත සන්තොෂ කොට; සෙස්සේ, ඉතිරිවන්නාවූ;

පලකිම, ප්‍රයෝජන කවරේද; දූත් දූත්, මේ වතීවාත් කාලයෙහි; (දූත්ම දූත්වව); මරුවා, මාරයා; පසු පස්සේ එයි, (තමාගා) කැපී කැපිව ඒයයි (සලකා); ඉන්, ඒහේතුවින්, දස්සේ කටයුතු නම්, දක්‍ෂලෙස කළයුත්තේනම්; පින්මය, පුණ්‍යකර්මයැයි,

**කාන් කාස් මෙන් විස අඹපල පිස්සේ-**

"ආයතිං දෙසං නාඤ්ඤාය-යෝ කාමෙ පති සෙවති
විපාකන්තෙ හනන්තිනං-කිම්පක්කමිව භක්ඛිතං"

යමෙක් අනාගත භවය නොතකමා කාම සේවනය කෙරේ නම් බු භුක්‍ෂායෙන් කන "කිපක්" සෙයින් සේ ඔහු නසයි.

(ධම්මප්‍රදීපිකාව)

"කිම්පක්ක නම් විෂ වෘක්‍ෂයාගේ කඳ අතුපත්ඵල සටහනින් හා වර්ණ ගන්ධ රසයෙන් අඹ හා සමානවන්නේය. ආම්‍ර ඵලය යන සංඥාවෙන් ඒ අනුභවකළාවූ සත්වයෝ ජීවිතක්‍ෂයට පැමිණෙන්නෝය. පඤ්චකාම ගුණයෝද පරිභෝගකාලයෙහි සිත්කළුවන්නාහ. ඒ පඤ්චකාම කොට්ඨාසයන්ගේ අනුභව කිරීම නරකාදි සතර අපායෙහි උපදවා මහදුක්දෙනබැවින් කිම්ඵලනම් විෂඵල අනුභව කිරීම හා සමාන වන්නේය."

(කිම්පක්ක ජාතකය)

X 22. ඉ ස ගිනි ගත් ගෙනකු එගිනි නිවන ලෙ ස
කු ස ලට මඳකුත් පමා නොවනු මි ස
මෙ ස සර අත් හැර නොයන මෙදුක් රැ ස
වෙසෙ සින් නැත අත්හරිනා උපදෙ ස

ඉසගිනි ගත්තෙකු, හිස ගින්නෙන් දැවෙන්නාවූ එකෙක්; එගිනි නිවන ලෙස, (ජලයක් කරා පැමිණ) ඒගින්න නිවාගන්නා මෙන්; කුසලට, කුසල් කිරීමෙහි; මඳකුත්, ස්වල්පයකුත්; පමා නොවනුමිස, ප්‍රමාදවනොසිටිවව්හා; මෙසසර, මේ සංසාරය; අත් හැර නොයන, අත්නොහරින්නාවූ; මෙදුක් රැස, මේදුක්කරාශිය; අත්හරිනා, අත්හරින්නාවූ; උපදෙස, (අන්‍ය) උපදේශයක්; වෙසෙසින් නැත, විශෙෂයෙන් නොමැත්තේයි.

**ඉසගිනි ගත්තෙකු එගිනි නිවනලෙස**-"සෙය්‍යථාපි භික්ඛවෙ ආදිත්තචෙලො වා ආදිත්තසීසො වා තස්සෙව චෙලස්සවා සීසස්සවා නිබ්බාපනාය අධිමත්තං ඡන්දඤ්ච වායාමඤ්ච උස්සාහඤ්ච උස්සොළ්හිඤ්ච අප්පටිවානිඤ්ච සතිඤ්ච සම්පජඤ්ඤඤ්ච කරෙය්‍ය එවමෙව ඛො භික්ඛවෙ තෙන පුග්ගලෙන තෙ සං අඤ්ඤඤ්ච කුසලානං ධම්මානං

පටිලාභාය අධිමත්තා ඡන්දච උස්සාහොච උස්සොළ්හිච අප්පටිවානීච සතිච සම්පජඤ්ඤච කරණීයො"—යම්සේ පිළිස හෝ හිස හෝ ගිනිගත් පුරුෂයෙක් එගිනි නිවන්නට බලවත් උත්සාහ කෙරේද එසෙයින්ම කුසල ධර්ම ප්‍රතිලාභයට බලවත් උත්සාහ කටයුතු.

(ධර්මප්‍රදීපිකාව)

"අප්පමායු මනුස්සානං-හීළෙය්‍යනං සුපොරිසො
චරෙය්‍යා දිත්ත සීසොව-නත්ථි මච්චුස්සනා ගමොති"

මනුස්සානං, මිනිසුන්ගේ; ආයු, ආයුස; අප්පං, ස්වල්පය; සුපොරිසො, සත්පුරුෂතෙම; නං, ඒආයුෂ; හීළෙය්‍ය (ස්වල්පයයි); හීනකොට ප්‍රකාශ කරන්නේය; ආදිත්තසීසොව, ප්‍රජ්වලිත ශිර්ෂ ඇත්තෙක් මෙන්; චරෙය්‍ය, (අප්‍රමාදව සත්පුරුෂතෙම) හැසිරෙන්නේය; මච්චුස්ස අනාගමො, මරුවානො ඊමක්; නත්ථි, නැත.

(මාරසංයුත්ත)

23. නැ ත කින් ගෙණ දූමුවන් කැට නුබ කු ස
අ ත රක නොරඳන මෙන් මේ බිම මි ස
සි ත සතොසින් පින් නොකළොත් නිසිලෙ ස
නැ ත සිටිනා තැන් සතර අපා මි ස

කැට, කැටක්; නැතකින්ගෙණ, උත්සාහයකින් ග්‍රහණයකොට; නුබකුස දූමුවත්, නභොකුක්ෂියෙහි දූමුයේවී නමුත්; මේ බිමමිස, මේ භූමියෙහිවිනා; අතරක නොරඳනමෙන්; අන්තරයක්හි නොරඳන්නාක් මෙන්; සිත සතොසින්, චිත්ත ප්‍රීතියෙන්; නිසිලෙස, යොග්‍ය පරිදි; පින්නොකළොත්, පුණ්‍යකර්ම නොකළේවීනම්; සතර අපාමිස, චතුර් අපායවිනා; සිටිනා තැන් නැත, සිටින්නාවූ (අන්‍ය) ස්ථානයක් නැත්තේයි.

**නැතකින් ගෙණ දූමුවන් කැට නුබ කුස........සතර අපාමිස:—**
උඩවිසිකුරණලද ගල්කැටය පොළොවේ ආකර්ෂණ ශක්තියනිසා භූමියට ඇදගණී. එමෙන් දිව්‍යලොකාදී යහපත් ස්ථානයන්ට පැමිණීමට නිසිපුණ්‍යකර්ම නොකරනලද සත්වයාද මෙලොවින් චුතවූ කල්හි පාප කර්මයේ ආකර්ෂණ බලයනිසා නරක, තිරිසන්, ප්‍රේත, අසුර යන සිව් අපායට ඇදගණී.

"කැවික් ගෙණ තුඹ කු ස
දුමුව නොරඳයි බිම මි ස
එමෙන් පව් පින් රැ ස
සිදුවිම නියතය පැතු ලෙ ස"

(කුසජාතක කාව්‍යය)

**අපා**-අය සඞ්ඛ්‍යාත සැපයෙන් පහවූ හෙයින් **අපාය** නම්වේ.

**සතර අපාය**-1. නරකය, 2. තිරිසන් අපාය, 3. ප්‍රේතලෝකය, 4, අසුරනිකාය.

1. **නරකය**-9, 93 වෙනි කවි බලනු.
2. **තිරිසන් අපාය**-10 වෙනි කව බලනු.
3. **ප්‍රේතලෝකය**-11 වෙනි කව බලනු.
4. **අසුරනිකාය-කාලකඤ්ජා** නම් ප්‍රේත අසුර කොටසෙක්වේ. කල්පගණන් බත් පැන් නොලැබ ඔවුනොවුන් විකලව ක්‍රොධයෙන් දිලිහි නානාවිධ විෂම ආයුධගෙණ කපාකොටා ගණිමින් එසින් ශරීරයෙහි හටගත් තුවාලනිසා කුණුවූ වණවූ දෙහ ඇතිව කකුළුවන්ගේ ඇස්වැනි උඩට නික්මුණු ඇස්ඇතිව ඉස මුදුනේ පිහිටි ඉදිකටු සිදුරක් පමණ ඉතා සුළුවූ මුඛයෙන් ඒ ශරීරයෙහිවූ සැරව අනුභවකරමින් වාසයකරණ යොදුන් පමණ උස ඇති දුක්ඛිත සත්ව කොට්ඨාසයකි. *

**24. තිරව නොසිත කුණුකය මෙත මායේ**
**නොතිර බවට විදුලිය උප මායේ**
**නිතර මෙකය පවකට නොක මායේ**
**කරව කුසල් විරිය නොප මායේ**

මෙතමායේ, මේ තමාගේ; කුණුකය, (දෙතිස් කුණප කොට්ඨාසයකින්යුත්) කුණුශරීරය; තිරවනොසිත, ස්ථිර පැවතුම් ඇත්තේයයි නොසිතව; නොතිරබවට, (එහි) අස්ථිර භාවයට; විදුලිය උපමායේ, විදුලිය උපමාවන්නේයි; මෙකය, මේ ශරීරය; පවකට නොකමායේ, පාපක්‍රියාවෙහි නොයොදවා; නොපමායේ, අප්‍රමාදව; නිතර, නිරන්තරයෙන්; කුසල්, කුසලක්‍රියාවෙහි; විරිය කරව, වීර්‍ය්‍ය කරව.

**කුණුකය**-52 වෙනි කව බලනු.

**නොතිර බවට විදුලිය උපමායේ**-විදුලිය ඇතිවූ ක්ෂණයෙහිම නැතිවීයන ස්වභාව ඇත්තේය. එමෙන්ම ශරීරයද ඇතිව නැතිවන ස්වභාව ඇති නිසා එය විදුලියකට බඳු උපමා ඇත්තේය.

---

* තව්තිසා දෙව්ලොවින් හෙලනලදුව මහමෙර පත්ලෙහි වසන්නාවූ අසුරයෝ මේ සඞ්ඛ්‍යාවෙහි නොගැණෙත්.

"විජ්ජු බුබ්බුල උස්සාව ජලරාජි පරික්ඛයං
ඝාතකොව රිපූතස්ස සබ්බත්ථාපි අවාරියො"

විදුලියක්මෙන්ද, දියබුබුලක්මෙන්ද, තණ අග පිණිබිඳක් මෙන්ද දිමයෙහි ඇඳි ඉරක්මෙන්දැයි මෙසේ මේ ජීවිතයාගේ අනිත්‍යභාවය මරණානුස්මෘති භාවනාවෙහි යෙදෙනා ගාථා වෙන් පැණේ.

"දිය බුබුලු විදු ලිය
ඇතුපස් බිඳට කිකි ලිය
ලඹ ඔව්ලෙහි කෙ ලිය
සයින් අනිසය මෙපණතෙක ලිය"

(කව්මුතුහර)

**විදුලිය**-මේඝයෙනි වැලක ආකාරයෙන් විද්‍යුල්ලතා භාවයෙන් පැණෙන ක්‍රියා මාත්‍රයවූ ක්‍ෂණිකාලෝකයතෙම විදුලිය නම්වේ.

"දිසවාව විජ්ජු චපලං කුරුතෙ පමාදං"

(තෙලකටාහ ගාථා)

"අන්තාන විජ්ජතිහි විජ්ජු මිවනතාලිකෙඛ"

(තෙලකටාහ ගාථා)

විදුලිය යනු අස්ථිරවූ චපලවූ වහා නැතිවන සුළුවූ ආලෝක විශෙෂයකි.

**කුසල් විරිය**-සම්‍යක් වීර්‍ය්‍ය හෙවත් සම්‍යක් ව්‍යායාමයි. "i අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදය, ii උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහාණාය, iii අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය, iv උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා"

i නුපන් අකුසල් නුපදවන්වද, ii උපන් අකුසල් දුරුකරන්වද, iii නුපන් කුසල් උපදවන්වද, iv උපන් කුසල් දියුණුකරන්වද කරන්නාවූ උත්සාහය හා යෙදුනු වීර්‍ය්‍ය පිළිබඳ චෛතසිකය සම්‍යක් ව්‍යායාම නම්වේ.

**නොපමාසේ**-"අප්පමාදෙ අමතපදං—පමාදෙ මච්චුනො පදං
අප්පමත්තා න මියන්ති—යෙ පමත්තා යථාමතා"

අප්පමාදෙ, නොපමාබව; අමතපදං, අමෘතයයි කියනලද නිර්වාණයාගේ ලැබීමට කාරණය; පමාදෙ, ප්‍රමාදභාවය; මච්චුනොපදං, මරණයට කාරණය; අප්පමත්තා, අප්‍රමාද සත්වයෝ;

නමියනකි, නොමියන්නාහ; යෙ, යම් කෙනෙක් (විනාකි); පමත්තා, ප්‍රමාදයෝද; තෙ, ඔව්හු; යථාමතා, මලවුන් හා සමයෝයි.

(ධම්මපදය)

25. අඳු රෙහි අස්ලොම විදිනට — දුරදී
විදු ලිය පැහැ වැරදුනහොත් — වරදී
විදු ලියවන් මේකය ලත් — වරදී
සිදු නොකලොත් මතු සගමොක් — වරදී

අඳුරෙහි, අන්ධකාරයෙහි; අස්ලොම, අශ්වලෝමයක්; දුරදී විදිනට, දුරසිට විදීම පිණිස; විදුලිය පැහැ, විදුලි එළිය; වැරදුන හොත්, වැරදුනේවීනම්; වරදී, බැරිවන්නේය; (එමෙන්ම) විදුලිය වන්, විදුලියකට්බඳු උපමා ඇති; මේකයලත්වරදී, මේ ශරීරය ලැබුවාවූ අවස්ථාවෙහි; සිදුනොකලොත්, (කුසලධර්මයන්) සිදුකර නොගත්තේවීනම්; මතු, අනාගතයෙහි; සගමොක්, ස්වර්ගමොක්ෂය; වරදී, වරදින්නේයි.

**විදිනටදුරදී**—විදීමනම් ධනුශිල්පයයි-එය අෂ්ටාදශ ශිල්පයන්ගෙන් එකකි—ධනු ශිල්පයෙහි ප්‍රභෙද බොහෝයි. ශරපවුරුය-ශර තොරණය-ශර පොකුණුය-ශර ප්‍රාසාදය-ශර රථය-අක්ෂණ වෙධිය-ශබ්ද වෙධිය-වාල වෙධිය-ශර වෙධිය-ගොඩ විදමණය දියෙහි විදමණය-ආකාශ විදමණය-දුර විදමණය-ආසන්න විදමණය-යපට විදමණය-තඹපට විදමණය-පිදුරු බිසි විද මණය-වැලිබිසි විදමණය-මිගං විදමණය-උදලු තැටිලි විදම ණය-දිඹුල්පෝරු විදමණය-පියපෝරු විදමණය ආදිය ඉන් සමහරකි.

**විදුලියවන් මේකය**—24 වෙනි කව බලනු.

26. කොතන වුනත් නැත මරුහම බා — දා
විදින මෙසැප පින් ඇතිනොක් වේ — දා
සගවන සසර දුක් බුදු බණ නා — දා
කුමන නැටුම් කෙළිකවට සිනා — දා

කොතනවුනත්, කවර ස්ථානයකවූයේවීනමුත්; මරුහට, මාරයාහට; බාදා නැත, බාධාවක් නැත්තේය; විදින, විඳිනය කරන්නාවූ; මෙසැප, මේ සම්පත්තීන්; පින් ඇතිනොක්වේද, පුණ්‍ය විපාකය ඇතිනොක්වද; සසරදුක්ගෙවන; සංසාර දුඃඛය තුනීකරන්නාවූ; බුදුබණනාදා, බුද්ධධර්මය නොඅදහා; කුමන නැටුම් කෙළිකවට සිනාදා, කවරනම් නාට්‍යයෙක්ද? ක්‍රීඩාවෙක්ද? කවටකමෙක්ද? සිනාවෙක්ද?

**ළොකාසන උනත් නැත මරුහට බාද**

"න අන්තලික්ඛෙ න සමුද්ද මජ්ඣෙ
න පබ්බතානං විවරං පවිස්ස
න විජ්ජතී සො ජගතිප්පදෙසො
යත්ථට්ඨිතං නප්පසහෙථ මච්චු"

යත්ථට්ඨිතං, යම් තැනෙක්හි සිටි සත්ත්වයා; මච්චු, මරණයතෙම; නප්පසහෙථ, අභිභවනය නොකෙරේද; (හෙවත්) මැඩනොපවත්වාද; සොජගතිප්පදෙසො, (කෙශගක් පමණවූද) එබඳුවූ භූමිප්‍රදෙශයක්; නවිජ්ජතී, නැත්තේය; (හුදෙක් පෘථිවිතලයෙහි මතුනැත්තේ නොවෙයි) න අන්තලික්ඛෙ, ආකාශයෙහිදු මරණින්මිදෙන්ට සුදුසු ප්‍රදෙශයෙක්නැත; නසමුද්දමජ්ඣෙ, සමුද්‍ර මධ්‍යයෙහිදු මරණින්මිදෙන්ට සුදුසු ප්‍රදෙශයෙක්නැත; නපබ්බතානං විවරං පවිස්ස, පර්වතයන්ගේ විවරයකටවැද මරණින් මිදෙන්ට සුදුසු ප්‍රදෙශයෙක් නැත්තේයි.

(ධම්මපදය)

27. සැදැහැත් තන්හට බවදුක් නොකැමැ ති
යහපත් කල් මේ කල්මිස වෙතනැ ති
දනිතොත් දන් සිල් ගුණසත නොනැව ති
පැයකුත් අවිරුදු දහසක් විතරැ ති

බවදුක්, සසර දුක; නොකමැති, කැමති නොවන්නාවූ; සැදැහැත්තන්හට, ශ්‍රද්ධාවන්තයින්ට; යහපත් කල්, (පින්කරගැණීමට) යොග්‍යකාලයක්; මේකල්මිස, මේ (බුද්ධොත්පාද) කාලයවිනා; වෙත නැති, වෙතනොමැත්තේය; සත, සත්ත්වයා; නොනැවති, නැවතීමක් නැතිව; දන්සිල් ගුණ; දානසීලයෙහි ගුණය; දනිතොත්, දන්නේවී නම්; පැයකුත්, පැයක කාලයද; අවිරුදු දහසක්, සහස්‍රවර්ෂයක්; විතරැති, ප්‍රමාණවන්නේය.

**සැදැහැත්තන්හට**—රජ සොර සතුරු ආදීන් විසින් පැහැරගත නොහෙන ආර්‍ය්‍ය ධනයෝ සත්දෙනෙක් වෙත්, එනම්:-

"සද්ධාධනං සීලධනං-හිරි ඔත්තප්පියංධනං
සුතධනං ච චාගොච-පඤ්ඤාවෙ සත්තමංධනං"

යනුවෙන් දක්වන 1. ශ්‍රද්ධා, 2. සීල, 3. හිරි, 4. ඔත්තප්ප, 5. ශ්‍රැති, 6. ත්‍යාග, 7. ප්‍රඥා, යන මොව්හුවෙත්. යම් පුද්ගලයෙක්තෙම රත්නත්‍රය හා කර්මඵල විශ්වාසය ඇත්තේද සීලසම්පන්න ආර්‍ය්‍ය ශ්‍රාවකයන් දකිනු කැමතිවේද? ධර්මශ්‍රවණයෙහි ඇළුම් ඇත්තේවේද? දාන පරිත්‍යාගයෙහි ප්‍රියවේද? ඔහුතෙම වනාහි ශ්‍රද්ධාධනය ඇත්තාවෙයි.

"කිංසූධ විත්තං පුරිසස්ස සෙට්ඨං" (මේ ලෝකයෙහි පුරුෂයාහට කවරනම් වස්තුවක් ශ්‍රේෂ්ඨවේද) යනුවෙන් ආලවක යක්ෂයා විසින් විචාරණලද පැණයට භාග්‍යවතුන්වහන්සේ විසින් "සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං" (මේ ලෝකයෙහි ශ්‍රද්ධාතොමෝ පුරුෂයාහට ශ්‍රේෂ්ඨ ධනයවේ)යයි පිළිතුරු වදාරණලද බැවින් ලෞකික ලෝකෝත්තර ශ්‍රද්ධාතොමෝ ලොකවාසි සත්වයාට ප්‍රීති ජනකවූ ශ්‍රේෂ්ඨ වස්තුව බැව් දතයුතුයි.

"දස්ස න කාමො සීලවතං-සද්ධම්මං සොතු මිච්ඡති
විනෙය්‍ය මච්ඡෙර මලං-සවෙ සද්ධොති වුච්චති"

* සීලවතං, සීලවන්තයන්; දස්ස න කාමො, දකිනු කැමතිවේද; සද්ධම්මං, සද්ධර්මය; සොතුං, අසන්ට; ඉච්ඡති, කැමතිවේද; මච්ඡෙරමලං, මසුරුමල; විනෙය්‍ය, දුරුකරන්නේවේද; සො, ඒ තෙම; වෙ, ඒකාන්තයෙන්; සද්ධොති, ශ්‍රද්ධා ඇත්තේයයි; වුච්චති, කියනුලැබේ.

(අඞ්ගුත්තර නිකාය)

**සඟපත් කල් මේ කල් මිස වෙන නැති**—අෂ්ට දුෂ්ටක්ෂණයෙන් විනිර්මුක්තව දුලභවූ මනුෂ්‍යාත්මය ලැබගත් මේ කාලය පමණ පින්කිරීමට යොග්‍යකාලයක් වෙන නැත්තේයි—

**28. අද අද එයි මරු පින්කර ගන්නේ
කෙලෙසද සෙට මරුනේති සිතන්නේ
කිකලද මහසෙන් මරු ඇපවන්නේ
කුමටද කුසලට කම්මැලිවන්නේ**

මරු, මාරයා; (හෙවත් මරණය) අද අද එයි, අද අදම එන්නේයයි; පින්කරගන්නේ, පුණ්‍යකර්මයන් කරගන්නේය; සෙට, සෙට දිනයෙහි; මරු, මාරයා; නේති, නොපැමිණෙන්නේයයි; සිතන්නේ, චින්තනයකරන්නේ; කෙලෙසද, කොයිආකාරයකින්ද; මහසෙන්, මහසේනාවට; මරු, මාරයා; ඇපවන්නේ කිකලද, ඇපවන්නේ කවරකාලයෙක්හිද; (නොහොත් මහසෙන්, මහසෙනඟකින් යුක්තවූ; මරු, මාරයාහට; ඇපවන්නේ කිකලද, ඇපවන්නේ කවරකාලයෙක්හිද;) කුසලට, කුසලක්‍රියාවට; කම්මැලිවන්නේ, අලසවන්නේ හෙවත් මැලිවන්නේ; කුමටද, කුමක් නිසාද?

**අද අද එයි මරු පින්කර ගන්නේ ....... කෙලෙසද සෙට මරු නේති සිතන්නේ**

"අජ්ජෙව කිච්චං ආතප්පං-කොජඤ්ඤා මරණං සුවෙ
නහිනො සංගරං තෙන-මහාසෙනෙන මච්චුනා"

---

* දේශනාවේ මෙසේ ඇතත් මෙකල ඇතැම් අය මෙන් බැහැරයනවිට භික්ෂූන්වහන්සේලාගේ දර්ශණය අවමඟුල්කොට සලකා සැදැහැ නැත්තෝ වෙත්. අහෝමයි!

ආතප්පං, (ක්ලේශතාපන පරිතාපනයෙහි ආතප්පයයි ලද නම් ඇති) වීර්‍ය්‍යය; අජ්ජ එව, අදම; කිච්චං, කටයුතුයි; සුවෙ, සෙට දිනා; මරණං, මරණවනු නොවනු; කො, කවරෙක්; ජඤ්ඤා, දනීද; මහා සේනෙන, මහා සේනාග ඇති; තෙන මච්චුනා. ඒ මරුහු හා; නො, අපට; සංගරං, මිත්‍රාකාරලංච දන බලරාශිසංඛ්‍යාත සඞ්ගරයක්; නත්ථි, නගමක් ඇති; (නැත්තේය)

29. කුමට ද කාබී නිති සැරසෙ ස් සේ
කොතනද මේ කය ඇරගෙණි ය න් නේ
ඇමස ද. නොමැලිව පින් කර ග න් නේ
එමව ද බව සයුරෙන් ගොඩල න් නේ

කාබී, කෑම් බීම් ආදියෙන් සම්පූර්ණව; නිති, නිරන්තරයෙන්; සැරසෙන්නේ, සූදානම් වන්නේ; කුමටද, කුමක් පිණිසද; මේකය, මේශරීරය; ඇරගෙණයන්නේ, ග්‍රහණයකොටයන්නේ; කොතනද, කවර ස්ථානයකටද; ඇමසද, සදකල්හි; නොමැලිව, නුකුසීතව; පින්කර ගන්නේ, පුණ්‍යක්‍රියාවෙහි ව්‍යාපාරවන්නේය; බවසයුරෙන්, සංසාර සාගරයෙන්; ගොඩලන්නේ, එතරලන්නේ; එමවද, එම හෙතුවින් වද.

බවසයුරෙන් — භවයසාගරයකට බඳු උපමා ඇති පරිදි කියෙසයත්:-
අවිද්‍යා නමැති වෙලානන්තයෙන් යුක්තවූයේ තෘෂ්ණා නමැති ජලයෙන් පරිපූර්ණවූයේ එක්දහස් පන්සියයක් ක්ලේශයන් නමැති උස්ව පැණ නගින්නාවූ රළපහරින් ගැවසීගත්තේ ජරාව්‍යාධි මරණාදි චණ්ඩවූ දූතිමුවර ආදි මත්ස්‍යයන්ගෙන් ගහණවූයේ දෙසැටක් දෘෂ්ටි නමැති තොට ඇත්තේ නරකාදී සතර අපාය නමැති ගැඹුරින් යුක්තවූයේ මිනිස්ලෝක නමැති ජලපිට්තලයෙන් හෙබියේ සදිව්‍යලෝක නමැති කූටපර්වතයන්ගෙන් සමලඞ්කෘතවූයේ භවාග්‍ර නමැති මහාමේරු පර්වත රාජයාගෙන් විරාජමානවූයේ නිර්වාණ ක්ෂේම භූමි නමැති පරතෙර ඇත්තේ භවසාගර නම්වේ. මේනයින් භවය සාගරයකට බඳු උපමා ඇති පරිදි දතයුතු *

30. තෙ ර ව සසර සයුරෙන් නෙපිනොල සා
තිරව ලබන මොක් සැපසිරි උදෙ සා
නොරව පවින් නිතරම මුණි බණ සා
කරව කුසල් විරිය පසු නොබැ සා

* නිර්වාණය භවයෙන් මුක්තවූයේ සාමුද්‍ර භවයෙන් එතරවූ තැන නිර්වාණය බැවින් පරතෙර දක්වනු සඳහා මෙසේ ගෙණකීනු.

තෙපි, යුෂ්මත්හු; නොලසා, අනලස්ව හෙවත් අප්‍රමාදව; සසර සයුරෙන්, සංසාරසාගරයෙන්; තෙරව, එතරව; නිරවලබන, ස්ථිරව ලබන්නාවූ; මොක් සැපසිරි උදෙසා, මොක්ෂ සුඛශ්‍රීයලැබීම සඳහා; පවින් නොරව, පාපයෙන්වැළකී; නිතරම්, අනවරතයෙන්ම; මුණි බණසා, බුද්ධ ධර්ම්‍ය ශ්‍රවණයකොට; පසුනොබැසා, පසුබට නොවී; කුසල් විරියකරව, කුසල ක්‍රියාවෙහි වීර්‍ය්‍ය වඩව්.

**සසර සයුරෙන්**—29 වෙනි කවෙහි බවසයුර යන්න බලනු.

**31.** හැ ම වි ට   පිණවම සිත පා   ද න් නේ
නි ව ණ ට   මග එමවද සා   දි න් නේ
වැ ඩ ක ට   කිබස් කිම නා   ද න් නේ
නි ර ය ට   වන් කලදේ නොප   ද න් නේ

හැමවිට, සදකල්හි; පිණවම, පුණ්‍යක්‍රියාවටම; සිත, චිත්තය; පාදන්නේ, පහදන්නේය; නිවණටමග, නිර්වාණයට මාර්ගය; සාදන්නේ, සජ්ජිතකරන්නේ; එමවද, ඒ (හේතුවෙන්) වද; වැඩකට, වැඩසිදු කිරීම පිණිස හෙවත් යහපත පිණිස; කිබස්, කථනයකල වචන; නාදන්නේ (නොඅදහන්නේ) ප්‍රතිග්‍රහණය නොකරන්නේ; කිම, කුමක්නිසාද; නොප, තුඹලා; දන්නේ (ඒ) දැනගනුලබන්නේ; නිරයට වන්කලදේ, නරකප්‍රාප්තවූ කාලයෙහිදේ?

**පිණටම සිත පාදන්නේ**—53, 121, වෙනි කවි බලනු.

**32.** මොක්   සිරි දෙන මුණිඳුන්ගේ උපත   කි
ක ප්   කෙළ සියදහසකිනුත් නොලදූ   කි
ප ත්   වූ එබුදුන්ගෙන්යුත් මෙකල   කි
එ ත්   වැරදුන නැත පරලොව පිහිට   කි

මොක් සිරිදෙන, මොක්ෂශ්‍රීය දානයකරන්නාවූ; මුනිඳුන්ගේඋපතකි, මුනීන්ද්‍රයාණන් වහන්සේගේ උත්පත්තියක්; කප්කෙළ සියදහසකිනුත්, කල්පකොටි සතසහස්‍රයකිනුත්; නොලදූකි, ලැබියනොහැක්කේය; එබුදුන්ගෙන්යුත්, එබඳු බුද්ධවරයෙකුගෙන් යුක්තව; පත්වූ, ප්‍රාප්තවූ; මෙකලකි, මේ (බුද්ධෝත්පාද) කාලයෙකි; එත් වැරදුන, ඒ කාලය වැරදුනේ වීනම්; පරලොව පිහිටකි නැත, පරලෝවෙහි පිහිටක් නොමැත්තේයි.

**කප්**—කල්පයතෙම, 1 අන්තඃකල්පය, 2 අසංඛ්‍ය කල්පය, 3 මහා කල්පයයි ත්‍රිවිධවේ.

1. අන්තඃකල්පය — සත්වයන්ගේ කුසලකම් සමාදානය හේතුකොට ගෙණ දසඇවිරිදි මිනිසුන්කෙරෙන් පටන්ගෙණ මනුෂ්‍යයාගේ ආයුෂ ක්‍රමයෙන් නැගී අසංඛ්‍යයට පැමිණ සත්වයන්ගේ අකුසල කම් සමාදානය හේතුකොටගෙණ අසංඛ්‍යයෙහි සිටි ආයුෂ ක්‍රමයෙන් බැස අවුත් දස අවුරුදු වනතෙක් මේ මැද අතුර එක් අන්තඃ කල්පයෙක් නම්වේ.

["තත්ථ අන්තර කප්පොනාම මනුස්සානං දස ආයුකො පට්ඨාය කමෙන වඩ්ඪමානං අසංඛෙය්‍යායුකං හුත්වා පුන පරිහායමානං දසවස්සායුකත්තං පාපුණාති, එත්තකං කාලං එකො අන්තර කප්පො නාම"]

ඒ දහසක් අවුරුද්දෙන් අඟලක් වඩනා පොළොව එක්යොදුන් තුන්ගව්වක් උස වඩනා පමණ කල් වන්නේයි;

[තස්ස වස්ස සහස්සෙන-වඩ්ඪතංගුලකං මහී
සෙදය්‍යං වඩ්ඪන්ති කාලන්ති-යොජන මෙව තිගාවුතං]

රොගාන්තඃකල්පය, ශස්ත්‍රාන්තඃකල්පය, දුර්භික්ෂාන්තඃකල්ප යයි අන්තඃ කල්පය ත්‍රිවිධවේ.

**රොගාන්තඃකල්පය** — අන්තඃකල්පය පෙරළෙන කාලයෙහි ජනයෝ ලොභාධික වීනම් ඔව්හු රොගයෙන් නසිති.

**ශස්ත්‍රාන්තඃකල්පය** — අන්තඃ කල්පය පෙරළෙන කාලයෙහි ජනයෝ ද්වෙෂාධික වීනම් ඔව්හු ශස්ත්‍රයෙන් නසිති.

**දුර්භික්ෂාන්තඃකල්පය** — අන්තඃකල්පය පෙරළෙන කාලයෙහි ජනයෝ මොහාධික වීනම් ඔව්හු දුර්භික්ෂයෙන් නසිති.

["රාගප්‍රතිඝමොහානා-මාධික්‍යෙන යථාක්‍රමම්
ස්‍යාද්‍රොග ශස්ත්‍ර දුර්භික්ෂෛ-රන්තඃකල්පස්‍ය නිර්ගමඃ]

2. **අසංඛ්‍යකල්පය** — අන්තඃ කල්ප විස්සෙක් එක් අසංඛ්‍ය කල්පයෙක්වේ. අසංඛ්‍ය කල්පය වනාහි සංවර්තය, සංවර්තස්ථායිය, විවර්තය, විවර්තස්ථායියයි චතුර්විධවේ.

"අසංඛ්‍ය කල්පස්සංවර්තස්‍ය-වාන්තඃ කල්ප විංශතිඃ
තතඃ ස්ථායි විවර්තාඛ්‍ය-තතඃ ස්ථායි සමාමතාඃ

**සංවර්තකල්පය** — කල්පවිනාශ මහාමෙඝය පටන්ගෙණ ධ්වාලොපවෙජ්ජ දය දක්වා ලොවනස්මින් සිටි කාලයයි.

**සංවර්තස්ථායිකල්පය** — ජාලොපච්ඡෙදයෙහි පටන්ගෙණ කෙළලක්ෂයක් සක්වළ එක පැහැර පිරීසිටි සම්පත්ති මහාමෙඝය දක්වා ලොව නැසී සිටි කාලයයි.

**විවර්තකල්පය** - සම්පත්ති මහාමේඝය පටන් ගෙණ නැවත චන්ද්‍ර සූර්‍ය්‍යයන් පහළවීම දක්වා ලොව වැඩෙමින් සිටි කාලයයි.

**විවර්තස්ථායිකල්පය**—චන්ද්‍ර සූර්‍ය්‍යයන්ගේ පහළවීමෙහි පටන් ගෙණ නැවත කල්ප විනාශ මහාමේඝය දක්වා ලොව පවත්නා කාලයයි.

["සංවර්තඃ කල්පනාශස්‍ය-ස්ථායී ලොකච්ඡේද සන්තතඃ
සම්පත් මේඝසමාරම්භ-චන්ද්‍රභූත්‍යන්තතඃ ස්ථායී විවෘද්ධඃ"]

පූර්වෝක්ත සංවර්තය, සංවර්තස්ථායිය, විවර්තය, විවර්තස්ථායියයි සිව් වැදෑරුම්වූ කල්පයෝ වෝගු මෙතෙක් වර්ෂ සියයක මෙතෙක් වර්ෂ දහසක, මෙතෙක් වර්ෂ ලක්‍ෂයකැයි සඞ්ඛ්‍යා නොකොට හැක්කෙන් අසඞ්ඛ්‍ය කල්පනම් වූහ.

3. **මහාකල්පය**—සතර අසඞ්ඛ්‍ය කල්පයෙක් එක් මහාකල්පයෙක් වෙයි, මහාකල්පයාගේ ආයුෂය දිගින් සතර ගව් පුලුලින් සතර ගව්, උසින් සතර ගව් පමණවූ අටුවක මුදුන්ව චූලිකාබැඳ අබ පුරා එකල එගින් පුරුෂයෙක් වර්ෂ සීයක් වර්ෂ සීයක් ගියකල එකඑක අබඇටක් නගාහැරීමෙන් සිස්වූ ඒ මහාසර්සප රාශිය ගෙවීයන්නේය. කල්පයක අවුරුදු නොගෙවන්නේයයි කීයාද තවද එපමණ දිග පුළුල උසඇති එකඝනවූ මහා පර්වතයක් වර්ෂ සීයක් වර්ෂසීයක් ගියකල කසීසළුවිකින් එකඑක වරක් බැගින් පිරිමැදීමෙන් සිදුරු නැති ඒසා මහත් පර්වතය වහා ගෙවීයන්නේය, කල්පෙක අවුරුදු එතෙක් කල් ගියත් නොගෙවෙන්නේයයි කීයාද උපමාකොට දක්වා තිබේ.

["සෙය්‍යථාපි භික්ඛු ආයසං නගරං යොජනං ආයාමෙන යොජනං විත්ථාරෙන යොජනං උබ්බෙධෙන පුණ්ණං සාසපානං චූළිකාබද්ධං, තතො පුරිසො වස්ස සතස්ස වස්ස සතස්ස අච්චයෙන එකමෙකං සාසපං උද්ධරෙය්‍ය ඛිප්පතරං ඛො සො භික්ඛු මහා සාසප රාසි ඉමිනා උපක්කමෙන පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය නත්වෙව කප්පො."]

["සෙය්‍යථාපි භික්ඛු මහාසෙලො පබ්බතො යොජනං ආයාමෙන යොජනං විත්ථාරෙන යොජනං උබ්බෙධෙන අච්ඡින්නො අසුසිරො එකග්ඝනො තමෙනං පුරිසො වස්ස සතස්ස වස්ස සතස්ස අච්චයෙන කාසිකෙන වත්ථෙන සකිං සකිං පරිමජ්ජෙය්‍ය ඛිප්පතරං ඛො සො භික්ඛු මහාසෙලො පබ්බතො ඉමිනා උපක්කමෙන පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය නත්වෙව කප්පො."]

“අසඞ්ඛ්‍යා කල්පාශ්චබ්ධාරා-මහාකල්පස්ස සූචිතඃ
යොජනායාම විස්තාර-ශෛලත සර්ෂප රාශිනා.”

“කප්පීයන්ති සා සප දබ්බන්තොපමාහීති කප්පා”-සර්ෂපොපමයෙන් හා පර්වතොපමායෙන් කල්පිතවන බැවින් කල්පනම්වේ.

**මුනිඳුන්ගේ උපනකී . .. කප්කොළ සියදහසකිනුත් නොලද්දකී**- බුඩාදි මහෝත්තමයන් උපදනා පිළිවෙලින් කල්පයතෙම ශූන්‍ය කල්පය, අශූන්‍ය කල්පයයි ද්විප්‍රකාරවේ.

**ශූන්‍යකල්පය**—බුඩ, ප්‍රත්‍යෙක බුඩ, ශ්‍රාවක චක්‍රවර්ත්‍යාදීන්ගේ ඉපදීමක් නැති කල්පය ශූන්‍යකල්ප නම්වේ.

**අශූන්‍යකල්පය**—බුඩාදි උතුමන් උපදනා කල්පය අශූන්‍ය කල්ප නම්වේ.

**එය** 1. සාරකල්ප, 2. මණ්ඩකල්ප, 3. වරකල්ප, 4. සාරමණ්ඩකල්ප, 5. භද්‍රකල්පයයි පඤ්චවිධවේ.

1. එක බුදුකෙනෙකුන් උපදනා කල්පය සාරකල්ප නම්.
2. බුදුවරයින් දෙනමක් උපදනා කල්පය මණ්ඩකල්ප නම්.
3. බුදුවරයින් තෙනමක් උපදනා කල්පය වරකල්ප නම්.
4. බුදුවරයින් සිව්නමක් උපදනා කල්පය සාරමණ්ඩකල්ප නම්.
5. බුදුවරයින් පස්නමක් උපදනා කල්පය භද්‍රකල්ප නම්.

[“එකො බුද්ධො සාරකප්පෙ-මණ්ඩකප්පෙ ජිනා දුවෙ
වරකප්පෙ තයො බුද්ධා-සාරමණ්ඩෙ චතුජ්ජිනා
පඤ්ච බුද්ධා භද්දකප්පෙ-තතො නත්ථාධිකා ජිනා”]

**පස්වූ එබුදුන් ගෙන් යුත් මෙකලකී**—මේ කල්පය වනාහි බුදුවරයින් පස්දෙනෙකුන් වහන්සේ උපදනා භද්‍රකල්පයෙක්වේ. එසේ පස්දෙනෙකුන් වහන්සේ උපදනා කාලයෙහි සත්ත්වයෝ බුඩ, ප්‍රත්‍යෙක බුඩ, ආර්‍ය්‍ය ශ්‍රාවකාදිවූ උතුම් කල්‍යාණමිත්‍ර සේවනයෙන් සැප බහුල වන්නාහුය. බොහෝසේ ත්‍රිහෙතුක සත්ත්වයෝ කෙලෙසුන් නසා රහත් වන්නාහුය. ද්විහෙතුක සත්ත්වයෝ සප්තවිධ කාම ස්වර්ගයෙහි උපදනාහුය. අහෙතුක සත්ත්වයෝ කල්‍යාණ මිත්‍ර යෝගය නිසා හේතු සම්පත් ලබන්නාහුය. එසේ හෙයින් මේ කල්පය බොහෝ සත්ත්වයන්ට සැප බහුල භාවයෙන් භද්‍රකල්ප නම්විය. මේ භද්‍රකල්පයට වඩා බුඩාදීන්ගෙන් සැරහුණු අන්‍ය කල්පයක් නැත. එසේවූ කල්පයෙක් නැවත ලැබීම තුඹ, දිඹුල්, රුක්වල මල් හටගැනීමක්සේ ඉතා දුර්ලභ වන්නේයී.

33. අ ත් වැඩ පරවැඩ සමව සිත න් නේ
මෙ ත් . සිත සව්සත කෙරෙහි කර න් නේ
එ ත් බැරිනම් තොප සසර ගෙව න් නේ
සෙ ත් පුර සැප කෙලෙසකද ලබ න් නේ

අත්වැඩ පරවැඩ, ආත්මාර්ථ පරාර්ථයනදෙක; සමව සිතන්නේ; සමසේ සිතන්නේය; මෙත් සිත, මෛත්‍රී චිත්තය; සව්සත කෙරෙහි, සකල සත්ත්වයා කෙරෙහි; කරන්නේ, ඇතිකරන්නේය; එත් බැරි නම්, එයද නුපුළුවන් නම්; තොප, තුඹලා; සසර ගෙවන්නේ, සංසාරගෙහිම (කාලය) ගතකරන්නේය; සෙත්පුර සැප, ශාන්තිපුර සැපය හෙවත් නිර්වාණය; ලබන්නේ, ලැබගන්නේ; කෙලෙසද, කොයි ආකාරයකින්ද?

**අත්වැඩ පරවැඩ සමව සිතන්නේ—**

ස්වාර්ථ පරාර්ථ සම්පත් සාධක කරුණානිධානවූ අප මහ බෝසතාණන්වහන්සේ මෙයින් සාරාසැකි කප්සුවහසකින් මතුයෙහි දඹදිව අමරවතීනම් නුවර බමුණු මහසල්කුලයෙක සුමෙධනම් පණ්ඩිතව වෙදත්‍රයෙහි පාරප්‍රාප්තව වසනසඳ මව්පිය දායාදවශයෙන්ලත් සත්මුතුපරම්පරාවක ධනය අළුයම දැමූ කෙලපිඩක්මෙන් ආලයනොකොට සසර දොස් දැක කාල කිරි ගිහිගෙන්නික්ම සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා හිමාලය වනයෙහි වසනසේක් දිවකුරු බුදුන් හමුවෙහි සුවෙන්ලත්. නිවන්සිරි තමන් පමණක් නොවිඳ ලෙවන්වෙත මෙතින් යුතුවෙමින් **අත්වැඩ පරවැඩ සමසේ සිතා** සසර සිඳුතුලටවැද නතරනොව දසපෙරුම්දම් පුරා විදුරසුන්හි අරා පස්මරුන් බුන්කරා ලොව්තුරා බුදුව පන්සාළිස් වසක් වැඩහිඳ දම්දෙසා නිවන්පුරවැද සැනහුණු සේක. කරුණු මෙසේහෙයින් අත්වැඩ පරවැඩ සමවසිතීම මහාවීරවූ බෝධිසත්ත්වයන්ගේ චරිතයක්බව ස්ඵුටවේ.

34. ම ස් ලේ නැති ඇටබඳු ලෙව කා න් නේ
කු ස් පිරුමක් පලයක් නොලබ න් නේ
ලෙ ස් ඒ සැපකෙහි ලොබ නොසිත න් නේ
දෙ ස් නොපෙණෙනුයිස දුක්මඩ ව න් නේ

මස් ලේ නැති ඇට, මාංස හා රුධිරය නොමැත්තාවූ ඇටය; බඳු, සුනඛතෙම; ලෙවකන්නේ, ආශ්වාදනයකරන්නේය; කුස් පිරුමක්, (එයින්) කුක්ෂිය පූර්ණවනබවක් හෝ; පලයක්, (අන්‍ය) ඵලයක් හෝ; නොලබන්නේ, නොලැබෙන්නේය; ඒලෙස්, එයා

කාරවූ; සැපතෙහි, (පඤ්චකාම) සම්පත්තියෙහි; ලොබ නොසිතත්තේ, ලොභ චේතනාවක් ඇතිකරනොගන්නේය; (ඇතිකර ගත්තේවීනම්) දෙස් නොපෙණෙනුම්ස, දෙශයක් (දූනට) නොපෙණෙන්නේවීනමුත්; දුක්මසිවන්නේ, සිදුවන්නේ දුකක්මය.

ඒ සැපතෙහි ලොබ නොබඳින්නේ—

"භික්ඛු, නන්දි රාගස්සේතං අධිවචනං උක්ඛිප්ප මංසපෙසිං" යනුවෙන් මහණෙනි! මං සපෙසිය යනු රූපශබ්දාදීවූ ඒ ඒ අරමුණෙහි ලගනාවන්නාවූ චිත්තයට නමෙකියි දක්වාතිබේ. භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ විසින් කුමක් පිණිස නන්දි රාගයට මස්වැදූල්ලයයි වදාරණලදද? මස්වැදූල්ල රජ වෙළඳ ගොවි ආදීවූ බොහෝ සත්‍වයන් විසින්ද කාක සෝන සිගාලාදීවූ තිරශ්චීනයන් විසින්ද ප්‍රාර්ථනා කරණලද්දීය. එපරිද්දෙන්ම අවිද්‍යානමැති මත්‍යයෙන් මත්වූ සත්‍වයෝ රූපාදී අරමුණෙහි සිත ලොභකොට එයින් තෘෂ්ණාව වර්ධනයවීමෙන් භවයම ප්‍රාර්ථනා කරන්නාහු-මස්වැදූල්ල තිබූ තිබූතැන ඇලෙන්නේ යම්සේද? එපරිද්දෙන්ම නන්දි රාගයෙන් බඩවූ සත්‍වයෝ භවයෙහි ලගනාවන්නාහු එහෙයින් රූපාදී අරමුණෙහි ලොභ උපදවන්නාවූ චිත්තය මස්වැදූල්ලකට බඳු උපමා ඇත්තේයි.

(වම්මික සූත්‍රය)

35\. ම ස් කැපියක් ගත් උස්සෙක් අහ සේ
ම ස් නොදුමුව උස්සන් ගෙන් වැන සේ
ප ස් කම්රස ලොබ කලහොත් එම සේ
ප ස් විසි මහ බයකින් දුක් සැල සේ

මස් කැපියක් ගත්, මස් කැපියක් ග්‍රහණය කලාවූ; උස්සෙක්, උකුස්සෙක්; අහසේ, ආකාශයෙහි; (ගමන්කරන්නේ) මස් නොදූමුව, ඒ මාංසය නොදූම්මේවීනම්; උස්සන්ගෙන්, උකුස්සන් නිසා; වැනසේ, විනාශයට පැමිණෙන්නේය; එමසේ, එපරිද්දෙන්ම; පස්කම්රස, පඤ්චකාම රසයෙහි; ලොබ කලහොත්, ලොභ කලේ වීනම්; පස්විසි මහ බයකින්, පස්විසි ආකාරවූ මහත් භීතිය කරණකොටගෙණ; දුක් සැලසේ, දුක්ඛය සැලසෙන්නේය.

පස් කම්රස—1. රූප හෙවත් ඇසින් දක්නාදේ 2. ශබ්ද හෙවත් කණින් අසන ශබ්දය 3. ගන්ධ හෙවත් නාසිකාවෙන් ආඝ්‍රාණය කරන සුගන්ධය 4. රස හෙවත් දිවෙන් විඳිනා මධුරාදී රස 5. ස්පර්ශ හෙවත් හැපීමෙන් ශරීරයට දැනෙන ශීත උෂ්ණාදි

ස්වභාව යන මේ පුහුදුන් විසින් ප්‍රියකරනුලබන පස්කොට සයි. පුහුදුන් විසින් කැමතිවනු ලබන ආශ්වයත් කාමයයිද එබඳු කම් පසක් එක්කොට සලකනලදහු පස්කාමයයිද ඒ කාම්පස රසයක්කොට සලකා විඳින ආශ්වයත් පස්කාමරස යයිද වදාළේ.

**පස්විසි මහබය—**

'ජාති ජරා ව්‍යාධි චුතීච සොකො
තෙකාලිකා පඤ්ච දසච හොන්ති
චොරාරි රාජුදකපාවකොච
දණ්ඩ භයා දුග්ගති ඝොර රොගො
අත්තානුවාදෙච පරානුවාදෙ
වදෙ බුද්ධා විසති පඤ්චිමෙ භයා"

(අතීත, අනාගත, වර්තමාන, යන) කාලත්‍රයෙහිවූ ජාති භය, ජරා භය, ව්‍යාධි භය, මරණ භය, සොක භය යන පසළොස් සොර භය, සතුරු භය, රාජ භය, දිය භය, ගිනි භය, (එකී නොකී කපා කොටා ගැනීම් නම්වූ) දණ්ඩභය, (සතර අපායෙහි ලැබියහැකි) දුර්ගතිභය (වහා මරණ ඇතිකරණ) දරුණු රෝග භය (තමාට තමාම දොෂාරොපනය කරගැනීම් යයිකියන) ආත්මානු වාදභය (අනුන්ගෙන් උපවාද ලැබීම නම්වූ) පරානු වාදභය යන මේ දසයත් සමග පස්විසි මහ භයයයි වදාළේ.

**36. සෙත සලසන මුනි බණ ඇසන සුබිහි රි**
**අසන නොපගේ කන් ඇසුමට නොබිහි රි**
**නසන කරණව පිනසුන මෙතොපට බැ රි**
**සතර අපා දුක් වද විඳිනව බැ රි**

සෙත සලසන, ශාන්තිය සලස්වන්නාවූ; සුබිහිරි, අභිමධුරවූ; මුනි බණ ඇත, බුද්ධ ධර්මය ඇත්තේය; ඇසුමට, (ඒ ධර්ම) ශ්‍රවණය පිණිස; තොපගේ, තුඹලාගේ; නොබිහිරි, බිහිරිනුවූ; කන් ඇත, කණ් ඇත්තේය; මෙතොපට, මේ තොපහට; කරණව බැරි, කළ නොහැකිවූ; පිණසුන් නැත, පුණ්‍යයක්ද නැත්තේය; විඳිනවබැරි, විඳිමට බැරිවන්නේ; සතර අපා දුක්වද, සිව්අපායෙහි දුක්ඛයමවද!

**මුනි බණ ඇසන සුබිහිරි**—"සබ්බං රසං ධම්මරසො ජිනාති"—සියළු රසයන් අතරෙන් ධර්මරසය ජයගනී.

**37. කරන කලම පව් මිහිර මි සේ**
**විඳින කලම දුක් දැඩිව ගිණි සේ**
**ඇඳින එපව් දරලන උපදේ සේ**
**නුදුන මැනවි නුඹේ දුර අවකා සේ**

පව්, පාපකර්මයන්; කරණකලට, කරන්නාවූ කාලයේ; මීසේ, මධු හෙවත් මීපැණි මෙන්; මිරිය, මධුරවන්නේය; විඳිනකලට, (පව් කොට) විපාකවශයෙන් විඳින්නාවූ කාලයෙහි; දුක්, දුක්ඛය; ගිනිසේ, අග්නිය මෙන්; දැඩිවිය, දැඩි (තර) වන්නේය; එපව්, ඒ පාපයන්; දුරලන, දූරිභූතකරන්නාවූ; උපදෙස්, උපදේශය හෙවත් ක්‍රමය; ඇඳින, සංඥානනය කොට; තුන්දෙර, වාරත්‍රය; අවකාසේ නුදුනමැනවි, (පව් කිරීමෙහි) අවකාශ නුදුනහොත් යහපති.

**කරණකලට පව් මිරිය මීසේ, විඳිනකලට දුක් දැඩිවිය ගිනිසේ-**

“මධුවා මඤ්ඤති බාලෝ-යාව පාපං න පච්චති,
යදාච පච්චතී පාපං-අථ බාලෝ දුක්ඛං නිගච්ඡති.”

පාපං, (සත්ත්වයා විසින් කරණලද) අකුසල කර්මය; යාව, යම්තාක්කල්; න පච්චති (දෘෂ්ට ධර්ම වේදනීයවශයෙන් මෙලොවම හෝ උපපද්‍ය වේදනීයවශයෙන් හෝ අපරාපර්‍යාය වේදනීයවශයෙන් පරලොව හෝ විපාකනොදේද (තාව, ඒතාක්කල්;) බාලෝ, අඥාන තෙම; මධුවාව මඤ්ඤති, (පාපකර්මය) මී අනුභව කිරීමක් මෙන් මිහිරිකොට සිතන්නේය. යදාච, යම්කලෙක්හි වනාහි; පාපං (බාලයා විසින් කරණලද) අකුශලකර්මය; පච්චති, (මෙලොව අත් පා කන් නාසා කැපීම් ආදි විසින් නොයෙක් කම්කටුලු කරණු ලබන්නාහටවත් පරලොව නරකාදි අපායි ඉපිද මහ දුක් විඳින්නාහටවත්) විපාකදේද; අථ, එකල්හි; බාලෝ, (දුශ්චරිත සමඟිවූවිසු) අඥානතෙම; දුක්ඛං, (බලවත් කායික චෛතසික) දුක්ඛයට; නිගච්ඡති, පැමිණෙන්නේයි.

(ධම්මපදය)

**තුන්දෙර**—කායද්වාර, වාක්ද්වාර, මනොද්වාර (කාය, වචනය, මනස) පව් ඉපදීමට හේතුවූ දොරටුතුනවෙති.

**නුදුනමැනවි තුන්දෙර අවකාසේ—**

“කායෙන සංවරො සාධු සාධු වාචාය සංවරො
මනසා සංවරො සාධු සාධු සබ්බත්‍ථ සංවරො”

කායෙන සංවරො, කාය සංවරය; සාධු, යහපත; වාචාය සංවරො, වාග්සංවරය; සාධු, යහපත; මනසා සංවරො, මනොද්වාර සංවරය; සාධු, යහපත; සබ්බත්‍ථ සංවරො, චක්ෂුරාදි සදෙරම සංවරය; සාධු, යහපත.

(අඞ්ගුත්තරනිකාය)

මෙසේ චාරිත්‍රය යම්කෙනෙක් ආවරණය නොකළාහුද, ඔවුහු නිරන්තරයෙන් කයින් සිදුවන්නාවූ ප්‍රාණඝාත, අදත්තාදාන කාමමිථ්‍යාචාර යන පාප කර්මයන්ද, වචනයෙන් සිදුවන්නාවූ මුසාවාද පිසුනාවාච ඵරුෂාවාච සම්ඵප්‍රලාප යන පාපකර්මයන්ද, සිතින් සිදුවන්නාවූ අභිද්‍යා, ව්‍යාපාද මිථ්‍යාදෘෂ්ටි යන පාපකර්ම යන්දකොටැ අනෙත් කෙලෙදහස් චර්‍යන්ගි සතර අපාය ගිනි යෙන් මිදීමක් නැතිව මහත් දුක් අනුභවයට හේතුවන බැවින් "නුදුන මැනවි තුන්දෙර අවකාශෙ"යි වියු—

89. අ ද මි න් ජීවත් වෙනවා විතර ට
දූ හැ මි න් මියයනු සොඳමයි දනහ ට
මෙලෙසි න් වදහළ මුනිබණ සිහිකො ට
සැ බ වි න් පින්කොට පැමිණෙව් නිවණ ට

අදමින්, අධර්මයෙන්; ජීවත්වෙනවා විතරට, ජීවත්වන ප්‍රමාණයටවඩා; දූහැමින්, ධර්මයෙන්; මියයනු, මැරියාම; දනහට, ජනයාහට; සොඳමැයි, යෝග්‍යමය හෙවත් යහපත්මැයි; මෙලෙසින්, මෙයාකාරයෙන්; වදහළ, වදාළාවූ; මුනි බණ, බුද්ධ ධර්මය; සිහිකොට, සමරණයකොට; සැබවින්, ස්වභාවයෙන් හෙවත් සත්‍යලෙස; පින්කොට, පුණ්‍යකර්මකොට; නිවණට පැමිණෙව්, නිර්වාණ ප්‍රාප්තවව්.

**අදමින් ජීවත්වෙනවා විතරට—දූහැමින් මියයනු සොඳමයි දනහට—**

"ජීවිතම අධම්මෙන-ධම්මෙන මරණංවරං
මරණං ධම්මිකං සෙය්‍යො-යඤ්චෙ ජීවෙ අධම්මිකං"

අධර්මයෙන් දිවිරක්නේ මැනැද? ධර්මයෙන් මරණ මැනැද යත්, අධර්මයෙන් දිවිරක්නේ නොවැනව ධර්මයෙන් මරණ මැනවි.

(ධර්මප්‍රදීපිකාව)

**අදමින් ජීවත්වෙනවා විතරට**—අධර්ම ජීවිකාව නම් සම්‍යක් ආජීවයෙන් බැහැරවූ මිථ්‍යා ආජීවයයි, හෙවත් අධර්මයෙන් උපදවාගත් වස්තුවෙන් දිවිපැවැත්මයි. සර්වඥයන්වහන්සේ විසින් "පඤ්චිමා භික්ඛවෙ වණිජ්ජා උපාසකෙන අකරණීයා" යනුවෙන් පංචමිථ්‍යා වණිජ්ජාවක් උපාසකයාට තහනම්කොට තිබේ.

ඒකවරේදයත්? 1 මිනිස් වෙළඳාම, 2 *ආයුධ වෙළඳාම, 3 මස් පිණිස සතුන් වෙළඳාම, 4 මත්පැන් වෙළඳාම, 5 විෂවෙළඳාම යන මේ පසයි. එබැවින් ගිහියන් විසින් පූර්වෝක්ත වෙළඳාම් පස ආදී අධර්මයෙන්තොරව ධාර්මිකවූ ගොවිතැන් වෙළඳාම්

* සත්ව ඝාතනය පිණිස යොදනුලබන ආයුධ මෙහි ගැණේ.

ආදියෙන් දිවි පැවැත්වීම කටයුතුයි. එසේම ප්‍රව්‍රජිතයෙක් වී නම් අෂ්ටකුලදූෂණ එක්වීසි අනේෂණාදියට නොපැමිණ ධාර්මිකව සිව්පසය ලැබීමෙන් දිවි පැවැත්වීම කටයුතුයි.

39. එ ක ම සතෙකු නම මව් මළ දුක වා
වෙ න ම ඇඬු කඳුළු බිඳු වල වා
මෙහැ ම මුහුදු දිය අඬුවන කල වා
තා ව ම සසර ආලය ඇයි නොප වා

එකම සතෙකු, එකම සත්වයෙක්; නම් මව්, ස්වකීය මෑණියන්, මළ දුකවා, මළාවූ කනගාටුවට; වෙනම, (එකී එකී වාරයෙහි) වෙන් වශයෙන්; ඇඬූ, ඇඬුවාවූ; කඳුළු, අශ්‍රුධාරාවන්හී; බිඳුවලවා, බිඳුවලටද; මෙහැම මුහුදුදිය, මේ සියළු සමුද්‍ර ජලය; අඬුවන කලවා, අඬුවනකල්හි; නොපටා, නුඹලාට; තවම, මේතාක්කල්ම; සසර ආලය, සංසාරය කෙරෙහි ඇල්ම; ඇයි, කුමටද?

**එකම සතෙකු නම මව් මළ දුකවා .....මෙහැම මුහුදුදිය අඬුවන කලවා**—අක්මුල් නැති සංසාරයෙහි එකසතෙකු එක මවකගේ මරණින් කම්පිතව අඬනකල්හී වැගුරුණු කඳුළු සතර මහාසාගරයෙහි ජලයටවඩා අධික බැව් "දීඝරත්තං වො භික්ඛවෙ මාතු මරණං පච්චනු භූතං තෙසං වො මාතු මරණං පච්චනුභොන්තානං අමනාප සම්පයොගා මනාප විප්පයොගා කන්දන්තානං රොදන්තානං අස්සු පස්සන්නං පග්ඝරිතං නත්වෙව චතුසු මහාසමුද්දෙසු උදකං" යනුවෙන් දක්වා තිබේ.

(අනමතග්ග සංයුත්ත පාළි)

**කඳුලු**.—ස්ත්‍රී කත්දල යන්නෙන් භින්නයි. කන් යනු ද්‍රවිඩ භාෂාවෙහිවූ අක්ෂි වාචක "කණ්" ශබ්දයෙන් තද්භවයි.

40. ලී ප ගිනි මොලවන තෙක් දිය සැ ලි යේ
සැ ප යක් මෙන් කකුළුව දියකෙ ලි යේ
එ ප වත් නොප සිතාගොත් නොහැකි ලි යේ
සැ ප යක් නම් නැත කම්රස කෙ ලි යේ

ලිප, උදුනෙහි; ගිනි මොලවනතෙක්, ගිනි දල්වනකල් දක්වා; දිය සැලියේ, දිය භාජනයෙහි; කකුළුව, කකුළුවා; සැපයක් මෙන්, සැපයකැයි සිතා; දියකෙළියේ, ජල ක්‍රීඩාකෙරෙයි; එපවත්, ඒකාරණය; (භවත් මෙම කකුළුවාගේ කථාව) නොහැකිලියේ, හැකිලීමක් නැතිව; නොප, නුඹලා; සිතනොත්, චින්තනය කරත්නම්; කම්රස කෙළියේ, (පඤ්ච) කාමරස ක්‍රීඩාවෙහි; සැපයක් නම් නැත, සෞඛ්‍යයක් නම් නැත්තේයි.

41. උඩුසුළ ගට අල්වාගෙණ ස න්නේ
තණ සුළ නොදැමිනම් අත ද න්නේ
වරපල යයි කම්රස තෙපල න්නේ
එදකල කම් නිරයේ පැසව න්නේ

උඩුසුළඟට, සුළඟ ඉදිරියට; අල්වාගෙණ යන්නේ, ගෙණ යනු ලබන්නාවූ; තණසුළ, තෘණෝල්කාව; නොදැමිනම්; අත නැරියේවී නම්; අත දන්නේ, හස්තය දවන්නේය; කම්රස, (පඤ්ච) කාමරසය; වරපල යයි; උත්තමවය, එළඹසිටියයි; තෙපලන්නේ, කියනු ලබන නැනැත්තේ; එදකල කම්, ඒ කරණයෙන්ද කාමියාගේ හේතුවෙන්; නිරයේ, නරකයෙහි; පැසවන්නේ, දුක් විඳවනු ලබන්නේය.

**උඩුසුළගට අල්වාගෙණ සන්නේ—තණසුළ නොදැමිනම් අත දන්නේ** —"ආදිත්තා තිණුක්කා ගණ්හන්තං ඩහන්ති නො මුඤ්චන්තං උක්කූපමාහි කාමා ඩහන්ති යෙ න මුඤ්චන්ති"

ආදිප්තාවූ තෘණෝල්කාගත්තාහු දවයි, පීවාහු නොදවා. එසේයින්ම කාමයෝ ගතුවන් දවිති, පීවන් නොදවත්.

(ධර්මප්‍රදීපිකාව)

"තිණුක්කූපමා කාමා" – කාමතෙම දහන කෘත්‍ය සම්පාදන වන බැවින් තෘණෝල්කාවක් (තණ සුළක්) වැන්න.

42. පිරුළෙන් ඇරගත් අබරණ මඟුල ට
දම්මින් ගැතිවන අයමෙන් අනු න ට
පෙරපින් ඇතිතෙක් විඳිනා සැපත ට
තෙපි දූ න් උඩගුව නොවදිව් නිරය ට

මඟුලට, මඞ්ගල පිණිස; පිරුළෙන් අරගත්, ආපසු දෙන්ට ඉල්වාගත්තාවූ; අබරණ, ආභරණයන්; දම්මින්, ඉවතලා; අනුනට ගැතිවන; අන්‍යයන්ට දාසවන්නාවූ; අයමෙන්, නැනැත්තන් මෙන්; පෙරපින්, පූර්ව පුණ්‍යයන්; ඇතිතෙක්, විද්‍යමානවනතුරු; විඳිනා, ලබන්නාවූ; සැපතට, සම්පත්තියට; තෙපි, යුෂ්මත්හු; දූන්, වර්තමාන කාලයෙහි; උඩගුව, අහංකාරවී; නිරයට, නරකයට; නොවදිව්, ප්‍රවිෂ්ට නොවෙව්.

43. වද සව බැදගණ ගෙණයන සොරු මා
වද මල් දම් ලූ බෙර පිරිවර මා
ලද ඉසුරෙහි ලොබ බූවාත් මිණ මා
එද සැපතෙහි කල කම් මරු රව මා

වදයට, වධය පිණිස (මරණු ලබන පිණිස); බැඳගණ, බඳින යකොාව්; නෙණයන, ගෙනයන්නාවූ; සොරුටා, චෞරයාහට; පිරිව රටා, පිරිවර වශයෙන්; වදමල්දම්, බැඳි ජීවක පුෂ්පදාමයන් (සා) බෙරි, වදබෙරද; ලූ, ලූවාක්මෙන්; පිණිටා, කුසල් පිණිස; ලද, ලද් දවූ; ඉසුමරගි, ඓශ්චර්‍ය්‍යයෙහි; ලොබවූමවාත්, ලොභවූයේ වී නම්; සැපතෙහි, සම්පත්තියෙහි; කලකම්, කරණලද කර්‍ම්‍ය ඇති; එද, ඒ පුද්ගලයාද; මරු, මාරතෙම; රවටා, රවටන්නේයි. (වසඬාකරත්නේය)

**පුරාණ රජ දරුවන් විසින් වරද කළවුන්ට පමුණුවනලද දෙතිස් වධ—**

1 කසවලින් තැළීමද,
2 වේවැලින් තැළීම හා සතර රියන් පොලු දෙකට කපා ගත්තාලද පොලු කැබලි වලින් තැළීමද,
3 අත්කැපීමේ වධයද,
4 පය කැපීමේ වධයද,
5 අත් පා කැපීමේ වධයද,
6 කණ කැපීමේ වධයද,
7 නාසය කැපීමේ වධයද,
8 කන් නාසා කැපීමේ වධයද,
9 හිස් කබල ගලවා මොලපිට ගිනියම් කරණලද ලොහ ගුළි තැබීමෙන් කැඳ සැළියක්මෙන් කරන්නාවූ බිලිඞගථාලික නම් වධයද,
10 හිසෙහි සම්ගලවා බොරලු අතුල්ලා සේදීමෙන් හක්ගෙඩි යක්මෙන් සුදුවන් කරන්නාවූ සඞ්ඛමුණ්ඩික නම්වධයද,
*11 හුලින් කට අරවා මුවතුළ පහන් දල්වන්නාවූ රාහුමුඛ නම් වධයද,
12 සියලු ශරීරයෙහි තෙල් පහන්කඩ ඔතා ගිනිදල්වන්නාවූ ජොතිමාලිකනම් වධයද,
13 අතෙහි තෙල් පහන්කඩ දවටා පන්දමක්මෙන් ගිනිදල් වන්නාවූ හස්ථ පජ්ජොතිකනම් වධයද,
14 යටිග්‍රීවයෙහි පටන් සම්ගලවා ගොප් ඇටයෙහි හෙළා යොත්වලින් බැඳ එහෙ මෙහෙ ඇදින්නාවූ එරකවත්තික නම් වධයද,

---

* කන්සිලුයෙහි පටන් තියනින්ඇන මුවතුල ලෙහෙ පුරවන් නාවූ වධයද රාහු මුඛකර්ම්‍යයි අටුවාහි දක්නාලැබේ:

15 සටග්‍රීවයෙහි පටන් සමගලවා කටියෙහි හෙළා කටියෙහි පටන් සමගලවා ගොප් ඇටයෙහි හෙළා දුරසිටබලන්නවුන්ට රතුපැසුනු ඇඳුවුන්මෙන් දක්වීම කරවන්නාවූ චීරකවාසිකනම් වධයද,

16 බිම හොවා දෙවැලමිටෙහි හා දෙදණ මඬුල්ලෙහි යකඩ වළලුදමා යකුලින් කොටා මුළුපොළොයේ බිම සවිකොට ගාත් පස ගිනිදල්වන්නාවූ එණෙයයක නම වධයද,

17 දෙමුවඇති බිලියෙන් ශරීරයෙහි ඒ ඒ තැන ඇන සම්මස් නහර උපුටන්නාවූ බලිසමංසික නම් වධයද,

18 සියල් සිරුර සිසුම් මුවහත් ඇති පිහිවලින් හෝ කඩුවලින් කෙලවරක පටන් කහවණු පමණ පෙතිකරන්නාවූ කහාපණකනම් වධයද,

19 ශරීරයෙහි ඒ ඒ තැන ආයුධවලින් ඇන කොස්සෙන්කාරන්දිය ඉස සම්මස් නහර දියකිරීමෙන් ඇට සැකිල්ල පමණක් ඉතිරිකරන්නාවූ ඛාරාපතච්ඡිකනම් වධයද,

20 එක් අංසයකින් බිම හොවා කණෙහි යගුලක්ගසා සවිකොට දෙපාමෙහෙන පලිඝයක් (සෙක්කුවක්) මෙන් කරකවන්නාවූ පලිඝ පරිවත්තිකනම් වධයද,

21 සියලු ශරීරයෙහි සිවිසම් සිඳුරු නොවනසේ පොලුවලින් තලා ඇට කුඩුකොට පිදුරු බිස්සක්මෙන් කරන්නාවූ පලාල පීඨකනම් වධයද,

22 කකියන තෙල් ඉසීම කරවන්නාවූ වධයද,

23 කීපදිනක් ආහාරයෙන් තොරවූ චණ්ඩ බල්ලන් ලවා කවවන්නාවූ වධයද,

24 දිවස්හුල ඉලුවන්නාවූ වධයද,

25 කඩුමෙන් හිස් සිඳුවන්නාවූ වධයද,

26 වධබෙර ගස්වා විථිසක්පාසා ඇවිද්දවීමේ වධයද,

27 යටිපල් ඉරා ලුණු ඇඹුල් ගල්වා බොරලු පිට සක්මන්කරවන්නාවූ වධයද,

28 අඬුවෙන් දිව පිටතට ඇද ලුණු වතුර වත්කිරීමේ වධයද,

29 කකියන තෙල් කටාරමෙහි බැස්වීමෙන් කරවන්නාවූ වධයද,

30 ඇස් උගුලුවා දැමීමේ වධයද,

31 මස්ලොඹුවෙහි තබා කඩකඩකොට කැපීමේ වධයද,

32 වෑයෙන් සිවුරැස්කොට සැසීමේ වධයද,

මොවුහු දෙතිස් වධයහයිද, කම්කාටුලූහයිද කියත්.

41. දුමුවෙන් ගිරි මුදුනෙන් එන සොරු මා
පවනින් කම් නැතිමෙන් ඇඟ ගිම මා
ජරයෙන් මිදෙමින් යන මරු මුව මා
සැපතින් කිම දුන් කම්කල තොප මා

දුමුවෙන්, පහතට හෙළන ලදින්; ගිරි මුදුනෙන් එන, පර්වත මස්තකයෙන් වැටෙන්නාවූ; සොරුවා, චෞරයාහට; ඇඟ, (ස්වකීය) ශරීරයෙහි; ගිම්වා, ග්‍රීෂ්ම (සන්සිඳවා ගනු)පිණිස; පවතින් කම්නැති මෙන්, වාතයෙන් ප්‍රයෝජන නොවන්නාක්මෙන්; ජරයෙන්, ජරාභාවයෙන්; මීදෙමින්, මුසනව; මරු මුවටා, මරුවාගේ මුඛයට; යන, ගමනය කරන්නාවූ; කම්කළ, පාපකර්මකලාවූ; නොපවා, (නුඹලාට) දුෂ්චරිතුන්ට; ඉන්, ඒ නිසා; සැපතින්, සම්පත්තියෙන්; කිම, කවර ඵලයක්ද?

45. අ ල වන මේ කම්රස දෙස විම සා
ප ල සව් හපසට පුළුවන් වය සා
ප ල රසවිඳ ගස උඩ උන් මිනි සා
මු ල සිදිනාතෙක් ඉදිදෝ නොබැ සා

අලවන, සිත් අලවන්නාවූ (විත්තාකර්ෂණය කරවන්නාවූ); මේ කම්රස, මේ පචකාම රසයෙහි; දෙස, දෙෂය; විමසා, විමංසනය කොට; පුළුවන් වයසා, (කායබලයෙන් යුක්ත) යොග්‍ය අවස්ථාවෙහි; තපසට, තපස් පිණිස; පලයව්, නික්මෙව්; පලරස විඳ, ඵලරසය අනුභවකරමින්; ගසඋඩ, වෘක්ෂ මස්තකයෙහි (තුරුමුදුනෙහි); උන්, උන්නාවූ; මිනිසා, මනුෂ්‍යතෙම; මුළුසිඳිනාතෙක්, මුළුකපන තුරුත්; නොබැසා, නොබැස; ඉදිඳෝ, ඉදීද?

කම්රස දෙස—

"මහරද මෙලෝවැ සි
අනුවණ දනෝ නොවල සි
පස්කම් ගුණෙහිරි සි
වඩාකුසලින් වැලක එකලෙ සි

පව් රුස්කර නැත ක්
සිතෙන් පමණ සැපත ක්
නොලද්දකි රුදුරු දු ක්
අවාපත්වෙති දනුව එදද ක්"

(කව්මිණි මල්දම)

46. බ ණ න ම් නිබොරුය මුනිවරන් නේ
ක ය න ම් නොතිරය අඳහාග න් නේ
ප ණ න ම් තණ අග පිනිබිඳු වැ න් නේ
පි ණ න ම් නොපමාවම කරග න් නේ

මුනිවරයින්නේ, සම්බුදුවරයන්ගේ; බණ නම්, ධර්මයනම්; නිදොරුය, දොරු නොවන්නේය; කය නම්, ශරීරය වනාහි; නොනිරය, සථිර නොවන බැවි; අදහාගන්නේ, විශ්වාස කරන්නේය; පණ නම්, ප්‍රාණයනම්; තණ අග, තෘණාග්‍රයෙහිවූ; පිනිබිඳු වැන්නේ, (පිනිබිඳක් හා සමාන වන්නේය;) තුසාරබින්දුවක් වැන්නේය; පින නම්, පුණ්‍යය නම්; නොපමාවම, අප්‍රමාදවම; කරගන්නේ, කරගතයුත්තේය.

**පණනම් තණ අග පිනිබිඳු වැන්නේ—**

"උස්සාවොව තිණග්ගම්හි—සුරියස්සුග්ගමනං පති
එවමායු මනුස්සානං—මාමං අම්ම නිවාරයාති"

සුරියස්ස, හිරුහුගේ; උග්ගමනං පති, නැගීමෙන් හෙවත් උදාවීමෙන්; තිණග්ගම්හි, තණපත අග; උස්සාවො ඉව, පිණිබිඳු මෙන්; මනුස්සානං, මිනිසුන්ගේ; ආයු, ආයුෂය; එවං, මෙසේමය; අම්ම, මෑණියෙනි; මං, මා; මානිවාරය, (පැවිදිවන්නාහු;) නොවලක්වව.

"පණනම් තණ අඟපිණිබිඳු වැන්නේ" යන්න, මේ ධම්ම ගත්ට අනුව යොදනලද බව පෙනේ.

"ලොව සියලු සැප තා ය
මෙර බිම මුහුද මහ තා ය
ජීවිතය සහි තා ය
මෙහැම තණඅග පිණිසෙ අති තා ය"

(කව්දීපනිය)

47. අ ස න් මෙමා කීදේ වැඩ ඇතිව නා
ප ස න් සිතින් උන්නත් පව් කරමි නා
උ ප න් ශොකින් මතු යක්බූ පිසසු නා
ස සි න් ඇවිද පිණකුත් බැරි එපවි නා

මෙමා කී, මේ මා විසින් කියනු ලබන්නාවූ; වැඩ ඇතිවන දේ, අභිවෘද්ධිය සලස්වන්නාවූ දෙය; අසන්, ශ්‍රවණයකරනුමැනැවි; පසන් සිතින්, ප්‍රසන්න චිත්තයෙන්; පව් කරමින, පාපක්‍රියාවල් කරමින්; උන්නත්, උන්නේවිනමුත්; මතු, අනාගතයෙහි; යක්බූ පිසසුන, යක්ෂ, භූත, පිශාච (යනමෙයින් එක්) අයෙකු; උපන්නොතින්, උත්පත්තිය හොල්වීනම්; එපවින, ඒ පාපයෙන්; සසින් ඇවිද, සංසාරයෙහි ඇවිදිමින්; පිණකුත් බැරි, කුසලයකුත් නුපුළුවන.

48. ලෝ බේ සිතින් පව් කල හැම සත වා
ස බේ කියති ගෙණ ගොස් යම රජු වා
ඉ බේ ඉන්ට නොයෙදී සිතු රග වා
ලැ බේ නිරදුක් පැමිණ එවි වා

ලෝබේසිතින්, ලෝභචිත්තයෙන්; පව්කළ, පාපකර්මයන්කළාවූ; හැමසතුට, සකලසත්වයින්; ගෙණගොස්, ගැරගෙණගොස්; සබේ, සභාවෙහිදී; යමරජුවා, යමරජයාහට; කියති, කථනයකරති; එවිවා, එකල්හි; සිතුරගට, සිත්වූ පරිද්දෙන්; ඉබේ ඉන්ට නොයෙදී, නිකම් ඉන්ට නොලැබ; නිරාපැමිණි, නරකයෙහි ප්‍රාප්තව එහවත් නිරයේවැටී; දුක් ලැබේ, දුක් ලබන්නේයි.

**යමරජු**—කලක් දිව්‍යසම්පත් අනුභව කරන්නාවූද පූර්වකල අකුසලයෙන් අපාය සමීපයෙහි හිඳ සත්වයා කළවරද නිවරද විනිශ්චය කරන්නාවූද ධර්මිෂ්ඨවූ විමානප්‍රේතයෙක්වෙයි. මෙහෙතම දුලබ මිනිසත් බවද බුද්ධ දර්ශණයද සද්ධර්ම ශ්‍රවණයද ස්වර්ගාපවර්ග සම්පත්තියද ප්‍රාර්ථනාකෙරේ.

**ලොබේ සිතින් පව්කල හැම සතවා—සබේ කියති ගෙණ ගොස් යම රජුවා**—"තමෙනං භික්ඛවෙ නිරයපාලා නානා බාහාසු ගහෙත්වා යමස්ස රඤ්ඤො දස්සෙන්ති"

භික්ඛවෙ, මහණෙනි; තමෙනං, (කුසලා කුසල ධර්මයන් මිශ්‍රකොට; උස්සද නරක සමීපයෙහි උපන්) ඔහු; නිරයපාලා, නරකපාලයෝ; නානාබාහාසු ගහෙත්වා, අනෙකප්‍රකාර (තාලස්කන්ධ සදෘශ) බාහුවෙන් දැඩිකොට අල්වාගෙණ; යමස්ස රඤ්ඤො, යමරජහට; දස්සෙන්ති, දක්වන්නාහුය.

(දේවදූත සූත්‍රය)

49. නො සි න් නොයෙක් සැපවිඳ සමහරු නි ති
ඇ සි න් ම දක පව් පින් කලවුන් ග ති
බ සි න් කිවත් අදහා පින් නොකර ති
ගො සි න් නිරේ වැටුනොත් දුක් ගිම් නැ ති

සමහරු, ඇතැම් කෙනෙක්; නිති, අනවරතයෙන්; නොසින්, සන්තෝෂයෙන්; නොයෙක් සැප විඳ, අනේකප්‍රකාර සම්පත් විඳනායකොට; පව් පින් කලවුන්, කුසලා කුසල කර්මකළ වුන්ගේ; ගති, ස්වභාවයන්; ඇසින්ම දක, (ස්වකීය) චක්ෂුසයන්ම දර්ශනයකොටත්; බසින් කිවත්, වචනයෙන් කීකල්හිත්; අදහා, ඇදහිලිකොට; පින් නොකරති, කුසල් නොකෙරෙත්ය; නිරේ ගොසින්, නරකයට ගොස්; වැටුනොත්, පතිතවූයේ වීනම්; දුක්, දුක්ඛය; ගිම් නැති, සීමාවක් නැත්තේය.

50. පි න් පව් නොදූනම අනුවණ කම්කො ට
කා න් නන් මස්රස සොඳමයි කරතු ව
ඉ න් ගැලපවතු බැරි නොගොසින් නිරය ට
දූ න් එම ආලය අරිනේ අදසි ට

පින්පව්, පුණ්‍යපාපයන්; නොදූනම, ජානනය නොකොටම; අනුවණකම්කොට, අඥාන කම්කොට; මස්රස, මාංසරසය; සොඳ මයි, යහපත්මයයි; කරතුව, සන්තොෂව; කන්නන්, අනුභවකරන් නාවූත්ම; නිරයට නොගොසින්, නරකයට නොගොස්; ඉන්ගැල පවතු, එයින් මිදීමක්; බැරි, නුපුළුවන්වෙයි; දූන්, වර්තමාන කාල යෙහි; අදසිට, අදසිටත්මත්; එම ආලය, ඒ (මස් රසයෙහිවූ) ලොභය; අරිනේ, හරණීය.

51. *කා ලා රසමුසු බෝජන කරපෙ මි
ගා ලා සුවඳැති සඳුනුත් මනර මි
ලා ලා අබරණ රිසිලෙස සැරසු මි
පා ලා ගියවැනි බහුරූ කෝල මි

පෙම්කර, ප්‍රේමකොට; රසමුසු බෝජන, රසයෙන් මිශ්‍රවූ ආහාර; කාලා, අනුභවකොට; මනරම්, සිත අලවන්නාවූ; සුවදැති සඳුනුත්, සුගන්ධයෙන්යුත් චන්දන කල්කයන්; ගාලා, (ගල්වාගෙන) ආලෙපකොට; අබරණ, ආභරණයන්; ලාලා, පැළඳගෙන; රිසි ලෙස, (තමතමන්ට) රුචිවූ පරිද්දෙන්; සැරසුම්, සැරසීම; බහුරූ කෝලම්, බොහෝ රූප ඇති කෝලම්; පාලා, දක්වා; ගියවැනි ගියාක්මැත්ත.

52. මෙ බ ස් තම නුවණින්ම විමසා නොතිරවූ*කය
ගති අසන් නේ
දෙ නි ස් කුණුවෙන් යුතුව මඳකුත් සාරතුබව
සැණින් දන් නේ
මි නි ස් බවලක් නැතේ කුසලක් නොකර උන්නොතක්
අපල වන් නේ
ස නි ස් එක්සිය නිවර් වැඩුනොත් එදසි අනුවණ
කම් දූනෙන් නේ

මෙබස්, පූර්වොක්ත වචනයන්; තමනුවණින්ම, තමාගේ ඥාන යෙන්ම; විමසා, පරීක්ෂාකොට; නොතිරවූ කය, අස්ථිරවූ ශරීරයයි; ගති, ස්වභාව; අසන්නේ, ශ්‍රවණය කරන්නේය; දෙතිස් කුණුවෙන්, තිස්දෙකක් කුණපයෙන්; යුතුව, යුක්තව; මඳකුත්, ස්වල්පයකුදු;

සාරනුබව, භරයක් නැතිබව; තැණින්, ඥාණයෙන්; දත්තේ, අවබොධ කරන්නේය; මිනිස් බව, මනුෂ්‍යාත්ම භාවය; ලත් තැනේ, ලබාගත්තාවූ කාලයෙහි; කුසලක් නොකර, පුණ්‍යකර්මයක් නොකර; උන්නොත්, සිටියේවී නම්; අපලවන්නේ, (ලද්දාවූ මනුෂ්‍යාත්මය) නිෂ්ඵල වන්නේය; සතිස් එක්සිය තිරේ, එක්සිය සතිස් නරකයෙහි; වැටුනොත්, පතිතවූයේවී නම්; අනුවණ කම්, අඥාන කම්; දූනෙන්නේ, අවබොධ වන්නේ; එදැයි, ඒ දවසටයි.

දෙතිස් කුණුවෙන්—දෙතිස් කුණපයෝ නම් ශරීරයෙහි ඇත්තාවූ කුණප කොටස් 32 යි. එනම්:-

1 කෙසා, හිසකේද; 2 ලොමා, රෝමයෝද; 3 නඛා, නියපොතුද; 4 දන්තා, දත්ද; 5 තචො, සමද; 6 මංසං මස් පිඩුද; 7 නහාරු, නහරද; 8 අට්ඨි, ඇටද; 9 අට්ඨිමිඤ්ජා, ඇටමිදුලුද; 10 වක්කං, වකුගඩුවද; 11 හදයං, හෘදය මාංසයක්ද; 12 යකනං, අක්මාවද; 13 කිලොමකං, දලබුවද; 14 පිහකං, බඩදිවද; 15 පපඵාසං, පපුකැනැත්තද; 16 අන්තං, බඩවැලද; 17 අන්තගුණං, අතුණුබහනද; 18 උදරියං, උදර පටලයද; 19 කරීසං, අසූචිද; 20 පිත්තං, පිතද; 21 සෙම්හං, සෙමද; 22 පුබ්බො, සැරවද; 23 ලොහිතං, ලේද; 24 සෙදො, ඩහදියද; 25 මෙදො, මෙදතෙල්ද; 26 අස්සු, කඳුලුද; 27 වසා, චුරුණුතෙල්ද; 28 ඛෙළො, කෙළද; 29 සිඞ්ඝාණිකා, සොටුද, 30 ලසිකා, සඳමිදුළුද; 31 මුත්තං, මුත්‍රද; 32 මත්ථකෙ මත්ථලුඞ්ගං, හිස්මුල්ද යන මේවා වෙත්.

"1 අඩ තුන් කෙළක් කෙ ස්
නවනුදහස් රොම රැ ස්
විසි නිය දත් දෙති ස්
සමත් සියොලඟ සිටි වසා ම ස්

2 නවසිය මස් වැද ලී
නවසියයක් නහර වැ ලී
තුන්සිය ඇට සැකි ද ලී
පුරා සිටිනා ඇට මිදුලුව ලී

3 වකුගඩුද හදව ත්
අක්මා දලබුමස් ව ත්
බඩ දිව පපු කැනැ ත්
දෙතිස් රියනක් අතුණු වැටිය ත්

4 අතුණුබඳ බඟන ද
නොපැසුණු අහර කසල ද
ඉස් මුල් පිත් සෙම් ද
සැරවමල් සෝදිය මෙතෙල්බ ද

5 කඳුඑද වුරුණු නෙ ල්
කොළ සොටු පිරෙරණ ඇමක ල්
අසූසිය සඳව ල්
පිරුණු සඳ මිදුලු මූ පිළිකු ල්

6 දුගඳ දෙතිසක් කු නු
මෙපෙවෙත් අනය විහිදු නු
විදුලි ඇතු පය හු නු
කුකුළු බිජුමෙන් අනිස මිරිකු නු

(කාව්‍යශෙඛරය)

63. පෙ ර ත් ජාතිය පතාගත් දූත් හේතුබලයෙන්
මෙතැ න් නේ
ල ග ත් වෙන් නොව සමග දවසැර උන් නමුත්
සෙනෙහසින් නේ
ප ණ ත් යනකල තනිව ගෙයි උන් අසත් වෙන්වෙව්
බැඳින් නේ
පි ණු ත් කලනිති කැටුවසෙයි ගිය තැනේදී සැප
විඳින් නේ

පෙරත් ජාතිය, පූර්වජාතියෙහි; පතාගත්, ප්‍රාර්ථනාකරගත්තාවූ; හේතුබලයෙන්, වාසනාබලය නිසා; දූත්, වර්තමාන කාලයෙහි; මෙතැන්නේ, මේ ස්ථානයෙහි; ලගත්, සමීපයෙහිත්; වෙන්නොව, වෙනස් නොවීත්; සෙනෙහසින්නේ, ස්නේහාධ්‍යාශයෙන්; සමග, එක්ව; දවසැර උන්නමුත්, කල් ගතකරමින් සිටියේවී නමුත්; (දිවසාතික්‍රමය කරමින් උන්නේවී නමුත්;) පණත් යනකල, ප්‍රාණය හානිවන කල්හි; තනිව, හුදකලාවී; ගෙයිඋන් අසත්, ගෘහවාසී ජනයාත්; බැඳින්නේ, (ඥාති) බන්ධනයෙන්; වෙන්වේ, වෙනස් වන්නේය; කල පිණුත්, කළාවූ පුණ්‍යකර්මය (පමණ) ක්; නිති, නිරන්තරයෙන්; කැටුවසෙයි, (තමා) කැටුව ගමන්කරන්නේය; (එපමණක්ද නොව) ගියතැන්දී, ගියාවූස්ථානයේදීද; සැප විඳින්නේ, (ඒකරණකොටගෙණ) සුඛ අනුභව කරන්නේය.

**පිණුත් කලනිති කැටුවසෙයි ගිය තැනේදී සැප විඳින්නේ—**

"ධඤ්ඤං ධනං රජතං ජාතරූපං පරිග්ගහං වාපි යදත්ථි කිඤ්චි
දාසා කම්ම කරා පෙස්සා යෙ චස්ස අනුජීවිනො."

ධඤ්ඤං, සාලිව්‍රීහ්‍යාදී ධාන්‍යස; ධනං, මුක්තාමාණික්‍යාදි ධනය; රජතං, රිදීය; ජාතරූපං, රන්රන්ය; පරිග්ගහංචාපි, පරිග්‍රාහි කවුද; යං කිංචි, යම්කිසි වස්තුවක්; අත්ථි, ඇත්තේද; දාසා, දාසයෝය; කම්මකරා, කම්කරුවෝය; පෙස්සා, පණිවිඩකාරයෝය යන; අනුජීවිනො, අනුව ජීවත්වන්නාවූ; සෙව, යමෙක්තුමූ; අස්ස, වනාහුද;

"සබ්බං නාදාය ගන්තබ්බං සබ්බං නික්ඛිප්ප ගාමිනං
යඤ්ච කරොති කායෙන වාචාය උදචෙතසා"

සබ්බං, මෙකී සියල්ල; නආදාය, නොගෙණ; ගන්තබ්බං, යායුතුය; තංසබ්බං, ඒ සියල්ල; නික්ඛිප්ප, බහාතබා; ගාමිං, ගමන්කරන්නේය; කායෙන, කයින්ද; වාචා, වචසින්ද; උද, නොහොත්; චෙතසා, සිතින්ද; යං, යම්කිසි කුසලාකුසල කර්මයක්; කරොති, කෙරේද;

"තං හිතස්ස සකං හොති තඤ්ච ආදාය ගච්ඡති
තං චස්ස අනුගං හොති ඡායාව අනපායිනී."

තංහි, ඒ කර්මය වනාහි; තස්ස, ඔහුගේ; සකංහොති, ස්වකීය වස්තුවක්වේ; තංච, ඒ කර්මය; ආදාය, ගෙණ; ගච්ඡති, මිය පරලොවයයි; තංච, ඒ කර්මයම; අනපායිනී, නොඉක්මයන්නාවූ; ඡායා ඉව, සෙවනැල්ලමෙන්; අස්ස, ඔහුහා; අනුගංහොති, අනුවයන්නේවේ.

"තස්මා කරෙය්‍ය කල්‍යාණං නිචයං සම්පරායිකං,
පුඤ්ඤානි පරලොකස්මිං පතිට්ඨා හොන්ති පාණිනං ති"

තස්මා, එහෙයින්; කල්‍යාණං, කුසලකර්මය; කරෙය්‍ය, කරන්නේය; සම්පරායිකං, සම්පරායිකවූද කුසල ධර්මය; නිචයං, රැස්කරන්නේය; පුඤ්ඤානි, පින්: පරලොකස්මිං, පරලෙව්හි; පාණිනං, සත්වයන්ට; පතිට්ඨාහොන්ති, පිහිට වෙත්.

(අපුත්තක සූත්‍රය)

51. සා ර නූ කුණු කසක් අරගෙණ කරණ බහුනාටකනදේ
නෑ ර නමගිම් සමග දවසැර උන් නමුත් සැප විඳ වි දේ
ගෝ ර මරුවා පැමිණි කල් දූත යන්ට කැඳවා එමස දේ
බා ර වම සිබුවන්ට බැඳිවද පිණක්කරගන්නොත්සොදේ

සාරනු, අසාරවූ; කුණුකයක් අරගෙණ, (කුණප 32 කින්යුත්) කුණු ශරීරයක් හැරගෙණ; කරණ, කරන්නාවූ; බහුනාටක, බොහෝවූ නැටුම්; තදේ, මහත්වන්නේය; නමගිම් නැර, සවකීය.

ස්වාමියා අත්නොහැර; සැප වීඳ විඳේ, සම්පත් අනුභව කරකර; සංග දවිසැර උන් නමුත්, එක්ව කල් ගතකොට හිටියේවී නමුත්; කැඳවායන්ට, අඩගසාගන යැම පිණිස; ඝෝරවූරූවා, ඝොරවූ මාරයා; පැමිණිකල, පැමිණියාවූ කාලය; දන, ජානනයකොට; එමසඳේ, එම් කාලයෙහි; බාරවම, භාරයක්වම්; සිටුවාගන්ට බැරි වද, නවත්වාගන්ට නුපුළුවන්වද; (එනිසා) පින්ක්කරගත්තොත්, කුසලයක් කරගත්තේ වීනම්; සොඳේ, යහපති.

55. සරණ මුනිඳුගෙ අදහ පිණකුත් නොකර ඉන්නේ
කුමට දේ
මරණ පැමිණෙන කලට යමයා ඇවිත්
කැඳවා යන්ට දේ
කරණ සොඳකම් දම් පිණක්කළ කියනු නුවණින්
සොඳ වෙ දේ
කුමණ අනුවණ කම්ද? නැසිනි අඩනු සිටුවා ගන්ට දේ

මුනිඳුගෙ සරණ, මුනීන්ද්‍රයානන් වහන්සේගේ පිහිට; අදහා, විශ්වාසකොට; පිණකුත් නොකර, පුණ්‍ය කර්මයකුත් නොකොට; ඉන්නේ කුමටදේ, කුමක් පිණිස ඉන්නේද? මරණ පැමිණෙන කලට, මරණය පැමිණෙන අවස්ථාවෙහි; යමයා, යමතෙමේ; ඇවිත්, ආගමනයකොට; කැඳවා යන්ටදේ, කැඳවාගෙන යන පිණිසවද; කරණ, (යමෙකුගේ මරණ අවස්ථාවෙහි) කරන්නාවූ; සොඳකම්, යහපත් ක්‍රියාවනම්; කළ දන් පිණක්, කරණලද දානාදි පුණ්‍ය කර්මාදියක්; සොඳවේදා, යහපත්ව; නුවණින් කියනු, නුවණින් කියාදීමය; නැසිනි, නැතියෙනි; අඩනු, අඩන්නේ; කුමන අනුවන කම්ද? කවර අඥාන කම්ද? සිටුවාගන්ටදේ, (මැරෙන්ටනොදී) නවත්වානන්ට වත්ද?

මරණ —

"යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ චුති චවනතා භෙදො අන්තරධානං මච්චු මරණං කාලකිරියා ඛන්ධානං භෙදො, කළෙබරස්ස නික්ඛෙපො, ඉදං වුච්චතාවුසො මරණං" ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්ව සමූහයෙන් යම් චුතවීමක් වේද, ජීවිතය ගැලවීයන බවද, බිඳීමද, අතුරුදහන් වීමද, සම්මුති මරණින් මියයාමද, කාලක්‍රියාවද, ශරීරයාගේ දැමීමෙක් ඇද්ද, ඇවැත්නි මේ මරණයයි කියනු ලැබේ.

(සච්චවිභඞ්ග සූත්‍රය)

56. අ ඹා ලා කම්පාව උන්නත් ඉතින් දුක්මක් නොවත් නේ
හ නා ලා සිත පිණක් නොකරම කුමට උපසා තබන් නේ
ද මා ලා ගත නරක කුණු කය කුමටදෝ සැප විඳින් නේ
දි නා ලා සුරපුරට යන්නට මකි මේ බණ අස න් නේ

අඹාලා, රොදනයකොට; කම්පාව උන්නත්, කම්පිතව සිටියේ විනමුත්; ඉතින් (මැණිකාව) ඉක්බිතිව; දුක්මක් නොවත්නේ, (මල අය) දුකිමක් නොමවත්නේය; සිත හනාලා, සිතහදගන; පිණක් නොකරම, කුසල ධර්මයක් රැස්කර නොගෙණ; උපසා තබන්නේ කුමට, එසතුව සපයා තබන්නේ කුමටද? දමාලා ගත, හැරදමා යන්නාවූ; නරක කුණු කය, නින්දිත කුණප ශරීරය; සැප විඳින්නේ, සම්පත් අනුභව කරන්නේ; කුමටදෝ, කවර ප්‍රයෝජනයක් පිණිසද? දිනාලා, ජයග්‍රහණයකොට; සුරපුරට, දිව්‍ය ලෝකයට; යන්නට, ගමණය කිරීම පිණිස; මකී, මාවසින් කියනලද; මේ බණ අසන්නේ, මේ (අවවාද) ධර්මශ්‍රවණය කරන්නේය.

57. සිටි න ඇවිණ ගෙණ මෙසසර බි ළි යේ
වි ඳි න මෙසැප ජරයෙන් හැළි තැ ළි යේ
බ ල න නැටුම් වැනි විදුලිය එ ළි යේ
මෙ දූ න නොකර කුසලට කම්මැ ළි යේ

මෙසසර බිළියේ, මේ සංසාර නමැති බලිසයෙහි; (බිලිකටුවෙහි ඇවිනගෙණ සිටින, ඇවිලී සිටගන; ජරයෙන්, ජරාවෙන්; තැළි තැළියේ, තැළි තැළී; විඳින, විඳින්නාවූ; මෙසැප, මේ සම්පත් තියෙ; විදුලිය එලියේ බලන, විදුලි ආලෝකයෙන් බලන්නාවූ; නැටුම්වැනි, නෘත්‍යයක් වැන්න; මේදූන, මෙය ජනනයකොට; කුසලට, පින්කිරීමට; කම්මැලියේනොකර, කුසිතබවක් නොකරව්.

**මෙසසර බිළියේ**—ඇමටලොල්වීමෙන් මත්ස්‍යයා යම්සේ කෙවුලන්ගේ බිළියෙහි ඇවිණ විනාශයට පත්වේද? එමෙන්ම සත්වයාද පස්කම් සැප අනුභවයෙහි ආශාවීමෙන් සසර නමැති බිළියෙහි ඇමිණ විනාශයට පත්වේ.

“යථාපි මච්ඡෝ බලිසං වඞ්කං මංසෙන ඡාදිතං
කාමගිද්ධො නජානාති මච්ඡො මරණ මත්තනො”

යථාපි, යම්සේ; මච්ඡෝ, මත්ස්‍යතෙම; වඞ්කං, වක්වූ; මංසෙන ඡාදිතං, ඇමින් වැසූ; බලිසං, බිලීකටුව; කාමගිද්ධො; කාමයෙහි ලොල්වූයේ; නජානාති, නොදනීද? මච්ඡො, ඒ මත්ස්‍යතෙම; අත්තනො, තමාගේ; මරණං, මරණය; (නජානාති, නොදනී.)

(උම්මග්ගජාතකය.)

**ජරසෙන්**—"යාතෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්ත නිකායෙ ජරා ජීරණතා ඛණ්ඩිච්චං පාලිච්චං වලිත්තචතා ආයුනොහානි ඉන්ද්‍රියානං පරිපාකො, අයං වුච්චතාවුසො ජරා,"

ඒ ඒ සත්වසමූහයෙහි ඒ ඒ සත්වසමූහයන්ගේ යම් ජරාවක් වන්නීද, දිරණබවද, දත්ඇට කැඩුනු බවද, කෙස්ලොම් පැසුනු බවද, රැළිනැගුණු සම් ඇති බවද, ආයුෂයාගේ ගෙවීමද, ඉන්ද්‍රියයන්ගේ මුහුකුරා යාමද, ඇවැත්නි, මෝතොමෝ ජරායයි කියනු ලැබේ.

(සච්චවිභඞ්ග සූත්‍රය)

**විඳින මෙසැප ජරසෙන් නැළි නැළියේ—බලන නැවුම් වැනි විදුලිය එළියේ**—විදුලිය ආලෝකය ඇතිවූ ක්ෂණයෙහිම නැතිවන ඉතා අස්ථිරදෙයක් බැවින් එහි ආධාරයෙන් නැටුමක් බැලීම ඉතා අසීරු නිෂ්ඵල වැඩකි. එමෙන්ම ජරාවෙන් මිරිකි මිරිකී එවින්එට විඳිනු ලබන්නාවූ අල්පවූ පස්කම් සැපයද නිෂ්ඵලය.

**58. දන් පින් බැරිදේකැයි නොසිත න් නේ**
**අන් කල පින් අනුමෝදන් ව න් නේ**
**උන් කල පින්සරි පින් ලැබග න් නේ**
**ඉන් වද සගමොක් සැප සාද න් නේ**

දන්පින්, දාන ධර්මයන්; (දානය හා පුණ්‍යය) බැරිදෙයකැයි, භාරවූවෙකැයි; (නොහැකි වැඩකැයි) නොසිතන්නේ, චින්තනය නොකරන්නේය; අන්කලපින්, අන්‍යයන් විසින් කරණලද පුණ්‍යය; අනුමෝදන් වන්නේ, අනුමෝදන් වන්නේය; (එසේ කිරීමෙන්) උන්කල, ඒ අන්‍යයන් විසින් කරණලද්දාවූ; පින්සරි, පිණට සමානවූ; පින් ලැබගන්නේ, පින් ලබාගන්නේය; සගමොක් සැප, ස්වර්ගමෝක්ෂ සම්පත්තිය; ඉන්, ඒ හේතුවෙන්; සාදන්නේවද, සිද්ධ කරන්නේවද.

**දන්**—106 කව බලනු—

**පින්අනුමෝදන් වන්නේ**—128 කව බලනු—

**59. සස ම වේද රස මුසු බත් කා න් නේ**
**ගඳ ම වේද ඇඟ සුවඳ කර න් නේ**
**ලෙඩ ම බෝති මේ මෙලොව සතු න් නේ**
**කුම ම මීට සැප යෙකැයි සිත න් නේ**

රසමුසු, රසමිශ්‍රවූ; බත් කන්නේ, බත් අනුභව කරන්නේ; සයටවේද, ක්ෂුධාව සංසිඳුවන පිණිසවද (බඩගින්නවවද); ඇඟ, ශරීරයෙහි; සුවඳ කරන්නේ, සුගන්ධාලේපකරන්නේ; ගඳටවේද, දුර්ගන්ධය නැතිකිරීම පිණිසවද; මේ, මේවා; මෙලොව සතුන්නේ, මෙලෝක සත්වයන්ගේ; ලෙඩට, රෝගයන්ට; බෙහෙත්, ඖෂධයි; මීට, මේඳ්වලට; කුමට, කුමක්නිසා; සැපයකැයි සිතන්නේ, සැපයක්යයි කල්පනාකරන්නේද?

60. මා නෙ න් ඉඳිනත් මේ සැප පෙ රැ ම ය
ඝි නෙ න් ගෑ සුවඳක්සේ බො රැ ම ය
දා නෙ න් සිලෙන් නොකලොත් දු රැ ම ය
පා නෙ න් අඳුරට ගෙනයයි කා රැ ම ය

මේ සැප, මේ සම්පත; පෙරැමය, උතුම්යයි; මානෙන් ඉඳිනත්, මානයෙන් හිඳින්නේවීනමුත්; ඝීනෙන් ගෑ, ඝවප්නයෙන් ගල්වන ලද; සුවඳක්සේ, සුගන්ධයක්මෙන්; බොරැමය, නිෂ්ඵලමය; දානෙන් සිලෙන්, දන්දීමෙන් හා සීල්රක්ෂාකිරීමාදියෙන්; දරැමය නොකලොත්, කුසල ධර්මයන් රැස්නොකලේවීනම්; කරැමය, පාපකර්මය තෙම; පානෙන්, ප්‍රදීපයෙන්; අඳුරම, (අපායනමැති) අන්ධකාරයට; ගෙණයයි (පාපකර්මකල සත්වයා) ගෙනයනු ලබන්නේය.

**මානෙන්**—මානය හෙවත් තමා උසස්කොට හැඟීම, දස සංයෝජනයන්ගෙන් එකකි. එය රහත්වීමේදී නැසෙන කෙලෙසයකි.

මානයෙහි ප්‍රභේද නවයෙක් වේ. එනම්:-

1. සෙය්‍යස්ස සෙය්‍යො හමස්මි—මම ශ්‍රේෂ්ඨයාට ශ්‍රේෂ්ඨවෙමි.
2. සෙය්‍යස්ස සදිසො හමස්මි—මම ශ්‍රේෂ්ඨයාට සමානවෙමි.
3. සෙය්‍යස්ස හීනො හමස්මි—මම ශ්‍රේෂ්ඨයාට හීනවෙමි.
4. සදිසස්ස සෙය්‍යො හමස්මි—මම සමානයාට ශ්‍රේෂ්ඨවෙමි.
5. සදිසස්ස සදිසො හමස්මි—මම සමානයාට සමානවෙමි.
6. සදිසස්ස හීනො හමස්මි—මම සමානයාට හීනවෙමි.
7. හීනස්ස සෙය්‍යො හමස්මි—මම හීනයාට ශ්‍රේෂ්ඨවෙමි.
8. හීනස්ස සදිසො හමස්මි—මම හීනයාට සමානවෙමි.
9. හීනස්ස හීනො හමස්මි—මම හීනයාට හීනවෙමි.

මීට නවවිධ අස්මි මානයයිද කියනු ලැබේ.

**පානෙන් අඳුරට ගෙණයයි කරුමය**—සත්වයෝ අඳුරෙන් අඳුරට යන්නාහ, අඳුරෙන් පානට යන්නාහ, පානෙන් අඳුරට යන්නාහ, පානෙන් පානට යන්නාහයි සතර කොටසක් වෙත්.

**අඳුරෙන් අඳුරට යන්නාහු නම් කවරහයත්?**—පෙරකල බලවත් පාපකර්මයෙන් චණ්ඩාලාදිවූ හීනවූ නීචවූ බැගෑවූ දිළිඳුවූ කුලයෙහි ඉපද, විරූපවූ දුර්වර්ණවූ දුර්දශීකවූ මහාරෝගීව, කණව, පිළුව, බිහිරිව, පරම දුක්ඛිතව, අන්නපාන වස්ත්‍රාභරණාදීන් නොලැබ මහාදුක්ඛයෙන් ජීවත්වන්නාහු පෙරකල අකුසලින් දුන් මෙසේ උපනුම්හයි නොසිතා නැවතත් කයින් වචසින් මනසින් ප්‍රාණඝාතාදිවූ බොහෝ පව්කොට මෙසේ ත්‍රිවිධ දුශ්චරිතයෙන් ආයුපමණින් දවස්යවා මිය ඒපවින් සතර අපායෙහි ඉපිද නැවත නැවතත් නරලොව චණ්ඩාලාදී හීනවූ නීචවූ දිළිඳු කුලයෙහි රෝගීවූ විරූපාදී භාවයට පැමිණ බොහෝ දුක් විඳින්නාහු අඳුරෙන් අඳුරට යන්නාහු නම්වෙත්.

**අඳුරෙන් පහනට යන්නාහු නම් කවරහයත්?**—යටකියනලද චණ්ඩාලාදී හීනවූ කුලයෙහි ඉපිද දිළිඳුවීම් රෝගීවීම් ආදී මහත් ව්‍යසනයට පැමිණියාට අප (පූර්ව ජාතිවලදී) කළ ඝෝරවූ කර්මයෙන් මෙසේවූම්හයි දැන දැනුදු පින්කොට මතු ස්වර්ගයෙහි උපන මැනවැයි සිතා පණිවා, ඝෝරකම් ආදිවූ පව්දුරුකොට ත්‍රිවිධ දුශ්චරිතය හැර ත්‍රිවිධ සුචරිතය පුරා මිය ස්වර්ගයෙහි උපදනාහු අඳුරෙන් පහනට යන්නාහු වෙත්.

**පහනින් අඳුරට යන්නාහු නම් කවරහයත්?**—රජකුලයෙහි හෝ බමුණු කුලයෙහි හෝ වෛශ්‍ය කුලයෙහි ඇත් අස් ආදිවූ බොහෝ වාහන ඇතිව බොහෝ පිරිවර ඇතිව, බොහෝ ගව මහිෂාදීන් ඇතිව, බොහෝ වස්ත්‍රාභරණ ධන ධාන්‍ය ඇතිව විපුලවූ අන්නපානයෙන් යුක්තව දුටුදුටුවන්ට ප්‍රියදර්ශීනව නිරෝගීව ඉපිද පෙරකල පිණින් දුන් මෙසේ සියල්ලෙන්ම උතුම්ව උපනුම්හයි දැනුදු පින්කොට මතුත් උතුම්ව උපන මැනවැයි දන්නා නුවණ නමැති ඇස මෝහ නමැති පටලයෙන් වැසී ගිය හෙයින් කණව ලෝභ ද්වේෂ මෝහාදීන් වඩා ප්‍රාණඝාත අදත්තාදාන කාම මිථ්‍යාචාර මෘෂාවාද යනාදිවූ අනේක ප්‍රකාර පව් රැස්කොට ඒ පවින් මිය සතර අපායෙහි ඉපිද, අනේකවාදහස් අගනනාවූ අනේක විධවූ කොපින්දහැකිවූ නොඉවසිය හැකිවූ නොබැලිය හැකිවූ මහත් නරක දුක් අනුභවකොට අන්තයෙහි අවශේෂවූ පවින් චණ්ඩාලාදී හීන කුලයෙහි ඉපිද, යටකියනලද දරිද්‍රාදී භාවයට පැමිණ බොහෝ ව්‍යසන විඳිනාහු පහනින් අඳුරට යන්නාහු නම්වෙත්.

**පහනින් පහනට යන්නාහු නම් කවරහයක්?**—යමෙක් පරිද්දෙන් රාජ වංශාදියෙහි සියල්ලෙන් උතුම්ව ඉපිද පෙරකළ සකස් පිණින් දුන් මෙසේ උතුම්ව උපනුම්හයි දැන දැන් පින්කොට මතු අපායෙහි නූපන් මැනවයි සිතා කාය දුශ්චරිත වාක් දුශ්චරිත මනො දුශ්චරිතයෙන් දුරුව කාය සුචරිත වාක් සුචරිත මනො සුචරිතයන් පුරා කාබුන් මරණින් මත්තෙහි ක්ෂත්‍රිය මහා සාර කුලයෙහි හෝ බ්‍රාහ්මණ මහා සාර කුලයෙහි හෝ ඉපිද මනුෂ්‍ය සම්පත් අනුභව කරන්නාහුද, චාතුර්මහාරාජිකය තාවතිංශය යාමය තුසිතය නිර්මාණරතිය පරනිර්මිත වසවර්තිය යන මේ සදිව්‍යලොකයෙන් එක් දිව්‍යලොකයකහි ඉපිද අනන්ත කාලයක් මුළුල්ලෙහි කනක විමානාදියෙහි අනෙකවිධවූ දිව්‍ය සම්පත් අනුභවකොට සුවවිඳිනාහුද පහනින් පහනට යන්නාහු නම් වෙත්.

61. ද ර රැ ස ගිනි ඇවුළුණු කල නිබ දේ
ගි නි මි ස දරයයි යන බස නොයෙ දේ
එ ම ලෙ ස එක්කොට වදහල මුනි දේ
දු ක මි ස කයකැයි යන බස නොයෙ දේ

දරරැස, දරු රැශිය; නිබදේ, නිරන්තරයෙන්; ගිනිඇවුළුනුකල, ගිනිඇවිළුනුකල්හි; ගිනිමිස, අග්නිය විනා; දරයයියන, දරයයිකියන්නාවූ; බස, වචනය; නොයෙදේ, නොයෙදෙන්නේය; එම්ලෙස, එපරිද්දෙන්ම; එක්කොට, එකරාශිකොට; දුකමිස, දුඃඛයවිනා; කය කැයියන බස, ශරීරයකැයි කියන වචනය; නොයෙදේ, යෝජිත නොවේයයි; මුනිදේ, මුනීන්ද්‍රයානන් වහන්සේ; වදහල, වදාළසේක.

**දුකමිස කයකැයි යනබස නොයෙදේ**—"දු"යන්නෙහි අර්ථය නින්දා කටයුතුය යනුයි. "ඛ"යනු හිස් අසාරය යන අර්ථයි, එබැවින් දු+ඛ යනුවෙන් නින්දාකටයුතු අසාරය යන අර්ථය හැඟේ. කාම රූප අරූප සඞ්ඛ්‍යාත ත්‍රිභවයට අයත්වූ පඤ්චුපාදනස්කන්ධයන් ගේ පිළිවෙල නොසිඳ පැවැත්ම ඒකාන්තයෙන්ම දුක්යයි "සංඛිත්තෙන පඤ්චුපාදනක්ඛන්ධා දුක්ඛා" (සැකවින් උපාදන ස්කන්ධ පසම දුක්වන්නාහ) යනුවෙන් ප්‍රකාශිතයි, දුක් නැමැති රොගයෙන් නොපෙළෙන්නාවූ දුක් නමැති බරින් නිදහස්වූ දුක් නමැති සතුරාගෙන් උපද්‍රව නොලබන්නාවූ දුක් නමැති විෂය අනුභව නොකරන්නාවූ දුක් නමැති භයෙන් අභය ලද්දාවූ දුක් නමැති සයුරෙන් එතරවූ එකද පෘථග්ජන සත්වයෙක් අප අතර නොමැතිය. ශරීරය රොගයන් උපද්‍රවයන්ම ආධාර

මන බැවින් නිත්‍යකාවයුතුයි. නිත්‍යනුවූ සුභනුවූ සුඛනුවූ ආත්ම යක් නැත්තාවූ හේතුවෙන් සාරභාවයෙන් තොරවේ. එබැවින් නිතර ස්‍රාවනිත්තාවූ අනිත්‍යවූ සදාකාලිකනුවූ පෙරලෙන සුළුවූ ඇති සැටියට එබඳු විරුද්ධාකාරයකින් පෙන්නුම් කරන් නාවූ මමම ශරීරය දූෂණීය කයක්නොවේ.

62. ඉදිනොත් බෝකල් ජරසෙන් විඝි රේ
නැතහොත් වැදයයි මරුමුව කුහ රේ
මෙමහත් ජරමර දෙදෙනා අත රේ
මේසැපත් සැපයයි ගනිද්දේ කව රේ

බෝකල් ඉඳීනොත්, බොහෝකාලයක් ජීවත්ව ඉන්නේ වීනම්; ජරසෙන් විසිරේ, ජරාව විසිර්ණි වන්නේය; නැතහොත්, එසේ නුවූයේ වීනම්; මරුමුව කුහරේ, මරුවාගේ මුඛාභ්‍යන්තරයට; වැද යයි, ප්‍රවිෂ්ට වන්නේය; මහත්, මහත්වූ; මෙජරමර දෙදෙනා අතරේ, මේ ජරාමරණාභ්‍යන්තරයෙහිවූ; මේසැපත්, මේ සම්පත්තීයත්; සැප යයි, සම්පත්තීයකැයි; කවරේ, කවරනම් (පණ්ඩිත) කෙනෙක්; ගනිද්දේ, ග්‍රහණය කෙරෙත්දේ?

"ඉදිනොත් බෝකල් ජරසෙන් විඝිරේ—නැතහොත් වැදයයි මරුමුව කුහරේ"—

"යථා දණ්ඩෙන ගොපාලො ගාවො පාචෙති ගොචරං
එවං ජරා ච මච්චු ච ආයුං පාචෙන්ති පාණිනං"

යථා, යම්සේ; ගොපාලො, ගොපල්ලතෙම; දණ්ඩෙන, දණ්ඩෙන්; (පැහැර පැහැර) ගාවො, ගෙරින්; ගොචරං, ගොචර භූමියට; (හෙවත් තණ බිමට) පාචෙති, පමුණුවාද ගෙණයේද? එවං, එපරිද්දෙන්ම; ජරා ච, (ප්‍රකට ජරාද අප්‍රකට ජරාද යන විවිධ) ජරාද; මච්චු ච, (සන්තති විච්ඡේදය යන) මරණද; (යන මොහු දෙදෙන) පාණිනං, ප්‍රාණීන්ගේ; ආයුං, ජීවිතෙන්ද්‍රිය; පාචෙන්ති, ක්ෂයට පමුණුවන්නාහුයි.

ධම්මපද)

63. අසල් ගෙයක සොරකම් ගිය දවස ක
කුහුල් සිතින් ඉදිගේ නම ගෙන රැ ක
සිසල් සතුන් මරු ගෙණියනු දැක දැ ක
කුසල් නොකර ඉදිගේ ඇයි නොවසැ ක

අසල් ගෙයක, සමීපගෘහයෙක්හි; සොරකම් ගිය දවසක, සොර කමක් පැමිණි දවසෙක්හි; කුහුල්සිතින්, කුතූහල චිත්තයෙන් (සැක සහිත සිතින්) තමගෙය, ස්වකීය ගෘහය; රැකා, රක්ෂාකොට; ඉදිනේ,

ඉන්නේය; සියල් සතුන්, සකල සත්වයන්; මරු, මාරයා විසින්; ගෙණයනු දක දක, ගෙණයනු ලැබීම් බලබලා; කුසල් නොකර, කුසල ධර්මයන් රැස්නොකර; නොවසැක, නිස්සාංකව; ඉඳිනේ ඇයි, හිඳින්නේ කුමක් හෙයින්ද?

64. ගගසන ඇත්කුණ ඉඳ මස් රස මා
සිඳු මැද වැද වැනසුණ මෙන් කපු මා
ලද ඉසුරෙහි ලොබ කලහොත් නොප මා
බව සයුරෙන් ගමනෙක් නැත ගොඩ මා

ගගාතත, ගංගාවෙහි (පාවී) යන්නාවූ; ඇත් කුණ, හස්ති කුණප යෙහි; මස් රසටා, මාංස රස තෘෂ්ණාවෙන්; ඉඳ, හිඳිනයකොට; සිඳුමැද, සමුද්‍ර මධ්‍යයෙහි; වැද, ප්‍රවිෂ්ඨවැ; කපුටා, කාකයා; වැනසුන මෙන්, විනාශවූවාක් මෙන්; ලද ඉසුරෙහි, ලබනලද ඓශ්වර්‍ය්‍යයෙහි; ලොබ කලහොත්, ලෝභ කළේවිනම්; නොපමා, නුඹලාට; බව සයුරෙන්, සංසාර සාගරයෙන්; ගොඩටා ගමනෙක් නැත, නිර්වාණ තීර යට ප්‍රවිෂ්ඨවීමක් නැත්තේය.

**ගගසන ඇත්කුණ ඉඳ මස් රසටා...... වැනසුණ මෙන් කපුටා—**

1

"ගඟෙහි බාගී ර ත
වැටී ඉල්පි දියප ත
යත ඇත් කුණ නිය ත
නුවණනැති කපුටුවෙක් දක සිත

2

බැඳි ලොබිනි බලව ත්
අද මම ඉතා රිසිව ත්
නිසී යානාවකු ත්
විපුල රසවත්වූ ගොදුරකු ත්

3

එකවිටම ලදුයෙ මි
වෙනතක ඉන් නොයායෙ ම්
කුස දුක් මුදල මි
මහත් සැපතට මීන් ඇමිණීයෙ මි

4

මස් අනුබව කර මි
සිසිල් ගඟ පැන් ගෙණ බො මි
දිව රැ මෙහි වස මි
මදපස වන සිරි බලබලා යෙ මි

5

සිතාගෙන සතු ටු ව
ඇත්කඳ මුදුන පිටි ටු ව
නුවණ නැති පව් ටු ව
එහිම සතොසින් විසි එක පු ටු ව

6

ඇත් කුණපය එවි ට
අවිසයවූ සියොත්න ට
ගහින් ගොස් මුහුද ට
පැමිණ සම් මස් උවෙන් බිඳු මට

7.

ඇට කිලිල දියෙහි ම
ගිලුණු පසු එකපුටු නෙ ම
රිවි වන සිව් දිග ම
පියාසර කර විඩා පත්ව ම

8

නොලදින් කිසි පිහි ට
වැටී උන්සඳ දියපි ට
දුහිමුවරුන් ඇය ට
ගොදුරුවූයෙන් පත්විවනස බ

9

එඃසයිඤ්ම මහර ද
පොපිද අනිකුදු පිළිබ ද
කම්කෙලෙස් නොහළෙ ද
ඔවුන්හට මහතුමෝ අනුබ ද

10

සිදු වැද මුළාව ම
මරපත් කපුටුවාසෙ ම
නුවණ තියසි අද ම
සියනී නිවරද නැණින් විහිද ම

11

උවමෙහි වසා හ මි
අනවරගසසරණවයි හ මි
ගෙහෙයි ගිය කුණ හ මි
මුළාපස්කම් ගුණවෙවයි හ මි

12

කපුටුතෙම එහි වි ය
අනුවණ සන්විලස් වි ය
මස්කා පැන් පි වි ය
සතුටු කාලය කෙමෙන් කියවි ය

13

කුණදුක අවෙ ස් වූ
අරිටුවනසිරි දි ස් වූ
කාලය කෙළෙ ස් වූ
රසෙනි අනුවණ තෙම සතොස් වූ

14

ඇත්කුණ සමුදුර ට
ගොසින් වත්සද දියපි ට
උතුකාලය අරි ට
පච්වුදන පස්කම්හි ලොබකොට

1. පින් පිහිටක් නොල ද
අවෙහි උපදින කල්වෙ ද
පස්කම් ගුණෙහි බ ද
දනන් මෙමෙහමය සිතව මහර ද"

(කව්මිණ මල්දම)

**65.** ප ර සතුරන් එති එති යන බස වා
හැ ර අඹුදරුවන් යන නොපවල වා
ඝොර ජර මරු එනු එනු දැක වෙත වා
ප ර මාදව ඉදිනේ ඇයි පිණ වා

පරසතුරන්, අන්‍යශත්‍රූහු; එති එති යන, එත්ය එත්ය කියන් නාවූ; බසවා, වචනයවි; අඹුදරුවන් හැර, පුත්‍රදාරවන් වර්ජිත කොට; වලවා, වනයට; යන නොපි, ගමනය කරණ නුඹලා; ඝොර, ඝොරවූ; ජරමරු, ජරාමරණයදක; වෙතවා, සමීපයට; එනු එනු දැක, පැමිණීම බල බලා; පිණවා, පුණ්‍යකර්මය පිණිස; පරමාදව ඉදිනේ ඇයි, කුමක් නිසා ප්‍රමාද වව්ද?

**66.** ග ග වතුරෙහි යන මිනිසෙකු දුකි. නෝ
ළි ග කල ඔරුවම නොනැගෙණ ලෙසි. නෝ
ස ග මොහු දෙහ බණ අදහා නොගෙ නෝ
දු ග තිස වැද නොම සිමදුක් විඳි නෝ

ගඟ වතුරෙහි, ගංවතුරට අසුවී; දුකිනේයන, දුඃඛිතවයන් නාවූ; (දුක්සහිතවයන්නාවූ) මිනිසෙකු, මනුෂ්‍යයෙක්; ළඟකල,

ලංකලාවූ; ඔරුවට, ද්‍රෝණියකට; නොනැඟෙණ ලෙසිනේ, නොන ගින්නාක්මෙන්; සඟමොක්දෙන, ස්වර්ගී මෝක්ෂ දායකවූ; බණ, සද්ධර්මය; අදහා නොගෙණේ, ඇදහිමයක් නොකොට; තොප, නුඹලා; දුශ්ශීලව්‍යද, දුගීතියට ප්‍රවිෂ්ඨව; දුක්විඳිනේ කිම, දුක්ඛ වින්දනය කරන්නේ කිම්ද? (කුමක් නිසා දුක්විඳිව්ද?)

**67.** සිල්ප නැවුම් සේවාකම් පෑත ද
අල්ප දෙයක් උදෙසා විඳිනා ව ද
සිල්ප හද රැක්කෝතින් නතුලෙ ද
කල්ප දහස් සුරසිරි විඳිනේ ව ද

සිල්ප, ශිල්පයන්ද; නැවුම්, නෘත්‍යයන්ද; නද සේවාකම්, දාස සේවාකම්ද; පෑ, දක්වා; අල්පදෙයක් උදෙසා, ස්වල්ප වස්තුවක් නිසා; විඳිනා, (සත්වයන් විසින්) වින්දනයකරණු ලබන්නාවූ; වද, වදයක්; (බලව) පහද, ප්‍රසන්නකොට; නතුලෙද, නත්‍යාකාරයෙන්; සිල් රැක්කෝතින්, ශීලයන් රක්ෂාකලේ වීනම්; කල්ප දහස්, කල්ප සහස්‍රයෙහිදූ; සුරසිරි, දිව්‍යශ්‍රීය; විඳිනේ වද, වින්දනය කරන්නේ වද?,

**සිල්ප**—ශිල්ප හෙවත් කලායනු පරිචිතයෙන් දතයුතු දෙයයි. ශාස්ත්‍ර හෙවත් විද්‍යා යනු ඥානයෙන් දතයුතු දෙයයි, කලා සූසැටක්ද, අෂ්ටා දශ විද්‍යාවක්ද වේ.

**සූසැට කලා ශිල්ප:-**

1 අක්ෂරය, 2 ලිඛිතය, 3 ගණිතය, 4 ගාන්ධර්වය, 5 නර්තය, 6 ව්‍යාකරණය, 7 ඡන්දසය, 8 නිඝණ්ඩුය, 9 අලංකාරය, 10 ශාලිහොත්‍රය, 11 මන්ත්‍රය, 12 තන්ත්‍රය, 13 යන්ත්‍රය, 14 ආතෙර්වාදය, 15 ජෝතිඥනය, 16 ඉතිහාසය, 17 පුරාණය, 18 අග්නිස්ථම්භය, 19 ජලස්ථම්භය, 20 කච්මාරය, 21 කූප ශාස්ත්‍රය, 22 සූපශාස්ත්‍රය, 23 කාමශාස්ත්‍රය, 24 ශස්ත්‍රවින්‍යාශය, 25 ශස්ත්‍රකර්මය, 26 අශ්වාරොහණය, 27 ගජාරොහණය, 28 අංකුශචාරණය, 29 මාරණය, 30 මොහණය, 31 ස්ථම්භණය, 32 උච්චාටනය, 33 ත්‍රාටනය, 34 දූර ගමනය, 35 දූරදර්ශනය, 36 හෙරිත්‍රාවනය, 37 පත්‍රච්ඡේදනය, 38 චිත්‍රකර්මය, 39 මාලාබන්ධය, 40 ගන්ධයුක්තය, 41 ද්‍යූතය, 42 ඍරතය, 43 ස්ත්‍රී ලක්ෂණය, 44 පුරුෂ ලක්ෂණය, 45 නපුංසක ලක්ෂණය, 46 පරහිතඥණය, 47 කණක පරික්ෂාව, 48 රත්නක පරීක්ෂාව, 49 චාතුර්වාදය, 50 ධාතු වාදය, 51 බිල වාදය, 52 කණ්‍යා වාදය, 53 ආකර්ෂණය, 54 ආකාශ ගමනය, 55 යක්ෂකර්මය, 56 කාෂ්ට

කාව්‍ය, 57 හේමකර්මය, 58 රත්නපරීක්ෂාය, 59 කඩරණය, 60 ශ්‍රුයාරණය, 61 ආද්‍රිශ්‍යකරණය, 62 පරකාය ප්‍රවේශණය, 63 වේණු වීණා වාද්‍යය, 64 විෂහරණය යන මොහුවෙත්.

අෂ්ටාදසවිද්‍යා:-1 ශ්‍රුතිය, 2 වේදය, 3 ව්‍යාකරණය, 4 ජ්‍යොතිලක්ෂණය, 5 ශබ්දපිය, 6 නක්ෂත්‍රය, 7 ශික්ෂාය, 8 මොක්ෂඥනය, 9 සිතිත්‍ය, 10 ධනු ශිල්පය, 11 හස්ති ශිල්පය, 12 කාමතන්ත්‍රය, 13 සාමුද්‍රිකාය, 14 පරකථාය, 15 නිඝණ්ඩුය, 16 නීතිය, 17 තර්කය, 18 වෛද්‍යය. යන මොහු වෙත්.

68. උ න් නු ත් නැගී සිටිනට බැරි තී — රුව
සි ටි යො ත් ඉඳිනට බලනැති මා — රුව
ජ ර ප ත් වූ කල නොතිබෙයි මේ — රුව
ක ර තො ත් කරගත් දනපින් සී — රුව

උන්නත්, නිසීදනය කළොත්; තීරුව, යපිරාකාරයෙන්; නැගී සිටිනට බැරි, නැගී සිටින්ට නොහැක්කාවූ; සිටියත්, නැගීට සිටිය හොත්; මාරුව, ඒ වෙනස්කොට; ඉඳිනට, නිසීදනය කිරීම පිණිස; බලනැති, ශක්ති නැත්තාවූ; ජර, ජරාවට; පත්වූකල, ප්‍රාප්තවූ කාල යෙහි; මේ රුව, මේ රූපය; නොතිබෙයි, නොතිබෙන්නේය; කර තොත්; කරගත්තේ විනම්; දන්පින්, දාන පුණ්‍යයන්; සීරුව, යහපත්සේ; කරගත්, කරගනිව්.

69. මු න් හැම අඹු දරුවන් උපදි — න් නේ
පි න් බලයෙන් බෝකල් පවති — න් නේ
උ න් කළ පින්මය උන් රදව — න් නේ
ඉ න් සිත ලොබමය තොප පවති — න් නේ

මුන්හැම, මේ සියලුම්; අඹුදරුවන්, පුත්‍රදාරාවන්; උපදින්නේ; උත්පාදවන්නේත්; බෝකල්, බොහෝකාලයක්; පවතින්නේ, ප්‍රවෘත්තවන්නේත්; පින් බලයෙන්, පුණ්‍ය බලයෙන්මය; උන්, ඔවුන්; රදවන්නේ, රජනයකරවන්නේ; උන්කල පින්මය, ඔවුන් විසින් කරණලද පුණ්‍ය කර්මයමැයි; ඉන්, එහෙයින්; තොප සිත, තොපගේ චිත්තයෙහි; පවතින්නේ ලොබමය, ප්‍රවෘත්තවන්නේ ලොභය පමණක්මැයි.

70. සි ල ගුණේ පිහිටා ගෙණ නොසි — දේ
අ ල සැර රකිනා තොප නිබ — දේ
බා ල පියඹු දරුවෝ නම් මෙස — දේ
බා ල කලට කෙළිනා උතු වල — දේ

සිලගුණෙණ්, ශීලගුණයෙහි; පිහිටාගෙණ නොසිදේ, ප්‍රතිෂ්ඨාව නොසිද; නොප, නුඹලා; මෙසදේ, මේ කාලයෙහි; නිබඳ, නිරන්තරයෙන්; ආලයකර, ප්‍රේමකොට; රකිනා, රක්‍ෂාකරන්නාවූ; බාල, බාලවූ; පියඹුදරුවෝනම්, ප්‍රියවූ පුත්‍රදරුවෝ නම්; බාලකලට, ලදරු අවස්ථාවෙහි; කෙළිනා, ක්‍රීඩා කරන්නාවූ; උතුවලදේ, උතුවලන් ගෙවත් පොල්කටු වැනිය.

**71.** දු ක් ගෙ ණ  රැස්කර දන හැම කැම  ති
නි ක් මෙ න  නිරයට නරසින් සිරි  තී
දු ක් දෙ න  අඹු දරුවන් නිති රකි  ති
මො ක් දෙ න  පිරිසිදු සිල් නොම රකි  ති

දුක් ගෙණ, දුක් උසුලා; කැමති, රුචිවූ; හැමදන, සියළු ධන යන්; රැස්කර, රාශිභූතකොට; නිරයට, නරකයට; නික්මෙන, නික්මිම; නරසින්, මනුෂ්‍යයින්ගේ; සිරිති, චාරිත්‍රයකි; දුක්දෙන, දුක්ඛදායීවූ; අඹුදරුවන්, පුත්‍රදාරාවන්; නිති, නිරන්තරයෙන්; රකිති, රක්‍ෂාකෙරෙත්; මොක් දෙන, මොක්‍ෂ දායීවූ; පිරිසිදු, පරිශුද්ධවූ; සිල්, සීලයන්; නොමරකිති, රක්‍ෂා නොකෙරෙත්.

**72.** නො ල ද ත්  අහරක් සාදුක් දුරුකො  ට
නැ තු ව ත්  කඩරෙද්දක් එක පටක  ට
බ ල ව ත්  නිරයේ තද දුක් සිහිකො  ට
ම ද කු න්  පසු නොබසිව් නොපි පිණක  ට

සාදුක් දුරුකොට, ක්‍ෂුධාදුඃඛය දුරිභූතකොට; අහරක්නොල දත්, ආහාරයක් නොලද්දේවී නමුත්; එක පටකට, එක පටකටවත්; කඩරෙද්දක්, රෙදිකැබෙල්ලක්; නැතුවත්, නැත්තේවී නමුත්; නිරයේ, නරකයෙහි; බලවත්, දුස්තරවූ; තදදුක්, ඝෝරදුක්ඛයන්; සිහිකොට, සම්රණයකොට; නොපි, නුඹලා; පිණකට, කුසල් කිරීම පිණිස; මදකුන්, ස්වල්පයක්හුත්; පසුනොබසිව්, පසුබට නොවව්.

**73.** න ස  නො ත්  සිත ලොබ අනුවණ දෙ  ස ම ය
ව ස  නො ත්  සැදැහැත්තන් ඇති දෙ  ස ම ය
දෙ ස  නො ත්  සඟමොක් දෙන උපදෙ  ස ම ය
අ ස  නො ත්  මුනිඳුන් වදහල බ  ස ම ය

නසනොත්, විනාශකරන්නොත්; සිත, චිත්තයෙහි; ලොබ, ලෝභ යද; අනුවණ, මෝහයද; දෙසමය, ද්වේෂයද යන මොහුමය; වස නොත්, වාසය කරන්නොත්; සැදැහැත්තන්, ශ්‍රද්ධාවන්තයින්; ඇති,

ඇත්තාවූ; දෙසමය, දේශනයෙනිමය; දෙසතොත්, දේශනා කරන් හොත්; සගමොක්දෙන, ස්වර්ගමොක්ෂ දෙයිවූ; උපදෙසමය, උපදෙශයක්මය; අසතොත්, ශ්‍රවණයකරත්හොත්; මුනිඳුන් වදහළ, බුද්ධභාෂිතවූ; බසමය, වචනයෙක් මැයි.

**නසතොත් සිත ලොබ අනුවණ දෙසමය—**

"ලොභො අකුසලමූලං, දොසො අකුසල මූලං, මොහො අකුසල මූලං" ලොභ, ද්වේෂ, මොහ යන තුණ අකුසලයන්ගේ හටගැණීමට මුල්කාරණාබැවින් ඒ ත්‍රිවිධ අකුසල මූලය නැසිය යුතුවේ.

**වසතොත් සැදැහැත්තන් ඇති දෙසමය—**

"පති රූප දෙස වාසොව එතං මඞගල මුත්තමං" තෙරුවන් සරණ ගත සාධු ජන සංකීර්ණ යම් ගම් නියම් ගම් රාජධානියෙක් ඇද්ද; (එබඳුවූ) සුදුසු පියෙස්හි විසීම උත්තම මංගලයෙක් වේ.

(මඞගල සූත්‍රය)

**71.** **වැනුවා නම් බුදුගුණ වැනුවාමය**
**තැනුවා නමී තම සිත තැනුවාමය**
**දෙනුවා නම් දන්පින් දෙනුවාමය**
**දිනුවා නම් පරලොව දිනුවාමය**

වැනුවානම්, වර්ණිතාකළානම්; බුදුගුණ වැනුවාමය, සර්වඥගුණ වර්ණිතා කළාමය; තැනුවානම්, තැත්පත් කළානම්; තම සිත තැනුවාමය, ස්වකීය චිත්තය තැත්පත්කළාමය; දෙනුවානම්, දානය කරන්නේනම්; දන්පින්, දාන පුණ්‍යයන්; දෙනුවාමය, දානයකළාමය; දිනුවානම්, ජයග්‍රහණය කළානම්; පරලොව දිනුවාමය, පරලොව ජයග්‍රහණය කළාමය.

**වැනුවානම් බුදුගුණ වැනුවාමය—**

"තස්ස මුඛං මුඛං නාම—යං වත්තති මුඛෙ සදා
දුල්ලභං බුඩ වචනං—සබ්බ සම්පත්ති දායකං"

සබ්බ සම්පත්ති දායකං, සියළු සැපත් දෙන්නාවූ; දුල්ලභං, දුලබවූ; බුඩ වචනං, බුද්ධ යන වචනය; සදා, සැමකල්හි; මුඛෙ, (යමෙකුගේ) මුඛයෙහි; යං, යම් හෙයකින්; වත්තති, පවතීද? (එහෙයින්) තස්සමුඛං, ඔහුගේ මුඛය; මුඛංනාම, මුඛ නම්වෙයි.

(රසවාහිනී)

තැනුවානම් තම හිය තැනුවාමය —

"දූරඞ්ගමං එකචරං අසරීරං ගුහාසයං
යෙචිත්තං සඤ්ඤමෙස්සන්ති මොක්ඛන්ති මාර බන්ධනා"

දූරඞ්ගමං, (යොදුන් දහසකින් දුරවූද අරමුණු ගත්නා බැවින්) දුරට යන්නාමවූ; එකචරං, (යම්සේ පිරිසෙකින් දෙසිත කුදු එකවිට නොඉපද එක් සිතක් ඉපද නිරුඩවූ කල්හිම අනික් එකම සිතක් උපදනාහෙයින්) එකවරවූ හුදකලාවම පවත්නාවූ; අසරීරං, (තමා අරූපී ධර්ම බැවින් වර්ණසංස්ථාන යෙක් නැත්තුයි) ශරීරයක් නැත්තාවූ; ගුහාසයං, (සතර මහාභූතයන් නිසා පවත්නා මේ ශරීර නමැති) ගුහායෙහි පවත්නාවූ හෙවත් හෘදය රූපය නිසා පවත්නාවූ; චිත්තං, සිත; යෙ, යම් ස්ත්‍රී පුරුෂ කෙනෙක් හෝ ගෘහස්ථ ප්‍රව්‍රජිත කෙනෙක් හෝ; සඤ්ඤමෙස්සන්ති, (නූපන් කෙලෙසුන් නොඉපැද්දදී ප්‍රමාද දෝෂයකින් උපන් කෙලෙසුන් දුරුකෙරෙමින්) සංවරයෙහි පිහිටුවද්ද; තෙ, ඔහු; මාරබන්ධනා, මාරබන්ධනයයි කියනලද තෛභූමික වෘත්තයෙන්; මොක්ඛන්ති, මිදෙන්නාහුයි.

(ධම්මපදය)

දිනුවානම් පරලොව දිනුවාමය —

"යො සහස්සං සහස්සෙන සඞ්ගාමෙ මානුසෙ ජිනෙ
එකඤ්ච ජෙය්‍ය අත්තානං සවෙ සඞ්ගාම ජුත්තමො"

යො, යම් සංග්‍රාම යොධයෙක්; සහස්සෙන, දහසකින් ගණන ලද; සහස්සං මානුසෙ, මිනිසුන් දහසක් (හෙවත්) දශලක්‍ෂයක් පමණ මිනිසුන්; සංගාමෙ, එකම යුඩයෙක; ජිනෙ, දිනුයේ විනමුත්; (හෙතෙම ජයලද්දේ නමුදු නොවෙයි, උත්තම යොධ නමුදු නොවේ, වැලි ජයලද්දේ නමුදු උත්තම යොධ නමුදු කවරේදයත්?) යො, යමෙක් වනාහි; එකං, එකම; අත්තානං, ආත්මය; (හෙවත්) තමාම; ජෙය්‍ය, (රාත්‍රි ස්ථාන දිවාස්ථානයෙහි ආධ්‍යාත්මිකවූ කර්මස්ථාන සම්මර්ශනයකරන්නේ තමාගේ සන්තානයෙහි ලොභාදී කෙලෙසුන් දිනීමෙන්) දිනුයේවේද; සො, හෙතෙම; වෙ, ඒකාන්තයෙන්; සඞ්ගාමජුත්තමො, සංග්‍රාම ජිත්නට (හෙවත්) යුඩයෙහි දිනුව වුත්ට උත්තම යොධ නම්වේ.

(ධම්මපදය)

75. අසතොත් නිබොරුව මුනිඳු නෙපු ල්මය
හපිතොත් නොනබා දස අකුස ල්මය
රකිතොත් සිත පිරිසුදුකොට සි ල්මය
දනිතොත් මෙහියල්ලට මේ කා ල්මය

නිබොරුව, සැබවින්; අසතොත්, ශ්‍රවණය කරත්හොත්; මුනිඳු තෙපුල්මය, බුඩ වචනමය; නොනබා, ශෙෂ නොකොට; හරිතොත්, දුරලතොත්; දස අකුසල්මය, දස අකුසල කර්මාන්තමය; සිත, චිත්තය; පිරිසුදුකොට, පරිශුඩකොට; රකිතොත්, රක්‍ෂාකරත්හොත්; සිල්මය, සීලයමය; දනිතොත්, ජානනය කරත්හොත්; මෙසියල්ලට, පූර්වෝක්ත සියළු දෙයට; මේ කල්මය, මේ(බුද්ධෝත්පාද) කාලයමැයි.

**හරිතොත් නොනබා දස අකුසල්මය—**

“වාණිජෝ'ව භයං මග්ගං අප්පසත්ථො මහඩනො,
විසං ජීවතු කාමො'ව පාපානි පරිවජ්ජයෙ”

භයං මග්ගං, සොරුන් සිටි හෙයින් භය කටයුතුවූ මගවල ගන්නාවූ; අප්පසත්ථො, කැටිව යන සාත්තුවක් නැති; මහඩනො, බොහෝ ධනඇති; වාණිජෝ ඉව, වෙළඳක්හුමෙන්ද; විසං, හලාහල විෂයක් දුරුකරන්නාවූ; ජීවතු කාමො ඉව, ජීවත්වනු කැමති එකක්හුමෙන්ද; පාපානි පරිවජ්ජයෙ, අකුශල කර්මයන් දුරුකරන්නේයි. අකුශලයෝ නම් සොරුන් සිටි මගක්මෙන් හලාහල විෂයක්මෙන් සොපද්‍රවයහ සාදීනවය හයි සලකා නුවණැති පුද්ගලතෙම ස්වල්පදවූ අකුශලය දුරින්ම දුරුකරන්නේයි සේයි.

(ධම්මපදය)

**දස අකුසල්—**

“කායකම්මං තිධා වුත්තං වාචා කම්මං චතුබ්බිධං
මනසා තිවිධඤ්චෙති දස කම්ම පථා ඉමෙ
පාණඝාත පරද්දබ්බං පරදාරඤ්ච කායතො
මුසා පෙසුඤ්ඤ ඵරුසංච සම්ඵප්පලාපි වාචතො
අභිජ්ඣා, චෙව ව්‍යාපාදෙ මිච්ඡාදිට්ඨීච මානසො”

1

“තුනක් පව් කයි නුත්
බසින් සතරක් කිය නුත්
තුනක් එය සිති නුත්
මෙදස පව්බව දනුවකෙමෙනුත්

2

පණිවා කිරි ම ය
අන් දන පැහැර ගැන් ම ය
පරදරෙනි යෙදු ම ය
කයින් නිරිඳුනි මෙපව් කිරි ම ය

3

කේලම් බොරු බ සත්
සතත් වෙහෙසන පරු සත්
වැඩනැති කිසි බ සත්
වදනයෙන් වෙයි දනුව දවස ත්

4

අන් දන ලොබව් ම ත්
වැපාද දිටු ගැන් ම ත්
පමු තුණය සිතු ම ත්
දනුව නිරිඳුනි මෙදස පව් ම ත්”

(කව්දීපනීය)

කායකම් අකුසල් තුනෙක, වාක්කම් අකුසල් සතරෙක, මනඃකම් අකුසල් තුනෙක, මේ දස අකුසල කම් පථය නම්වේ. ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිථ්‍යාචාරය, යන තුණ කාය කම් (කයින් සිඩවන) අකුසලයෝයි. මුසාවාද, පිසුනාවාච, ඵරුෂාවාච, සම්ඵප්‍රලාප යන සතර වාක් කම් (වචනයෙන් සිඩවන) අකුසලයෝයි. අභිද්‍යාය, ව්‍යාපාදය, මිථ්‍යාදෘෂ්ටිය, යන තුණ මනඃ කම් (සිතින් සිඩවන) අකුසලයෝයි.

"1 සතුන් දිවි නැසුමු ත්
අන්සතු දෙයැරගැණුමු ත්
පරදර [රා බොතු ත්]
මෙපව් සිදුවේ කයින් සැක නැ ත්

| 2 | | 3 | |
|---|---|---|---|
| කියනු දූත දූත බො | රැ | දළ ලොබ අන් සැප | ත |
| තෙපුලුන් නොවන වැඩක | රැ | වනස සිතිවිලි නොව ඉ | ත |
| කේලාමුත් නපු | රැ | යළි මිසදිටු පව | ත |
| බිණුම් බසෙව් මෙසැව් උවදු | රැ | මෙතුණ නියනින් පහළවේ සිත" | |

(කාව්‍යශේඛරය)

| 1 | | 2 | |
|---|---|---|---|
| 'සතත් වැනසී | ම ය | කියන කේලා | ම ය |
| අන්සතු දෙය ගැණී | ම ය | දළරළුබස් බිණී | ම ය |
| පරඟන සෙවී | ම ය | මුවාවෙස් කී | ම ය |
| සමඟ මුසවා [සුරා බී | ම ය] | අව්දුවියපා කුදිටු වී | ම ය" |

(කවිමිණිමල්දම)

මෙහි එකොළොස් අකුසල් උගත්වනලදී. දසයක්කොවැ ගනිනු ලබන කළැ රහමෙර පානයත් කාමමිථ්‍යාචාරයටම ඇතුලත් වේ.

76. මෙ ස සර දුක් රුක විස පලගත් අ තු
ලෙ ස සිටියාමෙන් සියපලයෙන් යු තු
නො ස වඩමින් ඉන් බැහැර නොලා සි තු
ද ස අකුසල් පල අසව මෙසින් ම තු

විසපලගත්, විෂඵල හටගත්තාවූ; මෙසසර දුක් රුක, මේ සංසාර දුක්ඛ නමැති වෘක්ෂයාගේ; සිය පලයෙන් යුතු, සත්ඵලයෙන් යුක්තවූ; අතු ලෙස සිටියාමෙන්, ශාඛා පරිද්දෙන් සිටියාක් වැනිවූ; දසඅකුසල්, දසඅකුසලයන්ගේ; පල, විපාක; මෙසින්මතු, මෙතැන් සිට; ඉන් බැහැර, එයින් ඉවත; සිතුනොලා, චිත්තය නොයොදවා; නොසවඩමින්, සංතානෙ විඩිනයකරමින්; අසව, ශ්‍රවණයකරව.

**මෙසසර දුක්රුක විසපලගත් අනු—**

1 “සංසාර විස රුකඛසෙසා—සජ්ජතෙ මමිතං ඵලං,
තථා විස ඵලචාති—ච ඵල සම්භවනති හි.”

2 “රාග රතනා පජා ලොකෙ—ඛාදිත්වාන විසං ඵලං,
පපෙපාති දුකඛං කටුකං—නරකෙසු අනපපකං.”

3 “තසමා ලොකානු කමපාය—ඉදං විස ඵලං ඉති,
ඉදංතු අමතං චාති—සඤඤ පෙසසාමි සාධුකං.”

අවිද්‍යා නමැති මුල්ඇති සංසාර නමැති විෂවෘක්‍ෂයෙහි හටගත් ඵලයෝ දෙදෙනෙක්වෙත්. එනම්:-කුසල නමැති අමෘඵලය සහ අකුසල නමැති විෂ ඵලයද වේ. අමෘත ඵල අනුභව කරන්නේ හෙවත් කාය වාක් මනො යන ත්‍රිවිධවාරය පිරිසිදු කොට දසකුසල ධර්මයන් රැස්කරන්නේ ඉහාත්ම භාවයෙහිද තමා විසින් කරණලද පුණ්‍යකර්ම නන්‍දනයෙන් සතුටුව පරලොවදීද (සප්ත) කාම ස්වර්ගයෙහි උපන්නේ විපාක නන්‍දනයෙන් සතුටුවන්නේය. විෂ ඵල අනුභව කරන්නේ හෙවත් තුන්දොරින් දසඅකුසල ධර්මයන් රැස්කරන්නේ මෙලොවදීම තමාගේ කර්ම සන්‍තාපයෙන් තැවෙමින් සිට මින් මිය නරකාදී සතර අපායෙහි පතිතව විපාක සන්‍තාපයෙන් බෙහෙවින් තැවෙන්නේයි.

**77.** **බු දු බ ණ අසමින් සිත සත පා යේ**
**කු රු ප ණ කම් හැරපියව් පා යේ**
**ප ර ප ණ නැසුවොත් කවර උ පා යේ**
**අ ප ම ණ දුක්දෙයි සතර අ පා යේ**

බුදුබණ, බුද්ධධර්මය; අසමින්, ශ්‍රවණයකරමින්; සිතසතපායේ, චිත්තසන්තර්පණයකොට; ඒ පායේ, එපාවූ; කුරු, කෲරවූ; පණකම්, ප්‍රාණඝාත පාපකර්මය; හැරපිය, පහකර දමව්; කවර උපායේ, මොනයම් උපායකින් නමුත්; පරපණ, අන්‍ය සත්වයන්ගේ ප්‍රාණය; නැසුවොත්, විනාශකළේවී නම්; සතර අපායේ, චතුර් අපායෙහි; අපමණ දුක්, ප්‍රමාණාතික්‍රාන්තදුඃඛයන්; දෙයි, (සලසා) දනය කෙරෙයි.

**පරපණ නැසුවොත් කවර උපායේ—අපමණදුක්දෙයි සතර අපායේ—**

**ප්‍රාණඝාතය**—සත්වයන්ගේ ජීවිතෙන්ද්‍රිය ස්වභාවයෙන් නැතිවීමට අවසරනොදී වහා නැතිකිරීම “පාණාතිපාත” නම්වේ-

(පාණෝහමෙව පාණසඤ්ඤී වධකචිත්ත මූපක්කමෝ
තෙන ජීවිත නාසොච, අඞ්ගාපඤ්ච වධස්සච)

තමා විසින් කරණුලබන ප්‍රාණඝාතයෙහි අංග පසක්වේ, එනම්:-සතෙකු බවය, සත්වයෙක යන සංඥව ඇතිවීමය, මරම් යන චේතනාවය, මරණයට උපක්‍රම යෙදීමය, ඒ උපක්‍රමවලින් දිවි තොරකිරීමය, යන පසයි.

අනුන් ලවා කරවණු ලබන ප්‍රාණඝාතයෙහි අංග සතක්වේ. එනම්:-සතෙකුබවය, සත්වයෙක යන සංඥව ඇතිවීමය, නසමි යන චේතනාවය, ඊට නියමිත උපක්‍රමය, අදහස්ලෙස අනිකෙකුට නියොගකිරීමය, ඒ නියමය එසේ පිළිගැණීමය, නියමය ලෙස මැරීමය යන මේ සතයි.

| | |
|---|---|
| "සතෙකු බව දැනුම ද | නියෝ පිළිගැත්ම ද |
| මරණුව සිත් පයෝග ද | එකාරතුයට කියනල ද |
| දිවියතු සියත බ ද | පියෝ ඇර තමඹ ද |
| පසඟකැයියෙත් පළමුසිකප ද | සතඟි සතරඟ සහ නියෝග ද" |

(කාව්‍යශේඛරය)

ප්‍රාණඝාතයෙහි ආදීනව—

"සබ්බො ප භොග ධන ධඤ්ඤ විසෙස ලාභී
රූපෙන භො සමකරඩ්ජ සනාතිහොපි
යො යොබ්බනෙපි මරණං ලභතෙ අකාමං
කාමං සදුතු පරපාණ හරො නරොති"

ප්‍රාණවධකළ සත්වතෙම මෙම ජනවයෙහිම ශසත්‍රහුල් ආදීන් ඇනුම් කන්නේය. මෙයින් මිය සතර අපායෙහි ඉපිද අනේක වර්‍ෂ කෝටි සහස්‍රයෙහි පැසී එයින් මිදී යම්කිසි කුශල ක්‍රියාවක් හේතුකොට ගෙණ සියළු වස්ත්‍රාභරණ ධන ධාන්‍ය මුක්තා මාණික්‍යාදී උපභොග පරිභොග වස්තූන්ගෙන් ආඪ්‍යවූ මහත් විභූති ඇති කුලයෙහි අනඞ්ගයා හා සමාන රූප ශොභා ඇතිව උපන්නේ වී නමුත් ඒ සම්පත් නොවළඳම ඒකාන්තයෙන් යෞවණ අවස්ථාවෙහිම නොකැමතිසේ මරණයට පැමිණෙන් නේයි.

"හිංසා අප්පායු කාතනම බව්හා බාධතානං පිච
විශොග දුක්ඛ බාහුල්‍යං ජනෙතුබ්බියග වාසතං"

හිංසා, ප්‍රාණාතිපාත චෙතනා තොමෝ; අප්පායුකත්තාව, අල්පායුෂ්කබවද; බව්හා බාධත්තානං පිව, බොහෝ රෝග ඇති බැදද; විප්‍රයොග දුක්ඛ, ප්‍රිය වියොග දුක්ඛයාගේ; බාහුල්‍යං, බොහෝ බවද; උබ්බිග්ගවාසත්තං, උද්විග්නවාස ඇතිබවද; හෙවත් භයපත්ව විසීමද; ජනෙති, කෙරේ.

"පාණාතිපාතො භික්ඛවෙ ආසෙවිතො භාවිතො බහුලීකතො නිරය සංවත්තනිකො හොති, තිරච්ඡානයොනි සංවත්තනිකො හොති, පෙත්තිවිසය සංවත්තනිකො හොති, යො සබ්බ ලහුසො පාණාති පාතස්ස විපාකො මනුස්ස භූතස්ස අප්පායුක සංවත්තනිකො හොති."

මහණෙනි, ප්‍රාණඝාතය නැවත නැවත පුරුදුකරණ ලද්දේ, භාවිතා කරණලද්දේ, බොහෙවින් කරණලද්දේ නරකයෙහි උපදවන්නේය, තිරිසන් යොනියෙහි උපදවන්නේය, ප්‍රේත යොනියෙහි උපදවන්නේය, මෙසේ මහත් විපාකදී යම්කිසි හේතු කර්මයකින් මිනිසත් බවෙහි උපන් කල්හි ශෙෂවතාවූ ප්‍රාණඝාතයාගේ අකුසල විපාකයෙන් අල්පායුෂ්කබවට පමුණුවන්නේය, හෙවත් මඳවූ වයසේම මරණයට පමුණුවන්නේය.

78. මැ ඩි ය න් නයි මුව ගොදුරුව ඉ ද යා
ප ණු ව න් කනමෙන් රසවිඳ වි ද යා
සැ ලෙ මි න් ජරගොර මරුමුව වැ ද යා
බ ල මු න් පරපණ වනසන ලෙ ද යා

මැඩියන්, මණ්ඩූකයන්; නයි මුව, නාගයන්ගේ මුඛයෙහි; ගොදුරුව ඉඳයා, ගොචරව හිඳගණිත්; රසවිඳ විඳයා, රස විඳිනය කරමින්; පණුවන්, කෑමින්; කනමෙන්, අනුභව කරන්නාක්මෙන් ජර, ජරාවෙන්; සැලෙමින්, චලිතවෙමින්; ගොරමරුමුව, ඝෝරවූ මාරයාගේ මුඛයට; වැදයා, ප්‍රවිෂ්ටවන්නාවූ; මුන්, මොවුන්; පරපණ, අන්‍යයන්ගේ ප්‍රාණය; වනසන, විනාශකාරණ; ලෙදයා, ආකාරය; බල, අවලොකනයකර.

79. බ ල යෙ න් වන් කිසියම් සොර සිත කි න්
සි ය ති න් වන් දූන්වූ උපදෙස කි න්
ප ර ස න් හක දෙය ගත සොර කම කි න්
නි ර යෙ න් නිරයට පැමිණෙසි එතෙ කි න්

බලයෙන්වත්, සාහසිකභාවයෙන්වත් (බලහත්කාරයෙන්වත්); කිසියම් සොර සිතකින්, යම්කිසි චෞර චිත්තයකින් හෝ; සියතින් වත්, ස්වහස්තයෙන් හෝ; දුන්වූ, (අනුන්) සංඥ කළාවූ; උපදෙස කින්, උපදේශයකින්වත්; පරසන්තක දෙය, අනුන් අයත් වස්තුව; සොරකමකින්, චෞරකර්මයකින්; ගත, ග්‍රහණය කෙළේවීනම්; එතෙකින්, එපමණකින්; නිරයෙන් නිරයට, නරකයෙන් නරකයට; පැමිණෙයි, ප්‍රාප්තවන්නේය.

**පරසන්තක දෙය ගත සොරකමකින්—නිරයෙන් නිරයට පැමිණෙයි එතෙකින්—**

**අදත්තා දානය**—වස්තු ස්වාමීහු විසින් කයින් හෝ වචනයෙන් තමහට නොදෙනලද වස්තුව සොරසිතින් පැහැරගැණීම අදත්තාදාන නම්වේ.

(පරපරිග්ගහිතං පරපරිග්ගහිත සඤ්ඤිතා ථෙය්‍ය චිත්තං උපක්කමො තෙන හරණන්ති)

තමා විසින් කරණුලබන අදත්තාදානයෙහි අංග පසක්වේ. එනම්:-අන්‍යයන් සතු වස්තුවක් බවය, පරසන්තකයයි දන්නා බවය, සොරකමින් ගණිමි යන චේතනාවය, සොරකම් කරණ උපක්‍රමය, ඒ උපක්‍රමයෙන් හැරගැණීමය, යන මේ පසයි.

අනුන් ලවා කරවන අදත්තාදානයෙහි අංග සතක්වේ. එනම්:-පරසන්තක වස්තුවක් බවය, පරාඅයත් බව දැනීමය, සොරකම් කරවමි යන සිතය, සොරකම් කරණ උපක්‍රමය, සොරකම් කිරීමට අනිකෙකුට නියොග කිරීමය, ඒ නියමය එසේ පිළිගැණීමය, ප්‍රතිඥපරිදි ඒ කිරීමය යන මේ සතයි.

| | |
|---|---|
| "වෙන අය අයිතිව ත් | මෙමහවර ගිවිස්ම ත් |
| එබව දැනමුත් සොරසි ත් | ඔහු එමසේ කිරීම ත් |
| පියෝ ඉන් ගැණුමු ත් | හැරයට පියෝ අ ත් |
| දෙවන සිකපද පසග කැසියෙන් | එසිව් සමගින් සතගි නියව ත්" |

(කාව්‍යශෙඛරය)

**අදත්තාදානයෙහි ආදීනව—**

"යො යාව කො භවති භින්නකපාල හත්ථො
මුණ්ඩාධි ගක්ඛර සතෙහි ච තජ්ජයන්තො
භික්ඛං සදරි හදනො සකුවෙල වාසො
දෙහී ෂරත්ථපරචිත්ත හරො නරොති"

මෙම ජන්මයෙහිම මහත් අනයව්‍යසනයට පමුණුවන අදත්තාදානය කළ සත්ත්වතෙම සතර අපායෙහි ඉපිද අනෙක වර්ෂ කෝටිසහස්‍රයෙහි පැසී ඉදින් යම්විටක මිනිස් කයක් ලදහු නම් දිළිඳු යාචකයෙක්ව හිස මුඩුකරණුලැබ කබල්ගත් අත් ඇතිව බොහෝ ජනයා විසින් බණින නිෂ්ඨුරවචනයෙන් තර්ජනයකරණු ලබමින් කිළිටිවස්ත්‍ර හැඳ හැමකල්හී සිඟමින් මනුෂ්‍යප්‍රේතව ඇවිදින්නේයි.

"දළිද්දියම දීනත්තං ආසාභඞ්ගම දරුණං
අඥ්ඥායත්තපප වත්තිචා දිනානාදයිලභෙන්නරො"

අදිනනාදයී, අදත්තාදානකළ; නරො, සත්ත්වතෙම; දළිද්දියංච, දිළිඳුබවද; දීනත්තං, බැගෑබවද; දරුණං, දරුණුවූ; ආසාභඞ්ගච, කැමති වස්තු නොලැබීමද; අඥ්ඥායත්තපපවත්තිච, අනුන් පිළිබඳවූ ජීවනවෘත්ති ඇතිබවද; ලභෙ, ලබන්නේය.

"අදින්නාදානං භික්ඛවෙ ආසෙවිතං භාවිතං බහුලීකතං නිරය සංවත්තනිකං හොති, තිරච්ඡාන යොනි සංවත්තනිකං හොති, පෙත්තිවිසය සංවත්තනිකං හොති, යො සබ්බලහුසො අදින්නාදානස්ස විපාකො මනුස්ස භූතස්ස මනුස්ස දෙ භගා සංවත්තනිකො හොති"

මහණෙනි, අදත්තාදාන අකුසලය නැවත නැවත පුරුදු කරණලද්දේ භාවිතාකරණලද්දේ බොහෝසෙයින් කරණලද්දේ නරකයෙහි උපදවන්නේය, තිරිසන් යොනියෙහි උපදවන්නේය, ප්‍රේත යොනියෙහි උපදවන්නේය, මෙසේ ලැබෙන් විපාකදී යම්කිසි හේතුකර්මයකින් මිනිසත්බවෙහි උපන් කල්හි ශෙෂව තුබූ අදත්තාදාන අකුසලයාගේ විපාකයෙන් ඉතා බැගෑපත් ස්වභාවකට පමුණුවන්නේයි.

80. ලො බි නා මිහිරිව සොරකම් කළ ස ත
වි දි නා දුක් මේ ලොව මෙතෙකැයි නැ ත
මෙ දි නා ඒ දැක දැක ඉන් නොනැව ත
ඉ දි නා කළ කිකලක වේදෙ සෙ ත

ලොබිනා මිහිරිව, ලොභයෙන් මධුරව; සොරම්කළ සත, චෞරකර්මකළාවූ සත්ත්වයා, මේ ලොව, මේ මනුෂ්‍යලොකයෙහි; විඳිනා දුක්, විඳිනයකරන්නාවූ දුඃඛයන්; මෙතකැයි, මේ ප්‍රමාණයයි; නැත, කෙලවරක් නැත්තේය; මෙදිනා, මෙකල්හි; ඒ දැක දැක; ඒ (සොරකම් කළ සත්ත්වයා විඳින්නාවූ ගැහැට) දර්ශනයකරමින්ම;

ඉන් නොනැවත, එයින් නොවැළකී; ඉඳිනාකළ, හිඳින්නාවූ කාලයෙහි; කිකලක, කවරකලෙක්හි; සෙත, සාන්තියක් සෙවන් සැපතක්; වේදෝ, වන්නේද?

81. අසු කොට ගත නොතිබති ආද ර ය
වද කොට මැරුවක් නැත එවිවා ර ය
ලගු කොට නොසිතව් පව් පරද ර ය
නි ර ය ට ඇදගෙණ යන එම පා ර ය

අසුකොටගත, අසුකරගතු ලැබුවහොත්; ආදරය, ආධාරයක්; නොතිබති, නොතිබෙන්නේය; වදකොට, වධකිරීමෙන්; මැරුවත්, මැරුයේවීනමුත්; ඒ, ඒ පිළිබඳ; එවාරය නැත, පිළිවිසීමෙක් නැත්තේය; පරදරයපව්, පරදර අකුසලකර්මය; ලගුකොට, සැහැල්ලු කොට; නොසිතව්, චින්තානය නොකරව්; එම, ඒ පාපයම; නිරයට ඇදගණයන, නරකයට ඇදගෙන යන්නාවූ; පාරය, මාර්ගයවේ.

**ලගුකොට නොසිතව් පව් පරදරය—නිරයට ඇදගෙණයන එම පාරය—**

**කාම මිථ්‍යාචාරය**—කෙලෙශ කාම වශයෙන් ලාමක නින්දිතාචාරවූ කායචාරයෙන් සිඩවන අකුසල කර්මපථය කාමමිථ්‍යාචාර නම්වේ.

(පරපරිග්ගහි තිත්ථිව පරපරිග්ගහ සඤ්ඤිතා
අතික්කම මණ චිත්තං ච තජ්ජො වා තික්කමො පිච
එවං පරස්ස දරෙසු චතුරඞ්ගා අතික්කමො)

කාම මිථ්‍යාචාරයෙහි අඞ්ග සතරෙක්වේ. එනම්;-සේවනය නොකටයුතු ස්ත්‍රියක් බවද, සේවනයකරණ ප්‍රයොගයද, මාර්ගයෙන් මාර්ගය ප්‍රතිෂ්ඨකිරීමද, ඒ ඉවසීමද යන මේ සතරයි.

"නොලැබිය යුතු තැන ත්
ඉවසුම් සෙවුම් රිසිව ත්
මඟින් මග සඹව ත්
සතර අඟ පරදර සැකනැ ත්"

(කාව්‍යශෙඛරය)

සේවනය නොකටයුතු පරදාරාවෝ විසිදෙනෙක් වෙත්. එනම්;-

1 මාතු රක්ඛිතා=මෑණියන් විසින් රක්නා ලද්දීය,
2 පිතු රක්ඛිතා=පියාණන් විසින් රක්නා ලද්දීය,
3 මාතා පිතු රක්ඛිතා=මව්පිය දෙදෙනා විසින් රක්නාලද්දීය,

4 භාතු රක්ඛිතා=බෑයා විසින් රක්නා ලද්දීය,
5 භගිණි රක්ඛිතා=බුහුණා විසින් රක්නා ලද්දීය,
6 ඤාති රක්ඛිතා=නෑයන් විසින් රක්නා ලද්දීය,
7 ගොත්ත රක්ඛිතා=ස්වකීය ගෝත්‍රයෙහි අය විසින් රක්නා ලද්දීය,
8 ධම්ම රක්ඛිතා=සහධාර්මිකයන් විසින් රක්නා ලද්දීය,
9 සාරක්ඛා=ස්ත්‍රී බාලකාලයෙහිම මෑ මට භාර්‍ය්‍යාවන්නීයයි ස්වාමියා විසින් මල්පිළි පළඳවා නියත කරණ ලද්දීය,
10 සපරිදණ්ඩා=මෙනම් ස්ත්‍රිය ලඟවූවන්ගෙන් මෙතෙක් දඩයයි සම්මත කරණ ලද්දීය,
11 ධනක්කීතා=පුරුෂයා විසින් මිළදී ගෙණ වාසය කරණලද ස්ත්‍රිය
12 ඡන්දවාසිනී=තමන්ගේ ප්‍රියයෙන් පුරුෂයා හා වාසය කරන්නීය,
13 භොගවාසිනී=යම්කිසි භොගයක්ගෙණ ස්වාමියාකෙරෙහි වාසය කරණලද ස්ත්‍රිය,
14 පටවාසිනී=පිළියක් ගෙණ වාසය කරණලද ස්ත්‍රිය,
15 ඕදපත්තකිනී=දෙමව්පියන් ආදී නෑයන් විසින් මඟුල්කොට පාවා දෙනලද්දීය,
16 ඔභතචුම්බටා=පැන්කොට ආදී තැන්හි දූක හිසතුබූ සුඹුලුබහවාපියා භාර්‍ය්‍යාකොට වසනලද ස්ත්‍රිය,
17 දාසිභරියා=දාසීවසිට ස්වාමියාකෙරෙහි වාසයකරණලද ස්ත්‍රිය,
18 කම්මකාරිවහරියා=මෙසීනාක් ප්‍රකාරයෙන් පිටත්ව ගෙයි මෙහෙකොට වසනලද ස්ත්‍රිය.
19 ධජාහටා=සටන්කොට දිනූ තැනින් ගෙණෙනලද ස්ත්‍රිය,
20 මුහුත්තිකා=අවධි පරිච්ඡේදකොට (මෙතෙක් දවසට මෙතෙක් මිළයයි නියමකොට) ගත් ගණිකාය.

මොහු විසිදෙනා කෙරෙන් ආදි දැක්වූ අටදෙනා හා මෙවුන් දම්හි යෙදුණු පුරුෂයන්ට පරදර සෙවුන් පව්සිඩවෙයි, මොවුන් අටදෙනාගේ ශරීර ස්පර්ශයට හිමිවූ අනික් ස්වාමියෙකු නැතිබැවින් ඔවුන් අටදෙනාට කාමමිථ්‍යාචාර පව්සිඩනොවේ. ඉතිරි දොළොස්දෙනා හා කැටිව අසද්ධර්මයෙහි පැවති පුරුෂයන්ටද ඔවුන් දොළොස්දෙනාටද කාමමිථ්‍යාචාර පව් සිඩවේ.

**කාමමිථ්‍යාචාරයෙහි ආදීනව--**

"ඉත්ථි න මුඤ්චති සද පුන ඉත්ථි භාවා
නාරිසද භවති සො පුරිසො පරත්ථ
යො ආචරෙය්‍ය පරදාර මලං සනීයං
ඝොරඤ්ච වින්දති සදුක්ඛසහස්සඤ්ච නෙකං"

යම් සත්වයෙක් පරලොව නොඉක්මවිය හැක්කාවූ විපාක ඇති මිථ්‍යාචාර පාපය කෙළේද හෙතෙම මෙම ජන්මයෙහිම රජුන් විසින් කරණලද ධනදණ්ඩයෙන්ද, වධදණ්ඩයෙන්ද, පීඩාලැබ මෙයින් මිය සතර අපායෙහි ඉපිද අනෙකවර්‍ෂ කෝටිසහස්‍රයෙහි දැසී එයින් මිදී මනුෂ්‍යත්වයක් ලදහුනම් ස්ත්‍රී නපුංසකාදී භවට හා භොගව්‍යසන ඥාතිව්‍යසනාදියට පැමිණෙන්නේයි.

“ස පතත බහුලො හොති සදවා’පතී ජ තී කො
ඉත්ථි වා පණ්ඩකො වාපි පරදාර රතො නරො”

පරදාරරතො, පරදාරාවන්කෙරේ ඇළුනු; නරො, පුරුෂතෙම; සපතත බහුලොහොති, සතුරන් බහුලකොට ඇත්තේවෙයි; සදා, හැමකල්හි; අපතීතො, අප්‍රීතිවූ; (නොකැමති) ඉත්ථිකාව, ස්ත්‍රීහුද ඇතිවෙයි; ඉත්ථිවා, තෙමේ ස්ත්‍රී හෝ වෙයි; පණ්ඩකො වාපි, පණ්ඩකහෝවෙයි.

“කාමෙසු මිච්ඡාචාරෙ භික්ඛවෙ ආසෙවිතො භාවිතො බහුලීකතො නිරය සංවත්තනිකො හොති, තිරච්ඡාන යොනි සංවත්තනිකො හොති, පෙත්තිවිසය සංවත්තනිකො හොති, යො සබ්බලහුසො කාමෙසු මිච්ඡාචාරස්ස විපාකො මනුස්ස භූතස්ස සපත්තවෙර සංවත්තනිකො හොති.”

මහණෙනි, කාමමිථ්‍යාචාරය නැවත නැවත පුරුදුකරණලද්දේ භාවිතා කරණලද්දේ බොහෝසෙයින් කරණලද්දේ නරකයෙහි උපදවන්නේය, ප්‍රේතයොනියෙහි උපදවන්නේය, තිරිසන්යොනියෙහි උපදවන්නේය, මෙසේ මහත් විපාකදී යම්කිසි හේතු කර්මයකින් මිනිස් පියක් ලදකල්හි ශේෂව තිබූ කාමමිථ්‍යාචාර අකුශලයාගේ විපාකයෙන් ගැහැණිවෙති, මව් පියන්ට පවා අප්‍රියවෙති, සර්වජනයන් විසින් වෛරකරණු ලැබේ.

82. අ ස වා මකියන බස් අරන ර යේ
මු ස වා බස් කීවා එක මු ර යේ
ව ස වා දෙව්ලොව සන මංන ර යේ
පැ ස වා මිස නාරී ගොර නි ර යේ

මකියන බස්, මාවිසින් කියනුලබන්නාවූ වචන; අරතරයේ, දෑස්තරව; අසවා, ශ්‍රවණය කරන්වා; එකමුරයේ, එක්වතාවක්; මුසවා බස්, මුසාවචන; කීවා, කථනයකෙළේනමුත්; දෙව්ලොව්

යනමත්, දිව්‍යලෝකයට යන්නාවූ මාර්ගය; නරයේ වසවා, තිරතොම (සපිරවම්) ඡාදනයකෙරෙයි; ඝොර නිරයේ, ඝොරවූ නරකයෙහි; පැසවා විස, පවනයකොට විසක්; නාරී, අත්නොහරී.

**මුසවා බස් කිවා එක මුරයේ—පැසවා විස නාරී ඝොරනිරයේ—.**

**මුසාවාදය**-බොරුකීමයි.

(වත්ථුනො පරිනාමඤ්ඤව විසංවාදන මානසං
වායාමතා පරිඤ්ඤුතා මුසාවාදස්ස චාතුරො)

මුසාවාදයෙහි අඞ්ග සතරෙක් වේ. එනම්:-තමා කියන වචනය අභූතවූ නැත්තාවූ එකක් බවය, එසේ නැත්තාවූ දෙය ඇත්තක් වශයෙන් කියන සිත් ඇතිබවය, ඒව කරණලද කාය වාක් ප්‍රයොගයන් අතුරෙන් එක්තරා ප්‍රයොගයක් දක්වන ව්‍යායාමය, කියනලද වචනය ශ්‍රවණයකළවුන් ඒ වචනාර්ථය දැනීමය යන මේ සතරයි.

“නෙ තතු සඟවන සි තු
කීමුන් එම සිතට න තු
ඇසුවන් දනුම් යු තු
මුසා සතරඟ මෙසේ දතයු තු”

(කාව්‍යශෙඛරය)

**මුසාවාදයෙහි ආදීනව—**

“දීනො විගන්ධ-වදනො ච ජලො අපඤ්ඤො
මූගොසදා හවති අප්පිය දස්සනො ච
පප්පොති දුක්ඛ මතු ලඤ්ච මනුස්ස භූතො
වාචං මුසා භණති යොහි අපඤ්ඤ සත්තො”

මුසාබස් බිණූ සත්ත්වතෙම සතර අපායෙහි ඉපිද අනෙක වර්ෂකෝටිසහස්‍රයෙහි පැසී එයින් මිදී මිනිස් පියක් ලද කල්හි දුගීවෙයි, තමන් නොකී නොකළ දෙය කීකළ දෙයයි අභූතයෙන් ලොකයා විසින් කියනු ලැබෙයි. ජඩවෙයි, නුවණනැති වෙයි, ගොළුවෙයි, විරූපදෙහ හෙවත් අප්‍රිය දර්ශනඇතිවෙයි, දුර්ගන්ධ මුඛ ඇතිවෙයි, මෙසේ බොහෝවූ දුකට පැමිණෙන්නේය.

“වාචනා දුක්ඛ බිභණාණාව අභූතක්ඛාණ තාළිතො
අසඤ්ඤි යො සුදුග්ගන්ධ මුඛො හොති මුසාරතො”

මුසාරතො, මෘෂාවෙහි ඇලුණු; (නරො, පුරුෂතෙම;) වාචතා දුක්ඛ, වචනදුක්ඛයෙන්; භින්නණාව, භිණ්ණාවූයේද; අභූතක්ඛාණ, අභූතව්‍යාඛ්‍යාණයෙන්; තාළිතොව, තාඩිතවූයේද; අසන්ධියොව, අසන්ධෙය්‍යවූ (නොඇඳිනියහැකි) නෙපුල් ඇතිවූයේද; සුදුග්ගන්ධමුඛො හොති, අති දුර්ගන්ධමුඛ ඇත්තේද වේ.

"මුසාවාදෙ භික්ඛවෙ ආසෙවිතො භාවිතො බහුලීකතො නිරය සංවත්තනිකො හොති, තිරච්ඡාන යොනි සංවත්තනිකො හොති, පෙත්ති විසය සංවත්තනිකො හොති, යො සබ්බලහුසො මුසාවාදස්ස විපාකො මනුස්ස භූතස්ස අභූතබ්භක්ඛාන සංවත්තනිකොහොති"

මහණෙනි, මුසාවාදය නැවත නැවත පුරුදුකරණ ලද්දේ භාවිතාකරණ ලද්දේ බොහෝසෙයින් කරණලද්දේ නරකයෙහි උපදවන්නේය, තිරිසන් යොනියෙහි උපදවන්නේය ප්‍රේතයොනියෙහි උපදවන්නේය, මෙසේ ප්‍රමාණාතික්‍රාන්ත කල්පශතසහස්‍රයක් මුළුල්ලෙහි අපා දුක්විඳ එයින්මිදී යම්කිසි හේතුවකින් මිනිස් පියක් ලදහොත් ශෙෂව තුබූ මෘෂාවාද අකුසලයාගේ විපාකයෙන් ඔහුකෙරෙහි නැති දොෂකිය නොයෙක් පරිද්දෙන් වෙහෙසන බවට පැමිණෙන්නේය.

77 සිට 82 වෙනි කව දක්වා අනාගීතවූ ප්‍රාණඝාතය අදත්තාදානය, කාමමිථ්‍යාචාරය, මෘෂාවාදය, යන මේ සතරට කර්ම ක්ලෙශයෝයයි කියනු ලැබේ,

"කම්මකිලෙසානි තෙහි සම්මෙහි සත්තාකිලිස්සන්ති තස්මා කම්මකිලෙසාති වුච්චන්ති"—කම්මකිලෙසා යනු ඒ කර්මයන් කරණකොට ගෙණ සත්වයෝ කිලුටුවෙත්ද? එහෙයින් කර්ම ක්ලෙශයෝයයි කියනු ලැබේ.

"පාණාතිපාතො බො ගහපති පුත්ත කම්මකිලෙසො, අදින්නාදානං කම්මකිලෙසො, කාමෙසුමිච්ඡාචාරො කම්මකිලෙසො, මුසාවාදො කම්මකිලෙසො, ඉමාස්ස චත්තාරො කම්මකිලෙසා පහීනා හොන්ති; ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා"—

"පාණාතිපාතො අදින්නාදානං මුසාවාදො ච වුච්චති,
පරදාරගමනං චෙව න ප්පසංසන්ති පණ්ඩිතාති."

ගෘහපති පුත්‍රය, ප්‍රාණඝාතයතෙම කර්මක්ලෙශයෙක්වෙයි, අදත්තාදානයතෙම කර්මක්ලෙශයෙක්වෙයි, කාමමිථ්‍යාචාරයතෙම කර්මක්ලෙශයෙක්වෙයි, මුසාවාදයතෙම කර්මක්ලෙශයෙක්

වෙයි, මේ චතුර්විධවූ කර්මක්ලේශයෝ ආර්ය්‍ය ශ්‍රාවකයාහට ප්‍රහීණවූවාහුයයි යන මේ වචනය භාග්‍යවතුන්වහන්සේ විසින් වදාළසේක. මෙසේ වදාරා ශෝභනගති ඇති හෙයින් සුගත නම්වූ දිව්‍ය මනුෂ්‍යයින්ට අනුශාසනා කරණ හෙයින් ශාස්තෘ නම්වූ තිලෝගුරු සම්‍යක් සම්බුද්ධ සර්වඥරාජෝත්තමයාණන් වහන්සේ විසින් නැවත තදර්ථදීපකවූ මේ ගාථාව වදාළසේක. ප්‍රාණඝාතයද, අදත්තාදානයද, කාමමිථ්‍යාචාරයද, මුසාවාදයද, යන මේ සතර කර්මක්ලේශයන් සේවනය කිරීම බුද්ධාදී පණ්ඩිතොත්තමයින් වහන්සේලා ප්‍රශංසානොකෙරත්.

(සිගාලෝවාදසූත්‍රය)

83. ප ල දෙ න  පව්පින් දෙක නොබ  ලා මේ
ප ව ස න  බස් උරසක් මා  ලා මේ
බි ඳු ව න  බස් වැඩනැති කේ  ලා මේ
ම තු ව න  දුක් නොදනෙන වේ  ලා මේ

පලදෙන, විපාක දෙසීවූ; පව්පින් දෙක, කුසලාකුසලකර්මයන්; නොබලාමේ, දර්ශනයනොකොටම; පවසන බස්, ප්‍රකාශකරන්නාවූ වචන; උරසක්මාලාමේ, උරචක්‍රමාලාවෙක්මැයි; බිඳුවන, ඔවුනොවුන් භේදකරවන්නාවූ; වැඩනැති, අනර්ථදායකවූ; බස්, වචන; කේලාමේ, (කේලාම්ය හෙවත්) පෛශුන්‍ය නම්වේ; මතුවන දුක්, (ඉන්) අනාගතයෙහි වන්නාවූ දුඃඛයන්; නොදනෙන, ජානනය නොකරන්නාවූ; වේලා මේ, මේ කාලයවේ.

**උරසක්මාලාමේ—උරචක්‍රමාලාව**—මේ වනාහි දර්ශනය කළාවූ බලවත් පව්කම් ඇත්තවුන්ටම අතිශයින් ප්‍රියමනාප එළවා පැළඳගැණීමට ආශා ඇතිකරන සුලුවූද, ඇවිලගත් ගින්නෙන් බබලන මුවහත් කරණලද තියුණු ආයුධයන්ගෙන් ගැවසී ගත්තාවූද, බොටුවෙහි ලාගත් කල්හි ගෙල කැපි කැපී භ්‍රමනය වන්නාවූද, සටහන්වශයෙන් මාලාදමයක්ට බඳු උපමා ඇති එක්තරා චක්‍ර විශෙෂයෙකි. මිත්තවින්දක නම් පුරුෂයෙකු උරචක්‍රමාලාවෙන් කැපි කැපී විනාශවූබැව් ජාතකඨකථාවේ මිත්තවින්දක ජාතකයෙන් දතහැකිවේ.

**බිඳුවන බස් වැඩනැති කේලාමේ**—

කේලාම් හෙවත් පිසුනාවාච "යාය වාචාය යස්ස හදයේ අත්තනො පිය භාවං පරස්ස ච සුඤ්ඤභාවං කරොතීති සා පිසුනාවාචා" ඔවුනොවුන්ගේ තෙපුල් ඔවුනොවුන්ට කියා මිත්‍රයන් භෙදකිරීමයි හෙවත් උනුනුන් භෙදවන තෙපුල් කීමයි.

"පරෙහිනත්තස්ස පියතතාමපි හෙදාධිප්පාය තස්ස ච
හෙදනු ලොමි කායචාචා පෙසුඤ්ඤානි පකාසිතා"

පිසුනාවාචයෙහි අඞ්ග සතරක්වේ. එනම්:-බිඳ යුතුවූ අන්‍යයාය, බිඳීම පෙරටුකොට ඇතිබවය, තමා අන්‍යයාට ප්‍රියබව පැතීමය, බිඳීමට අනුලෝම වචනයාගේ අඞ්ගය දූතීමය යන මේ සතරයි.

"වෙන් කරවන සි තින්
නොහොත් පිය බැව් කැම තින්
දනුමුත් ඔහු තැ තින්
සමගපෙහෙසුන් සිවගිතියති ත්"

(කාව්‍යශෙඛරය)

කේලාම් කීමෙහි ආදීනව—නූපන් දබර උපදවන්නාවූද, උපන් දබර දිව්ණුක රන්නාවූද, මෙම කේලාම්බස් කිණීම හේතුකොට මෙගණ සතර අපායෙහි අනේක වර්ෂ කෝටි සහස්‍රයෙහි පැසී එයින් මිදී යම්කිසි හේතුබලයකින් මිනිස් කයක් ලත්විට අනේක දුක්ඛයන්ට භාජනව කබල් ගත් අත් ඇතිව කඳුළු පෙරෙණ මුහුණින් යුක්තව සිඟමින් ඇවිදීමට පමුණුවන්නේය.

"සුසම්බද්ධාපි තස්සී' ධම්තතා භිජ්ජන්ත්‍ය කාරණා
පියසුඤ්ඤකරං යොහි පෙසුඤ්ඤං මකරී පුරා"

පුරා, පූර්වජන්මයෙහි; යො, යමෙක්; පියසුඤ්ඤකරං, ප්‍රියයන් ශූන්‍යකරණ හෙයින් හෙවත් ප්‍රියයන් ඔවුනොවුන් කෙරෙහි ප්‍රේම නැතිකරණ; පෙසුඤ්ඤං, පෛශූන්‍යය හෙවත් කේලාම; අකරී, කෙළේද; ඉධ, මේජාතියෙහි; තස්ස, ඔහුගේ; සුසම්බද්ධාපි, ඉතා බැඳීසිටියාවූද; මිත්තා, මිත්‍රයෝ; අකාරණා, නිෂ්කාරණයෙ; භිජ්ජන්ති, බිඳෙත්.

84. අ වි ස නොවන බස් කනට යවුල්ලෙ ස
සි න ස නොසින් කිය කියනොත් පිය බ ස
ප රු ස නෙපුල් බිණුවා නම් මහ දෙ ස
එ වි ස නොසසි පරලොව දුක් දී මි ස

කනට, කණියට; යවුල්ලෙස, අංගුලයන්මෙන්; (යකඩහුල් මෙන්) අවිසනොවන, විෂවත්නාවූ; බස්, වචනයන්; (නොකිය, කථනය නොකරව;) කියනොත්, කථනය කරත්හොත්; සිත සනොසින්, චිත්තසන්තොෂයෙන්; පිය බස් කිය, ප්‍රිය වචනයන්ම කථනයකර; පරුසනෙපුල්, පරුෂවචන; බිණුවාතම්, කියාතම්;

මහදෙස, (ඒ) මහාදෝෂයකි; එවිස, ඒ (පරුෂතෙපුල් බිණීම්) විෂය; පරලොව, පරලොකයෙහි; දුක්දිමිස, දුඃඛ දනයකොට විනා; නොහරියි, බැහැරනොවෙයි.

**සිත සතොසින් කිය කියනොත් පියබස—**

“මනාප මෙව භාසෙය්‍ය-නාමනාපං කුදාචනං”

මනාපං, මනවඩන වචනයක්ම; භාසෙය්‍ය, කියන්නේය; කුදාචනං, කිසිකලෙකත්; අමනාපං, මනනොවඩන වචනයක්; න, නොකියන්නේය.

“තමෙව වාචං භාසෙය්‍ය—යායත්තානං න තාපයෙ
පරෙචනවිහිංසෙය්‍ය—සාවෙ වාචා සුභාසිතා”

යම් වචනයකින් තමන්ගේ සිත දුෂ්‍යවීමෙත් නොතැවේනම් අන්‍යයාට ලජ්ජා හිංසා පීඩා නොවේනම් එබඳු වචනයක්ම කිවයුත්තේය. යහපත් වචනය නම් එය වෙයි.

**පරුස තෙපුල් බිණුවානම් මහදෙස—**

**පරුෂ වචනය**—“යාය පන අත්තානම්පි පරම්පි ඵරුසං කරෙතීති සාවාචාතෙවකණ්ණසුඛා නහදය සුඛා”—ඒක් දෙශනයන් සුකනවූ කන් කළුනොවූ හෘදයට සැපනොවූ අනුන්ට හෙළා කියන්නාවූ තෙපුලෙක්වේද? හේ ඵරුෂ වචන නම්.

(පරං බො හෙතු කාමස්ස—දුට්ඨ චිත්තස්ස ජන්තුනො
අනිට්ඨ සවණං වුත්තං—ඵරුසන්ති විජානතා)

ඵරුසාවාචයෙහි අඞ්ග තුනක්වේ, එනම්;-බිණුම් අසන් නෙක්වීමය, කිපුණු සිතය; ආක්‍රොෂ කිරීමය යන මේ තුනයි.

‘සතෙකි බිණුමස නා
සම්ගින් කිපුනු සිති නා
බිණීමද තදි නා
මෙසේ තුණගින් පරුස වද නා”

(කාව්‍යශෙඛරය)

**පරුෂ** වචනයෙහි ආදීනව—යමෙක් කණට අම්හිරිවූ රළු බස් කියානම් හෙතෙම ඒ හේතුවෙන් සතර අපායෙහි අනෙක වර්ෂ කොටි සහස්‍රයෙහි පැසී ඉන් මිදී මිනිස්පියක් ලත්විටද අපමණ දුක් විඳින්නේයි.

“දිඨ විදෙදසනියො වා’සසවනීය බරසසරො
භොතිහ කතදොසාපි ඵරුසාභි රතො පුරා”

පුරා, පූර්ව ජන්මයෙහි; එරුසැහිරතො, ඵරුෂ වචනයෙහි ඇළුණේ; ඉහ, මේජන්මයෙහි; අකතදෙසොපි, අකෘතදොෂවූයේද; (කළ වරදක් නැතිවූයේම) දිස්, දුටුදුටුවන්; විදෙසති ගොව, විද්වෙෂනීය වූයේද (නොරුස්වන ලද්දේ;) අසසවනීය, අශ්‍රවනීයවූ; (අසන්නට නොරිසිවූ) බරස්සරොවහොති, කර්කශවූ ස්වර ඇත්තේද වේ.

85. පෙ ර සි ට විසතුන් නොකිසා වැළ කී
දෙ ලෝ ව ට වැඩනැති බස් අකුසල කී
කෙ ළි ය ට වන් ඒ වැඩනැති බස කී
නි ර ය ට වැද යන රජ මාවත කී

පෙරසිට. පූර්වයෙහි පටන්; විසතුන්, ව්‍යක්තයන් විසින්; නොකියා, කථනය නොකොට; වැළකී, වැළක්කාවූ; දෙලොවට; (මෙලෝ පරලෝ) උභය ලොකයට; වැඩනැති බස්, අර්ථයක් නැති වචන (සම්ප්‍රලාප) කීම; අකුසලකී, පාපයකි; කෙළියටවන්, ක්‍රීඩා පිණිසවන්; ඒ, පූර්වොක්ත; වැඩනැති බස, අභිසිද්ධියක්නැති වචනය; කී, කථනය කෙරේනම්; නිරයට වැද යන, නරකයට ප්‍රවිෂ්ටකරන්නාවූ; රජ මාවතකී, රාජ මහා මාර්ගයක් සමාන වන්නේය.

දෙලොවට වැඩනැති බස් අකුසල කී —

නිරර්ථක තෙපුල් හෙවත් සම්ප්‍රලාප —

"යෙන සම්ඵප්පලාපෙති නිරත්ථකං සො සම්ඵප්පලාපො"

ස්වභාව ධර්මයෙන් පිටත්වූ තමහටද පරහටද වැඩනැති තෙපුල් බිණීම සම්ප්‍රලාප නම්වේ.

(නිරත්ථක කථායාහි රාගදොසාහි වඩ්ඪන්ති
තං රතස්ස අකාලෙන භාසතා සම්ඵ සඤ්ඤිතා)

සම්ප්‍රලාපයෙහි අඞ්ග දෙකක්වේ. එනම්:-දෙලොවට වැඩ නැති කථාවීමය, එබඳු නිරර්ථක කථාකිරීමය යන මේ දෙකය.

"රාමා යන බර ත
ඇතුළුව දෙඩුම් මුල් යු ත
කීමුත් බස් නිර ත
යුතුව දෙසහින් දතුව නියව ත"

(කාව්‍යශෙඛරය)

**සම්ඵප්‍රලාපයෙහි ආදීනව**—අවිසූත්‍යවූ නිස්බස් බණිනනැනැත්තේ මරණින් මතු අපාගතව අනේක වර්ෂ කෝටිසහස්‍රයෙහි ඝොරවූ කටුක දුක් විඳින්නේවේ. තවද අපායෙන් මිදී යම් හෙයකින් මිනිස් පියක් ලදහොත් අසම්බන්ධවූ (නොගැළපෙන්නාවූ) ශරීරාවයව ඇත්තෙක් හා සැලකියයුතු වචන නැත්තෙක්ද වෙයි.

"අසම්බන්ධඞ්ග පච්චඞ්ගා අනාදෙය්‍ය වචො'පිච
සම්ඵප්පලාපං යො පුබ්බෙ අවදී අප්පයොජනං"

යො, යමෙක්; පුබ්බෙ, පූර්වජාතියෙහි; අප්පයොජනං, නිෂ්ප්‍රයෝජනවූ; සම්ඵප්පලාපං, සම්ඵප්‍රලාපය; අවදී, කීද; සො, හෙතෙම; අසම්බන්ධ, නොයෙදුනු; අඞ්ග පච්චඞ්ගා, අඞ්ග ප්‍රත්‍යඞ්ග ඇත්තේද; අනාදෙය්‍ය වචොඅපිච, අනුන් විසින් නොගිවිස්සයුතු තෙපුල් ඇත්තෙක්ද වේ.

**86.** අන් සතු සැපතක් දැක දළ ලොබි නේ
උන් ට නොවී මට වේවයි සිති නේ
මන් කළ ඒ සිත අවගත් පවි නේ
උන් මතු නිරයේ දුක්මයි විඳි නේ

අන්සතු සැපතක්, අනුන් සන්තක සම්පත්තියක්; දැක, දර්ශනය කොට; දළලොබිනේ, දැඩි ලොභයෙන්; උන්ටනොවී, ඔවුන්ට නොව; මට වේවයි, (ඒ සම්පත්තිය) මාහටම අයිතිවේවයි; සිතිනේ මන්කළ, චිත්තයෙන් චින්තනයකළේවීනම්; සිතහංගත්, චිත්තයෙහි හටගත්තාවූ; ඒ පව්නේ, ඒ පාපකර්මයෙන්; උන්, ඔවුන්; (එබඳු දැඩි ලොභ චේතනා ඇතිකරගත් තැනැත්තෝ); මතු, අනාගතයෙහි; නිරයේ, නරකයෙහි; දුක් විඳිනේමැයි, දුඃඛ වින්දනය කරන්නේ මැයි.

**අන්සතු සැපතක් දැක දළලොබිනේ—උන්ටනොවී මටවේවයි සිතිනේ—**

**අභිධ්‍යාව නොහොත් දැඩිලොභය**—"අභිජ්ඣායතීති අභිජ්ඣා පර භණ්ඩාභි මුඛී හුත්වා තන්නින්නතාය පවත්තතීති අත්ථො"

පරසන්තක සම්පත් දැක එය තමහට ඇතුළත්කොට ගන්නේ කෙසේදැයි හෝයි ලොභවශයෙන් සිතීම අභිධ්‍යා නම්වේ.

(අභිජ්ඣාය පවත්තනාකාරා—පරෙපකරණාදිසු
ලොභාධිමුත්තතො සාහි—අභිජ්ඣාති පකාසිතා)

අභිධ්‍යාවෙහි අඞ්ගදෙකක්වේ. එනම්:-අනුන් අයිති වස්තුවක් වීමය, එය තමාහට ඇත්නම් යෙහෙකැයි ගන්නා විෂම ලෝභ චිත්තයද වේ.

"බඩුවෙක් අන් අයි ති
තමහට නැමුම්කර රැ ති
මෙසේ දෙයගින් යු ති
දනුව දලලොබ අත්සැපත ඇති"

(කාව්‍යශෙඛරය)

**අභිධ්‍යාවෙහි ආදීනව**—අන්සතු වස්තුවෙහි දූඩි ලෝභ චේතනා ඇතිකරගත් පුද්ගලතෙම මරණින්මතු අපාගතව නොයෙක් වර්ෂ කෝටි සහස්‍රයෙහි ඝොරවූ කටුක දුක් අනුභව කරණු පමණක් නොව යම් හෙයකින් මිනිස් පියක් ලදහොත් තමා කරණ කටයුතු ඉෂ්ටනොවන්නෙක්ද වෙයි.

"යං යම්විජ්ජති සාධෙතුං නතං තස්සහ ඉජ්ඣති
අඤ්ඤස්සයෙන'ඤ්ඤං අභෙජ්ජු යො භිජ්ඣමකරිපුර"

පුරා, පූර්වයෙහි; යො, යමෙක්; අඤ්ඤස්සයෙන, අන්‍යායක් හෙවත් න්‍යායඉක්ම; අඤ්ඤඅභෙජ්ජු, අනුන් පිළිබඳ වස්තූන්හි; අභිජ්ඣං, අභිධ්‍යාව හෙවත් අධික ලෝභය; අකරි, කෙළේද; සො, හෙතෙමේ; ඉධ, මේ ලෝකයෙහි; යං යං, යම් යම් කාර්‍ය්‍යයක්; සාධෙතුං, සාදන්නට; ඉච්ඡති, කැමතිවේද; තං තස්ස, ඒ ඔහුට; න ඉජ්ඣති, සිඩ නොවේ.

**87.** **පි සි නූ දනහට කරවා දේ ෂා**
**න සි වසී යන සිත වැ පා දේ ෂා**
**බ සි නා නිරයට ඒ පා දේ ෂා**
**කි සි කලෙකත් ඒ ඒ පා දේ ෂා**

පිසිනූ දනහට, රුචිනොවන්නාවූ ජනයාහට (නුරුස්නා අයහට); වාදේෂා කර, ක්‍රොධකොට; (මෙෂකොට) නසිවසියන සිත, (ඔවුන්) නැසේවයි යන චින්තනය; වැපාදේෂා, ව්‍යාපාදනම්වන් තේය; ඒ, ඒ (ව්‍යාපාද අකුශලකර්මය;) නිරයට බසිනා, නරකයෙහි අවතීර්ණවන්නාවූ; පාදේෂා, පාදයකි; ඒ දේශා, එවැනි චින්තනයක්; කිසිකලෙකත්, කවරකාලයකවත්; ඒපා, නොකටයුතුයි.

**පිසිනූ දනහට කරවා දේෂා—නසිවසී යන සිත වැපාදේෂා—**

**ව්‍යාපාදය**—"හිතසුඛං ව්‍යාපාදයතීති ව්‍යාපාදෙ සො පරවිනාසාය මනොප දොසලක්ඛණො"

සමගියන් දුක හිනාවෙත්වයි සිතන සිතද, ප්‍රියයන් දුක සතුරු වෙත්වයි ඔවුනොවුන් හා මිදෙත්වයි යනාදීන් සිහින් පතා ඔවුනොවුන්ගේ මිත්‍ර ධර්ම නොඉවසීමද ආදී අනුන් නැසීම පිණිස හිතෙහි හටගන්නා ක්‍රොධ චේතනාව ව්‍යාපාද නම්වේ.

(යා සමප දුට්ඨ චිත්තස්ස — අනත්ථා හිත කාමතා
බ්‍යාපාදෙති සම්බොධෙනා — අබ්‍යාපජෙනති සබ්බථා)

ව්‍යාපාදයෙහි අඞ්ග දෙකක්වේ. එනම්:-අන් සත්ත්වයෙක් වීමය, ඔහු නසම් යන ක්‍රොධ සිතය යන මේ දෙකවේ.

"අන් සතෙකි යම්කි සි
කෝකර ඔහු නසන රි සි
මෙසේ දෙයගින් නි සි
වනය සිතිවිලි දනුව නතුලෙසි"
(කාව්‍යශෙඛරය)

**ව්‍යාපාදයෙහි ආදීනව** — ව්‍යාපාද සඞ්ඛ්‍යාතවෛරයෙන් දූෂිත සිත් ඇත්තේ බහුලවශයෙන් තිරශ්චීන යොනියෙහි උපදින්නේවෙයි. යම්විටක මිනිස්පියක් ලදහොත්විරූප විෂමරෝගයෙන් පිඩිතවූ දූෂිතයකලවුන්ට අප්‍රියකරවූ අයෙක් වන්නේය.

"විරූපො හොති අච්චන්තං විසමා බාධ පීළිතො
අපපි යොච මනුස්සානං යො බ්‍යාපාදරතො පුරා"

යො, යමෙක්; පුරා, පූර්වජන්මයෙහි; බ්‍යාපාදරතො, ව්‍යාපාදයෙහි ඇළුනේද; සො, හෙතෙමේ; අච්චන්තං, අතිශයින්; විරූපො, විරූපවූයේද; විසමාබාධ, විෂමවූ රොගයෙන්; පීළිතො, පිඩිතවූයේද; මනුස්සානං, මනුෂ්‍යයන්ට; අපපියොච හොති, අප්‍රියවූයේද වේ.

88. නිවණට මග මෙයයි මුනි නි යම්
දහමට වෙන්වූ දෙසැටක් සම යම්
සම්මො ට ගත් ඔහා බැඳි මිසදිටු යම්
සසරට හිමුවටමයි ඒ සම යම්

නිවණට මග, නිර්වාණයට මාර්ගය; මෙයයි, මෙසේයයි; මුනි, සර්වඥයන්වහන්සේ විසින්; නි, දෙශනාකරණ ලද්දාවූ; යම් දහමට, යම් ධර්මයකට; වෙන්වූ, විරුද්ධවූ; (වෙනස්වූ) දෙසැටක් සමයම්,

(ශාශ්වතවාදාදී) බාහ්‍යදෘෂ්ටිදෘෂ්ටීන්; සරිකොට, සත්‍යකොට; (පැබැලෙන) ගත්සිත, ග්‍රහණයකළාවූ විඝාතය; මිසදිටුනම්වෙයි, මිථ්‍යාදෘෂ්ටිනම් වන්නේය; ඒ සමයම්, ඒ දෙසැටි දෘෂ්ටිය; සඳුරාව, සංසාරයට; බිජුවටමයි, බිජුවටක්මය.

**සමයම්** —

"සමයො සමවායෙච සමූහෙ කාරණෙ ඛණෙ
පටිවෙධෙසියාකාලෙ පහාණෙ ලාභ දිට්ඨිසු"

යනුහෙයින් සමවායෙහිද, ක්ෂණයෙහිද, සමූහයෙහිද, කාරණයෙහිද, දෘෂ්ටියෙහිද, ලාභයෙහිද, ප්‍රහාණයෙහිද, ප්‍රතිවෙධයෙහි දැයි මෙසේ අනෙකාර්ථයෙහි වැටෙන්නාවූ සමය ශබ්දය මෙතැන්හි දෘෂ්ටියෙහි වැටේ.

**දෙසැටක් සමයම්** —පරසමයාදි ඒ ඒ ශාස්තෘන් විසින් උපදවන ලද බාහ්‍යදෘෂ්ටිප්‍රභෙදවූ දෘෂ්ටීහුයෝයි. මේ භෙදවශයෙන් ශාශ්වත උච්ඡේදයයි ද්විවිධවේ. ශාශ්වත පක්ෂයෙහි බෙදීම් පස්පණසක්ද උච්ඡේද පක්ෂයෙහි බෙදීම් සතක්දවේ.

**ශාශ්වතවාද** :—

කෙවල ශාශ්වත වාද සතරය, එකච්චශාශ්වත වාද සතරය, අන්තානන්තික වාද සතරය, අමරාවික්ඛෙපික වාද සතරය, අධිච්චසමුප්පන්නවාද දෙකය, සඤ්ඤීවාද සොළසය, අසඤ්ඤී වාද අටය, නෙවසඤ්ඤී නාසඤ්ඤී වාද අටය, දෘෂ්ටධර්ම නිර්වාණ වාද පසය යන මොව්හු ශාශ්වත දෘෂ්ටියේ ප්‍රභෙදයෝයි.

**කෙවලශාශ්වත දෘෂ්ටි නම්**:-සියල්ල සදාකාලිකබවක් සිතාගත් දෘෂ්ටියෝයි.

**එකච්චශාශ්වත දෘෂ්ටි නම්**;-සමහරෙක් සදාකාලිකය සමහරෙක් සදාකාලික නොවේයයි ගණු ලබන දෘෂ්ටියෝයි.

**අන්තානන්තික දෘෂ්ටි නම්**:-ලොකය අන්තවත්ය කියා හෝ අනන්තවත්ය කියා හෝ අන්තානන්තවත්ය කියා හෝ අන්තවත් නුවූයේද අනන්තවූත් නුවූයේද වේයයි කියාහෝ මේ සතරාකාරය අරභයා ග්‍රහණය කරණ දෘෂ්ටියෝයි.

**අමරාවික්ෂෙප වාද නම්**:-පයතිනා රහිත දෘෂ්ටිගතිකයාගේ දෘෂ්ටියයි. ග්‍රහණයට නොහැකි අමරා (ආඳ) නම් මත්ස්‍ය ජාතිය මෙන් එක් ලබ්ධියකත් නොපිහිටා මේ දෘෂ්ටිගතිකයා ධාවනය කරණ හෙයින් මීට අමරාවික්ෂෙපියයි කියනලදී.

**අධිච්චසමුප්පන්න වාද නම්**:-සියලුම දෙය නිෂ්කාරණොත්පත්තිකයයි (කාරණයක් නැති උත්පත්ති ඇත්තේයයි) ගන්නාලද දෘෂ්ටියයි.

**සඤ්ඤී වාද නම්:**-සංඥව හෙවත් සිත ඇත්තේයයි කියා ග්‍රහණය කරණ දෘෂ්ටියෝයි.

**අසඤ්ඤී වාද නම්:**-සංඥව හෙවත් සිත නැත්තේයයි ග්‍රහණය කරණ දෘෂ්ටියෝයි.

**නෙවසඤ්ඤීනාසඤ්ඤී වාද නම්:**-සංඥවමවූ ව්‍යක්ත සංඥතොමෝ කෘත්‍යකරණයෙහි අසමර්ථ බැවින් උපෙක්ෂාදකයෙහි තෙජෝ ධාතුවමෙන් නෙවසඤ්ඤීය සියුම් වශයෙන් විද්‍යමානවන බැවින් සංඥව නොවන්නේනුයි නෙවසඤ්ඤ නාසඤ්ඤ නම්වූ දෘෂ්ටියෝයි.

**දෘෂ්ටධර්ම නිර්වාණවාද නම්**—ආත්මය මෙම අත්බැව්හි උතුම් නිවණ යයි කියමින් නිර්වාණයට ඉඳුරාම විරුද්ධ ධර්මයක් නිර්වාණයයි ප්‍රකාශකරන්නාහුගේ මිථ්‍යා දර්ශනයන්.

**උච්ඡේදවාද නම්**—සත්ත්වයා මරණින් මතු නූපදීයයි ගන්නා මිථ්‍යා දෘෂ්ටියෝයි. ලාභීය අලාභීය යන දෙදෙනෙක් උච්ඡේද දෘෂ්ටි ගනිති.

ඔවුන් අතුරෙන් ලාභිතැනැත්තේ දිව්‍යසින් රහතුන්ගේ ච්‍යුතයදැක උත්පත්තිය නොදක්නේද, යමෙක් ච්‍යුති මාත්‍රය දක්නට සමර්ථද උත්පත්තිය දක්නට අසමර්ථද හෙතෙමේද උච්ඡේද දෘෂ්ටි ගන්නේය.

අලාභී තෙමේ පරලෝ දන්නෝ කවුරුදයි කියා කාම සැපතෙහි ගිජු බැවින් හෝ යම් රුකෙකින් විලික්සිහුනු පත් (පැසී ඉදී වැටුණු කොළ) නැවත හටනොගණිත්ද එපරිද්දෙන්ම මලාවූ සත්ත්වයෝත් නැවත නූපදිති යන මේ ආදි තර්කයෙන් හෝ උච්ඡේද දෘෂ්ටිය ගන්නේය. ඇතැම් දෘෂ්ටිගතිකයෝ විද්‍යමාන සත්ත්වයාගේ උච්ඡේද විනාශ භාවය පණවති. අනිකෙක් මේ ආත්මය කාමාවචර සදිව්‍යලොකයෙහි කබලිංකාහාර භක්ෂණයකොට අන්‍යාත්මයක්ව දිව්‍යාත්මභාවයෙන් මනාකොට සිඳේයයි දෘෂ්ටි ගනී. අන් සමහරෙක් මේ ආත්මය රූපභවයට පැමිණ මනොමයව සර්වාංගප්‍රත්‍යංග සම්පන්නව (සම්පූර්ණ ඉන්ද්‍රිය යන් ඇතුව) අන්‍යාත්මයක්ව රූප භවයෙන් මනාකොට සිඳේයයි දෘෂ්ටි ගනී. අන් සමහරෙක් මේ ආත්මය ආකාශානඤ්චායතන තලයට පැමිණ අන්‍යාත්මයක්ව මනාකොට සිඳේයයි දෘෂ්ටි ගනී. ඇතැම් අයෙක් මේ ආත්මය විඤ්ඤාණඤ්චායතන තලයට පැමිණ අන්‍යාත්මයක්ව මනාකොට සිඳේයයි දෘෂ්ටිගනී. තවත් අයෙක් මේ ආත්මය ආකිඤ්චඤ්ඤායතන තලයට පැමිණ අන්‍යාත්මයක්ව මනාකොට සිඳේයයි දෘෂ්ටි ගනී. තවත්

සමහරෙක් මේ ආත්මය නෙවසඤ්ඤානාසඤ්ඤායතන තලයට පැමිණ මනාකොට සිඳේයයි දෘෂ්ටි ගනී. මේ නයින් උච්ඡේද වාදය සප්තවිධවේ.

**දෙසැටක් සමසම්—සරිකොට ගත්සිත මිසදිටුසම් වෙයි:—**

**මිථ්‍යාදෘෂ්ටිය—**

“මිච්ඡා පාපිකා විඤ්ඤූ ගරහිතා දිට්ඨීති මිච්ඡාදිට්ඨි”

දන ශීලාදී පුණ්‍යයෙන් සුගති සිඬනොවෙයි, ප්‍රාණඝාතාදි පාපයෙන් අපාය සිඬනොවෙයි, යට උපන් ජනවයකුත් නැත, මතු උපදිනා ජනවයකුත් නැත, සියල්ලම නිත්‍යය යනාදීන් ගන්නා මිථ්‍යාවූ ලාමකවූ පණ්ඩිතයන් විසින් නිඳුකරණ ලද්දාවූ, විපරීත දෘෂ්ටිතොමෝ මිථ්‍යාදෘෂ්ටී නම්වේ.

“අනනතා හි නිවෙ සො ලො—නාත්ථිදින්නනාදි ආදිකා
මිච්ඡාදිට්ඨිති අක්ඛාතො—සම්මාදිට්ඨි විපක්ඛ කො”

මිථ්‍යාදෘෂ්ටියෙහි අඩග දෙකක්වේ. එනම්;-වරදවා කල්පනා කරණ චෙතනාවය, ඒ සත්‍යලෙස වැටහීමය යන මේ දෙකය.

“වරදවා සිතුමු ත්
එලෙසින්ම වැටහීමු ත්
මිසදිටු දෙයගයු ත්
වේය නැතහේ අකිරියෙන්ගත්”
(කාව්‍යශෙඛරය)

**මිථ්‍යාදෘෂ්ටියෙහි ආදීනව**—මිථ්‍යාදෘෂ්ටීයයි කියනලද විපරීතග්‍රහණය නිවණට අකුලකි, අපායට මහාපථයකි, ඒ වනාහි සංසාරයෙහි පැවැත්මට මුල්වන්නේය. මිථ්‍යාදෘෂ්ටියෙන් සමන්විත සත්ත්‍වයාට භවයෙන් මිදීමෙක් නැත. උපන් උපන් තන්හි අධමවූ අපිරිසිදු වස්තුවෙහි ඇළුනාවූ නුවණමඳවූ එහෙයින්ම ජඩවූ අසාධ්‍ය රොග ඇතිවූ නපුරු දෘෂ්ටි ඇත්තෙක්වේ.

“නිහීණා සුචී භොගෙසු රතො මන්දො ජළොපිච
දුක්ඛරොගී කුදිට්ඨිච මිච්ඡාදිට්ඨි සියා නරො”

මිච්ඡාදිට්ඨි, මිථ්‍යාදෘෂ්ටිකවූ; නරො, නරතෙම; (උපන් උපන් තෙන) නිහීණා, අධමවූ; අසුචි, නොසකස්වූ; භොගෙසු, භොගයන්හි; රතො, ඇළුනේද; මන්දො, නුවණමඳවූයේද; ජළො අපිච, (එහෙයින්ම) ජඩවූයේද; දුක්ඛරොගී, දුෂ්ටවූ (අසාධ්‍යවූ) රෝග ඇත්තේද; කුදිට්ඨිච, කුත්සිතවූ දෘෂ්ටි ඇත්තේද; සියා, වන්නේයි.

සසරට තියුවමනී ඒ සමයම් —

"කාම යොගෙන සංයුත්තා — භවයොගෙන චූභයං
දිට්ඨියොගෙන සංයුත්තා — අවිජ්ජාය පුරක්ඛතා
සත්තා ගච්ඡන්ති සංසාරං — ජාති මරණ ගාමිනො"

කාමයොගෙන, (රූපාදී පඤ්ච කාමගුණික රාගයයි කියන ලද) කාමයොගයෙන්ද; භවයොගෙන, (රූපාරූප භවයන්හි ඡන්ද රාගයයි කියනලද) භවයොගයෙන්ද; නොහොත් ශාශ්වත දෘෂ්ටි සහගත රාගයෙන්ද යන; උභයං, යෝගද්වයෙන්; සංයුත්තා, යුක්තාවූ; දිට්ඨියොගෙන, දෙසැට දෘෂ්ටියයි කියනලද දෘෂ්ටි යොගයෙන්; සංයුත්තා, යුක්තාවූ; අවිජ්ජාය, (චතුස්සත්‍යයන්හි නොදැනීමයයි කියනලද) අවිද්‍යාව විසින්; පුරක්ඛතා, පිරිවරණලද්දාවූ; ජාති මරණ ගාමිනො, ජාතියට හා මරණයට යන්නාවූ; සත්තා, සත්ත්වයෝ; සංසාරං, සසරට; ගච්ඡන්ති, යෙත්.

(අඞ්ගුත්තරනිකාය)

89. න ට  සිල් මිසදිටු ගත් අය කැම  ති
අ ට  ගත් කප් ගිනිකඳ මැද පැසෙ  ති
අ ට  මහ නරකය පැසුනත් නොමැ  ති
පි ට  සක්වල එක් පෙදෙසක පැසෙ  ති

නටසිල්, නෂ්ටසීලීවූ; කැමති, කැමැත්තෙත්; මිසදිටුගත් අය, මිථ්‍යාදෘෂ්ටිකවූ පුද්ගලයෝ; අටගත්, හටගත්තාවූ; කප්ගිනිකඳ මැද, කල්පාග්නිස්කන්ධ මධ්‍යයෙහි; පැසෙති, පච්නවෙති (පැසෙත්); අටමහ නරකය, අෂ්ටමහා නරකයෙහි; පැසුනත්, පැසුණේවිනමුත්; නොමැති, නොසෑහී; පිටසක්වල, බාහිර චක්‍රවාලයෙක්හි; එක් පෙදෙසක, එක් ප්‍රදෙශයක; පැසෙති, පැසෙත්.

90. නො සෙ කී  රසබිම නිඹබිජුවට ල  ත්
එ මැ කී  සිව්නෙස තිත්තව පලග  ත්
මෙ ම කී  මිසදිටු අදහස් ඇති ස  ත්
කා ල කී  දෙය අකුසලම්ස පින් නැ  ත

නොයෙකී, අනෙකවිධවූ; රසබිම, රසවත් භූමියෙහි; නිඹබිජුවට, කොසඹ බිජුවටක්; ලත, රොපනයකළ කල්හි; එමැකී, ඒ රස ගුණයමැකී; පලගත, (එහි) හටගත්තාවූ ඵලය; තිත්තව සිටිනෙය, තික්තාරසව පවත්නේය; මෙමකී, මෙහි යට දැක්වූ; මිසදිටු අදහස් ඇති, මිථ්‍යාදෘෂ්ටි අධ්‍යාසයන් ඇත්තාවූ; සත, සත්ත්වයන් විසින්; කළ, කරණලද්දාවූද; කී, කියනලද්දාවූද; දෙය, දේවල්; අකුසල්මිස, අකුසලයක්විනා; පින් නැත; පුණ්‍යයක් නැත්තේයි.

91\. මේ ද ස අකුසලි ඉනෙකක් කළහො ත්
උප දෙ ස කින් බසකින් කරවුවො ත්
එ වි ග ස එක් අදහස සිත සිතුවො ත්
නොවලස මොහු හැමදෙන නිරයට යෙ ත්

මේ දස අකුසලි, මේ කියනලද්දේ දස අකුසලයයි; ඉනෙකක් කළහොත්, එයින් එකක්වත් කළේවීනම්; උපදෙසකින් බසකින්; උපදේශයකින් හෝ වචනයකින්; කරවුවොත්, (අනුන්ලවා) කර වූයේවීනම්; එවිගස, ඒ ක්‍ෂණයෙහි; සිතු, චිත්තයෙහි; එක් අදහස, එකම අධ්‍යාසයක්; සිතුවොත්, චින්තනයකළේවීනම්; මොහු හැම දෙන, (අකුසල කළාවූද, කරවූද, ඊට සතුටුවූද) මේ සියලු අය; නොවලස, අනලස්ව; නිරයට, නරකයට; යෙත්, පැමිණෙත්.

**මේ දස අකුසලි ඉනෙකක් කළහොත්...... නිරයටයෙත් —**

| | |
|---|---|
| "මේ අකුසල් ද ස ය | නරක තිරිසන් ව න් |
| බසින් හෝ උපදේ ස ය | පේත සුරකාය සිවු ව න් |
| එකක්කළෙ කෙළෙ ස ය | එහිපිද දරුණු ව න |
| කෙරෙව්වත් විය මගත් දෙ ස ය | මගත් දුක්දෙයි දනුව බිය ව න" |

(කව්දීපනිය)

92\. කර ද ර දස අකුසලයෙන් නොමි දී
වැර සැ ර පැවොත් මෙමිනිස් ලොව දී
මේර ගි ර මුදුනෙන් හුණුමෙන් නොරැ දී
ප ර තෙර නැති දුක් සයුරේ කිමි දී

කරදර, කරදරවූ; දස අකුසල්යෙන්, අකුසල් දශයෙන්; නොමිදී, මුක්තනොව; මෙමිනිස් ලොවදී; මේ මනුෂ්‍යලොකයෙහිදී; වැරසැර, වීරසාරය; පැවොත්, දක්වූවහොත්; මෙරගිරමුදුනෙන්, මේරුපර්වත මස්තකයෙන්; නොරැඳී, රැඳීමක්නොව; හුණුමෙන්, පතිතවූවාක්මෙන්; පරතෙර නැති, පර්‍ය්‍යන්තයක් නැත්තාවූ; දුක් සයුරේ, දුඃඛ සාගරයෙහි; කිමිදී, නිමග්නවන්නේය.

**මෙරගිරමුදුනෙන් හුණුමෙන් නොරැඳී—පරතෙර නැති දුක් සයුරේ කිමිදී —**

"සුදුල්ලභං බුබ්බුල දුබ්බලං ඉමං
සරීර මෙවං විධ පුඤ්ඤ සාධනං
අපුඤ්ඤ කම්මෙසු පයොජයං ජනො
සිනෙරු මුද්ධා පතිතොව සොචිතො"

සුදුලලහං, අතිශයින්මදුලීහවූ; බුබ්බුලදුබ්බලං, දියබුබුලක්සේ දුර්වලවූ; එවං විධ, මෙබඳුවූ; පුඤ්ඤ සාධකං, පුණ්‍යසාධකවූ; ඉමං සරීරං, මේ ශරීරය; අපුඤ්ඤ කම්මෙසු, පාපකර්මයන්හි; පයොජයං ජනො, යොදන ජනතෙමේ; සිනෙරුමුද්ධා පතිතො ඉව, මෙරගල් මුදුනෙන් බිම හුනුවක්මෙන්; සොචියො, ශෝක කටයුතුවෙයි.

(සඞ්ඝම්මොපායනය)

93. බු දු ව න් මෙතෙකැයි නොකිහැකි පිරිසි ද
බ ල ව ත් මහදුක් විඳුවන හැමස ද
සි තු ව න් බියවන අටමහ නිරය ද
ඔ ස ප ත් සහ එක්සිය සතිසෙක් ව ද

බුදුවණ්, බුඩත්වයට පැමිණවත්; පිරිසිඳ, පරිච්ඡේදකොට; (කෙළවරකොට) ; මෙතෙකැයි, මේ ප්‍රමාණයයි; නොකිහැකි, කිව නොහැක්කාවූ; බලවත්, දුඃතරවූ; මහදුක්, මහාදුඃඛයන්; හැමසඳ, හැමකල්හි; විඳුවන, විඳිනය කරවන්නාවූ; සිතුවන්, චින්තනයකළ කල්හි පවා; බියවන, භයවන්නාවූ; අටමහ නිරයද, අෂ්ටමහා නරකයද; ඔසුපත්සහ, ඕසුපත් නරකයන්හා සමග; එක්සියසතිසෙක්වද, එකසිය තිස්හයක් වද.

අටමහ නිරය—

"සංජීවඃ කාල සූත්‍රඤ්ච—සඞ්ඝාතො රෞරවස්තථා
මහාරෞරව තාපඤ්ච—ප්‍රතාපාවීචි නාමකා"

1 සඤ්ජීවය, 2 කාලසූත්‍රය, 3 සඞ්ඝාතය, 4 රෞරවය, 5 මහා රෞරවය, 6 තාපය, 7 ප්‍රතාපය, 8 අවීචිය යන මේයි.

1 සඤ්ජීවය—යමපලුන් විසින් ප්‍රජ්වලිතවූ නානායුධයෙන් කඩකඩ කොට සිඳනාලද සත්වයන් පුනපුනා දිවි ඇතිවන නරකය සඤ්ජීවනම්වේ. එහි ආයුෂ මනුෂ්‍යගණනින් අවුරුදු එක්ලක්ෂ ෂට්නහුත දෙදහස්කෝටියක් ( 1620000000000 ) වන්නේය.

2 කාලසූත්‍රය—යමපලුන් විසින් ප්‍රජ්වලිතවූ විවිධායුධයෙන් මහ හඬින් හඬා දිවගොස් නිරිසතුන් දිලියෙන යපොළොවැ පැහැර හෙළාපියා සූත්‍රාගතකොට ප්‍රජ්වලිත පරශුවින් හඬව හඬවා අෂ්ටාංශ ෂොඩශාංශකොට සස්නා නරකය කාලසූත්‍ර නම්වේ. එහි ආයුෂ මිනුෂ්‍ය ගණනින් අවුරුදු දෙළොස්ලක්ෂ නවනහුත ෂට්සහස්‍ර කෝටියක් (12960000000000) වන්නේය.

**3 සංඝාතය**— අයෝමය පර්වතයෙන් සතුන් සුන්සුන්කොට මිරිකන නරකය සංඝාතනම්වේ. ඒ කෙසේදයත්? ඒ නරකයෙහි සත්වයෝ නවයොදුන් බොල්දිලියෙන යපොළොවැ කටීප්‍රදේශය දක්වා ගැලී නිශ්චලවැ සිටිති. එකල්හි පූර්වදිශාභාගයෙන් ප්‍රජ්වලිත අයඃ පර්වතයෙක් උත්ථිතවැ අසනි ඝොෂයක් සෙයින් ගර්ජනා කෙරෙමින් අවුදු ඒ සත්වයන් සියුම්කොට වටනතල සෙයින් සුන්සුන් කෙරෙමින් ගොස් පශ්චිම දිශාභාගයෙහි සිටී. පශ්චිම දිශාභාගයෙනුදු, උත්තර දිශාභාගයෙනුදු, දක්ෂිණ දිශාභාගයෙනුදු උත්ථිත පර්වතයෝ එසෙයින්ම මිරිකමින් යෙති. දෙදිශායෙන් දෙපර්වතයෙක් අවුදු සතුන් උක්දඬුකලඹක් සෙයින් මිරිකාඹය. එයින් ඒ නරකය සංඝාත නම්වී. එහි ආයුෂ මනුෂ්‍ය ගණනින් අවුරුදු එක්ප්‍රකෝටි තෙලක්ෂ ෂට්නහුත අටදහස් කෝටියක් ( 10368000000000 ) වන්නේය.

**4 රෞරවය**—නවමාරයෙන් වැද සකල ශරීරයහුයන ක්ෂාර ධූමයෙන් ගුගුරා පස්නා සතුන් ඇති නරකය රෞරව නම්වේ. එහි ආයුෂ මනුෂ්‍ය ගණනින් අවුරුදු අෂ්ටප්‍රකෝටි එකුන් තිස් ලක්ෂ සිව් නහුත සිව් දහස් කෝටියක් ( 82944000000000 ) වන්නේය.

**5 මහාරෞරවය**—රක්ත ලෝහිත ජ්වාලාවයන් පරිපූර්ණවූ බලවත් දුඃඛයෙන් අභිභූත සත්වයන් ඇති නරකය මහාරෞරව නම්වේ, එහි ආයුෂ මනුෂ්‍ය ගණනින් අවුරුදු ෂට්ශෂ්ටිප්‍රකෝටි පන්තිස් ලක්ෂ පස් නහුත දෙදහස් කෝටියක් ( 663552000000000 ) වන්නේය.

**6 තාපය**—යමපලුන් විසින් දිලියෙන යපොළොවැ දිලියෙනය හුල්හී හිඳුවනලද සත්වයන් දිලිහි දිලිහි නිශ්චලවැ හිඳ පස්නා නරකය තාප නම්වේ. එහි ආයුෂ මනුෂ්‍ය ගණනින් අවුරුදු පන්සිය තිස්ප්‍රකෝටි සුවාසූලක්ෂ එක් නහුත සදහස්කෝටියක් (5308416000000000) වන්නේය.

**7 ප්‍රතාපය**—තාප නරකයට කී සෙයින් ප්‍රකර්ෂයෙන් තවනලද නරකය ප්‍රතාප නම්වේ. ඒ කෙසේදයත්? භෛරව රූප ඇති රාක්ෂසයෝ භයානක නාදයෙන් හඬා ප්‍රජ්වලිත ආයුධයෙන් පැහැරැ සත්වයන් ආදීප්ත අයඃ පර්වතයට නගති. ඔවුන් පර්වත මස්තකයෙහි සිටිකල කර්මජවූ ක්ෂාර වාත හමයි. එසත්හු එහි නොසිටියහි ඌර්ධ්වපාදවැ අධශ්ශිරස්වැ හෙති. එකල්හි දිලියෙන

යපොලොවින් තාලස්කන්ධ ප්‍රමාණ අයශ්ශූල නැගෙයි. සත්ත්වයෝ එහි ඕදනකයෙන්හි විනිවිධ ශරීරවැ පස්නී. ඒ යහුලුදු දිලියෙයි, සත්ත්වයෝද දිලියෙයි, යපොද්‍රෝවද දිලියෙයි, මෙසේ ප්‍රකම්පයෙන් තවන්නෙන් ඒ නරකය ප්‍රතාපනම්වේ. එහි ආයුෂ අනන්තඃ කල්පයෙන් ඉදකෙන් කොටසකි.

8 **අවිචිය**—ජ්වාලායෙනුදු, සත්ත්වයන් විසිනුදු, දුක්ඛයෙනුදු වීචි නැති නරකය අවීචි නම්වේ. වීචිශබ්දය අන්තරපර්යායකි. එහි ජ්වාලායෙන් අතුරු නැති පරිදි කිසේයයත්? පූර්වභිත්තියෙන් ජ්වාලා උපනිනවැ සකල නරක මණ්ඩලය පුරමින් සියක් යොදුන් තැන් ගොස් පශ්චිම භිත්තීය විනිවිද ගොස් පිටත සියක් යොදුන් තැනැපැතිරසිටී. තුබූපස්දිසායෙහිදු එසේමය. මෙසේ ෂට්විධ ජ්වාලායෙහු නිරන්තරවන බැවින් ඒ නරකය අවීචි නම්වේ.

සත්ත්වයන් විසින් අතුරුනැති පරිදි කිසේයයත්? ඒ නරකාභ්‍යන්තරයෙහි සියක් යොදුන් තැන් නළෙක පිරූ මල් තුඹු පිටි සෙයින් සතුන් විසින් නිරන්තරයැ, මෙතන සත්ත්වයෝ ඇති. මෙතන සත්ත්වයෝ නැති කියන්නට නිසි තැනක් නැති. නෙව හිඳ සිට ඇවිද පස්නා සතුන්ගේ අන්තනැති. යන්නානට සිටියන් විසින් හුන්නන් විසින් හොත්තන් විසින් ආවරණ නැති. මෙසේ සත්ත්වයන් විසින් නිරන්තරවන බැවින් අවීචි නම්වේ.

දුඃඛයෙන් නිරන්තර පරිදි කිසේයයත්?

කායද්වාරයෙහි සඋපෙක්ෂාසහගතචිත්තයෝ උපදිති. එක්දුක්ඛසහගත චිත්තයක් උපද්දී. එතෙකුදුවුව යම්සේ ජිහ්වාග්‍රයෙහි මධු බිඳුවක් තබා එක්තාම්‍ර ලොහ බිඳුවක් හිබු කලැ අනුදහනයමැ බලවත්වන බැවින් ඒ මී බිඳින් කම්නැති. එසෙයින්මැ උපෙක්ෂා සහගත චිත්තයන් උපදුතුදු දුඃඛ සහගත චිත්තයාම බලවත්වන බැවින් දුඃඛයමැ නිරන්තරවන බැවින් "අවීචි" නම්වේ. එහි ආයුෂ එක් අතුරු කපෙකි.

**අවමහ නිරය ඔසපක් සහ එක්සිය සතිසෙක් වද**—අෂ්ටමහා නරකයෝ චතුරශ්‍රයහ. චතුර්ද්වාරයහ. සතර දෙසෙහි නව යොදුන් බොල් යකින. උඩ නවයොදුන් බොල් යපිරින. යට නවයොදුන් බොල් යපොලොව. මෙයින් නික්මෙන අග්නි ජ්වාලා විලනුවන් ඇස් සියක් යොදුන් තැන් සිට යමකාගුළිකා ගෙනසින් හික්මෙසි,

මේ අෂ්ට මහා නිරය එකෙකි ද්වාරයෙහි සතර සතර උස්සද නරකයැ. මේ නියායෙන් එකෙකි මහා නරකයෙහි සොළොස් සොළොස් උස්සද නරකවන බැවින් එක්සිය අටවිස්සෙක් වෙයි. මහා නරක හා සමග එක්සිය සතිසෙක්වේ.

(ධම්මප්‍රදීපිකාව)

“චතුක්කණ්ණො චතුද්වාරො විභත්තො භාගසො මිතො
අයොපාකාර පරියන්තො අයසා පටිකුජ්ජිතො”

චතුක්කණ්ණො, සතර කොණක් ඇත්තේය; චතුද්වාරො, සතර දොරක් ඇත්තේය; විභත්තො, (මහා නරක ඔස්සදනැයි කියා) බෙදනලද්දේය; භාගසො, කොටසින්; මිතො, (දනාවුන් විසින් ආයුෂයෙන් ස්ථානයෙන්) පමණ දන්නාලද්දේය; අයොපාකාර පරියන්තො, ය පවුරුම කෙළවරකොට ඇත්තේය; අයසා පටිකුජ්ජිතො, ය කබලින්ම වසනලද්දේය.

“තස්ස අයොමයා භූමි ජලිතා තෙජසායුතා
සමන්තා [illegible]ොජන සතං ඵුටා තිට්ඨති සබ්බදා”

තස්ස, ඒ නිරයාගේ; භූමි, බිම; අයොමයා, යමුවාය; (හෙද) ජලිතා, දිලිසෙන්නීය; තෙජසායුතා, තෙජසින් යුත්තීය; (හෙද මද තැනක් පැතිරෙන්නේ නොවෙයි) සමන්තා, හාත්පසින්; යොජන සතං, යොදුන් සියයක් තැන්; ඵුටා, පැතිර; තිට්ඨති, සිටී; (ඒද එක් කලෙක සිටිනේ නොවෙයි) සබ්බදා, හැමකල්හිමැයි.

(සද්ධම්මොපායනය)

94. තෙ සි ය ක් තෙප්මුව වැද සිදුරැව ග ත
ද ව ස ක් මිනිසකු විඳි දුක් නොනැව ත
මොහොතක් නිරයේ විඳි දුක් සමව ත
අ බැ ට ක් හා සරිනොවෙදෙ හිමව ත

තෙප්මුව, තෙප්මුණුවල්; තෙසියක්වැද, තුන්සියයක් ප්‍රවිෂ්ටව; ගත සිදුරැව, ශරීරය ඡිද්‍රව; දවසක්, එක් දිනක්; මිනිසෙක්, මනුෂ්‍ය යෙක්; නොනැවත, නැවත්මක් නැතිව; විඳිදුක්, විඳනායකල දුඃඛය; මොහොතක්, මුහුර්තයක්; නිරයේ, නරකයෙහි; විඳිදුක්, විඳිනුලැබූ දුකට; සමවත, සරිවන්නේනම්; අබැටක් හා, සර්ෂප බීජයක්හා (අබඇටයක්හා); හිමවත, හිමාලපර්වතය; සරිනොවෙදෙ, සමනොවේද?.

**තෙසියක් නෙප්බුමවැද සිදුරුවගත....... අබැටක් හා සරිනොවෙදෙ හිමවත—**

"ති සතානි සත විද්ධස්ස යං දුක්ඛ'මච්ඡිනන්තියං
තමෙනෙරයික දුක්ඛස්ස හිමවා සාසපන්තරං"

ති සතානි සත, තුන් සීයක් තෙබින්; විද්ධස්ස, විදිනාලද්දහු පිළිබඳවූ; අච්ඡිනන්තියං, නොසිඳිය හැකිවූ (සිඳන්ටද බැරිවූ); යං දුක්ඛං, යම් දුකෙක් ඇද්ද; තං, ඒ දුක්; නෙරයික දුක්ඛස්ස නරකයෙහි දුකට; හිමවා සාසපන්තරං, හිමවත් සෂීපාන්තරයී (හිමවත් පර්වතයහා සිදතු ඇටක්හා දෙක අතරතුරවැනි).

**මොහොතක්**—අසුරු දසයක් පමණ කාලය ක්ෂණයෙක්වේ, ක්ෂණ දසයක් ලයෙක්වේ. ලය දසයක් ක්ෂණලයෙක්වේ. ක්ෂණලය දසයක් මොහොතක්වේ.

**හිමවත**—ජයමහා බෝධීන් උතුරුදෙසෙහි තුන්සියක් යොදුන් තැනින් මත්තෙහි පිහිටියේය. උස පන්සියක් යොදුන, ආයාම විසින් විස්තාර විසින් තුන් තුන් දහස් යොදුන.

"යොජනානාං ශතාන්‍යුච්චො—හිමවාන් පච පර්වතඃ
යොජනානාං සහස්‍රාණි—ත්‍රීණ්‍යායත විස්තෘතඃ"

ඒ පර්වතය සුදර්ශන කූටය, චිත්‍රකූටය, කාලකූටය, කෛලාස කූටය, ගන්ධමාදන කූටය, යනාදි සියක් සියක් යොදුන් සුවාසූ දහසක් රුවන් කුළින් දිලිසෙනුවූයේය. රථකාර දහතලාය, මන්දාකිනී දහතලාය, හංසපාත දහතලාය, අනවතප්ත දහ තලාය, ෂඩ්දන්ත දහතලාය, කුණාල දහතලාය, කර්ණමුණ්ඩ දහතලාය යන ආයාමයෙහි පණස් පණස් යොදුන් විස්තාරයෙහි පණස් පණස් යොදුන් ගැඹුරෙහි පණස් පණස් යොදුන් වටාසෙල සියයොදුන් සත්දහතෙළෙසින් සැදුම් ලද්දේයි.

"සංෂොඩශ සහස්‍රෙන—ලක්ෂකූටෛර්විභූෂිතඃ
අෂ්ටාශොභ්‍යස්සප්තභිශ්ශුකො—රථාකාරහ්‍රදාදිභිඃ"

අනවතප්තයෙහි චතුර්මුඛයෙන් නිර්ගත ආවර්ත ගඞ්ගාදී භාත්පසින් බස්නා පන්සියක් ගඞ්ගායෙන් විචිත්‍රවූයේයි.

"ගඞ්ගා සරස්වතී සින්ධුස්තාරක්ෂුශ්ච මහා පගාඃ
යෙ ෂාම්න වතප්ත්‍යාබ්‍යාත් ස්‍රවන්ත්‍යං ක්ෂපයන්තිතඃ"

මෙසේ උක්තානුක්ත වර්ණනායෙන් විචිත්‍රපර්වතය හිමවත්නම්.

(ධමමප්‍රදීපිකාව)

95. පෙ ර අ ඟ   නක් එක් එළුදෙනක හිස සි   ඳ
සි ය ල ඟ   වැලඳි ගිනිදල් නිරය දුක් වි   ඳ
ඇ ය ඇ ඟ   ලෝම ගණිනෙන් ඉස් කැපුම් ල   ද
මෙම ර ඟ   වේය කාටත් අකුසලේ ලෙ   ද

පෙර, පූර්වයෙහි; අඟනක්, (එක්) අඞ්ගනාවක්; එක්එළුදෙනක, එක් එළුදෙනකගේ; හිස සිඳ, ශීර්ෂච්ඡේදනයකොට; සියලඟ. (ඒ අකුසලකර්මය හේතුකොටගෙණ) සර්වාඞ්ගයෙහි; ගිනිදල්, අග්නිජ්වාලා; වැලඳී, වැලඳගත; නිරය දුක්විඳ, නරකයෙහි දුක් අනුභවකොට; (ඉක්බිති) ඇය, ඒ ළියගේ; ඇඟ, ශරීරයෙහි; ලෝමගණනෙන්, රෝමගණනාවෙන්; ඉස් කැපුම් ලද, ශීර්ෂච්ඡේදන ලද්දීය; කාටත්, කවරක්හට උවත්; අකුසලේලෙද, අකුසල කර්මයෙහි ප්‍රකාරය; මෙම රඟවේය, මෙයාකාරවත්තේය.

**පෙර අඟනක් එක් එළුදෙනක හිස සිඳ.........හිස් කැපුම්ලද—**

කොසොල් මහරජහුගේ අග්‍රමහෙසිකාවූ මල්ලිකාදේවී පෙර එක් ජන්මයෙක කුලදූවක්ව පති කුලයෙහි (ස්වාමිහුගේ ගෙහි) වසන්නී අළුත්තකු වත්කල ඔහුට බත් දෙනු කැමතිව මස් සොයා නොලදින් පැසුළුදෙරහොත් එළියකගේ හිස සිඳ මස් ගෙණ අමුත්තාට සඞ්ග්‍රහ කළාය. ඒ අකුසල කර්මයෙන් අනේක වර්ෂ කෝටි සහස්‍රයෙහි නරකයෙහි පැසී එයින් මිදී ගියකල උපනුපන් තන්හි ඒ එළුදෙනගේ ලොම් ගණිතින් හිස් සිඳුම්ලද්දීය. ඉන් මෑත භාගයෙහි ඕතොමෝ දිනනා දේවීව උපන් කාලයෙහි ජාතිස්මරණ ඥානය පහළවී තමා එක් එළුදෙනකගේ හිස් සිඳිනු ලැබීමෙන් විඳුවූ දුක් දැක සියක් රජුන් හිස් සිඳීමට ලෑසතිව සිටි බරණැස් රජහට මෙසේ අවවාද කළාය.

“එකිස්සං කණ්ඨං ඡින්දිත්වා—ලොමගණනාය පච්චයිං
බහුනනං කණ්ඨෙඡෙත්වාන—කථං කාහසි ඛත්තිය.”

ක්ෂත්‍රිය මහ රජාණෙනි, එක එළුදෙනකගේ හිස් කැපුවාවූ මම ඒ එළුදෙනගේ ලොම්ගානේ හිස් කැපුම් ලද්දෙමි. බොහෝ දෙනෙනකුගේ හිස් සිඳිනුලබන්නාවූ නුඹවහන්සේට පැමිණෙන විපාකය කෙසේ කවරෙකුට කිවහැක්කේද?

96. කෙළි ය ට   කඩග් සඟවා සහළුවනුගෙ   නේ
එ ළි කොට   නැවත දුන් මිනිසකුට එතොකි නේ
වි ළි වැ ස්   මත් නොමවිය දෙව්බුවත් අ   නේ
කෙළි ය ට   වත් නොකරව් සොරකමක් දැ   නේ

**කෙළියට, ක්‍රීඩා පිණිස; (සෙල්ලම් පිණිස) යහළුවකුගෙනේ, මිත්‍රයකුගේ; කඩක්, වස්ත්‍රයක්; සඟවා, සඟවලා; නැවත, ඉක්බිති; එලිකොටදුන්, එළිදරව්කොට දුන්නාවූ; මිනිසෙකුට, මනුෂ්‍යයෙකුට; එතෙකිනේ, එපමණකින්ම; දෙව්වූවත්, දිව්‍යවූ උපන්නාවූ කාලයේත්; විලිවැස්මක්, ලජ්ජා ආවරණයක්; (රෙදි කෑබැල්ලක්) නොම්විය, නොමවූයේය; (නොලැබුණේය) අනේ, අහෝ; දූනේ, (මේ) ජනතාවනි; කෙළියටවත්, ක්‍රීඩා පිණිසවත්; සොරකමක් නොකරව්, වෛර කර්මයක් නොකරව්.**

**කෙළියට කඩක් සඟවා යහළුවෙකුගෙනේ......විලිවැස්මක්**

**නොමවිය දෙව්වූවත් අනේ—**

බුදුරජාණන්වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවාසයකරණ සමයෙහි විශාලා මහනුවර "අංබසක්කර" නම් මිථ්‍යාදෘෂ්ටිගත් එක් ලිච්ඡවී රජ කෙනෙක් වූයේය. එසමයෙහි එනුවර වැසි එක් වෙළෙන්දෙකුගේ කඩපිල සමීපයෙහි කදීමයෙන් ගැටසී ගත් එක් භූමි භාගයෙක්වී. යන එන බොහෝ මනුෂ්‍යයෝ එතැනදී පැන පැන යාමෙන් විඩාවට පත්වන බවත්, මඩ තැවරී සමහරෙකුගේ ශරීර හා වස්ත්‍රත් කෙලෙසෙනබවත් දුටු ඒ වෙළඳතෙම, යනෙන අය මඩ නොමැඩ සුවසේ යෙත්වයි සිතා දුගීඳිය නැත්තාවූ කල් පසුගිය ගොන් හිස් ගෙන්වා මඩ මතුයෙහි දමමවී. ඒ වෙළඳතෙම ප්‍රකෘතියෙන් සිල්වත්වූහ. ක්‍රොධ නැත්තාහ. මොළොක් වචන ඇත්තේය. අනුන්ගේ ගුණ නොසඟවා තත්වූපරිද්දෙන් කියන්නේය. හෙතෙම එක් දවසක් තමන්ගේ බෑණනුවන්ගේ යහළුවෙක් නහන කල්හී ඔහු හැඳි වස්ත්‍රය ක්‍රීඩා පිණිස සඟවාතබා වෙහෙසකොට නැවත දුන්නේය. ඔහුගේ බෑණණුවෝ අනුන්ගේ ගෙයකින් බඩු සොරා ගෙනවුත් මයිලණුවන්ගේ කඩපිළෙහි තැබීය. බඩු ස්වාමියෝ ඒ දැක බෑණණුවන්ද ඔහුද බඩුත් සමග අල්වාගෙන ගොස් රජහට දැක්වීය. එකල රජතෙම "වෙළඳුගේ හිස සාප්පුවා බෑණණුවන් දිවස්හුල තබවයි" රාජ පුරුෂයන්ට නියෝග කෙළේය. ඔව්හුද එසේම කළෝය. ඒ වෙළඳතෙම මැරිගොස් භූමාටුදෙවියන් අතරෙහි උපන්නේය. තමා මනුෂ්‍යව උපන් කල ගොන් ඔළුවලින් ඒ දණඩ දුමූ කුශලය හේතුකොටගෙණ සුදුවන්, දිව්‍යමය ජවයෙන් සමන්විත අාජානීය අශ්වයානාවක් ඔහුට පහළවී. ගුණවතුන් ගුණ වණිනාකළ කුශලය හේතුකොටගෙණ ශරීරයෙන් දිව සුවඳ හමන්නේය. නමුත් වස්ත්‍රය සැඟවූ අකුශලය කරණකොටගෙණ නග්නව උපන්

න්නේය. හෙතෙම පූර්වයෙහි තමා විසින් කරණලද කර්මය බලන කල්හි එම අනුසාරයෙන් තමන්ගේ බෑණණුවන් දිවස්හුල හිඳිනවුන් දැක කරුණාවෙන් චොදිත සිත් ඇතිව ස්වකීය සෛන්ධවයා පිට නැගී අඩ රාත්‍රියෙහි ඔහු හුල උන් තැනට ගොස් නුදුරු තැන්හි සිට ඝෝෂතුගේ පින්වත, ජීවත්වෙව. ජීවත්වීම උතුමැයි දවසක් දවසක් පාසා කියන්නේය. එසමයෙහි අම්බසක්ඛර රජතෙම හස්ති වාහනා රූඪව නුවර ප්‍රදක්ෂිණා කරමින් ඇවිදිනේ, එක්තරා ගෙයක ජනෙල්කවුළුව හැරගෙණ රාජ විභූති බලමින් සිටි එක් ස්ත්‍රියක් දැක ඈ කෙරෙහි පිළිබඳ සිත් ඇතිව ක්‍රමයෙන් ගොස් රජගෙට ප්‍රවිෂ්ටව ඒ ස්ත්‍රී සස්වාමික අස්වාමික බැව් පුරුෂයෙක් යවා විචාරා සස්වාමික බැව් දැන එක් උපායකින් ඈ තමන් සතු කර ගැනීමට කල්පනාකොට ඈගේ ස්වාමියා ගෙන්වා ටික දවසක් රාජ සේවයෙහි යොදවා ඉක්බිති එක්දිනක් ඔහු කැඳවා "සගයෙනි, යව අසවල් තැන එක්විලෙක් ඇත. එහිගොස් අරුණුවන්මැටි හා රත්නෝත්පලයන්ද රැගෙණ අදම එව. එසේ නාවහොත් තාගේ දිවි නැතැයි" කීය. ඒ පුරුෂතෙම විල්තෙරට ගියේ එය අමනුෂ්‍යාධිගෘහිත වන්නේයයි කලින් අසා තිබුණු හෙයින් විලට නොබැස එයවටේ ඇවිදිමින් උන්නේය. ඒ විලට අරක්ගත් දිව්‍යරාජතෙම ඔහු කෙරෙහි කරුණාඋපදවා මනුෂ්‍ය වේශයෙන් අවුත් ඔහු අභිමුඛයෙහි සිට ආකරුණු විචාරා ඉක්බිති මල්හා මැටි ගැන්මට අවසරදී තමාගේ දිව්‍ය ශරීරය දක්වා අන්තර්ධානවිය. පුරුෂතෙම මල් හා මැටි රැගෙණ වහා දිවගොස් ඉරබස්නාව පළමු නුවරට පැමිණියේය. ඒ දැක වාරපාලතෙම ඔහු මොරගසමින් සිටියදීම නුවර දොරවැසීය. ඒ පුරුෂයා නුවරතුලට ප්‍රවිෂ්ටවීමට නොහැකිවූයෙන් ඒ සමීපයෙහි දිවස්හුල උන් පුරුෂයාට කථාකොට, තමා කලින් ආ බවට සාක්ෂිවනමෙන් ඉල්ලීය. එවිට ඔහු උත්තරදෙමින් දැනට මම මරණාභිමුඛව හුලඉඳිමි. එසේවූ මම තොපට කෙසේ සාක්ෂි කියම්ද? මහත් සෘද්ධි ඇති එක් ප්‍රේතයෙක් මෙහි මා ලඟට එයි. ඔහු සාක්ෂිකරවයි කීය. ඒ පුරුෂයාද හුල උන් මිනිසාගේ බස පිළිගෙණ එතැන්හි උන්නේ මධ්‍යම යාමයෙහි එතැනට ආවාවූ ප්‍රේතයා දැක තමාට සාක්ෂිවනමෙන් ඉල්ලීය. ඉක්බිති අළුයම්වූ කල්හි රජහු විසින් රාජනියොගය කඩකළේ යයි කියා ඒ පුරුෂයා මරවන්ට සැරසුණේය. පුරුෂතෙම කියන්නේ "දෙවයන්වහන්ස මාවිසින් ඔබවහන්සේගේ ආඥාව කඩනොකරණ ලද්දේය. හිර බැසීමට පළමු මෙහි ආවෙමි" යි කීය. තොපට සාක්ෂි ඇද්දැයි රජතෙම විචාළකල්හි, "එසේය

දිවස්හුල උන් පුරුෂයා ළඟට එන්නාවූ එක් නග්නප්‍රේතයෙක් ඇත. ඌ මටසාක්ෂිවන්නේය''යි ඒපුරුෂයා උත්තර දුන්නේය. එදින රාත්‍රි අම්බසක්බර රජතෙම මේ කාරණයෙහි සත්‍යාසත්‍යතාව පරීක්ෂා කරණුවස් තෙමේම ඒ පුරුෂයා සමග දිවස්හුල උන් තැනැත්තාවෙත ගොස් "පින්වත, ජීවත්වෙව ජීවත්වීම උතුමැ''යි යනාදි ප්‍රේතයා විසින් කී වචන අසා විසම්පත්ව එහි අඩිය ප්‍රේතයා අතින් විචාළේය. ප්‍රේත තෙම උත්තර දෙමින් "මහරජ මේදිවස්හුල හිඳිනා පුරුෂතෙම මාගේ කිට්ටුනෑයෙකී. පවිටු ස්වභාව ඇත්තාවූ මේ තෙමේ මින් මිය ඝෝරවූ නරකයෙහි උපදින්නේය. ඒබව මොහුට කීයෙම් නම් මොහු වේදනා ඉපදී වහා මැරෙයි. එබැවින් මොහු කෙරෙහි කරුණාවෙන් නරකයෙහි උපදිනබව නොකියා පින්වත, ජීවත්වෙව, ජීවත්වීම උතුමැයිමෙපමණක්ම කීමි'' යි කීයේය.

ඉක්බිති ඒ ප්‍රේතයාකෙරෙහි රජතුමා පැහැදී, අශ්වයා පහළ වීමේ හේතුව, ශරීරප්‍රභා ලැබීමේ හේතුව, විලිවැස්මක් නැතිවීමට හේතුව ආදි බොහෝ ප්‍රශනයන් ප්‍රේතයා අතින් විචාරා ඔහුට වස්ත්‍ර ලබාදෙනු කැමතිව "එම්බා යක්ෂය, යම් ආකාරයකින් තොපට වස්ත්‍ර ලැබේද? එබඳු කාරණයක් ඇත් නම් මට නොවලහා කියව''යි කීය. ප්‍රේතතෙම උත්තරදෙමින්, "මහරජ ඉතා ගම්භීර ගුණ ඇති "කප්පිතක" නම් රහතන් වහන්සේ නමක් මේ විශාලා මහනුවර ඇත. උන්වහන්සේට වස්ත්‍ර යුගලක් පූජාකොට මට දක්ෂිණා දෙවුනම්, උන්වහන්සේ එය පිළිගත්තේවී නම් තොප විසින් මට දක්ෂිණා දුන් කල්හි මට දිව්‍ය වස්ත්‍ර ලැබෙන්නේය'' යි කීයේය. එකල ඒ රහතන් වහන්සේ (වඳුරන්ගේ නැවුම් පවත්නා හෙයින්) කපිනච්චනා වයයි කියනලද ප්‍රදේශයෙහි බොහෝ දෙවතාවන්ට ධර්මදේශනාකරමින් සිටිනබැවි ප්‍රේතයාගෙන් අසා දැන, රජතෙම සූකතප්‍රාප්ත වේලාවෙක්හි වස්ත්‍ර යුගල අටක් ගෙන්වාගෙණ තෙරුන්වහන්සේකරා එළඹ එකත් පසෙක හිඳ පිළිසඳර කථාකොට ඉක්බිති සියලුම වස්ත්‍රයන් තෙරුන්වහන්සේට පුද ප්‍රේතයාට පින්දුන්නේය. එපින් ලැබීමෙන් එකෙණෙහිම දිව්‍ය වස්ත්‍රලත් ප්‍රේත තොම සකසා හැඳ පෙරව ශුභ්‍රවර්ණ අශ්වයා පිට නැගී අවුත් තෙරුන්වහන්සේගේ හා රජහුගේ අභිමුඛයෙහි ප්‍රාදුර්භූතවිය. ඒ දැක රජතෙමේ සතුටු සිත් ඇතිව සොම්නස් ඉපදී ප්‍රත්‍යක්ෂවශයෙන්ම දුන් මාවිසින් කර්ම විපාකය දත්නාලද්දේයයි කියා එවක් පටන් ස්වකීය මිථ්‍යා දෘෂ්ටිය හැරදමා සම්‍යක් දෘෂ්ටිගතව ධර්මයෙහි හැසිරෙන්නෙක්

විය. ප්‍රේතයාගේ නියමයැලෙස දිවස්හුල උන් පුරුෂයා වහා මුදවා ඔහු සුවකරවීයයි වෙදුන්ට ආඥකෙළේය. මෙසේ කල් යත් යත් හෙතෙම තෙරුන් වහන්සේගෙන් නැවත නැවත අසනලද ධර්මාවවාද ඇත්තේ ඒ අවවාදවූ නියායෙන් පිළිපැද දහසක් නයින් ප්‍රතිමණ්ඩිත සෝවාන් පෙලෙහි පිහිටියේය. හුල අමුණ උන් පුරුෂතෙමේද නිරෝගිව සසරෙහි භවගත් සංවේග ඇත්තේ භික්ෂුන්වෙත පැවිදිව නොබෝ කලකින් අර්හත්ඵල ප්‍රාප්තවිය.

( අම්බසක්ඛර ප්‍රේතවස්තුව )

97. නොනැවති අයෙක් පෙර පරදර පව් කැම ති
ගු ගු ර ති ගැලෙති තිස්වා දහසින් උඩෙ ති
නි ම් නැ ති තවම ලෝකුඹු නිරයේ පැසෙ ති
නොක ර ති මෙපව් නුවණැති අය වැඩ කැම ති

පෙර, පූර්වයෙහි; පරදර පව් කැමති, පරදර අකුසල කර්මය කැමැත්තෙන්; නොනැවතිඅයෙක්, (ඒපාපයෙන්) නොවැලැක්කාවූ සමහර කෙනෙක්; ගුගුරති, ගර්ජනාකෙරෙති; ගැලෙති, නිමග්න වෙති; තිස්වාදහසින්, වර්ෂ තිස් දහසකින්; උඩෙති, (වරක්) උඩට එති; තවම, අදදක්වාම; නිම්නැති, සීමාඅතික්‍රාන්තවූ; ලෝකුඹු නිරයේ, ලොහකුම්භිනම් නරකයේ; පැසෙති, පැසෙත්; වැඩකැමති, (තමහට) අභිවෘද්ධිය කැමැත්තාවූ; නුවණැතිඅය, ඥානවන්තජනයෝ; මෙපව්, (මේ පරදර) පාපකර්මයන්; නොකරති, නොකෙරෙත්ය.

**නොනැවති අයෙක් පෙර පරදර පව් කැමති......ලෝකුඹු නිරයේ පැසෙති—**

බුදුරජාණන්වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සමයෙහි එක් දිනක් කොසොල් රජ මධ්‍යම රාත්‍රියෙහි බියකරු ශබ්දයක් අසා බියපත්ව මල්ලිකාදේවියගේ නියොගයෙන් බුදුරජාණන් වහන්සේ කරා ගොස් ඒ බැව් සැලකෙළේය. බුදුහු, "මහරජ, තෙපි කවර ශබ්දයක් ශ්‍රවණය කරණ ලදදැ"යි විචාළහ. එවිට කොසොල්රජ "ස්වාමීන් වහන්ස, දු—ස—න—සො, යන ශබ්ද සතර ඇසීමි"යිකීහ. එබසට බුදුරජානන්වහන්සේ මෙසේ වදාළසේක. "මහරජ, මෙය තොපටවත් රටටවත් වන විපතක් නිසා නොවේය. පෙර කාශ්‍යප බුදුන් දවස බරණැස් නුවර විසූ සිටුපුත්‍රයන් සිව්දෙනෙක් ඔවුන්ගේ මහ ධනය වියදම් කරමින් බරණැස් නුවර සිටි රූපත් ස්ත්‍රීන් ගෙන්වා ඔවුන් හා මිථ්‍යාචාරයෙහි යෙදෙමින් විසිදහසක් අවුරුදු දුශ්චරිතයන් පුරා

මරණින්මතු අවීචි මහා නරකයෙහි ඉපිද එක් අතුරු කපක් ඝෝර දුක් විඳ එතැකින් ඔවුන්ගේ අකුසලකර්මය නොගෙවුණු බැවින් එයින් සැවලෝකුඹුනම් ඔසුපත් නරකයෙහි ඉපිද කැකි යන උදුනෙහි සාල් සෙයින් උඩුයටිව පැසෙන්නාහු අවුරුදු තිස්දහසකින් පත්ලට බැස තිසවාදහසෙකින් මුවවිටට නැංගාවූ ඔවුනොවුන් දැක එක එක ගාථාව කියැටිව කියන්ට කල්නැත්තෙන් දු, ස, න, සො,-යන සතර අකුරෙක් සතර දෙන කියා ලොහකුම්භී නිමග්නාවූහු" ඔවුන් විසින් අපරිපූර්ණ සතර ගාථාවන් බුදුරජාණන් වහන්සේ විසින් පරිපූර්ණකොට වදාළසේක. ඒ මෙසේයි,

"දුජ්ජීවිතං අජීවිම්හ—යෙ සන්තෙ න දදම්හසෙ
විජ්ජමානෙසු භොගෙසු—දීපං නාකම්හ අත්තනො"

අපි නපුරුවූ ජීවිතයෙන් ජීවත්වීමු, භොග සම්පත් ඇතිකල් හින්දිය යුත්තාන්ට නුදුන්නෙමු, තමහට ප්‍රතිශ්‍රයාධාරවූ කිසිවක් කරනොගත්තෙමු යනු මෙහි අභිප්‍රායයි.

"සට්ඨිං වස්ස සහස්සානි—පරිපුණ්ණානි සබ්බසො
නිරයෙ පච්චමානානං—කදා අන්තො භවිස්සති."

නිරයෙහි පැසෙන්නාවූ අපට සර්වප්‍රකාරයෙන් වර්ෂ සැට දහසක් පිරිගියේය. කවර කලෙක්හි මෙහි කෙළවරක් වන්නේද?.

"නත්ථි අන්තො කුතො අන්තො—න අන්තො පටිදිස්සති"
තදා හි පකතං පාපං—මම තුය්හං ච මාරිස."

එම්බා පින්වත, මාවිසින්ද තා විසින්ද එකල්හි කරනලද පාපකර්මය කෙළවරක් නැත්තේය, කොහෙන් කෙළවරක් ලැබේද? කෙළවරක්නම් නොපෙණෙන්නේමය.

"සොහං නූන ඉතො ගන්ත්වා—යොනිං ලද්ධාන මානුසිං
වදඤ්ඤූ සීල සම්පන්නො—කාහාමි කුසලං බහුං"

ඒකාන්තයෙන් ඒ මම මෙයින් මිදීගොස් මිනිස් පිසක් ලදකල්හි දන්දෙන සුළුව සීලයෙන් යුක්තව බොහෝවූ පින්කම් කරන්නෙමි.

ලෝකුඹු නිරයේ සැකෙකි—"තමෙනං භික්ඛවෙ නිරය පාලා උද්ධපාදං අධොසිරං ගහෙත්වා තත්තාය ලොහ කුම්භියා පක්ඛි පන්ති ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය සොතත්ථ

ඵෙණුද්දෙහකං පචචති සොතතථ ඵෙණුද්දෙහකං පචචමානො සකිම්පි උඩං ගචඡති සකිම්පි අධො ගචඡති සකිම්පි තිරියං ගචඡති සොතතථ දුකඛාතිපපා කටුකා වෙදනාවෙදියති නචතාව කාලං කරොති යාවනතං පාපං කමමං ව්‍යනතී හොති"

මහණෙනි, නරකපාලයෝ, නරකගත සත්ත්වයා ඌර්ධ්වපාද අධශ්ශිරස්කොට ගිණිගෙණ ඇවිලෙන්නාවූ ප්‍රකෘතියෙන් දිලියෙන්නාවූ ගිනිදැල් සහිතවූ (යකියනලද) ලෝහ කුම්භි නරකයෙහි බහන්නාහුය. හෙතෙම පෙණ පිඩු බැඳුවූ ශරීරය පැසෙන්නේ එකවරෙක උඩට එන්නේය. එක්වරෙක යටට යන්නේය, එක්වරෙක සරසට යන්නේය, හෙතෙම එහි තීක්ෂණවූ කඨිනවූ දුඃඛ වේදනාවන් විඳින්නේය, යම්තාක් ඒ පාපකර්මය කෙළවර නොවේද ඒතාක් කල් කාලක්‍රියා නොකරන්නේය.

( දෙවදූතසූත්‍රය )

ලෝහකුම්භි නිරයට මේ නාමය ව්‍යවහාරකරණු ලබන්නේ එය උණුකරණලද ලෝහයෙන් පිරි සැළියක් බඳු ස්වභාව ඇතිසෙයින්වේ.

98. ලැ දි ව රජෙක් බොරු බස් කී විගස කයා
නැ ති ව රිද්දි බලයක් ඒ මිනිස් කයා
පොලොව පලාගෙණ ගොස් වැටුනි නර කයා
මෙලො ව සතුනි ඉන් බොරු කීම නර කයා

රජෙක්, (එක්) රාජයෙක්; ලැදිව, (මිථ්‍යා) ලබ්ධිව (බොරුවට කැමතිව); බොරුබස් කී, මුසා වචන බිනූ; විගසකයා, ක්ෂණයෙහිම; රිද්දිබලයත් නැතිව, ඍද්ධිබලයත් නැතිවී; ඒ මිනිස්කයා, ඒ මනුෂ්‍ය කයෙන්ම; පොලොව පලාගෙණ ගොස්, පෘථිවිය විවරකොට ගෙණ; නරකයා වැටුනි, නරකයෙහි පතිතවූයේයි; ඉන්, එහෙයින්; මෙලොව සතුනි, මේ ලෝකවාසී සත්වයිනි; බොරුකීම නරකයා, මුසාබස් බිණීම නරකය; වරද සහිතවෙයි.

**ලැදිව රජෙක් බොරුබස්කීවිගසකයා .....පොලොව පලාගෙණ ගොස් වැටුනි නරකයා**—මෙමකල්පයෙහිවූ සි ප්‍රථම කල්පික මහා පිරුත්තහු බොරුකීම කුමනාකාරද කීයාවත් දැන නොසිටියෝය. මෙසේ කල්ගතවන අතර චේතියනම් රජෙක් විය. ඔහු මුඛයෙන් උත්පලගන්ධය (මහනෙල්මල් සුවඳ) හමයි,

ශරීරයෙන් සඳුන් සුවඳ වැහෙයි. ආකාශයෙහි බඩපයහීඩියාව සිටිනු පොහොසත්වේ. කඩුගත් විද්‍යාධරයෝ සිව්දෙනෙක් චතුර්දිශායෙහි රක්‍ෂාකෙරෙති. පළමුවෙන්ම බොරුකීම ලොකයෙහි පතල කරණලද්දේ මේ චෙතිය රජහු විසින්., එම රජ බොරුකීතැන් පටන් විද්‍යාධරයෝ ඔහුහැර ගියාහ. මුවෙන් වැහෙන මහනෙල්මල් සුවඳද ඇඟින් වැහෙන සඳුන් සුවඳද අන්තර්ධානවිය. ආකාශයෙහි නොහිඳැහී බිමට බට. බිම ඇක්මෙන්ම පොළොවැ විවරව සවකිය ශරීරයෙන්ම නිරයෙහි වැටින. (දනුදු බොරුකීමෙහි සතුන්හට චෙතිරජ්ජුයයි ව්‍යවහාර කරති.)

99. පි සු ණු කියා සඟදෙනමක් වෙනස්කො ට
පැ සු ණු එකෙක් නිරයේ කල්පයක් සි ට
මු හු ණු කුණුව තව ජේතව විඳි ගැහැ ට
පි සු ණු බසක් නොකියව් අදපටන් සි ට

පිසුනුකියා, පෛශුන්‍ය කථනයකොට; (කේලාම් කියා) සඟ දෙනමක්, භික්‍ෂූන් දෙනමක්; වෙනස්කොට, භෙද‍කොට; එකෙක්, එක් අයෙක්; කලපයක් සිට, කලපයක් මුළුල්ලෙහි; නිරයේ, නරක යෙහි; පැසුණු, පැසුනේය; තව, තවද; ජේතව, ප්‍රේතව (ඉපිද); මුහුණු කුණුව, මුඛය කුණුවී; ගැහැට විඳි, පීඩා විඳින්නේය; අද පටන් සිට, අද දවසේ සිට; පිසුණු බසක්, කේලාම් වචනයක්; නොකියව්, කථනය නොකරව්.

**පිසුණුකියා සඟ දෙනමක් වෙනස්කොට...... තව ජේතව විඳි ගැහැට—**

ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ කලන්‍දකනිවාප නම්වූ වේළුවනාරාමයෙහි වැඩ වාසයකර වදාරණ කල්හි එක්තරා පූතිමුඛ ප්‍රෙතයෙකු අරභයා මේ ප්‍රෙතවස්තුව වදාරණ ලද්දේය. ඒ කෙසේදයත්?

යටගිය දවස කාසුප් සම්මාසම්බුදුන්කල්හි කුලපුත්‍රයෝ දෙදෙනෙක් ඒ බුදුන්ගේ ශාසනයෙහි පැවිදිව සීලාචාර සම්පන්නව සැහැල්ලුවූ පැවතුම් ඇතිව එක්තරා ග්‍රාමාවාසයෙක සමගිව වෙසෙති. ඉක්බිති එක්තරා පවිටු භික්‍ෂුවක්තෙම හැල්කෙතට සොර මීමෙක් වැදුනාසේ ඒ දෙදෙනාවහන්සේ වසන තෙනට අවුත් සිටියේක. ඒ තෙරහු දෙදෙන ඒ භික්‍ෂුව සමග පිළිසඳර කථාකොට වසන තැනක්දී දෙවෙනි දවසෙහි ඒ ආගන්තුක

භික්ෂුව හැරගෙණ පිඬු පිණිස ගම් වැදුනාහ. ඒ දැක මනුෂ්‍යයෝ ඒ තෙරුන්වහන්සේලා කෙරෙහි ඉතාම යටත් ආකාර දක්වා කැඳ බත් ආදියෙන් වැළඳෙව්වාහුය. ඒ ආගන්තුක භික්ෂුතෙම වෙහෙරට ගොස් මෙසේ සිතූය. මේ ගොදුරු ගම යහපත මනුෂ්‍යයෝද ශ්‍රද්ධා සම්පන්නව ප්‍රණීත පිඩ පාතය දෙන්නාහුය. මේ වෙහෙර ජාසුදක සම්පන්නය, මෙහිම වසන්ට හැක්කේය. මේ භික්ෂූන් මෙහිම වසනකල මට පාසු විහරණයෙක් නොවෙයි. අතවැසියෙකුගේ විසීමක්මෙන්වෙයි. එබැවින් මම ඔවුන්නොවුන් බිඳුවා යම්සේ කලකල්හි නැවත මෙහි නොවෙසෙත්ද එසේ හෙදකරම්යි සිතීය ඉක්බිති එක් දවසක් වැඩිමහළු තෙරුන්වහන්සේ ඉතිරිදෙදෙනාහටම අවවාදකොට තමන්වහන්සේ වසන තැනට වන්කල්හි කෝලාම් කියන මහණතෙමේ මදක් කල්යවා මහතෙරුන්කරා ගොස් තෙරුන්වහන්සේ විසින් "ඇවැත්නි නොකල්හි කුමක් පිණිස ආයෙහිදැ"යි වදළකල්හි "වහන්ස කියයුතුකිසිවක් ඇතැ"යි කියා කීය. ඇවැත්නියි තෙරුන්වහන්සේ විසින් අනුදන්නාලද්දේ මෙසේ කියන්නේ, "වහන්ස ඔබගේ මේ මිත්‍රතෙරුන්වහන්සේ සම්මුඛයෙහි තමන් මිත්‍රයෙකුමෙන් පෙන්වා පරාමුඛයෙහි සතුරකුමෙන් නුගුණ කියන්නේවේදැ"යි කීය. "කුමක් කියන්නේද ඇවැත්නි"යි විචාලකල්හි ඒ භික්ෂුතෙම මෙසේ කීහ "වහන්ස ඇසුව මැනව. මේ තෙරුන්වහන්සේ කෙරාටිකවූ කළ වරද සඟවා නිවරද දක්වන්නාවූ මායා ඇත්තෙක, කුහකය, මිථ්‍යා ජීවයෙන් ජීවිකාව කෙරේයයි කියා ඔබගේ නුගුණ කියති"යි කීය. එකල්හි තෙරුන්වහන්සේ කියන්නේ "ඇවැත්නි මෙසේ නොකියව, ඒ මහණ මට මෙසේ නොකියති. ගිහි කල පටන් මාගේ ප්‍රකෘතිය දන්නේය. මෙතෙම ප්‍රිය සීලි කෙනෙක් වන්නේය. යහපත් ස්වභාව ඇත්තෙකැ"යි කියා ඒ ආගන්තුක තමාගේ කීම නොගිවිසියේක. එකල කෝලාම් මහණතෙම කියන්නේ "වහන්ස, ඉදින් ඔබවහන්සේගේ සිත් සුධ බැවින් මෙසේ සිතවූනම් ඒ මහණ ඔබටම සුදුසුය. ඔහු හා සමග මාගේ වෛරයෙක් නැත්තේය. කුමක් හෙයින් මම උන්වහන්සේ විසින් 'නොකිවක් කීයේ'යයි කීයම්ද? එසේ වේවා. කාලාන්තරයකින් තමහටම දැනේ"යි කීය. මහ තෙරුන්වහන්සේද පුහුදුන් බැවින් වෙල්හක සිත් ඇතිසේක් මෙසේත් වෙයි කියා සැක ඇතිව මදක් ලිහිල්වූ විශ්වාස භාවය ඇතිවිය. ඒ අඥාන මහණ පළමුකොට මහ තෙරුන් බිඳුවා ඉතිරි තෙරුන්වහන්සේද ඉහත කී ආකාරයෙන්ම බින්දේය. ඉක්බිති ඒ

දෙදෙනාවහන්සේ දෙවෙනි දවස්හි ඔවුන් කථානොකොට පා සිවුරුගෙණ ගමෙහි පිඬු සිඟා ගෙණවුත් තමතමන්ගේ වාසස්ථාන වලදීම වළඳ වැඳුම් පිදුම් පමණවත් නොකොට එදවස එහිම වැස අළුයම්වූ කල්හි ඔවුනොවුන්ට බැණනොගෙණ මපහසු තැන්වලට ගියාහුය.

කෝලාම් කියමනෙහි ඇළුනු සිත් ඇති මහණ සම්පූර්ණවූ මනොරථය ඇතිව පිඬුපිණිස ගමට වන්නාවූත් දැක මනුෂ්‍යයෝ විචාරන්නාහු "වහන්ස තෙරුන්වහන්සේලා කොයිගියාහුද්ද"යි විචාළාහුය. එවිට කෝලාම් මහණ කියන්නේ "ඊයේ රාත්‍රිය මුළුල්ලේ ඔවුනොවුන් කලහකොට මා විසින් කලහ නොකරවිය, සමගිවුව මැනව, කලහය නම් අනර්ථදායකය, අනාගතයෙහි දුක් එලවන්නාවූ අකුසලොත්පාදයට හේතුවෙක, පූරාතනයෝ කලහය නිසා මගත් වැඩෙන් පිරිහුනෝවේද්දැයි යනාදීන් අවවාදකරණු ලබන්නාහුද මාගේ වචනය නොගෙණ පිටත්ව ගියෝය"යි කිය. එකල්හි මනුෂ්‍යයෝ කියන්නාහු "ඒ දෙදෙනාවහන්සේ කැමතිතැනක යෙත්වා. නුඹවහන්සේ අපට අනුකම්පාවෙන් කනස්සලුනොව මෙහිම වැඩ සිටිය මැනව"යි ආරාධනාකලාහ. යහපතැයි කියා ඒ මහණ එහිම වසමින් කීප දවසක් ඉක්මුනුකල්හි සිතනසේක් "සිල්වත් ගුණවත් අධ්‍යාසය ඇති තෙරුන්දෙදෙනා ආවාස ලොභයෙන් මා විසින් බිඳුවනලද්දහ. එහෙයින් මා විසින් බොහෝ අකුසල් රැස් කරණලද්දෙම්"යි කැඩපතින් මුහුණේ තිබෙන කැලැල් දුටුවාසේ සිහියෙන් තමන් කළවරද පෙණී බලවත්සේ විපිළිසරව සෝක වේගයෙන් ගිලන්වහිද නොබෝදවසකින් මැරීගොස් අවීචි මහා නරකයෙහි උපන්නේය.

නේවාසික තෙරදෙදෙනා වහන්සේ දනවුසැරිසරා වඩනාහු එක්තරා විහාරයකදී ඔවුනොවුන් සම්මුඛව සතුවුවී කෝලාම් මහණ විසින් කියනලද වචනයත් ඔවුනොවුන්ට කියා ඒ කියමන් එසේ නුවූබව දැන සමගි සතුටුව ක්‍රමයෙන් අවුත් එම ආවාසයට පැමිණියාහුය. මනුෂ්‍යයෝ ඒ දෙදෙනා වහන්සේ දැක තුටු පහටු සිත් ඇතිව සොම්නස්වූවාහු සිව්පසයෙන් උපස්ථාන කළෝය. තෙර දෙදෙනාවහන්සේ එහිම වසමින් සැප ආහාර අනුභවයෙන් එකඟවූ සිත් ඇතිව විදර්ශනා වඩමින් නොබෝ කලකින්ම අර්හත්වයට පැමිණියාහුය. කෝලාම්කී මහණතෙම එක් බුද්ධාන්තරයක් මුළුල්ලෙහි නරකයෙහි පැසී එයින් ගොඩ නැගී අවුත් මේ බුද්ධොත්පාදයෙහි රජගහ නුවරට නුදුරු

තැනෙක පූතිමුඛ ප්‍රේතයෙක්ව උපන්නේය. ඔහුගේ ශරීරය රන්වන්වෙයි. කටින් පණුවෝ පිටත්ව මුඛයසිසාරාකන්නාහුය. ඔහුගේ මුඛයෙන් ආකාශය පැතිර දුර්ගන්ධය වැහෙයි. එකල්හි ආයුෂමත්වූ නාරදස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බස්නේ ඒ ප්‍රේතයා දැක මෙසේ විචාරණසේක.

"දිබ්බං සුභං ධාරෙසි වණ්ණ ධාතුං
වෙහායසං තිට්ඨසි අන්තලික්ඛෙ
මුඛං ච තෙ කිමයො පූතිගන්ධං
ඛාදන්ති කිං කම්ම මකාසි පුබ්බෙති."

යනුහෙයින් "එම්බා ප්‍රේතය තෙපි දිව්‍යශරීරයක්හා සමානවූ සම්පත් ශරීරයක් දරමින් ආකාශයෙහි සිටින්නෙව. එතකුදු වුවත්තගේ මුඛය පණුවො වලාකති. මුඛයෙන් දුර්ගන්ධයද හමන්නේය. පූර්වයෙහි කුමන අකුසල කර්මයක්කොට මෙසේ විඳී"යි මේ ගාථාවෙන් විචාළේය. මෙසේ තෙරුන්වහන්සේ විසින් තමන් පූර්වයෙහි කරණලද අකුසල කර්මය විචාරණලදුව එපවත් දක්වන්නාවූ ප්‍රේතතෙම-

"සමණො අහං පාපො දුට්ඨ වා චො
තපස්සි රූපො මුඛ සා අසඤ්ඤතො
ලද්ධා ච මෙ තපසා වණ්ණ ධාතු
මුඛං ච මෙ පෙසුණි යෙන පූතිති."

යනුහෙයින් "නාරදස්ථවිරයන්වහන්ස මම පූර්වයෙහි කේලාම් කියා ඔවුනොවුන් බිඳුවන පවිටු ලාමක මහණෙක්වූයෙමි. අනුන්ගේ ගුණය නසා කඨාකරණ ස්වභාවයෙන් හා ඵරුෂ වචනයෙන් යුක්තව කේලාම්කීම් ආදි වාක් දුශ්චරිතයෙහි ඇළුනෙමි. තපස්ද ඇතිවූයෙමි. මාගේ තපස් ගුණයෙන් මේ ශරීර වර්ණය හා කේලාම් කීහෙයින් කුණුවූ මුඛය ඇතිවූයෙමි. මාගේ මුඛය සිසාරා පණුවෝ සිදුරු බිදුරුකොට මුඛය කන්නාහුය"යි කිව. මෙසේ ඒ ප්‍රේතතෙම තමන් පූර්වයෙහි කරණලද කුශලා කුශල කර්මය ප්‍රකාශකොට ඉන්පසු තෙරුන් වහන්සේට අවවාද දෙමින් අවසාන ගාථාව කීහ.

"තයිදං තයා නාරද සාමං දිට්ඨං
අනුකම්පකා යෙ කුසලා වදෙය්‍යුං
මා පෙසුණං මා ච මුසා අභානි
යක්ඛො තුවං හොහිසි කාමකාමී."

"නාරදස්ථවිරයන්වහන්ස, මාගේ මේ රූපය නුඹවහන්සේ විසින්ම දක්නාලද්දේය. බුද්ධාදී මහොත්තමයෝ තොපට අනුකම්පාවෙන් යම්සේ කියත්නාහුවෙත්ද එසේම මම කියමි. කේලාම් නොකිව මැනව. බොරු නොකිව මැනව. කේලාම් නොකීමෙන් වාක් සංයමයෙන් යුක්තවූයේවීනම් නුඹවහන්සේ පවකාමයෙන් සම්භාවිතව ප්‍රසිද්ධ දෙවියෙක්හෝවෙයි. දෙවියන් අතුරෙන් එක්තරා දෙවියෙකු හෝ වෙයි. උදාර දිව්‍ය සම්පත් ලබා අභිරමණය වන්නෙහිය"යි කීව. එයසා තෙරුන්නාන්සේ එසින් රජගහනුවරට ගොස් පිඬු සිගා දන් වළඳා පෙරලා වැඩිසේක් ශාස්තෘවූ බුදුරජනන්වහන්සේට එපවත් සැලකෙළේය. බුදුරජනනවහන්සේ ඒ අර්ථෝත්පත්තිකොටගෙණ සම්ප්‍රාප්ත පිරිසට ධර්ම දෙශනාකළසේක. ඒ ධර්මදෙශනාව බොහෝ දෙනාහට සාර්ථකවිය

(ප්‍රේතවස්තු ප්‍රකරණය)

100. පෙ ර එක් * සතෙක් සගගණහට බැණි නපු රූ
නි ර යේ වැටී බිම සත්ගව් වැඩෙනතු රූ
ඝො ර දුක් විඳි තව පේතව සිට කුරි රූ
† ප ර හට එසින් නොකියව් බස් නොපියක රූ

පෙර, පූර්වයෙහි; එක් සතෙක්, එක් සත්වයෙක්; සගගණහට, සංඝසමූහයාට; නපුරු බැණ, ආක්‍රොශ පරිභවකොට; බිම, භූමි තොමෝ; සත්ගව් වැඩෙනතුරු, ගව්සතක් උඩට වඩිනවතකල්හිත්; නිරයේ වැටී, නරකයේ පතිතව සිට; තව, තවමත්; (මේ දක්වාත්); පේතව සිට, ප්‍රේතාත්මය ලැබ; කුරිරු, කෲරවූ; ඝොර දුක්, ඝොරවූ දුඃඛයන්; විඳි, විඳිනය කරන්නේය; එසින්, එහෙයින්; පරහට, අන්‍යයන්ට; නොපියකරු බස්, අප්‍රියකර වචනයන්; නොකියව්, කථනය නොකරව්.

**බිමසත් ගව් වැඩෙනතුරු—එක් අතුරු කපෙක් වේ.**

**පෙර එක් සතෙක් සඟගණහට බැණ නපුරු .... තව පේතව සිට කුරිරු—**

ශාස්තෘවූ බුද්ධරජනන්වහන්සේ රජගහනුවර සමීපයෙහිවූ කලන්දකනිවාප නම් වේළුවනාරාමයෙහි වැඩවාසයකර වදාරණ කල්හි එක්තරා සූකරමුඛ ප්‍රේතයෙකු අරභයා මේ ප්‍රේතවස්තුව වදාරණලද්දේය. ඒ කෙසේදයත්?

අතීතයෙහි වනාහි කාශ්‍යප බුද්ධරජනන්වහන්සේගේ ශාසනයෙහි එක් භික්ෂුවක් තෙම කයින් කෙරෙණ ප්‍රාණඝාතාදි අකුසල් වලක්වා කායසංයමය ඇතිවිය. වචනයෙන් කෙරෙණ

* සහෙක්   † සඟහට

එරුෂ වචනාදිය නොවැලැක්වූහෙයින් වාක්සංයමය නැත්තේ භික්ෂූන්ට අක්‍රොෂ පරිභව බෙණෙයි. ඒ මහණතෙම මැත කාලයෙහි කාලක්‍රියාකොට නරකයෙහි ඉපිද එක්බුද්ධාන්තරයක් මුළුල්ලෙහි පැසී එයින් චුතව අවුත් මේ බුද්ධොත්පාද කාලයෙහි රජගහනුවර සමීපයෙහිවූ ගිජ්ඣකූට පර්වතය අසල එම අකුසල කර්මයාගේ විපාක වශයෙන් සා පිපාසයෙන් මඩනලද ශරීර ඇති ප්‍රෙතයෙක්ව උපන්නේය. ඔහුගේ ශරීරය රන්වන්විය. මුඛය සූකර මුඛයවැනිවිය. එකල ආයුෂමත්වූ නාරදස්ථවිර යන්වහන්සේ ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කරමින් උදෑසනම සිරුරු පිළිදූගුම්කොට පා සිවුරුගෙණ රජගහනුවරට පිඬු පිණිස වඩිනාසේක් අතරමගදී ඒ ප්‍රෙතයා දැක ඔහු විසින් කරණලද අකුසල කර්මය විචාරණසේක් මේ ගාථාව කීහ.

"කායො තෙ සබ්බ සො වණ්ණො සබ්බා ඔභාසතෙදිසා
මුඛං තෙ සූකරස්සෙව කිං කම්ම මකරීපුරෙති."

එම්බා තාගේ ශරීරය රන්වන්වීය. සියලු දික් බබලයි, තාගේ මුඛය සූකරමුඛයවැනිවෙයි. මෙසේ වන්ට තා විසින් පූර්වයෙහි කුමන අකුසල කර්මයක් කරණලද්දේදැයි විචාළේය. මෙසේ තෙරුන්වහන්සේ විසින් විචාරණලදුව ඒ ප්‍රෙතතෙම ගාථාව කින් කියන්නේ–

"කායෙන සං යතො ආසිං වාචා යාසිං අසං යතො
තෙන මෙතා දිසො වණ්ණො යථා පස්සසි නාරදාති"

යනුහෙයින් "ස්වාමීනි පෙර මම කාය සංයමයෙන් යුක්තවීමි. වාක් සංයමයෙන් යුක්තනුවූයෙමි. නාරද ස්ථවිරයනි නුඹ වහන්සේ මාගේ ශරීරය දක්නෙහිවේද කාය සංයමය ඇතිවූ කුසල කර්මයෙන් එබඳු ශරීර වර්ණය ඇතිවූයෙමි. වාක් සංයමය නැතිවූයෙන් සූකර මුඛය ඇතිවූයෙමි" කීහ. මෙසේ ඒ ප්‍රෙත තෙම තෙරුන්වහන්සේ විසින් විචාරණලදුව ඒ ප්‍රවෘත්තිය කියා එයම කාරණාකොට තෙරුන්වහන්සේට අවවාද දෙන් නේ මේ ගාථාව කීහ.

"තන්තාහං නාරද බ්‍රෑමිසාමං දිඨ්මිදංතයා
මා කාසි මුඛ සා පාපං මාමෙඛා සූකර මුඛා අහුති."

තවද "නාරද ස්ථවිරයෙනි මම නුඹවහන්සේට කියමි. මාගේ මේ ගල වළඹයහි පටන් යට මනුෂ්‍ය සටහණ ඇතිබව හා ගල වළඹයෙන් මත්තෙහි සූකර සටහන් ඇතිබවත් නුඹවහන්සේ විසින් තෙමේම දක්නාලද්දේවන. එහෙයින් මුඛයෙන් එරුෂ

වචන කීම් ආදි පව්කම් නොකළ මැණව. එසේකොට මාසේම සූකර මුඛය ඇතිනොවූව මැනවැ"යි කීහ. ඉක්බිත්තෙන් ආයුෂ්මත් නාරදතෙරුන්වහන්සේ රජගහනුවර පිඬුසිගාඇවිද දන් වළඳ පෙරළා වැඩිසේක් සිව්වණක් පිරිස් මැද වැඩහුන් ශාස්තෘන්වහන්සේට එපවත් සැළකෙළේය. ශාස්තෘන්වහන්සේ "නාරද මා විසින් ඒප්‍රේතතෙම පළමුවෙන්ම දක්නාලද්දැ"යි වදරා අනෙකාකාරයෙන් ලාමකවූ වාක්දුශ්චරිත නිශ්‍රිතවූ ආදීනවයද වාක් සුචරිත ප්‍රතිසංයුක්ත ආනිසංසයද ප්‍රකාශකර මින් ධර්ම දෙශනාකළසේක. ඒ ධර්මදෙශනා තොමෝ සම්ප්‍රාප්ත පිරිසට සාර්ථකවූයේය.

( ප්‍රේතවස්තු ප්‍රකරණය )

101. කිවොත් වැඩක් නැති බස් ඝොර නිරයෙහි බේ
මහත් කුරිරු දුක් විඳ යළි අවොත් මොබේ
කිවත් සැබෑ නොගනිති ඔහුගෙ බස් සබේ
ගෙවත් සසර දුක් මෙම නොකියතොත් සැබේ

වැඩක් නැති බස්, සම්ඵප්‍රලාප වචන; කිවොත්, කථනය කළොත්; ඝොර නිරයෙහිබේ, ඝෝරවූ නරක ගර්භයෙහි; මහත්, මහත්වූ; කුරිරු, ක්‍රෑරවූ; දුක්විඳ, දුක්ඛ විඳිනයකොට; යළි, නැවත; මොබේ අවොත්, මෙලොවට ප්‍රත්‍යසන්ධි වශයෙන් ආයේවීනම්; ඔහුගෙ බස්, ඒ පුද්ගලයාගේ වචනය; සබේ, (පණ්ඩිත) සභාවෙහි; කිවත්, කී කල්හි; සැබෑ නොගනිති, සත්‍යයයි පිළිනොගනිති; මෙම නොකියතොත්, මේ (සම්ඵප්‍රලාප වචන) කථනය නොකරන්නේවීනම්; සැබේ, සැබවින්; සසර දුක් ගෙවත්, (ඔව්හු) සංසාර දුක්ඛය ගෙවන්නාහුමය.

කිවත් සැබෑ නොගනිති ඔහුගෙ බස් සබේ—

85 වෙනි කවෙහි සම්ඵප්‍රලාප ආදීනව බලනු.

102. අන් සතු දෙයක් වේවයි සිතුව තමහට
ඉන් දුගතියෙහි දුක් විඳ අව මේ ලොවට
උන් සිතුවා සිදුනොමවෙයි සිතූ ලෙස ට
මින් මතු සිතක් නොසිතව් එවැනි පවකට

අන්සතු දෙයක්, පරසන්තක වස්තුවක්; තමහටවේවයි, තමහට අත්වේවයි; සිතුව, චින්තනය කළහොත්; ඉන්, ඒ හේතුවෙන්; දුගතියෙහි, දුර්ගතියෙහි; දුක්විඳ, දුක් අනුභවකොට; මෙලොවට අව, මේ ලෝකයට (නැවත) ආකල්හි; උන් සිතුවා,

ඔවුන්ගේ චිත්තාභිප්‍රාව; සිතුලෙසට, සිත් වූපරිද්දෙන්; සිදුනොම වෙයි, සිද්ධනොවන්නේමය; මිත්මතු, මෙයින් මත්තෙහි; එවැනි පවකට, එබඳු පාපයකට; සිතක්, චිත්තයක්; නොසිතව, චින්තනය නොකරව්.

**උන් සිතුවා සිදුනොමවෙයි සිතුලෙසට—**

86 වෙනි කවෙහි අභිධ්‍යාවෙහි ආදීනව බලනු.

**103.** බෝවාද හස් පැසවන නිරය වෙන වෙන<br>
වැපාද නම් රුදු මනබව නපුරු වන<br>
ආබාද දුක් විඳුවන උපනුපන් තැන<br>
වැපාද යක් නොසිතව දූන දූන සිතින

බෝවාදහස්, බොහෝ වර්‍ෂසහස්‍රයන්; නිරය, නරකයෙහි; වෙන වෙන පැසවන, වෙන වෙනම පචනය කරවන්නාවූ; වැපාදනම්, ව්‍යාපාදනම්වූ; මන රුදුබව, චිත්ත රෞද්‍රභාවය; නපුරුවන, අයහපත්වන්නේය; උපනුපන් තැන, උපනුපන් තන්හි; ආබාදදුක් විඳුවන, ව්‍යාධි දුඃඛයන් විඳිනය කරවන්නාවූ; වැපාදයක්, ව්‍යාපාදයක් (හෙවත් ද්වේෂ චින්තනයක්); දූනදූන, දූනදූනම; සිතින නොසිතව, චිත්තයෙන් චින්තනය නොකරව.

**ආබාද දුක් විඳුවන උපනුපන් තැන—**

87 වෙනි කවෙහි ව්‍යාපාදයෙහි ආදීනව බලනු.

**104.** කලක් නිරා දුක් විඳ විටෙක ගොඩ දුමු<br>
නොයෙක් රෝග අටගෙණ ගතවෙයි අරිමු<br>
උදක් නුවණ නැතිවෙයි සිතවෙයි කිලුමු<br>
මෙවක් පටන් විසමෙන් සිතව මිසදිමු

කලක්, (දීර්‍ඝ) කාලයක් මුලුල්ලෙහි; නිරාදුක්විඳ, නරක දුඃඛ විඳිනයකොට; ගොඩ දුටු විටෙක, (නරකයෙන් මිදී) මනුෂ්‍යාත්ම භාවයක් ලැබගත් කලෙක; නොයෙක් රෝග, අනෙකවිධ ව්‍යාධීන්; අටගෙණ, වැළඳ; ගත අරිටුවෙයි, ශරීරය අරිෂ්ටවන්නේය; උදක්, විශෙෂවශයෙන්; නුවණනැතිවෙයි, අඥානවන්නේය; සිත, චිත්තය; කිලුටුවෙයි, කලිෂ්ටවන්නේය; මෙවක්පටන්, මෙතැන් සිට; මිසදිටු, මිථ්‍යාදෘෂ්ටිය; විසමෙන් සිතව, විෂයක්මෙන් චින්තනය කරව; (සලකව.)

**නොයෙක් රෝග අටගෙණ ගතවෙයි අරිමු—උදක් නුවණ නැතිවෙයි සිතවෙයි කිලුමු—**

88 වෙනි කවෙහි මිථ්‍යාදෘෂ්ටියෙහි ආදීනව බලනු.

පස්පව්වලට සහ එකොළොස් අකුසලයන්ට අයත්වූද, අකුසල්දසයක්කොට ගණිනු ලබනකල, කාමමිථ්‍යාචාරයෙහිම ඇතුලත් වන්නාවූද මද්‍යපානය පිළිබඳවද සංක්ෂෙපවිස්තරයක් මෙහි සඳහන්කරණු ලැබේ.

**මද්‍යපානය**—ප්‍රමාදයට කාරණාවූ මත්පැන් පානයකිරීමයි. සුරනම් වැද්දෙකු විසින් පළමුවෙන් සොයාගත් බැවින් මත්වනද්‍ර සුරායයි කියනු ලැබේ. ඒ වනාහි පිට්ඨ සුරාය, පූව සුරාය, ඕදනිය සුරාය, කිණ්ණපක්ඛිත්ත සුරාය, සම්භාර සංයුක්තායයි කියා පංචප්‍රකාරවේ. ඒ පංචප්‍රකාරවූ සුරාවගේම විශෙෂවූ මෙරයද පුෂ්පාසවය, ඵලාසවය, ගුලාසවය, මධ්වාසවය, සම්භාර සංයුක්තායයි පංචප්‍රකාරවේ. පිට්ඨසුරාව නම්, පිටි භාජනයෙහි බහා එයට සෑහෙන පැන් වත්කොට මත්ගාකරණලද්දේය. පූවසුරා නම්, කැවුත් වගී පල්කොට සාදගන්නා වගීයි. ඕදනිසසුරා නම් බත්වගී පල්කොට පෙරාගන්නා දෙයකි. කිණ්ණපක්ඛිත්තසුරා නම්, රාමණ්ඩිදමා කරණලද්දේය. සම්භාරසංයුක්තා නම්, තෙලලි අබ ආදි නොයෙක් ද්‍රව්‍යයන් බහා කරණලද රාසි. මීමල් තල්පොල් ආදීන්ගේ පුෂ්පරසය කල්යවාගත්තේ පුෂ්පාසව නම්වේ. කොස් ආදීන්ගේ ඵලරස යෙන් කරණලද්දේ ඵලාසව නම්වේ. මුද්‍රිරපපලම් රසය මධ්වාසව නම්වේ. උක්රසය ගුලාසව නම්වේ. අරළු, බුළු, තෙලලි කටුක භාණ්ඩාදි නොයෙක් සම්භාරයන්ගේ රසය කල්යවා ගන්නාලද්දේ සම්භාරසංයුක්තානම් වේ.

**සුරාමෙරයෙහි අඞ්ග:-**

“සුරා භවෙ පාතු කාමො අජ්ඣොහරණප්පයොගතා,
තෙනෙව අජ්ඣොහරණං සුරාපානස්ස චාතුරො.

සුරාවක් බව දැනීමද, පීමට කැමති සිත් ඇති බවද, බොනු පිණිස කරණ ප්‍රයොගයද, ගත්ලෙසින්ම පානයකිරීමදැයි මද්‍යපානයෙහි සිව් අංගයෙක් වන්නේය.

රා බව් බොන රිසි දූ
බොන තැත් ඇතිව පීම දූ
මද්‍රහමෙර බොනු දූ
සතර අඟකින් යුතුව වේ සි දූ

( කාව්‍යශෙඛරය )

**මද්‍යපානයෙහි ආදීනව—**

"උම්මත්තකා විගත ලජ්ජ ගුණා භවන්ති
දීනා සදා ව්‍යසන සොක පරායනා ච
ජාතා භවෙසු විවිධෙසු විරූපදෙහා
පීත්වා හලාහල විසං ච සුරා පිපස්සු

යම් කෙනෙක් හලාහල විෂයක් බඳු සුරාපානය කරණ ලද්දේද? ඔහු නරකයෙහි ඉපිද අනේකවර්ෂ සහස්‍රයෙහි පැසී එයින් චුතව මිනිස්පියක් ලද කල්හි උන්මත්තවෙයි, ලජ්ජා රහිතවෙයි, ගුණ හීනවෙයි, දීනවෙයි, දුඃඛිතවෙයි සදාකල්හි ඤාති ව්‍යසනාදීන් යුක්තව ශෝක පරිදෙව ආදි කායික චෛතසික දුඃඛයන්ගෙන් පීඩා විඳින්නේවෙයි. අනේක ජාතිවල විරූපදෙහයෙන් යුක්තවේ.

"ඡඛො මෙ ගහපති පුත්ත ආදීනවා සුරාමෙරය මජ්ජපමාදට්ඨානානුයොගෙ සන්දිට්ඨිකා ධනං ජානි, කලහප්ප වඩ්ඪනී, රොගානං ආයතනං, අකිත්තිසංජනනි, කොපීනං නිදංසනී, පඤ්ඤාය දුබ්බලීකරණී, ඡට්ඨං පදං භවති, ඉමෙ ඛො ගහපති පුත්තඡ ආදීනවා සුරාමෙරය මජ්ජපමාදට්ඨානානු යොගෙ," එම්බා ගෘහපති පුත්‍රයාණනි, මත්ව ප්‍රමාදවීමට කාරණාවූ රහමෙර පිංමෙහි නැවත නැවත යෙදීමෙහි මේ දෝෂයෝ සදෙනෙක්වෙති 1. තමා විසින් ප්‍රිය වස්තූසින් බැලියයුතු මුතු මැණික් ආදි වස්තුව විනාශවේ. 2. කලහවඩන්නීය. 3. වසනු රෝගාදී ඒ ඒ රෝගයන්ගේ ඉපදීමට කෙතක් වන්නේය. 4. අයසඅකීර්තිය උපදවන්නීය. 5. ලැජ්ජාව කාරණකොටගෙණ වැසියයුතු අංග ප්‍රත්‍යඞ්ගයන් විවෘතකරන්නීය. 6. ප්‍රඥව දුර්වලකරන්නීය. මොව්හු සදෙන වනාහී මත්වීමෙන් ප්‍රමාදයට කාරණාවූ රහමෙර පානය කිරීමෙහි දෝෂයෝ සදෙන නම් වෙති.

( සිගාලෝවාදසූත්‍රය )

"සුරාපානං භික්ඛවෙ ආසෙවිතං භාවිතං බහුලීකතං නිරය සංවත්තනිකං හොති, තිරච්ඡාන යොනි සංවත්තනිකං හොති, පෙත්ති විසය සංවත්තනිකං හොති, යො සබ්බලහුසො සුරාමෙරය පානස්ස විපාකො මනුස්සභූතස්ස උම්මත්තකභාව සංවත්තනිකො හොති." මහණෙනි, ආසෙවිත භාවිත බහුලීකෘත කරණලද සුරාපානයතෙම නරක දුකට පමුණුවන්නේය, තිරිසන් දුකට පමුණුවන්නේය, ප්‍රේත දුකට පමුණුවන්නේය,

මෙසේ නරකාදි සතර අපායෙහි ඉපිද නොයෙක්වා දහස් මුළුල්ලේ මහත් දුක් විඳ පව් ගෙවී ගියකල එයින් මිදී යම්කිසි පින්කම් සහායකින් මිනිසත්බව ලදහොත් ශෙෂව සිටි සුරාපාන අකුශලයාගේ විපාකයෙන් උපනුපන් ජාතිවල උමතු බවට පමුණුවන්නේය.

"තිදිවා වරණං තිමලප්පභවං තිභවස්සහිතං තිජනාවමතං
තිවිධස්ස පිදුච්චරිතස්සහිතං තිභවුබ්භවනාසන නායකරං"

සුරා දිව්‍යලොකයට ආවරණය, රාගාදීනට ප්‍රභවය, තුන්භවයට පිහිටය, තුන් මහා පුරුෂයන් විසින්ගර්හිතය, ත්‍රිවිධ දුශ්චරිතයට කාරණය, තුන්ලොවට පිහිටවූ සස්නට විනාශ කරයි.

(ධර්මප්‍රදීපිකාව)

105. බ ව යෙ න් බවයෙහි කෙලෙසුන් නොයෙ කී
නො ප ද න් විඳිනා දුක් දන නිසැ කී
ස ස රි න් ගොඩ නැගුමට මුනිඳුන් කී
ලෙ ස පි න් පවසමි ඇසුවොත් යෙහෙ කී

බවයෙන් බවයෙහි, භවයක් පාසා; නොයෙකී කෙලෙසුන්, අනෙකවිධ කෙලශයන්නිසා; නොපද, නුඹලා; දූත් විඳිනා, මෙතල්හි විඳින්නාවූ; දුක්, දුක්ඛයන්; නිසැකී, සංකාරහිතව; දන, ජනතාය කොට; සසරින් සංසාරයෙන්; ගොඩ නැගුමට, එතරවීම පිණිස; මුනිඳුන් කී ලෙස, මුනීන්ද්‍රයාණන්වහන්සේ විසින් දෙශනාකළ පරිද්දෙන්; පින්, පුණ්‍යයන්; පවසමි, ප්‍රකාශකරමි; ඇසුවොත්, (ඒ) ශ්‍රවණයක්ලොත්; යෙහෙකී, යහපති.

පින් —

"පුඤ්ඤන්ති රාගාදී නනතු පටිපක්ඛා හි චෙතනා
පඤ්ඤාදි ගුණ සංයුත්තා විසෙසදයා සුඛ දායිකා."

පුඤ්ඤංඉති, පින් නම්; රාගාදිනංතු, රාගාදීන්ට; පටිපක්ඛා, ප්‍රතිපක්ෂවූ; පඤ්ඤාදි ගුණ සංයුත්තා, ප්‍රඥාදි ගුණයෙන් යුක්තවූ; සුඛදායිකා, (උපනුපන් තන්හි) සුවදෙන; චෙතනා, සිත් තොමෝමයයි, විසෙසදයා, දතයුත්තිය.

(සද්ධම්මොපායනය)

පුණ්‍ය වස්තුහු දෙළොසක් වෙත්. එනම්:-

"දානං සීලඤ්ච භාවනා පත්ති පත්තානුමෝදනා
දෙසනා සවණං පූජා වෙය්‍යාවච්චං පසංසනා
සරණං අනුස්සතිචෙව පුඤ්ඤවත්ථූනිවාරස"

1. දානය, 2. සීලය, 3. භාවනාය, 4. අනුන්ට පින්දීමය, 5. පින් අනුමෝදන්වීමය, 6. බණ කීමය, 7. බණ ඇසීමය, 8. පිදියයුත්තන් පිදීමය, 9. (අන් පා මෙහෙකළමැනවුන්ට) අන් පා මෙහෙකිරීමය, 10. පින්කරන්නහුගේ ගුණවර්ණනා කිරීමය, 11. තුණුරුවන් සරණයාමය, 12. බුද්ධානුස්මෘති ආදී සිහිකිරීමය යන මේ දොළසයි.

(සද්ධම්මෝපායනය)

"දන් සිල් බාව නා | කරණුද වතාව ත්
පින් දෙනු අනුමෝද නා | පින්කරු ගුණ වැනීම ත්
බණසනු දේස නා | සරණ සිහිවීම ත්
පිදිය යුත්තන් පුදනු සම නා | දෙලොස්පින් දන කරවයාපත්"

(කාව්‍යශේඛරය.)

"දන් සිල් බාව න ය | වතාවත් කර නුය
පින් දීම පින් ලබ න ය | පින්කරුන් ගුණ වණ නුය
බණ දෙසනු සව න ය | සරණ සිල් සිත නුය
පිදියයුතු කුලදෙටුන් පුද න ය | දෙළොස්පින්මේලෙසින්දරනුය"

(කව්දීපනිය)

106. අ න් හට අලසව නොකොට වි දා න ය
පි න් මිස අනිකක් නොකොට ප දා න ය
තු න් සිත පිරිසිදුකොට දුන් දා න ය
උ න් ගිය ගිය තැන ලැබෙයි නි දා න ය

අලසව, කුසීතව; අන්හට, අන්‍යයාහට; විදානය නොකොට, විධාන නොකොට; පින්මිස, පුණ්‍යයමුත්; අනිකක්, අන් කිසිවක්; පදානය නොකොට, ප්‍රධානකොට නොගෙණ; තුන්සිත, ත්‍රිවිධ චිත්තයන්; පිරිසිදුකොට, පරිශුද්ධකොට; දානයදුන, දන් දුන්නේ වීනම්; උන් ගිය ගිය තැන, ඔවුන් ගියගියතන්හි; නිදානයලැබෙයි, නිධානයක්සේ (ප්‍රතිඵල) ලැබෙන්නේය.

**තුන්සිත**—ත්‍රිවිධ චිත්ත නම්:-ආදි, මධ්‍ය, පර්‍ය්‍යවසානයන ස්ථානත්‍රයෙහි උපදනා චිත්තයෝයි.

"පුබ්බෙ ච දානා සුමනො—දදං චිත්තං පසාදයෙ
දත්වා අත්තමනො හොති—එසා යඤ්ඤස්ස සම්පදා"

දානා, දීමෙන්; පුබ්බෙ එව, පූර්වයෙහිම; සුමනො, සතුටු සිත් ඇත්තේද; දදං, දෙන්නේ; චිත්තං, සිත; පසාදයෙ, පහදවාන්

නේද; දක්‍ඛා, දී; අත්තමනොහොති, සතුටු සිත් ඇතිවේද; එසා, මෝෂතාමෝ; සඤ්ඤසස, යාගසඞ්ඛ්‍යාත දානයාගේ; සම්පදා, පරිපූර්ණතාවන්නීය.

( අඞ්ගුත්තරනිකාය )

**දානය**—දානයතෙම දසපාරමිධර්මයන් අතුරෙන් පළමුවන පාරමි ධර්මය වන්නේය. දසරාජ ධර්මයන් අතුරෙන් පළමුවෙනි රාජ ධර්මය වන්නේය. සතර සඞ්ග්‍රහවස්තූන් අතුරෙන් පළමුවෙනි සඞ්ග්‍රහවස්තුව වන්නේය. තුන් පුණ්‍ය ක්‍රියා වස්තූන් අතුරෙන් පළමුවන පුණ්‍ය ක්‍රියා වස්තුව වන්නේය. හැම මහබෝසතුන් හසල මාර්ගයෙකි. හැම බුදුන්ගේ වංශයි.

**දසදානවස්තු**—

"අන්නං පානං වත්ථං, යානං මාලා විලෙපනං
ගන්ධා සෙය්‍යා පදීපෙය්‍යං, දාන වත්ථු සියුං දස."

ආහාරය, නිරවද්‍යපාන වර්ගය, ආවාසය, වස්ත්‍රය, යානවාහනය, පුෂ්පය, (ශරීරාලේපය පිණිස සාදනලද) විලේපනය, (කස්තුරි, කපුරු, සඳුන් ආදී) සුගන්ධය, (ඇඳපුටු කොට්ටමෙට්ට ඇඳ ඇතිරිලි ආදී) සයනාසනය, තෙල් පහන් ආදිය යන මේ දශය දශදාන වස්තුහුනම් වෙත්.

"බත් පැන් වත් යහන
මල් සුවඳ සහ විලවුන
පහනට තෙල් විම න
මෙලෙස දන්වත් සමග වාහන"

( කාව්‍යශෙඛරය )

**දන් දෙන්නවුන්ගේ ප්‍රභෙද**—දාන දාසය, දානසහාය, දානපතියයි දන් දෙන්නවුන්ගේ ත්‍රිභෙදයෙක්වේ.

**1. දානදාස**—යමෙක් මධුරදෙය අනුභවකොට අමධුරදෙය අන්‍යයන්ට දෙන්නේද හේ දානදාසනම්වේ.

**2. දානසහාය**—යමෙක් තමේ මධුරවූහෝ අමධුරවූදෙය තමා වළඳන නියායෙන් අන්‍යයන්ටත්දේද හේ දානසහායනම්වේ.

**3. දානපති**—යමෙක් යම්තම් දෙයකින් යැපී අනුන්ට මිහිරි දෙය දෙන්නේද හේ දානපති නමවේ.

**ත්‍රිවිධ ශුද්ධිය**—වස්තු ශුද්ධිය, චිත්ත ශුද්ධිය, ක්‍ෂෙත්‍ර ශුද්ධිය යන ත්‍රිවිධ ශුද්ධියෙන් යුක්තව දෙන දන් මහත් ඵලවේ.

1. **වස්තුශුද්ධිය**—මිථ්‍යා ආජීව, මිථ්‍යා කර්මාන්ත ආදියෙන් තොරව දැහැමෙන් සෙමෙන් කායශක්තියෙන් උපයා දන්දීම වස්තුශුද්ධි නම්වේ.

2. **චිත්තශුද්ධිය**—දන්දෙමියි සිතූ තැන් පටන් දෙනතෙක් දක්වා සොම්නස් උපදවා දෙනවිටද සොම්නස් උපදවා දන්දී අනතුරෙහිද සොම්නස් උපදවා මෙසේ තුන්සිතම පහදා දන්ගන්නවුන්කෙරෙහි කුළුණු උපදවා මේ මට මතු විපාකදායකයයි අදහා නුවණින්යෙදී දානවස්තුවෙහි ලොභය හැරපියා අලොභයෙන් යුක්තව දන්දීම චිත්තශුද්ධි නම් වේ.

3. **ක්ෂෙත්‍රශුද්ධිය**—බුදුන්ට හෝ පසේබුදුන්ට හෝ රහතන්ට හෝ නිවණට යන මග සිටි බුදුන් වදාළ ශික්ෂාපදවූ පරිද්දෙන් පිළිපදනා මහ සඟනට හෝ දන්දීම ක්ෂෙත්‍රශුද්ධිනම්වේ.

**දානයාගේ ප්‍රභෙද**—උත්තම දානය, මධ්‍යම දානය, අධම දානයයි දානයාගේ ප්‍රභෙද තුනක් වේ.

**උත්තමදාන**—සිල්වත්ව සිට සිල්වතුන්ට දෙන දානයයි.

**මධ්‍යමදාන**—දුශශීලව සිට සිල්වතුන්ටද සුසීලව සිට දුශශීලයන්ටද දෙන දානයයි.

**අධමදාන**:—දුශශීලව සිට දුශශීලයන්ට දෙන දානයයි,

**සප්තවිධ සඞ්ඝික දානය**—

1. "බුද්ධ ප මුඛෙ උභතො සංඝෙ දානං දෙති, අයං පඨමා සංඝගතා දක්ඛිණා"

   දිවමන් බුදුන් ප්‍රමුඛ දෙපස සඟරුවන් වඩා හිඳුවා යමෙක් දන්දේද මෙය පළමුවෙනි සංඝගත දක්ෂිණාවනම් වන්නීය,

2. "තථාගතෙ පරිනිබ්බුතෙ උභතො සඞ්ඝෙ දානං දෙති, අයං දුතියා සංඝගතා දක්ඛිණා"

   බුදුන් පිරිනිවිකල්හි උභය සඟරුවන් කෙරෙහි දන්දේද මෙය දෙවෙනි සංඝගත දක්ෂිණාවනම් වන්නීය.

3. "භික්ඛු සඞ්ඝෙ දානං දෙති අයං තතියා සංඝගතා දක්ඛිණා"

   භික්ෂු සඞ්ඝයා කෙරෙහි (සංඝිකකොට) දන්දේද මෙය තෙවෙනි සංඝගත දක්ෂිණාවනම් වන්නීය.

4. "භික්ඛුණී සඞ්ඝෙ දානං දෙති අයං චතුත්ථි සංඝගතා දක්ඛිණා"

   භික්ෂුණී සඞ්ඝයාකෙරෙහි දන්දේද මෙය සිව්වැනිවූ සංඝගත දක්ෂිණාවනම් වන්නීය.

5. "එතනකා මෙ භික්ඛුච භික්ඛුණියොච සංඝතො උද්දිස්ස ථාති දනං දෙති, අයං පඤ්චමි සංඝගතා දක්ඛිණා"

මටදෙපස සඟුරුවන් කෙරෙන් මෙතෙක් භික්ෂූන්ද භික්ෂුණීන්ද උදෙසව්යයි (නොහොත්) මෙතෙක් භික්ෂු භික්ෂුණී සංඝයා නිමන්ත්‍රණය කරදුන මැනවැයි ආරාධනාකොට දන් දේද මෙය පස්වැනිවූ සංඝගත දක්ෂිණාව නම් වන්නීය.

6. එතනකා මෙ භික්ඛූ සංඝතො උද්දිස්සථාති දනං දෙති අයං ජට්ඨා සංඝගතා දක්ඛිණා"

මෙතෙක් භික්ෂූන් මට සංඝයාවහන්සේ කෙරෙන් නිමන්ත්‍රණයකොට වඩා ගෙනෙවයි කියා (දනයට පූර්වභාගයෙහි සංඝ නමින් පවරා සංඝගතකොට) දන්දේද මෙය සවැනිවූ සංඝගත දක්ෂිණාව නම් වන්නීය.

7. එතතකා මෙ භික්ඛුණියො සංඝතො උද්දිස්සථාති දනං දෙති අයං සත්තමි සංඝගතා දක්ඛිණා"

මෙතෙක් භික්ෂුණීන් මට සංඝයා කෙරෙන් නිමන්ත්‍රණය කොට වඩා ගෙනෙවයි කියා (යථොක්තපරිද්දෙන්) දන්දේද මෙය සත්වැනිවූ සංඝගත දක්ෂිණාව නම් වන්නීය.

මෙම සප්තවිධ සඞ්ඝිකදනයන් අතුරෙන් මෙකල්හි දිය හැක්කේ නෙවෙනි සවෙනි දනවය පමණකි.

**කඨිනදනය**—මෙය වනාහි වස්සාන සෘතුවේ චීවරමාසයේදී භික්ෂූන් විසින් පිළිගතුලබන වස්ත්‍රයකි. ආමිස දනයන් කෙරෙන් කඨිනදනය මහත් ආනිශංස දයකවේ. මෙම දනය දෙන දයකයා විසින් තුන්සිවුරු අතුරෙන් තමහට දියහැකිවූ එකකට පොහොනා වස්ත්‍රයක් පෙරවස් විසූ තැනකදීම සංඝයාට පැමිණවියයුතුයි. වස්පවාරණයකළ වස්සාන සෘතුවේ අන්තිම මාසයේදීම දියහැකිවේ. අන්කලක දියනොහැකියි. භික්ෂූන් විසින් එදවස්හිම කපා මසා පඬුපොවා ඇතිරිය යුතුයි.

**කාලදනය**—යමෙක් ආගන්තුකයාහට දේද, ගමනට සැරසුන භික්ෂුහටදේද, ගිලන්හටදේද, * දුර්භික්ෂයෙහි දේද; අග්‍රසස්‍ය අග්‍රඵල (අළුත්බත් අළුත්ඵල) පළමුකොට සිල්වතුන් කෙරෙහි පමුණුවාද මේ වනාහි කාලදනයයි කියනුලැබේ.

---

* පැලවියෙහි දෙන දනද දුර්භික්ෂ දනයක් වැනිවෙයි. එහෙයින් පැලවියෙහි දෙන දනය පසලොස්වක් දිනයෙහි දෙන දනටවඩා මහත්ඵල බව දෙශනාවෙන් පෙණේ.

**අසත්පුරුෂදාන**—යමෙක් දන් නොසකස්කොටදේද දෙය්‍යධර්මයෙහිද දක්ෂිණාහීයන් කෙරෙහිද අගෞරවයෙන් දේද පරහස්තයෙන් දෙවාද දමා පියන දාසක් සෙයින් කිසිකලෙක්හි දේද, ආගාමිඵලයෙහි ආදරනැතිවදේද මේ අසත්පුරුෂ දානනම්වේ.

**සත්පුරුෂදාන**—යමෙක් දන් සකස්කොටදේද, දෙය්‍යධර්මයෙහි ඔජස් ඇතිකොට දක්ෂිනාහීයන් සොයා තෙණදේද, ස්වහස්තයෙන් දේද, නිරන්තරයෙන් දේද, කර්මඵල අදහා දේද මේ සත්පුරුෂ දානනම් වේ.

**දානානිසංස**—"පඤ්චිමෙ භික්ඛවෙ දානෙ ආනිසංසා, කතමෙ පඤ්ච? බහුනො ජනස්ස පියො හොති මනාපොසන්තො සප්පුරිසා භජන්ති, කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති, ගිහිධම්මා අනපෙතො හොති, කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති, ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච දානෙ ආනිසංසා."

මහණෙනි, දන්දීමෙහි අනුසස් පසෙක්වෙත්. කවර පසෙක්ද යත්? 1–බොහෝ දෙනහට ප්‍රියවෙයි. 2–සජ්ජනයන්ගේ සමාගමය ලැබෙයි. 3–ඔහුගේ යසස් දසදිසායෙහි පැතිර බඹලොව දක්වා නැගෙයි. 4–ගිහිගෙයි වැසියන්ගේ ධර්මයෙන් අනපෙත වෙයි. 5–ශරීර භෙදයෙන් උත්තරයෙහි (මරණින් මත්තෙහි) ස්වර්ගී පදප්‍රාප්තවෙයි.

"දානංහි ලොකෙ සක්කසම්පත්තිං දෙති, මාරසම්පත්තිං දෙති, බ්‍රහ්මසම්පත්තිං දෙති, චක්කවත්ති සම්පත්තිං දෙති, සාවක පාරමී ඤාණං දෙති, පච්චෙකබොධි ඤාණං දෙති, අභිසම්බොධි ඤාණං දෙති,"

දානයතෙම සක්‍රසම්පත්තියද, මාරසම්පත්තියද, බ්‍රහ්මසම්පත්තියද, චක්‍රවර්ති රාජ්‍යසම්පත්තියද, අග්‍ර ශ්‍රාවක පදවියද, පසේ බුඩත්වයද, ලොව්තුරා බුඩත්වයද යන මේ සප්තවිධ සම්පත්ති යම සිඩකරන්නේය. එහෙයින් දානයෙන් සිඩනොවන ලෞකික ලොකොත්තර සම්පත්තියෙක්නම් නැති. කාමලොකයෙහි සැපය ස්වර්ගයෙන්ද නිර්වාණ සැපය ප්‍රාර්ථනා වශයෙන්ද සිඩවේ මැයි.

"අන්නදො බලදො හොති—වත්ථදො හොති වණ්ණදො
යානදො සුඛදො හොති—දීප දො හොති චක්ඛුදො."

අන්නදෙ, ආහාරදෙන පුද්ගලතෙම; බලදෙ හොති, ශක්තිය දෙන්නේවේ. වත්ථදෙ, වස්ත්‍ර දානයකරන්නේ; වණ්ණදෙ හොති, ශරීරවර්ණයදෙන්නේවේ. යානදෙ, ඡත්‍රොපාහානාදීන් දෙන තැනැත්තේ; සුඛදෙ හොති, සැප දෙන්නේ වේ. දීපදෙ, ප්‍රදීපදෙන තැනැත්තේ; චක්ඛුදෙහොති, චක්ෂුසදෙන්නේවේ.

"සො ච සබ්බද දෙහොති—යො දදාති උපස්සයං
අමතං ද දෙව සො හොති—යො ධම්ම මනුසාසති."

යො, යමෙක්තෙම; උපස්සයං, ආවාස; දදාති, දේද; සො, හෙතෙම; සබ්බද දෙ හොති, (සව්කී) සියල්ලම දෙන්නේ වේ. (ආවාස සෙනසුන් දෙන තැනැත්තේ ඒ සමග බලවර්ණාදී සියල්ලම දෙනහෙයින් ඔහුට කර්මානුරූප විපාක වශයෙන් ඒ සියල්ලම ලැබෙයි.) යො, යමෙක්තෙම; ධම්මං අනුසාසති, ධර්මානුශාසනාකෙරේද; සො, හෙතෙම; අමතං දදෙහොති, අමෘතය දෙන්නේ වේ.

(සංයුත්තනිකාය)

107. ඇ තු ළ ට වැද ගෙය ඇවිලෙන ගි න් නේ
පි ට ත ට හළ බඩුමය වැඩව න් නේ
එ සි ත ට ගෙණ ලොබනොව දන් දෙ න් නේ
ත ම හ ට එමවද මතු පලදෙ න් නේ

ගෙය ඇතුළට වැද, ගෘහාභ්‍යන්තරයට ප්‍රවිෂ්ටව; ගින්නේ ඇවිලෙන, අග්නිය ඇවිලෙනකල්හි; වැඩවන්නේ, ප්‍රයෝජනවත් වන්නේ නම්; පිටතවහළ, (ගෙයින්) බැහැරටගනුලැබුවාවූ; බඩුමය, භාණ්ඩ පමණක්මය; ඒ, එය; සිතටගෙණ, චිත්තග්‍රහණයකොට; ලොබනොව, අලොභව; දන්දෙන්නේ, දන්දීමකරන්නේය; තමහට, තමන්ට; මතු, අනාගතයෙහි; පලදෙන්නේ, විපාකදායිවන්නේ; එමවද, ඒ (දානමය කුසලකර්මය) වද.

ඇතුළට වැද ගෙය ඇවිලෙන ගින්නේ—පිටතටහළ බඩුමය
වැඩවන්නේ—

"ආදිත්තස්මිං අගාරස්මිං—යං නීහරති භාජනං
තං තස්ස හොති අත්ථාය—නොච යං තත්ථ ඩය්හති
එව මාදි පිතො ලොකො—ජරාය මරණෙනච
නීහරෙථෙව දානෙන—දින්නං හොති සුනීහතං."

අගාරස්මිං, ගෙය; ආදිත්තස්මිං, (ගිනි) ඇවිළුණකල්හි; යං භාජනං, යම් භාණ්ඩයක්; නීහරති, (එයින්) මෑත්කෙරේද; තං, ඒ භාණ්ඩය; තස්ස, ඔහුට; අත්ථාය, ප්‍රයෝජන පිණිස; හොති, වේද; යං, යම් භාණ්ඩයක්; තත්ථ, එහි; ඩය්හති, දනු ලැබේද; (ඒ භාණ්ඩය) තොව, ප්‍රයෝජනය පිණිස නොවේද?

එවං, මෙසේ; ලොකො, ලොවැසිතෙම; ජරාය, ජරාව විසින්ද; මරණෙනච, මරණය විසින්ද; ආදිපිතො, දල්වන ලද්දේය. දෘතෙන, දීම් කරණකොටගෙණ; නීහරෙථෙව, මෑත්කරගත්තේමය; දින්නං, දෙනලද්ද; සුනීහතං හොති, මනාකොට මෑත්කරගන්නාලද්දේ වේ.

බැහැරගත් බඩු පමණක් ගේ හිමියාට ප්‍රයෝජනවත්වන්නාක්මෙන් දන මුඛයෙහි යොදනලද්ද පමණක් ලොවී ලොවිතුරා අර්ථසිද්ධිය පිණිස වේ.

( අඞ්ගුත්තරනිකාය )

**ඔබතම ගෙණි ලොබනොම දන් දෙන්නේ—තමහට එමවද මතු පලදෙන්නේ—**

"යෙ ධ ලද්ධා මනුස්සත්තං වදඤ්ඤූ වීතමච්ඡරා
බුද්ධෙ පසන්නා ධම්මෙ ච සංඝෙ ච තිබ්බගාරවා
එතෙ සග්ගෙ පකාසෙන්ති යත්ථ තෙ උපපජ්ජරෙ."

යෙ, යම්කෙනෙක්; ඉධ, මේ ලොකයෙහි; මනුස්සත්තං, මිනිසත්බව; ලද්ධා, ලැබ; වීතමච්ඡරා, පහවූ මසුරු මල ඇත්තාහු; බුද්ධෙ, බුදුන්කෙරෙහිද; ධම්මෙ ච, ධර්මයකෙරෙහිද; සංඝෙ ච, සඞ්ඝයාකෙරෙහිද; පසන්නා, ප්‍රසන්නාවූවාහු; තිබ්බගාරවා, (තෙරුවන් කෙරෙහි) මහත් ගෞරව ඇත්තාහු; වදඤ්ඤූ, දෙශනා කථා දන්නාහුද නොහොත් ප්‍රතිග්‍රාහකයන්ගේ වචනවල අදහස දන්නාහුද; එතෙ, (ඒ) මොව්හු; සග්ගෙ, ස්වර්ගයෙහි; පකාසෙන්ති (විමානප්‍රභායෙන්) ප්‍රකාශ වෙත්. (කුමන ස්වර්ගයෙහිදයත්) තෙ, ඔව්හුතුමූ; යත්ථ, යම් ස්වර්ගයෙක්හි; උපපජ්ජරෙ, උපදිත් නම් එහිය.

"සචෙ එනාති මනුස්සත්තං—අඩ්ඪෙ ආජායරෙ කුලෙ
චොලං පිණ්ඩා රතී ඛිඩ්ඩා—යත්ථාකිච්චෙජ්ජන ලබ්භති."

සචෙ, ඉදින්; මනුස්සත්තං, මිනිසත්බවට; එනාති, එත්නම්; අඩ්ඪකුලෙ, ආඪ්‍යකුලයෙක්හි; ආජායරෙ, උපදිත්; (ආඪ්‍යකුලෙ

කෙබඳුදයත්) චොලංපිණ්ඩා, කැම්ඇඳීම්ද; රතී, පස්කම්රතීද; ඛිඩ්ඩා, (කායිකාදී) ක්‍රීඩාද; යසං, යම්කුලයෙක්හි; අභිවෙජ්ජත, නිදුකින්; ලබ්භති, ලැබේද; (ඒ ආඪ්‍යකුලයෙහි උපදියි).

"පරසම්භතෙසු භොගෙසු වසවත්ති ච මොදරෙ
දිඨෙ ච ධම්මෙ ස විපාකො සම්පරායෙ ච සුගගතී."

පරසම්භතෙසු, අනුන් විසින් රැස්කරණලද; භොගෙසු, සම්පත්තීන්හි; වසවත්තීව, වසවර්තීනී දිව්‍යරාජයාමෙන් (අනුන් හා අනුන් සැපත් තමන් යටතෙහි පවත්වමින්); මොදරෙ, සතුටුවෙත්; (යම්සේ පරා විසින්, තමාගේ චිත්තාකාංක්ෂාපරිද්දෙන් නිර්මිතකරණලද රූපාදීයෙහි සුඛානුභවන වශයෙන් වසවත්තෙමේ සතුටුවේද එමෙන්ම මේ ලෙව්හිද ආඪ්‍යකුල ජයෝ අනුන් විසින් උපයනලද සම්පත්තීන්හි සුඛානුභවන වශයෙන් සතුටුවෙතියි සේයි;) දිඨෙව ධම්මෙ, ඉහාත්මභාවයෙහි; එසො විපාකො, මේ විපාකයි; සම්පරායෙච, පරලෙව්හිද; සුගගති, සුගතියෙහි උපදනේයි.

( සංයුත්තනිකාය )

108. බු දි න ට ගත් බත් පිඩ මිස වෙන නැ ත
ය දි න ට දන්දෙව මතුදුක් නොවිඳි ත
මෙ ම හ ට ඇත ඉතිරිය දෙමි යන සි ත
හැ ම ර ට රජසිරි සැප ලදුවත් නැ ත

බුදිනට ගත්, අනුභවය පිණිස ගත්තාවූ; බත්පිඩ මිස, භක්ත පිණ්ඩයහැර; වෙනනැත, වෙන කිසිවක් නැත්තේවීනමුත්; යදිනට, යාචකයන්ට; දන්දෙව, (එම බත්පිඩ) දානයකරව්; මතු, අනාගතයෙහි; දුක් නොවිඳිත, (ඒ හේතුවෙන්) දුකක් නොලබන්නේය; මහට, මාහට; මෙඇත, මෙපමණෙක් ප්‍රමාණය; ඉතිරිය, අවශෙෂයේ; දෙමි යන සිත, දානයකරමි යන චිත්තය; හැමරට, සියළුදෙශයෙහි; රජසිරි සැප, රාජ්‍යශ්‍රී සම්පත්; ලදුවත්, ලද්දේවීනමුත්; නැත, නොවන්නේය.

109. පි න් නොකරණ දුදනන් බස් නා ද
තු න් දෙස් මල දුරු කරයිත පා ද
ප න් සිල් නිති අටසිල් රැක පෝ ද
ඉ න් මොක් පුර පැමිණෙව් නොව බා ද

පින් නොකරණ, පුණ්‍යකර්ම නොකරන්නාවූ; දුදනන් බස්, දුර්ජනයන්ගේ වචන; නාදා, නොමඅදහා; තුන්දෙස් මල, (ලොභ, ද්වෙෂ, මොහ නමැති) ත්‍රිවිධ දෙෂ මලය; දුරුකර, දුරීභූතකොට; සිතපාදා, චිත්තප්‍රසාදකොට; නිති පන්සිල්, නිත්‍ය පඤ්චසීලයද; පෝදා අටසිල්, පොහෝ දිනයෙහි අෂ්ටාඞ්ග සීලයද; රැක, රක්‍ෂා කොට; ඉන්, ඒ හේතුවෙන්; බාදා නොව, බාධාවක් නැතිව; මොක් පුර පැමිණෙව්, මොක්‍ෂපුරයට ප්‍රවිෂ්ටවව්.

**සිල්**—"ශිරොර්ථයෙන් ශීලනම් වේ. ශීතලාර්ථයෙන් ශීලනම් වේ. ශලනාර්ථයෙන් ශීලනම් වේ. ශාලාර්ථයෙන් ශීලනම් වේ. යම්සේ ශිරස්ඡෙදකළ කල්හි සියලු ආත්ම භාවය විනාශයට යේද එසෙයින්ම ශීල භෙදවූකල්හි සියලු ගුණ ශරීරය විනාශයට යෙයි. ඒ හේතුවින් ගුණ ශිරශ් නෛරුක්තික විධීන් "ශීල" වේ. සර්ව්ක්ලෙශ පරිදාහ සන්සිඳුවන බැවින් ශීතලාර්ථයෙන් "ශීල" වෙයි. සර්වාකුශල ධර්මයන්ගේ ශලණසංවරණ කරණ බැවින් ශලනාර්ථයෙන් "ශීල" වෙයි. සර්වකුශල ධර්ම ප්‍රවෙශයට ශාලාවන බැවින් ශාලාර්ථයෙන් "ශීල" නම් වේ.

(ධර්මප්‍රදීපිකාව)

**ශීලය**—යනු හික්මීම යන අර්ථයි. හේ වනාහි ප්‍රභෙදවශයෙන් නොයෙක් ආකාර බැවි විසුද්ධි මාර්ග අටුවාවෙහි විස්තර විසින් දක්වනලද්දේමය. ඒ කෙසේදයත්? සරණශීලය, පඤ්චශීලය, බ්‍රහ්මචරිය පඤ්චමකශීලය, විකාලභොජන ෂට්ඨමකශීලය, ආජීවාෂ්ටමකශීලය, අෂ්ටාඞ්ග උපොසථශීලය, ගිහි දසශීලය, ප්‍රව්‍රජ්‍ය දසශීලය, උපසම්පදශීලය කියා වෙති.

**සරණශීලය**—දිවියතුත් මිසදිටු නොගෙණ තෙරුවන් පිහිටකොට විසීම **සරණශීල** නම් වේ,

**පඤ්චශීලය**—නම් පණිවා ආදී පඤ්ච දුශ්චරිතයන්ගෙන් හෙවත් පස්පවින් වැලැක්මයි. සතුන් නොමරම්, පරවසතුව නුදුන්නා නොගනිම්, පරදර සේවනය නොකරම්, බොරු නොකියම්, රහමෙර නොබොමියි සිතා ඒ සිත් තරකිරීම **පන්සිල්** නම්. පන්සිල් රැකීම නම් සැදැවඩා, සොම්නස්වඩා සිල්වතුන් වහන්සේකෙනෙක්වෙත හෝ උපාසකකෙනෙක්වෙත පැමිණ නැතහොත් දාගැබ් මහබෝ හෝ පෙතිපිළිම ලඟට එළඹ හෝ ඒ දිසාව බලා වැඳගෙන රත්නත්‍රය සරණගතව ඉක්බිති

1. පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
2. අදින්නාදානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
3. කාමෙසු මිච්ඡාචාරා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
4. මුසාවාදා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
5. සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි

1. මම සතුන් මැරීමෙන් වැළැක්මවූ ශික්ෂාපදය සමාදන්වෙමි
2. මම සොරකම්කිරීමෙන් වැළැක්මවූ ශික්ෂාපදය සමාදන්වෙමි
3. මම කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළැක්මවූ ශික්ෂාපදය සමාදන්වෙමි
4. මම බොරු කීමෙන් වැළැක්මවූ ශික්ෂාපදය සමාදන්වෙමි
5. මම මත්වීමට හා ප්‍රමාදයට කාරණාවූ (රහමෙර) මත්පැන් පීමෙන් වැළැක්මවූ ශික්ෂාපදය සමාදන්වෙමි යනුවෙන් සමාදන්ව මෙයින් එක ශික්ෂාපදයකුදු නොබිඳ යතනයෙන් ආරක්ෂාකිරීමයි.

**බ්‍රහ්මචරිය පඤ්චමකශීලය**—පඤ්චශීලයෙහි තුන්වන "කාමෙසු මිච්ඡාචාරා වෙරමණී" යන ශික්ෂා පදයවෙනුවට "අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං සමාදියාමි" කියා සමාදන්ව බ්‍රහ්මචර්‍ය්‍යාව නිරන්තරයෙන් රක්නාහුගේ ශීලය **බ්‍රහ්මචරිය පඤ්චමකශීල** නම් වන්නේය.

**විකාලභොජන ඡට්ඨමකශීලය**—පඤ්ච ශික්ෂාව සමාදන්වන කල්හි ඊටම "විකාලභොජනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි" යනුවෙන් "විකල් බොජුනෙන් හෙවත් ඉර අවරබූවාටපසු ආහාරයක් නොවළඳමි" කියා සමාදන්වන ශීලය **විකාලභොජන ඡට්ඨමකශීල** නම් වන්නේය.

**ආජීවාෂ්ටමකශීලය**—කයින් සිඩවන්නාවූ ප්‍රාණඝාත අදත්තාදාන කාමමිථ්‍යාචාර යන තුනින් හා වචනයෙන් සිඩවන්නාවූ මුසාවාද, පිසුනාවාච, ඵරුසාවාච, සම්ඵප්‍රලාප යන සතරින් වෙන්වීම හා අධර්ම වෙළඳාම් ආදියෙන් නුපදවනලද දූහැමින් සෙමින් උපයනලද වස්තුවෙන් දිවි පැවැත්වීමද යන මේ අට **ආජීවාෂ්ටමකශීල** නම් වන්නේය.

**අෂ්ටාඞ්ග උපොසථ ශීලය**—නම් පොහො දවස් ගෘහස්ථයන් විසින් රැක්කයුතු ශීලයයි. ඒ මේ උපොසථ ශීලය සමාදන්වන්නහු

විසින් පොහො දිනට ප්‍රථම දවස ස්වකීය ආහාරාදියට විධාන කටයුතු නිමවා තබා සිත එකඟකොටගෙණ වැස පොහොදින අරුණට පළමු නැගිට මුවදෙවන ස්නානය කිරීමාදියෙන් ශරීරය ශුද්ධකොටගෙණ සුදු වස්ත්‍ර හැඳ පෙරව උදයම භික්ෂුවක හෝ (භික්ෂුනියක හෝ) පෙළ පුහුණු උපාසකයෙකු හෝ උපාසිකාවක හෝ එක්තරා කෙනෙකුන් කෙරෙහි වාග්භෙද කොට පෞෂථාඞ්ග සමාදන් කටයුත්තේය. එසේ සමාදන්ව පෙහෙවස් වසනුවහු විසින් පර පීඩායෙන් යුක්ත කර්මාන්තය කිරීමෙන් හෝ කරවීමෙන්ද (සර්වඥයන්වහන්සේ විසින් එපාකර වදළ) දෙතිස් කථාවෙන්ද, මිථ්‍යා කල්පනාවලින්ද, මෛථුන චෙතනාවලින්ද, ඊර්ෂ්‍යා, ක්‍රොධ, මායා, සාඨ්‍යය, ස්තම්භ, මාන, ඡන්ද, කාම විතර්කාදී පාපචෙතනාවලින්ද දුරුව වාසයකළ යුතුයි. ස්වකීය රැකිරක්ෂා හා ගෙදරදොර අයවැය ගණන් බැලීම් ආදිය පිණිස ව්‍යාවෘතීන නොවිය යුතුයි. ගෙහි ලද අහර නිත්‍ය භක්තික භික්ෂුවක් හුසේ වලඳ විහාරයට ගොස් ධර්මශ්‍රවණය කිරීමෙන් හා භාවනා කිරීමෙන්ද දවස ගතකළ යුතුයි.

"සෙටයයි පෝදව ස
අද දවසම නොයෙක ලෙ ස
කටයුතු නම නිමෙව ස
කියා අළුයම නැගිට එදව ස

දුව්වුකා කී පෙ ර | ඇත මුනි උවසු පේ න
සනහා ගිහි සුවඳ හැ ර | අඬදනිව දී මුදුන න
මල් දුම් ගෙණ පව ර | දවරැකර නිය න
පුද තෙරුවන් නැමද බැතික ර | ගණුව පේවස්කර හැදුයි න"

( කාව්‍යශෙඛරය )

**අෂ්ටාඞ්ගශීලයෙහි ශික්ෂාපද:—**

1. පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
2. අදින්නාදානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
3. අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
4. මුසාවාදා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
5. සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං සමා
දියාමි
6. විකාලභොජනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
7. නච්චගීත වාදිත විසූකදස්සන මාලා ගන්ධ විලෙපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
8. උච්චාසයන මහාසයනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.

මෙයින්, 1, 2, 4, 5 වෙනි ශික්ෂාපදයන්ගේ අර්ථ මින් ඉහත පඤ්චශීලයෙහි කීහයින් දතයුතු.

3. අබ්‍රහ්මචරියයයි කියනු ලබන මෛථුන්දමෙහි හැසිරීමෙන් වෙන්වීමවූ ශික්ෂාපදය සමාදන්වෙමි.

6. විකාලභොජනයෙන් හෙවත් ඉර අවරවූවායින්පසු ආහාර අනුභව කිරීමෙන් වෙන්වීමවූ ශික්ෂාපදය සමාදන්වෙමි.

7. නැටීම්, නැටවීම්, හෝ නැටුම් බැලීම, ගී කීම, කියවීම හෝ ඇසීම, (බෙර දවුල් ආදිය) වැයීම, වැයවීම හෝ ඇසීමද, විසුලු දක්වීම හෝ බැලීමද, මල් ගඳ විලවුන් දැරීම හෙවත් මල් පැළඳීම හා සුවඳ ගැල්වීමද, (පලඳනාවන්හි) අඩුතැන් පිරීම් වශයෙන්කරණ සැරසීම හා ඡවිරාගකරණ වශයෙන් සැරසීම යන මේ ආදියෙන් වෙන්වීමවූ ශික්ෂාපදය සමාදන් වෙමි.

8. උස් ආසන මහආසන යන දෙක පරිභොග කිරීමෙන් වෙන්වීමවූ ශික්ෂාපදය සමාදන්වෙමි.

"පාණං න හානෙ නච දින්නමාදියෙ
මුසා න භාසෙ නච මජ්ජ පොසියා
අබ්‍රහ්මචරියා විරමෙය්‍ය මෙථුනා
රත්තිං න භුඤ්ජෙය්‍ය විකාල භොජනං

මාලා න ධාරෙ නච ගන්ධ මාචරෙ
මඤ්චෙ ඡමායංච සයෙථ සන්ථතෙ
එතං හි අට්ඨඞ්ගික මාහුපොසථං
බුද්ධෙන දුක්ඛන්තගු ණා පකාසිතං"

පාණං න හානෙ, ප්‍රාණඝාතය නොකරන්නේය; අදින්නං, නොදෙනලද අනුන් සන්තක වස්තුව; නච ආදියෙ, නොගන් නේය; මුසා න භාසෙ, බොරු නොකියන්නේය; මජ්ජපො, මද්‍යපානය කරන්නෙක්; නචසියා, නොවන්නේය; මෙථුනා, අසද්ධර්මයයි කියනලද; අබ්‍රහ්මචරියා, අශ්‍රෙෂ්ඨචර්‍ය්‍යාවෙන්; විරමෙය්‍ය, වලකින්නේය; රත්තිං, (උපොසථයෙහි වාසය කරන්නේ) රාත්‍රියෙහිද; විකාල, විකාලයෙහිද; භොජනං, භොජනය; නභුඤ්ජෙය්‍ය, අනුභව නොකරන්නේය.

මාලා, මල්මාලා; න ධාරෙ, නොදරන්නේය; නච ගන්ධ මාචරෙ, සුවඳ ආඝ්‍රාණය නොකරන්නේය; මඤ්චෙ, (මිටිරියන් පමණ පා ඇති කැප) ඇඳෙහි හෝ; ඡමායංවා, (සුණුපිරියම්

කරණලද) භූමියෙහි හෝ; සන්ථතෙ, (තෘණපත්‍ර පලාලාදිය අතුට කරණලද) සංස්තරණයෙහි හෝ; සයෙථ, සයනයකරන් නේය; එතංහි උපොසථං, මේ උපොසථ සීලය වනාහී; අට්ඨඞ්ගිකං, අඞ්ග අටකින් යුක්තයි; ආහු, කියා; දුක්ඛන්තගුණා, දුක් කෙළවරකිරීමට පැමිණියාවූ; බුද්ධෙන, බුදුන් විසින්; පකාසිතං, ප්‍රකාශ කරණලද්දේය.

( ධම්මිකසූත්‍රය )

**පටිජාගරණ උපොසථය**—පසළොස්වක් දින අටසිල් සමාදන් වන්නහු විසින් පටිජාගරණ උපොසථය සමාදන්වනු කැමැත්තේනම් පොහෝදිනට පෙරදින හෙවත් චාතුද්දසීතිථියෙන් සමාදන්ව පැලවියෙන් පවාරණය කටයුතුවෙයි. අටවක් දින අටසිල් සමාදන්වන්නහු විසින් පටිජාගරණ සීලය සමාදන් වනුකැමැත්තේනම් සතවකින් සමාදන්ව නවවකින් පවාරණය කළයුතු වෙයි. මෙකල බොහෝසෙයින් මාසය සතර පොහොයක්කොටැ සතර දිනක් සිල් සමාදන්වන්නේවී නමුදු, මාසය කට අට දවසක් සිල් සමාදන්වන ක්‍රමයකුදු ඇත්තේය. එනම්, පූරපක්ෂයෙහි සතරෙක, අවපක්ෂයෙහි සතරෙක කියා වේ. පූර ඒසේනියලත් දිනය, පූරඅටවක්ලත් දිනය, පුරතුදුස්වක්ලත් දිනය, පූරපසළොස්වක්ලත් දිනය. පූරපක්ෂයෙහි වේ. අව පක්ෂයටද මෙසේ මැයි. මේ සියළු දිනයන්හිම පටිජාගරණය කරණ පිළිවෙල පෙර කී නයින් දතයුතු. මෙකල බොහෝ දෙන රාත්‍රි දෙළඟයෙන් පෙර පෝය ලබනවානම් එදින උදය සිල් සමාදන්වන ක්‍රමයක් පුරුදුකරගණ එන්නේවීනමුත් එය පටිජාගරණයට නියම ක්‍රමය බැවින් පෙණෙණි උපොසථය නොවන්නේය. යම් දිනක රාත්‍රි ගයෙන් පෙරපෝය ලබන වානම් එදින උදය සිල් සමාදන්වීමද, රෑවී පැයක්වත් ගතව පෝය ලබනවානම් පසුදින සිල් සමාදන්වීමද ආගමානුකූල බැව් පෙණේ.

**දශ ශීලය**—ගිහි දශ ශීලය* ප්‍රව්‍රජ්‍යා දශ ශීලය කියා දෙයාකාරවේ. මෙය වනාහි බුදුරජාණන්වහන්සේ විසින් සාමණේරයන්ට සිකපද ව්‍යවස්ථාකරණ පිණිස පණවනලද දශශික්ෂාපදයෝයි. අෂ්ටාඞ්ගශීලයෙහි හත්වන ශික්ෂාපදය "නච්චගීත වාදිත විසූක දස්සනා වෙරමණී සික්ඛාපදං" "මාලාගන්ධ විලෙපන ධාරණ

---

* ගිහියන් විසින් රක්ෂා කටයුතු දශ ශීලය ගිහි දශ ශීලයයි. ප්‍රව්‍රජ්‍ය දශ ශීලය අවයව වශයෙන් පණසක් ප්‍රභෙද ඇත්තේ වේ. එහි මේ ගිහි දශ ශීලයට වඩා වෙනසයි.

මණ්ඩනවිභූසනට්ඨානා වේරමණී සික්ඛාපදං" යනුවෙන් දශ ශීලයෙහිදි ශික්ෂාපද දෙකක් වශයෙන් ගැණේ. "ජාතරූප රජතපටිග්ගහණා වේරමණී සික්ඛාපදං" (රන්රිදී මසු කහවණු පිළිගැන්මෙන් වෙන්වීමවූ ශික්ෂාපදය) යන දසවෙනි ශික්ෂා පදය එක්වීමෙන් දශ ශික්ෂාපදය සම්පූර්ණ වේ. සාමණේර උපසපන්වහන්සේලා විසින් දශ ශික්ෂාපද රක්ෂා කටයුතු වේ. වීර්‍ය්‍ය සම්පන්න ගිහියන් විසින්ද මෙය පිළිපදිනු හැකිවේ.

**චතුපාරිශුද්ධි ශීලය—**

"සීලං චතුබ්බිධං පාතිමොක්ඛ ඉන්ද්‍රිය සංවරො
ආජීව පාරි සුද්ධං ච සීලං පච්චය නිස්සිතං"

ප්‍රාතිමොක්ෂ සංවරශීලය, ඉන්ද්‍රිය සංවරශීලය, ආජීව පාරිශුද්ධි ශීලය, ප්‍රත්‍යයසන්නිශ්‍රිත ශීලයයි, ශීලයතෙම සිව් වැදෑරුම් වේ.
(සද්ධම්මොපායනය)

**ප්‍රාතිමොක්ෂ සංවරශීලය**—චාරිත්‍ර (හැසිරියයුතු) වාරිත්‍ර (වැලකිය යුතු) විසින් දෙකක් වෙත්. "චරන්ති තස්මිං සීලෙ පරිපූරකාරිතාය පවත්තන්තීති චාරිත්තං" මේ කටයුතුයයි පණවනලද ශික්ෂාපදයන්ගේ යම් පිරිමෙක් ඇද්ද ඒ **චාරිත්‍ර සිල** නම්වේ. දකුම් හැමදුම් තණ කසල ගැනුම්, ගෙත්තම් පණ්ණම් කිරීම්, කැළිකසල දක දක නොහිඳීම්, ගිලන්හට මහල්ලන්ට සිල්වත් ගුණවත්නට මෙහෙකිරීම්, ගුරුන් සිල්වතුන් තුන්වේලේ වැඳීම්, දගැප් මහබෝ තුන්වේලේ වැඳීම්, උපන් අහර ඇසුරු ඇතිනැන බෙදදී වැළඳීම්, පුහුණු බණ නොමැලිව පිරවීම්, හදරණ (ඉගෙණගන්නා) බණ දන්නවුන් ලවා කියවාගෙණ කිපරිද්දෙන් පුහුණුකිරීම්, සකස්කොට සුපිළිසන්ව හැඳීම් පෙරවීම්, පැනිත්තෙහිද (දිය බීමෙහිද) පසද වේලාවෙහිද (අනුභවකරණ වේලාවෙහිද) සන්සිඳි හැසිරීම් යන මේ ආදී වත් පිළිවෙත් චාරිත්‍ර ශීලයයි. "වාරිත්තං තායන්ති රක්ඛන්ති තෙනාති වාරිත්තං" මේ නොකටයුතුයයි පණවනලද ශික්ෂා පදයන්ගේ පිළිපැදීමක් ඇද්ද ඒ **වාරිත්‍ර සිල** නම්වේ. මෙසේ චාරිත්‍ර වාරිත්‍ර විසින් දෙකක්වූයේ ප්‍රාතිමොක්ෂ සංවර ශීලනම් වේ.

**ඉන්ද්‍රිය සංවර ශීලය**—රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, * ධර්ම යන මේ ෂට් අරමුණෙහි එළඹ උපදනා ලොභ, ද්වේෂ, මොහ නම් ඇති කෙලෙස් සොරුන් දුරුකොට චක්ෂුර්ද්වාර, ශ්‍රොත්‍රද්වාර, ඝ්‍රාණ ද්වාර, ජිව්හාද්වාර, කායද්වාර, මනොද්වාර යන මේ සදොරින් නොවැද්දදී සිහි නමැති දොර පියාලා සිහි නුවණ ඇතිව විසීම ඉන්ද්‍රිය සංවර ශීලනම් වේ.

---

* ධර්ම යනු සිතෙහි උපදනා චෛතසිකයෝයි.

**ආජීවපාරිශුද්ධි ශීලය**—ප්‍රාණඝාත, අදත්තාදාන, කාමමිථ්‍යාචාර, යන ත්‍රිවිධ කාය දුශ්චරිතයෙන්ද, මෘෂාවාද, පිශුනාවාච, පරුෂාවාච, සම්ඵප්‍රලාප යන චතුර්විධ වාග්දුශ්චරිතයෙන්ද, කුහක බැවින් හා අනුන් සිත්ගන්නා කථාවෙන්ද තමා කෙරෙහි නැති ගුණ පෙන්වීමාදියෙන්ද තොරව කප්‍ය සාරුප්‍ය පරිදි දැහැමින් සෙමෙන් දිවි පැවැත්වීම ආජීව පාරිශුද්ධි ශීල නම් වේ.

**ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය**—දැහැමෙන් සෙමෙන් උපන් සතර පසයෙහි ලෝභය හැරපියා අයහපත්වූවද මදිවූවද බොහෝ කොට නොඉල්වා සසර කතර ගෙවන්ට කාරණයයි සලකා පස්විකා හෙවත් ප්‍රත්‍යවේක්‍ෂාකොට (නුවණින් බලා) වැළඳීම් පරිභොග කිරීම් ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලනම් වේ.

**110.** ලෝ ල් සිත මුල්සිඳ නිති තැත් සිති නේ
සී ල් පිරිසිදු කොට සඳ රැස් ලෙසි නේ
ව ල් රකිනා සෙමරෙකු මෙන් රකි නේ
කා ල් නොයවා සෙද මොක්සිරි ලබ නේ

නිති, නිරන්තරයෙන්; තැත් සිතිනේ, උත්සාහ චිත්තයෙන්; ලෝල්සිත, ලෝභචිත්තය; මුල්සිඳ, මූලොච්ඡින්නකොට; වල්රකිනා, වාලධිය රක්‍ෂාකරන්නාවූ; සෙමරෙකුමෙන්, චමරියෙකුමෙන්; සිල්, සීලය; සඳ රැස්ලෙසිනේ, චන්ද්‍රමරීචියමෙන්; පිරිසිදුකොට, පරිශුද්ධකොට; රකිනේ, රක්‍ෂාකරන්නේය; කල් නොයවා, කාලාතික්‍රමණය නොකොට; සෙද, ශීඝ්‍රව; මොක් සිරි ලබනේ, (එයින්) මොක්‍ෂ ශ්‍රීය ලබන්නේය.

**වල් රකිනා සෙමරෙකුමෙන් රකිනේ—**

“කිකීව අණ්ඩං චමරීව වාලධිං—
පියං ව පුත්තං නයනං ව එකකං,
තථෙව සීලං අනුරක්ඛ මානකා—
සුපෙසලා හොථ සදා සගාරවා.”

බිජුවටරක්නා කිරලාපක්ෂිණියක් සෙයින්ද, වාලධියරක්නා සෙමරමුවෙකු සෙයින්ද, ප්‍රිය පුත්‍රයෙකු රක්නා සෙනහවත් මැනිකෙනෙකු සෙයින්ද, එකම ඇසක් ඇතිව එය රක්නා මිනිසක්හු සෙයින්ද සිදුරු නොකොට දුබල නොකොට කිලිටි නොකොට කඩ නොකොට ශීලය රක්‍ෂා කටයුතුයි.

**උපක්ලේශ ධර්ම හෙවත් ශීලය කිළිටිකරණ කරුණු—**

"සීලස්ස ථෙය්‍යා චතුත්තිංස යොධා
කොධො පලාසො අති මාන මායා
සාඨෙය්‍ය ඉස්සා උපනාහ ථම්භා
සාරම්භ මානොච අසම්ප ජඤ්ඤං

මච්ඡෙර කො සජ්ජ මදෙ පමාදෙ
මුට්ඨස්සතී දුබ්බ චතා දු පඤ්ඤ
දුම්මිත්තතාසෙවී අහිරී කුදිට්ඨි
අසද්ධිකො නින්ද්‍රිය සංවරො ච

අසන්තුට්ඨිකො ඔදරිකො මහිච්ඡො "
අනොත්තප්ප කො ඉත්ථි මභිණ්හ දස්සනං
සං සට්ඨ චාරී සික්ඛා අගරුං අමත්තං
මොක්ඛක්ඛ මො ජාගරිකානු යොගො."

1 ක්‍රෝධය, 2 බද්ධවෛරය හෙවත් ක්‍රෝධයෙන් පෙළෙන බවය, 3 අතිමානය, 4 මායාවය, 5 කෛරාටිකබවය, 6 ඊර්ෂ්‍යාවය, 7 එකකට එකක් වැඩිය කෙරීමය, 8 චිත්තයාගේ දැඩිබවය, 9 අවවාදයට නොනැමෙන තද ගතිය, 10 මානසගතබවය, 11 සිහිමුළාබවය, 12 මසුරුබවය, 13 කොතුහලබවය, 14 සත්විසිමදය, 15 පමාදය, 16 මුසබවය, 17 දුර්වචබවය හෙවත් අකීකරුබවය, 18 දුර්බුද්ධිය හෙවත් නපුරු කල්පනා ඇතිබවය, 19 පාපමිත්‍ර සේවනය, 20 නිර්ලජ්ජාබවය, 21 මිථ්‍යා දෘෂ්ටිබවය, 22 ශ්‍රද්ධාරහිතබවය, 23 ඉන්ද්‍රිය සංවරනැතිබවය හෙවත් ඇස්, කන්, නාසා, ජිව්හා කාය මනස් යන ඉන්ද්‍රිය සය රූපශබ්දදී ඒ ඒ අරමුණුවලට ගැටී ලොභ වෙෂාදිය ඉපදීමට අනවකාශ නොදෙනබවය, 24 නොසතුටුබවය, 25 දුක් සහිතබවය, 26 බලවත් ඊර්ෂ්‍යා සහිතබවය, 27 පාපයට භයනැතිබවය, 28 පව්කිරීමට ලජ්ජා නැතිබවය, 29 නිතර ස්ත්‍රීන් දකිණු කැමතිබවය, 30 නානාප්‍රකාරදේ කරන්නවුන් හා ඇවිදිනු කැමතිබවය, 31 ශික්ෂාවන්හී සැලකිලිනැතිබවය, 32 යමක ප්‍රමාණය නොදත්බවය, 33 නිර්වාණය ලැබීමට නොකැමතිබවය, 34 නිදිවර්ජිත නොකිරීමය යන මොව්හු උපක්ලෙශ ධර්මයෝනම් වෙත්.

**ශීලානිශංස—**

"පඤ්චිමෙ ගහපතයො ආනිසංසා සීලවතො සීල සම්පදය"

ශීල සම්පන්න පුද්ගලතෙමේ අප්‍රමාදව මහත් භොගස්කන්ධයට පැමිණේ. යසස් දශ දිශායෙහි පහළවේ. යම් පිරිසකට එළඹේනම් විසාරදව එළඹේ. මුලානැතිව කළුරියකෙරේ. කාබූත් මරණින් මතු ස්වර්ගයෙහි උපදී.

"ඤාතී නඤ්ච පියො හොති—මිත්තෙසු ච විරොචති
කායස්ස භෙදා සුගතිං—උපපජ්ජති ච සීලවා."

සිල්වත්වූවාහු නෑයන්ටද ප්‍රියවත්තේය. මිත්‍රයන් අතුරෙහිද බබලත්තේය. කාබුත් මරණින් මත්තෙහි ස්වර්ගයෙහි උපදනේය.

**පඤ්චශීලානිශංස**—"පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ කතමෙහි පඤ්චහි පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාදා පටිවිරතො හොති, සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති, ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො, යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ."

මහණෙනි! පඤ්ච ධර්මයකින් සමන්විත පුරුෂතෙම දෙවතාවන් විසින් අල්වාගෙණ ගොස් ස්වර්ගයෙහි තිබුවාසේම වන්නේය, කවර පව ධර්මයෙක්දයත්? ප්‍රාණාතිපාතයෙන් වැළැක්කේවේද, අදත්තාදානයෙන් වැළැක්කේවේද, කාම මිථ්‍යාචාරයෙන් වැළැක්කේවේද, මුසාවාදයෙන් වැළැක්කේවේද, සුරාමෙරය පානයෙන් වැලක්කේවේද මේ පඤ්චධර්මයෙන් සමන්විතවූ පුරුෂතෙම දෙවතාවන් විසින් ගෙණ ගොස් ස්වර්ගයෙහි තිබුවාසේමය.

(දෙවතාසංයුත්ත)

**අෂ්ටාඞ්ග ශීලානිශංස**—"එවං උපවුත්ථො ඛො විසාඛෙ අට්ඨඞ්ග සමන්නාගතො උපොසථො මහප්ඵලො හොති මහානිසංසො මහාජුතිකො මහාවිප්ඵාරො." (මෙසේ) අෂ්ටාඞ්ග සමන්විත කොට රක්ෂාකළ පෙහෙවස් ශීලය මහත්ඵලවේ. මහානිශංසවේ, මහත් ආලෝකවේ. මහත් පැතිරීම් ඇත්තේවේ.

"සෙය්‍යථාපි විසාඛෙ ඉමෙසං සොළසන්නං මහාජනපදානං පහූත සත්ත රතනානං ඉස්සරාධිපච්චං රජ්ජං කාරෙය්‍ය සෙය්‍යිදං අඞ්ගානං මගධානං කාසීනං කොසලානං වජ්ජීනං මල්ලානං චේතීනං වඞ්ගානං කුරූණං පඤ්චාලානං මච්ඡානං සූරසෙනානං අස්සකානං අවන්තීනං ගන්ධාරානං කම්බොජානං අට්ඨඞ්ග සමන්නාගතස්ස උපොසථස්ස එතං කලං නාග්ඝති සොළසිං තං කිස්සහෙතු කපණං විසාඛෙ මානුසකං රජ්ජං දිබ්බං සුඛං උපනිධාය."

* අඞ්ගුරටය, මගධරටය, කසීරටය, කොසොල්රටය, වැදූරටය, මල්ලරටය, චෙතියරටය, වඞ්ගුරටය, කුරුරටය, පඤ්චාලරටය, මත්ස්‍යරටය, සූරසෙනරටය, අස්සකරටය, අවන්තිරටය, ගන්ධාර රටය, කාම්බෝජරටය යන මේ සොළොස් මහා ජනපදයෙන් අලඞ්කෘතවූ දඹදිව්තලය බෙර ඇසමෙන් සමතලාකොට හිණ පමණ සත්රුවනින් පුරවනලදද දඹදිව්තලයාගේ ඓශ්චර්‍ය්‍යාධිප්‍රත්‍යයට පැමිණ රාජ්‍යකිරීමෙක් ඇද්ද යේ අෂ්ටාඞ්ග සමන්නාගතකොට එක දවසෙක්හි විසූ පෙහෙවස් ශීලයාගේ පින්කම් සොළොස් කොටසක්කොට බෙදූ කල්හි එක කොටසකටදු අගනේනොනාවෙයි. ඊට හේතු කවරේද? මනුෂ්‍යවූ චක්‍රවර්ති රාජ්‍ය සැපද දිව්‍ය සැප පිණිස කෘපණවේ.

"ඨානං ඛො පනෙතං විසාඛෙ විජ්ජති යං ඉධෙ කච්චෙ ඉත්ථිවා පුරිසොවා අට්ඨඞ්ග සමන්නාගතං උපොසථං උපවසිත්වා කායස්ස භෙද පරම්මරණා චාතුම්මහාරාජිකානං දෙවානං සහව්‍යතං උප්පජ්ජෙය්‍ය, තාවතිංසානං දෙවානං යාමානං දෙවානං තුසිතානං දෙවානං නිම්මාණරතීනං දෙවානං පරනිම්මිත වසවත්තීනං දෙවානං සහව්‍යතං උප්පජ්ජෙය්‍ය."

යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් අෂ්ටාඞ්ග සමන්නා ගතකොට පෙහෙවස් විසුවාහුනම් ජීවිත පර්‍ය්‍යාවසානයෙහි ඕතොමෝ නොහොත් හෙතෙම චාතුර්මහාරාජිකයන් කෙරෙහි, තව්තිසාවැසියන් කෙරෙහි, යාමයන් කෙරෙහි, තුසිතයන් කෙරෙහි, නිර්මාණරතීන් කෙරෙහි, පරනිර්මිත වසවර්තීන්කෙරෙහි උපදින්මැයි.

111\. වෙ ත් වා සව්සත හැමකල් නිදු කී
ප ත් වා සැපතට රෝදුක් වැල කී
සෙ ත් වා සමගිව නිවණට මුනි කී
මෙ ත් බා වනනම් වැඩි පින්කම කී

සව්සත, සකල සත්වයෝ; හැමකල්, සදකල්හි; නිදුකීවෙත්වා, දුක් රහිතයෝ වෙත්වා; රෝදුක් වැලකී, රෝග දුක්ඛයෙන්මිදී; සැපතට පත්වා, සම්පත්තියට ප්‍රාප්තවෙත්වා; සමගිව, එකතුව; මුනිකී නිවණට, සර්වඥයන්වහන්සේ වදාළාවූ නිර්වාණයට; සෙත්වා, පැමිණෙත්වා; (යන) මෙත් බාවනනම්, මෛත්‍රී භාවනාවනම්; වැඩි පින්කමකී, අධිකවූ පුණ්‍යකර්මයෙක්ය.

* ජනපදවාචක ශබ්දයෝ තුමූ පුරුෂලිඞ්ගික බහුවචනම වෙති. එහෙයින් 'අඞ්ගානං'යි කියනලද්දේමය. නමුත් අපි ව්‍යවහාර පහසුව පිණිස මෙහි රටයයි කීමූ.

*** මෙත් බාවන—මෛත්‍රී භාවනාව—**

"අත්තූපමාය සබ්බසං—සත්තානං සුඛ කාමිතං
පස්සිත්වා කමතො මෙත්තං—සබ්බ සත්තෙසු භාවයෙ."

සියල්ලන්ම සැප කැමතිබව තමා උපමාකොට බලා සියලු සත්‍වයන්කෙරෙහි මෛත්‍රී කටයුතුය.

"සුඛී භවෙය්‍යං නිද්දුක්ඛො—අහං නිච්චං අහං වීය
හිතාච මෙ සුඛී හොන්තු—මජ්ඣත්තාථච වෙරිනො."

සතතයෙන් මම නිදුක් සුවපත් වෙම්වා, එමෙන් මට හිතවූ මව්පියාදීහුද, මධ්‍යස්ථ සත්‍වයෝද, යලිදු වෛරී සත්‍වයෝද සුවපත් වෙත්වා.

"ඉමම්හි ගාමක්ඛෙත්තම්හි—සත්තා හොන්තු සුඛී සදා
තතො පරඤ්ච රජ්ජෙසු—චක්කවාලෙසු ජන්තුනො."

මේ ග්‍රාමක්ෂෙත්‍රයෙහි අපාද විපාදදි සත්‍වයෝ හැමකල්හිම සුවපත් වෙත්වා. එයින් ඔබ්බෙහි ගම්හිද ක්ෂෙත්‍රයෙහිද රාජ්‍යයන්හිද සක්වළවල්හි සත්‍වයෝද හැමකල්හි කායික චෛතසික දුකක් නොවිඳ සුවපත් වෙත්වා.

"සමන්තා චක්කවාලෙසු—සත්තානං තෙසු පාණිනො
සුඛිනො පුග්ගලා භූතා—අත්ත භාව ගතා සියුං."

හාත්පස අනන්ත සක්වළවල්හි සත්‍වයෝද ප්‍රාණීහුද පුද්ගලයෝද භූතයෝද ආත්මභාවයට ගියාහුද සුවපත් වෙත්වා.

"තථා ඉත්ථි පුමාචෙව—අරියා අනරියා පිච
දෙවා නරා අපායට්ඨා—තථා දස දිසාසු චාති."

මනුෂ්‍ය අමනුෂ්‍ය තිරශ්චීනස්ත්‍රීහුද, පුරුෂයෝද, ආර්‍ය්‍යයෝද, පෘථග්ජනයෝද, ශක්‍ර බ්‍රහ්මාදි දෙවියෝද, ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණාදි මනුෂ්‍යයෝද, සතර අපායෙහි සිටි සත්‍වයෝද, දශ දිශාවන්හි සත්‍වයෝද එසේම සුවපත් වෙත්වා.

**මෛත්‍රී භාවනාවෙහි අනුසස්**—"මෙත්තාය භික්ඛවෙ චෙතො විමුත්තියා ආසෙවිතාය, භාවිතාය, බහුලීකතාය, යානීකතාය, වත්ථුකතාය, අනුට්ඨිතාය, පරිචිතාය, සුසමාරද්ධාය, එකාදසානිසංසා පාටිකඞ්ඛා කතමෙ එකාදස? සුඛං සුපති, සුඛං පටිබුජ්ඣ

* කරණීයමෙත්ත සූත්‍රය මෙත් භාවනා අතුරෙන් උතුම් භාවනා, එහෙ බැවින් එය නිතර පුරුදුකිරීමට උත්සාහ වැඩිය යුතුයි.

ති, න පාපකං සුපිනං පස්සති, මනුස්සානං පියො හොති, අමනුස්සානං පියො හොති, දෙවතා රක්ඛන්ති, නාස්ස අග්ගිවා විසංවා සත්ථංවා කමති, තුවටං චිත්තං සමාධියති, මුඛවණ්ණො විප්පසීදති, අසම්මූළ්හොකාලං කරොති, උත්තරිං අප්පටිවිජ්ඣන්තො බ්‍රහ්මලොකූපගො හොති.

මහණෙනි! ආදරයෙන් සෙවිනාලද, වඩනාලද, බහුලකොට කරණලද, යානාවක් මෙන් කරණලද, (පිහිටන) වස්තුවක් මෙන් කරණලද, එලඹ සිටියාවූ හාත්පසින් පුරුදුකරණලද මොනවට පටන්ගන්නාලද මෛත්‍රීධ්‍යානාඞ්ගයෙන් යුක්තවූ නීවරණයන්කෙරෙන් මිදුනු සිතපිළිබඳව එකොළොස් අනුසස් කෙනෙක් කැමතිවියයුත්තාහ. ඒ කවර එකොළොස් අනුසස්ද යත්? 1 සුවසේ නිදයි. 2 සුවසේ පුබුදී. 3 පවිටුසිහින නොදකී. 4 මිනිසුන්ට ප්‍රියවේ. 5 අමනුෂ්‍යයන්ට ප්‍රියවේ. 6 දෙවියෝ ආරක්ෂාකෙරෙත්. 7 ගින්න, විසය, ආයුධය යන මොව්හු ඔහුගේ කයෙහි නොවදිත්. 8 වහා සිත සමාධිගතවේ. 9 මුහුණේ ඡවිවණිය ඉතා පහදී. 10 නුමුළාවූයේ කළුරිය කෙරේ. 11 මෙත් සමවතට මතුයෙහි රහත්බවට පැමිණෙන්ට නොහැකිවීනම් මෙයින් චුතව බඹලොව උපදී.

112. ය හ ප ත නොසිතන සැපි මේ ද න යා
කි පි ස ත නුන්හට වෙති වේ ද න යා
හැ ම ස ත වෙත කල මෙත්බා ව න යා
සැ ක නැ ත සගමොක් සැපසා ද න යා

මේ දනයා, මේ (ලෝකවාසි) ජනයා; යහපත නොසිතනසැපි, සත්ගුණය චින්තණය නොකරණ අඥම (බලව); කිපිසත, කිපුණාවූ සත්වයා; උනුන්හට, අන්‍යොන්‍යයන්ට; වේදනායාවෙති, වේදනාවෝ උපදවත්; හැමසත වෙත, සියළු සත්වයන්කෙරෙහි; මෙත් බාවනයා කළ, මෛත්‍රී භාවනාව කළේවීනම්; සැකනැත, සංකා රහිතව; සගමොක් සැප, ස්වර්ගමොක්ෂ සම්පත්තිය; සාදනයා, (එයින්) සාද දෙන්නේය.

113. දෙ න් න න් දනඳුන් රන්සේ පොලිය ම
දු න් දු න් සේ නම කලසින් අනුන ම
එ න් නේ දියුණුව දියුණුව නමහ ම
ඉ න් දු න් නුකුසී වව් පින්දීම ම

පොලියට දන දෙන්නන්, පොලිපිණිස ධනය දෙන්නවුන් විසින්; දුන් රත්සේ, දුන්නාවූ රත්රන්මෙන්; තමකළපින්, තමන් විසින් කරණලද්දවූ කුසලය; අනුනට, අන්‍යයන්ට; දුන් දුන්සේ, දුන් දුන්පරිද්දෙන්; දියුණුව දියුණුව, විගුණවිගුණව; තමහට එන්නේ, තමන්කරා පැමිණෙන්නේය; ඉන්, එහෙයින්; දුන්, ඒ කාලයෙහි; පින්දීමට, පින්දීමපිණිස; නුකුසීවව්, කුසීතනොවව්.

**පින්දීම**—තමා විසින් කළාවූ කුසලය සිහිකොට අනින් අයට එය අනුමොදන්කරවීම **පින්දීම** නම් වේ.

"පරමුද්දිස්ස යං දානං අනනවත්ථාදි දීයතෙ
පත්තිදානන්ති තං ආහු සුත්ත සද්ධම්මදෙසකා."

පරං උද්දිස්ස, අනුන් පිණිස; අනනවත්ථාදි, බත්පිළි ආදිවූ; යංදානං, යම් දානයක්; දීයතෙ, දෙනුලැබේද; තං, ඒ; සුත්ත සද්ධම්මදෙසකා, සූක්තවූ සද්ධර්මදේශකයෝ (බණකියන්නෝ); පත්තිදානං ඉති, ප්‍රාප්ත දානයයි; ආහු, කියත්.

(සද්ධම්මොපායනය)

**පින්දීමේ ආනිසංස**—

"අත්තත්ථමනපෙක්ඛිත්වා පරත්ථං දීයතෙ යතො
කරුණා කතඤ්ඤුතා යොගා පත්තිදානං විසෙසිතං
යෙ ආනිසංසානිද්දිට්ඨා දානෙ මාතාපපහාසිනා
ස විසෙසෙසා ච තෙ සබ්බෙ පත්තිදානෙ පි වෙදියාති."

යම්හෙයකින් කරුණාව හා කෙළෙහිගුණ දන්නාබව හා දෙන්නාගේ යෙදීමෙන් ආත්මාර්ථය නොබලා පරාර්ථය පිණිස දෙනුලැබේද එහෙයින් පින්දීම විශෙෂවන්නේය. ත්‍රිවිධමාතය හැරියාවූ බුදුන් විසින් දානයෙහි යම් ආනිසංසයක් විශෙෂයෙන් දක්වනලද්ද විශෙෂ සිහිතවූ ඒ සියළු ආනිසංසයෝම පින් දීමෙහිද දතයුත්තාහුය.

(උපාසකජනාලඞ්කාරය)

"මෙයින් පරලොව ප ත්
උදෙසා එබඳු පෝස ත්
දෙනු තිසි අහරව ත්
දනෙහි අනුසස්වේය පින්පෙ ත්"

(කාව්‍යශෙඛරය)

114. මුනිඳුන් බණපද කරවා පුහු ණු
දෙසමින් දනහට වඩවා කුළු ණු
එපිණෙන් නොපැමිණ නිරයට දරු ණු
ලැබගන් සගමොක් මතුසිරි දිසු ණු

මුනිඳුන්, මුනීන්ද්‍රයාණන්වහන්සේගේ; බණපද, ධර්මපදයන්; පුහුණුකරවා, ප්‍රගුණකොට; දනහට, ජනයාහට; කුළුණුවඩවා, කරුණාවර්ධණයකොට; දෙසමින්, (එය) දෙශනාකරමින්; එපිණෙන්, ඒ පුණ්‍යයෙන්; දරුණු නිරයට, ඝොරනරකයට; නොපැමිණ, ප්‍රාප්තනොව; මතු, අනාගතයෙහි; දිසුණු, විගුණව; සගමොක්සිරි, ස්වර්ගමොක්ෂශ්‍රීය; ලැබගන්, ලබාගනු.

**මුනිඳුන් බණ පදකරවා පුහුණු-දෙසමින් දනහට වඩවා කුළුණු-**

**බණ කීම හෙවත් ධර්ම දෙශනාකිරීම**—තමන් දන්නා ධර්මය නිවන්මග පෙන්වීමේ අදහසින් අනුන්ට කියාදීමයි.

"හිතජ්ඣාසයතො යාහි පරස්ස හිත දෙසනා
දෙසනාමය පුඤ්ඤන්ති දෙසයී තං සුදෙසකො."

පරස්ස, මෙරමාහට (අනුන්ට); හිතජ්ඣාසයතො, හිතවූ අධ්‍යාසයෙන්; යාහි හිත දෙසනා, කරුණාධ්‍යාශ පෙරදැරි යම් දෙසීමෙක් ඇද්ද; තං, එය; සුදෙසකො, මනාදෙසුම් ඇති තථාගතතෙමේ; දෙසනාමය පුඤ්ඤන්ති, දෙසනාමය පිනැයි; දෙසයී, වදළේ.

( සද්ධම්මොපායනය )

ධර්මදෙශනානිසංස—

"සබ්බදානං ධම්මදානං ජිනාතීති ජිනො බ්‍රැවී
දෙසයී දෙසක වරො දෙසනා දුල්ලභාති ච
අත්ථොපදීයමානොහි තතො ඛිප්පං විගච්ඡති
ධම්මොපදීයමානොහි උභයත්ථාභි වඩ්ඪති
යොනිසො මනසීකාරෙ අථො සද්ධම්මදෙසනා
මග්ගඤ්ඤණස්ස හෙතූති වුත්තා මග්ගඤ්ඤුනා සදා
සභාව ඤාණං ධම්මානං සංසාරාදී නවඤ්ඤුතා
සච්චානං වා හි සමයො සබ්බතෙ දෙසනා භවා
යතො යං දෙසකො ධම්මං සබ්බසම්පත්ති කාරණං
දෙසෙසි තස්මා තස්සී ධ සබ්බසම්පත්ති යො ඵලනති."

පස් මරුන් දිනූ සර්වඥයන්වහන්සේ සියලු දනයෙහි ධර්ම දනයම දිනන්නේයයි වදාළසේක. උතුම්වූ දේශනාව ඇති බුදුරජතෙම ඒ සද්ධර්ම දේශනාව දුලීභවන්නේයයි වදාළසේක. වස්තුව දෙනුලබන්නේ එයින් වහාම අඩුවට පැමිණෙන්නේය. ධර්මදානයකරණු ලබන්නේ මෙලොව පරලොව උභයාර්ථයෙන් වැඩෙන්නේය. හැමකල්හිම යොනිසොමනසකාරයයි කියන ලද සිහිනුවණින් යෙදී කල්පනාකිරීමද සද්ධර්මදේශනාවද මාර්ගඥණයට හෙතුයයි මාර්ග දන්නාවූ බුදුරජාණන්වහන්සේ විසින් දේශනාකරණලදී. ප්‍රත්‍යයොත්පන්න ධර්මයන්ගේ ස්වභාව අවබොධය හෙවත් සවලක්ෂණ වශයෙන් දුක්මද සංසාරයෙහි ආදීනව දැනීමද චතුස්සත්‍යාවබොධයද මාර්ගඥනදර්ශනයද ඒ සියල්ලම දේශනාවෙන් සිඩවන්නේය. යම්හෙයකින් ධර්ම දේශක තෙමේ සියලු සම්පත්තියට කාරණාවූ යම් ධර්මයක් දේශනාකෙළේද එහෙයින් ඔහට මෙලොව සියලු සම්පත් ලැබීම ඵලවන්නේයි.

(උපාසකජනාලඞ්කාරය)

“නොහැඟ පුදලබ ය ස
හිත අදහසින් මුනිඹ ස
අන්හට මොක් සිරි ස
කියනු දේසන මහත් අනුහ ස”

(කාව්‍යශෙඛරය)

115. දි ව ම න් මුනිඳුටමෙය් මන් තො ස වා
බ ණ ද න් නන් හට වැඳ අත් ඔ ස වා
ප ද යෙ න් පදයට අදරින් අ ස වා
එපිණෙ න් නිරයට යනමං ව ස වා

දිවමන්, ජීවමානවූ; මුනි, මුනීන්ද්‍රයාණන්වහන්සේ; දුටමෙන්, දර්ශනයකලාක්මෙන්; මන්තොසවා, චිත්තසන්තුෂටව; බණදන් නන් හට, ධර්මය ජීනනය කලවුන්ට; අත් ඔසවා වැඳ, දෙඅත්නගා නමස්කාරකොට; පදයෙන් පදයට, පදයක් පාසා; අදරින්, ආදරයෙන්; අසවා, ශ්‍රවණයකොට; එපිණෙන්, ඒ පුණ්‍යයෙන්; නිරයට යන, නරකයට යන්නාවූ; මං, මාර්ගය; වසවා, ප්‍රතිච්ඡන්නකරව.

**බණ දන්නන්හට වැඳ අත් ඔසවා — පදයෙන් පදයට අදරින් අසවා —**

**බණ ඇසීම හෙවත් සද්ධර්මශ්‍රවණයකිරීම**— අනුන් කියාදෙන ධර්මය නිවන්මග සිදුකරගැණිමේ අදහසින් මනාකොට ශ්‍රවණය කිරීමයි.

"ධම්මං විනානත්ථි පිතා ච මාතා
තමේවතාණං සරණං පතිට්ඨා
තස්මාහි භො කිච්ච මඤ්ඤපපහාය
සුණාථ ධාරේථ චරාථ ධම්මං,"

සත්වයාහට ධර්මය සමාන අන්කිසි පියකෙනෙක්ද මෑනි කෙනෙක්ද නැත්තේය. ඒ ධර්මයම සත්වයාහට රක්‍ෂස්ථානය, සරණවන ස්ථානය, ප්‍රතිෂ්ඨාධාරස්ථානය. පින්වත්නි! එහෙයින් තමන්ට ඇත්තාවූ අන්කිසි කෘත්‍ය හැර ධර්මය අසව්, ධර්මය දරාගණිව්, ධර්මයෙහි හැසිරෙව්.

"කාලෙන ධම්ම සවණං එතං මඞ්ගලමුත්තමං."

සුදුසුකාලයෙහි ධර්මශ්‍රවණයකිරීම උත්තම මඞ්ගලයෙක් වේ,

( මඞ්ගලසූත්‍රය )

**ධර්මශ්‍රවණයෙහි ආනිසංස—**

"පඤ්චිමෙ භික්ඛවෙ ධම්මසවණෙ ආනිසංසා, කතමෙ පඤ්ච? අස්සුතං සුණාති, සුතං පරියොදපෙති, කඞ්ඛං විතරති, දිට්ඨිං උජුංකරොති, චිත්තමස්ස පසීදති, ඉමෙ ඛො භික්ඛවෙ පඤ්චානිසංසා ධම්ම සවණෙති."

මහණෙනි! බණ ඇසීමෙහි ආනිසංස පසක් ඇත්තාහුය. ඔව්හු කවරහුදයත්? නොඇසූ ධර්මමාගී අසයි. ඇසූ ධර්මමාගී පිරිසිදුවෙයි. සිතෙහි සංකාදූරුවෙයි. (සම්‍යක්) දෘෂ්ටිය සෘජු කරයි. අසන්නහුගේ සිත පැහැදෙයි. මේ ආනිසංස පස ධර්ම ශ්‍රවණයෙහි ඇත්තාහුයි.

"සද්ධම්මදෙසනා කාලෙ—සාධු සාධූති භාසතො
මුඛතො නිච්ඡරතී ගන්ධො—උප්පලංව යථොදකෙ."

මාගීලම්බන ප්‍රීතිමත්ව එපරිද්දෙන් සාධුකාරදිදී බණ ඇසූවාහු උපනුපන් ජාතියෙහි උත්පල ගන්ධ මහතෙරුන්වහන්සේ මෙන් මහනෙල්මල් සුවඳ වහනයවන මුව ලබන්නාහ.

( අඞ්ගුත්තරනිකායඨකථා )

"පඤ්ඤ වා සුණමානොහි සද්ධම්මං බුද්ධ දෙසිතං
සුගම්භීරං අපි තුට්ඨං මධුරං අමතං විය

ලභතෙ පරමං පීතිං දෙවිනෙදනාපි දුල්ලභං
න දෙවාලං ඵලං තස්ස මා හොතු පරලොකිනං

සද්ධම්මස්සි ධ ගහණං න හොති සවණං විනා
ගහණෙන පීතා අඤ්ඤ පරිකතා නොපජ්ජති

අඤ්ඤාතු අපරික්ඛෙන්තා අත්තනො වා පරස්සවා
අසමත්ථො ච සො හොති හිතත්ථ පටිපත්තියා

පරියත්තිං විනා ධම්මො න තිට්ඨති කුදචනං
සවණං විනා පරියත්තිං තස්මා පි සවණං වරං

නෙක කප්ප සතුස්සාහ සමානි තොපි සඤ්ඤුතා
සද්ධම්මො න පතිට්ඨාති සවණෙන විනා යතො

තතො තස්සා පි උස්සාහ විසෙසං සම්වෙක්ඛිය
සොතබ්බො එව සද්ධම්මො අපි නිබ්බාණ දස්සිනාති."

බුදුන් විසින් දෙශනාකරණලද ගම්භීරවූ සත්‍යවූ මධුරවූ අමෘතයක්වැනිවූ සද්ධර්මය අසන්නාවූ ශ්‍රද්ධාවන්ත පුද්ගලතෙම සක්දෙවිඳුවිසිනුදු ලබන්ට දුලබවූ උතුම්වූ ප්‍රීති ලබන්නේය. ඕහට පරලොව ඵලයක් කෙසේවුවත්* ඒ ප්‍රීති ඵලයම ප්‍රමාණවත්නේය. මේ සස්නෙහි සද්ධර්මයඇසීම නැතිව ග්‍රහණීම නොවන්නේය. ග්‍රහණය නැතිව අර්ථ පරීක්‍ෂාවනොවන්නේය. අර්ථ පරීක්‍ෂා නොකරන්නේ තමාට හෝ අනුන්ට හෝ හිතවූ ප්‍රතිපත්තියෙහි හැසිරීමට අසමර්ථ වන්නේහි. පිටකත්‍රය ධර්මය හැදෑරීම පුහුණුකිරීම නැතිව කිසිකලෙක්හිදු නොසිටින්නේය. ඒ පර්‍ය්‍යාප්තිය පුහුණුකිරීම අනුන්කෙරෙන් ධර්මශ්‍රවණයක් නැතිව නොපවත්නේය. බණ ඇසීමම උතුම්වන්නේය. බුදුන් විසිනුදු බොහෝ කල්ප සියගණනක් උත්සාහකොට ගෙණඑන ලද්දවූ සද්ධර්මයතෙම ශ්‍රවණය නැතිව නොපිහිටන්නේය, එසින් ඒ බුදුන්ගේ උත්සාහ විශෙෂ දැක නිවන් දක්නාහු විසිනුදු සද්ධර්මය ඇසිය යුතුයි.

(උපාසකජනාලඞ්කාරය)

"මේ බණ ඇසූක ල
ඇතැයි සිතමින් පින්ප ල
එකහව මුනි තෙප ල
අසනු බණසනකුසලි මතකල"

(කාව්‍යශෙඛරය)

116. දු රූ කො ට හැමවිට සිත ඇති මා නේ
ග රූ කො ම වැඳ වැඳ දුටුතොක් මා නේ
මු නි ඳු ම පුදකල බන් මල් පා නේ
ස න හ ට සගමොක් මගඑම පා නේ

* මෙයින් බණඇසීමෙන් පරලොව විපාකයක් නැතිබවක් ප්‍රකාශකළානොව මෙලොවඇතිවන ප්‍රීතියම ධර්මශ්‍රවණ ඵලවශයෙන් ප්‍රමාණබැව් කීයනලදී.

හැමවිට, සදකල්හි; සිතඇති, චිත්තයෙහි ඇත්තාවූ; මානේ, අභිමානය; දුරුකොට, දුරීභූතකොට; දුටුතෙක් මානේ, දුටුතැන් පටන්; ගරුකොට වැඳ වැඳ, ගෞරවයෙන් නමස්කාරකොටකොට; මුනිඳුට, මුනීන්ද්‍රයාණන්ට; බත් මල් පානේ, භක්ත පුෂ්ප ප්‍රදීපයන්; පුදකල, පූජාකළාවූ; සතහට, සත්වයාහට; එම, ඒ පුණ්‍යකර්මය; සග මොක්මග පානේ, ස්වර්ගමොක්ෂ මාර්ගය දක්වන්නේයි.

**මුනිඳුට පුදකල බත් මල් පානේ—**

**පූජාකිරීම නම්:—**"තුණුරුවන්ට කළ පූජාව උතුම් කුලයෙහි උපද වයි" යනාදීන් මහා විපාක සඳහන්කොට මල් පහන් සුවඳ දුම් බත් ආදීවූ සම්භවූ පූජා වස්තුවකින් සතතයෙන් තුණුරුවන් පිදීමයි.

**මල් පූජාකිරීම—**

"වණ්ණ ගන්ධ ගුණො පෙතං—එතං කුසුම සන්තතිං
පූජයාමි මුනින්දස්ස—සිරීපාද සරොරුහෙ."

වර්ණයෙන්ද ගන්ධයෙන්ද ගුණයෙන්ද යුක්තවූ මේ මල් සමූහය මුනීන්ද්‍රවූ සර්වඥයන්වහන්සේගේ ශ්‍රීපාදපද්මයට පූජා කරමි.

"පූජේමි බුද්ධං කුසුමෙනනේන
පුඤ්ඤෙන මෙතෙන ච හොතු මොක්ඛං
පුප්ඵං මිලායාති යථා ඉදංමෙ
කායො තථායාති විනාස භාවං."

මේ පුෂ්පයෙන් බුදුරජාණන්වහන්සේ පුදමි. මෙයින් ජනිත පුණ්‍යය හේතුකොටගෙණ මොක්ෂය හෙවත් නිර්වාණසම්පත්තිය ලැබේවා. යම්සේ මේ මල් මැලවීයේද එමෙන්ම මාගේ ශරීර යද විනාශභාවයට පැමිණේ.

**මල් පූජාකරන්නවුන් විසින් සැලකියයුතු කරුණු—**ත්‍රිවිධරත්නය කෙරෙහි පූජාකරණු ලබන්නාවූ මල් ඉතා පිරිසිදුව යහපත් වර්ණයෙන් සහ සුගන්ධයෙන් යුක්තව පූජාකළයුතුයි. උදය පිපී සවස පරවන්නාවූ මල් ඉර අවරවූ පසු පූජාවට අයොග්‍යය. එමෙන්ම ඒ ඒ මල්වල ස්වභාව වර්ණය වෙනස්වූවාට පසු ඒ මල් පූජාවට නුසුදුසුයි. මල්වලට පිරිසිදු වතුර හෝ සුවඳ පැන් සැහෙන් පමණ ඉසීමෙන් පූජාවට ප්‍රථම ඒවා ධෝවනයකටයුතු ය. එසේකිරීමේදී මල් සේදී යන පරිද්දෙන් පැන් නොවත්කළ යුතුය. මල් ඉදිරිපිටතබා කථානොකළයුතුය. එසේ කිරීමෙන් කෙල ඉසී ඒවා අපවිත්‍රවන්ට පුළුවන.

ආහාර පූජාව—

"අධිවාසෙතු නො භන්තෙ භොජනං පරිකප්පිතං
අනුකම්පං උපාදාය පතිගණ්හාතු මුත්තමං."

ස්වාමීන්වහන්ස! අප විසින් කැපකරණලද මේ උතුම්වූ භොජනය ඉවසනසේක්වා, අපට අනුකම්පාපිණිස පිළිගන්නා සේක්වා.

පහන් පූජාව—

"ඝනසාරප්පදිත්තෙන දීපෙන තමධංසිනා
තිලොකදීපං සම්බුද්ධං පූජයාමි තමොනුදං."

ත්‍රෛලෝක්‍යප්‍රදීපායමානවූ මොහාන්ධකාරය විධ්වංසනය කළාවූ සර්වඥයන්වහන්සේ ඝනවූ සාරවත්වූ අඳුරුවිදහන සුළුවූ ප්‍රදීපාලොකයෙන් පුදමි.

"තිලොක මහිතං නාථං පදීපං පූජයා මහං
තෙන ධම්මෙන සංසාරෙ චක්ඛුං සුජ්ඣතු සබ්බදා."

තුන් ලෝවැස්සන් විසින් පුදනලද්දාවූ අනාථයින්ට පිළිසරණවූ සර්වඥයන්වහන්සේට මම පහනක් පුදමි. ඒ පුණ්‍ය කර්මය හේතුකොටගෙණ සසර වසනතුරු මාගේ ඇස් පිරිසිදු වේවා.

පහන් පූජාකරන්නවුන් විසින් සැලකියයුතු කරුණු—පහන් පූජා කරණවිට පිළිමගෙවල් දගැබ් බෝමළු යනාදී පූජනීය ස්ථාන දුම් වැදීමෙන් තෙල් වැටීමෙන් ඉටිපත්දම්වල ඉටි වැගිරීමෙන් අපවිත්‍ර නොවන අන්දමට පරීක්ෂාවෙන් ක්‍රියාකළයුතුය. නැතහොත් පව්සිද්ධවන්ට පුළුවන.

සුවඳ පූජාව—

"සුගන්ධි කාය වදනං මනන්ත ගුණ ගන්ධිනං
සුගන්ධිනාහං ගන්ධෙන පූජයාමි තථාගතං."

අප්‍රමාණවූ ගුණසුවඳක්ඇත්තාවූ සුගන්ධවූ ශ්‍රීශරීරයහා ශ්‍රීමුඛ ඇත්තාවූ සර්වඥයන්වහන්සේ (මේ) මනාසුවඳින් පූජාකරමි.

සුවඳ දුම් පූජාව—

"ගන්ධ සම්භාර යුත්තෙන ධූපෙනාහං සුගන්ධිනා
පූජයෙ පූජනෙය්‍යන්තං පූජා භාජන මුත්තමං."

සුවඳ සම්භාරයෙන් යුක්තවූ සුගන්ධ ධූමයෙන් ඒ උතුම්වූ පූජා භාජනවූ පූජාර්හවූ සර්වඥයන්වහන්සේ පුදමි;

117. ඇ ත ලොව වනපස මල් හැම දව සා
කො ත නක පිදුවත් මුනිඳුන් උදෙ සා
සි ත මෙව්තර පිණවත් නොම සල සා
ස ත සසරින් ගැලවෙන්නේ කෙලෙ සා

ලොව, ලෝකයෙහි; වනපසමල්, වනපාශීව පුෂ්පයන්; හැම දවසා, සදකල්හි; ඇත, ඇත්තේය; මුනිඳුන් උදෙසා, මුනීන්ද්‍රයාණන් වහන්සේ සඳහා; කොතනක පිදුවත්, කොයි ස්ථානයක පූජාකළත්; (වැඩසිදුවෙව්) සිත, චිත්තය; මෙව්තර පිණවත්, මේප්‍රමාණ කුසලකට වත්; නොමසලසා, නොයොදවා; සත, සත්වයා; සසරින් ගැලවෙන්නේ, සංසාරයෙන්මුක්තවන්නේ; කෙලෙසා, කවරආකාරයකින්ද?

118. මු නි පු ත් සඟගණ මව්පිය ගුරුව ර
ජ ර ප ත් කුලදෙටු ගිලනුන් තවස ර
රැ ක සි ත් සේ කල අත් පා මෙහෙව ර
සු ව ප ත් කර සිරි විඳුවයි සුරපු ර

මුනිපුත්, බුදුපුත්‍රවූ; සඟගණ, සංඝ සමූහයාද; මව්පිය, මාතෘ පිතෘන්ද; ගුරුවර, ආචාර්‍ය්‍යවරයන්ද; ජරපත් කුලදෙටු, වයෝ වෘද්ධවූ කුලජ්‍යෙෂ්ඨයන්ද; ගිලනුන්, රෝගාතුරයන්ද; තවසර, තපස්වීන්ද; රැක, රක්ෂාකොට; සිත්සේ, සිත්වූපරිද්දෙන්; අත් පා මෙහෙවර, හස්තපාද මෙහෙවර කර්මයන්; කල, කළාහු; සුවපත්කර, සුඛප්‍රාප්තකොට; සුරපුර, දිව්‍යපුරයෙහි; සිරි විඳුවයි, ඓශ්වර්‍ය්‍ය විඳිනයකරවයි.

**සඟගණ මව්පිය ගුරුවර කුලදෙටු ගිලනුන් තවසර—රැක සිත්සේකල අත් පා මෙහෙවර—**

**වතාවත් කිරීම**—ශ්‍රමණ බ්‍රාහ්මණ මව්පිය ගුරුවරාදීන්ට අත් පා මෙහෙවර කිරීම් ආදිය වතාවත් කිරීමනම් වේ.

“ගිලාන ගුණ වන්තානං දානාදි කිරියාසු වා
ආසනොදකදානාදී වෙය්‍යාවච්චන්ති සඤ්ඤිතා.”

ගිලාන, රෝගීන්ටද; ගුණවන්තානං, ගුණ ඇත්තන්ටද; වා, නොහොත්; දානාදි කිරියාසු, දන් ආදී ක්‍රියාවෙහිද; ආසනොදකදානාදි, හිඳිනා හෝනා අසුන් පනවාදීම් අත් පා මෙහෙවර කිරීම් නාහන බොන මුවසෝනා පැන් දැහැටිදඬු ආදිය සපයා දීම්ද; වෙය්‍යාවච්චන්ති, වතාවතැයි; (අත්පා මෙහෙයයි) සඤ්ඤිතා, දන්නාලදී.

( සද්ධම්මෝපායනය )

“පින්කිරියෙහි නොහො ත්
සිලත් ගුණවත්හටව ත්
කරණුමෙහෙ යහප ත්
වනාවත්නම් වෙනී නෙපල ත්”

(කාව්‍යශෙඛරය)

**සංඝයාට කටයුතු උපස්ථාන**—“පඤ්චහි ඛො ගහපති පුත්තඨානෙහි කුලපුත්තෙන උපරිමාදිසා සමණ බ්‍රාහ්මණා පච්චුපට්ඨා තබ්බා, මෙත්තෙන කායකම්මෙන, මෙත්තෙන වචීකම්මෙන, මෙත්තෙන මනො කම්මෙන අනාවටවාරතාය ආමිසානුප්පදානෙන, ඉමෙ හි ඛො ගහපති පුත්ත පඤ්ච හි ඨානෙහි කුලපුත්තෙන උපරිමා දිසා සමණ බ්‍රාහ්මණා පච්චුපට්ඨිතා.”

ගෘහපති පුත්‍රය! කුලපුත්‍රයා විසින් උපරිමාදිසා සඞ්ඛ්‍යාත ශ්‍රමණ බ්‍රාහ්මණයෝ පස්කාරණයකින් උපස්ථාන කටයුත්තාහුය. **ඒ පස්කාරණයෝ** නම් කවරහුදයත්?

1. **මෛත්‍රියෙන් යුක්තවූ කායකර්මය**—භික්ෂූන්ට නිමන්ත්‍රණය කරන්නෙමියි කියා විහාරයට යාමද ඔබරුවගෙණ පැන්පෙරීමද පිටමිරිකීම් පාමිරිකීම් ආදී මෛත්‍රී සිත පිහිටුවා කරණලද කායකර්මාදීහු මෛත්‍රී කායකර්ම නම්වෙති.

2. **මෛත්‍රියෙන් යුක්තවූ වාක්කර්මය**—පිඬු පිණිස ප්‍රවිෂ්ටවූ භික්ෂූන් වහන්සේ දැක සකස්කොට කැඳ දෙව බත්දෙවයි කීමද, සාධුකාරදී බණ ඇසීමද සකස්කොට පිළිසඳර කථාකිරීම් ආදීයද මෛත්‍රී වාක් කර්මනම්වේ.

3. **මෛත්‍රියෙන් යුක්තවූ මනොකර්මය**—අපගේ කුළුපග ස්ථවිරයන් වහන්සේ නිදුක් නිරෝගිවෙත්වයි මෙසේ සිතීම මෛත්‍රී මනොකර්ම නම්වේ

4. **අපිහිත ද්වාරයන් ඇතිබව**—තමාගේ වාසභවන ද්වාරයට සම්ප්‍රාප්තවූ ශ්‍රමණයන්වහන්සේලා දැක ඇත්තාවූ දෙය්‍යධර්මය නැතැයි නොකියා දත් දෙන්නේද එය නොවසනලද දොර ඇතිබව නම්වේ.

5. **ආමිසානු ප්‍රදානය**—ඉර අවරවෙන්ට මෙපිටදී හෙවත් පූර්වාහ්ණ කාලයෙහි අනුභව කරන්ට සුදුසුවූ ඛාද්‍යාදී විකෘතීන් ප්‍රදානය කිරීම (හෙවත් කැඳ බත් ආදිය සම්පාදනය කිරීම) ආමිසානු ප්‍රදානය නම්වේ.

(සිගාලොවාදසූත්‍රය)

**මව්පිය උපස්ථානය:—**

“ බ්‍රහ්මාති මාතා පිතරො පුබ්බාචරියාති වුච්චරෙ
ආහුනෙය්‍යා ච පුත්තානං පජාය අනුකම්පකා
තස්මාහි තෙ නමස්සෙය්‍ය සක්කරෙය්‍යාථ පණ්ඩිතො.”

මාතා පිතරො, මව්පියෝ; බ්‍රහ්මාති, බ්‍රහ්මයයිද; පුබ්බාචරියාති, පූර්වාචාර්‍ය්‍යයෝයයිද; වුච්චරෙ, කියනුලැබෙත්, පුත්තානං, පුත්‍රයන්ගේ; ආහුනෙය්‍යාච, ආහුනෙය්‍යයෝද වෙත්. (හෙවත් සත්කාරයට සුදුස්සෝද වෙති) පජාය, පුත්‍ර ප්‍රජාවට; අනුකම්පකා, අනුකම්පා කරන්නාහු වෙත්; තස්මාහි, එහෙයින් වනාහි; තෙ, ඔවුන්ට; පණ්ඩිතො, පණ්ඩිතතෙම; නමස්සෙය්‍ය, නමස්කාර කරන්නේය; අථ, නැවත; සක්කරෙය්‍ය, සත්කාරද කරන්නේය.

“ අන්නෙන අථ පානෙන වත්ථෙන සයනෙන ච
උච්ඡාදනෙන න්හාපනෙන පාදානං ධොවනෙන ච
තායනං පාරිචරියාය මාතා පිතූසු පණ්ඩිතා
ඉධ චෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙච මොදතීති.”

අන්නෙන, ආහාරයෙන්ද; අථ, නැවත; පානෙන, පානයෙන්ද; වත්ථෙන, වස්ත්‍රයෙන්ද; සයනෙන ච, සයනයෙන්ද; උච්ඡාදනෙන, ඇඟ ඉලීමෙන්ද; න්හාපනෙන, නෑවීමෙන්ද; පාදානං ධොවනෙනච, පා සේදීමෙන්දයි; මාතා පිතූසු, මව්පියන් කෙරෙහි; තාය පාරිචරියාය, ඒ පාරිචරියාවෙන්; හෙවත් මනාසේවනයෙන්; පණ්ඩිතා, පණ්ඩිතයෝතුමූ; ඉධචෙව, මේ ලෝකයෙහිද; නං, ඕහට; පසංසන්ති, ප්‍රසංසාකෙරෙත්; පෙච්ච, පරලෙව්හි; සග්ගෙච, සවගීයෙහිද; මොදති, (දිව්‍යසම්පත්තීයෙන්) සතුටුවේ.

( අඞ්ගුත්තරනිකාය )

“ මාතා පිතු උපට්ඨානං—එතං මඞ්ගල මුත්තමං ”.

මව්පියන්ට උපස්ථාන කිරීම උතුම් මඞ්ගලයෙක් වේ.

( මඞ්ගලසුත්‍රය )

“පඤ්චහි ඛො ගහපති පුත්ත ඨානෙහි පුත්තෙන පුරත්ථිමාදිසා මාතා පිතරො පච්චුපට්ඨාතබ්බා, භතො නෙ භරිස්සාමි, කිච්චං නෙසං කරිස්සාමි, කුලවංසං ඨපෙස්සාමි, දායජ්ජං පටිපජ්ජාමි, අථවා පන පෙතානං කාලකතානං දක්ඛිණං අනුප්පදස්සාමි, ඉමෙහි ඛො ගහපති පුත්ත පංචහි ඨානෙහි පුත්තෙන පුරත්ථිමාදිසා මාතා පිතරො පච්චුපට්ඨාතබ්බා.”

ගෘහපති පුත්‍රයානනි, පුත්‍රයා විසින් පූර්දිශා සඞ්ඛ්‍යාත මව්පිය දෙදෙනා කාරණා පසකින් උපස්ථාන කටයුතුතාහුය—

කවර නම් පස්කාරණයකින්ද යත්?

(1) දෙමව්පියන්විසින් රක්‍ෂාකරණ ලද්දවූ මම වෘඩහාවයට පැමිණියාවූ ඒ මව්පියන් රක්‍ෂාකරන්නෙමියි කියාද,

(2) ඒ මව්පියන්ට රාජකුලාදියෙන් පැමිණියාවූ කටයුතු කරන්නෙමියි කියාද,

(3) දෙමව්පියන් සනාතකවූ වංශතුව නොනසා පවත්වමින් කුල වංශය පිහිටුවන්නෙමියි කියාද,

(4) දායාද පිළිපදින්නෙමියි කියාද,

(5) නැවත කාලක්‍රියාකළාවූ ඒ දෙමව්පියන්ට දන්දී පින්දෙන්නෙමියි කියාද යන මේ කාරණා පසින්වේ.

( සිගාලොවාදසූත්‍රය )

**ගුරුවර උපස්ථානය**—"පචහි ඛො ගහපති පුත්තඨානෙහි අන්තෙවාසිනා දක්ඛිණාදිසා ආචරියා පච්චුපට්ඨා තබ්බා, උට්ඨානෙන, උපට්ඨානෙන, සුස්සුසාය, පාරිචරියාය, සක්කච්චං සිප්ප පටිග්ගහණෙන ඉමෙහි ඛො ගහපති පුත්ත පචහි ඨානෙහි අන්තෙවාසිනා දක්ඛිණාදිසා ආචරියා පච්චුපට්ඨා තබ්බා."

ගෘහපති පුත්‍රයානනි—අතවැසියා විසින් දක්‍ෂිණා දිසා සඞ්ඛ්‍යාතවූ ආචාර්‍ය්‍යවරයෝ පස්කාරණයකින් උපස්ථාන කට යුතුතාහුය. ඒ කාරණා පසනම් කවරේද ?

(1) ගුරුන් වහන්සේ දැක හුනස්නෙන් නැගිටීමය;
(2) උපස්ථාන කිරීමය;
(3) කීදෙය මනාව ශ්‍රවනය කිරීමය;
(4) දැහැටි පැන්දීම් ආදි පාරිචර්‍ය්‍යාවය;
(5) සකස්කොට ශිල්ප ඉගණීමය යන මේ පස්කාරණයයි.

( සිගාලොවාදසූත්‍රය )

**ගිලානොපස්ථානය**—

"යො ගිලානං උපට්ඨාති සො උපට්ඨාති මං ඉති
මහා කාරුණිකෙනාපි සො භුසං පරිවණ්ණිතො."

යො, යමෙක්; ගිලානං, රෝගීහට; උපට්ඨාති, උපස්ථාන කෙරේද; සො, හෙතෙමේ; මං උපට්ඨා ඉති, මට උපස්ථාන කෙරෙයි කියා; , මහාකාරුණිකෙන අපි, මහාකාරුණා ඇති

බුදුරජහු විසිනුදු; සො, ඒ රෝගීන්ට අත්පා මෙහෙකරන් නේ; භුසං, බොහෝසේ; (නැවත නැවත) පරිවණ්ණිතො, හැම පරිද්දෙන් වර්ණනාකරණලදී.*

(සද්ධම්මොපායනය)

**වතාවත්කිරීමේ ආනිසංස—**

"ආපදාසු සහායානං ලාභො ඉට්ඨඵල සිද්ධිච
පරිවාර සම්පදා චෙති වෙය්‍යාවච්ච ඵලම්මතං."

ආපදාසු; විපත්තියක්සම්භවූකල්හි; සහායානංලාභො, සහායයන්ගේ ලාභය; ඉට්ඨඵලසිද්ධිච, කැමති ඵලයක් සිද්ධවීමද; පරිවාරසම්පදාච ඉති, පරිවාර සම්පත්තියද යන මොහු; වෙය්‍යාවච්චඵලං, රෝගීන්ට හා මහලුන්ට කරණලද අත්පාමෙහෙයෙහි ඵලයයි; මතං, දත්නාලදහු.

(සද්ධම්මොපායනය)

**119.** ලොව ඇත් තන් නුවණින් විමසා දැ ක
හිත නැත් තන් සයි නොසිතා වෙනස ක
ගුණ ඇත් තන් ගුණකිම නොවිසැ ක
නුව නැත් තන් පින්කරණ උපාය ක

ලොව ඇත්තන්, ලෝකවාසීන්; නුවණින්, ඥාණයෙන්; විමසා, විමංසනයකොට; දැක, දර්ශනයකොට; හිතනැත්තන්යයි, අහිත අයවලුන්යයි; වෙනසක නොසිතා, වෙනසක් නොසිතා; ගුණ ඇත්තන්, ගුණවන්තයින්ගේ; ගුණ (විද්‍යමාන) ගුණය; සැක නොවී, සංකා රහිතව; කීම, කථනයකිරීම; නුවනැත්තන්, ඥාණවන්තයින්; පින්කරණ, පින්කරන්නාවූ; උපායක, උපායෙක්ය.

**ගුණ ඇත්තන් ගුණකීම නොවිසැක – නුවණැත්තන් පින් කරණ උපායක—**

"කුසලංහි කරොන්තානං පහාසුස්සාහ කාරිකා
ගුණතො වණ්ණනා යාසා පසංසාති පකිත්තිතා."

කුසලං කරොන්තානංහි, පින්කරන්නවුන්ට; පහාස, සතුට හා; උස්සාහකාරිකා, උත්සාහකරන්නාවූ; ගුණතො, ඒකරණ පින්ගුණයෙන්; යාහි වණ්ණනා, යම්බඳු ගුණවර්ණනාවක්වන්නීද; සා, ඕතොමෝ; පසංසා ඉති, ප්‍රසංසායයි; පකිත්තිතා, කියනලදී.

(සද්ධම්මොපායනය)

---

* සර්වඥයන්වහන්සේවිසින් ස්වකීය ශ්‍රීහස්තයෙන්ම ගිලනුන්ට උපස්ථාන කරතිබෙනබව පූතිගත්තතිස්ස ස්ථවිරයන්වහන්සේගේ කථාවෙන් දතහැකිවේ.

"සතහට පින්කර න
සතුටු විරිය වඩව න
ඔවුන් ගුණ පවස න
කලට පැසසුම් කුසලි දසව න"

(කාව්‍යශේඛරය)

120. ගොඩ ලමිනේ සත්වග බවදුකි නේ
ගෙණ නිවනේ සිටුවන තුටුමති නේ
තුණුරුවනේ ගුණ සිහිකළ සතු නේ
නැත විඳිනේ දුක් සසරෙහි ඉති නේ

සත්වග, සත්ත්වවර්ගයා; බවදුකිනේ, සංසාරදුක්ඛයෙන්; ගොඩ ලම්නේ, තීරප්‍රාප්තකොට; තුටුමතිනේ, තුෂ්ටිමාත්‍රයෙන්; ගෙණ, ග්‍රහණයකොට; නිවණේ සිටුවන, නිර්වාණයෙහි ස්ථාපනකරන්නාවූ, තුණුරුවනේ ගුණ, රත්නත්‍රයෙහි ගුණය; සිහිකළ, අනුස්මරණය කළහොත්; සතුනේ, සත්ත්වයිනි; ඉතිනේ, එතෙකින්; සසරෙහිදුක්; සංසාරයෙහි දුක්ඛය; විඳිනේ නැතු, විඳිනු නැත්තේය.

තුණුරුවනේ—* තුණුරුවන් නම් :- බුද්ධරත්නය, ධම්මරත්නය, සඞ්ඝරත්නය යන මේ රත්නත්‍රයයි. බෞද්ධයන්ගේ ශ්‍රද්ධා බීජරෝපණයට වස්තුවූහෙයින් හෙවත් ක්ෂෙත්‍ර ස්ථානවූහෙයින් වස්තුත්‍රය නමුදුවූ බුද්ධ-ධම්ම-සඞ්ඝයෝ කවරනම් අර්ථයකින් රත්න නම්වීදයත් ?

"චිත්තීකතං මහග්ඝඤ්ච—අතුලං දුල්ලභ දස්සනං
අනොමසත්ත පරිභොගං—රතනං තෙන පවුච්චති"

1. මහේශාක්‍යවූ දෙවිමිනිසුන්විසින් ගරුබුහුමන් කරණලද බවය; 2. (මෙතෙක් අගීයයි නියම කළනොහැකි) මහගුබවය; 3. (සමාන කළහැකි අනිකක්හුනැති) අතුලබවය; 4. දුර්ලභවූ දර්ශනඇතිබවය; 5. අලාමකවූ සත්ත්වයන්විසින් පරිභෝග කටයුතුබවය; යන මේ අර්ථයන් හේතුකොටගෙණ රත්න (රුවන්) නම්වෙති.

තවද (නුවණැත්තන් විසින් සිත් ඇලවියයුතු ගුණ ඇති යන) රම්‍යාර්ථයෙන් "ර" නම්වේ සසරදුක් මගවතුරුතරණය

* "බුද්ධො සබ්බඤ්ඤුත ඤාණො—ධම්මො ලොකුත්තරො නව
සඞ්ඝො මග්ග ඵලට්ඨොච—ඉච්චෙතං රතනත්තයං"

කිරීමෙහි (සසර සයුරෙන් එතරවීමෙහි) ඉතා උපකාරීවන්නේය යන අර්ථයෙන් **"ත"** නම්වේ. සරණගියවුන් සුගතියට හා නිර්වාණයට නයනය (පැමිණවීම) කරන්නේය යන අර්ථයෙන් **"න"** නම්වේ. මෙසේ "ර" වූයේත් ක්ෂේමය. "ත" වූයේත් ක්ෂේමය. "න" වූයේත් ක්ෂේමය යන අර්ථයෙනුදු රත්න නම්වෙතැයි දතයුතුයි.

**තුණුරුවනේ ගුණ**—තුණුරුවන්ගේ ගුණතබා කල්පයක් මුළුල්ලෙහි තමන්සේමවූ බුදුකෙනෙකුන්වහන්සේ විසිනුදු අනික් එකබයකුදු නොවදරා බුදුගුණම වදළත් ඉතා දීර්ඝ කාලාන්තරයකින් කල්පය ගෙවීගියත් බුදුගුණ නම් නොගෙවෙන්නේයයි.

"බුද්ධො'පි බුද්ධස්ස භණෙය්‍ය වණ්ණං
කප්පම්පිචෙ අඤ්ඤම'භාසමානො
ඛීයෙථ කප්පො චිර දීඝමන්තරෙ
වණ්ණො න ඛීයෙථ තථාගතස්ස"

යනුවෙන් ප්‍රකාශිතයි. මෙසේ බුද්ධරත්නයෙහි ගුණස්කන්ධය බුදුමුඛයකින් කල්පයක් මුළුල්ලෙහි වර්ණනාකොට නිමවාලන්ට නොපිළිවන්කලැ තුණුරුවන්ගේ ගුණ පෘථග්ජනවූ අපවැන්නන්ට කෙසේ නම් විෂයවේද? නොවේමැයි. ඒ බුද්ධගුණසාගරයෙන් බින්දුමාත්‍රයකුදු දක්වන්නට අපි අපොහොසත්වම්හ. එබැවින් අසදෘශවූ, අවාච්‍යවූ, අද්භූතවූ, අනෝපමෙය්‍යවූ රත්නත්‍රයාගේ අප්‍රමාණ ගුණසමූහයන්කෙරෙන් **බුද්ධානුස්මෘති ධර්මානුස්මෘති සංඝානුස්මෘති** භාවනාවන්හි ප්‍රකාශිත **සූවිසි මහාගුණයන්ගේ** නාම මාත්‍රය පමණක් මෙහි දක්වනු ලැබේ.

**බුද්ධානුස්මෘති භාවනාව**—"ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙව මනුස්සානං බුද්ධො භගවාති"

මෙම පාඨයෙහි අන්තර්ගත වර්ණනා විෂයාතික්‍රාන්ත **නවමහා** ගුණයෝ නම්:—

**1. අරහං 2. සම්මාසම්බුද්ධො 3 විජ්ජාචරණසම්පන්නො 4. සුගතො 5. ලොකවිදූ 6. අනුත්තරො 7. පුරිසදම්මසාරථී 8 සත්ථා දෙවමනුස්සානං 9. භගවා** යන මොවුහු වෙත්.

1. **අරහං**—සො භගවා බුද්ධො, ඒ භාග්‍යවත් බුදුරජතෙම; ඉතිපි, මේ මේ කාරණයෙන්ද; අරහං, අර්හත් නම් වනසේක.

කවර කාරණයන්ගෙන් අර්හත් නම් වනසේක්ද යත්?

"ආරකත්තා හතත්තාච—කිලෙසාරීන සො මුනි
හතසංසාර චක්කාරෙ—පච්චයාදීන චාරහො
නරහො කරොති පාපානි—අරහං තෙන සො මුනි."

කෙලෙසුන් කෙරෙන් දුරුවූ හෙයින්ද, කෙලෙස් සතුරන් නැසූහෙයින්ද, සංසාරචක්‍රයෙහි අරකැපූහෙයින්ද, ප්‍රත්‍යයාදීන් පිදීමට සුදුසුහෙයින්ද, රහසිවත් පව්නොකරණහෙයින්ද යන මෙතෙක් කාරණයෙන් ඒ භාග්‍යවත් බුදුරජාණෝ අර්හත් නම් වනසේක *

"රහසත් පව් නොකො ව
කෙලෙසරයනුත් දුරුකො ව
නිසිවූයෙන් පුද ව
අරහ යැයි නම කියති මුනිඳු ව"

මේ අර්හත් ගුණය සිහිකොට මෙසේ නමස්කාර කටයුතු :—

"ඉතිපි සො භගවා අරහං, අරහං වත සො භගවා, අරහන්තං භගවන්තං සරණං ගච්ඡාමි, අරහන්තං භගවන්තං සිරසා නමාමි."

අරහං අරහොති නාමෙන
අරහං පාපං නකාරයෙ
අරහත්ත ඵලං පත්තො
අරහං නාම තෙ නමො.

2. **සම්මාසම්බුද්ධො**—සො භගවා බුද්ධො, ඒ භාග්‍යවත් බුදුරජතෙම; ඉතිපි, මේ මේ කාරණයෙන්ද; සම්මාසම්බුද්ධො, සම්මාසම්බුද්ධ නම්වනසේක.

කවර කාරණයකින් **සම්‍යක්සම්බුද්ධ** නම් වනසේක්ද යත්?

"සබ්බස්ස ඤෙය්‍යධම්මස්ස—දුක්ඛාදි චතුසච්චතො
අත්තනා යෙව බුද්ධත්තා—සම්බුද්ධො නාම සො මුනි."

---

* ශ්‍රුතාපාද පරිවෙණාධිපති බුද්ධ පුත්‍ර මහාස්ථවිරයන්වහන්සේ විසින් "අරහං" යන එක පදයෙණ විස්තර කරමින් සූතිස් පරිච්ඡේදයකින්යුත් "පූජාවලී" නම්වූ මහා ග්‍රන්ථය කරණලදී.

මනා හෙතුවෙන් ක්‍රමයෙන් ප්‍රත්‍යය සමුත්පන්න ප්‍රත්‍යය අසමුත්පන්න ත්‍රෛකාලික සියලු ධර්මයන් අනන්‍ය ශාස්තෘකව (වෙන ගුරුකෙනෙක් නැතිව) තමන්වහන්සේම අවබොධ කළ බැවින් හෙවත් විශිෂ්ට ඥානයෙන් දතයුතු චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන් පූර්ව භාගයෙහි විදර්ශනා ප්‍රඥාදියෙන්ද, අධිගම කාලයෙහි මාර්ගප්‍රඥාවෙන්ද, අපර භාගයෙහි සර්වඥතාඥානාදියෙන්ද **විශෙෂයෙන් දැන වදාළහෙයින් සම්මාසම්බුද්ධ** නම් වනසේක.

"**තුන් කල් හිමි පැව ති**
**පදරුත් සියල් ලොව ඈ ති**
**අතැඹුලසෙ දැනග ති**
**එයින් සම්මාසම්බුදුන යෙ ති**"

**සම්‍යක්සම්බුද්ධ ගුණය සිහිකොට මෙසේ නමස්කාර කටයුතු :—**

"ඉතිපි සො භගවා සම්මාසම්බුද්ධො, සම්මාසම්බුද්ධො වත සො භගවා, සම්මා සම්බුද්ධං භගවන්තං සරණං ගච්ඡාමි, සම්මා සම්බුද්ධං භගවන්තං සිරසා නමාමි."

සම්මා සම්බුද්ධ ඤාණෙන
සම්මා සම්බුද්ධ දෙසනා
සම්මා සම්බුද්ධ ලොකස්මිං
සම්මා සම්බුද්ධ තෙ නමො.

3. **විජ්ජාචරණ සම්පන්නො**—සො භගවා බුද්ධො, ඒ භාග්‍යවත් බුදුරජතෙම; ඉතිපි, මේ මේ කාරණයෙන්ද; විජ්ජාචරණ සම්පන්නො, විජ්ජාචරණ සම්පන්න නම් වනසේක.

කවර කාරණයන්හෙන් **විජ්ජාචරණ සම්පන්න** නම් වනසේක්ද යත්?

වින්දයුතු නිර්වාණරසය තත්වූ පරිද්දෙන් විඳගන්නා අර්ථයෙන් හෝ තමහට ප්‍රතිපක්ෂවූ අවිද්‍යා නමැති ඝනාන්ධකාරය ප්‍රදලනයකරණ අර්ථයෙන් හෝ විද්‍යා නම්වූ ත්‍රිවිද්‍යා අෂ්ටවිද්‍යාවෙන් හා පසළොස් චරණ ධර්මයෙන්ද පරිපූර්ණ බැවින් හෝ අවිකල බැවින් හෝ **විජ්ජාචරණ සම්පන්න** නම් වනසේක.

**අෂ්ට විද්‍යාවෝ —**

"විපස්සනා ඤාණ මනොමයිද්ධි
ඉද්ධිප්පභෙදෙපි ච දිබ්බසොතං
පරස්ස චෙතො පරියාය ඤාණං
පුබ්බෙ නිවාසානු ගතඤ්ච ඤාණං
දිබ්බඤ්ච චක්ඛාසව සංඛයොච
එතානි ඤාණානි ඉධට්ඨ විජ්ජා."

i සියළු සංස්කාර ධර්මයන් අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් දක්නාඥානය විදර්ශනඥාන නම්වේ.

ii තමතමන්ගේ රූපය වැනි රූපයන් මවාලීමෙහි සමර්ථඥානය මනෝමය ඍද්ධි නම්වේ.

iii අහසට නැගීම්, පොළොව කිමිදීම්, දියපිට යාමර්ම ආදී ආශ්චර්ය්‍යමත් දෙය කිරීමෙහි ඥානය ඍද්ධි විකුර්වණ නම්වේ.

iv දෙව්ලොව බඹලොව පිටසක්වල ආදියෙහි පවත්නා ශබ්දය එක තැන සිට ඇසීමෙහි සමර්ථඥානය දිව්‍යශ්‍රොත්‍රඥාන නම්වේ.

v අනිකෙක් විසින් කරන්ට කියන්ට සිතූදෙය දැනගැනීමෙහි සමර්ථඥානය චෙතොපරිය ඥාන නම්වේ.

vi පෙරවිසූ කඳ පිළිවෙළ දැනගන්නා ඥානය පූර්වේනිවාසානුස්මෘතිඥාන නම්වේ.

vii මේ මේ කර්මකල සත්වයෝ මේ මේ ස්ථානවල උපදනාහුයයි ඒ ඒ සත්වයන්ගේ කර්මවිපාකදන්නා ඥානය දිව්‍යචක්ෂුරභිඥාන නම්වේ.

viii කාමාදි සියලු ආශ්‍රවයන් පහකිරීමෙහි ඥානය ආශ්‍රවක්ෂයකර ඥාන නම්වේ. (කායකර්මාදී සියලු කර්මයන් ක්ෂයකරණ හෙයින්) මීට කර්මක්ෂයකරඥාන යයිද, ඒ ඒ මාර්ගයෙන් පහකල යුතු කෙලෙසුන් මරමින් පවත්නා අර්ථයෙන් මාර්ගඥාන යයිද, කියනු ලැබේ.

පසලොස්චරණ ධර්මයෝ —

" සීලං වරං ඉන්ද්‍රිය සංවරො ච
මත්තා සිතා ජාගරියානු යොගො
සද්ධා හි ඔරොත්තප්ප බහුස්සු තත්තං
පරක්කමො චෙව සතී මතී ච
චත්තාරි ඣානානි ච තානිමානි
තිපඤ්ච ධම්මා චරණා ති ඤෙය්‍යා
එතානි විජ්ජාහි ච සම්පයොගො
සම්පන්න විජ්ජා චරණො මුනින්දො."

1. උතුම් ප්‍රාතිමොක්ෂ සංවරසීලය, 2. ඉන්ද්‍රිය සංවරසීලය, 3. භොජනයෙහි පමණදන්නා බවය, 4. ජාගරණ ප්‍රතිපදාවය, (නිද්‍රාවර්ජිත කිරීමය) 5. ශ්‍රද්ධාවය, 6. පවට ලජ්ජාවීම් වශයෙන් පවත්නාහිරිය, 7. පවට භයවීම් වශයෙන් පවත්නා

ඔත්තප්පය, 8. බොහෝ ඇසූ පිරූ තැන් ඇතිබවය, 9. සතර සම්‍යක් ප්‍රධාන වීය්‍යීය, 10. සතරසතිපට්ඨාන ගත සමෘතිය, 11. ප්‍රඥාවය, 12. 13. 14. 15. ප්‍රථම ධ්‍යානාදි සතර ධ්‍යාන යෝග, යන මේ පසළොස්දෙන **චරණ ධර්‍මයෝයි.**

“**චරණ**” යනු පාදයට නමෙකි. ත්‍රිවිධ ශික්‍ෂා සඞ්ගෘහිත මේ පසළොස් ධර්‍මයන් කරණකොටගෙණ ආය්‍යීශ්‍රාවක තෙමේ නිර්‍වාණ නමැති දිසාවට ගමන් කරයි යන අර්ථයෙන් (“චරති අරිය සාවකො නිබ්බාන දිසං ගච්ඡති අනෙනාති චරණං යනු නිර්‍වචන හෙයින්) මේ පසළොස් ධර්‍මයෝ **චරණ** නම්වූහ.

යට දැක්වූ අෂ්ටවිද්‍යාවෙන් හා මේ පසළොස්චරණ ධර්‍මයන් ගෙන්ද යුක්ත බැවින් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ **විජ්ජාචරණ සම්පන්න** නම් වනසේක.

“විද්දූ නැණ අට ද
පසළොස් සරණ ගුණය ද
ඇතියෙන් එමුනි ස ද
පිරුණු විජ්ජාචරණ නම් ල ද”

**විජ්ජාචරණ සම්පන්නගුණය** සිහිකොට මෙසේ නමස්කාර කටයුතු:—

“ඉතිපිසො භගවා විජ්ජාචරණ සම්පන්නො විජ්ජාචරණ සම්පන්නො වතසො භගවා, විජ්ජාචරණ සම්පන්නං භගවන්තං සරණං ගච්ඡාමි, විජ්ජාචරණ සම්පන්නං භගවන්තං සිරසා නමාමි.”

“විජ්ජාචරණ සම්පන්නො
තස්ස විජ්ජා පකාසිතා
අතීතා නාග තුප්පන්නා
විජ්ජාචරණ තෙ නමො”

4. **සුගතො**—සො භගවා බුද්ධො, ඒ භාග්‍යවත් බුදුරජතෙම; ඉතිපි, මේ මේ කාරණයෙන්ද; සුගතො, සුගත නම් වනසේක.

කවර කාරණයකින් **සුගත** නම් වනසේක්ද යත්?

“නීය්‍යා තස්සා න වජ්ජන්තා
ගන්තා සුන්දරං සිවං
සම්මා ග න්තා ගිරස්ස
ගදන්තා සුගතො මුනි”

ඒ භාග්‍යවත් මුනිරජතෙම, නිරවද්‍ය ගමන් ඇතිහෙයින්ද, සුන්‍දරවූ නිවන්පුර ගිය හෙයින්ද, මනාව ගිය හෙයින්ද, මනා තෙපුල් ඇති හෙයින්ද, සුගත නම් වනසේක.

" යහපත් කොට යෙ — තැ සී
සුන්දර තැනට සැප — තැ සී
සොඳුරු බස් කිය — තැ සී
කියති ඒ මුනිරජුට සුග — තැ සී "

මෙම **සුගත** ගුණය අනුස්මරණයකොට මෙසේ නමස්කාර කටයුතු:—

"ඉතිපිසො භගවා සුගතො, සුගතො වතසො භගවා, සුගතං භගවන්තං සරණං ගච්ඡාමි, සුගතං භගවන්තං සිරසා නමාමි."

"සුගතො සුගතත්තා නං
සුගතො සුන්‍දරම්පි ච
නිබ්බාණං සුගතිං යන්ති
සුගතො නාම තෙ නමො"

5. **ලොකවිදූ**—සො භගවා බුද්ධො, ඒ භාග්‍යවත් බුදුරජතෙම; ඉතිපි, මේ මේ කාරණයෙන්ද; ලොකවිදූ, ලොකවිදූ නම් වන සේක.

**කවර කාරණයකින් ලෝකවිදූ නම් වීදයත්?**

"සබ්බථාපි විදිත ලොකතො ලොකවිදූ" යනුවෙන් සත්ව, සංඛාර, ඔකාස යන ලොකත්‍රය සර්වප්‍රකාරයෙන් අවබොධ කළ හෙයින් **ලොකවිදූ** නම්වේ.

රූපාදී පඤ්චකාමයෙහි සක්ත විසක්තවන බැවින් සත්වයයි කියනලද ඉන්‍ද්‍රිය ප්‍රතිබද්ධ ස්කන්ධයන්ගේ රාශිය හෝ පරම්පරාව **සත්වලොක** නම් වන්නේය. අනන්තා පරිමාණ ලොකධාතුයයි කියනලද අනින්‍ද්‍රිය ප්‍රතිබද්ධ රූපාදීන්ගේ සමූහය හෝ පරම්පරාව ඒ ඉන්‍ද්‍රිය බද්ධරූපාදීන්ගේ පිහිටීමට ආධාරවන බැවින් **ඔකාස (අවකාශ) ලොක** නම් වන්නේය. ඉන්‍ද්‍රියා නින්‍ද්‍රිය ප්‍රතිබද්ධ ලොකදෙදෙනම හෙතු ප්‍රත්‍යයන් කරනකොටගෙණ හට ගන්නා හෙයින්ද, පවත්නාහෙයින්ද, විනාශවන හෙයින්ද, **සංඛාරලොක** නම්වන්නේය. ඒ මේ ත්‍රිවිධලොකය තත්වාකාරයෙන්ම දැන වදාළ බැවින් අපගේ ස්වාමිවූ ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ **ලොකවිදූ** නම් වනසේක.

"තුන්ලොව තතු ලෙස ව
දුනාගෙණ තොදත් මේලොව ව
දෙසුමෙයන් නියමකො ව
ලොකවිදු යයි කියති මුනිඳු ට"

ලොකවිදුගුණය අනුසමරණයකොට මෙසේ නමසකාර කටයුතු:-

"ඉතිපි සො භගවා ලොකවිදූ, ලොකවිදූ වත සො භගවා, ලොකවිදූං භගවන්තං සරණං ගච්ඡාමි, ලොකවිදූං භගවන්තං සිරසානමාමි."

"ලොකවිදූ ති නාමෙන
අතීතා නාග තෙ විදූ
සඞ්ඛාර සත්ත මොකාසො
ලොකවිදූ නාම තෙ නමො"

6. අනුත්තරෙ—සො භගවා බුදෙධා, ඒ භාග්‍යවත් බුදුරජතෙම; ඉතිපි, මේ මේ කාරණයෙන්ද; අනුත්තරො, අනුත්තර නම් වනසේක.

කවර කාරණයකින් අනුත්තර නම් වීදයත්?

"නත්ථි උත්තරො එතස්ස" යනුවෙන් සීලසමාධි ප්‍රඥා විමුත්ති විමුත්ති ඥාණ දශීණාදිවූ ගුණවිශෙෂයෙන් හා දෙතිස්මහා පුරුෂලක්‍ෂණ අසූ අනුව්‍යඤ්ජනයෙන් ප්‍රතිමණ්ඩිත රූප සමපත්තියෙන්ද තමාට අධිකයෙක් තබා සදෘශයෙක් පමණවත් තුන්ලොවෙහිම නැති බැවින් බුදුරජාණෝ අනුත්තර නම් වන සේක.

"හැම ගුණයෙන් න දු
සම වැඩි සතකු ඇම දු
දියෙතහි නැති ස දු
අනුත්තර යයි කියති මුනි දු"

ඒ අනුත්තරගුණය සිහිකොට මෙසේ නමස්කාර කටයුතු:—

"ඉතිපි සො භගවා අනුත්තරො, අනුත්තරො වත සො භගවා අනුත්තරං භගවන්තං සරණං ගච්ඡාමි, අනුත්තරං භගවන්තං සිරසා නමාමි."

"අනුත්තරො ඤාණ සීලෙන
යො ලොකස්ස අනුත්තරො
අනුත්තරො පූජ ලොකස්මිං
තං නමස්සාමි අනුත්තරො"

7. **පුරිසදම්ම සාරථී**—සො භගවා බුද්ධො, ඒ භාග්‍යවත් බුදුරජතෙම; ඉතිපි, මේ මේ කාරණයෙන්ද; පුරිස දම්ම සාරථි, පුරිස දම්ම සාරථි නම් වනසේක.

**කවර කාරණයකින් පුරිස දම්ම සාරථී නම් වීදැත්?**

“පුරිසදම්මෙ සාරෙතීති පුරිසදම්ම සාරථී” යනුහෙයින් දමිය යුතු බ්‍රහ්ම සුරාසුර මනුෂ්‍යා මනුෂ්‍ය තිරශ්චීන පුරුෂයන් දමානුයි හික්මවානුයි * පුරිස දම්ම සාරථී නම්වේ. භාග්‍යවතුන් වහන්සේ විසින් අපලාල, ආරවාල, චූලෝදර, මහෝදර, නන්දොපනන්ද, අග්නිශිඛ, ධූම්‍රශිඛාදී නාගරාජයන්ද; නාලාගිරි, ධනපාලාදි හස්තිරාජයන්ද; සච්චක, නිගණ්ඨපුත්‍ර; අම්බට්ඨ මාණවක, සොණදණ්ඩ, කූටදන්ත, අග්ගිදත්ත, අඞ්ගුලිමාල, ඝොටමුඛ, උපාලි ගෘහපති ආදිවූ මනුෂ්‍ය පුරුෂයන්ද; ආලවක සූචිරෝම, ඛරරෝම ආදී යක්ෂයන්ද, ශක්‍රාදි දෙවියන්ද, රාහුආදි අසුරයන්ද, බකාදි බ්‍රහ්මයන්ද විසිතුරුවූ හික්මවන උපායෙන් දමනය කරණ ලද්දහුය.

“බඹ සුර යකුත්ත ද
දමනය කර තමන්ල ද
සෙත්දී මුනිඳු ස ද
පුරිසදම් සාරතී නම් ල ද”

**පුරිසදම්ම සාරථී ගුණය** අනුස්මරණයකොට **මෙසේ** නමස්කාර කටයුතු :—

“ඉතිපිසො භගවා පුරිසදම්මසාරථි, පුරිස දම්ම සාරථිවනසො භගවා, පුරිසදම්ම සාරථිං භගවන්තං සරණං ගච්ඡාමි, පුරිස දම්ම සාරථිං භගවන්තං සිරසා නමාමි.

“සාරථී සාරථි දෙවො
යොලොකස්ස සාරථී
සාරථි පූජලොකස්මිං
තං නමස්සාමි සාරථි”

8. **සත්ථා දෙවමනුස්සානං**—සො භගවා බුද්ධො, ඒ භාග්‍යවත් බුදුරජතෙම; ඉතිපි, මේ මේ කාරණයෙන්ද; සත්ථා දෙවමනුස්සානං, සත්ථා දෙවමනුස්සානං නම්වනසේක.

---

* ආචාර්‍ය්‍ය ගුරුළුගෝමින් විසින් “පුරිසදම්ම සාරථී” යන පදය ගෙණ විස්තාර කෙරෙමින් අටළොස් පරිච්ඡේදයකින් පිරිසුන් අමාවතුර නම් මහා ග්‍රන්ථය කරණලදී.

**කවර කාරණයකින් සත්ථා දෙවමනුස්සානං වීදයත්?**

"දිට්ඨධම්මික සම්පරායික පරමත්ථෙහි යථාරහං අනුසාසතීති සත්ථා" යනුහෙයින් (ඉහාත්මයෙහි) මෙලොවින්වන අර්ථය, (මතු ආත්මයෙහි) පරලොවින්වන අර්ථය, (නිර්වාණ සංඛ්‍යාත) පරමාර්ථය යන ත්‍රිවිධ අර්ථයෙන් යම් යම් පුද්ගලයෙක් යම් යම් අර්ථලාභයකට යොග්‍යවන්නේද, ඒ ඒ පුද්ගලයන්ට ඒ ඒ අර්ථයෙන් අනුශාසනා කරණ හෙයින්ද, ඒ ඒ අර්ථයෙහි පිහිටුවන හෙයින්ද, * ශාස්තෘ නම් වනසේක. **සත්ථවාහොති සත්ථා** යන මේ අර්ථයෙන්ද, බුදුහු ජඞ්ඝසාර්ථයකාට සාර්ථ නායකයා වැනිහෙයිනුත් නෛරුක්තික විධීන් "ශාස්තෘ" නම් වනසේක. යම්සේ සාර්ථ නායක තෙමේ සාර්ථික නම්වූ ජනයන් "චොරකාන්තාරය, ව්‍යාලකාන්තාරය, අමනුෂ්‍ය කාන්තාරය, නිරුදක කාන්තාරය, අල්පභක්ෂ්‍ය කාන්තාරය" යන පඤ්චප්‍රකාර කාන්තාරයෙන් එතරකොට ක්ෂෙමභූමියට පමුණුවාද, එපරිද්දෙන් අපගේ ස්වාමිවූ භාග්‍යවත් තෙමේද, උග්ඝටිතඥ-විපචිතඥ-නෙය්‍ය-පදපරම-යන චතුර්විධ වෛනෙය ජනයන් ජාති, ජරා, මරණ නමැති මහා කතරින් එතරකොට නිර්වාණ නමැති නිරුපද්‍රව ස්ථානයට පමුණුවනසේක. **දෙවමනුස්සානං** යන පදය උත්තම සත්ව පරිච්ඡෙද වශයෙන්ද, මාර්ගාධිගමයට යොග්‍ය පුද්ගල පරිච්ඡෙද වශයෙන්ද, කියනලද නමුත් අප භාග්‍යවත් තෙමේ තිරිසන් ගතික යන්ටද, අනුශාසනාකරණ අර්ථයෙනුදු "ශාස්තෘ" නම් වනසේක. තිරශ්චීනයෝද බුදුන්ගෙන් බණඅසා ත්‍රි හෙතුක ප්‍රතිසන්ධි සංඛ්‍යාතවූ මාර්ගඵලාධි ගමයට බලකාරණාලදින් ඒ උපනිශ්‍රය සම්පත්තීයෙන් දෙවැනි තුන්වැනි ආත්ම භාවයෙහි මාර්ගඵලයන්ට හිමිවෙත්. ඒ බැව් මෙම ලෝවැඩසඟරාවේ 129 වෙනි කවියේ **මණ්ඩුක දිව්‍යපුත්‍රයාගේ කථාව** බැලීමෙන් සපුවේ.

"බව කතරින් එත ර
ලනුයෙත් සතත් හැමවි ර
තිලෝගුරු මුනිව ර
ශාස්තෘ නමින් පුවත ර"

---

* වැලිවිට පිණ්ඩපාතික සරණංකර සංඝරාජ මහාස්ථවිර පාදයන් වහන්සේගේ ශිෂ්‍යවූ සිද්ධාර්ථ බුද්ධරක්ෂිත මහා ස්වාමිපාදයන් වහන්සේ එසිත් **සත්ථා** යන පදය විස්තාරකරමින් ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහ නම් මහාග්‍රන්ථය කරණලදී.

ශාසනා ගුණය අරමුණුකොට මෙසේ නමස්කාර කටයුතු-

"ඉතිපිසො භගවා සත්ථා දෙවමනුස්සානං, දෙවමනුස්සානං වතසො භගවා සත්ථා, සත්ථාරං භගවන්තං සරණං ගච්ඡාමි, සත්ථාරං භගවන්තං සිරසා නමාමි"

"දෙවයක්ඛ මනුස්සානං
ලොකෙ අග්ග ඵලං දදං
දදන්තං දම යන්තා නං
පුරිසා ජඤ්ඤ තෙ නමො"

9. භගවා—සො භගවා බුද්ධො, ඒ භාග්‍යවත් බුදුරජතෙම; ඉතිපි, මේ මේ කාරණයෙන්ද; භගවා, භගවා නම් වනසේක.

කවර කාරණයකින් භගවා නම් වීදයත්?

"භගී භජීභාගී විභත්තවා ඉති
අකාසි භග්ගන්ති ගරූති භාග්‍යවා
බහූහි ඤායෙහි සුභාවි තත්ත නො
භවන්ත ගො සො භගවාති වුච්චති"

ඓශ්වර්‍ය්‍යාදි ෂඩ්විධ භග ධර්‍මයන් ඇත්තේනුයි කියාද, මාර්‍ග ඵල නිර්‍වාණ සඞ්ඛ්‍යාතවූ ආර්‍ය්‍ය ධර්‍මරත්නයද ගැඹුරුවල්හිවූ දුරු-සෙනසුන්ද සෙවීනුයි කියාද, චීවර පිණ්ඩපාතාදි චතුර්විධ ප්‍රත්‍යයන්වද අර්‍ථරස ධර්‍මරස විමුක්තිරසයවද, අධිසීල අධිචිත්ත අධිප්‍රඥාවටද, භාගීනුයි කියාද, ලෞකික ලොකොත්තර ධර්‍ම යන් ස්කන්ධායතන ධාත්වාදි වශයෙන් විභාගකෙළේනුයිකියාද, රාගාදිසියලු පාපධර්‍මයන් බොධිමණ්ඩයෙහිදීම සවාසනාකෙලශ යන් හා සමග භග්නකෙළේනුයිකියාද, සනරාමරලොකයාවිසින් පාෂාණච්ඡත්‍රයක්මෙන් ගරුකටයුතු බැවින් ගරුනුයි කියාද, දානසීලාදී පාරමිතා සාගරයෙහි පාරප්‍රාප්ත බැවින් කොටි ප්‍රාප්තවූ භාග්‍ය ඇත්තේනුයි කියාද, කාය භාවනාදී බොහෝ භාවනාක්‍රමයෙන් මනාකොට වඩනාලද සිත්ඇති සියළු භව යන්ගේ කෙළවරයයි කියනලද නිර්‍වාණයටගියාවූ ඒ ගුරුතෙම භගවා යයි කියනුලැබේ.

(නව අරහාදී බුදුගුණ විභාගය)

"බෙදූයෙන් දහම් ක ද
බජනය කලෙත් ගුණ ක ද
බග දහමින් සස ද
බැවින් බගවත් වීය මුනිස ද"

**භගවත් ගුණය** සිහිකොට මෙසේ නමස්කාර කටයුතු:—

**“ඉතිපි සො භගවා** භගවා, භගවා වතසො භගවා, **භගවන්තං** භගවන්තං **සරණං** ගච්ඡාමි. භගවන්තං භගවන්තා **සිරසා නමාමි.**

“භගවා භගවා යුත්තො
භග්ගං කිලෙස වා ගතො
භග්ගං සංසාර මුත්තාතෙරා
භගවා නාම තෙ නමො”

**ධම්මානුස්සති භාවනාව**—“ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී”ති.

මෙම පාඨයෙහි අනාගීත අසාධාරණ **ෂඩ්විධ මහගුණයෝ නම්:—1. ස්වාක්ඛාතො, 2. සන්දිට්ඨිකො, 3. අකාලිකො, 4. එහිපස්සිකො, 5. ඔපනයිකො, 6. පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී යන මොව්හුවෙත්,**

1. **ස්වාක්ඛාත ගුණය**—ප්‍රතිපත්තියට අනුකූල විපාකයද, විපාකයට අනුකූල ප්‍රතිපත්තියද, භාග්‍යවතුන් වහන්සේ විසින් **“මනාකොට දෙශනාකරණ ලද්දේය”** යනාදී අර්ථයෙන් **සෝවාන්, සකෘදගාමි, අනාගාමි, අර්හත්** යන සතරමග සතර ඵලයද, **නිර්වාණයද,** යන ලොකොත්තර ධර්ම නවය හා විනය, සූත්‍ර, අභිධර්ම යන පිටකත්‍රයද, **“ස්වාක්ඛාත”** ගුණයෙන් යුක්තය. **මේ ස්වාක්ඛාත** ගුණය සිහිකොට මෙසේ නමස්කාර කටයුතු.

“පටිපත්ති ඵලානං හි—උභින්න මනුකූලතො
නව ලොකුත්තරං ධම්මං—පරියත්ති ච දෙසිතං
ධම්මං සපරියත්තිං තං—ස්වාක්ඛා තං නාම තං නමෙ”

2. **සන්දිට්ඨික ගුණය**—භාග්‍යවත් බුදුරජාණන්වහන්සේවිසින් මනාකොට වදාරණලද ධර්මයතෙම ඉහාත්මයෙහිම විපාකදෙන (හෙවත් මේ ජාතියේදීම ලොභාදි කෙලෙස් ප්‍රහීණ කරණ) හෙයින් එම ධර්මය **“සාන්දෘෂ්ටික”** ගුණයෙන් යුක්තය.

**සාන්දෘෂ්ටික** ගුණය සිහිකොට මෙසේ නමස්කාර කටයුතු:—

“ලොභාදී නං කිලෙසා නං—ඉධ විනෙතා පහාණතො
මග්ගං ඵලං ච නිබ්බාණං—ධම්මං සන්දිට්ඨිකං නමෙ”

3. **අකාලික ගුණය**—සම්බුදුරජාණන් වහන්සේ විසින් වදාරණලද ධර්මයතෙම කල්නොයවා විපාකදෙන (හෙවත් මාර්ග චිත්තයට අනතුරුව ඵල චිත්තය උපදවන) හෙයින් එම ධර්මය **අකාලික** ගුණයෙන් යුක්තය.

**අකාලික** ගුණය සිහිකොට මෙසේ නමස්කාර කටයුතු:—

“මග්ගානන්තරං යෙව-ඵලං උප්පජ්ජතී යතො
තස්මා අකාලිකං නාම-තං ධම්මං සිරසා නමෙ”

4. **ඒහිපස්සික ගුණය**—තථාගත බුදුරජාණන් වහන්සේ විසින් වදාරණලද සද්ධර්මයෙහි “එව, බලව” යි දක්විය හැකි ආශ්චර්‍ය්‍යමත් ගුණ ඇතිහෙයින් එම ධර්මය තෙම **ඒහිපස්සික** ගුණයෙන්ද යුක්තය, **ඒහිපස්සික** ගුණය මෙනෙහිකොට මෙසේ නමස්කාර කටයුතු.

“යං සන්තං අප්පටික්කූල්‍යං-ඒහිපස්ස විධිං අලං
තං ඒහිපස්සිකං ධම්මං-නමාමි සිරසා අහං”

5. **ඕපනයික ගුණය**—සර්වඥරාජෝත්තමයාණන් වහන්සේ විසින් වදාරණලද ධර්මයතෙම තමන්ගේ චිත්ත සන්තානයෙහි උපදවා ගැණීමෙන් පවත්වාගත යුතුහෙයින් ඒ ධර්මයතෙම **ඕපනයික** ගුණයෙන්ද යුක්තය **ඕපනයික** ගුණය සිහිකොට මෙසේ නමස්කාර කටයුතු.

“අජ්ඣත්තං උපනෙත්වාන-පවත්තෙතබ්බ භාවතො
ඔපනයිකං ති නිද්දිට්ඨං-තං ධම්මං සිරසා නමෙ”

6. **පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි ගුණය**—ලොකශිවංකරවූ බුදුරජාණන් වහන්සේ විසින් මනාකොට වදාරණලද ධර්මය “උග්ඝටිතඤ්ඤූ, විපඤ්චිතඤ්ඤූ, නෙය්‍ය යන පණ්ඩිතපුද්ගලයන් විසින් වෙන වෙනම දැනගතයුතුය. (තමතමන් විෂයෙහි දත යුතුය) යන අර්ථයෙන් එම ධර්මය **පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි** ගුණයෙන්ද යුක්තය. **පච්චත්තං වෙදිතබ්බ** ගුණය සිහිකොට මෙසේ නමස්කාර කටයුතු.

“උග්ඝටිතඤ්ඤූ ආදීහි-සච්ඡෙත්ත බුජ්ඣිතබ්බතො
පච්චත්තං වෙදිතබ්බං ච-තං ධම්මං සිරසා නමෙ”

**සඞ්ඝානුස්මෘතිභාවනාව** —“සුපටිපන්නො භගවතො සාවකසංඝො, උජුපටිපන්නො භගවතො සාවකසංඝො, ඤායපටිපන්නො භගවතො සාවකසංඝො, සාමීචිපටිපන්නො භගවතො සාවක

සංඝො, යදිදං චත්තාරි පුරිස යුගානි අට්ඨපුරිස පුග්ගලා එස භගවතො සාවකසංඝො, ආහුණෙය්‍යො, පාහුණෙය්‍යො, දක්ඛිණෙය්‍යො, අඤ්ජලිකරණීයො, අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා' ති.

මෙම පාඨයෙහි අනාගීත අතුල්‍යවූ නවවිධ මහාගුණයෝ නම්:— 1. **සුපටිපන්න**, 2. **උජුපටිපන්න**, 3. **ඤායපටිපන්න**, 4. **සාමීචිපටිපන්න**, 5. **ආහුණෙය්‍ය**, 6. **පාහුණෙය්‍ය**, 7. **දක්ඛිණෙය්‍ය**, 8 **අඤ්ජලිකරණීය**, 9. **අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස**, යන මොව්හු වෙත්.

1 **සුප්‍රතිපන්න ගුණය**:—බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝයාවූ ඒ ආර්‍ය්‍ය මහා සංඝතෙම * ඡන්දය, ද්වේෂය, මෝහය, භයය යන සතර අගතියෙන් තොරව මනාව පිළිපන් හෙයින් සුප්‍රතිපන්නය, ඒකාන්තයෙන්ම සුප්‍රතිපන්නය, එම සුප්‍රතිපන්න ගුණය සිහිකොට මෙසේ නමස්කාර කටයුතු.

"චතස්සො ගතියො හිත්වා-සුප්පටිපන්න භාවතො
සංඝං සුප්පටිපන්නං තං-නමාමි සිරසා අහං"

2. **ඍජු ප්‍රතිපන්න ගුණය**:—බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම ඍජුව පිළිපන්සේක හෙවත් චන්ද්‍රවංකය, නංගුලිවංකය, ගෝමුත්‍රවංකය, යනාදි උභයන්තවූ වංකගතිහැර) සර්වප්‍රකාරයෙන්ම **ඍජු ප්‍රතිපන්න** සේක. එම **ඍජු ප්‍රතිපන්න ගුණය** සිහිකොට මෙසේ නමස්කාර කටයුතු.

"චන්දනඞ්ගුලි ගොමුත්ත-වඞ්කෙ හිත්වාන සබ්බසො
එවං උජුගතං සංඝං-නමාමි සිරසා අහං"

3. **න්‍යාය ප්‍රතිපන්නගුණය**:—බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම න්‍යාය ධර්ම සංඛ්‍යාත රහත්බව පිණිස පිළිපන් සේක. ඒ ශ්‍රාවක සංඝයාම ඒකාන්තයෙන් රහත්බවට පැමිණුනුත් අතර නොනැවතී වීර්‍ය්‍යයෙන් පිළිපන්සේක්මය. එම **න්‍යායප්‍රතිපන්න** ගුණය සිහිකොට මෙසේ නමස්කාර කටයුතු.

"හිත්වාන ලොකියං සබ්බං- පත්තො'ව ආසවක්ඛයං
ඤායෙ පතිට්ඨිතං සංඝං-නමාමි සිරසා අහං"

---

* ඡන්දා දොසා භයා මොහා යො ධම්මං අතිවත්තති
නිහීයති තස්ස යසො කාළපක්ඛෙව චන්දිමා.

සතර අගතියෙන් ධර්මය අධර්මය කෙළේද? හේ කලුවර පක්ෂ සඳමෙන් පිරිහෙයි,

4. **සාමීචිප්‍රතිපන්නගුණය:**—බුදුරජාණන්වහන්සේගේ ශ්‍රාවකසංඝ තෙම ඇලක්ළිකිරීමට සුදුසුව පිළිපන්සේක, එහෙයින් ඒ ශ්‍රාවක සංඝතෙම ඒ කාරණයෙන් අභිසමාචාරික ආදි බ්‍රහ්මචරියක ශීලයෙහි හැසිරීම සාමීචිකම්යට සුදුසුව පිළිපන්සේක. සාමීචි ප්‍රතිපන්න ගුණය සිහිකොට මෙසේ නමස්කාර කටයුතු.

"දෙවමනුස්ස ආදීහි-සත්තබ්බ ගාරවාරහං
සාමීචි පටිපන්නං තං-සඞ්ඝං වන්දාමි සබ්බදා"

5. **ආහුණෙය්‍යගුණය:**- බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙම දුරසිටගෙණ එනලද පූජාවෙන් පිදියයුතුය ඒ ශ්‍රාවක සංඝතෙම ඒ කාරණයෙන් දුරසිටගෙන එනලද පූජාවට සුදුසු හෙයින් ආහුණෙය්‍ය වනසේක. ආහුණෙය්‍ය ගුණය සිහිකොට මෙසේ නමස්කාර කටයුතු.

"දූරතො වා හරිත්වා න-පූජෙතුං යුත්ත භාවතො
ආහුණෙය්‍යං ච තං සංඝං-නමාමි සිරසා අහං"

6. **පාහුණෙය්‍ය ගුණය:**- බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙම නෑයන් පිණිස පිළියෙළකළ භොජනයෙන් වැළඳවිය යුතුහෙයින් පාහුණෙය්‍ය වූසේක. ඒ ශ්‍රාවක සංඝතෙම ඒ කාරණයෙන්ම ආගන්තුක සත්කාරයට සුදුසුවූසේක. පාහුණෙය්‍ය ගුණය සිහිකොට මෙසේ නමස්කාර කටයුතු.

"ඤාතකාදී නමත්ථාය-සම්පාදිතම්පි පච්චයං
භොජ පෙතුමලං සංඝං-පාහුණෙය්‍යං නමාම්‍යහං"

7. **දක්ඛිණෙය්‍ය ගුණය:**- බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙම කම්ඵල අදහා දෙනලද ප්‍රත්‍යය සංඛ්‍යාත දක්ෂිණාව පිළිගැණීමට යොග්‍යසේක. ඒ ශ්‍රාවක සංඝතෙම ඒ කාරණයෙන්ම දක්ෂිණාව පිළිගැණීමට සුදුසුසේක. දක්ෂිණාගී ගුණය සිහිකොට මෙසේ නමස්කාර කටයුතු.

"පත්වා න ඵලං දිනනං-දක්ඛිණං යුත්ත භාවතො
දක්ඛිණෙය්‍යං ච තං සංඝං-නමාමි සිරසා අහං"

8. **අඤ්ජලිකරණීය ගුණය:**—බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම දෙහොත් මුදුන්තබා කරනලද අඤ්ජලි කර්මයට යොග්‍යවූසේක. ඒ අඤ්ජලිකරණීය ගුණය සිහිකොට මෙසේ නමස්කාර කටයුතු.

"සිරස්මිං අඤ්ජලිං කත්වා-වන්දිතුං යුත්ත භාවතො
අඤ්ජලිකරණී යොච-සංඝං වන්දාමි සබ්බදා"

9. **අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර ගුණය:**—බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝතම ලොකයාට නිරුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වූසේක. ඒ සංඝතම ඒ කාරණයෙන්ම අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වූසේක. එම ගුණය සිහිකොට මෙසේ නමස්කාර කටයුතු.

"චතු පච්චය බීජානං-වපනෙ ඛෙත්තා භාවතො
පුඤ්ඤක්ඛෙත්තං ගතං සංඝං-නමාමි සිරසා අහං"

**තුණුරුවනේ ගුණ සිහිකළ සතුනේ—නැත විඳිනේ දුක්
සසරෙහි ඉතිනේ—**

"න මනුස්සා මනුස්සෙ හි නාගරොගා නලෙහිවා
ඊසකම්පි භයං හොති රතනානුස්සතික්ඛණෙ
තස්මා නුස්සරණීයෙසු බුද්ධාදිසු සගාරවො
අනුස්සරෙය්‍ය සතතං සංසාරූප සම්භීතිකො"

රතනානුස්සතික්ඛණෙ, තුණුරුවන් සිහිකළ කෙණෙහි; මනුස්සා මනුස්සෙහි, මිනිසුන් නොමිනිසුන් කෙරෙන් හෝ; නාගරොගා නලෙහිවා, නාගයන් කෙරෙන් රොගයෙන් ගින්නෙන් හෝ; ඊසකංඅපි භයංනහොති, මදකුත් භයක් නොවේ; තස්මා, එහෙයින්; සංසාරූප සම්භීතිකො, සසරදුක් සංසිඳුවනු කැමැත්තෙක්; අනුස්සරණීයෙසු, සිහිකට යුතුවූ; බුද්ධාදිසු, බුද්ධාදී රත්නත්‍රයෙහි; සගාරවො, ගෞරව ඇත්තේ; සතතං, හැමවේලෙහි; අනුස්සරෙය්‍ය, ඒ බුද්ධාදීන් සිහිකරන්නේයි.

(සද්ධම්මොපායනය)

**121. පි න් මිස නෑයන් වන පිහිටක් නැ ත
උ න් දෙන මතු හිමිවන දෙයකුත් නැ ත
ඉ න් මතු අදහා සිහිකරතොත් ස ත
අ න් කුසලක් නොකළත් මෙමදේ ඇ ත**

පින්මිස, පුණ්‍යයවිනා; නෑයන් වන, ඥාතීන් වන්නාවූ; පිහිටක් නැත, ප්‍රතිෂ්ඨාවක් නැත්තේය; උන්දෙන, ඒ නෑයන් විසින් දෙනු ලබන්නාවූ; මතු හිමිවන, අනාගතයෙහි අයිති වන්නාවූ; දෙයකුත් නැත, ද්‍රව්‍යයක්ද නැත්තේය; ඉන්, එහෙයින්; මතු අදහා, අනාගතය අදහාගෙන; සත, සත්වයා විසින්; සිහිකරතොත්, (ඒ රත්නත්‍රයෙහි ගුණය) සමරණය කරණු ලබන්නේ වීනම්; අන්කුසලක්, අන්‍යවූ පුණ්‍යයක්; නොකළත්, නොකළේවී නමුත්; මෙමදේ ඇත, මෙම (රත්නත්‍රගුණානු ස්මෘතියම) ප්‍රමාණවත්තේය.

**පින්මිස නැසත් වන පිහිටක් නැත—**

"සයං කතානි පුඤ්ඤානි-තං මිත්තං සම්පරායිකං"

සයං, තමා විසින්; කතානි, කරණලද; පුඤ්ඤානි, (යම්) පුණ්‍යචේතනා කෙනෙක් වේද්ද; තං, ඒ සියල්ල; සම්පරායිකං, පරලෙව්හි; (හිතසැප එළවන්නාවූ) මිත්තං, මිත්‍රයාවේ.

(සංයුත්තනිකාය)

53 කවෙහි "පිණුත් කළනිති කැටුවයෙහි ගිය තැනේදී සැප විඳිත්තේ" යන්න බලනු.

122. පු ර වා සත් රුවනින් මුළු දෙර ණ ය
කරවා පායක් බඹලොව පම ණ ය
බ ඳ . වා රන්දද ලාමිණි තොර ණ ය
දෙ න වා මත් වැඩි පින්බුත් සර ණ ය

සත්රුවනින්, සප්තවිධ රත්නයෙන්; මුළුදෙරණය, සමස්ත ධරණිය; පුරවා, පූරණයකොට; බඹලොව පමණය, බ්‍රහ්මලෝකප්‍රමාණයට; පායක්කරවා, ප්‍රාසාදයක් තනවා; රත්දදලා, ස්වර්ණධ්වජලවා; මිණිතොරණය බඳවා, මාණික්‍ය තොරණයක් බන්ධනයකොට; දෙනවාටත්, දානය කරනවාටත්; (වඩා) බුත් සරණය පින්, බුදුරජාණන් වහන්සේ සරණයාමේ පුණ්‍යය; වැඩි, අධිකවේ.

**සත්රුවනින්—**

"සුවණ්ණං රජතං මුත්තා, මණිවෙළුරියානිච
වජිරං ච පවාලානි, සත්තාහු රතනානි'මෙ"

සප්තවිධ රත්නයෝ නම්— 1 ස්වර්ණය (රත්ය) 2. රජතය (රිදීය) 3. මෞක්තිකය (මුතුය) 4. මණිය (මැණික්ය) 5. වෛරඩු මිණිය (වෛදූර්‍ය්‍යය) 6. වජ්‍රය (දියමන්තිය) 7. ප්‍රවාලය (පබළුය) යන මොහුයි.

**දෙනවාටත් වැඩි පින් බුත් සරණය—**

"බුද්ධ'ස්සෙ'ක ගුණං වා'පි සමනුස්සරතොහියා
පීතිසා තිභවිස්සරිය, ලද්ධස්සපි න විජ්ජති"

බුද්ධස්ස, බුදුන්ගේ; එකගුණංවා අපි, එකගුණයකුදු; අනුස්සරතො සතො, සිහිකරණ සත්පුරුෂයාහට; යාපීති, යම්ප්‍රීතියක් වන්නීද; සා, ඕ ප්‍රීතිතොමෝ; තිභව, තුන්ලොවට; ඉස්සරිය, ඉසුරු බව; ලද්ධස්ස අපි, ලැබුවහුටද; නවිජ්ජති, නැත්මැයි.

(සද්ධම්මොපායනය)

"එවං අචින්තියා බුද්ධා-බුද්ධ ධම්මා අචින්තියා
අචින්තියෙසු පසන්නානං-විපාකො හොති අචින්තියො"

(මෙසේ) බුදුගුණ අචින්ත්‍යයහ, බුද්ධ ධර්මයෝද අචින්ත්‍යයහ, මෙසේම බුදුන්කෙරෙහිද ධර්මය කෙරෙහිද, පහන්වූවන්ට විපාකයෝද අචින්ත්‍යයහ, අප්‍රමෙයවූහ.

123. අ ස මි න් මෙදහම් අලසව නොඉ දේ
පු ර මි න් මෙසිසළු පින්කම් නිබ දේ
කෙලෙ සුන් මුල්නොතබා සිත පසි දේ
ලැ බ ග ත් සගමොක් මතු දුක් නොවි දේ

මෙදහම් අසමින්, මේ ධර්මයන් ශ්‍රවණය කරමින්; අලසව නොඉඳේ, කුසීතව නොහිඳ; මෙසිසළු පින්කම්, මේ සකල පුණ්‍ය කර්මයන්; නිබඳේ, නිරන්තරයෙන්; පුරමින්, පූරණය කරමින්; සිත, චිත්තයෙහි; කෙලෙසුන්, ක්ලේශයන්; මුල්නොතබා පසිඳේ, මුලින්උපුටා ප්‍රච්ඡේදනයකොට; මතු, අනාගතයෙහි; දුක්නොවිඳේ, දුක්ඛානු භවයෙන් වෙන්ව; සගමොක් ලැබගත්, ස්වර්ග මොක්ෂ වය ලබාගනුව.

**පුරමින් මෙසිසළු පින් කම් නිබඳේ – කෙලෙසුන් මුල් නොතබා සිත පසිඳේ—**

"සබ්බ පාපස්ස අකරණං-කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියොදපනං-එතං බුද්ධාන සාසනං"

(කායාදීචාරත්‍රයෙන් සිඩවන්නාවූ) සියළුඅකුශල කර්මයන්ගේ නොකිරීමද, සියළු ලෞකික ලොකොත්තර කුසලයන්ගේ උපදවීමද, උපදවනලද කුසලයන්ගේ වැඩීමද, ක්ලේශයන් කෙරෙන් තමාගේ සිත පිරිසිදු කිරීමද, යන මේ සියල්ල සියලු බුදුවරයන්ගේ අනුශාසනාවෝයි.

(ධම්මපදය)

124. සි ග ප ත් එකෙක් පෙර අනුරුදු තෙරු න් දැ ක
ත ම ල ත් බතින් දුන්හෙන් එකම සැ න් දැ ක
බ ල ව ත් එසින් සුරපති විය ඉ න් දැ ක
නැත වත් කරවි දන්සින් පල මෙයි න් දැ ක

පෙර, පූර්වයෙහි; සිගපත් එකෙක්, යාචක භාවයට පැමිණියාවූ එක් පුරුෂයෙක්; අනුරුදු තෙරුන්දැක, අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ දර්ශනයකොට; තමලත් බතින්, තමා විසින් ලැබුවාවූ

භක්තයෙන්; එකාව සැත්දක, එකම සැත්දක් පමණක්; දුන්නේ, දානය කෙලේය; එයින්, ඒ (දානමය) කුශලයෙන්; ඉත්දක, ඉත්දක නම්වූ; බලවත්, බලවත්තාවූ; සුරපතිවිය, දිව්‍යාධිපතියෙක් වූයේය; නැණවත්, සුගුණවන්තයිති; මෙයින්, (ප්‍රත්‍යක්ෂ) කාරණයෙන්; දන්පින්පල, දානයෙහි පුණ්‍යඵලයන්; දක, දර්ශනය කොට; කරව (දානමය කුශලය) සිද්ධ කරව.

**අනුරුද්ධ තෙරුන්**—කපිලවස්තු පුරයෙහි සුද්ධෝදන රජ්ජුරුවන්ගේ මල් අමිතෝදන නම් ශාක්‍ය රජ්ජුරුවන්ගේ අග මෙහෙසුන් බිසෝවූ සඳ නම් දේවීන් වැදූදරුවෝ මහානාමය, අනුරුද්ධ යයි පුතුන් දෙදෙනෙකු හා රෝහිනී නම් දියණියක් හා තුන්දෙනෙකාවූහ. එයින් අනුරුද්ධ නම් කුමාරයෝ ඉතා මහත්වූ පින්ඇති කෙනෙක නැතැයි යන බසෙකි අපි නොදන්නේය පෙර මේ අනුරුද්ධ කුමාරයෝ එක් ජාතියක දිළිඳුවූ එක්කුලයක ඉපිද අසුන්ට තණද තණකපා ඇද ජීවත් වෙති. එසමයෙහි උපරිට්ඨ නම් පසේබුදුන් වහන්සේ දැක තමන් බැලමෙහෙ කොට ලත් බත් කොටඨාසය උන්වහන්සේගේ පාත්‍රයට පිළිගන්වාලා මේ පිණෙන් මතු මෙසේවූ දිළිඳු කුලයක නුපදිම්වයි උතුම් රජකුලයෙහි උපදිම්වයි, එසේ ඉපදත් නැතැයි යන බසෙහි අපි නොදනිම්වයි කියා ප්‍රාර්ථනා කළාහුය. ඒ කුමාරයින්ගේ පුණ්‍යමහිමය පහතදක්වනු ලබන කථාවෙන් ප්‍රත්‍යක්ෂවේ.

අනුරුද්ධ කුමාරයින් සත්අට අවුරුදුකල රජකුමරුවන් තුන්දෙනෙකු හා සමග පැරදිකෙනෙක් කැවුන්තලි දෙම්හයි ගිවිස ගුලකෙළි කෙළනාහුය. එකල අනුරුද්ධ කුමාරයෝ පැරදගියහ. සෙසු රජකුමරුවෝ කැවුම් තලියක් දුන්නොත් මුත් නොකෙළිම්හයි කීහ. එකල අනුරුද්ධ කුමාරයෝ තමන් පැරදිබව මෑණියන්ට කියායවා කැවුම් තලියක් ගෙන්වාදී මෙසේම තුන්වාරයක පැරද තුන්වාරයක් කැවුම් ගෙන්වාදී සතරවන වාරයෙහිත් පැරද කැවුම් තලියක් එවන්නේයයි මෑණියන්ට කියා යැවූහ. බිසව් තුන්වාරයක කැවුම් යවා කුසීතව දරුවන් පැරදී පැරදිමෙස් මට කැවුම්තලි යවාගත නොහෙම්. ඉතිකින් කැවුම් නැතැයි කියායවූහ. අනුරුද්ධ කුමාරයෝ කැවුම් නැතැයි කියායැවූ බස්අසා තමන් උපන් තැන්පටන් නැතැයි යනබසක් නොඇසූ විරූහෙයින් නැතැයි යනබසෙහි අර්ථනොදැන නැතිපූයයි යන පූපශෙෂයක් ඇතැයි සිතා නැතිපූ වහා එවන්නේයයි කියා යැවුවාහුය, මෑණියෝ එබස් අසා තමන් අතුමෙරහි සිනාසි මාගේ පුතණුවෝ කමින්

ශ්‍රීමත් කුලයෙහි උපන්හෙයිනුත් මහපින් ඇතිහෙයිනුත් නැතැයි යනබසෙහි අපි නොදනිති. මපුතණුවන් මතු රාජ්‍යය කරණකල නැතැයි යන බසක් නොකියාම. රාජ්‍යකළ නොහැක්ක. මපුතණුවන් නැතැයි යන බසෙහි අපි උගන්වමි සිතාලා රන්තලිය ගුඩකරවා පියා අනික් රන්තලියකින් වසාලා තෙලෙනැතිපු, මපුතණුවන්ට දෙවයිකියා නිකම් තලිය යැවුවාහුය—එකෙණෙහි එනුවර අරක්ගත් දේවතාවා මාගේ අනුරුඩ කුමාරයෝ මවුකුසින් උපන්දපටන් නැතැයි යන බසෙහි අපිය නොදන්නාහුය. අද එබසෙහි අපි දැකපු නම් උන්ගේ පින්බලයෙන් මාගේ හිස සත්කඩක්ව පැලීයෙයි කියා මරණභයින් වෙවුලා ඒ ගෙණයන්නාවූ තලියෙහි දිව්‍යවූ සුවඳ කැවුම් මවාලීය. එවේලෙහි ගෙණගොස් තලිය අනුරුඩ කුමාරයන් ඉදිරියෙහි තබාලා ගෙණගිය පුරුෂයා අක්තොලින් මදක් සිනාසී සවාමිනි! තෙලෙ නැතිපු කැව මැනවයි කියාලා මත්තෙහි තුබූ රන්තලිය ඔසවාපීය. එකෙණෙහි දිව්‍ය කැවුමෙහි සුවඳ එසානුවර මුළුල්ලෙහි හමාබසින්ට පටන්ගත. එයින් එක කැවුමක් හැරගෙණ දිවඅග තබාලූ වේලෙහි අනුරුඩ කුමාරයන්ගේ සකල ශරීරය පිණවාගෙණ සත්දහසක් රස නහර රසයෙන්පුරා සිටගත ඒ කැවුම් තුමූන්කාලා සෙස්ස වුන්ටත් බෙදදීලා කොළනාකෙළි තබාපියා සතුටු සතුටුව රජගෙට පලාගොස් මෑණියන් උරයපිට වැද හිඳ දෑතින් කර වැළඳගෙණ මෑණියන්ගේ මුහුණ හා දෙතන සනාපියා මෑණියන් වහන්ස! මෙතෙක්ද නුඹමට නොසිත ඇත්තේත් ඇයිද අදම මට සෙනහ ඇතිව ගියේනැයි විචාළහ. එවේලෙහි මෑණියෝ පුතණුවන් කෙරෙහි ප්‍රෙමයෙන් සතුටු කඳුළුගෙණ කියා පුතණුවණි! කුමක් කියන්නේද? මාගේ ඇස්දෙකත් මාගේ හදවතත් නුඹත් මෙ සතරම මට සමවය—ඒ ඇස්දෙකටත් හදවතටත් වඩා නුඹමට ප්‍රියයයි කීහ. අනුරුඩකුමාරයෝ කියන්නාහු එසේ නුඹවහන්සේමට සෙනහ ඇතිකල මෙතෙක් කලක් මෙසේවූ රසඇති නැතිපු මට පිසනුදුන් යයි කීය. තිසව් තලිය ගෙණගිය පුරුෂයා අතින් විචාරා මෙපවත් දැන මාගේ පුතණුවන්ගේ පින්බලයෙන් දිව්‍ය කැවුන් දෙවියෝ මවාදුන්හයි දැන ඉතාවිසමයට පැමිණියහ. එවේලෙහි අනුරුඩ කුමාරයෝ මෑණියන් වහන්ස! මාකෙරෙහි සිතැහැ ඇතිනම් ඒනම් අද පටන්ගෙණ සෙසු කැවුමක් නොකමිමය. නැතිපුම මට පිස එවන්නේයයි කියාලා කෙළියට දිවපීහ. එදපටන් කැවුම්කමියි කියා පුතණුවන් එවූකල මෑණියෝ පෙරසේ රන්

තලියක් සෝදා රන් තලියකින් වසා යවාලති. පෙරසේම දේවතාවෝ දිව්‍යවූ කැවුත් මවාලති. අනුරුඬ කුමාරයෝ සෙසු කැවුමක් නොකා දෙවියන් මැවූ දිව්‍ය කැවුත්ම කා නැතැයි යන බසකි අපි නොදූන ගිහිගෙයි වැඩුනාහුය.

මෙසේ සුඛිතව ගිහිගෙයි වසන්නාවූ අනුරුඬ කුමාරයින්ට සොළොස්වස් සම්පූර්ණවිය. එකල බුදුරජානන්වහන්සේ සමීප යෙහි එක් කුලයකින් එක් දරුකෙනකුන් බැගින් මහණ කරවන සමයෙහි මහානාම නම් ශාක්‍යයෝ තමන් මලනුවන් මෙකී අනුරුඬකුමාරයන් ලඟට කැඳවාලා 'මලණ්ඩ' බුදුන්කරා ගොස් අප දෙබෑනන් අතුරෙන් එක්කෙනකුන් මහණවුව මැනව, මම මහණවෙම්ද? තෙපි මහණවවුදැයි විචාළහ. එබසට අනුරුඬකුමාරයෝ කියන්නාහු බෑණන්වහන්ස බුදුන්කෙරෙහි මහණවූකල එක්වේලේ කැවමනාල, එසේවූ බතත් දෙර දෙර සිඟා ඇවිද්ද මනාලු, බඩසායි කියනොහැකිල. ඇඹුල් ලුණු බෝය මදයයි කියනොහැකිල, හුණු කැමති සිසිල් ලැබෙල, සිසිල කැමති හුණු ලැබෙල, දිවිහිමියෙන් එකලාවවහොත මනාල, රුක්මුල් සුසානභූමිවල භාවනාකොට ඇවිද්දව නාල එසේවූ දුක් මම විඳගත නොහෙම්යි කීහ එකල්හි මහානාම ශාක්‍යයෝ තමමලනුවන් රජ සිවුමැලි හෙයින් මහණවන්ට මැලියාහුයයි දැන එක්උපදෙසකින් ඔවුන්කැමතිකරවා ගනිම්යි සිතා එසේවීනම් මලන්ඩ මමගෙස් මහණවෙම්. තෙපි ගිහිගෙයි වසානම් උපයාකන ලෙස් මා අහින් ඉගෙණගනුව. කම්‍රාන්ත නොදන්නාවුන්ට ගිහිගෙයි වාසය බැරිමයයි කීහ. එබසට අනුරුඬකුමාරයෝ උපයාකෑමනම් කම්‍රාන්තනම් ඒ කෙසේවූ දෙයක්දැයි විචාළහ. බත් ඉපදවීමයයි බෑණෝ කීහ. මෙතුවක් කල් බත් උපදින්නේ රන් තලියෙනැයි සිතා සිටි අනුරුඬ කුමාරයින්ට මහානාමශාක්‍යයින්ගේ වචන පුදුමයක්සේ වැටහින. ඉක්බිති මහානාමශාක්‍යයන් විසින් ගිහිගෙයි ආදීනව සහ උපයාකෑමෙහි දුක් හිරිහැර ආදිය සවිස්තරව අවබෝධ කරවනලදින් අනුරුඬකුමාරයින්ගේ සිත සසරකෙරෙහි කලකිරී මෙසේවූ දුකක් ඇති ගිහිවාසය මට නොකැමන්නේය. මට සෙතහ ඇතියේනම් නුඹ මහණවන්නට නොගොස් මා පළමුකොට බුදුන්කරා යවා පුව මැනවැයි කියාලා බෑණන් අනුදන්වාලා එකලට පියානන් නැති හෙයින් මෑනියන් වෙත ගොස් මහණවීමට අවසර ඉල්වීය. මව් බිසව් පුතණුවන්ගේ මහණවීම නොකැමැත් නී ඊට අවසර නුදුන්නීය. තමුන් කුමාර

සිත්හේ ඇවිටිල්ල බලවත් නිසා, මව් බිසව්තොමෝ අනිකක් කියාගතහොත් මාගේ මින් දරුවන් තපසට යානොදී නවත්වා ගණිමියි සිතා පුත තොපගේ කල්‍යාණමිත්‍රවූ එක කෙළිමඬලෙහි වැඩියාවූ එක ප්‍රාණීවූ භද්දියනම් රජ්ජුරුවන්ට කියාලා ඔහු මහණවෙත්නම් උන් හා සමග ගොස් බුදුන්කෙරේ මහණවවයි කීහ. එවේලෙහි අනුරුඬකුමාරයෝ යහපත මෑනියෙනි, උන් යතොත් යන්නෙම්වේදැයි කීහ. බිසව් රජෙක්නම් රාජ්‍යශ්‍රී හැර කවර කලක නම් මහණවේදැයි සිතා, යහපත යව පුතණුවනි කීහ. එවේලෙහි අනුරුඬ කුමාරයෝ රජගෙට නික්ම මඟදී සිතන්නාහු මාගේ මෑනියන් වහන්සේ "රජ්ජුරුවෝ නම් මහණවන්නට නොයෙති උන්කරා යැව්කල ඔහු මුත් රඳවාගණිති" යි මායවිත් සමුදුන්සේක රජ්ජුරුවන් මහණ නොවන්නේත් සැබැව. මම උපදෙසකින් උනුත් එක්කොටගෙණ මහණවෙම්වයි සිතා අපගේ ශාක්‍යකුලයෙහි රජදරුවෝනම් දිවියේ නමුත් බොරු නොකියති උපදෙසකින් මහණවෙමියි කියවාගෙණ ඒ බස මුල්කොට රජහට චෝදනා කොටගෙණ ලජ්ජාකරවා මහණවනලෙස ගිවිස්වාගණිමියි සිතාලා රජගෙට ගොස් භද්දියරජ්ජුරුවන් දැක රජහුවැලඳ සිඹ සනහා දේවයෙනි ! මා නුඹකෙරෙහි ඇති ප්‍රේම මෙතෙකැයි පමණ නොදන්මි. නුඹ මාකෙරෙහි ඇති ප්‍රේම මා තරමට අඩුයයි සිතමි. ඉදින් නුඹවහන්සේ මේ රාජ්‍යශ්‍රී හැර මහණවන සේක්වීනම් මමද මාගේ තුන් ඍතුවට කළ තුන්පාය ඇතුළුවූ සුවහස්නළු පිරිස් ආදිවූ සියළු සම්පත් අළුයම දමූ කෙළ පිඩක් සේ නොසිතා නුඹහා එක්වගොස් මහණවෙම්මය. එසේ හෙයින් මාගේ තපසපවා නුඹගේ තපස් අනුව පවත්නේය. ඉදින් එසේ පළමුවන තපසට යනෝතින් නුඹගේතපස මාහා අනුව වේදැයි කීහ. එවේලෙහි භද්දියරජ්ජුරුවෝ වැලි කෙළියෙහි පටන් එක්ව සුවවිඳ ඇවිද්දාවූ ජීවිත සමාන යාළුවාකෙරෙහි උදාරවූ ප්‍රේමයෙන් උමතුවූවාහු සිහි එළවාගත නොහී මොහුගේ මේ සා සැපතක් හැර මහණවීමෙක් නම් කවරකලෙක වේදැයිසිතා යහළු තෙපි මහණවූවා නම් මමත් රාජ්‍යශ්‍රී හැර තොප හා සමග මහණවෙම් කීහ. එබසට අනුරුඬකුමාරයෝ අමාදිය කඳකින් අභිෂේකයක් ලදුවාසේ ඉතා සන්තුෂ්ටවූවාහු මා සිතූ සිත ඒ කාන්තායෙන් සැදෙනවනැයි සිතා දේවයෙනි එසේවීනම් තෙපි අ. සුදද අදම මහණවන්නට යෙමි. මාහා කැටිව අවමැනවයි කීහ. එවේලෙහි භද්දියරජ්ජුරුවෝ පඹීතයකින් ගැහැවුණු කලක්සේ රාජ්‍ය ලෝභයෙන් කම්පිතවූ සිත් ඇතිව නොසලකා

වරදවා කියපිවි. මා කීයේ කිමෙක් දෝහෝයි සිතා යහළු අපි දෙදෙනම නවයෞවනයෙහි පිහිටි යම්හ. දැනට කාමසුව අනුභවකොට මතු මහළුව ගිය කල සමගව ගොස් මහණවම් හයි කීහ. එබසට අනුරුද්ධකුමාරයෝ යහළු ජරා මරණ දෙදෙනාගේ පසු පළමුවීමෙහි විභාගයෙක් නැත. සමහර කලෙක ජරාව පළමුවෙයි. සමහර කලෙක මරණය පළමුවෙයි. තෙලෙ නුවණෙක් නොවෙයි. අප බුදුහු එකුන්තිස් ඇවිරිද්දෙහි කාමසුව හැර සත් දවසකින් ලැබෙන සක්විති රාජ්‍යය හැර මහණවූහ. උදයින් ආදීවූ මෙම නුවර මහ ඇමතියෝද නව යෞවනයෙහි මහණව අමාමහ නිවන් දැක දූත් අප ඉසපිය පස් වගුරුවා ගෙණ ආකාශයෙන් ඇවිදිති. අපි ඔවුන් වඳුම්හ. පුදම්හ. සත්කාර කරම්හ. මෙයිදු ලජ්ජාවකාව ඇත. කාමසුව විඳීම නම් නුවණැසින් බැලූකල සුවවිඳීමෙක් නොවෙයි, දුක්විඳීමෙක. එකලා වලට ගොස් තපස් කිරීම නම් විශේෂයෙන් බැලූකල දුක්විඳීමෙක් නොවෙයි. ඒකාන්ත සුව විඳීමෙක. යහළු දෙබසක් නොකියව. මහණවන්නට යම් හයි කීහ. එවේලෙහි භද්දිය රජ්ජුරුවෝ තමන් මහා සත්‍යවාදීනු හෙයින් උපහාරයක් කියනොහී සදවසක්තුලදී සියලු කෘත්‍යයන් නිමවා රාජ්‍යය පුත්‍රදරාවන්ට භාරදී සත්වෙනි දවස මහණවීම පිණිස නික්මුණාහ. අනුරුද්ධ කුමාරයෝය. භද්දිය කුමාරයෝය. (බුදුන් සුළුපියවූ ධෝතෝදන ශාක්‍යයන්දරු) ආනන්ද කුමාරයෝය. කිම්බිල රාජකුමාරයෝය. භගු රාජකුමාරයෝය. (සුප්‍රබුද්ධ රජුන් දරු යසෝදරාදේවීන් බෑගෑ) දෙව්දත් කුමාරයෝය. යන රජකුමරුවෝ සදෙන තමපිරිස් ගෙණ ශක්‍රපුරයෙන් බට දිව්‍ය භටයන් සඳෙනක්සේ උයන් කෙළියට යම්හයි නුවරින් පිටත්ව ක්‍රීඩාපසාරයෙන් ගොදුන් ගණන් පලා ගොස් එක් බිමෙක සිය සෙනග රඳවා ඔවුනොවුන්ට හිගිලා උපාලි නම් කපුවානන් හා සමග සත්දෙන මහ සෙනගට සොරා වල්වැද විල් හීරා ගොස් පසල් දනව්වකට බැස ඔවුනොවුන් හා කථාකොට එක්වම මහණවම් හයි ඔවුනොවුන් ගිවිස්වා ගෙණ තම තමන් පළඳින් සත්රුවන් ආභරණ ගලවා උතුරු සළුවෙක පොදි බැඳ උපාලි නම් කපුවාන්ට දී මේ සියළු ආභරණ තොපසේවූ එකක්හට එක ජාතියක් මුළුල්ලෙහි සුඛිතවම ජීවිතය රක්ෂාකරගන්නා පමණවන්නේයයි කියා තෙලෙ සම්පත් තොපටම දුනුම්හ. අපි බුදුන් කෙරෙහි මහණ වන්නට යම්හයි රජ කුමරුවෝ සදෙන නික්මුණාහ. එවේලෙහි

රජ කුමරුවන් යත් යත් උපාලි ආභරණ පොදිය අතින් අල්වාගෙණ බල බලා සිට අනගිවූ සම්පතෙහි ඉතා හය ඇතිව ශාක්‍යයෝ නම් ඉතා ගුණනපුරහ මේ සම්පත් හැරගෙණ රාජ්‍යයට ගොස් මා මෙපවත් කී කල්හී සමපතනි ලොභයෙන් රජ දරුවන් උගත්වා ගෙණ යවාපුයේ මේ කපුවා යයි මට කිපී මරාදමාපු නම් නපුර. සමපත් තබා දිවිගලවා ගතෝතින් යෙහෙක. මේ මට සැපතෙක් නොවෙයි විපතට කාරණාමය. මෙවැනි රජුන් සැපත් හැර මහණ වනකල මාවැනියන්ට සැපතින් කම්නැත. මමද ඔවුන් හා සමග ගොස් මහණ වෙමියි සිතා ආභරණ පොදියපිටින් ගසෙක එල්වා පළමුව දුටු කෙනෙක් මෙතෙම හැරගත්තේයයි අත් ගසා රජ දරුවන්ගිය පද ලකුණෙන් දිව ගොස් රජ කුමරුවන් හඹාගියහ. එකල අවුනැයි රජ කුමරුවන් විචාළ කල තමන් ආපවත් කියා මමද මහණ වෙමියි කීය රජ කුමරුවෝ තොප ආසේම යෙහෙකැයි වරෝයයි කියා උනුදු කැදවාගෙණ ගොස් එකලට බුදුන් මල්ලව රජුන්ගේ අනුපිය නම් නියම් ගම අනුපිය නම් වෙනෙහි වසන තැනට ගොසින් බුදුන් දැක වැද එකත්පස්ව උන්හ. එකල සවාමිදරුවෝ ඔවුන් ආ කාරණා විචාරා මහණ වන්නට ආබැවී අසා මහණවයි අවසර දුන්සේක එවේලෙහි රජ දරුවෝ සඳත කියත්තාහු සවාමිනි අපගේ කුලයෙහි ශාක්‍යයෝ නම් ඉතා මානිතිහ. මානයෙන්ම මඩනා ලදහ. නුඹ වහන්සේ වැතියත් පවා නොවඳුම්හයි මත්කල කුලයක උපනුම්හ. අපද මහණවූ කල එබඳුවූ මානයක් උපනි නම් එකල මහණ දම් මුදුන් පැමිණිය නොදෙයි. මේ අපගේ උපාලි නම් කපුවානන් පළමුව මහණ කොට අප පසුව මහණ කොට වදළ මැනව. එසේකල ඔවුන් අපි වඳුම්හ, පුදම්හ. සත්කාර කරම්හ. එසේ කල අපගේ අභිමානන් සිඳෙයි. මහණ දම් මුදුන් පැමිණෙයි. ඉදින් මතු රාජ්‍යශ්‍රියෙහි ලොභයකුදු වීනම් තොපගේ කපුවානන් වැඳ පුදා නිවක්‍රියාකොට නැවත රාජ්‍යය කරන්නට අවුදුයි ශාක්‍යයන් අපට පරිභව බෙණෙයි කියා දෙවෙනිව රාජ්‍ය ලොභය දුරුවෙයි. මේ මේ කාරණයෙන් උන් පළමුකොට මහණ කරවා අප පසුව මහණ කල මැනවයි කීහ. සවාමි දරුවෝ තොප කීයේ කාරණාමය. ඥාණවතන යත් සිතුවමනා සිතිවිලලකැයි වදරා උපාලින් පළමුව මහණ කොට රජ සඳහා දෙවෙනිව මහණ කොට උපසමපදා කර කම්මසථානයක් ඉගැන්වූ සේක, (එකල විදශීනා වඩා එම වශසානය ඇතුළත හද්දිය තෙරුන් වහන්සේ රහත්ව හද්

දිය නම් මහ තෙරව බුඩශාසන නැමැති මහ සරසියෙහි සුපිපි මහා පද්මයක්සේ ශිල සුගන්ධයෙන් තුන්ලෝ බැබළුවූසේක. අනද මහ තෙරුන් වහන්සේද එසේම සෝවාන්ව බුඩෝපස්ථායකයන් කෙරෙහි අග්‍රවූ ස්ථානාන්තර ලදින් බුඩ ශාසන නමැති ආකාශයෙහි නැගූ ජයකේතුවක්සේ ඉතා ප්‍රසිඬ වූසේක. කිඹිලග හගුයයි යන දෙදෙනා වහන්සේද එසේම රහත්ව පන්සිය පන්සිය පිරිස් සෙණ බුඩ ශාසන නමැති දිව්‍ය රූපයෙහි දිව්‍ය නෙත්‍ර යුග්මයක්සේ ඉතා සොභා සම්පන්නවූ සේක. දේවදත්තයෝ තිස්ස නම් මහා තෙරව ධ්‍යාන ලාභීවූහ. උපාලි මහ තෙරුන් වහන්සේද එසේම රහත්ව විනය ධාරීන් කෙරෙහි අග්‍රස්ථානාන්තර ලදින් පන් සියක් පමිත් ඇතිකොට බුඩ ශාසන නමැති මහා ගෘහයෙහි ප්‍රදීපයක් සේ සසුන් බැබලවූ සේක) අනුරුඬ තෙරුන් වහන්සේ විදර්ශනා වඩා රහත්ව ත්‍රිවිද්‍යාවෙහි කෙළ පැමිණ පෙර තමන් වහන්සේ පියුම තුරා නම් බුදුන් සමයෙහි පහන් පූජා කලාවූ කුශලයාගේ බලයෙන් වැඩළුන් එම අස්නේ හිද ලක්ෂයක් සක්වළ තුබූ තලඇටක් සා වස්තුවකුන් අත්ලෙහි තිබුවාසේ දක්නා තරම් දිවැස් ලදින් එතැන් පටන් ශාසනාම්බරයෙහි පුන්සඳක්සේ සසුන් සොබවා බුදුසස්නෙහි දිවැස් ඇතියන් කෙරෙහි අග්‍රවූ තනතුරු ලදින් බුදුන් මල් අනුරුඬ තෙරුන් වහන්සේයයි මෙනමින් දිව්‍යමනුෂ්‍යයන් කෙරෙහි ඉතා ප්‍රසිඬවූසේක.

(පූජාවලිය)

**නමලන් බතින් දුන්නේ එකම සැන්දක—බලවත් එසින්**
**සුරපති විය ඉන්දක—**

අභිධර්මය දේශනා කරණු සඳහා බුදුරජානන් වහන්සේ තව්තිසා දෙව්ලොව පරසතු නම් වෘක්ෂ මූලයෙහිවූ පාණ්ඩුකම්බල ශෛලාසනයෙහි වැඩහුන් කල්හි:—

පෙර මිනිස් ලොවදී අනුරුඬ තෙරුන් වහන්සේට එක බත් සැන්දක් පමණ පිළිගන්වාලූ ඉන්දක නම් දුගියෙක් එපිනින් මිය ශක්‍රපුරයෙහි මහේශාක්‍ය ඉන්දක නම් දිව්‍යරාජයෙක්ව ඉපද තම ඇඟින් නිකුත් රැසින් සියළු දෙවියන් අභිභවනය කොට වෙසෙති. තවද මිනිස් ලොවදී දෙලොස් යොදනක් මානයෙහි කැපින් කැට ගත්වා ලීප් බඳවා දසදහසක් අවුරුදු මුළුල්ලෙහි මුළු දඹදිව යාචකයන්ට මහදන් දුන්නාවූ අබුඩෝත්පාදයෙහි අඬකුරනම් රජෙක් එපිනින් මහේශාක්‍ය

දිව්‍යරාජත්ව නොයෙක් ශතසහස්‍ර දිව්‍යනළුවන් පිරිවරා උපන්හ. මෙකී අඞ්කුර නම් දිව්‍යපුත්‍රයා හා ඉන්දක නම් දිව්‍ය රාජයා හා දෙදෙන ඔවුනොවුන් හා මන්ත්‍රණය කරන්නාහු අද බුදුහු පාඬු කම්බලාසනයෙහි වැඩහිඳ විජම් බණ වදරණ සේක. ඒ විජම් නම් ඉතා දුඞ්ඛදයක්ල. බුදුන් ලඟ ඉඳ අපි දෙදෙන සිත් හෙළා බණ අසම්හ ඇසිල්ලෙකින් බොහෝ දෙවියෝ රැස්වෙති. එකල අපට අවසර නොලැබෙයි. අපි දෙදෙන පළමුව නොස් බුදුන් ලඟ ඉදුම් හයි මන්ත්‍රණය කොට දෙදෙනා අත්වැල් බැඳ ගොස් ඉන්දක නම් දිව්‍යරාජයා බුදුන් දකුණු දනමඬලට නුදුරුව ඉඳගත. අඞ්කුර නම් දිව්‍යරාජයා වම් දනමඬලට නුදුරු තැන හිඳගත. අඞ්කුර දිව්‍ය පුත්‍රතෙම මහේශාක්‍ය දෙවියන් රැස්වෙන කල්හි හුන් තැනින් පහව ගොස් දොළොස් යොදුනකින් ඔබ්බේ අවසරයක් ලැබ උන්නේය. ඉන්දක දිව්‍යපුත්‍රතෙම අහලක් පමණ තැනුත් නොසෙල්වී එහිම උන්නේය. බුදුරජානන් වහන්සේ උන් දෙදෙන බලා වදරා ඔවුන්ගේ කුසල විභාගය දිව්‍ය සේනාවට හඟවා තමන් වහන්සේගේ සස්නෙහි දක්ෂිණාහී පුද්ගලයන්ට දුන් දානයාගේ මහත්ඵල බැව් හඟවනු කැමතියේ දොළොස් යොදුනෙක ගොස් හුන් අඞ්කුර නම් දිව්‍යරාජයාට අඞ්කුරයයි හඬගා අඞ්කුරය! තා විසින් දීඝී කාලයක් මුලුල්ලෙහි මහ දන් දෙන ලද්දේය. ඉතා දුර සිටිනෙහිය. මා වෙතට එවයි වදාළ සේක. සර්වඥයන් වහන්සේ විසින් මෙහෙයන ලද්දාවූ අඞ්කුර දිව්‍යපුත්‍රතෙම හුනස්නෙන් පැනනැගී බුදුන් වැඳ සිට ස්වාමීනි පෙර මම අබුද්ධෝත්පාද කාලයෙහි ඉපද සිල්වතුන් නොලදින් බොහෝ දන පරිත්‍යාග කෙළෙම්. සුඩවූ කුඹුරක යාලක් වපුට පැලක් ලබන්නාහුසේ නොසිල්වතුන් විෂයෙහි බොහෝවූ පින්කොට සවල්පවූ අනුභාවයක් ලදිම්. තෙල ඉන්දක නම් දිව්‍යරාජයා සරුවූ කෙතක පැලක් වපුට යාලක් ලබන්නාසේ නුඹ වහන්සේගේ බුද්ධෝත්පාදයෙහි සිල්වතුන් විෂයෙහි පමණවූ පිණක් කොට අපමණවූ ආනුභාව ලදින් අපි හැම අභිභවා තරු මැද සඳසේ දිලියෙන්නේ වේද, ස්වාමීනී කීය. එවේලෙහි බුදුහු ලඟ උන් ඉන්දකයන් බණවා ඉන්දකය! තා කල පිණ්ද කියා බලහයි වදාළසේක. එතෙම හුනස්නෙන් පැනනැගී දොහොත් මුදුන්දී සිට ස්වාමීනි! පෙර මම ඉන්දක නම් දුකඛිතයෙක්ම්. දෙරින් දොර සිඟා ඇවිදිනාවූ මම එක් දෙරක සිඟා සිටියෙම්. එගෙයි මනුෂ්‍යයෝ මා දුක උපන් මහා කරුණාවෙත් බත්සැත්දක්

ගෙණුය. එවේලෙහි නුඹවහන්සේගේ ශාසනයෙහි අනුරුඩ නම් මහතෙරුන් වහන්සේද, පසුව එදෙරට පිඩුසිගා වැඩි සේක. මම එකල උන්වහන්සේ දැක මහත්වූ සැදැහැ ඇතිව පෙරපින් නොකෙළෙන් දැන් දුක්ඛිතවීමි. දැන් මෙතන කිසියම් පිණක් පුරාගන්මියි සිතාලා ඒ බත් සැත්ද ඔබගේ පාත්‍රයට පිළිගන්වාලීමි. එපමණ පිණින් මෙපමණ පිණක් ලදුයේවේද. මාගේ ශරීරයෙන් නිකුත් ප්‍රභා හැමදෙවියන් මැඩගෙණ පවතිනා ලෙසුත් මා අභිමුඛයේ හිඳ එන දේවතාවකු නැති නියාවත් මාගේ මහත්වූ දිව්‍යතේජස හා පිරිවරන් බලා වදාළ මැනවැයි කීය. බුදුහු එවේලෙහි දාන විභාගයෙන් බණ වදාළ සේක. දෙශනාවශානයෙහි අඞ්කුර ඉන්දක දිව්‍ය පුත්‍රයෝ සෝවාන් පෙළෙහි පිහිටියාහ. හැමදෙනාටම දෙශනාව වැඩ සහිතවූවාය.

දන්පින්පල —106 වෙනි කවෙහි දැනය යන්න බලනු.

1. "යථාපි භද්දකෙ ඛෙත්තෙ—බීජං අප්පංපිරොපිතං
සම්මා ධාරං පවෙච්ඡන්තෙ—ඵලංතොසෙති කස්සකං"

2. "තථෙව සීලවන්තෙසු—ගුණවන්තෙසු තාදිසු
අප්ප කම්පි කතං කාරං—පුඤ්ඤං හොති මහප්ඵලං"

3. "විචෙය්‍ය දානං දාතබ්බං—යත්ථ දින්නං මහප්ඵලං
විචෙය්‍ය දානං දත්වාන—සග්ගං ගච්ඡන්ති දායකා"

4 "විචෙය්‍ය දානං සුගතප්පසත්ථං
යෙ දක්ඛිණෙය්‍යා ඉධ ජීවලොකෙ
එතෙසු දින්නානි මහප්ඵලානි
බීජානි වුත්තානි යථාසු ඛෙත්තෙ"

1. යථාපි, යම්සේ; භද්දකෙ, පෘථුවි සාරාදියෙන් යහපත්වූ ඛෙත්තෙ, කෙතක; අප්පං අපි බීජං, ස්වල්පවූ ධාන්‍ය බිජුවටක් නමුත්; රොපිතං, රෝපණය කරණ ලද්දේ; සම්මා, මනාකොට; ධාරං, වෘෂ්ටිජලය; පවෙච්ඡන්තෙ, වස්නා කල්හි; ඵලං, ඵලය; කස්සකං, ගොවියා; තොසෙති, සතුටු කෙරේද.

2. තථා එව, එපරිද්දෙන්ම; තාදිසු ගුණවන්තෙසු, තාදිර් ගුණයෙන් සම්පන්නවූ; සීලවන්තෙසු, සිල්වතුන් විෂයෙහි; අප්පකං අපි, ස්වල්පවූවත්; කතං කාරං, කරණලද සත්කාරය; මහප්ඵලං, බොහෝ විපාක ඇත්තාවූ; පුඤ්ඤංහොති, පුණ්‍ය කර්මයක් වේ.

3. යත්‍ර, යම් උත්තමයෙක් කෙරෙහි; දින්නං, දෙනලද දානය; මහප්ඵලං, මහත් ඵලඇත්තේද; (එහෙයින්) ඒතාදීර් ගුණ සඞ්ගත දක්ෂිණාර්හ පුද්ගලවිෂයෙහි; විචෙය්‍ය, නුවණින් සොයා; දානං දාතබ්බං, දන්දිය යුතුයි; දායකා, දායකයෝ; විචෙය්‍ය, පරීක්ෂාකොට; දානං දත්වාන, දන්දී; සග්ගං ගච්ඡන්ති, ස්වර්ග ලොකයට යෙත්.

4. විචෙය්‍ය දානං, පරීක්ෂාකොට දන්දීම; සුගතප්පසත්ථං, බුද්ධාදී උත්තමයන් විසින් වර්ණිතා කරණ ලද්දේය; ඉධජීවලොකෙ, මෙම සත්ව ලොකයෙහි; යෙ දක්ඛිණෙය්‍යා, යම්දක්ෂිණාර්හ කෙනෙක් වෙද්ද; එතෙසු, මෙම දක්ෂිණාර්හයන් කෙරෙහි; දින්නානි, දෙනලද දානයෝ; සුඛෙත්තෙ, යහපත් ක්ෂෙත්‍රයෙහි, වුත්තානි, වපුළාවූ; බීජානි යථා, ධාන්‍යබීජවට සේ; මහප්ඵලානි, මහත් ඵලදෙති.

**125. ද ව ස ක් විතර සිල්රැකි කුලඟනක් පෙ ර**
**ද හ ස ක් සුරඹ පිරිවර මින්ම සුර පු ර**
**ත ව ස ක් දෙව්ඳු ලඟ සිරි විඳි නිරන් ත ර**
**වි ග ස ක් එසිල් තොර නොකරව් සිතින් ද ර**

පෙර, පූර්වයෙහි; දවසක් විතර, එක් දිනක් පමණ; සිල්රැකී, සීලසරක්ෂා කළාවූ; කුලඟනක්, කුලාඞ්ගනාවක්; සුරපුර, දිව්‍ය පුරයෙහි; දහසක් සුරඹ, සහස්‍රයක් සුරාඞ්ගනාවන්; පිරිවරමින්, පරිවාර කොටගෙණ; තව, මේ තාක්ම; සක්දෙව්ඳු ලඟ, ශක්‍රදේවෙන්ද්‍රයා සමීපයෙහි; නිරන්තරා, අනවරතයෙන්; සිරිවිඳි, ඓශ්වර්‍ය්‍ය විඳිනය කරන්නීය; එසිල්, ඒ සීලය; සිතින්දරා, චිත්තයෙන් ධාරණය කොට; විගසක්, ක්ෂණය කුදු; තොර නොකරව්, කඩ නොකරව්;

**දවසක් විතර සිල්රැකි කුලඟනක් පෙරා—සක්දෙව්ඳු ලඟ සිරිවිඳි නිරන්තරා—**

"පැ හැ දෑ දිනෙක අටසිල් රැක පිතින් එ ම
ඉ ප ද සුරිඳු පුර පසුබා සුරඹ හැ ම
නො ම ද ඉසුරැ ලද අඟ නක දුටිම් ම ම
නි බ ද පොහොය සිල් රැකියොත් කියනු කී ම"

(ගුත්තිල කාව්‍යය)

"එකාහු පොසථෙනා පි පරනිම්මිත වත්ති සු
ඨානෙසා උපපජ්ජෙය්‍ය ඉති වුත්තං මහෙසිනා"

එකාහු පොසථෙන අපි, එක දවසක් කළ පෙහෙවසිනුදු; ඨානසො, ඒ කාරණයෙන්ම; පරනිම්මිත වසවත්තිසු, පරනිර්මිත වශවර්ති දෙවලොකයෙහි; උපපජ්ජෙය්‍ය ඉති, උපදනේයයි; මහෙසිනා, මහර්ෂිවූ බුදුරජහු විසින්; වුත්තං, වදාරණලදී;

(සද්ධම්මොපායනය)

සක්දෙවිඳු:—"දහසක් නුවන් ඇ ති
දෙදෙව් ලොවටම අදිප ති
මට ඉඳුරු දික් ප ති
දෙනෝ සක්දෙවිඳු යයි පවස ති"

(ගුත්තිල කාව්‍යය)

චාතුර්මහාරාජික තාවතිංශය යන දිව්‍යලොකවලයෙහි අධිපති කම් කරන්නාවූ, සකල දිව්‍ය සමූහයා අතරෙහි අතිශයාලංකාර ලීලාවෙන් හා කීර්තිමත් සවභාවයෙන් විරාජිතව වාසය කරන්නාවූ ප්‍රමාණාතික්‍රාන්ත සුරන් හා සුරඟනන් පිරිවරා සැණකෙළි උයන්කෙළි ආදියෙහි යෙදී චිත්ත ප්‍රමොදයට පැමිණ කාලාතික්‍රමණය කරන්නාවූ අත්‍යුත්තම විශිෂ්ට සත් පුරුෂ ගුණාඞ්ගයෙන් සමුපලක්ෂිතවූ මනුෂ්‍ය වර්ගයාට බොහෝ හිතවත්වූ ඉෂ්ට දෙවතාවෙකි ප්‍රාචීන දිශාවට අධිපතිවූ හෙයින් ශක්‍රදෙවෙන්ද්‍රයන්ට ඉන්ද්‍රයන නාමයද දෙදෙව් ලෝවැසි සියලු දෙවියන් අතර අධිපතිකම් කරණ හෙයින් දෙවෙන්ද්‍ර, සුරෙන්ද්‍ර, දෙවරාජ සුරරද යන නාමයන්ද යෙදේ. සත්පුරුෂයන්ට අසත්පුරුෂ යන්ගෙන් වන්නාවූ විපත් ඇති කල්හි ඒ දුදනන් මැඩ සුදනන්ට අභයගෙනදීම සක්දෙවිඳුගේ විශිෂ්ට ගුණධර්ම යකි. ගුත්තිල ජාතක, කුසජාතක, වෙස්සන්තර ජාතක ආදී බොධිසත්ව චරිත මීට නිදර්ශනවේ. ශක්‍රදෙවෙන්ද්‍රයින්ගේ පාණ්ඩු කම්බල නම් ප්‍රකෘති වශයෙන් සිනිඳු සුව පහස් ගෙනදෙන් නාවූ ශෛලාසනයක් ඇත්තේය. යම් පින්වතෙක්හට විපත්ති යක් පැමිණි කල්හි මේ සිසිල් ගුණඇත්තාවූ ශෛලාසනය රත්වූ යකඩ ගුලියක්මෙන් උෂ්ණ භාවයට පැමිණේ. එවිට සහස්‍රනෙත් ඇත්තාවූ ශක්‍රදෙවෙන්ද්‍ර තෙම දිවැස් යොමා මිනිස්ලෝ බලන්නේය. සියලු පසළොස්වක් දිනයන්හි සක් දෙවිඳු තෙම මහෙසාක්‍ය දෙවියන් විසින් පිරිවරණ ලදුව සුධර්මානම්වූ තම දිව්‍ය සභාවට පැමිණ මිනිස්ලොව සත්වයන් විසින් කරණලද කුසලාකුසල කර්මයන් ගණන් ගන්නේය. ශක්‍රයාට මෙහෙ කරන්නාවූ සතරවරම් දෙවියෝ සත්වයන්

එසිත් කරණලද කුශලාකුශල කර්මයන් තම පොත්හි සටහන් කොට ගෙනවුත් සභාගත දෙවියන්ට පෙන්වත් නේය. ඔව්හු පළමුකොට අකුසල ක්‍රියාවන්බලා බොහෝවූ හෘදය ශෝකයට පැමිණ හඬත්. ඉත්පසු කුසල ක්‍රියාවන් බලා අපමණ සන්තුෂ්ටියට පැමිණ නැවත නැවතත් සාධුකාර පවත්වමින් කුශල කර්මයන් කළ සාධුජනයාට ආචාර කෙරෙත්.

126. කෙලෙසුන් කෙරෙන් හොරකර සිතු න නාමය
නිදුකින් ලැබෙයි බඹලොව සැප ම නාමය
දුදසුන් නිවන් දෙයි මරසෙන් දි නාමය
පිණකින් උතුම් පිණනම් බාව නාමය

කෙලෙසුන් කෙරෙන්, කෙලෙශයන් කෙරෙන්; හොරකර, බැහැරකොට; සිත, චිත්තය; නනාමය, සාදන්නේමය; මනාමය, මනොඥවූ; බඹලොවසැප, බ්‍රහ්මලොක සම්පත්; නිදුකින්ලැබෙයි, දුකක් නැතුව ලැබෙන්නේය; මරසෙන්, මාරසේනාව; දිනාමය, ජයග්‍රහණය කොටම; දුදසුන්, දුර්දර්ශීවූ; නිවන්, නිර්වාණය; දෙයි, දානය කෙරෙයි; (ගෙණදෙන්නේය) පිණකින්, පුණ්‍යයකින්; උතුම් පිණනම්, උත්තමවූ පුණ්‍යකර්මය නම්; බාව නාමය, භාවනාවමැයි.

**කෙලෙසුන්කෙරෙන්**—"අභිජ්ඣා විසම ලොභො චිත්තස්ස උපක්කිලෙසො ව්‍යාපාදො චිත්තස්ස උපක්කිලෙසො, කොධො චිත්තස්ස උපක්කිලෙසො, උපනාහො චිත්තස්ස උපක්කිලෙසො, මක්ඛො චිත්තස්ස උපක්කිලෙසො, පලාසො, චිත්තස්ස උපක්කිලෙසො, ඉස්සා චිත්තස්ස උපක්කිලෙසො, මච්ඡරියං චිත්තස්ස උපක්කිලෙසො, මායා චිත්තස්ස උපක්කිලෙසො, සාඨෙය්‍යං චිත්තස්ස උපක්කිලෙසො, ථම්භො චිත්තස්ස උපක්කිලෙසො, සාරම්භො චිත්තස්ස උපක්කිලෙසො, මානො චිත්තස්ස උපක්කිලෙසො, අතිමානො චිත්තස්ස උපක්කිලෙසො, මදො චිත්තස්ස උපක්කිලෙසො, පමාදො චිත්තස්ස උපක්කිලෙසො"

(වත්ථූපමසූත්‍රය)

1. තමන්සතු දෙයෙහි ආසාව හා අනුන්සතු දෙයෙහි ආසාවද, 2. ව්‍යාපාදයද, 3. ක්‍රොධයද, 4. බද්ධවෛරයද, 5. මකුගුණයද, 6. පලාසයද, 7. ඊර්ෂ්‍යාවද, 8 මාත්සර්‍ය්‍යයද, 9. මායාවද, 10. කෛරාටිකබවද, 11. (ගුරු අවවාදයට නොනැමීමයැයි කියනලද) චිත්තයාගේ දැඩිබවද, 12. (මානසඟගතව

එකට දෙගුණ කිරීම් වශයෙන් උපදවනලද) කරණුත්තරිය කරණයද, 13. මානයද, 14. අධි මානයද, 15. මදයද, 16. ප්‍රමාදයද සිතට කෙලෙසිලි වෙත්·

"චිත්තෙන සංකිලිස්සන්ති—සංකිලිස්සන්ති මානවා
චිත්තෙන සුද්ධි විසුජ්ඣන්ති—ඉති වුත්තං මහෙසිනා."

සත්වයෝ කිලුටුවූ සිත කරණකොටගෙණ කෙලෙසෙත්නාහුය. (සීලවිශුද්ධි, චිත්තවිශුද්ධි, දිට්ඨිවිශුද්ධි, කඞ්ඛාවිතරණ විශුද්ධි, මග්ගාමග්ග ඤාණ දස්සන විශුද්ධි, පටිපදා ඤාණ දස්සන විශුද්ධි, ඤාණ දස්සන විශුද්ධි යන) සත්වැදෑරුම් විශුද්ධි පිළිවෙළින් සිත සුධවූකල්හි ශුද්ධවෙත්යයි මහා කාරුණිකවූ බුදුරජානන්වහන්සේ විසින් වදාරණලදී. එබැවින් සිත පිරිසිදුකිරීමට කැමැත්තේ සීල ශුද්ධියෙහි පිහිටා යෝගකර්මයට (භාවනාවට) අරමුණුවන සම සතලිස් කමටහන් අතුරෙන් චරිතානුකූල කර්මස්ථානයක් භාවිතා කටයුතුයි,

"සිත කිලිටිකර නා
රාගාදි පවිලුව නා
සිහිවිලි බාධ නා
මදකොක් විදසුන් සමත විසි නා"

(කාව්‍යශේඛරය)

**භාවනාව** වනාහි **සමථය, විදර්ශනාවය** කියා දෙයාකාර වෙති. එහි **සමථභාවනා** නම් කිමෙක්දයත්? දශ කසිණය, දශ අශුභය, දශානුස්මෘතිය, සතර අප්‍රමාණ්‍යය, එකාම සංඥාය, එකම ව්‍යවස්ථාය, සතර අරූපයෝද්දැයි **සත් ආකාරයකින් කර්මස්ථාන සංග්‍රහය** දතයුතු. එහි **දශකසිණයෝ** නම් කවරහයත්? පඨවිකසිණය, ආපොකසිණය, තෙජොකසිණය, වායොකසිණය, නීලකසිණය, පීතකසිණය, ලොහිතකසිණය, ඕදාතකසිණය, ආකාශ කසිණය, ආලොක කසිණය යන මොහු දශ කසිණයෝ නම් වෙති, එහි පඨවි ආදි සතරදෙන **භූතකසිණයහ**, නීලාදිවූ සතරදෙන **වර්ණකසිණයන**, ආකාශය **ආකාශ කසිණයවෙයි**, චන්ද්‍රාලොකාදිවූ ආලොකය **ආලෝකකසිණයයි** දතයුතු. එහි **දශඅශුභයෝ** නම් කවරහයත්? උද්ධුමාතකය, විනීලකය, විපුබ්බකය, විච්ඡිද්දකය, වික්ඛායිතකය, වික්ඛිත්තකය, හතවික්ඛිත්තකය, ලොහිතකය. පුලවකය, අට්ඨිකයද්‍යයි මොහු දශ අශුභයෝ නම් වෙති. එහි **දශ අනුස්මෘතිහු** නම් කවරහයත්? බුදුන් අරභයා උපදනා අනුස්මෘතිය,

ධර්මය අරභයා උපදනා අනුස්මෘතිය, සංඝයා අරභයා උප
දනා අනුස්මෘතිය, සීලය අරභයා උපදනා අනුස්මෘතිය,
ත්‍යාගය අරභයා උපදනා අනුස්මෘතිය, දෙවතාවන් අරභයා
උපදනා අනුස්මෘතිය, උපසමානුස්මෘතිය, මරණය අරභයා
උපදනා අනුස්මෘතිය, කායගතාසතිය, ආනාපාන සතියදයි
යන මොහු දශානුස්මෘතිහු නම් වෙති. එහි අප්‍රමාණ්‍ය
යෝ නම් කවරහයත්? මෛත්‍රිය, කරුණාවය, මුදිතාවය,
උපෙක්ෂාවය යන මොහු අප්‍රමාණ්‍යයෝ නම් වෙති. "බ්‍රහ්ම
විහාරය"හයි කියාද මීට නමකි. කබලීකාරාහාරයෙහි
ප්‍රතිකූල සංඥායයි ප්‍රවෘත්තවූ සංඥ තොමෝ එකම සංඥා,නම්
වේ. පඨවි ධාතු ආදී සතරවිධ ධාතූන්ගේ සවභාව ලක්ෂණාදී
හෙයින් නිශ්චයකිරීම එකම ව්‍යවස්ථා නම් වේ. ආකාශා
නඤ්චායතනාදිවූ සතරදෙන ආරූප්‍ය නම් වේ. මෙසේ සියලු
ආකාරයෙන් සමථභාවනා දක්වීමෙහිලා මොහු කම්සථානයෝ
නම් වෙති. මේ භාවනා මාර්ගීයන්ගේ පුරුදුකිරීම හේතුකොට
රාගාදී කෙලෙස් සංසිඳුවාගත හැකි බැවින් මීට සමථභාවනා
හයි වදු. එහි **විදර්ශනා භාවනානම්** කවරහයත්? අනිත්‍ය,
දුක්ඛ, අනාත්මාදීන්ගේ වශයෙන් දැකීම විදර්ශනා භාවනානම්
වන්නේය. මෙහි විදර්ශනාව වනාහි නවාකාරයකින් දකින
හෙයින් **විදර්ශනාව** ප්‍රභේද වශයෙන් **නවාකාර** වෙති. ඔහු
කවරහුදයත? සකන්ධයන්ගේ හටගැන්ම හා විනාශය පිරිසිඳ
දන්නාවූ, (1) **උදයව්‍යයඥානයද** ඒ උදයව්‍යය ඥානයෙන් හට
ගැනීම හා විනාශය පරිග්‍රහකොටැ අනිත්‍යාදි වශයෙන් විදර්ශනා
කරත් කරත් උදය ඉක්ම භංගයම (බිඳීමම) වැටහෙයි. මෙසේ
භංගය වැටහුනුකල ප්‍රත්‍යුත්පන්න රූපාදී එකී එකී අරමුණු
භංගය බලා ඒ ඒ ආලම්බනයන්ගේ භංගය බැලූ විපස්සනාගේද
භංගයබලා මෙයාකාරයෙන්ම අතීත සංස්කාරයෝද බිඳෙත්මය.
අනාගත සංස්කාරයෝද බිඳෙත්මයයි ඇසින් දුටුවනුදනුදු
වුවනුදු එකෙක්කොට බිඳුම් මාත්‍රයම අරමුණුකරමින් සියලු
සංස්කාරයන්ගේ භංග මාත්‍ර පරිග්‍රහණය කරන්නාවූ, (2)
**භංගානුදර්ශනඥානයද** මෙයාකාරයෙන් උපන්නාවූ භංගානු
දර්ශනයෙන් විදර්ශනා කරත් කරත් හුණුනුණුවන් දවන අඟුරු
වලක් සෙයින් භවත්‍රයෙහි අතීතාදී සංස්කාරයෝ භංග
වශයෙන් භය ඇතිබව වැටහෙත්. මෙසෙයින් තුන් භවයෙහිවූ
සංස්කාරයන් භය වශයෙන් දක්නාවූ, (3) **භයතුපට්ඨාන
ඥානයද** එයාකාරයෙන් උපන් භයතුපට්ඨාන ඥානයෙහි සිට
භාවනා කරන් කරත්වණ සත්වයන් ඇති වනගහණ

යක් සෙයින් භවත්‍රයෙහි සියලු සංස්කාරයෝ තම තමන් ගත්තවුන්ට උපද්‍රව එලවනුව දොෂ වශයෙන් වැටහෙත්. මෙයාකාරයෙන් සියලු සංස්කාරයෝ දොෂ ඇතියහයි ආදීනව වශයෙන් දක්නාවූ, (4) **ආදීනවානු දර්ශන ඥානයද**, එයින් උපන් ආදීනවානු දර්ශන ඥානය මෙසෙහි කාන් කරන් චිත්‍රකූට පර්වතයෙහි ගුණ දුටු සුවර්ණ හංසතෙමේ දොෂ දුටු හවරවලෙහි නොඇලෙනා සෙයින් තමා විසින් අගුණ දුටු සංස්කාරයන්හි නොඇලී කලකිරෙයි. මෙසෙයින් නිවන් ශාන්ත වශයෙන් දුටුවාහට සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරෙමින් උපදනා, (5) **නිබ්බිදානු පස්සනාඥානයද** ඒ සංස්කාරයන් කෙරෙහි කලකිරුණාවූ යොනාවචරයා මහත්වූ සෙසැයි සලකා තමාහු ගත්තැනැත්තහු සොවැති දුක නසයකැයි දනිමින්ම ගැණීමෙහි ආසාව දුරුකොට හැරපියනු කැමැත්තාසේ විදර්ශනා ඥානයෙන් තිලකුණු දුක සියලු සංස්කාරයන්ගේ ස්වභාවය දනිමින්ම සියලු සංස්කාරයන් හැරපියනු කැමතිවෙයි. දැලට හසුවූ මත්ස්‍යයා දැලින් මිදෙනු කැමැත්තාසේ සියලු සංස්කාරයන් කෙරෙන් මිදෙනු කැමති වෙයි. මෙසෙයින් සංස්කාරයන් කෙරෙහි නොඇලී ඔවුන් හරණා කැමතිව උපදනා, (6) **මුඤ්චිතුකාම්‍යතාඥානයද**, එසෙයින් සියලු සංස්කාරයන්කෙරෙන් මිදෙනු කැමතිව මිදෙන්නට උපායවූ විදර්ශනාඥානය ස්ථිරකරණු පිණිස සියලු සංස්කාරයන් නැවත ආගනතුකකොට තිලකුණු එලවා අනිත්‍යාදි වශයෙන් විදර්ශනාකෙරෙති. මෙයාකාරයෙන් අනිත්‍යාදි වශයෙන් සියලු සංස්කාරයන් පරීක්ෂාකරමින් උපදනා, (7) **පටිසඞ්ඛානු පස්සනාඥානයද**, එයාකාරයෙන් සංස්කාරයන් පරිග්‍රහ කෙරෙමන්ම දොෂ දුක හරණලද අඹුව කෙරෙහි උපෙක්ෂාකරණ පුරුෂයාමෙන් දෙස් දුටු සංස්කාරයන්කෙරෙහි මැදහත්වෙයි. ගිනි දුටු කුකුළුපත් සෙයින් සංස්කාරයන් කෙරෙන් හැකිලෙයි. මෙයාකාරයෙන් සංස්කාරයන් කෙරෙහි මැදහත්වෙමින් උපදනා, (8) **සංස්කාරෝපෙක්ෂා ඥානයද**, එයාකාරයෙන් උපන් සංස්කාරොපෙක්ෂා ඥානය මෙසෙහි කාරන් කරන් මාර්ගොපස්ථානය වියයුතු වාරයෙහි අනිත්‍යයැකියා වේවයි, දුක්ඛයැකියා වේවයි, අනාත්මයකියා වේවයි සංස්කාරයන් අරමුණුකොට ආවර්ජනා උපදී. ඊට අනතුරුව පැවති ආ විදර්ශනාවටද අනාගතයෙහි ඉපදියයුතු ආර්‍ය්‍යමාර්ගයටද ප්‍රතිපක්ෂ නොවන බැවින් අනුලෝමයයි නම් ලද ඥාන සම්ප්‍රයුක්ත කාමාවචර චිත්තයෝ දෙදෙනෙක් හෝ

තිදෙනෙක් හෝ උපදිත්. ඥාණ ශක්තිය මදවූවන්ට වනාහි සතරකුදු උපදිතියි කියත්මය. මෙයාකාරයෙන් උපදනා, (9)
**අනුලෝමඥානයද**—යතෙමෙහු නව මහා විදර්ශනා ඥානයෝ වෙතියි වදාළත් මේ කියනලද ආකාරයෙන් භාවනාකරන්නාවූ යෝගාවචරයාහට වනාහි විදර්ශනාවගේ මිහිකිරීමට පැමිණ දුන්දුන් අර්පණාවයයි කියනලද ලොවුතුරුමග උපදීයයි කියයුතු කල්හි භවාඞ්ගසන්තතිය භවාඞ්ගචලන භවාඞ්ගෝපච්ඡෙද වශයෙන් සිඳගෙණ උපන්නාවූ මනොද්වාරාවර්ජනයට අනතුරුව දෙතුන් විදර්ශනා චිත්තකෙනෙක් සංස්කාරොපෙක්ෂා ඥාණයෙන් ගත්නාලද යම්කිසි අනිත්‍යාදි ලක්ෂණයක් අරභයා පලමු සිත පරිකර්මනාමයෙන්ද දෙවන සිත උපචාරනාමයෙන්ද තුන්වන සිත අනුලෝම නාමයෙන්ද පවත්නාහුයි. යම් විදර්ශනා කෙනෙක් විදර්ශනාවගේ මුදුන් පැමිණීමෙන් ශිඛාප්‍රාප්ත හෙවත් මුදුන් පැමිණි විදර්ශනා ඇත්තේයයි කියාද අනුලොමඥාන සහිත බැවින් සානුලොම විදර්ශනායයි කියාද සංස්කාරයන් කෙරෙහි මධ්‍යස්ථ බැවින් සංස්කාරොපෙක්ෂායයි කියාද ඒ ඒ මාර්ගයට සුදුසු පරිද්දෙන් අපායාදී දුක්ඛයෙන්ද සංස්කාර නිමිත්තයෙන්ද නැගන හෙයින් ව්‍යුත්ථාන සංඛ්‍යාතවූ මාර්ගයටද පැමිණෙනුයි ව්‍යුත්ථාන ගාමිණී විදර්ශනායයි කියාද කියනුලැබෙද්ද එසේවූ දෙතුන් විදර්ශනා කෙනෙක් පවතිත්යයි දතයුතු. ඒ අනුලොම චිත්තයෙන් මතුයෙහි තුන්වැනිව හෝ සතරවැනිව භාවනා බලයෙන් නිර්වාණය අරමුණුකොටැ මාර්ගයෙන් යුක්තවූවහුගේ පෘථග්ජනව්‍යවහාරය ඉක්මවමින් ආර්යව්‍යවහාරයද පමුණුවමින් මාර්ගයට අනන්තරාදී ප්‍රත්‍යයවූ ගොත්‍රභූ නම් විදර්ශනා චිත්තය උපදවන්නේයි. ඒ ගොත්‍රභූ චිත්තයට අනතුරුවම අෂ්ටාඞ්ගික ආර්ය මාර්ගයතෙමේ ත්‍රෛභූමක ස්කන්ධ සංඛ්‍යාත දුක්ඛ සත්‍යය කෘත්‍ය හෙයින් දුක්ඛයෙහි මූලාවක් නැති බැවින් අසම්මොහ ප්‍රතිවෙධ වශයෙන් දනිමින් දුඃඛොත්පත්තියට කාරණ හෙයින් තෘෂ්ණා සංඛ්‍යාත සමුදය සත්‍යය දුරුකෙරෙමින් නිර්වාණයයි කියනලද නිරොධ සත්‍යය ආලම්බනය කාරණ වශයෙන් ප්‍රත්‍යක්ෂ කරමින් සම්ප්‍රයුක්ත මාර්ග සංඛ්‍යාතවූ සතරවන සත්‍යය නාමාහා එක්ව උපන් ධර්මයන්ට සහජාතාදී ප්‍රත්‍යය වැඩීම්වශයෙන් එකම ඥානයාගේ එකැසිල්ලෙහි සතර කෘත්‍යය සිඩකෙරෙමින් අර්පණාවීයයි කියනලද සතරවනුවූ හෝ පස්වනුවූ ජවනස්ථානයට බස්නේයි.

ඒ මාර්ග චිත්තයෙන් මාර්ගොත්පත්තියට අනුරූප පරිද්දෙන් ඵලචිත්තයෝ දෙදෙනෙක් හෝ තුන්දෙනෙක් හෝ පහකරණ ලද ගිනි ඇත්තාවූ ස්ථානයෙහි උණුසුම් බව නැති කරණු සඳහා කලයකින් වත්කරණු ලබන ජලයමෙන් මුලින් සිඳින ලද කෙලෙසුන් ඇති සන්තානයෙහි කෙලෙස් දාහයන් සිඳිම් වශයෙන් ඉපිද නිරුද්ධවෙති. එකාවර්ජන වීථිය තමා සත්වන ජවනය පරමකොට ඇති බැවින් ඉන්මතු භවාඞ්ගපාත වන්නේය. එහි යමක් හට පස්වැනිව මාර්ගචිත්තය උපදනේ වීනම් ඕහට මාර්ගය හා සමානවූ එම නිරොධය අරමුණුකොට ඵලසිත් දෙකෙක් උපදනේයි. යමක් හට සතරවැනිව මාර්ග චිත්තය උපදනේ වීනම් ඕහට ඵලසිත් තුනෙක් උපදනේයි. නැවත භවාඞ්ග සන්තතිය සිඳගෙණ මාර්ග ඵලාදිය විෂයකොට ඇති කාමාවචර ඥානයෝ වක්ෂ්‍යමාණ ක්‍රමයෙන් උපදනාහුයි. මෙයාකාරයෙන් භාවනාවද එහි අනුසස්ද එයින් ලැබියයුතු ඵලයවූ නිර්වාණයද ලබාගැණීමට සියලු සත්පුරුෂයෝම උත්සාහ කටයුතුනාහුය. ලොකයෙහි අතීතානාගත වර්තමාන යන කාලත්‍රය පිළිබඳවූ යම් පමණ බුදුපසේබුදු මහරහත් යන උත්තමයාණන් වහන්සේ කෙනෙක් වෙත්නම් ඒ සියලු උතුමෝම මෙම භාවනා මාර්ගයෙන්ම නිවන් දුටුවෝය. දකින්නාහුය. දකින්මය. මිටවඩා නිර්වාණ දර්ශනයට අන්මාර්ගයක් නැතිබවද සලකා නිතර භාවනාවන් පුරුදු පුහුණු කිරීමට උත්සාහ කටයුතු.

**කෙලෙසුන් කෙරෙන් තොරකර සිතු නනාමය – භාවනාමය—**

"කිලෙස සම්බාධාභාවා සුඛං චිත්ත විවෙකජං
දිට්ඨෙමෙ'පි වෙදෙති පවර: භාවනාරතො"

භාවනාරතො, භාවනායෙහි ඇලුනේ; දිට්ඨෙව ධම්මෙ අපි, මේ ජාතියෙහිදු; කිලෙස සම්බාධාභාවා, කෙලෙස සම්බාධ නැති හෙයින් (කෙලෙස් විසින් සිත්හුගේ ඇලුම් නැතිහෙයින්) චිත්ත විවෙකජං, චිත්ත විවෙකයෙන්වූ; (කෙලෙසුන් කෙරෙන් සිත්හු තොරවූ සෙයින්වූ) පවරං සුඛං, උතුම්වූ (ප්‍රවර) සුව, වෙදෙහි, අනුභව කෙරේ.

(සද්ධම්මොපායනය)

**බඹලොව**—(කසිණ ප්‍රතිභාග නිමිති සඞ්ඛ්‍යාත රූපය අරමුණු කොට උපදවනලද ධ්‍යාන බලයෙන් ඇතිව පවත්නා) රූප තෘෂ්ණාව නිදන කොට ඇති රූපභව නම් ලද සොළොස් බඹ තලයෙක්වේ. එනම්: —

1. **බ්‍රහ්මපාරිසද්‍යය**—"මහාබ්‍රහ්මානං පරිවාරිකත්තා තෙසං පරිසති භවාති බ්‍රහ්මපාරිසජ්ජා" මහාබ්‍රහ්ම රජයන්ගේ පිරිවරවූ බැවින් ඔවුන්ගේ පිරිස් වනහෙයින් බ්‍රහ්මපාරිශද්‍ය නම්වේ. එහි ආයුෂ අසංඛ්‍ය කල්පයෙන් තුනෙන් කොටසකි.

2. **බ්‍රහ්මපුරෝහිතය**—"තෙසං පුරෙහිතට්ඨානෙ ඨිතත්තා බ්‍රහ්ම පුරෙහිතා" මහාබ්‍රහ්මයන්ට පුරෝහිත තනතුරෙහි පිහිටි බැවින් බ්‍රහ්ම පුරෝහිත නම් වේ. එහි ආයුෂ අසංඛ්‍ය කල්පයෙන් දෙකොටසකි.

3. **මහාබ්‍රහ්මය**—"වණ්ණවන්තතායචෙව දීඝායුකතාදීහිච මහන්තා බ්‍රහ්මානොති, මහාබ්‍රහ්මානො" ශරීර ලක්ෂණයෙනුත් දීර්ඝායුෂ ඇති බැවිනුත් සෙසු බ්‍රහ්මයන්ට වඩා මහත් බැවිනුත් මහාබ්‍රහ්ම නම්වේ. එහි ආයුෂ අසංඛ්‍ය කල්පයකි.

මේ බඹලොව තුණ එකතලයක පිහිටා තිබේ. ප්‍රථම ධ්‍යානය හීන-මධ්‍යම-උත්කෘෂ්ට යන තුන් ආකාරයකින් වැඩීමෙන් මෙම තුන් බඹතලෙහි උපදනේයි.

4. **පරිත්තාභය**—"උපරිමෙහි පරිත්තා ආභා එතෙසන්ති පරිත්තාභා" මත්තෙහි වාසය කරන්නාවූ බ්‍රහ්මයන් කෙරෙන් ස්වල්පවූ ආලෝකය මේ බ්‍රහ්මයන්ට ඇතිහෙයින් පරිත්තාභ නම්වේ. එහි ආයුෂ මහා කල්පදෙකකි.

5. **අප්පමාණාභය**—"අප්පමාණා ආභා එතෙසන්ති, අප්පමාණාභා" ප්‍රමාණයක් නැත්තාවූ ආලෝකය මේ බ්‍රහ්මයින්ට තිබෙනනිසා අප්පමාණාභ නම්වේ. එහි ආයුෂ මහාකල්ප සතරකි.

6. **ආභස්සරය**—"වලාහකතො විජ්ජුවිය ඉතො චිතොච, ආභා සරති නිච්ඡරති එතෙසන්ති ආභස්සරා" මේඝකූටයෙන් නික්මුණාවූ විදුලියක්මෙන් ශරීරයෙන් ආලෝකය නික්ම පැතිරෙණහෙයින් ආභස්සර නම්වේ. එහි ආයුෂ මහාකල්ප අටකි.

මේ බඹලොව තුණද එකතලයක පිහිටා තිබේ. ද්විතීය ධ්‍යානය වැඩීමෙන් මෙම තුන් බඹතලෙහි උපදනේයි.

7. **පරිත්තසුභය**—"සො උපරිබ්‍රහ්මෙහි පරිත්තසුභා එතෙසන්ති පරිත්තසුභා" ඒකඝනව නොසෙල් වෙන්නාවූ ශරීරාලෝකයෙන් බබලන්නාවූ මත්තෙහි වාසයකරණ බ්‍රහ්මයන්ට වඩා ස්වල්පවූ සුභසංඛ්‍යාතවූ ආලෝකය මේ බ්‍රහ්මයන් කෙරෙහි ඇතිහෙයින් පරිත්තසුභ නම්වේ, එහි මහාකල්ප දහසයක් ආයුෂ ඇතිවේ,

8. **අප්පමාණ සුභය**—"අප්පමාණා සුභා එතෙසන්ති අප්පමාණා සුභා" ප්‍රමාණයක් නැත්තාවූ නිශ්චලවූ ශරීරාලෝකය මේ බ්‍රහ්මයන්ට ඇත්තේනුයි. අප්පමාණ සුභ නම්වේ. එහි ආයුෂ මහාකල්ප තිස්දෙකක්වේ.

9. **සුභකිණ්හකය**—"පභාසමුදය සඞ්ඛ්‍යාතෙහි සුභෙහි කිණ්ණා ආකිණ්ණාති, සුභකිණ්හා" ප්‍රභාසමූහයකින් ආකීර්ණව ගැවසී තිබෙනනිසා සුභකිණ්හක නම්වේ. එහි මහාකල්ප හැටහතරක් ආයුෂ ඇතිවේ.

මේ බඹලොව තුණද එකතලයක පිහිටා තිබේ, තෘතීය ධ්‍යානය වැඩීමෙන් මෙම තුන් බඹතලෙහි උපදින්නේයි.

10. **වෙහප්ඵලය**—"ඣාන ප්පභාව නිබ්බත්තං විපුලංඵලං එතෙසන්ති වෙහප්ඵලා" ධ්‍යාන භාවනාවෙන් පහළවූ මහත් විපාක ඵලයන් මේ බ්‍රහ්මයන්ට ඇතිහෙයින් වෙහප්ඵල නම්වේ. එහි ආයු ප්‍රමාණය මහාකල්ප පන්සියයකි.

11. **අසඤ්ඤසත්තය**—"නත්ථිසඤ්ඤතං මුඛෙන වුත්තා අරූපක්ඛන්ධාව එතෙසන්ති අසඤ්ඤතෙ යෙව සත්තාති අසඤ්ඤ සත්තා" සංඥාව හා සංඥාස්කන්ධයෙහි ප්‍රධාන භාවයෙන් වදාරණ ලද්දවූ සෙසු වේදනා සංඛාර විඤ්ඤාණ යන නාමස්කන්ධයෝද නැති බැවින් අසඤ්ඤසත්ත නම්වේ. එහිආයුෂ මහාකල්ප පන්සීයකි.

(14 වෙනි කවෙහි "සිත නැතිවම කය ඇති බඹතලයකි" යන්න බලනු.)

මේ බ්‍රහ්මලෝකදෙක එකතලයක පිහිටා තිබේ.

12. **අවිහය**—"පඨමතල වාසීනො අප්පකෙන කාලෙන අත්තනො ඨානං නවිජහන්ති, අවිහා" පළමුවෙනි බ්‍රහ්මලෝකයෙහි වාසය කරන්නාවූ බ්‍රහ්මරාජයෝ මදකලකින් තමන්ගේ ස්ථානය නොහරනා බැවින් අවිහ නම්වේ. මෙහි ආයුෂ මහා කල්ප දහසකි.

13. **අතප්පය**—"නකෙනචි තප්පන්තීති අතප්පා." දෙවෙනි ලෝකයෙහි වාසය කරන්නාවූ බ්‍රහ්මරාජයන්ට කිසිවකින් තැවීමක් නොවනහෙයින් අතප්පය නම්වේ. එහි ආයුෂ මහාකල්ප දෙදහසකි.

14. **සුදස්සය**—"පරම සුන්දර රූපත්තා සුඛෙන දිස්සන්තීති සුදස්සා" මේ තුන්වෙනි ලෝකයෙහි වාසයකරන්නාවූ බ්‍රහ්මරාජයන්ගේ ශරීරශෝභාව යහපත් බැවින් සුවසේ දකින්නුයි සුදස්ස නම්වේ. එහි ආයුෂ මහාකල්ප සාරදහසකි.

15. සුදස්සී — "පරිසුද්ධ දස්සන තතාසුබෙන පස්සන්තීති සුදස්සී නො" මේ සතරවෙනි ලොකයෙහි වාසය කරන්නාවූ බ්‍රහ්ම රාජයන්ගේ ශරීර ඉතා ශොභා ඇති බැවින් සුවසේ දක්ක හුනි සුදස්සී නම්වේ. එහි ආයුෂ මහාකල්ප අටදහසකි.

16. අකනිට්ඨ — "උක්කට්ඨ සම්පත්ති කත්තා නත්ථි එතෙ සංක නිට්ඨභාවොති, අකනිට්ඨා" මේ පස්වෙනි ලොකයෙහි වාසය කරන්නාවූ බ්‍රහ්මරාජයන්ට උත්කෘෂ්ටවූ මහත් සම්පත් ඇති බැවින්ද, කිසිවෙකුට බාලබවක් නැතිහෙයින්ද, අකනිට්ඨ නම්වේ. එහි ආයුෂ මහාකල්ප සොළොස් දහසකි.

අවිහය, අතප්පය, සුදස්සය, සුදස්සීය, අකනිට්ඨය යන බ්‍රහ්ම ලොකපස සුද්ධාවාසයි. (සුද්ධානං අනාගාමි අරහන්තානමෙව ආවාසාති සුද්ධාවාසා) මේ පස් බඹලොව කෙලෙසයන් කෙරෙන් පිරිසිදුවූ අනාගාමි රහතන්ට වාසස්ථාන වන බැවින් සුද්ධාවාස නම්වේ. පෘථග්ජනයෝ එහි උත්පත්ති නොකෙරෙත්.

අරූප තෘෂ්ණාව නිදහකොට ඇති අරූප භවනම්වූ බ්‍රහ්ම ලොක සතරක්දවේ. එහි විභාග 14 වෙනි කවෙහි "සිතම්ස කයනැති බඹලොව සතරකි" යන්න බලා දතයුතුයි.

**පිණකින් උතුම්පිණනම් භාවනාමය—**

භාවනාව—හෙතු ප්‍රත්‍යයෙන් ඉපදී නැසෙන සියල්ල අනිත්‍ය දුක්ඛ අනාත්ම යයි සැලකීමෙන් හිත හික්මවා ගැනීම භාවනා නම්වේ.

"චිත්තස්සොපක්කිලෙසානං යා චින්තා පටිපක්ඛිකා
තස්සායා භාවනා සාහි භාවනාති පකිත්තිතා"

චිත්තස්ස, සිතට; උපක්කිලෙසානං, උප කෙලෙශවූ (කිළුටුවූ) රාගාදී කෙලෙශයන්ට; පටිපක්ඛිකා, ප්‍රතිපක්ෂවූ; යාචින්තා, යම් චින්තාවක් ඇද්ද; තස්ස, ඒ චින්තාවගේ; යා භාවනා, යම් භාවනාවක් වැඩීමක්වේද; සාහි, හෝ වනාහි; භාවනා ඉති, භාවනායයි; පකිත්තිතා, කියනලදී.

(සද්ධම්මොපායනය)

**භාවනානිසංස—**

"දාන සීලෙව යෙ වුත්තා ආනිසංසා අනෙසකා
තෙමන්දභාවනායා'පි සංසිජ්ඣන්ති අසංසයං
භාවනා බල යොගෙන බුද්ධ භාවො'පි සංගිණයං
තදඤ්ඤ කාහි සම්පත්ති භාවනාය අසාධියං."

දානයෙහිද, සීලයෙහිද, යම් අනුසස් කොතෙක් කියනලද හුද, ඒ අනුසස්හු සවල්පවූ භාවනාමය කුසලයෙන්ද, නිසැකයෙන් සිදුවෙත්. බුදුබවද භාවනාවගේ බලයෝගයෙන් (භාවනා ශක්තියෙන්) සාධ්‍යවෙයි. එයින් අන්‍යවූ කවරනම් සම්පත්තියක් භාවනා බලයෙන් අසාධ්‍ය වන්නීද?

(සද්ධම්මොපායනය)

බුද්ධානුස්මෘති භාවනාව<br>ධම්මානුස්මෘති භාවනාව<br>සඞ්ඝානුස්මෘති භාවනාව } --120 වෙනි කව බලනු.

කායගතාසති භාවනාව<br>හෙවත් පිළිකුල් භාවනාව } —52 කව බලනු.

මෛත්‍රී භාවනාව—111 කව බලනු.

අසුභභාවනාව—ශරීරය පිළිකුල් කටයුතු කුණපයක් බව මෙනෙහි කිරීම;—

"අවිඤ්ඤාණ සුභනිභං-සවිඤ්ඤාණ සුභං ඉමං
කායං අසුභතො පස්සං-අසුභං භාවයෙ යති"

නවචාරයකින් වැගිරෙන කුණු ඇතිහෙයින් සිත්නැති අශුභයක් බඳුවූ, සිත් ඇතිවම අශුභවූ මේ ශරීරය අසුභවශයෙන් මෙනෙහි කරමින් භාවනා කටයුතුයි.

"වණ්ණ සණ්ඨාන ගන්ධෙහි-ආසයොකාසතො තථා
පටිකකූලානිකායෙ මෙ-කුණපානි විසොළස"

මාගේ ශරීරයෙහි ෂොඩශවයක් කුණපයෝ වර්ණ සටහන් ගඳ ආශ්‍රය හෙවත් ආධාරය අවකාශ යන පඤ්චප්‍රකාරයෙන් පිළිකුල් වන්නාහුය.

"පතිතම්හාපි කුණපා-ජෙගුච්ඡං කාය නිස්සිතං
ආධාරෙහි සුචි තස්ස-කායෙතු කුණපෙ ඨිතං"

ශරීරයෙහිවූ කුණපය ශරීරයෙන් වැටුණු කුණපයට වඩා පිළිකුල්වේ. කුමක්නිසාද යතහොත් ශරීරයෙන් වැටුණු කුණපයාගේ ආශ්‍රය පිරිසිදුය. ශරීරස්ථවූ කුණපය කුණපයෙහිම පිහිටි බැවිනි.

"මීළ්හාකිම්ව කායොයං-අසුචිම්හි සමුට්ඨිතො
අන්තො අසුචි සම්පුණ්ණො-පුණ්ණ වච්ච කුටීවිය"

අසුචියෙහිවූ පණුවෙක්මෙන් මේ සිරුර මව්කුස අසුචියෙහිම උපන්නේය. පිරුණාවූ වැසිකිළියක් මෙන් ඇතුළත අසුචියෙන් පිරුණේය.

"අසුචි සන්දතෙ නිච්චං-යථා මෙදක ථාලිකා
නානා කිමි කුලාවාසො-පක්ක චන්දනිකාවිය.

මේදතෙල් පිරූ භාජනයක්මෙන් නිතර අසුචි වැහෙන්නේය. ගිම්හානයෙහි පැසුණු මඩවලක්මෙන් අනේක කෘමි කුලයන්ට ගෙයක් වූයේය.

"ගණ්ඩභූතො රොගභූතො-වණභූතො සමුස්සයො
අතෙකිච්ඡො'ති ජෙගුච්ඡො-පභින්න කුණපූපමො"

මේ ශරීරය වනාකී පැසවාපු ගෙඩියක් බඳුය. පිළියම් කිරීමෙන් සුවකට නොහැකි රොගයක් වැන්න. ව්‍රණයක්ද වැන්නේය. නොයෙක් අතින් සිදුරුව ගිය මිණී කුණපයක් බඳු බැවින් නුවනැත්තන් විසින් ඉතා පිළිකුල් කටයුත්තේය.

**මරණානුස්මෘතිය හෙවත් මරණය ගැණ සිහිකිරීම:—**

"පජ්ජොතදීප තුල්‍යාය-සායුසන්තති යාක්ඛයං
පරූපමාය සම්පස්සං-භාවයෙ මරණස්සති"

මහසුළඟ හමන තැන දල්වනලද පහනක් මෙන් හීනභාවට යන ආයුෂය අන්‍යයන්ට උපමාකොට බලමින් මරණානුස්මෘතිය භාවනා කටයුතුයි.

"මහා සම්පත්ති සම්පන්නා-යථා සත්තා මතා ඉධ
තථා අහං මරිස්සාමි-මරණං මම හෙස්සති"

යම්සේ මේ මනුෂ්‍ය ලොකයෙහි මහා සම්පත්තීන්ගෙන් ආඪ්‍යවූ (මහාසම්මත රජාදිවූ) සත්වයෝ මළාහුද එමෙන් මමද මියෙමි. මරණය මට වන්නේය.

"උප්පත්තියා සහෙවෙදං-මරණං ආගතං සදා
මරණත්ථාය ඔකාසං-වධකොවිය එසති"

මේ මරණය උත්පත්තිය කැටුව ආයේය. එබැවින් සියලු කල්හිම මරණය පිණිස අවකාශය වධකයෙක්මෙන් සොයන්නේය.

"ඊසකං අනිවත්තන්තං-සතතං ගමනුස්සුකං
ජීවිතං උදයා අත්ථං-සූරියො විය ධාවති"

ජීවිතය ඇසිල්ලකුදු නොනවත්නේය. නිරන්තරයෙන් ගමන උත්සාහ ඇත්තේ, උදාවීමෙන් අස්තඞ්ගත වන්නාවූ හිරුමෙන් දුවන්නේය.

"විජ්ජු බුබ්බුල උස්සාව-ජල රාජි පරික්ඛයං
ඝාතකොව රිපුතස්ස-සබ්බත්ථාපි අවාරියො"

විදුලියක්මෙන් දියබුබුලක්මෙන් තණඅග පිනිබිඳක්මෙන් දියෙහි ඇඳි ඉරක්මෙන් මේ ජීවිතය නැතිවීමට යන්නේය. මරණ සතුරෙකුමෙන් ඒ මරණය සියලුතන්හි වැළකිය නොහැක්කේය.

"සුයස්සත්ථාම පුඤ්ඤිද්ධි-බුද්ධිවුද්ධි ජිනච්චයං
ඝාතෙසි මරණං ඛිප්පං-කාතුමාදිසකෙ කථා"

මහත් යසසින්, ශක්තියෙන්, පිණින්, සෘද්ධියෙන්, බුද්ධියෙන් වැඩිසිටි බුදුපසේ බුදු දෙදෙනාද, වහා මරණය තෙම නැසූයෙන් කිත්ති රහිත වැඩිසිටි බවක් නොමැති මාවැන්නෙක් ගැණ කියනුම කවරේද?

"පච්චයානම වෙකල්ලා-බාහිරජ්ඣත්තු පද්දවා
මරාමොරං නිමෙසාපි-මරමානො අනුක්ඛණන්ති"

ක්‍ෂණක්‍ෂණයෙහි ක්‍ෂණික මරණයෙන් මියන්නාවූ මම ආහාරාදි ප්‍රත්‍යයන්ගේ වෙනස් වීමෙන්ද, සිංහ ව්‍යාඝ්‍රාදීන් ගෙන් වන බාහිර උපද්‍රවයෙන්ද, ධාතුකැළඹීම් ආදිවූ ශරීර ගත උපද්‍රවයෙන්ද, ඇසපිය හෙළීමෙන් මොබද මියෙමි.

127. ක ල පි න් දිමනම් තමසිත සතුටු කො ම
බැ ඳි ර න් හිණෙක දෙව්ලෝසගට නැගුම ම
නැ ගි පු න් සඳෙකි අව බියගිම් නිවිම ම
නි ති පි න් එසින් දෙව දුටු දුටු දනන් හ ම

තමසිත, ස්වකීය චිත්තය; සතුටුකොට, සන්තුෂ්ටකොට; කල පින්, කළාවූ පුණ්‍යය; දීමනම්, (අනුන්ට) දෙනා කිරිම වනාහි; දෙව් ලෝසගට, සදිව්‍යලොකයට; නැගුමට, නැගීම පිණිස; බැඳි, බඳනා ලද; රන්හිණෙක, ස්වර්ණසොපානයෙක; (රන්ඉණිමගෙක) අවබිය ගිම්, අපාය භය නැමති ග්‍රීෂ්මය; නිවීමට, නිර්වාපණය පිණිස; නැගි, උද්ගතවූ; පුන්සඳෙකි, පූර්ණචන්ද්‍රයෙකි; එසින්, එසේහෙයින්; දුටුදුටු දනන්හට, දක්‍ෂිණාව කළ කළ ජනයින්ට; නිති, නිරන්තරයෙන්; පින්දෙම, පත්තිදානය කරව්. (පින්දීම කරව්)

පින්දීම — 113 වෙනි කවිය බලනු.

**දෙව්ලෝසය:**— 1. චාතුම්හා රාජිකය, 2. තාවතිංශය, 3. යාමය, 4. තුසිතය, 5. නිර්මාණරතිය, 6. පරනිර්මිත වසවර්තිය, යන මේ සයයි.

1. **චාතුර්මහාරාජික දිව්‍යලෝකය**—"චතුන්නං මහාරාජානං නිවාසට්ඨාන භූතෙ චතුමහාරාජෙ භවාති චාතුම්මහා රාජිකා" සිව් වරම් දෙවිමහ රජදරුවන්ට වාසස්ථානවූ හෙයින් සිව්මහරජයෙහි උපන්නාවූ චාතුර්මහාරාජික දෙවියෝ නම් වන්නාහුය. ඒ චාතුර්මහාරාජික දිව්‍යලෝකය අසූහාරදහසක් යොදුන් උස ඇත්තාවූ යුගන්ධර පර්වත මුදුන සමවූ අවකාශයෙහි චක්‍රවාට පර්වතය දක්වා පිහිටා තිබෙයි. එහි ආයුෂ මනුෂ්‍යගණනින් අවුරුදු අනූලක්ෂයක් වේ. ( 9000000 )

2. **තාවතිංස දිව්‍යලෝකය**—"තෙත්තිංස ජනා එත්ථ නිබ්බත්තා තෙත්තිංසං තදෙව තාවතිංසං තං නිවාසො එතෙසන්ති තාවතිංසා." තිස්තුන්දෙනෙක් ජනයෝ එහි උපන්නෝනුයි. තෙත්තිංස නම් වන්නේය, එයම තාවතිංස නම් වන්නේය, ඒ තාවතිංසය ඔවුන් වාසස්ථානයකොට ඇත්තෝනුයි තාවතිංස නම් වේ. චාතුර්මහාරාජික දෙව්ලොව පටන් යොදුන් සතලිස් දෙදහසක් පමණ මත්තෙහි මහමෙර මුදුන සමවූ අවකාශයෙහි තව්තිසා දෙව්ලොව පිහිටාතිබෙයි. එහි ආයුෂ මනුෂ්‍යගණනින් අවුරුදු තුන්කෝටි හැටලක්ෂයයි. ( 36000000 )

3. **යාම දිව්‍යලෝකය**—"දුක්ඛතො යාතා අපායාතාති යාමා" දුකින් පහව දිව්‍ය සැපයට පැමිණි හෙයින් යාමනම් වේ. තව්තිසා දෙව්ලොව පටන් යොදුන් හාරලක්ෂ තිස්හාරදහස් හාරසියයක්පමණ මතුභාගයෙහි යාම දෙව්ලොව පිහිටාතිබෙයි. එහි ආයුෂ මනුෂ්‍ය ගණනින් අවුරුදු දහහතරකෝටි හතලිස් ලක්ෂයයි. ( 144000000 )

4. **තුසිත දිව්‍යලෝකය**—"තුසං පීතිං ඉතා ගතාති තුසිතා." තුටුපහටු සිත් ඇත්තේ සතුටට හා ප්‍රීතියට මෙයින් පැමිණියෙන් තුසිත නම් වේ. යාම දෙව්ලොව පටන් යොදුන් සත්ලක්ෂ අසූ අටදහස් අටසියයක් පමණ මතුභාගයෙහි තුසිත දිව්‍යලෝකය පිහිටාතිබේ එහි ආයුෂ මනුෂ්‍ය ගණනින් අවුරුදු පනස් හත්කෝටි හැටලක්ෂයයි. ( 576000000 )

5. **නිර්මාණරති දිව්‍යලෝකය** —"යථා රුචිතෙ භොගෙ නිම්මිනිත්වා රමන්තීති නිම්මානරතිනො." (ප්‍රකෘති සැපයෙන් වැඩියක් කැමතිව අරමුනක් උපන් කල්හි) කැමති පරිද්දෙන් සම්පත්

නිර්මිතකොට අභිරමණය කෙරේනුයි හෙවත් ඇලී සතුටු වෙත්නුයි නිර්මාණරතීනම් වෙයි. තුසිත දෙව්ලොව පටන් යොදුන් එකොලොස්ලක්ෂ තිස්පන්දස් දෙසිය දෙකක් පමණ මත්තෙහි නිර්මාණරතී දෙව්ලොව පිහිටා තිබේ. එහි ආයුෂ මනුෂ්‍යගණනින් දෙසියතිස්කෝටි හතලිස්ලක්ෂයයි. (2304000000)

6. **පරනිර්මිත වසවර්ති දිව්‍යලොකය**—"පරෙහි නිම්මිතෙ සුභොගෙසුව සං වතෙතනතීති පරනිම්මිත වසවත්තිනො" අනුන් විසින් නිර්මිත කලාවූ සම්පත් තමන් වසගයා පමුණුවත්නුයි "පරනිම්මිත වසවත්ති" නම් වේ. නිර්මාණරතී දෙව්ලොව පටන් යොදුන් තුදුස්ලක්ෂඅසූපන්දස්හසියයක් පමණමත්තෙහි මෙම දෙව්ලොව පිහිටා තිබේ. එහි ආයුෂ මනුෂ්‍යගණනින් අවුරුදු නවසිය විසිඑක්කෝටි හැටලක්ෂයයි. ( 9216000000 )

**128.** දන් දෙන සඳෙහි දෙව්රම් වෙහෙර මුනිඳු ට
පින් අනුමෝදන්ව මිනිසෙක් එතන සි ට
පින් ලැබගතිය වැඩිතරමින් එසිටුහ ට
ඉන් දුන නුදුන කිම අනුමෝදනාව ට

මුනිඳුට, මුනීන්ද්‍රයාණන්වහන්සේට; දෙව්රම් වෙහෙර, ජේතවනාරාමවිහාරය; දන්දෙන සඳෙහි, පූජාකරණ කල්හි; එතන සිට, ඒ ස්ථානයෙහි අවස්ථිතවූ; මිනිසෙක්, මනුෂ්‍යයෙක්; පින් අනුමෝදන්ව, ඒ පුණ්‍යය අනුමෝදන්වී; එසිටුහට, ඒ (අනේපිඬු) මහාසිටාණන්ට; වැඩිතරමින්; අධික ප්‍රමාණයෙන්; පින් ලැබගතිය, කුසල් ලබාගත්තේය; ඉන්, ඒනිසා; අනුමෝදනාවට, පුණ්‍යානුමෝදනාව පිණිස; දුන නුදුන, දුන්නත් නුදුන්නත්; කිම, කවර කාරණයක්ද?

**දන් දෙන සඳෙහි දෙව්රම් වෙහෙර.........පින් ලැබගතිය වැඩිතරමින් එසිටුහට—**

"විස්සජ්ජෙත්වාන නිස්සඞ්ගං චතුපඤ්ඤාස කොටියො
කත්වා ජෙතවනෙ රම්මං විහාරං චාරුදස්සනං
සොණ්ණභිංකාර හත්ථස්ස සුදත්තස්ස සිරිමතො
දිස්වා සබ්බඤ්ඤු බුද්ධස්ස දක්ඛස්ස දදතො සිරිං
අනොදනාති බහුසො උදකං අබ්භුදීරයං
මාණවො අනුමොදන්තො අදෙන්තො කාකණිකම්පිච
දායකතොපි අධිකං අලත්ථ කුසලොදයං."

නිස්සඬ්ගං, ඇළුම් නැතිව; චතුපඤ්ඤාසකොටියො, සූපණස් කොළක් ධන; විස්සජ්ජෙත්වාන, වියදම්කොට; රමෙම, රමණීයවූ; ජෙතවනෙ, ජේතවනයෙහි; චාරුදස්සනං, මනොඥ දශිනීයවූ; විහාරං කාරෙත්වා, විහාරයකොට; සබ්බඤ්ඤු බුද්ධස්ස, සර්වඥ බුදුන් ප්‍රමුඛකොට ඇති; සඞ්ඝස්ස, සඞ්ඝයාහට; අදාසි, දුන; සොණ්ණභිංකාරහත්ථස්ස, (දක්ෂිණොදකදෙන්නට) රන්කෙණ්ඩි ගත් අත් ඇති; සිරිමතො, ශ්‍රීමත්වූ; සුදත්තස්ස, සුදත්ත මහ සිටුහුගේ; සිරිං දිස්වා, ශ්‍රීය දක; අහො දානං ඉති, ආශ්චර්‍ය්‍යයේ මේ දානයයි කියා; බහුසො, බොහෝසේ; උදානං, ප්‍රීතිවාක්‍යය; අබ්භුදීරයං, කියමින්; අනුමොදන්තො, අනුමෝදන්කල; කාකණිං අපිච, කාණවකුදු (තුට්ටුවකුදු); අදෙන්තො, නුදුන්; මාණවො, මාණවකයෙක්ද; දායකතො අපි, දායකයහටද වඩා; අධිකං, බලවත්වූ; කුසලොදයං, කුසලොදයක් ( පින්එළ ) අලත්, ලද (මෙහි කාණවකැයි දෙවියට සමාරක්කියත්).

( සද්ධම්මොපායන )

**පුණ්‍යානුමෝදනාව** — අනුන් විසින් පින්දෙන කල්හි මානනුපදවා සාධු! සාධු!! කියා අනුමෝදන්වීමයි.

**පුණ්‍යානුමොදනාවෙහි අනුසස්** — යමෙක් ඊෂ්‍ර්‍යා ව්‍යාපාද මාත්සර්‍ය්‍ය විචිකිත්සා යන මේ අකුසල ධර්මයන්නසා ගුණයෙන් ආරාධිතවූ සිත් ඇතිව පින් අනුමොදන්වන්නේද හෙතෙම මහේශාක්‍ය වෙයි, යහපත් රුව ඇත්තේ වෙයි, භාග්‍ය ඇත්තේ වෙයි, හැම කල්හි සතුටු සිත් ඇත්තේවෙයි, බොහෝ ආයුෂ ඇත්තෙක් වෙයි. එසෙයින් කියනලදී.

සද්ධම්මොපායනයෙහි—

"ඉස්සා ව්‍යාපාද මච්ඡෙරං විචිකිච්ඡාපි නාසිය
ගුණ රාධිත චිත්තොයං අනුමොදති මොදකො
යතො තතො මහෙසක්ඛො සුරූපො භොගවා පිච
දීඝායුකො සදා හට්ඨො හොති පුඤ්ඤානුමොදකො."

"නොකැමිනි මසුරු මද ස
දුරලා වෙමින් සිතනො ස
අනුන් දුන් පින් රැ ස
හැඟුම් අනුමෝදනය සොඳලෙ ස".

( කාව්‍යශෙඛරය )

දෙව්රම්වෙහෙර – අනාථයන්ට පිඬු දෙනහෙයින් "අනාථපිණ්ඩික" යයි නම් ලද සුදත්තනම් ගෘහපතියානන් විසින් සැවත්නුවර ජේතනම් රජකුමරහුගේ උයනමිලදී ගෙණ සිව් පනස් කෙලක් ධන වියදම්කොට කරවා බුදුපාමොක් සිව්දික් වැසි මහසඟනට සඞ්ඝගතකොට පූජාකල මහ විහාරයයි.

129. බු දු න් දෙසන බණ මියුරෙන්ම සිත නැ ණී
ප ස න් ව උන් මැඬියෙක් කැවිටකින් ඇ ණී
එ සි න් මුගුරව සුරසිරි ලදිය දුහැමි ණී
මෙ ව න් දහම් ඇසුමට මැලිනොවි දූ ණී

බුදුන්, සර්වඥයන්වහන්සේ විසින්; දෙසන බණ, වදාරන්නාවූ ධර්මයෙහි; මියුරෙන්ම, මධුරතාවයෙන්ම; සිත නැනී, චිත්තය නැමීම් නොව; පසන්ව උන්, ප්‍රසන්නව උන්නාවූ; මැඬියෙක්, මණ්ඩූකයෙක්; කැවිටිකින් ඇනී, කෙවිටි පතොදයක් ඇනී; එසින්, ඒ මණ්ඩූකභාවයෙන්; චුතව, මියගොස්; දුහැමිනි, ඒ කුසල ධර්මය හේතුකොටගෙණ; සුරසිරි, දිව්‍ය ඓශ්වර්යයසී; ලදිය, ලද්දේය; දූනි, මෙයදූනගණ; මෙවන් දහම්, මෙබඳු ධර්මය; ඇසුමට, ශ්‍රවණය කිරීම පිණිස; මැලිනොවව්, කුසීතනොවව්.

බුදුන් දෙසන බණ මියුරෙන්ම සිතනැණී ...... පසන්ව උන් මැඬියෙක්........... සුරසිරිලදිය—

එක්සමයෙක්හි අප බුදුන් ගග්ගරානම් රාජමහෙසිකාව විසින් ඛනනයකරවූ හෙයින් ගග්ගරානම්වූ පුෂ්කරණී තීරයෙහි ප්‍රඥප්තාසනයෙහි වැඩහිඳ චම්පා නුවරවාසීන්ට ධර්ම දේශනා කරණ කල්හි එහි වසන එක් මණ්ඩූකයෙක් බුදුන්ගේ ශබ්ද යෙහි මේ කියන්නේ බණකැයි ධර්ම සංඥායෙන් ප්‍රසන්න චිත්තයෙන් නිමිත්ත ග්‍රහණයකෙළේ. මෙහි නිමිත්ත ග්‍රහණය නම් මත්තෙහිලැබියයුතු ලෞකික ලොකොත්තර සම්පත්තියට කාරණාවූ බුද්ධ වචන ග්‍රහණයයි. එකල්හි එක් වස්සන් රකිනා ගොපල්ලෙක් එතැන්හි දණ්ඩක එල්බ සිටියේ ඒ මණ්ඩූක යාගේ ශීර්ෂබාහණ සිටීය. එකල්හි ඒ මණ්ඩූකයා ඒ දුඃඛයෙන් එවිටම කාලක්‍රියාකොට තුන්කෙළ සැටලක්ෂයට ආයු ඇති තව්තිසා දිව්‍යලෝකයෙහි නිදා පිබිදියක්හුමෙන් දෙළොස් යොදුන් පමණ උස ඇති රන් විමානෙක ඖපපාතිකව උපනී. එතෙම එහි දාස්ගණන් දෙවඟනන් විසින් පිරිවරණලද තමා බලා කොල මමත් මෙසේවූ තැනක උපන්මි. මීට හේතු කවර

නම් කුසලකර්මයක් කෙළෙම්දෝයි ආභෝග කරන්නේ දිවසින් පරීක්ෂාකොට බලන්නේ බුදුවදන්හි කළ නිමිත්ත ග්‍රහණයවිනා අන් වෙතින් කළ කුසලයක් නොදිටි. ඒ දිව්‍ය පුත්‍රතෙම එවිගසම දිව්‍යප්සරා සමූහයා විසින් පිරිවරණ ලදුව දෙලොස් යොදුන් රන් විමන හා සමග බුදුන්කරා එළඹ ශ්‍රීපාදයට නමස්කාර කෙළේය. එකල්හි බුදුහු ඔහුදුන වදරණ සේක්ම එතැන්හි රැස්වූ පිණිදා ධර්මශ්‍රවණය කුශලයෙන් ජනිත ඵලයට විපාක ඔහු ලවාම ප්‍රකාශකරවනු පිණිස,

"කො මෙ වන්දති පාදානි—ඉද්ධියා යසසා ජලං
අභික්කන්තෙන වණ්ණෙන—සබ්බා ඔභාසයං දිසා"

යන මේ ගාථාවෙන් දෙව සෘද්ධියෙන්ද යසසින්ද දිලිසෙන්නාවූ ඉතා සිත්කළුවූ ශරීරවර්ණයෙන් සියළු දිගුන් බබුළුවන්නාවූ කවරෙක්තෙම මාගේ පාදයන් නමස්කාර කෙරේදැයි වදාළසේක. හෙතෙම එවිට:—

"මණ්ඩූකො'හං පුරෙ ආසිං—උදකෙ වාරි ගොචරො
තව ධම්මං සුණන්තස්ස—අවධී වච්ඡපාලකො"

යන මේ ගාථාවෙන් දියෙහි දියම ගොදුරුකොට ඇති පෙර මම මණ්ඩූකයෙක් වීමි. ස්වාමීනි බුදුරජාණන්වහන්ස! තුඹ වහන්සේගේ මේ බණ අසන මා එක් ගොපොල්ලෙක් දණ්ඩකින් මැඩ මැරුයේයයි දැන්වී. බුදුහු එවිට ඕහට ධර්මදේශනා කොට වදාළසේක. ඒ ධර්මදේශනාවෙන් එතැන් රැස්වූ සුවාසූ දහසක් ප්‍රාණීන්ට චතුස්සත්‍ය ප්‍රතිවේධය වීය. මාර්ගඵලාධිගමය වීය. ඒ මණ්ඩූකදිව්‍ය පුත්‍රද දහසක් නයින් ප්‍රතිමණ්ඩිතවූ සෝවාන් ඵලයෙහි පිහිටා එසේම ඉතා මදවූ කුසලානුභාව යෙන් මෙසේ ඉතා මහත්වූ ලොව්ලොවුතුරා සැපත් ලැබෙන්නේයයි කියා උපන් ප්‍රීතිසෞමනස්‍යයෙන් සිනා පහළකොට

"මුහුත්තං චිත්තප්පසාදස්ස—ඉද්ධිං පස්ස යසඤ්ච මෙ
ආනුභාවඤ්ච මෙ පස්ස—වණ්ණං පස්ස ජුතිඤ්ච මෙ
යෙ ච තෙ දීඝමද්ධානං—ධම්මං අස්සොසුං ගොතම
පත්තා තෙ අචලං ඨානං—යත්ථ ගන්ත්වා න සොචරෙ"

මොහොතක් (ධර්මය කෙරෙහි) සිත පැහැදීම හේතු කොට ගෙණ මාගේ දෙවසෘද්ධියද ඓශ්වර්යයද බැලුව මැනව. මාගේ ආනුභාවයද බැලුව මැනව. මාගේ ශරීරවර්ණයද බැලුව මැනව. ගෞතම සර්වඥයන් වහන්ස! යම් ඒ ජනකෙනෙක් දීර්ඝකාල

යක් මුළුල්ලෙහි ධර්මය ශ්‍රවණය කළාහුද ඔව්හු යම් තැනකට ගොස් (සත්වයෝ ශෝක නොකරද්ද, එබඳු) නිශ්චලස්ථානයට ප්‍රාප්තවූවාහු වෙති) යන මේ ගාථා දෙකින් බුදුන්ට ස්තුතිකොට තමාගේ දිව්‍යලෝකයටම ගියේය.

( විමුක්තිසංග්‍රහය )

130. දුක් පත් සතෙක් මුනිඳුන් වෙත සිත පැහැ දී
එක් දගැබක දියබෙරලිය මලක් පි දී
සක් විති සැපත් ඉන් පන්තිස් වරෙකල දී
දුක් නැත මෙපුද කරතොත් අකුසලින් මි දී

දුක්පත් සතෙක්, දුඃඛිතවූ සත්වයෙක්; මුනිඳුන්වෙත, සර්වඥයන් වහන්සේ කෙරෙහි; සිත පැහැදී, චිත්තප්‍රසාදනාව; එක්දගැබෙක, එක්ධාතු ගර්භයක්හි; දියබෙරලිය මලක්, දියබෙරලිය පුෂ්පයක්; පිදී, පූජාකෙළේය; ඉන්, ඒ පූජාවෙන්; පන්තිස්වරෙක, තිස්පස් වාරයෙක්හි; සක්විති සැපත්, චක්‍රවර්ති සම්පත්; ලදී, ලද්දේය. අකුසලින්මිදී, අකුසලයෙන්මුදනාව; මෙපුද කරතොත්, මේ පිදීම කරත්නේ නම්; දුක්නැත, දුඃඛයක් නැත්තේය.

**දුක්පත් සතෙක් — දියබෙරලිය මලක්පිදී —** * ඛණ්ඩසුමණ මහ තෙරහු වනාහි තමන් සසර වසනකල්හි පහන් සිතින් එක් මලක් පුද අශීති වර්ෂ කෝටියක් ස්වර්ගසම්පත් වළඳ පුණ්‍යක්ෂය නොවන තුරුම නිවන් පත්වූහ.

“එක පුප්ඵං චජිත්වාන අසීතිං කප්පකොටියො
දුග්ගතිං නාභිජානාමි — එකපුප්ඵස්සිදං ඵලං.”

එක පුප්ඵං, එකමලක්; චජිත්වාන, ත්‍යාගකොට පුදා; අසීතිං කප්පකොටියො, අසූකෙළක්කප්; දුග්ගතිං න අභිජානාමි, දුගතිය නොහඳුනමි; ඉදං, මේ; එකපුප්ඵස්ස, එක් පුෂ්පයක්හුගේ; ඵලං, ඵලයයි කියා දක්වා තිබේ.

(සද්ධම්මොපායනය)

131. වෙස් සබු මුනිඳු දැක එකවරෙක වැ න්දේ
තිස් එක කපෙක දුගතිය දුක් නොවි න්දේ
තොස් වඩවන නරසුර ඉසුරු වි න්දේ
යෙස් සතැනක් මෙකුසල් බැරි කුම න්දේ

---

* එකපුප්ඵං චජිත්වාන — අසීතිං වස්සකොටියො
සග්ගෙසු පරිචාරෙත්වා — සෙසකෙ නම්හි නිබ්බුතො.

වෙස්සබු මුනිඳු, වෙසසභූ නම් මුනීන්ද්‍රයාණන් වහන්සේ; දක, දර්ශනයකොට; එක්වරෙක, එක්වාරයක්; වැන්දේ, වැන්දවුයෙක හොත්; තිස්එක කපෙක, තිස්එකකල්පයෙක්හි; දුගතිය, දුර්ගතියෙහි; දුක්නොවිඳින්දේ, දුක්ඛවිඳිනය නොකළේ; තොස් වඩවන, තුෂ්ටි වර්ධනය කරන්නාවූ; සුරනර ඉසුරු, දිව්‍යමනුෂ්‍ය ඓශ්වර්‍ය්‍යයන්; විඳින්දේ, විඳිනය කොළේයි; සෙස්ස නැතත්, අතික් කුසලක්නැති නමුත්; මෙකුසල්, මේ (වන්දනා) කුසල කර්මයන්; බැරිකුමන්දේ, නොහැකිවන්නේ කුමක් හෙයින්ද !

**වෙස්සබු මුනිඳු**—මේ මහාභද්‍රකල්පයට එක්තිස්වන, බුද්ධරත්නවය කින් ලබ්ධිතවූ "මණ්ඩ" නම් කල්පයෙහි සිටි සර්වඥයන්වහන්සේට ඉක්බිතිව විසිතුරු තුසිත පුරයෙන්අවුත් දඹදිව "අනෝපම" නම් නුවර සුප්‍රතීත නම් මහරජහු නිසා යසවතී නම් අග මෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ දසළුකඩ මසින් බිහිව වැඩිවිය පැමිණ රුචිය සුරුචිය, රතිවර්ධන යයි යන තුන් සෘතුවට සුදුසුවූ පායෙහි තිස්දහසක් පුරඟනන් පිරිවරා දසදහසක් අවුරුදු රජසිරිවිඳ සුචිත්‍රා නම්අගබිසවතොමෝ සුප්‍රබුද්ධ නම් පුත්රුවන වැදූ දිනයෙහි රන්සිවිගෙයකින් මහබිණික්මන් කොට සැත්තෑ දහසක් අමාත්‍ය වරුන් සමග මහණව සමයක් ප්‍රධන් වීර්‍ය්‍යකොට බුදුවන දවස් සුචිත්‍රා නම් නියම්ගම සිරිවඩ්ඩ නම් නා මෙණෙවිය දුන් මිහිරි කිරිබත වළඳ නරින්ද්‍ර නම් නාගෙන්ද්‍රයා විසින් දුන් හිතණ අටමිටක් පිළිගෙණ අපරාජිත ස්ථානයට ගොස් සාල බෝධි මූලයෙහි සළාහෙලා සතලිස් රියන්උස පැනනැගි විදුරසුන් මත්තෙහි බෝකඳට පිටලා වැඩහිඳ මාර පරාජයකොට ලොව්තුරා බුදුව සත්සති යවා බඹහුගේ අයැදුමෙන් වරුණ නම් උයන්හි දම්සක් පවත්වා සෝනය උත්තරයයි යන අගසව් දෙනමක් හා දමාය, සුදමා යයි යන අග්‍රශ්‍රාවිකා දෙනමක් ඇතිව උපශාන්ත නම් මහ තෙරුන් වහන්සේගෙන් උපස්ථාන විඳ සැත්තෑ දහසක් තෙරුන් වහන්සේ පිරිවරා සැටදහසක් අවුරුද්දට ආසිරි ඇතිව සැටරියන් බුදුබඳින් මුළුලොව සරහා සත්වයන් අමා මහ නිවන් දක්වූ සර්වඥරාජෝත්තමයානන් වහන්සේය.

( සද්ධර්මරත්නාකරය )

**වෙස්සබු මුනිඳුදුක එක වරෙක වැන්දේ--තිස් එක කපෙක**
**දුගතිය දුක් නොවින්දේ—**

"බුද්ධෙ ධම්මෙච සඞ්ඝෙ වා කතො එකො පි අඤ්ජලී
පහොති භව දුක්ඛග්ගිං නිබ්බාපෙතුං අසෙසකං"

බුද්ධෙවා, බුදුන් කෙරෙහි හෝ; ධම්මෙව, ධර්මයෙහි හෝ; සඞ්ඝෙ වා, සඞ්ඝයා කෙරෙහි හෝ; කතො, කරණ ලද; එකොපි අඤ්ජලී, එක අඤ්ජලී කර්මයෙක්ද; භව දුක්ඛග්ගිං, භවදුක් නමැති ගිනි; අසෙසතො, නිශ්ශෙෂ කොට; නිබ්බාපෙතුං, නිවන් නට; පහොති, පොහොසති;

(සද්ධම්මොපායනය)

132. මි න් ලබමී නොසිතා කිසි උපකාර ණ
මු න් සසරින් ගොඩලම් යන සිත්කුලු ණ
පි න් පව් දෙකම නොවරදවා කීවොත් බ ණ
ඉ න් තොප විඳින සැප මෙතෙකැයි නැත පම ණ

මින්, මේ කරණකොටගෙණ; කිසි උපකරණ, යම්කිසි උපකාර ණයක්; ලබමී නොසිතා, ලබන්නෙමියි චින්තනය නොකොට; මුන්, මේ සත්වයන්; සසරින් ගොඩලම්යන, සංසාරයෙන් ගොඩ ලම් යන; කුලුණසිත්, කරුණා චිත්තයෙන්; පින්පව් දෙකම, කුසලා කුසල යන කරුණු දෙකම; නොවරදවා, වැරදවීමක් නොකොට; බණකිවොත්, ධර්මය දේශනා කළේවීනම්; ඉන්, ඒ හේතුවෙන්; තොපවිඳින, තොපවිඳිනය කරන්නාවූ; සැප, සම්පත්තිය; මෙතෙ කැයි පමණ නැත, මේ තරම්යයි ප්‍රමාණයෙක් නැත්තේය.

**පින් පව් දෙකම නොවරදවා කීවොත් බණ—ඉන් තොප විඳින සැප මෙතෙකැයි නැත පමණ—**

114 වෙනි කවෙහි ධර්මදෙශනානිසංස බලනු.

133. කලහො ත් සිල්වතුන්හට නිති වතාව ත
දු ටු ස ත් කෙනෙක් වෙති ඕහට ඉතා හි ත
නැණඇ ත් තවුන් සාදන පින් වතාව ත
මෙම හ ත් පිණෙකි දැනගනිතොත් හිතාහි ත

සිල්වතුන්හට, සීලවන්තයින්ට; නිති, නිරන්තරයෙන්; වතා වත කලහොත්, (අත්පා මෙහෙවරාදී) වතාවත් කළේවීනම්, දුටුසත් කෙනෙක්, (ඒ) දර්ශනය කළාවූ සත්වයෝ; ඕහට, (එබඳුවතාවත් කරන්නාවූ) සත්වයාට; ඉතා හිතවෙති, අතිශයින් කැමතිවන්නේය; නැණඇත්තවුන්, ඥානවන්ත සත්වයන් එසිත්; සාදන, සිද්ධකරන් නාවූ; වතාවත පින්, වතාවත පුණ්‍යය; හිතාහිත, වැඩඅවැඩ; දැන ගනිතොත්, ජානනය කරන්නේ වීනම්; මෙමහත් පිණෙකි, මේ මහත්වූ පුණ්‍යයෙකි.

**කාලෙහා සිල්වතුන්හට නිති වතාවත –**

118 වෙනි කවෙහි වතාවත්කිරීම යන්න බලනු.

“අභිවාදන සීලිස්ස නිච්චං වද්ධාපචායිනො
චත්තාරො ධම්මා වඩ්ඪන්ති ආයුවණ්ණො සුඛං බලං.”

හැම වේලෙහිම වැඩිසිටියන් පුදන සුළුවූ වැඳ යුත්තන් වඳිනා සුල්ලාහට ආයුෂ, වර්ණය, සුවය, (කායබල ඥානබල යන දෙයාකාර) බලය, යන සතර ධර්මයෝ වැඩෙත්නාහ.

**134.** පි න් කම් කරණ අය ඒ දියුණුවන ලෙ ස
මන් සන්තොසින් එහි ගුණ කියන ඇතිලෙ ස
උ න් උපනුපන් තැන පැතිරෙයි ලොව යස ස
පු න් සඳ පහන්වූමෙනි අඳහව මෙබ ස

පින්කම්කරන අය, පුණ්‍යකර්ම කරන්නාවූ සත්වයෝ; ඒ, ඒ පුණ්‍යකර්මයන්; දියුණුවනලෙස, විනුණවන පරිද්දෙන්; එහි ගුණ, එහි ගුණය; මන්සන්තොසින්, චිත්තසන්තොෂයෙන්; ඇතිලෙස, තත්වාකාරයෙන්; කියන, කියන්නෝත්; උන් උපනුපන්තැන, ඔවුන් උපනුපන් තැන්හි; යසස, කීර්තිය; පුන්සඳපහන්වූමෙනි, පූර්ණ චන්ද්‍රයා උදවූකල්හිමෙන්; ලොව පැතිරෙයි, ලෝකයෙහි පැතිරයන්නේය; මෙබස, මේ වචනය; අඳහව, අදහාගනු.

**පින්කම්කරණ අය ඒ දියුනුවන ලෙස...... උන් උපනුපන් තැන පැතිරෙයි ලොව යසස—**

“පමොද බහුලො හොති සදසබ්හි පසංසියො
පසන්නා ලූබපණ්ණාව පසංසාහි රතො නරො.”

පුණ්‍යකර්ම ප්‍රශංසායෙහි ඇළුනු පුරුෂතෙමේ උපනුපන්තැන සතුටු බොහෝ වෙයි, හැම වේලෙහිම සාධුන් විසින් ප්‍රසංසාහී වෙයි, (හැමවේලෙහිම) පහන් මුහුණු පැහැද ඇතිවේ.

(සද්ධම්මොපායනය)

**135.** ති ස ර ණ ගත් එක් මිනිසෙක් එක්කාලෙ ක
නොපැමි ණ දුගතියට ගිම කප් එක් තිසෙ ක
අ ප ම ණ සැපත් සගමොක් සිරි ලදි නිසැ ක
එ ස ර ණ නොගෙණ නොපෙ විඳිනෝ කිමමෙදු ක

එක් කෙලෙස, එක් කාලයෙක්හී; තිසරණ ගත්, රත්නත්‍රයෙහි සරණගතවූ; එක් මිනිසෙක්, එක් මනුෂ්‍යයෙක්; එක් තිසෙක කප් සිට; තිස්එක කල්පයක පටන්; දුගතිය, දුර්ගතියට; නොපැමිණ, ප්‍රාප්ත නොවී; අපමණ සග සැපත්, අප්‍රමාණවූ ස්වර්ග සම්පත් හා; මොක් සිරි, නිර්වාණශ්‍රීයද; තිසැක, නිශ්ශඞ්කව; ලදී, ලද්දේය; එසරණ නොගෙනැ, ඒ සරණය ග්‍රහණය නොකොට; යොප, නුඹලා; මෙදුක එඳිනේ කිම, මේ දුඃඛය විඳනයකරන්නේ කුමටද?

**තිසරණ** – බුද්ධ, ධම්ම, සඞ්ඝ යන රත්නත්‍රයයි.

සර්වඥයන්වහන්සේ නම් ලොවට අග්‍ර දක්ෂිණෙය්‍යවූ උත්තමයානන්වහන්සේය. උන්වහන්සේට වඩා උතුම දෙවියෙක්, බ්‍රහ්මයෙක් හෝ වෙන යම් කෙනෙක් නැත. උන්වහන්සේ තුන්ලොවට අග්‍රය ශ්‍රේෂ්ඨයයි මෙසේ උන්වහන්සේගේ බුදුගුණ සලකා යමෙක් උදීද ඕහට සරණය පිහිටයි. **සරණාගමනය ලෞකික ලොකොත්තරයයි** දෙවැදෑරුම් වේ. සෝවාන් ඵල ප්‍රාප්තවූ පුද්ගලයාගේ සරණය ලොකොත්තර වෙයි. එය නොබිඳෙයි. **ලෞකිකසරණය** මිථ්‍යාදෘෂ්ටි පිළිගැනීමෙන් හෝ සර්වඥයන්වහන්සේට වඩා උතුම් දෙවියෙක් බඹෙක් හෝ වෙන යම් කෙනෙක් ඇත කියා සිතීමෙන් බිඳෙයි. ලෞකික සරණාගමනයෙහි 1–ආත්ම සන්නියාතනය, 2–තත්පරායනය, 3–ශිෂ්‍යභාවොපගමනය, 4–ප්‍රණිපාතයයි ප්‍රභෙද සතරක් වේ.

1. **ආත්මසන්නියාතනය** නම්:-මෙවක් පටන් මාගේ ආත්මය ත්‍රිවිධ රත්නයට පුදමියි සිතා ආත්ම පරිත්‍යාගකිරීම් වශයෙන් සරණ ගැණීමයි.

2. **තත්පරායනය** නම්:-මෙවක් පටන් මම බුද්ධාදී රත්නත්‍රයට ඇතුලත් වෙමියි සිතා නියුක්තවීමෙන් ගන්නාලද සරණයයි.

3. **ශිෂ්‍යභාවොපගමනය** නම්:-අද පටන් මම බුද්ධාදිරත්නත්‍රයට ශිෂ්‍යයෙක්වෙමියි සිතා සරණ ගැණීමයි.

4. **ප්‍රණිපාතය** නම්:-අදපටන් මම බුද්ධාදිරත්නත්‍රයට නමස්කාර ගෞරවකරමියි සිතා ගන්නාලද සරණයයි.

තිසරණ සමාදන්වන උපාසක උපාසිකාදීන් විසින් මේ ක්‍රම දැන ඉගෙන තිසරණ සමාදන්විය යුතුයි.

ප්‍රණිපාත සරණාගමනය ඥාති, භය, ආචාර්ය, දක්ෂිණෙය්‍ය වශයෙන් චතුර්විධවේ: යම් ශාක්‍යයෙක් හෝ කෝලිය වංශජයෙක් හෝ "බුදුහු අප නෑයහයි" වඳීද, හේ සරණගත

නොවේ. යමෙක් ශ්‍රමණභවත් ගෞතමයන් වහන්සේ රාජපූජ්‍යය. මහානුභාවසම්පන්නය. නොවැන්දකල අනර්ථ පමුණුවයි යන භය හේතුකොට නැණ වදීද හෙතෙම සරණ ගත නොවේ. යමෙක් සර්වඥයන් වහන්සේ බොධිසත්ව අවස්ථාවෙහිදී උන්වහන්සේ කෙරෙන් ශාස්ත්‍රඋගතිම් යන සිතින් හෝ වෙළලාවට පූජ්‍යතවූ ගුරුකම් දෙන ආචාර්‍ය්‍යවරයෙක යන කල්පනා ඇතිව වදීද, ඔහුකෙරෙහි සරණය නොපිහිටති. යමෙක් උන්වහන්සේ අග්‍රදක්ෂිණෙය්‍යයයි සිතා වදීද ඔහුකෙරේ සරණ පිහිටයි. රත්නත්‍රය කෙරෙහි සැකකිරීම් අනාදරකිරීම් හේතුකොටගෙණ සරණය කිලුටුභාවයට පැමිණේ.

**ලෞකික සරණා ගමණ ඵල—**

“යෙව බුද්ධඤ්ච ධම්මඤ්ච – සඞ්ඝඤ්ච සරණං ගතො
රක්ඛන්ති තං සදාදෙවා—සබ්බදෙ වා ඵලපි වා”

බුදුන්, දහම් සඟුන් යන ත්‍රිවිධරත්නය සරණ ගියාවූ යම් පුද්ගලයෙක්වේද. හෙතෙම දෙවියන් විසින් ගොඩදිය දෙතැන් හිදීම රක්‍ෂා කරණු ලැබේ.

“යෙකෙචි බුද්ධං සරණං ගතාසෙ—නතෙ ගමිස්සන්ති අපායං
පහාය මානුසං දෙහං—දෙවකායං පරිපූරෙස්සන්ති”

බුඩ ධම් සඞ්ඝ යන ත්‍රිවිධරත්නය සරණගතවූ පුද්ගලතෙම සතර අපායගතනොව මරණින් මතු දිව්‍යලොකයෙහි උපදී.

**ලොකොත්තර සරණා ගමණ ඵල—**

“යොච බුඩං ච ධම්මං ච සඞ්ඝං ච සරණං ගතො
චත්තාරි අරිය සච්චානි—සම්මප්පඤ්ඤාය පස්සති”

යමෙක් බුදුන් දහම් සඟ යන තෙරුවන් සරණයයිද ඒ තෙම යහපත් ප්‍රඥාවෙන් දුක්ඛාදී චතුරාර්‍ය්‍ය සත්‍යයන් දකී, එම ලොකොත්තර සරණයෙහි ආනිසංසයි.

**තිසරණ ගත් එක්මිනිසෙක් එක්කාලක—අපමණ සැපත්
සගමොක් සිරි ලදි නිසැක—**

“අග්ගතො වෙ පසන්නානං අග්ගං ධම්මං විජානතං
අග්ගෙ බුද්ධෙ පසන්නානං දක්ඛිණෙය්‍යෙ අනුත්තරෙ
අග්ගෙ ධම්මෙ පසන්නානං විරාගුපසමෙ සුඛෙ
අග්ගෙ සඞ්ඝෙ පසන්නානං පුඤ්ඤක්ඛෙත්තෙ අනුත්තරෙ”

අග්ගං ධම්මං, රත්නත්‍රයාගේ උතුම් බව; විජානතං. දත්තාවූ අග්ගතො, අග්‍රභාවයෙන්; පසන්නානං, (රත්නත්‍රයෙහි) පැහැදුනාවුන්ට; වෙ, ඒකාන්තයෙන් (අග්‍රවිපාක ඇත්තේය) දක්වි

ණෙය්‍යො, දක්ෂිණාහීවූ අනුත්තරෙ, නිරුත්තරවූ; බුද්ධෙ බුදුන් කෙරෙහි; පසන්නානං, පැහැදුනාවුන්ටද; විරාගූපසමෙ, සියලු රාගය දුරුකිරීමට හා; සියලුකෙලෙස් අතිශයින් සන්සිඳුවීමටද හේතුවූ; සුඛෙ, (සසරදුක් නසන බැවින් හා සංස්කාරයන් සංසිඳුවන බැවින්) සැපවූ; අග්ගෙ, අග්‍රවූ; ධම්මෙ, ධර්මය කෙරෙහි; පසන්නානං, පැහැදුනාවුන්ටද; අනුත්තරෙ, නිරුත්තරවූ; පුඤ්ඤක්ඛෙත්තෙ, පුණ්‍යක්ෂෙත්‍රවූ; අග්ගෙ සඞ්ඝෙ, අග්‍රසඞ්ඝයා කෙරෙහි; පසන්නානං, පැහැදුනාවුන්ටද; (අග්‍රවිපාකවේ)

(අඞ්ගුත්තරනිකාය)

“එවං බුද්ධං සරන්තානං—ධම්මං සඞ්ඝඤ්ච භික්ඛවො
භයං වා ඡම්භිතත්තං වා—ලොමහංසො න හෙස්සති”

මහණෙනි! මෙසේ බුදුන් දහම් සඟුන් යන රත්නත්‍රය නිරතුරුව සිහිකරන්නාහට භයක් තැතිගැණීමක් හෝ ලොමෝද්ගමණයෙක් නොවන්නේය යනු භාවයි,

“බුද්ධෙ චිත්තප්පසාදෙන—ධම්මෙ සඞ්ඝෙ ච යොනරො
කප්පානි සතසහස්සානි—දුග්ගතිං සො න ගච්ඡති”

යම් මනුෂ්‍යයෙක් බුදුන් දහම් සඟුන් යන තුනුරුවනෙහි සිතපහදද ඒ හේතුවෙන් හෙතෙම කප්ලක්ෂය කිනුදු දුගතියකට නොපැමිණෙයි.

136. අ නු ව ණ කමින් සිහි නොකරණු මිස සත ත
අ ස ර ණ නොපට පිළිසරණක්මය නිය ත
බු දු ගු ණ සිතින් එකගව සිහිකරත හො ත
අ ප ම ණ සැපත් සිදුවෙසි සැක නොකර සි ත

අනුවන කමින්, අඥානකමින්; සතත, නිරන්තරයෙන්; සිහි නොකරණුමිස, සමරණය නොකරණවාවිනා; බුදුගුණ, බුද්ධ ගුණය; අසරණ නොපට, ප්‍රතිෂ්ඨාවක් නැත්තාවූ නුඹලාට; නියත පිළිසරණක්මය, නිශ්චය වූ ප්‍රතිෂ්ඨාවෙක්මය; එකගව සිතින්, ඒකාග්‍රවූ චිත්තයෙන්; සිහිකරතහොත, (ඒ බුදුගුණ) මෙනෙහි කරන්නේව් නම්; අපමණ සැපත්, අප්‍රමාණවූ සම්පත්තිය; සිදුවෙයි, සිද්ධවන්නේය; සිත සැකනොකර, චිත්ත සඞ්කාවක් නොකරව.

137. ලො ව ට  උතුම් මුනි රජුගේ ගුණ විපු  ල
සි ත ට  රැගෙණ සිහිකල නුවණින් නිම  ල
ස ත ට  නොවෙසී කලෙකත් බවදුක් අස  ල
තො ප ට  මෙසින් වේවා වැඩ සුබ මඟු  ල

ලොවට උතුම්, ලොකොත්තමවූ; මුනි රජුගේ, සර්වඥරාජයාණන්වහන්සේගේ; විපුලගුණ, මහත්වූ ගුණයන්; සිතට රැගෙණ චිත්තග්‍රහණයකොට; නිමල නුවණින්, නිර්මල ඥානයෙන්; සිහිකල සතට, මෙනෙහිකල සත්වයාට; බව දුක්, සංසාර දුඃඛය; කලෙකත්, කාලයකදීවත්; අසල නොවෙසී, සමීප නොවෙයි; තොපට, යුෂ්මතුන්ට; මෙසින්, මේ හේතුකොට ගෙණ; සුබ, ශුභවූ; වැඩ, අභිවෘද්ධි සඞ්ඛ්‍යාතවූ; මඟුල වේවා, මඞ්ගලයක් සිද්ධවේවා.

138. නොද  නෙනුවන්හට පව් පින් නියමකො  ට
බ ද  ලෝවැඩ සඟරා පිණෙනි හැමවි  ට
ල ද  සැපතින් නොරනොව ලැබ නිති පිහි  ට
වැ ද  සව්සත සැන සෙත්වා මොක්පුර  ට

නොදනෙනුවින්හට, නොදන්නා වුන්ට; පව් පින්, පාප පුණ්‍යයන්; නියමකොට, නිශ්චයකොට; බඳ, බන්ධනයකරණ ලද්දාවූ; ලෝවැඩසඟරා පිණෙනි, ලොකාර්ථසඞ්ග්‍රහ පුණ්‍යයෙන්; හැමවිට, සදාකල්හි; ලද සැපතින්, ලද්දාවූ සම්පත්තියෙන්; නොරනොව, ඌන නොවී; නිති, නිරන්තරයෙන්; පිහිට ලැබ, ප්‍රතිෂ්ඨා ලබා; සව්සත, සකල සත්වයෝ; මොක්පුරට වැද, මොක්ෂපුරයට ( නිර්වාණයට ) ප්‍රවිෂ්ඨව; සැනසෙත්වා, ශාන්තවෙත්වා හෙවත් නිර්භයවෙත්වා.

139. වි ද  ගම වෙහෙරෙහි මෙත් තෙරිඳුස  ද
සා ද  රණිව පැවසූ මෙත් සිතින් න  ද
බා ද  නොවී මොක් දැකුමට බැඳි මෙප  ද
පා ද  සතුන් සිත පවතිවා නිබ  ද

විදගම වෙහෙරෙහි, විදගම විහාරයෙහි; මෙත් තෙරිඳුසද, මෛත්‍රෙය ස්ථවිරෙන්ද්‍රනාමයාණන් විසින්; මෙත් සිතින්, මෛත්‍රී චිත්තයෙන්; සාදරණිව, සාධාරණ ලෙසින්; පැවසූ, ප්‍රකාශකළාවූ; බාදනොවී, බාධාවක් නැතිව; මොක් දැකුමට, නිවන් දැකීම පිණිස; බැඳි, බන්ධනයකළාවූ; නද, නන්දනීයවූ; මෙපද, මේ පද්‍යය; සතුන් සිත, සත්වයන්ගේ චිත්තය; පාද, ප්‍රසන්නකොට; නිබද පවතීවා, නිරන්තරයෙන් ප්‍රවෘත්තවේවා,

විදගම වෙහෙරෙහි මෙත් තෙරිඳුසඳ—

“පසත් ලක්දිව් සඳ-මුවඟබලමෙන් හොබනා
පලරම් අරම් සිරිපිරි-වීදගම් වෙහෙර රැඳි
පසක් තුන්ලෝසිදු-ඉඳු බුදුරදුන් වදහල
තෙවලා සයුර කුඹුයොත්-සිරිණි ගත්නිය අත්ලෙන්
නොයෙක් කව් නළුසඳ-වියරණ ලකර ලකරින්
වියතුන් සැරූ මෙත් මහ-නෙත් පාමුල මහ තෙරිඳු”

( කාව්‍යලක්ෂණමණිමාලාව )

“දි න  දි න  නොඅඩු දින පුද පැවති මනහ  ර
ද න  ම න  රඳන සැදි ගෙළුයන් සිරිත්ස  ර
වැජ  බෙන  පසිදු මහ රයිගම්පුර අතු  ර
බ බ  ල  න  සොඳුරු වීදගම මහ වෙහෙ  ර
කි  ත්  යස කොත්  දස දික් දිගුයටග බ  ද
මෙත්  මහ නෙත් පාමුල මහ තෙරිඳු ස  ද”

( බුදුගුණ අලඞ්කාරය )

## සිඞ්රස්තු.

නි කා ස ල  මුනි සසුන මුළුලොව පල  වේ වා
ගු ඳු බ ල  මොළ කුදිමු ගනඳුරු දුරු  වේ වා
ම න කා ල  මෙ විසකාන දුහුනට වැඩ  වේ වා
මෙතු ස ල  බලය නිවණට මට සිත  වේ වා!

# විස්තර විභාග පිළිබඳ

# අකාරාදිය.

—×—


| | පිට |
|---|---|
| **අ** | |
| අකනිට්ඨය. | 210 |
| අකාලික ගුණය. | 185 |
| අකුසලකර්ම | 13 |
| අකුසල චෛතසිකයෝ | 24 |
| අකුසල්සිත් | 28 |
| අඞ්ගමඞ්ගානු සාරීවාතය. | 16 |
| අඤ්ජලිකරණීය ගුණය. | 187 |
| අඤ්ඤසමාන චෛතසිකයෝ | 25 |
| අටමහනිරය | 118 |
| අටමහ නිරය ඔසුපත් සහ එක්සිය සතිසෙක් වද | 120 |
| අටලොස් අහෙතුක චිත්තයෝ | 28 |
| අටලොස් නිෂ්පන්න රූප | 20 |
| අට විසි රූප | 20 |
| අටුවා | 11 |
| අත්වැඩ පරවැඩසමව සිතන්නේ | 64 |
| අතප්පය | 209 |
| අමොහය | 25 |
| අද අද එසිමරූ පින්කර ගන්නේ කෙලෙසද සෙට මරූ තේති සිතන්නේ | 58 |
| අදත්තා දානය | 99 |
| අදත්තා දානයෙහි ආදීනව | 99 |
| අදමින් ජීවත් වෙනවා විතරට—දහැමින් මිය යනු සොඳමයි දනහට | 68 |
| අඳ ගොළු බිහිරිව...මඳ පිනැතුත් නොපිරෙයි | 42 |
| අඳුරෙන් අඳුරට යන්නෝ | 84 |
| අඳුරෙන් පාහාව යන්නෝ | 84 |

| | පිට |
|---|---|
| අධම්දන | 143 |
| අධර්ම ජීවිකාව | 68 |
| අධිච්ච සමුප්පන්නවාද | 113 |
| අධිමොක්ඛ | 25 |
| අධොගම වාතය | 16 |
| අන්සතු සැපතක්දුක දල ලොබිනේ—උන් : නො වී මට වේවයි සිතිනේ | 110 |
| අනන්තානන්තික දෘෂ්ටි | 113 |
| අනන්තඃ කල්පය | 61 |
| අනිත්‍යතා රූපය | 20 |
| අනිෂ්පන්නරූප | 19 |
| අනුත්තර ගුණය | 189 |
| අනුත්තර පුණ්‍ය ක්ෂෙත්‍ර ගුණය | 188 |
| අනුරුද්ධ තෙරුන් | 191 |
| අනුලොමඥානය | 206 |
| අනොත්තප්පය | 27 |
| අප්පමාණාභය | 208 |
| අප්පමාණ සුභය | 209 |
| අපර පර්‍ය්‍යාය වෙදනීය කර්ම | 13 |
| අපා | 54 |
| අපිහිත ද්වාරයන් ඇතිබව | 169 |
| අප්‍රමාණ්‍ය චෛතසිකයෝ | 26 |
| අප්‍රමාණ්‍යයෝ | 204 |
| අභිධ්‍යාව | 110 |
| අභිධ්‍යාවෙහි ආදීනව | 111 |
| අමරා වික්ෂෙපවාද | 113 |
| අභීත් ගුණය | [illegible] |
| අරූප ජීවිතෙන්ද්‍රිය | [illegible] |
| අරූප භව | 29 |

| | පිට |
|---|---|
| අරූපා වචර කුසල කර්ම | 14 |
| අරූපා වචර සිත් | 29 |
| අලාභය | 25 |
| අවකාශ රූපය | 19 |
| අවිහය | 209 |
| අවීචිය | 120 |
| අසත් පුරුෂ දාන | 145 |
| අසංඛ්‍ය කල්පය | 61 |
| අසඤ්ඤ සත්තය | 209 |
| අසඥතලය | 43 |
| අසඤ්ඤි වාද | 114 |
| අෂ්ට දුෂ්ටාක්ෂණ | 34 |
| අෂ්ට විද්‍යාවෝ | 176 |
| අෂ්ටාඞ්ග උපෝසථ ශීලය | 150 |
| අෂ්ටාඞ්ග ශීලයෙහි ශික්ෂාපද | 151 |
| අෂ්ටාඞ්ග ශීලානිශංස | 157 |
| අෂ්ටා දශවිද්‍යා | 90 |
| අසූතව විධ විපාකයෝ | 27 |
| අසුන්‍ය කල්පය | 63 |
| අසුභ භාවනාව | 211 |
| අසුර නිකාය | 54 |
| අහිරිකය | 27 |
| අහෝසි කර්ම | 13 |
| **ආ** | |
| ආකාසානඤ්චායතනය | 42 |
| ආකිඤ්චඤ්ඤායතනය | 43 |
| ආජීව පාරිශුද්ධි සීලය | 155 |
| ආජීවාෂ්ටමක සීලය | 150 |
| ආනවස නානිසංසිතනය | 223 |
| ආදීනවානුදර්ශනඥානය | 205 |
| ආපෝ ධාතු රූපය | 15 |
| ආබාද දුක් විඳුවන උපනු පත් තැන | 137 |
| ආභස්සරය | 208 |
| ආමිසානුප්‍රදානය | 169 |
| ආරූප්‍යයෝ | 204 |

| | පිට |
|---|---|
| ආශ්වාස ප්‍රාශ්වාසවාතය | 16 |
| ආශ්‍රව ක්ෂයකර ඥානය | 177 |
| ආහාර පූජාව | 167 |
| ආහාර රූපය | 19 |
| ආහුණෙය්‍ය ගුණය | 187 |
| **ඇ** | |
| ඇතුලට වැදගෙන ඇවිළෙන ගින්නෙන්—පිටතට හළබඩුමය වැඩවන්නේ | 146 |
| ඇම පමණින් පැවසුමුනි දූත තතු | 8 |
| **ඉ** | |
| ඉදිතොත් බෝකල්ජරයෙන් එසිරේ—නැතහොත් වැදයයි මරුමුව කුහරේ | 86 |
| ඉන්දකදිව්‍යපුත්‍රයාගේකථාව | 197 |
| ඉන්ද්‍රිය සංවර ශීලය | 154 |
| ඉසගිනි ගත්තොතු එගිණි නිවන ලෙස | 52 |
| ඉස්සා | 27 |
| **උ** | |
| උච්ඡේද වාද | 114 |
| උඩුසුලඟට අල්වාගෙනය ත්තේ...තණසුළ නො දූම් නම් අත දන්නේ | 70 |
| උත්තමදාන | 143 |
| උදයව්‍යයඥානය | 204 |
| උද්ධගම වාතය | 16 |
| උද්ධච්චය | 27 |
| උත්සිතුවා සිදුනොම වෙයි සිතුලෙසට | 137 |
| උපක්ලේශධර්ම | 156 |
| උපඝාතක කර්ම | 12 |
| උපචය රූපය | 20 |
| උපනත් පේතව පින් නොකලැකි බැසී | 37 |
| උපපද්‍යවේද්‍ය කර්ම | 13 |

පිට

උපපීඩක කර්‍ම 12
උපඝාතක කර්‍ම 11
උපාදරූප 17
උපෙක්ෂාවේදනා 21
උපෝසථශීලය 150
උරසක් මාලාමේ-උරචක්‍ර මාලාව 106

ඍ

ඍජුප්‍රතිපන්නගුණය 186
ඍද්ධිවිකුර්‍වණඥාණය 177

එ

එකමසතෙකු තම මව්මළ දූකටා ..මෙගැම මුහුදුදිය අඩුවන කලටා 69
එකම ව්‍යවස්ථා 204
එකම සංඥ 204
එසිතට මෙගණ ලොබනොව දත්දෙන්නේ-තමහට එම්ද මතුපලදෙන්නේ 147
එකග්‍රතා 24
එකච්චශාස්වතදෘෂ්ටි 113
එහිපස්සික ගුණය 185

ඔ

ඔත්තප්පය 25
ඔසුපත්තිර 121
ඔකාශලොක 179
ඔජශකතිය 19
ඔපනයිකගුණය 185

ක

කසිනදත 144
කඳපිළිවෙල 14
කඳපිළිවෙලදෙස් 30
කඳුළු 69
කත්නත් මෙත්විය අඹපල පිස්සේ 52
කජ 60

පිට

කර්මපල 11
කර්මරසදෙස 73
කර්‍මක්ෂයකර ඥාන 177
කර්‍මජරූපය 19
කරණ කලට පව් මිරියම්සේ විදිනකලට දුක් දැඩිය ගිනිසේ 67
කරුණා 26
කලකිනි බුදුකෙනෙකුන් උපදින්නේ දුකකිනිමිනි සත් බව ලැබගන්නේ 47
කලහොත් සිල්වතුන් හට නිහින්තා වත 222

කා

කාමභව 28
කාමමිථ්‍යාචාරය 101
කාමමිථ්‍යාචාරයෙහි ආදීනව 102
කාමාවචර කුසල කර්‍ම 14
කාමාවචරසිත් 28
කාමාවචර සොභන චිත්තයෝ 28
කාලකාඤ්ජා 54
කාලදත 144
කාලසූත්‍රය 118
කායකම්මඤ්ඤතා 25
කායකම්මඤ්ඤතාරූපය 20
කායපස්සද්ධි 25
කායපාගුඤ්ඤතා 26
කායප්‍රසාදය 17
කායමුදුතා 25
කායමුදුතාරූපය 19
කායලහුතා 25
කායලහුතා රූපය 19
කායුජ්ජුකතා 26
කායවිඥප්තිය 19

කි

කිම්පල 52
කිවත් සැබෑ නොගනිති මිනුගේ බස් යමෙකි 136

පිට

කු

කුක්කුච්චය 27
කුච්ඡිසයවාතය 16
කුසල් සිත් 28
කුසල් විරිය 55

කෘ

කෘතත්වාත් කර්ම 13

කෙ

කෙලිප්‍රියටකඩක් සහවාසහළ
වෙසුණගගේ විලිවැස්මක්
නොලද්දියදෙවිවූවත්අහෝ 124
කෙලෙසුන් කෙරෙන් 202
කෙලෙසුන් කෙරෙන්
තොරකර සිතුතනාමය
...භාවනාමය 207

කේ

කේලාම් 106
කේලාම් කීමෙහි ආදීනව 107
කේවලශාස්වත දෘෂ්ටි 113

කො

කොට්ඨාසය වාතය 16
කොතන උනත් නැත
මරුහට බාධ 57

ක්‍රි

ක්‍රියාසිත් 28

ක්ෂ

ක්ෂණිකමරණ 30
ක්ෂෙත්‍රශුද්ධිය 143

ඛු

ඛුප්පිපාසික 37

ග

ගඟ යන ඇත්කුණ ඉඳ මස්
රසවා...වැනසුන මෙන්
කාපුවා 87
ගන්ධසංඥාව 22
ගන්ධාලම්බනය 18

ගි

ගිලානොපස්ථානය 171

ගු

ගුණ ඇත්තන් ගුණ කීම
නොව් සැක ..නුවණැත්
තන් පින්කරණඋපායක 172
ගුරුවර උපස්ථානය 171

ගෝ

ගෝචර රූප 18

ඝ්‍රා

ඝ්‍රාණප්‍රසාද රූපය 17

ච

චක්‍රවර්තිරජුගේ සප්තවිධ
රත්නයෝ 41
චක්ෂුප්‍රසාද රූපය 17
චතුපාරිශුද්ධි ශීලය 164
චතුර්විධ කර්මකෙලශයෝ 105
චරණධර්ම 177

චා

චාතුර්මහා රාජික දිව්‍ය
ලෝකය 214

චි

චිත්තකම්මඤ්ඤතා 26
චිත්තපස්සද්ධි 25
චිත්තපාගුඤ්ඤතා 26
චිත්තමුදුතා 25
චිත්තලහුතා 25
චිත්තශුද්ධිය 143
චිත්තුජ්ජුකතා 26

චෙ

චෙතනා 24
චේතනාපරිශුද්ධ 177

චෛ

චෛතසිකයෝදෙපණය 24

ඡ

ඡන්දය 25

පිට

ජ
ජනකකර්ම 11
ජරතාරූපය 20
ජරමෙත් 82

ජි
ජිව්හාප්‍රසාද රූපය 17

ජී
ජීවිතෙන්ද්‍රිය 19

ටී
ටීකා 11

ත
තත්‍රමජ්ඣත්තතා 25
තදාපරායනය 223
තම තම නැණ පමණින් දූනගත සූත්‍ර 4
තමලත් බතිත් දුන්නේ එකම සැන්දක ..බිල වත්එයින් සුරපතිවිය ඉන්දක 197
තව උපදිප්නට බැරි මෙම් තිස් කුස 47

තා
තාපය 119
තාවතිංශ දිව්‍යලොකය 214

තැ
තැතකින් ගෙණ දූමුවත් කැට නුබකුස.. සතර අපාමිස 53
තැනුවානම් තම සිත තැනුවාමය 93

ති
තිත් 2
තිත්ගණඳුරු දුරලනදිනි දණත් 2
තිරිසන් 36
තිරිසන් ජාතිය උපනත් පව්කොට ..සලසන්නේ කෙලෙසද සිතුපිණකට 36
තිසරණ 223
තිසරණගත් එක්මිනිසෙක් එක්කාලක ..අප්‍රමණ සැපත් සගමොක් සිරි ලදි නිසැක 224

තු
තුණුරුවන් 173
තුණුරුවනේ ගුණ 174
තුණුරුවනේ ගුණ සිහික ල සතුනේ නැතවිදිනේ දුක් සසරෙහි ඉන්නේ 188
තුදුස් අකුසල චෛතසිකයෝ 27
තුන්දෙර 67
තුන්සිත 141
තුසිත දිව්‍යලොකය 214

තෙ
තෙසියක් තෙප්මුව වැද සිදුරුවගත . අබැවක්හා සිරිතොනවමෙදනිමවත 122
තේජො ධාතු රූපය 15

ත්‍රි
ත්‍රිවිධශුද්ධිය 142

ථි
ථිනය 27

ද
දක්ඛිණෙය්‍ය ගුණය 187
දන්දෙන චුන්ගේ ප්‍රභෙද 142
දන්දෙන සදෙහිදෙවිකම් මෙමෙහෙරපින් ලැබගනිය වැඩිතරම්න් එසිටුහාව 215
දන් පින්පල 199
දවසක්විතර සිල්රැකි කුලගනක්පෙරා...සක් දෙවිඳු ලග සිරිවිදි නිරන්තරා 200
දශශිලය 153
දසඅකුසල් 94
දස අනිෂ්පන්නරූප 20
දසඅනුසමෘති 203

| | පිට |
|---|---|
| දශඅසුභයෝ | 203 |
| දශකසිණයෝ | 203 |
| දශදාන වස්තු | 142 |
| **දා** | |
| දානදශ | 142 |
| දානානිසංස | 145 |
| දානපති | 142 |
| දානය | 142 |
| දානයාගේ ප්‍රභේද | 143 |
| දානසභාය | 142 |
| **දූ** | |
| දූෂීලොභය | 110 |
| **දි** | |
| දිට්ඨිය | 27 |
| දිනිඳුණත් | 2 |
| දිනුවා නම් පරලොව දිනුවාමය | 93 |
| දිව්‍යශ්‍රොත්‍රඥානය | 177 |
| දිව්‍යචක්ෂුරභිඥානය | 177 |
| **දු** | |
| දුක්පත් සතෙක් දිය බෙර ලිය මලක්පිදී | 219 |
| දුකම්ස කයකෑයි යන බස නොයෙදේ | 85 |
| දුගතිය | 47 |
| දුර්භික්ෂාන්තර කල්පය | 61 |
| දුඃඛවේදනා | 21 |
| **දෘ** | |
| දෘෂ්ටධර්ම නිර්වාණවාද | 114 |
| දෘෂ්ටධර්ම වේද්‍යකර්ම | 13 |
| **දෙ** | |
| දෙතිස් කුණුවෙත් | 77 |
| දෙතිස්වධ | 71 |
| දෙනවාටත් වැඩි පින් බුත්සරණය | 189 |
| දෙපණස් චෛතසිකයෝ | 24 |
| දෙලොවට වැඩනැති බස් අකුසලකි | 109 |

| | පිට |
|---|---|
| දෙව්ලෝසය | 214 |
| දෙව්රම් වෙහෙර | 217 |
| දෙසැටක් සමයම් | 113 |
| දෙසැටක් සමයම් පරිකොට ගත්සිත මිසදිටු නම්වෙයි | 115 |
| **දො** | |
| දොළොස් අකුසල චිත්තයෝ | 28 |
| **ද්වේ** | |
| ද්වේෂය | 27 |
| **ධ** | |
| ධනුශිල්පය | 56 |
| ධර්මදේශනා කිරීම | 162 |
| ධර්මදේශනානිසංස | 162 |
| ධර්මශ්‍රවණයෙහි ආනිසංස | 164 |
| ධර්මසංඥාව | 22 |
| ධර්මානුස්මෘති භාවනාව | 184 |
| **න** | |
| නරදම් සැරි | 11 |
| නසනොත් සිතලොබ අනුවණ දෙසමය | 92 |
| **නි** | |
| නිෂ්කාම තෘෂ්ණික | 37 |
| නිබ්බිදානුපස්සනා ඥානය | 205 |
| නිර්මාණරතී දිව්‍යලෝකය | 214 |
| නිරයේ | 35 |
| නිරයේ...පිණකට නැත අවසරයේ | 35 |
| නිරර්ථක තෙපුල් | 109 |
| නිවණ | 31 |
| නිවණට සපැමිණි | 31 |
| නිවණට සපැමිණි සඟසැට නමකි | 31 |
| නිෂ්පන්නරූප | 19 |
| **නු** | |
| නුදුනමැනවි කුත්දෙර අවකාශේ | 67 |
| **නෛ** | |
| නෛවසංඥානාසංඥාවාද | 114 |

| | පිට |
|---|---|
| **නො** | |
| නොකල් අවෙසි පින්කම් කළ නොහැකි | 34 |
| නොතිරබවට විදුලිය උපමායේ | 54 |
| නොනැවති අයෙක් පෙර පරදර පව් කැමිති ...ලෝකුඹුනිරයේ පැසෙති | 127 |
| නොපමායේ | 55 |
| නොයෙක්රොග අවනෙණ ගතවෙයි ඇරිවු උදක් නුවණ නැතිවෙයි සිතවෙයි කිළුටු | 137 |
| **න්‍යා** | |
| න්‍යායප්‍රතිපන්නගුණය | 186 |
| **ප** | |
| පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි ගුණය | 185 |
| පසකඳු | 26 |
| පටිජාගරණ උපොසථය | 153 |
| පටිසඞ්ඛානුපස්සනා ඥානය | 205 |
| පඨවීධාතු රූපය | 15 |
| පණනම් තණඅග පිණිබිඳු වැන්නේ | 74 |
| පත්වූ එබුදුන්ගෙන් යුත් මෙකලකි | 63 |
| පරදත්තූපජීව | 37 |
| පරනිර්මිත වසවර්තී දිව්‍යලොකය | 215 |
| පරපණ නැසුවොත් කවර උපායේ අපමණ දුක් දෙසී සතර අපායේ | 96 |
| පරසන්තක දෙය ගත සොරකමකින්... නිරයෙන් නිරයට පැමිණෙයි එතෙකින් | 99 |
| පරිච්ඡේද රූපය | 19 |
| පරිත්තසුභය | 208 |
| පරිත්තාභය | 208 |
| පරුෂ වචනය | 108 |
| පරුෂ වචනයෙහි ආදීනව | 108 |
| පරුෂතෙපුල් බිණුවා නම් මහ දොස | 108 |
| පස්කම්රස | 65 |
| පස්පව් | 50 |
| පස්පව්කොට මෙතනත් ලැබ සෝකය | 50 |
| පස්පව්කොට මෙතනත් ලැබ සෝකය...ගොස් නිරයේ දුක්විඳිනි අනේකය | 50 |
| පස්විසි මහබිය | 66 |
| පසලොස් වරණධම් | 177 |
| පහන් පූජාව | 167 |
| පහන් පූජාකරන්නවුන් විසින් සැලකියයුතු කරුණු | 167 |
| පහතින් අඳුරට යන්නෝ | 84 |
| පහතින් පහනට යන්නෝ | 85 |
| පංචශීලය | 149 |
| පංචශීලානිසංස | 157 |
| **පා** | |
| පාතෙන් අඳුරට ගෙනයයි කරුමය | 83 |
| පාංශුපිසාච | 37 |
| පාහුණෙය්‍යගුණය | 187 |
| **පි** | |
| පිටසක්වල .....කුසලක් නොකළැකි බල | 40 |
| පිණුත්කල නිති කැටුවයෙයි ගියතැනෙත්දීසැපවිඳින්නේ | 78 |
| පිණකින් උතුම් පිණනම් භාවනාවය | 210 |
| පින්කම්කරණ අයඑදිසුණු වතලෙස . උන්උපනුපන් තැනපැහිරෙසිලොවයසස | 222 |
| පින් | 140 |
| පිංදීම | 161 |

| | පිට |
|---|---|
| පින්දීමේ ආනිසංස | 161 |
| පින් මිස නැසන්වන පිහිටක් නැත | 189 |
| පින්පව්දෙකම නොවරදවා කිවොත්බණ... ඉන් තොප විඳින සැපමෙතෙ කැයි නැත පමණ | 221 |
| පිසුනාවාච | 106 |
| පිසුණුකියා සඟදෙනමක් පෙළනස්කොට......නව පේතව විඳි ගැහැට | 130 |
| පිළිවෙත්සරු | 9 |
| **පී** | |
| පීතිය | 25 |
| **පු** | |
| පුණ්‍යානුමෝදනාව | 216 |
| පුණ්‍යානුමෝදනාවෙහි ආනිසංස | 216 |
| පුණ්‍යවස්තු දෙළස | 140 |
| පුරමින් මෙසියලුපින්කම් නිබඳේ ...කෙලෙසුන් මුල් නොතබාසිතපසඳේ | 190 |
| පුරිස දම්ම සාරථි ගුණය | 181 |
| පුරුෂ භාවය | 18 |
| **පූ** | |
| පූජාකිරීම | 166 |
| පූර්වේනිවාසානුස්මෘති ඥානය | 177 |
| **පෙ** | |
| පෙර අඟනෙක් එක් එලු දෙනක හිස සිඳ .... හිස් කැපුම් ලද | 123 |
| පෙර එක් සෙතක් සඟ ගණහට බැන නපුරු ......නව පේතව සිට කුරිරු | 134 |
| පෙළදම් | 11 |
| **පේ** | |
| පේතව | 37 |

| | පිට |
|---|---|
| **ප්‍ර** | |
| ප්‍රකීර්ණක චෛතසිකයෝ | 24 |
| ප්‍රණිපාතය | 223 |
| ප්‍රතාපය | 119 |
| ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය | 155 |
| ප්‍රසාදරූප | 17 |
| **ප්‍රා** | |
| ප්‍රාණඝාතය | 96 |
| ප්‍රාණඝාතයෙහි ආදීනව | 97 |
| ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය | 154 |
| **ඵ** | |
| ඵස්ස | 24 |
| **බ** | |
| බණ ඇසීම | 163 |
| බණ කීම | 162 |
| බණදත් නත්හට වැද අත් ඔසවා පදයෙන් පදයට අදරින් අසවා | 163 |
| බඹලොව | 207 |
| බඹ සිරසෙහි පා පිසිනා | 4 |
| බලකොටුවත්තර මෙසසර නුවරේ | 44 |
| බව සසුරෙන් | 59 |
| **බි** | |
| බිඳුවන බස් වැඩනැති කෝලාමේ | 106 |
| බිමඉඳසිටකීබණ නාසත් තේ......එමහිවළඬඉඳ සිට නාසත්තේ | 33 |
| බිම සත් ගව් වැඩෙනතුරු | 134 |
| **බු** | |
| බුද්ධානුස්මෘති භාවනාව | 174 |
| බුදු කෙනෙකුන් | 45 |
| බුදුකෙනෙකුන්මේලොව නූපන්වර... සිදුනොක ළැකී ඉන් සඟමොක් සිරියර | 46 |

පිට

බුදුන්දෙසනබණ මීහි රෙත්ම සිතතැනී ...පසන්වලත් මැණි යෙක්...සුරසිරිලදීය 217

බ්‍ර

බ්‍රහමචරිය පඤ්චමකශීලය 150
බ්‍රහ්මපාරිසජ්ජය 208
බ්‍රහ්මපුරොහිතය 208

භ

භංගානුදර්ශන ඥානය 204
භගවත්ගුණය 184
භද්‍රකල්පය 63
භයතුපට්ඨාණඥානය 204

භා

භාවනාව 203-210
භාවනානිසංස 210
භාවරූප 18

භූ

භූත රූපයෝ 1

ම

මඞ්ගලචක්‍රවාල (මඟුල්සක්වළ) 40
මච්ඡරිය 27
මණ්ඩකල්පය 63
මද්‍යපානය 138
මධ්‍යමඥාන 143
මනසිකාර 24
මනුෂ්‍යත්වය දුර්ලභ පරිදි 47
මනොමයඍද්ධි 177
මරණ 80
මරණානුස්මෘතිය 212
මල්පූජාකිරීම 166
මල්පූජාකරන්නවුන්විසින් සැලකියයුතු කරුණු 166
මව්පිය උපස්ථානය 170
මහගුණමුහුදණන් 1
මහ සඟගණ 9
මහා කල්පය 62

පිට

මහාබ්‍රහ්මයා 208
මහා රෞරවය 119

මා

මානය 27
මානෙත් 83
මාර්ගඥාන 177

මි

මිද්ධය 27
මිථ්‍යාදෘෂ්ටිය 115
මිථ්‍යාදෘෂ්ටියෙහි ආදීනව 115
මිසදිටුවන් අයවත් පින් නොපිරේ 44

මු

මුඤ්චිතුකාමතාඥාණය 205
මුදිතා 26
මුනිඳුණන් 2
මුනිඳුටපුදකළබත් මල්සාමෙන් 166
මුනිඳුන්ගේරූපතකිකප්‍රකල සිඳගසක්නුත්නොලදුක් 63
මුනිඳුන්බණපදකරවා පුහුණු . දෙසමින් දනහට වඩවා කුළුණු 162
මුනි බණ ඇත සුමිගිරි 66
මුලැසටුවන්දළලන පව්පළුරේ 44
මුසවාබස්කීවාඑකමුරයේ පැසවාමිස නාරී ගොර නිරයේ 104
මුසාවාදය 104
මුසාවාදයෙහි ආදීනව 104

මෙ

මෙත් බාවන 159
මෙම හැමදෙන බලවයි දුක්වියයුතු 4
මෙරගිරඹුදුනෙත්හුණු මෙත්නොරැඳිපරනෙ රනැතිදුක්සයුරේ කිම්දී 117

| | පිට |
|---|---|
| මෙසසර දුක්රැක විස පලගත් අතු | 96 |
| මෙසසර බිළිඳෙය් | 81 |
| මෙලෙසින් පින් නොකළැකි කල් අපේකි | 46 |
| **මේ** | |
| මේදසඅකුසලිඳුනකාක් කලහොත් ...නිරයට යෙත් | 117 |
| **මෙ** | |
| මෛත්‍රීභාවනාවෙහි අනුසස් | 159 |
| මෛත්‍රීයෙන් යුක්තවූ කාය කර්මය | 169 |
| මෛත්‍රීයෙන් යුක්තවූ වාක් කර්මය | 169 |
| මෛත්‍රීයෙන්යුක්තවූ මනො කර්මය | 169 |
| **මො** | |
| මොක් | 32 |
| මොහොතක් | 122 |
| මොහය | 27 |
| **ය** | |
| යත්බහුලකම් | 12 |
| යද්නරුක කම් | 12 |
| යදසනාන කම් | 12 |
| යමරජු | 75 |
| යහපත්කල් මේකල්මිස වෙනහැති | 58 |
| **යා** | |
| යාම දිව්‍යලොකය | 214 |
| **ර** | |
| රසසංඥව | 22 |
| රසාලම්බනය | 18 |
| **රි** | |
| රිසිනුදනහවකරවාදේයා නස්වයි යනසිතවැනා දේයා | 111 |
| **රූ** | |
| රූපභව | 29 |
| රූපස්කන්ධය | 15 |
| රූපසංඥව | 22 |
| රූපාලම්බනය | 18 |
| රූපාවචර කුසල කර්ම | 14 |
| රූපාවචර සිත් | 29 |
| **රො** | |
| රොගාන්තඃකල්පය | 61 |
| **රෞ** | |
| රෞරවය | 119 |
| **ල** | |
| ලක්ෂණ රූපය | 20 |
| ලඝුකොටතොසිතව්පව්ප රදුරය...නිරයට ඇදගෙන යන එම පාරය | 101 |
| **ලැ** | |
| ලැදිවරජෙක් බොරුබස් කිව්ගසකයා පොළොව පලාගෙණගොස් වැටුනි නරකයා | 129 |
| **ලො** | |
| ලොබේසිතින් පව්කළ හැම සතවා සබේ කිය්නි ගෙණ ගොස් යමරජුවා | 75 |
| **ලෝ** | |
| ලොකවිදූ ගුණය | 179 |
| ලෝකුඹු නිරයේ පැසෙති | 128 |
| ලොකොත්තර සිත් | 29 |
| ලොකොත්තර සරණා ගමණ ඵල | 224 |
| ලොහය | 27 |
| ලෞකික සරණාගමණඵල | 224 |
| **ව** | |
| වතාවත්කිරීම | 168 |
| වතාවත්කිරීමේ ආනිසංස | 172 |
| වරකල්පය | 63 |
| වසතු ශුද්ධිය | 143 |
| වස නොත්සැදූහැත්තන් ඇති දෙසමය | 92 |
| වල්රකිනා සෙමමරකු මෙන් රකිතේ | 155 |

| | පිට |
|---|---|
| **වා** | |
| වාග්විඥප්තිය | 19 |
| වායොධාතුරූපය | 16 |
| **වැ** | |
| වැනුවානම් බුදුගුණ වැනුවාමය | 92 |
| **වි** | |
| විකාර රූප | 20 |
| විකාලභොජනාජටඨමක ශීලය | 150 |
| විචාර | 25 |
| විචිකිච්ඡා | 27 |
| විජ්ජාචරණසම්පන්න ගුණය | 176 |
| විඥප්තිරූප | 19 |
| විඤ්ඤාණස්කන්ධය | 27 |
| විඤ්ඤාණඤ්චායතනය | 43 |
| විතක්ක | 25 |
| විදර්ශන ඥාන | 177 |
| විදර්ශනා භාවනා | 204 |
| විදිනමෙසැප ජරයෙන්තැ ලිතැලිඹෙය් . දකින තැටුම් වැනි විදුලිය එළියේ | 82 |
| විදිනව දුරදී | 56 |
| විදුලිය | 55 |
| විපාක සිත් | 28 |
| විමසාසත්තේ | 33 |
| විරතිචෛතසිකයෝ | 26 |
| විරිය | 26 |
| විවර්තකල්පය | 62 |
| විවර්තස්ථායිකල්පය | 62 |
| විෂයරූප | 18 |
| විසකටුවත් සගමොක් මග අතුරේ | 44 |
| **වී** | |
| වීදුගම වේහෙරෙහි මෙත් තෙරිඳු සඳ | 227 |
| **වෙ** | |
| වෙස්සබුමුනිඳු | 220 |
| වෙස්සබුමුනිඳුදකළුත චරෙකවැත්දේහිස් එකකාලෝක දුගතිය දුක් නොවිත්දේ | 220 |
| **වේ** | |
| වේදනාචෛතසිකය | 24 |
| වේදනාස්කන්ධය | 20 |
| වෙහප්ඵලය | 209 |
| **ව්‍යා** | |
| ව්‍යාපාදය | 111 |
| ව්‍යාපාදයෙහි ආදීනව | 112 |
| **ශ** | |
| ශබ්දසංඥාව | 22 |
| ශබ්දලබ්ධනය | 18 |
| ශස්ත්‍රාන්තඃකල්පය | 61 |
| **ශා** | |
| ශාස්තෘගුණය | 183 |
| ශාශ්වතවාද | 113 |
| **ශි** | |
| ශිල්ප | 89 |
| ශිෂ්‍යභාවොප ගමණය | 223 |
| **ශී** | |
| ශීලය | 149 |
| ශීලයකිළිටිකරණකරුණු | 156 |
| ශීලානිශංස | 156 |
| **ශූ** | |
| ශූන්‍යකල්පය | 63 |
| **ස** | |
| සක්දෙවිඳු | 201 |
| සක්වළ | 40 |
| සඝ | 32 |
| සහගණ | 10 |
| සහගණමව්පියගුරුවර කුලදෙටුගිලනුත්තම සර රැක සිත්හේකළ අත් පා මෙමෙහෙවර | 168 |
| සංස්කාරස්කන්ධය | 23 |
| සංස්කාරලෝක | 179 |
| සඞ්ඝානුස්මෘති භාවනාව | 185 |
| සඞ්ඝයාට කටයුතු උපස්ථාන | 169 |
| සඞ්ඝාතය | 119 |
| සඤ්ඤාචෛතසිකය | 24 |
| සඤ්ඤාස්කන්ධය | 22 |
| සඤ්ජීවය | 118 |
| සඤ්ඤීවාද | 114 |

පිට

සත්ගව වනබව දුකවෙදනත් 1
සත්ථාදෙවමනුස්සානංගුණය 181
සත්රුවනිත් 189
සත්පුරුෂදන 145
සත්වලොක 179
සතර අපාය 54
සතර මහා භූතයෝ 16
සති 25
සදහම් 4
සද්ධම්ශ්‍රවණය 163
සන්දිට්ඨිකගුණය 184
සන්තතිරූපය 20
සප්තාර්යධන 57
සප්තවිධ සඞ්ඝිකදානය 143
සම්මාආජීව 26
සම්මාවාචා 26
සම්මාකම්මන්තා 26
සමථභාවනා 203
සම්ඵප්‍රලාපය 109
සම්ඵප්‍රලාපයෙහි ආදීනව 110
සම්‍යක්සිහිය 31
සම්‍යක්වීර්‍යය 55
සමයම් 113
සරණශීලය 149
සසර 34
සසරට බිජුවටමසි ඒ සමයම් 116
සර්වචිත්තසාධාරණචෛතසික 24
සහෙතුක කාමාවචරසුවිසස 28
ස්ත්‍රීභාව රූපය 18
සට්ගී සංඥව 22
ස්වාක්ඛාත ගුණය 184
සංයොජන ධර්ම 29
සංවර්තකල්පය 61
සංවර්තස්ථායිකල්පය 61
සංස්කාර ධර්ම 27
සංස්කාරොපෙක්ෂා ඥානය 205

සා

සාමීචිප්‍රතිපන්න ගුණය 187
සාරකල්පය 63
සාරමණ්ඩකල්පය 63

සැ

සැදැහැත්තන්හට බවදුක් නොකැමැති 57

පිට

සැරියුත් මහමුගලන් 4
සැරියුත් මහ මුගලන් පිළිවෙළිනා 9
සැපතෙහි ඵල බනොසි තත්නෙ 65

සි

සිතමිස කායනැති බඹලොව සතරකි 42
සිත නැතිවම කය ඇති බඹතලයකි 43
සිතමිස කයනැති ..කුසලක් නොම කලහැකි 43
සිත සතොසින් කිය කිය තොත් පියබස 108
සිරි 1
සිල් 149
සිහිකොටනදපිළිවෙලදෙස් 31

සු

සුබවෙදනා 21
සුභකිණ්හකය 209
සුදස්සය 209
සුදස්සීය 210
සුප්‍රතිපන්න ගුණය 186
සුරනග 37
සුරාමෙරය 138
සුරාමෙරයෙහි ආදිනව 139
සුවඳ පූජාව 167
සුවඳ දුම් පූජාව 167

සූ

සූවිසි මහා ගුණය 174
සූසැටකලා ශිල්ප 89

සෙ

සෙත්සිරි 1
සෙවනාග නොකටයුතු පරදුරුවෝ 101

සො

සොභන චෛතසික 24
සොභන සාධාරණ 26

හ

හදය රූපය 18
හරිතොත් නොතබා දස අකුසල්මය 94
හිමවත 122
හිරිය 25



